# ප්‍රාථමිකය 2

හරි දේ තෝරන්න අ

වයස 4–7

# ප්‍රාථමිකය 2


## හරි දේ තෝරන්න අ

වයස හතරේ සිට හත දක්වා ළමුන්ට ඉගැන්වීම සඳහාය

ප්‍රකාශනය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසිනි
සෝල්ට් ලේක් නගරය, යූටා

© 2005 Intellectual Reserve Inc, විසිනි.
සියලු හිමිකම් ඇවිරිණි.
අමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී

ඉංග්‍රීසි අනුමැතිය: 12/93
පරිවර්තන අනුමැතිය: 12/93
*Primary 2: Choose the Right A*
Sinhala



# පටුන


| | පාඩමේ අංකය සහ මාතෘකාව | |
|---|---|---|
| | ගුරු උපකාර | vii |
| 1 | හරි දේ තේරීමෙන් ප්‍රීතිය පැමිණෙයි | 1 |
| 2 | හරි දේ තේරීමට මට පුළුවන | 7 |
| 3 | මම දෙවියන්වහන්සේගේ දරුවෙක්මි | 13 |
| 4 | මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනයකිරීම තෝරාගමි | 19 |
| 5 | මට නිවැරදි තේරීම් කිරීමට පුළුවන | 24 |
| 6 | අපට විශේෂිතවූ පවුල් ඇත | 29 |
| 7 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත පොළොවට ප්‍රීතිය රැගෙන ආවේය | 35 |
| 8 | ස්වර්ගික පියාණන්වහන්සේ මා රැකබලාගන්නා සේක | 40 |
| 9 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මා වැනි ළමයෙක්ව සිටිසේක | 45 |
| 10 | යාච්ඤාව තුලින් ස්වර්ගික පියාණන්වහන්සේ සමග කථාකිරීමට මට පුළුවන | 51 |
| 11 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අන් අයට කීමට මට පුළුවන | 58 |
| 12 | බෞතීස්මවීම සඳහා සූදානම්වීමට මට පුළුවන | 63 |
| 13 | මට උපකාරකිරීමට ශුද්ධාත්මයාණන්ගේ දීමනාවට පුළුවන | 70 |
| 14 | හරි දේ තෝරාගැනීමට නිර්භීතවන්න | 78 |
| 15 | එන්න, මා අනුගමනයකරන්න | 86 |
| 16 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සුවකිරීමේ බලය ඇත | 92 |
| 17 | පූජකවරය මට උපකාරකරයි | 98 |
| 18 | යාච්ඤාවලට ඉතාමත් හොඳ අන්දමින් පිළිතුරු ලැබේ | 104 |
| 19 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මට ප්‍රේමකරනසේක | 110 |
| 20 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අනගි නිධානයකි | 116 |
| 21 | මට ගෞරවනීයවීමට පුළුවන | 123 |
| 22 | සමාදානකරන්නන් ආශිර්වාද ලද්දෝය | 130 |
| 23 | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත් බැටළු එඬේරාණන්ය | 135 |
| 24 | මට කෘතඥතාවය පෙන්වීමට හැකිය | 140 |
| 25 | “ඔබට ස්තුතියි” කීමට මතක තබාගන්න | 146 |

| | | |
|---|---|---|
| 26 | හරිදෙය තෝරාගැනීමෙන් මට යහපත් හැඟීමක් ඇති වේ | 146 |
| 27 | බෙදාගැනීම මගින් අන්‍යයන්ට ප්‍රීතිවීම පිණිස උපකාරකිරීමට මට හැකිවේ | 151 |
| 28 | මට කරුණාවන්ත වීමට හැකිය | 156 |
| 29 | යහපත් ආදර්ශයක් වීමට මට හැකිය | 166 |
| 30 | මට කීකරුවීමට හැකිය | 173 |
| 31 | මම නීතියට කීකරුවෙමි | 180 |
| 32 | එකිනෙකාට ප්‍රේමකරන්න | 186 |
| 33 | දසයෙන් එක කොටස ගෙවීමට මට හැකිය | 194 |
| 34 | නිතරම සත්‍ය ප්‍රකාශකරන්න | 200 |
| 35 | මට හැකියාවන් ඇත | 206 |
| 36 | හරිදෙය තෝරාගත් විට මම ප්‍රඥා සම්පන්න වෙමි | 213 |
| 37 | සබත් දිනය ශුද්ධව පැවැත්වීමට මට හැකිය | 220 |
| 38 | සක්‍රමේන්තුව (රාත්‍රී භෝජනය) ගන්නා විට මම යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සිහිපත් කරන්නෙමි | 228 |
| 39 | අන්‍යයන්ට සේවය කිරීම මගින් මට යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමණය කිරීමට හැකිය | 235 |
| 40 | අන්‍යයන්ට සමාව දීමට මට හැකිය | 240 |
| 41 | යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ ගැලවුම්කාරයාණන්ය | 247 |
| 42 | යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව පොළොවේ පිහිටුවා ඇත | 254 |
| 43 | යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණෙන සේක | 261 |
| 44 | සතුන්ට ආදරය කිරීමට මට හැකිය | 267 |
| 45 | යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම නිමිති කොටගෙන අපි උත්සවය පවත්වන්නෙමු (පාස්කු) | 274 |
| 46 | යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉතාම උතුම් දීමනාවයි (නත්තල) | 280 |
| | ගීතවලට වචන | 286 |

# ගුරු උපකාර

**අරමුණ**

මෙම දැනමුතුකම් පොත ලියා තිබෙන්නේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කිරීම මගින් ළමයින්ට හරි දේ තෝරාගෙන, බෞතීස්මවී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු- දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයන් බවට පත්වීමට ඔවුන්ට ඉගැන්වීමට උපකාරවත්වීමටය.

**ප්‍රාථමිකයේ ගුරුවරුන්ට පණිවුඩයක්**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය ළමයින්ට උගන්වා ඒ අනුව ජීවත්වීමට ඉගෙන ගැනීමට ඔවුන්ට උපකාරකිරීම සඳහා වන පූජනීය කැඳවීමක් අපගේ ස්වර්ගයේ වැඩසිටින පියාණන්වහන්සේ ඔබට දී ඇත. ඔබ ළමයින්ට සේවයකරමින් "කිස්තුස්වහන්සේ වෙතට පැමිණීමට" හැම කෙනෙකුටම ආරාධනාකරන විට, ඔබ ඔවුන්ගේ ජීවිතවලට ආශිර්වාද කරයි. ස්වර්ගික පියාණන්වහන්සේගේ ආශිර්වාද ගැන තේරුම්ගෙන, උන්වහන්සේගේ සුභාරංචිය ගැන සාක්ෂියක් ලබාගැනීම ආරම්භකිරීමට ඔවුන්ට උපකාරකිරීමට ඔබට පුළුවන. ඔබද පෞද්ගලිකව වර්ධනයවී ළමයින්ගෙන් ඉගෙනගනු ඇත. ප්‍රාථමිකයේ ඔබ කරන සේවය තුලින් ඔබට විශාල සතුටක් ලබාගත හැකිය. ප්‍රාථමිකයේ ළමුන්ට සේවයකිරීම මගින්, ඔබ ස්වර්ගික පියාණන්වහන්සේටද සේවය කරයි (බලන්න මොසායා 2:17).

ඔබ සුභාරංචි මූලධර්ම අනුව ජීවත්වෙමින්, ශුද්ධ ලියවිලි අධ්‍යයනයකරමින්, පූජක නායක යන්ගේ උපදෙස් අනුගමනයකරමින්, සහ යාච්ඤාව තුලින් ස්වර්ගික පියාණන්වහන්සේට සමීපවන විට, ඔබ උගන්වන ළමයින් සම්බන්ධව දේව අනුග්‍රහය ඔබට ලැබෙනු ඇත. ළමුන්ට නිතරම ඔබගේ සාක්ෂිය දරන්න. එසේම මෙම වැදගත් කැඳවීම තුලින් ශුද්ධාත්මයාණන්ට ඔබ තුලින් ක්‍රියාත්මකවීමට සලස්සන්න. ඔබ එසේ කරන විට, ඔබ ආත්මයාණන්ගේ මගපෙන්වීම් ලැබ, ප්‍රාථමිකයේ ඔබ කරන කටයුතු අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අනුමතකරනසේක.

**පංති තොරතුරු**

හදේතෝ යන්නෙහි අදහස හරි දේ තෝරන්න වේ. මෙම දැනමුතුකම් පොතේ ආරම්භයේ දැක්වෙන හදේතෝ පළිහ, සහ හදේතෝ මුදුව (31113) බොහෝ පාඩම්වල දැක්වේ. ඊට අමතරව, හදේතෝ සටහන සකස්කිරීම සඳහා වන උපදෙස් 1වෙනි පරිච්ඡේදයේ ඇතුළත්ව ඇති අතර, එයද බොහෝ පාඩම්වලට යොදාගැනේ. හදේතෝ මුදුව, එය පැළඳ සිටින්නාට හරි දේ තෝරාගැනීමට පෞද්ගලික සිහිපත්කරන්නෙකු ලෙස කටයුතුකරයි. හදේතෝ මුදුව ඔබගේ ප්‍රදේශයෙන් ලබාගත හැකිනම්, හැම ළමයෙක් සඳහාම මුදුවක් මිළදී ගැනීම සඳහා කොට්ඨාශයේ හෝ ශාඛාවේ අරමුදල් තත්වය ගැන සභානායකවරයා හෝ ශාඛා සභාපතිවරයා සමග සාකච්ඡාකරන්න.

**පංති කාලය**

යාච්ඤාව

සෑම පංති වාරයකම අරම්භය සහ නිමාව යාච්ඤාවක් සමගින් කරන්න. සෑම ළමයෙකුටම යාච්ඤාව කීමට ක්‍රමානුකූලව අවස්ථාවක් ලබාදෙන්න. යාච්ඤාව සඳහා උපදෙස් සහ යෝජනා ලබාදෙමින්, යාච්ඤාවට ඇතුලත්කිරීමට ළමයින්ගේ අදහස්ද විමසා යාච්ඤාව පංතියේ අර්ථවත් කොටසක් කරගන්න. පංතියේ අවශ්‍යතාවයන් සහ පාඩමේ පණිවුඩය අනුව ඔබගේ යෝජනා සකස්කරගන්න.

**පාඩම් ඉගැන්වීම**

හැම පාඩමක්ම ප්‍රවේශමෙන් සහ යාච්ඤාවෙන් යුතුව සූදානම්කරන්න.එවිට ළමුන් එය තේරුම්ගෙන සතුටුවන බැවින් ඔබටද ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීම් ලැබෙනු ඇත.

45 සහ 46 වැනි පාඩම් වන (පාස්කුව සහ නත්තල) හැර, පාඩම් පිළිවෙලට උගන්වන්න. ඔබගේ පංතියේ යම් ළමයෙක් වර්ෂය තුලදී බව්තීස්මවන්නේ නම්, ඔබගේ පංතියේ එම පළමු ළමයා බෞතීස්ම-වීමට පෙර, බෞතීස්මය සහ ස්ථිරකිරීම සම්බන්ධ 12 සහ 13වෙනි පාඩම් ඉගැන්වීමට ඔබට අවශ්‍යවෙනු ඇත.

ඔබගේ පංතියට යෝග්‍ය පරිදි පාඩමෙන් කරුණු තෝරාගන්න. හැම පාඩමකම අවසානයේ ලැයිස්තුගතකර තිබෙන අභිවෘධිදායක ක්‍රියාකාරකම් ලබාදී තිබෙන්නේ පාඩම අතරවාරයේදී ඔබගේ අභිමතය පරිදි පාවිච්චිකිරීම සඳහාය. පාඩම්වල එන සියලුම කරුණු සහ අභිවෘධිදායක ක්‍රියාකාරකම් ඔබගේ පංතියේ හෝ ප්‍රදේශයේ ළමුන්ට අදාළ නොවීමට හැකිය. සමහර ක්‍රියාකාරකම් අවුරුදු-හතරේ ළමයින්ට අසීරුවිය හැකිය; අනෙක් ඒවා අවුරුදු-හතේ ළමුන්ට සතටුවිය නොහැකි වඩාත් සරළ ඒවා විය හැකිය.

ඔබගේ පංතිය හොඳින් ප්‍රතිචාර දක්වන ක්‍රියාකාරකම් තෝරාගන්න. ඔබගේ පංතියේ බාල ළමුන් සිටීනම්, ඔවුන්ගේ අවධානය යොමුකරගැනීමට පාඩම අතරතුරේදී නිතරම මෙන් ගීත සහ ඇඟිලි ක්‍රීඩා යොදාගැනීමට ඔබට අවශ්‍යවිය හැකිය. ළමුන් සතුටුවන්නේ නම්, ගීතයක් හෝ ඇඟිලි ක්‍රීඩාවක් කිහිප-වරක්ම යොදාගැනීමට ඔබට පුළුවන. වචන කීරු වෙනුවට ඔබගේ ළමුන් සඳහා, ඔබ විසින් අඳින ලද හෝ සඟරාවලින් කපාගත් චිත්‍රයක් මගින් ඉගැන්වෙන යම් සංකල්පයක් පෙන්වාදීමට ඔබට පුළුවන.

ළමුන්ට පාඩම කියවන්න එපා. ඔබ එය ඔබගේම වචනවලින් ඉදිරිපත් කරන්නේ නම්, ඔවුන් වඩා හොඳින් ප්‍රතිචාර දක්වනු ඇත. නිතරම මෙන් කෙටියෙන් ඔබගේ පෞද්ගලික සාක්ෂිය දරන්න. එවිට පංති සාමාජිකයන් සුභාරංචි පණිවුඩය අසා, එයට ආත්මික ලෙස බොහෝසේ ප්‍රතිචාර දැක්වීමට ඉඩ ඇත.

*ඉගැන්වීමට වඩා—ශ්‍රේෂ්ඨ කැඳවීමක් නැත* (33043) දැනමුතුකම් පොත පාඩම් ඉගැන්වීමට ඔබට උපකාරවන්වේ.

**පංති කාමරය තුල සංගීතය**

ස්වාමීන්වහන්සේගේ ආත්මය පංති කාමරය තුලට රැගෙන ඒමට සංගීතයට පුළුවන. පංතියක් ලෙස එක්ව ගායනාකිරීමෙන් ඔබගේ පාඩම වඩාත් රසවත්කල හැකි අතර, එමගින් පාඩමේ සංකල්පයන් ඉතා හොඳින් මතකතබා ගැනීමටද ළමුන්ට උපකාරවත්විය හැකිය.

මෙම දැනමුතුකම් පොතේ එක් වරකට වඩා පාවිච්චිකර තිබෙන ගීතවල වචන දැනමුතුකම් පොතේ පිටුපස මුද්‍රණයකර ඇත. දැනමුතුකම් පොතේ එක් වරක් පමණක් පාවිච්චිවන ගීතවල වචන පාඩම තුලම ඇත. මෙම ගීත සඳහා සංගීතය ළමා ගී පොත (35395) යන්නෙහි ඇතුළත්ව ඇත. ළමා ගී පොතේ පටිගතකල සංගීත පටිගත කල කැසට්පට ලබාගත හැකිය(සංගීතය පමණක්, 52505; වචන සහ සංගීතය 52428) සහ සංයුක්ත තැටි (සංගීතය පමණක්, 50505; වචන සහ සංගීතය, 50428).

පංති කාමරය තුල ගායනාකිරීම ඵලදායී අත්දැකීමක් කරගැනීම සඳහා ඔබ පුහුණු සංගීතඥයෙක් වීම අවශ්‍ය නොවේ. ඔබ හොඳින් ගායනා කරන්නේද, නැතිද කියා ළමෝ නොදනිති; ඔවුන් දන්නේ ඔබ ගායනාකිරීමෙන් සතුටුවන බව පමණකි. ඔබ පාඩමට සූදානම්වීමේ කොටසක් වශයෙන් නිවසේදී ගීත ඉගෙනගෙන පුහුණුවන්න. ඔබට විශේෂිත උපකාර අවශ්‍ය නම්, ප්‍රාථමිකයේ සංගීත ප්‍රධානියාගෙන් හෝ පියානෝ වාදකයාගෙන් උපකාර ඉල්ලන්න. (අමතර උපකාර සඳහා බලන්න “පංති කාමරය තුල සංගීතය” *The How Book for Teaching Children* [31109], පිටු. 40–42.)

විශේෂයෙන්ම ඔබගේ පංතියේ බාල ළමුන් සිටීනම්, ගීත ගායනාකිරීමේදී අදාළ ක්‍රියාවන්ද යොදාගැනීමට ඔබට අවශ්‍ය විය හැකිය. ඒවා ගායනාකිරීම වෙනුවට වචන කීමටද ඔබට හැකිය.

**ඇදහිල්ලේ කරුණු**

ප්‍රාථමික අධ්‍යයන ක්‍රමයේ වැදගත්ම කොටසක් වන්නේ ඇදහිල්ලේ කරුණුය. ඇදහිල්ලේ කරුණක් යම් පාඩමක ඇතුලත්ව තිබේ නම්, එම ඇදහිල්ලේ කරුණ තමන්ට හැකි පමණ මතකතබාගැනීමට ළමුන්ව ධෛර්‍යමත්කරන්න.

ශුද්ධ ලියවිලි

හැම සතියකම ඔබගේ ශුද්ධ ලියවිලි පංතියට රැගෙන විත්,ඔබ එමගින් කියවා උගන්වන බව ළමුන්ට දැකීමට සලස්වන්න.ළමුන්ට ඔවුන්ගේම ශුද්ධ ලියවිලි පිටපත් තිබේනම්, හැම සතියකම ඒවා රැගෙන ඒමට ඔවුන්ව දිරිගන්වන්න. පාඩමේ පාවිච්චිකර තිබෙන එම කොටස් සොයා ඒවා කියවීමට වැඩිහිටි ළමුන්ට උදව්කරන්න. ශුද්ධ ලියවිලිවල වටිනාකම ගැන විටින් විට ඔබගේ සාක්ෂිය දරන්න.

ඉගැන්වීමේ අධාරක

*පින්තූර.* පාඩම්වලට යොදාගෙන තිබෙන බොහෝ පින්තූර අංකගතකර තිබෙන අතර, ඒවා මෙම දැනමුතුකම් පොත සමග ඇති කවරයක ඇතුලත්කර ඇත. මෙම පින්තූර දැනමුතුකම් පොත සමග තිබිය යුතුය. එක් එක් පාඩමට අවශ්‍ය පින්තූර පාඩමේ "සූදානම්වීමේ" කොටසේ ලැයිස්තුගතකර ඇත. "සූදානම්වීමේ" කොටසේ පින්තූර සඳහා වන රැස්වීම් ශාලාවේ පුස්තකාල පොත් අංකයද ඇතුළත්කර ඇත. ඒවා ඔබගේ රැස්වීම් ශාලා පුස්තකාලයේදී විශාල ප්‍රමාණවලින් ලබාගත හැකිය. (සමහර පුස්තකාල පින්තූර එම මාතෘකාවේම වුවද වෙනස් පින්තූර විය හැකිය) එසේම පින්තූර සඳහා වන සුභාරංචි කලා පින්තූර එකතුවේ අංකය, එම එකතුවේම ඇතුළත්කර ඇත.

*දෘෂ්‍යරූප සහ කපාගත් කොටස්.* පාඩම්වල පාවිච්චිවන කපාගත් කොටස් දැනමුතුකම් පොත සමග ඇතුළත්ව තිබෙන අතර, දැනමුතුකම් පොත සමගම තබාගත යුතුය. රූප කපාගෙන අදාළ පාඩම්වලට පාවිච්චිකරන්න. පාඩමේ යෝජනාකර තිබෙන වෙනත් සරළ ඉගැන්වීමේ ආධාරක වන, වචනතීරු, තොරතුරු සටහන් සහ අත්පත්‍රිකා වැනි දේවල් සකසාගැනීමට ඔබට අවශ්‍යවේ. මෙම ආධාරක පසුව වෙනත් පාඩම්වලට සහ ඉදිරි වර්ෂවලදී පාවිච්චිකිරීම සඳහා ආරක්ෂාකරගන්න.

*සංගීතය.* බලන්න "පංතිකාමරය තුල සංගීතය", පි. viii.

*ආහාර.* ආහාර පාවිච්චිකිරීම යම් පාඩමක යෝජනාකෙරෙන හැමවිටකම, කිසිම ළමයෙකුට එම ආහාර අපත්‍යවීම් හෝ වෙනත් ශාරීරික ප්‍රතික්‍රියා ආපදාවන් නොවන බවට සහතික කරගැනීම සඳහා කල්වේලා ඇතිව ඔවුන්ගේ දෙමාපියන් විමසන්න. කරුණාකර උපවාස ඉරුදිනවල ආහාර රැගෙන නොඑන්න.

---

## බෙදාගැනීමේ කාලවේලාවේ ඉදිරිපත්කිරීම්

ප්‍රාථමිකයේ බෙදාගැනීමේ වේලාව තුලදී සරළ සුභාරංචි ඉදිරිපත්කිරීමක් කරන ලෙස විටින් විට ඔබගේ පංතියට ඉල්ලීමක් කෙරෙනු ඇත. එවන් ඉදිරිපත්කිරීම් පාඩමෙන් සකසාගත යුතුය. ඔබ සූදානම්වෙන විට සහ පාඩම් ඉදිරිපත්කරන විට බෙදාගැනීමේ වේලාවට සුදුසු අදහස් ගැන සොයා බලන්න. ළමුන්ගේ වර්තමාන සකුමේන්තු ඉදිරිපත්කිරීම්වලින් යම් මූලධර්මයක් තෝරාගෙන එය බෙදාගැනීමටද ඔබට හැකිය.

බෙදාගැනීමේ වේලාව තුලදී ඔබගේ මගපෙන්වීම යටතේ ළමුන් ලවා සුභාරංචි මූලධර්මයක් ඉගැන්වීම, එම මූලධර්මය ඉගෙනගෙන බෙදාගැනීම සඳහා ඔවුන්ට උපකාරකල හැකි එක් සාර්ථක ක්‍රමයකි.

බෙදාගැනීමේ වේලාවේ ඉදිරිපත්කිරීම, බොහෝසේ පුහුණුවීම අවශ්‍ය නොවන යම් සරළ දෙයක් බවට වගබලාගන්න. ඉදිරිපත්කිරීම සූදානම්කිරීම සඳහා පංති කාලයෙන් කොටසක් යොදාගැනීමට ඔබට හැකිය. පහත සඳහන් යෝජනා සරළ පංති ඉදිරිපත්කිරීමක් සඳහා සාර්ථක ලෙස යොදාගත හැකිය:

1. පාඩමේ එන කථාන්තරයක් හෝ අවස්ථාවක් රඟදැක්වීමට ළමුන්ට උපකාරකරන්න.
2. පින්තූර, වචනතීරු හෝ කැපූ කොටස්වල රූප යොදාගෙන පාඩමක එන කථාවක්. ළමුන් ලවා කීමට සලස්වන්න.
3. ඉදිරියේදී සිදුවන තම බෞතීස්මයන් ගැන ඔවුන්ගේ හැඟීම් ප්‍රකාශකිරීමට ළමුන්ට කියන්න. අටවැනි වියට පැමිණ බෞතීස්මවී සිටින ළමුන් සිටීනම්, බෞතීමය ගැන තම හැඟීම් ප්‍රකාශකිරීමට ඔවුන්ට කියන්න.

4. ඇදහිල්ලේ කරුණක් නැවත කියවා එය පැහැදිළිකිරීමට ළමුන්ට උපකාරකරන්න. *ළමා ගී පොතේ* පිටු. 122–33 එන ඇදහිල්ලේ කරුණුවල එක් ගීතයක් ඔවුන් ලවා ගායනාකිරීමටද ඔබට වුවමනාවිය හැකිය.

අමතර උපකාර සඳහා, බලන්න *ප්‍රාථමික වේලාව බෙදාගැනීමේ උපකාරක දැනමුතුකම් පොත* (33231).

## ළමුන්ගේ පවුලේ අය සමග බෙදාගැනීම

ළමුන් ප්‍රාථමිකයේ ඉගෙනගන්නා දේවල් තම පවුලේ අය සමග බෙදාගැනීමට ඔවුන්ව දිරිගන්වන්න. පාඩම ඵලදායි කරගැනීම සඳහා යම් අවස්ථාවලදී ඔබගේ පංතියට පැමිණ සහභාගිවන මෙන් දෙමාපි-යන්ට ආරාධනාකරන්න. ප්‍රාථමිකය තම ළමුන් සඳහා වඩාත් අර්ථවත් කරගැනීමට උපකාරවත්වන දෙමාපියන්ගේ අදහස්වලට නම්‍යශීලීවන්න.

## බෞතීස්මය සඳහා සූදානම්වීම

ඔබගේ පංතියේ සත්-වියේ පසුවන ළමුන් සිටීනම්, ඔවුගෙන් සමහරෙක් එම වසර තුලදී සමහරවිට බෞතීස්මය ලබනු ඇත. ප්‍රාථමිකයේ ගුරුවරයෙක් ලෙස, ළමුන්ගේ පවුල්වලට උපකාර කර, පංති සාමාජිකයන්ට බෞතීස්මය සඳහා සූදානම්වීමට උදව්කිරීමට ඔබට පුළුවන. මෙලෙස කටයුතු කිරීමට ඔබට උදව්වන පහත සඳහන් යෝජනා සළකා බලන්න:

1. ඔබගේ පංතියේ පළමු ළමයාගේ බෞතීස්මයට පෙර, හැකියාවක් තිබේ නම්, බෞතීස්මය සහ ස්ථිරකිරීම සඳහා වන (12 සහ 13 පාඩම්) උගන්වන්න.
2. හැම ළමයෙකුගේම බෞතීස්මයට පෙර ඉරුදිනක මෙම පිළිවෙතේ ඇති වැදගත්කම සාකච්ඡාකිරීමට පංති කාලයෙන් මිනිත්තු කිහිපයක් වැයකරන්න.
3. හැකියාවක් තිබේනම්, එක් එක් ළමයාගේ බව්තීස්මයට ප්‍රාථමික සභාපතිත්වයේ සාමාජිකයෙකු සහ සහභාගිවිය හැකි ඕනෑම පංති සාමාජිකයෙකු සමග සහභාගිවන්න.
4. බෙදාගැනීමේ කාලයේදී බෞතීස්මය ගැන පංති ඉදිරිපත්කිරීම් සූදානම්කිරීමට ළමුන්ට උපකාරකරන්න.

## ළමුන්ව අවබෝධකරගැනීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය ඉගැන්වීම සඳහා වන ඔබගේ කැඳවීම ඔබගේ සභානායකත්වය හෝ ශාඛා සභාපතිත්වය තුලින් ඔබට ලබාදී තිබෙන පූජනීය වගකීමකි. මෙම පූජකවර නායකයන් ඔබව කැඳවා තිබෙන්නේ ස්වර්ගික පියාණන්වහන්සේගේ දේව අනුග්‍රහය මගින්ය. ඔබගේ පංතියේ ළමයින්ට ගැලවුම්කරුවාණන් වහන්සේව ඔවුන්ගේ ජීවිත කාලය මුළුල්ලේම අනුගමනය කිරීමට විශාල ලෙස බලපැවැත්වීමක් කිරීමට ඔබට හැකිය.

පංතියේ ළමයින්ට නිතරම සුභවාදී ආකල්පයක් සහ ප්‍රේමයක් පෙන්වන්න. එක් එක් ළමයාගේ දක්-ෂතා, ප්‍රියජනක දේවල්, සහ හැකියාවන් හඳුනාගන්න. ළමුන්ගේ හැකියාවන්ට අවශ්‍යවන කියවීම සහ ලිවීම වැනි පාඩම් ක්‍රියාකාරීත්වයන් ලෙස සකස්කරන්න.

සියලුම ළමුන්ට ඇහුම්කන්දීමෙන් සහ හැකිතරම් දුරට ඔවුන් එකිනෙකාට පෞද්ගලිකව අවධානය යොමුකරමින් ඔවුන්ගේ ආත්ම සුදුසුතාවය පිළිබඳ හැඟීම් වර්ධනය කරගැනීමට උපකාරකරන්න.

මෙම පාඩම් ලියා තිබෙන්නේ අවුරුදු හතරේ සිට හත දක්වා වන එකම වයසේ ළමුන් හෝ මිශ්‍ර වයස් කණ්ඩායම්වල ළමුන්ගේ පංති සඳහාය. කෙසේවුවද, ඔබගේ පංතියේ සිටින ළමුන්ගේ වයසට අනුකූලව පාඩම් සකස්කරගැනීමට ඔබට සිදුවිය හැකිය. ඔබගේ පංතිය සංවිධානයවී තිබෙන අන්දම ගැන නොසළකා, එම වයසේ පසුවන ළමුන්ගේ සාමාන්‍ය ගති ලක්ෂණ තේරුම්ගැනීමෙන් වඩාත් සාර්ථක

ලෙස ඉගැන්වීමට ඔබට උපකාර සැලසේ. ළමුන්ගේ හැසිරීම ගැන අවබෝධයක් ලබාගැනීමෙන් ඔවුන් ඒ අන්දමින් හැසිරෙන්නේ මන්ද කියාත්, ඔවුන්ට වඩාත් හොඳින් ඉගැන්විය හැකි මාර්ග මොනවාද කියාත් දැනගැනීමට මෙමගින් ඔබට පුළුවන. ළමුන්ව තේරුම්ගැනීමෙන් පංතිකාමරය තුල සුහවාදී හැඟීමක් පවත්වාගැනීමටද ඔබට උපකාරවේ. ඔබ පාඩමට සූදානම්වන විට පහත සඳහන් ගුණාංග නැවත බලන්න. කෙසේවුවද, හැම ළමයෙක්ගේම වර්ධනයවීම ඔහුගේ හෝ ඇයගේ අනුචිත ප්‍රමාණයට අනුව බව මතකතබාගන්න. මේවා හුදෙක් ප්‍රධාන මගපෙන්වීම්ය.

**අවුරුදු-හතරේ ළමයි**

හතර සොයාබැලීමේ වයසවේ. *මන්ද, කෙසේද* යන වචන අවුරුදු-හතරේ ළමුන් බොහෝසේ නිතරම පාවිච්චිකරන වචනවේ. අවුරුදු-හතරේ ළමෝ බොහෝ ක්‍රියාකාරීය. පහත සඳහන් වන්නේ අවුරුදු-හතරේ ළමුන්ගේ ප්‍රධාන ගුණාංගයන්වේ:

1. ඔවුන්ට තුන් වියැති ළමයින්ට වඩා පහසුවෙන් දිවීමට, පැනීමට සහ නැගීමට පුළුවන. ඔවුන්ට බෝලයක් විසිකිරීමට හෝ ඊට පයින් ගැසීමට සහ ලී කැබලිවලින් නිවසක් තැනීමට හෝ පුළුවන.
2. "මම එය කලින් කළෙමි; මට දැන් යම් වෙනස්දෙයක් සෑදීමට පුළුවන්" වැනි දේවල් ඔවුහු සතුටින් යුතුව කියති.
3. ඔවුන් අනෙක් ළමයින් සමග ක්‍රීඩාකිරීමට කැමති නමුත්, විශාල කණ්ඩායමක් සමග සාමාජමය වශයෙන් එකතුවීමට සූදානම් නැත.
4. අනෙක් ළමුන් සමග ක්‍රීඩාකිරීමට ඔවුන්ට කැමැත්ත සහ අවශ්‍යතාවය තිබුනද, ඔවුන් වැඩි වශයෙන් ක්‍රීඩාකරන්නේ තනිතනිවමය. ඔවුහු ක්‍රීඩාකරීමට හෝ කණ්ඩායමක් සමග සංගීතයට අනුව නැටීමට ඉඩතිබුනද, අනෙක් ළමුන් ක්‍රීඩාකිරීම හෝ නටන අන්දම ගැන වැඩි අවධානයක් යොමු නොකරති.
5. බොහෝ ප්‍රශ්න ඇසීමට අමතරව, වෙනත් ළමයෙකු සමග හෝ වැඩිහිටියෙකු සමග සංවාදයේ නියැලීමට ඔවුන් කැමතිය.
6. ඔවුන්ගේ අත්දැකීම් ප්‍රධාන වශයෙන් ලැබෙන්නේ නිවසෙන් නිසා, ඔවුහු වැඩිවශයෙන් නිවස සහ පවුල ගැන කථාකරති. මේ වයසේ ළමෝ තම පවුල් ගැන ගුරුතුමියට කීමට ආශාකරති. ඔවුහු අනෙක් ළමුන්ගේ කථාවලට සවන්දීම වෙනුවට, තමන්ගේම කථාකීමට වැඩි කැමත්තක් දක්වති. පවුල ගැන යොමුවන පාඩම් සහ ක්‍රියාකාරීත්වයන්ට ඔවුහු ආශාකරති.
7. ඔවුන් ජීවත්වන්නේ සම්පූර්ණයෙන්ම වර්තමානයේ සහ අවස්ථානුකූලවය. ඊයේ සහ හෙට ගැන සැලකිල්ල මඳය. කෙසේවෙතත්, ඒ ගැනද ඔවුන් සැලකිලිමත්වෙමින් ඉදිරි සිද්ධීන් ගැනද ඔවුහු විශාල උද්යෝගයක් පෙන්වති. එසේම කාලය යන්නෙහි අදහස ඔවුන්ට තවමත් ග්‍රහනයකරගැනීමට නොහැකි නිසා, යම් අනාගත සිද්ධියක් ගැන ඔවුන් මෙසේ ඇසිය හැක, "එය තිබෙන්නේ හෙටද?"
8. කථාන්තර සහ ළදරු කවි ඇසීමට ඔවුහු ආශාකරති. ප්‍රියතම කථාන්තර තම ඉරියව්ව මඳකුදු වෙනස්නොකර නැවත නැවත ඇසීමට ඔවුන්ට අවශ්‍යවේ. කථාන්තරය ඇසීමෙන් පසුව එහි චරිත රඟදැක්වීමටද ඔවුහු ආශාකරති.
9. මඳ සහයෝගයක් සහිතව යාච්ඤාකිරීම ඉගෙනගැනීමට ඔවුන්ට පුළුවන.

**අවුරුදු-පහේ ළමයි**

අවුරුදු-පහේ ළමයි තමන් ගැන බොහෝ ස්ථිරත්වයකින් යුතු අතර, සාමාන්‍යයෙන් විශ්වාස දායකය. ඔවුන් සාමාන්‍යයෙන් නිවෙසියන් ඔවුන්ගෙන් අපේක්ෂාකරන දේවල් කිරීමට ඉගෙනගෙන ඇත. ඔවුන් අනෙක් ළමයින් සමග හොඳින් ක්‍රීඩාකරන නමුත්, ලනු පැනීම සහ චිත්‍ර ඇඳීම වැනි අංශ ගණනාවකින් තනිවම විනෝදවීමටද ඔවුන්ට පුළුවන. පහත සඳහන් වන්නේ අවුරුදු-පහේ ළමුන්ට ආවේනික හැසිරීම් රටාවන්ය:

1. ඔවුන්ගේ විශාල මාංශ පේශීන් දිගටම වර්ධනයවේ. ඔවුන්ට දැන් පැනීමට, කරනම්ගැසීමට සහ තනි කකුලෙන් පැනීමට පුළුවන. හිම රථයක් හෝ අශ්ව රථයක් ඉතා පහසුවෙන් තල්ලු කිරීමට ඔවුන්ට පුළුවන.

2. ඔවුන්ගේ කුඩා-මාංශපේශී වර්ධනයවීමෙන් දැන් ඔවුන්ට පින්තූර කපාගැනීමට, සහ කලින් ඇඳගත් චිත්‍ර පාටකිරීමට ඒවා ක්‍රමවත් ලෙස කිරීමට නොහැකිවුවද, හැකියාවක් ඇත. බොහෝ දෙනෙකුට ඔවුන්ගේ පාවහන් පටි ගැටගැසීමටද පුළුවන.

3. ඔවුහු අවුරුදු හතරේ ළමුන්ට වඩා විශ්වාසවන්ත සහ ස්වාධීන අය වෙති. ඔවුහු නිතරම නිවස අවට වැඩවලට උදව්කිරීමට කැමති අතර, තම දෙමාපියන් සමග වැඩකිරීමට ලැබෙන විට ප්‍රීතියට පත්වෙති.

4. "එය කුමක් සඳහාද?" නැතහොත් "මෙය ක්‍රියාකරන්නේ කෙසේද?" යනුවෙන් අසන විට ඔවුන්ගේ ස්ථාවරය දැඩිය. ඔවුන්ට අවශ්‍ය පරිදි තේරෙන භාෂාවෙන්, විස්තර සහිතව කල්පනාකාරී, අවංක පිළිතුරු ලැබිය යුතුය.

5. ඔවුහු තම ගුරුවරුන් ප්‍රියකරන අතර, ඔවුන් සමග ඉඳගැනීමට ලැබීම වරප්‍රසාදයක් ලෙස සළකති. පාඩමකට උපකාරයක් වශයෙන් පින්තූරයක් ඔසවාගෙන සිටීමට හෝ වෙනත් උපකාරයක් කරන ලෙස ගුරුවරුන් ඉල්ලීමක් කරන විට ඔවුහු අතිශයින්ම ප්‍රීතියට පත්වෙති.

6. කුඩා කණ්ඩායම් ව්‍යාපෘති සහ නිවස සහ පවුල ගැන රඟදැක්වීම්වලට ඔවුහු ප්‍රියකරති.

7. කතන්දර ඇසීමට සහ කීමට ඔවුහු ප්‍රියකරති. තවද එම කතන්දරයම නැවත නැවත කියන ලෙස ඔවුහු ඉල්ලාසිටිති. නැවත කීම ඔවුන්ගේ ඉගෙනගැනීමේ ප්‍රධාන මාර්ගයවේ. නිතරම මෙන් බොහෝ දුරට පොතක පිටු පෙරලන පරිදි වචනයෙන් වචනය ගලපා කථාන්තරයක් කීමට ඔවුන්ට පුළුවන.

8. ඔවුහු සාමාන්‍යයෙන් මිත්‍රශීලී, අනුකම්පා සහිත, දයාබර මෙන්ම උපකාරවත්වන නමුදු, ඔවුන්ට අවශ්‍ය පරිදි යමක් සිදු නොවන විට, ඔවුන් බොහෝ කළහකාරී විය හැකිය.

9. තමන් වැඩුනු, වැඩිහිටි අය බව පෙන්වීමට අළුත් වරප්‍රසාද ලැබීමට ඔවුහු ප්‍රියකරති.

10. මිනිත්තු දහයක් දොළහක් දිගටම ඔවුන් දෙස අවධානය යොමුකල හොත්, ඔවුන් එක් ක්‍රියාවකින් තවත් එකකට සීඝ්‍රයෙන් මාරුවීමක් පෙනේ. ඔවුන් ඇඟිලි ක්‍රීඩාවල යෙදීමට වඩා මෝරා ඇතිබවත්, ඔවුන්ට වැඩිපුර අවශ්‍යවන්නේ වැඩිහිටි අය කරන ක්‍රියාකාරීත්වයන් හෝ විඩා නිවාකරන අභ්‍යාස බවත් සිතීමට ඔවුන් පටන්ගෙන ඇත.

11. ඔවුන් නිතරම වෙනත් ළමයෙක් ක්‍රීඩාකරමින් සිටින යමක් තමාට ක්‍රීඩාකිරීමට අවශ්‍ය බවට එකහෙලාම කියාසිටී. එවැනි සිද්ධීන් ප්‍රවේශමෙන් නිරාකරනය කිරීමට උත්සාහගන්න; වාර අනුව සෙල්ලම්කරන ලෙස ළමයින්ට උගන්වන්න.

12. ඔවුහු විශාල කණ්ඩායම්වලට වඩා කුඩා ඒවාට ප්‍රිය වෙති. දසදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක සිටිනවා වෙනුවට, එක් හොඳම මිත්‍රයෙක් සමග සෙල්ලම්කිරීමට ඔවුහු ප්‍රියකරති.

13. ඔවුන්ට තවමත් සිතාගැනීමේ සහ යථාතත්වය අතර වෙනස පිළිබඳ වැටහීමක් නැත. එමනිසා, මෙම ඔරලෝසුව තනා තිබෙන්නේ රත්රන් වලින්ය, වෙනත් පියෙකුට වඩා ඔහුගේ පියා ලොකුය, නැතහොත් ඔහු අල්ලාගත් මතස්‍යයා අතිශයින්ම දිගය කියා ළමයෙකු කීමට ඉඩ තිබේ. මෙය ළමයෙකුගේ ජීවිතයේ එක් සාමාන්‍ය අවධියකි; අව්‍යාජ දේ කුමක්ද, එසේ නොවන්නේ කුමක්ද අතර වෙනස ඉගෙනගැනීමට ළමයින්ට කලක් ගතවේ. ළමයින් වර්ධනයවන විට මෙම අවධිය ක්‍රමයෙන් ගෙවීයයි.

14. ඔවුහු ආශාවෙන් ඉගෙනගනිති. ස්වර්ගික පියාණන්වහන්සේ ඔවුන්ට ඉතා සැබෑ නිසා, ඔවුහු උන්වහන්සේ ගැන බොහෝ සැලකිලිමත් බැවින් උන්වහන්සේ ගැන බොහෝ ප්‍රශ්න අසති. යාච්ඤාකිරීමෙන් ඔවුන් සතුටක් ලබන අතර, සමහරවිට, උපකාරයක් නොමැතිවද යාච්ඤාකිරීමට හැකියාවක් ඇත.

අවුරුදු-හයේ ළමයි

සය-වියැති ළමයින්ට තම ශරීර ගැන මනා පාලනයක් ඇති අතර, නව හැකියාවන් ඉගෙනීමට සහ දැනටමත් ලබාතිබෙන ඒවා සම්පූර්ණකරගැනීම සඳහා වැයකිරීමට ශක්තිය විශාල වශයෙන් ඇත. උදාහරණයක් ලෙස, ඔවුන්ට ලණු පැනීමට, බෝලයක් උඩවීසිකිරීමට, විසිල් කිරීමට, අත්දුන්නක් හැරවීමට, සහ බයිසිකලයක් පැදීමට පුරුදුවීමට හැකිය. සය වියැති ළමයින්ට ඔවුන්ගේ කුඩා මාංශ පේශීන් පාවිච්චිකිරීමේ යම් අපහසුතා තිබිය හැකිවුවද, ඔවුන්ට හෝඩියේ අකුරු, ඔවුන්ගේම නම් සහ වෙනත් වචන කිහිපයක් ලිවීමට පුරුදුවිය හැකිය. පහත සඳහන්වන්නේ සය වියැති ළමයින්ගේ වෙනත් ප්‍රධාන ගති ලක්ෂයන්ය:

1. ඔවුන්ගේ අවධානය වර්ධනය කරා දිවයයි. ඔවුන් බොහෝ විඩාවට පත්වුවද, ඔවුන්ගේ සැලකිල්ල අනුව, ඔවුන්ට මිනිත්තු පහළොවක හෝ විස්සක ක්‍රියාකාරීත්වයක් ගැන සිත යොමුකිරීමටද පුළුවන.
2. ගස් නැගීම, ක්‍රීඩාභූමි උපකරණ පරිහරණය, හෝ තරඟ දිවීම වැනි සම්පූර්ණ ශරීරය වෙහෙසෙන දේවලින් ඔවුහු සතුටුවෙති
3. ඔවුහු ක්‍රීඩා සහ මිත්‍රශීලී තරඟවලට ප්‍රියකරති.
4. ගුරු උපදේශය ඔවුන්ට ඉතා වැදගත්වේ. ගුරුවරයා සමග එකට වාඩිවී, පාඩමට උදව්වීමක් ලෙස පින්තූර ඔසවාගෙන සිටීමට හෝ උපකරණ නැවතත් පුස්තකාලයට රැගෙනයාමට ඔවුන්ට අවශ්‍යවේ.
5. ඔවුහු තවදුරටත් කතන්දර ඇසීමටද, ඒවා රඟදැක්වීමට සහ චරිත ආරෑඩයටද ප්‍රියකරති. බොහෝදෙනෙක් වයස වැඩි අයගේ ඇඳුම් ඇඳීමටද කැමතිය.
6. ඔවුහු බොහෝ නිර්ලෝභීය, හිතෛෂීය, එමෙන්ම තම රුචිකත්වය ඉටු නොවන විට ඔවුහු ඉතාමත් කළහකාරීවෙති.
7. ඔවුහු ලණුපැනීම, නැටීම සහ තනි කකුලෙන් පැනීම ආදියට සමර්ථවිය හැකිය. මෙම හැකියාවන් ඔවුහු තරඟවලදී යොදාගෙන සතුටුවෙති.
8. හැසිරීමේ හොඳ නරක කම ගැන ඔවුහු ඉතා සැලකිලිමත් වෙති.
9. ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනයවේ. බොහෝ සය වියැති ළමයින් නිවසේදී හෝ වෙනත් පංතිවලදී කලින් අත්දකීම් ලබා තිබේ නම්, තනිවම යාච්ඥාකිරීමට ඔවුන්ට පුළුවන.

අවුරුදු-හතේ ළමයි

අවුරුදු හතේදී, ළමයි තවදුරටත් ඔවුන්ගේ දෙමාපියන්ට සමීපව සිටින අතර, ඔවුන්ගේ ප්‍රේමය, අවධානය සහ අනුකම්පාව අගයකරන නමුත්, මිනිසුන් සහ නිවසින් බාහිර තත්වය ගැන බොහෝසේ කථාකිරීම ආරම්භකරති. ඔවුහු පෞද්ගලිකත්වය අගයකරන අතර, ඔවුන්ගේම යම් යම් තීරනගැනීමට ඔවුන්ටම පැවරීම අපේක්ෂාකරති. ඔවුන් ප්‍රාණවත්, උත්සුක මෙන්ම ඔවුන්ගේ ජීවිතය ගැන අතිවිශාල ලෙස සැලකිලිමත් අය වෙති. ඔවුහු බොහෝ ක්‍රියාකාරීත්ව යන් හදාරන අතර, ඔවුන්ට සතුට ලබාදෙන ඒවා නැවතත් කිරීමට ආශාකරති. පහත සඳහන් වන්නේ සත් වියැති ළමුන්ගේ වෙනත් ප්‍රධාන ගති ලක්ෂණය:

1. ඔවුන්ගේ විශාල මාංශ පේශීන් මනාව පාලනයවී ඇති අතර, ඒවා වඩාත් සුන්දර, වේගවත් සහ කඩිසරබවට පත්වෙමින් ඇත.
2. ඔවුන්ගේ කුඩා මාංශ පේශී පාලනය වර්ධනයවෙමින් පවතී. ඔවුන්ට වඩාත් පහසුවෙන් සහ වඩාත් නිවැරදිව ලිවීමට හැකියාව ඇත.
3. බොහෝදෙනෙක් ක්‍රියාශීලී සහ ශාරීරික ක්‍රීඩාවලට කැමැත්ත දක්වමින්, එකම ක්‍රීඩාව නැවත නැවත කරති.

4. ඔවුහු නිතරම අවිවේකීව සහ නොසන්සුන්ව සිටිති. ඔවුහු ශක්තියෙන් පූර්ණවුවද, පහසුවෙන් විඩාවට පත්වෙති. විවේක කාලයත් වැදගත්වේ.

5. ඔවුහු යම් යම් දේවල් එකතුකිරීමට සහ ඒවා ගැන කථාකිරීමට ප්‍රියකරති. ඔවුන් විසින්ම හෝ කණ්ඩායමක් වශයෙන් හෝ ඔවුන් සෑදූ දේවල් ගැන කථාකිරීමටද ඔවුහු ප්‍රියත්වයක් දක්වති.

6. ඔවුන්ගේ අවධානය යොමුකිරීමේ වේගයද වර්ධනයවේ; මෙම වයසේ ළමයින් යම් ව්‍යාපෘතියකට මිනිත්තු විස්සේ සිට විසිපහක කාලයක් ගතවුවද, ඔවුන් එයට කැමති නම් එය නිමකිරීමට ඔවුන්ට පුළුවන. බොහෝ පාඩම්වල එන ක්‍රියාකාරීත්වයන්හි යම් වෙනසක්කිරීම ඔවුන්ට තවමත් අවශ්‍යවේ.

7. ලිංගික ප්‍රතිවිරුද්ධ පක්ෂයේ සාමාජිකයන් සමග අන්‍යොන්‍ය බලපැවැත්ම මඳ වශයෙන් ඔවුහු ආරම්භ කරති.

8. තමන්ට අභිමත පරිදි කටයුතු කිරීමේදී ඔවුහු මඳ වශයෙන් බලපෑමටත් මඳ වශයෙන් අධිෂ්-ඨානශීලීවීමටත් පටන් ගනිති

9. ඔවුන් සිතීමේදී වඩාත් ස්වාධීන සහ වඩාත් තර්කානුකූලවීම ආරම්භවේ.

10. වැරදි සහ නිවැරදිබව ගැන ඔවුහු වඩාත් දැනගැනීමට පැමිණ, ඔවුන් නිවැරදියයි සිතන දේවල් නොකරන අය බොහෝ විවේචනයට ලක්කරති.

11. ඔවුහු බව්තීස්මවීම ගැන බලාසිටිති.

12. ඔවුන්ට තනියම යාච්ඤාකිරීමට හැකි අතර, නිතරම ඔවුන්ගේ යාච්ඤාවලට ක්ෂණික පිළිතුරු අපේක්ෂාකරති.

13. උපවාස ඉරුදින අඩු වශයෙන් එක් කෑම වේලකින් වැළකීමට සහ තමන්ට දසයෙන් කොටස ගෙවීමට හැකිබවටත් ඔවුන්ට ආඩම්බරයක් ඇතිවීමට හැකිය.

---

## ආබාධිත අය සම්බන්ධකරගැනීම සඳහා විශේෂිත මගපෙන්වීම්

ආබාධිත අය වෙනුවෙන් දයාන්විත හැඟීමක් ඇතිකරගැනීමට සහ එය පෙන්වීමට ගැලවුම් කරුවාණන් වහන්සේ අපට ආදර්ශයක් තබා ඇතිසේක.මලවුන්ගෙන් නැගිටි උන්වහන්සේ නිෆායිට්වරුන් බැහැදුටු විට, උන්වහන්සේ මෙසේ කීසේක:

"නුඹලා අතර රෝගීන් සිටිත්ද? ඔවුන් මෙහාට ගෙනෙන්න. කොරවූ අය, අන්ධයෝ, නොණ්ඩි අය, අබ්බගාත අය, ලාදුරු රෝගීහු, වියැලුනු අය, බිහිරෝ හෝ වෙනයම් රෝගවලින් පෙළෙන අය නුඹලා අතර සිටිත්ද? ඔවුන් මෙහාට ගෙනෙන්න. මම ඔවුන් සුවපත්කරන්නෙමි. මන්දයත් මට නුඹලා කෙරෙහි දයාව ඇත්තේය" (3 නිෆායි 17:7).

ප්‍රාථමික ගුරුවරයෙකු වශයෙන් ඔබ දයාව පෙන්වීමේ විශිෂ්ඨ තත්වයක සිටියි. වෘත්තීමය සහායක් ලබාදීම සඳහා ඔබ පුහුණුවක් ලබා නොතිබිය හැකි වුවද, ආබාධයන් ඇති ළමයින් තේරුම්ගෙන රැකබලා ගැනීමට ඔබට පුළුවන. සැලකිල්ල, අවබෝධය, සහ හැම පංති සාමාජිකයෙක්ම පුහුණුවීමේ ක්‍රියාකාරීත්වයන්ට ඇතුළත්කරගැනීමේ කැමැත්ත අවශ්‍යවේ.

ආබාධිත ළමුන් ඔවුන් අවබෝධයේ කුමන තලයක සිටියද, ආත්මයාණන්ගේ ස්පර්ශය ලබාගත හැක.සමහර ළමුන්ට සම්පූර්ණයෙන්ම ප්‍රාථමික කාලයට සහභාගීවීමට හැකියාවක් නැතිවුවද, ආත්ම-යාණන් හැඟීම සඳහා කෙටි වේලාවක හෝ සහභාගීත්වය ඔවුන්ට අවශ්‍යවේ. ප්‍රාථමික කාලය තුළදී ළමයාට මුළු කණ්ඩායමෙන්ම ඉවත්වසිටීමේ කාලයක් අවශ්‍යවුවහොත්, ළමයාගේ අවශ්‍යතාවයන් ගැන සංවේදී යම් සහායකයෙක් සිටීමේ අවශ්‍යතාවයක් තිබිය හැක.

සමහර පංති සාමාජිකයන්ට ඉගෙනීමේ ආබාධයන්, බුද්ධි හීනතාවයන්, භාෂාවේ හෝ කථා කිරීමේ ප්‍රශ්න, පෙනීම හෝ ඇසීම අහිමිවීම්, හැසිරීම සහ සමාජමය ප්‍රශ්න, මානසික රෝග, සෙලවීමේ සහ ඇවිදීමේ ප්‍රශ්න හෝ කල් පවතින සෞඛ්‍ය ප්‍රශ්න වැනි අසීරුතාවයන් තිබිය හැක. සමහර අයට භාෂාවේ හෝ සංස්කෘතියේ අප්‍රියතාවයන් හෝ අසීරුතාවයන් පෙනීමට ඉඩ ඇත. පෞද්ගලික තත්වයන් ගැන තැකීමක් නොකොට, හැම ළමයෙක්ම එකම අවශ්‍යතාවයන් වන ප්‍රේමකරමින් පිළිගැනීම, සුභාරංචිය ඉගෙනගැනීම, ආත්මයාණන්වහන්සේ අත්විදීම, සාර්ථකව සහභාගීත්වය දැක්වීම සහ අන් අයට සේවය-කිරීම බෙදාගතියි.

මෙම මගපෙන්වීම් ආබාධිත ළමයෙකුට ඉගැන්වීමට ඔබට උපකාරවත්වේ:

- ළමයාගේ ආබාධිත තත්වය අමතක කර ඔහුව හැඳිනගැනීමට පුරුදුවන්න. ස්වභාවික වන්න, මිත්‍රශීලී සහ දයාවන්තවන්න.
- ළමයාගේ නිශ්චිත ශක්තිය සහ අභියෝග ගැන ඉගෙනගන්න.
- පංතියේ සෑම සාමාජිකයෙකුටම ගරු කිරීමේ වගකීම ගැන පංති සාමාජිකයන්ට ඉගැන්වී මට සහ සිහිපත්කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගන්න. ආබාධිත පංති සාමාජිකයෙකුට උදව් කිරීම,මුළු පංතියටම ක්‍රිස්තුස් මෙන් ඉගෙනගැනීමේ අත්දැකීමක් විය හැකිය.
- ළමයාගේ දෙමාපියන් සමග, වෙනත් පවුල් සාමාජිකයන් සමග, සහ අදාළවිට,ළමයා සමගද සාකච්ඡාකර ඉගැන්වීම සඳහා ඉතාම හොඳ ක්‍රම සොයාගන්න.
- ආබාධිත ළමයින්ව කියවීමට, යාච්ඤාකිරීමට, හෝ එසේ නොමැති නම්, සහභාගිවීම සඳහා කැඳවීමට පෙර, පංති සහභාගීත්වය ගැන ඔවුන්ගේ හැඟීම් කෙබඳුදැයි ඔවුන්ගෙන් අසන්න. එක් එක් ළමයාගේ හැකියාවන් සහ දක්ෂතාවයන් ගැන අවධාරණයකර, හැම ළමයෙකුටම පහසුවෙන් සහ සාර්ථකව සහභාගිවිය හැකි මාර්ග සොයන්න.
- ආබාධිත ළමුන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් ඉටුකිරීමට පාඩමේ උපකරණ සහ භෞතික වටපිටාව සකස්කරගන්න.

ආබාධිත ළමුන්ට ඉගැන්වීම සඳහා වන අමතර උපකරණ සභාවේ බෙදාහැරීමේ මධ්‍යස්ථා නයෙන් ලබාගත හැක(බලන්න "ආබාධිත අය සඳහා උපකරණ" බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ නාමාවලිය).

---

## අපවාදී ප්‍රශ්න සමග කටයුතුකිරීම

ගුරුවරයෙකු වශයෙන් ඔබට චෛතසික හෝ ශාරීරික වශයෙන් අපවාදයෙන් පෙළෙන ළමුන් සිටින බව දැනගැනීමට ලැබිය හැක. ඔබගේ පංතියේ එවන් ළමයෙකු ගැන ඔබගේ සැලකිල්ලට ලක්වුවහොත්, කරුණාකර ඔබගේ සභානායකවරයා සමග සාකච්ඡාකරන්න. ඔබ පාඩම් සූදානම්කර එය ඉදිරිපත්ක-රනවිට, ස්වාමීන්වහන්සේගේ උපදෙස් සහ මගපෙන්වීම් සඳහා යාච්ඤාකරන්න. ඔබගේ පංතියේ සිටින හැම ළමයෙක්ම, ඔහු හෝ ඇය ස්වර්ගික පියාණන්වහන්සේගේ වටිනා දරුවෙකු බවත්, එසේම ස්වර්-ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප එකිනෙකාට ප්‍රේමකරමින් අප ප්‍රීතියෙන් සහ ආරක්ෂාවී සිටීම අපේක්ෂාකරන බවටත් හැඟීමක් ඇතිකරගැනීමට උපකාරවත්වන්න.

# හරි දේ තෝරාගැනීමෙන් සතුට ලැබේ

**1**
වෙනි
පාඩම

**අරමුණ**

හරි දේ තෝරාගැනීමෙන් සතුට ලැබෙන බව හැම ළමයෙකුටම තේරුම්ගැනීමට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. මතෙව් 5:6 සහ 3 නිෆායි 12:6 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. තවද බලන්න, දහම සහ ගිවිසුම 58:27 සහ සුභාරංචි මූලධර්ම (31110), පරිච්ඡේදය 4.
2. හදේතෝ සටහනක් සකස්කරන්න. යේසුස්වහන්සේ ළමයෙකු සමග සිටින පින්තූරය 2-1, විශාල කඩදාසියක හෝ දැන්වීම් පුවරුවක අලවන්න. පින්තූරය උඩින් හදේතෝ යන අකුරුද, පින්තූරය යටින් මම හරි දේ තෝරන්නෙමි යන වචනද ලියන්න. මෙම සටහන ඉදිරි පාඩම් වලට උපයෝගීකර ගැනීම සඳහා ආරක්ෂාකරගන්න.
3. පංතිය සමග බෙදාගැනීම සඳහා හැම ළමයෙකු ගැනම තොරතුරු ස්වල්පයක් සොයා- ගැනීමට එක් එක් ළමයාගේ දෙමව්පියන් සමග කථාකරන්න.
4. "හරි මාර්ගය තෝරාගන්න ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්වන්න (ළමා ගී පොත පි. 160). මෙම ගීතයට වචන මෙම දැනමුතුකම් පොතේ පිටිපස ඇතුළත්කර ඇත.
5. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ මෝර්මන්ගේ පොතක්.
   ආ. හුණුකූරු, හුණුලැල්ලක් සහ මකනයක්.
   ඇ. මුදුවක් නැති හැම ළමයෙකුටම හදේතෝ මුදුවක් (බලන්න "පංති තොරතුරු" "ගුරු උපකාර" කොටස පි. viii).
   ඈ. හැම ළමයෙක් සඳහාම (මෙම දැනමුතුකම් පොතේ මුල් පිටුවල සඳහන්)හදේතෝ පළිහේ පිටපතක් හෝ චිත්‍රයක්.
   ඉ. ක්‍රේයොන් සහ කතුරක්.
   ඊ. එක් එක් ළමයා සඳහා නූල් කෑල්ලක්.
6. ඔබට අවශ්‍ය ඕනෑම වර්ධන ක්‍රියාකාරීත්වයන් සඳහා පාවිච්චිකිරීමට අවශ්‍ය සූදානම්වීම් සකස්කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ස්වර්ගික පියාණන්වහන්සේට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සහ පංතියේ සිටින ළමයින්ට ඔබ තුල ඇති ප්‍රේමය ප්‍රකාශකරමින් ආරම්භක යාච්ඤාව දෙන්න.

**ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රේමකරනසේක.**

අවධානශීලී ක්‍රියාකාරීත්වය

ළමුන් අමතා ඔබ ගැන සහ ඔබගේ හැඟීම් ගැන මෙන්ම මෙම වසරේ ප්‍රාථමික පංතිය පිළිබඳ ඔබගේ අභිලාෂයන් ගැනත් මඳ වශයෙන් කථාකරන්න. එක් එක් ළමයාව අනෙක් ළමුන්ට හඳුන්වාදෙමින් ඔබ එම ළමයා ගැන දන්නා යමක් කියන්න.

හදේතෝ සටහන

ඔබ සකස්කල හදේතෝ සටහන පෙන්වන්න. මෙම වර්ෂයේ ප්‍රාථමිකයේ ළමයින් යේසුස් ක්‍රිස්තුස් ක්‍රිස්තුස්වහන්සේ, අපගේ ගැලවුම්කරුවාණන් ගැන ඉගෙනගන්නාබව ඔවුන්ට කියන්න. ඔවුන් ඉගෙන- ගන්නා ඉතාමත්ම වැදගත් දෙයක් නම්, යේසුස්වහන්සේ ඔවුන් එකිනෙකාට කෙතරම් ප්‍රේමකරනවාද යන්නය. ඔබගේ පංතියේ හැම ළමයෙකුටම යේසුස්වහන්සේ ප්‍රේම කරනබවට සාක්ෂි දරන්න. මෙම

උදාහරණයෙහි පරිදි, එක් එක් ළමයාගේ නම සඳහන් කරන්න: යේසුස්වහන්සේ ස්ටෙෆනිට ප්‍රේමකරන-සේක." ස්වර්ගික පියාණන්වහන්සේද ඔවුන් එකිනෙකාට ප්‍රේමකරන බවද ළමුන්ට කියන්න.

**අපි සතුටින් සිටීම ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපේක්ෂා කරනසේක.**

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ස්වර්ගික පියාණන්වහන්සේ අපට එපමණටම ප්‍රේමකරන නිසා, අප සතුටින් සිටීම උන්වහන්සේලාගේ අපේක්ෂාව බව ළමුන්ට කියන්න. ඔබ සැබෑලෙසම සතුටට පත්වූ යම් අවස්ථාවන් ළමුන් හා බෙදාගන්න. (උදාහරණවලට බෞතීස්මය ලැබීම, අන් අය සමග බෙදාගැනීම, ඔබගේ මිතුරන් සමග විනෝදජනක යමක් කිරීම, ඉලක්කයක් සපුරාගැනීමට කටයුතු කිරීම, ඔබගේ පවුලේ අය සමග ප්‍රීතිමත්වූ අවස්ථාවන්, යේසුස්වහන්සේ ගැන කියවමින් ඉගෙනගැනීම, දේවමාළිගාවේ විවාහවීම හෝ දූතමෙහෙයක සේවයකිරීම යනාදිය ඇතුළත්විය හැකිය).

ළමා සහභාගීත්වය

ළමයින් සතුටින් සිටින අවස්ථාවන් ගැන කීමට ඔවුන්ට ඉඩසලසන්න. ළමයින්ට යම් පෙළඹවීම් අවශ්‍ය නම්, පහත සඳහන් පරිදි ප්‍රශ්න අසන්න:

- ඔබගේ සොහොයුරු සොහොයුරියන් සමග ක්‍රීඩාකරන විට ඔබ සතුටුවන්නේද?
- ඔබ ඔබගේ මවට සහ පියාට උදව්වනවිට, ඔබ සතුටුවන්නේද?
- ඔබට යම් ප්‍රියතම ක්‍රියාකාරීත්වයක් කිරීමට ලැබුනුවිට ඔබ සතුටුවන්නේද?
- ඔබ සභාවට පැමිණෙන විට ඔබ සතුටුවන්නේද?

**හරි දේ තෝරාගැනීම සතුට ගෙනඑයි**

කථාන්තරය සහ සාකච්ඡාව

පහත සඳහන් කථාන්තරය ඔබගේම වචනයෙන් කියන්න.

ජේම්ස් අපගේ පංතියේ සාමාජිකයෙකුවීම සඳහාවන තිසි වයසේ සිටි පිරිමි ළමයෙක් විය. එක් දිනක් තම සුරතලාව පංතියට ගෙන ඒමට තමාට හැකිදැයි ඔහු ප්‍රාථමිකයේ ගුරුවරියගෙන් ඇසුවේය. ඔහුගේ ගුරුවරිය පිළිතුරු දෙමින්, "හරි දේ තෝරන්න ජේම්ස්, හරි දේ තෝරන්න" යයි කීවාය.

- ඔබ සිතන පරිදි ජේම්ස් තෝරාගත්තේ කුමක් කිරීමද?

ඔහු තම ප්‍රාථමිකයේ ගුරුවරිය අමතා තමාගේ මිතුරෙක් සභාවට ගෙන ඒමට හැකිදැයි ඇසූ විට, "හරි දේ තෝරන්න ජේම්ස්. නිතරම හරි දේ තෝරන්න" යයි ඇය කීවාය.

- ඔබ සිතන පරිදි ඔහු තෝරාගත්තේ කුමක්ද?

ජේම්ස්ගේ දෙමාපියන් මෙම වචනම කිහිපවරක්ම කියනු ඔහු අසා ඇත: "හරි දේ තෝරන්න, ජේම්ස්. ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන්නේ නිතරම හරි දේ තේරීමය."

- හරි දේ තෝරන්න යන්නෙන් අදහස්වන්නේ කුමක්ද?

එක් දිනක් ජේම්ස් පාසලේ සිට නිවසට පැමිණිවිට, ඔහුගේ මව ඔහුට එක් විස්කෝතුවක්ද ඔහුගේ සහෝදරයා සඳහා එක් විස්කෝතුවක් තබා තිබෙන බව දුටුවේය. ජේම්ස් විස්කෝතුවලට කැමති බැවින් ඔහු තමාගේ විස්කෝතුව ඉක්මණින්ම කෑවේය. ඉන්පසු ඔහු තම සොහොයුරාගේ විස්කෝතුව සෙවීය. ඔහුගේ සොහොයුරා නිවසේ නොසිටි අතර, "හරි දේ තෝරන්න ජේම්ස්. නිතරම හරි දේ තෝරන්න" යයි කීමට කිසිවෙක් අසල නොසිටියේය.

- ඔබ කුමක් කරන්නේද?
- ජේම්ස් හරි දේ තෝරන්නේ නම් ඔහු කුමක් කරන්නේද?

ජේම්ස් සිය සොහොයුරාගේ විස්කෝතුව කෑවේය. ජේම්ස්ගේ සොහොයුරා නිවසට පැමිණිවිට, තමාට විස්කෝතුවක් නොමැතිබව ඔහුට පෙනීගියේය. තමාට විස්කෝතුවක් තබා යෑමට තම මවට අමතකවී ඇතැයි ඔහු සිතීය. ඔහුට බොහෝ දුක සිතිනි. තම සොහොයුරාගේ විස්කෝතුව කෑම නිසා ජේම්ස්ට වරදකාරී හැඟීම් ඇතිවිය.

- ජේම්ස් තෝරාගත්තේ හරි දේද?
- තම තේරීම ගැන ජේම්ස් සතුටුවූවේද?
- ජේම්ස් දැන් කලයුතු දේ කුමක්ද?

ජේම්ස්ට ඔහු කල තේරීම නිවැරදි කිරීමට හැකි මාර්ග ගැන සිතීමට ළමුන්ට උපකාර කරන්න. හරි දේ කිරීමට අපි නිතරම උත්සාහ කලයුතු බව අවධාරනය කරන්න. නමුත්, අපි වැරදි තේරීම් කලහොත්, අපගේ වැරදි තේරීම් නිවැරදිකිරීමට අපි උත්සාහ කල යුත්තෙමු. අප වැරදි තේරීම් කලහොත්, අපි අසතුටට පත්වන්නෙමු. නමුත් අප හරි තේරීම් කලහොත්, අපි සතුටට පත්වන්නෙමු.

ශුද්ධ ලියවිලි

අප හරි දේ තෝරන විට, අපි සතුටුවන බව යේසුස්වහන්සේ අපට ප්‍රකාශකර තිබෙන බව ළමුන්ට කියන්න. මතෙව් 5:6 හෝ 3 නීෆායි 12:6 ශබ්දනගා කියවන්න. (*ධර්මිෂ්ඨබව* තුලින්). "ධර්මිෂ්ඨකමට සාපිපාසා" යන්නෙහි අදහස හරි දේ තේරීම බව පහදාදෙන්න. අප හරි දේ තෝරාගත් විට අපි අශිර්වා-දිත වන්නෙමු.

### හදේතෝ අදහස හරි දේ තෝරන්න යන්නය

හුණුලෑල්ලේ ක්‍රියාකාරීත්වය

- ඔබගේ මවට ඔබගේ සම්පූර්ණ නම නොලියා ඔබට අයත් යමක් සළකුණු කල හැක්කේ කෙසේද? (ඇයට ඔබගේ නමේ මුල් අකුරු ලිවිය හැක.)

අපගේ නමේ මුල් අකුරු අපගේ නම්වල ආරම්භක අකුරු බව පහදාදෙන්න.

ඔබගේ නමේ මුල් අකුරු ළමයින්ට කියන්න. ඒවා හුණුලෑල්ලේ ලියා එක් එක් මූලකුර අදාල පරිදි පෙන්වා ඔබගේ නම නැවත කියවන්න.

- ඔබගේ නමේ මුල් අකුරු මොනවාද?

ළමුන්ගේ නමේ මුල් අකුරු හුණුලෑල්ලේ ලියා ඔවුන් තම නම් නියෝජනයකරන්නේ කෙසේදැයි පෙන්-වන්න. මුල් අකුරු පළමුවෙන් ලියා පසුව නම්වල ඉතිරිය ලියන්න. (ඔබගේ පංතිය විශාල නම්, උදාහර-ණයක් ලෙස ළමයින් ස්වල්ප දෙනෙකුගේ මුල් අකුරු යොදාගන්න.)

පහත පෙන්වා ඇති පරිදි හුණුලෑල්ලේ හදේතෝ කියා සිරස් අතට ලියන්න. ළමුන්ට එම අකුරු කියවීමට හැකි නම්, ඔවුන්ට අත් එසවීමට කියන්න.

හ
දේ
තෝ

මුළු පංතියම සමග මුල් අකුරු ශබ්දනගා කියවන්න. මෙම මුල් අකුරුවලින් වැදගත් වචන තුනක් නියෝජනය වන බව ළමුන්ට කියන්න. වචන සම්පූර්ණකර හුණුලෑල්ලේ ලියන්න.

| |
|---|
| හරි<br>දේ<br>තෝරන්න |

ළමයින් සමග වචන කියවා මුල් අකුරු ඔවුන් ලවා නැවත කියවන්න. ඉන්පසුව මුල් අකුරුවලින් නියෝජනයවන්නේ මොනවාදැයි සියල්ලෝම එක්ව කියන්න.

ළමුන් "හදේතෝ" යයි කියනවිට, ඔවුන් "හරි දේ තෝරන්න" ගැන සිතිය යුතු බව අවධාරනය කරන්න. මෙම මුල් අකුරු මගින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමණය කිරීමට සහ ඔවුන් සතුටට පත්වෙන දේවල් කිරීමට ඔවුන්ට සිහිපත් කෙරෙන බව ඔවුන්ට කියන්න.

### හරි දේ තේරීමට අපට මතකතබාගත හැකිය

**හදේතෝ සටහන**

හදේතෝ සටහනේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පින්තූරයට යොමුවන්න. යේසුස්වහන්සේ පොළොවේ සිටියදී උන්වහන්සේ කල සහ ඉගැන්වූ දේවලින් බොහොමයක් මෙම වසරේ ප්‍රාථමිකයේ ළමයින් ඉගෙනගන්නා බව ඔවුන්ට කියන්න. යේසුස්වහන්සේ නිතරම හරි දේ තෝරාගත් බවත් එසේම අපද හරි දේ තෝරාගැනීම උන්වහන්සේට අවශ්‍ය බවත්, එවිට අප සතුටට පත්වී, අන් අයවද සතුටට පත්කිරීමට අපට උදව්වීමට හැකිවන බවත් පහදා දෙන්න. ළමයින්ට නැගිට සිටීමට සලස්වා හදේතෝ සටහනේ තිබෙන වචන එක්ව කීමට සලස්වන්න: "මම හරි දේ තෝරාගන්නෙමි."

**ගීතය**

"හරි මාර්ගය තෝරාගන්න" මෙය ගායනාකිරීමට හෝ වචන කීමට ළමයින්ට උදව් කරන්න. ළමයින්ට ගීතය හෝ එහි යම් වචන කිහිපයක් හෝ තනිවම කීමට හැකිවන තෙක් ගීතය කිහිප වරක් කියන්න.

**හදේතෝ මුදුව**

හදේතෝ මුදු, ඒවා නොමැති ළමයින්ට ලබා දෙන්න (හදේතෝ මුදු ලබා ගැනීමට නොහැකි නම්, හදේතෝ පළිහ ක්‍රියාකාරීත්වයට යොමුවී, පළිහේ සඳහන් වචන ගැන සාකච්ඡාකරන්න). සියලූම ළමයින්ට ඔවුන්ගේ මුදු දෙස බැලීමට සලස්වන්න.

- මුදුවේ සඳහන් මුල් අකුරු වලින් නියෝජනයවන්නේ කුමක්ද? (හරි දේ තෝරන්න.)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ගෙන් අපේක්ෂාකරන්නේ හරි දේ තේරීම බව සිහිපත් කරගැනීමට ඔවුන්ගේ හදේතෝ මුදු ඔවුන්ට උදව්කරන බව ළමුන්ට කියන්න.

**හදේතෝ පළිහ ක්‍රියාකාරීත්වය**

එක් එක් ළමයාට ක්‍රේයොන් සහ හදේතෝ පළිහේ පිටපතක් පාටකිරීමට දෙන්න. පළිහේ මුදුනින් කුඩා සිදුරක් සාදා එතුලින් නූල් කැබැල්ලක් ඇමීනීමට එක් එක් ළමයාට උදව් කරන්න. නූලට ගැටයක් දමන්න. එවිට ළමයාට එම පළිහ ඔහුගේ හෝ ඇයගේ කර වටා පැළඳගත හැකිය.

**සාරාංශය**

සාකච්ඡාව නැවතකිරීම

- හදේතෝ යන්නෙහි අදහස කුමක්ද?
- හරි දේ තෝරන්න යන්නෙහි අදහස කුමක්ද?
- අප එකිනෙකාට ප්‍රේමකරමින් අප සතුටින් සිටීම අපේක්ෂාකරන්නේ කවුද? (ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.)
- අපට සතුටින් සිටීම සඳහා ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ අප කුමක්කිරීම අපේක්ෂා කරන්නේද?

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ස්වර්ගික පියාණන්වහන්සේ අපට ප්‍රේමකරමින් අප සතුටින් සිටීම අපේක්ෂාකරන බවට ඔබගේ සාක්ෂිය දරන්න. ස්වර්ගික පියාණන්වහන්සේව සහ යේසුස්වහන්සේව අනුගමනය කිරීමෙන් සහ හරි දේ තේරීමෙන් අපට සමාදානය සහ සතුට සොයාගැනීමට හැකි බව ළමුන්ට කියන්න.

ප්‍රාථමිකයට පැමිණීමෙන් හරි දේ තෝරාගැනීම ගැන ළමුන්ට ප්‍රශංසාව පුදකර, හැම සතියකම පැමි-ණීමට ඔවුන්ව දිරිගන්වන්න.

හදේතෝ සටහනේ වචන ("මම හරි දේ තෝරමි") ඉදිරි සතිය තුළදී කටපාඩම් කිරීමට ළමුන් දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් හොඳින් සරිලන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට හෝ නැවත බැලීමක් හෝ සාරාංශයක් ලෙසද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා "පංති වෙලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. මෙම වර්ෂයේදී ළමයින් ප්‍රාථමිකයේදී හරි දේ තෝරාගැනීම ගැන බොහෝ දේවල් ඉගෙනගන්නා බව ඔවුන්ට පහදාදෙන්න.

   පින්තූර 2-4, පොලොවට පෙර ජීවිතය; පින්තූරය 2-24, මසුන් අල්ලන්නන් කැඳවීම; සහ පින්තූරය 2-39, ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයා ප්‍රදර්ශනය කරන්න. හරි දේ තෝරාගත් වැදගත් මිනිසුන් කිහිපදෙනෙකු ගැන ළමයින් ඉගෙනගැනීමට යන බව ඔවුන්ට කියන්න. එක් එක් පින්තූරය ගැන කෙටි සමාලෝචනයක යෙදෙන්න.

   - පින්තූරය 2-4. පොලොවට පැමිණීම තෝරාගැනීමෙන් අපි හරි දේ තෝරාගත්තෙමු (බලන්න 4වෙනි පාඩම).
   - පින්තූරය 2-24. යේසුස්වහන්සේගේ ප්‍රේරිතවරු උන්වහන්සේව අනුවයාමට තම දැල් අත්හැරීමෙන් හරි දේ තෝරාගත්හ (බලන්න 15වෙනි පාඩම).
   - ජෝසෆ් ස්මිත් සත්‍ය සභාව සොයාගැනීමට යාච්ඤාකිරීමෙන් හරි දේ තෝරාගත්තේය (බලන්න 20වෙනි පාඩම).

2. ළමයින්ට එකිනෙකා ගැන වඩා හොඳින් වටහාගැනීම සඳහා, එක් එක් ළමයාගේ නම කොල කැබැල්ලක ලියා එම කොල භාජනයක දමන්න. හැම ළමයෙකුටම භාජනයෙන් නමක් තෝරාගැ-නීමට සලස්වා, පංතියේ අනෙක් ළමුන් එම පුද්ගලයා කව්දැයි අනුමාන ලෙස සිතන තුරු, නම ලියා තිබෙන තැනැත්තා ගැන හෝඩුවාවල් දෙන්න. හෝඩුවාවල්වලට මෙවැනි ප්‍රකාශ ඇතුලත්කල හැකිය: "මෙම පුද්ගලයා බොහෝ සිනහසෙයි, " "මෙම පුද්ගලයා නිල් පාට යමක් ඇඳ සිටියි" හෝ "මෙම පුද්ගලයාට කළු හිසකෙස් ඇත."

3. ළමුන් ගත හැකි යම් පියවරවල් විස්තර කරන්න. එම පියවර නිවැරදි තේරීම නියෝජනය කරයි නම් ළමුන්ට සිටගැනීමටත්, පියවර වැරදි තේරීමක් නියෝජනයකරයි නම්, හිඳගැනීමටත් කියන්න. පහත සඳහන් උදාහරණ පාවිච්චිකරන්න. නැතහොත් ඔබම නිර්මානය කරගන්න:

- උදෑසන අවදිවන්න, එවිට නියමිත වෙලාවට සභාවට යාමට ඔබට පුළුවන.
- ඔබට අවශ්‍ය පරිදි උදෑසන ආහාරය නොලැබෙන විට ශබ්දනගා චෝදනාකරන්න.
- ඔබගේ කුඩා සොහොයුරියට ඇයගේ නැතිවූ සපත්තුව සොයාගැනීමට උදව්කරන්න.
- ඔබගේ ප්‍රාථමික පංතියේ අළුත් ළමයාට "හලෝ" කියන්න.
- ඔබ රැස්වීම් ශාලාවට ඇතුල්වන විට ශබ්දනගා පියවර තබන්න.
- සක්‍රමේන්තු කාලයේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සිහිපත්කරන්න.
- ඔබගේ ප්‍රාථමික පාඩමට නිශ්ශබ්දව සවන්දෙන්න.

# මට හරි දේ තේරීමට පුළුවන

## 2 වෙනි පාඩම

**අරමුණ**

මෙලෙස ඇසීමෙන් හරි දේ තෝරාගැනීමට ඔහුට හෝ ඇයට හැකිබව එක් එක් ළමයාට තේරුම්ගැනීමට උපකාර කිරීමය. "මා කුමක් කිරීම යේසුස්වහන්සේ අපේක්ෂාකරන සේක්ද?"

**සූදානම්වීම**

1. 2 නිෆායි 31:10 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.
2. පාඩමේ එන පාඩම පෙන්වාදීම සඳහා බිත්තර සහිත කූඩුවක් සාදන්න. භාජනයකට කෝටුකෑලි, තණකොල හෝ නූල් කෑලි පුරවන්න. හොඳින් තැම්බන ලද බිත්තර තුනක් කූඩුවට දමන්න. බිත්තර ලබාගත නොහැකි නම්, බිත්තර හැඩයට කැපූ කඩදාසි කැබලි තුනක් කූඩුවට දමන්න.
3. කොල කෑලි පහක් ගෙන එකේ සිට පහ දක්වා අංක දමා ඒවා කුඩා මල්ලක හෝ වෙනත් භාජනයක දමන්න.
4. "මම යේසුස්වහන්සේ මෙන් වීමට උත්සාහ කරමි, යන ගීතය ගායනා කිරීමට හෝ වචනකීමට හෝ සූදානම්වන්න *(ළමා ගී පොත,* පි. 78). මෙම ගීතයට වචන අත් පොතේ පිටුපස දැක්වේ.
5. අවශ්‍ය උපකරණ:
   අ. මෝර්මන්ගේ පොතක්
   ආ. හදේතෝ සටහන (බලන්න 1වෙනි පාඩම).
6. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිමත් කලේ නම්, ළමුන්ගෙන් එය සොයා බලන්න. හදේතෝ සටහනේ ("මම හරි දේ තෝරාගන්නෙමි") යන වචන කටපාඩම්දැයි ළමයින්ගෙන් ඇසීමට ඔබට අවශ්‍යවිය හැක.

**අප හරි දේ තෝරාගැනීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපේක්ෂාකරනසේක**

අවධානශීලී ක්‍රියාකාරීත්වය

"නායකයා අනුගමනය කරන්න" යන්න ළමුන් ලවා රඟදක්වන්න. ළමයි පේළියට සිටගෙන සිටිති. පේළියේ පළමු ළමයා, දුවයි, තනි කකුලෙන් පනියි, පැන පැන යයි, නැතහොත් වෙන යමක් කරමින් කාමරයේ අනෙක් පැත්තට යයි. අනෙක් ළමයින්ද පළමු ළමයා කලදෙයම කරමින් එය අනුගමනය කරති. ඉන්පසු පළමු ළමයා පේළියේ අන්තිමට යන අතර දෙවැනි ළමයා නායකයා වෙයි. හැම ළමයෙකුටම නායකයා වීමට වාරයක් ලැබෙන තුරු එය දිගටම කරන්න.

ශුද්ධ ලියවිලි සාකච්ඡාව

2 නිෆායි 31:10 පළමු කොටස, *නුඹ මා අනුගමනය කරන්නෙහිය,* දක්වා ශබ්දනගා කියවන්න. මෙම වචන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශකල බව පහදාදෙන්න. අපි යේසුස්වහන්සේ අනුගමනයකිරීම උන්වහන්සේගේ අපේක්ෂාවවේ.

- අපි යේසුස්වහන්සේ අනුගමනයකරන්නේ කෙසේද?

2 නිෆායි 31:10 ඉතිරි කොටස ශබ්දනගා කියවන්න. අප පණත්වලට කීකරුව, උන්වහන්සේ කැමති දේවල් කරන විට, අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනයකරන බව පහදාදෙන්න.

හදේතෝ සටහන

හදේතෝ සටහන පෙන්වන්න. ළමයින් යේසුස්වහන්සේ ගැන වැඩි දුර ඉගෙනගන්නා විට, හරි දේ කුමක්ද කියා යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අපට කියන නිසා, ඔවුන්ට වඩා හොඳ තේරීම් කිරීමට හැකිවන බව කියන්න.

අපට අසීරු තේරීමක් කිරීමට සිදුවනවිට, හරි දේ කුමක්ද කියා අපට දැනගැනීමට උපකාරීවිය හැකි ප්‍රශ්නයක් අපට අපගෙන්ම ඇසීමට හැකිය. එම ප්‍රශ්නය නම්, "මා කුමක් කිරීම යේසුස් වහන්සේට අවශ්‍යවන්නේද?"

කථාන්තරය සහ සාකච්ඡාව

ඔබ සෑදූ කූඩුව පෙන්වාදීමක් ලෙස පාවිච්චි කරමින් පහත සඳහන් කථාව ඔබගේම වචනවලින් කියන්න:

වොරන් නම් තරුණ පිරිමි ළමයෙක් කුරුළු රක්ෂස්ථානයක් අසල ජීවත්විය. රක්ෂස්ථානය යනු කුරුල්ලන්ට ආරක්ෂාව සැපයෙන ස්ථානයකි. වොරන්ගේ පියාගේ රක්ෂාව වූයේ කුරුල්ලන් ආරක්ෂාකිරීමට උදව්වීමය. සිය නිවස අසල උසට වැඩුන තණකොල අතර තිබූ කූඩුවක් වොරන් දුටු අතර, කුරුළු අම්මා පිටත සිටි අවස්ථාවක කූඩුවේ තිබෙන බිත්තර දැකගැනීමට වොරන් තුල අශාවක් ඇතිවිය. එක් දිනක් වොරන් බිත්තර දෙස බලා සිටින විට, ඔහුට විශාල ශබ්දයක් ඇසින. ඔහු උඩ බැලූ විට ඔහුගේ පාසලේ පිරිමි ළමයින් දෙදෙනෙක් ගල් පටියකින් කුරුල්ලෙකුට විද ඇති බව ඔහු දුටුවේය.

වොරන් දුටු ළමයින් දෙදෙනා කූඩුව බැලීමට එහි පැමිණියහ. එක් ළමයෙකුට බිත්තර පොඩිකර දැමීමට අවශ්‍යවිය. බිත්තර පොඩි නොකල යුතු බව වොරන් ළමයින්ට ඒත්තු ගැන්වීය. රක්ෂස්ථානයක කුරුල්ලන් මැරීම නීතියට විරුද්ධබවද ඔහු ඔවුන්ට කීවේය. තමන් කුරුල්ලෙක් මැරූ බව කිසිවෙකුට නොකියන ලෙස පිරිමි ළමයි වොරන්ට කීහ. නීතිය කඩකිරීම සඳහා දඬුවම් ලැබීමට ඔවුහු අකමැතිවූහ. වොරන් නිවසට යන විට, තමා කල යුත්තේ කුමක්දැයි සිතමින් ඔහු ඇවිදගියේ ඉතා සෙමින්ය. ඔහු පිරිමි ළමයින් ගැන තම පියාට කිවහොත්, ඔවුන් ඔහුව විහිළුවකට ගැනීමට හෝ ඔහුට හිරිහැර කිරීමට හෝ ඉඩ ඇත.

හදේතෝ සටහනේ යේසුස්වහන්සේගේ පින්තූරය පෙන්වන්න.

- වොරන්ට හරි දේ තෝරාගැනීමට හැකිවීම සඳහා ඔහු තමන්ගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද? ("යේසුස්වහන්සේට අවශ්‍ය මා කුමක් කිරීමද?")
- ඔබ කරන්නේ කුමක්ද?

එම පිරිමි ළමයින් ගැන තම පියාට කීමට වොරන් තීරණය කළේය. ඔහුගේ පියා ඔහු අමතා තමා එම ළමයින් සමග සහ ඔවුන්ගේ දෙමාපියන් සමගද කථාකරන බව කීවේය. තමාට එම පිරිමි ළමයින්ව පාසැලේදී දැකීමට කණගාටු බව වොරන් තම පියාට පැවසූ විට, එම ළමයින්ව මිතුරන්කර ගැනීමට මගක් වොරන්ට ලැබෙන බවට පියා යෝජනා කළේය.

කුරුල්ලන්ට ගල් විදින, උන්ගේ බිත්තර පොඩිකර දමන පිරිමි ළමයින් සමග මිතුරුවීමට වොරන්ට අවශ්‍ය නොවීය. තම පියා එම යෝජනාව කිරීම ගැන වොරන් අවුල් සහගත විය. එම මුළු රාත්‍රියේම වොරන් තම පියා කී දෙය ගැන සිතීය. වොරන්ට වෙනත් තීරණයක් ගැනීමට තිබින.

- වොරන්ට ගැනීමට තිබූ තීරණය කුමක්ද?

හදේතෝ සටහනේ යේසුස්වහන්සේගේ පින්තූරය නැවත පෙන්වන්න.

- වොරන් තමාගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවශ්‍ය මා කුමක් කිරීමද?)
- වොරන් කල යුත්තේ කුමක්ද?

වොරන්ට නැවතත් පිරිමි ළමුන්ව හමුවූවිට, ඔවුන් ගැන ඔහුගේ පියාට පැවසීම නිසා ඔවුහු ඔහු සමග අමනාපව සිටියහ. ඔහුට හිරිගැරකරන බවට ඔවුහු තර්ජනය කළහ. වොරන් බියට පත් නමුත්, යේසුස්වහන්සේ ඔහුගෙන් අපේක්ෂාකරන පරිදි කටයුතු කිරීමට ඔහු තීරණය කළේය. ඔහු එම ළමුන් අමතා, ඔහු සහ ඔහුගේ පියා සෙනසුරාදා ගමනක් යන බැවින් ඔවුන්ද ගමන යාමට ඒමට කැමතිදැයි ඇසුවේය. පුදුමයට පත්වූ ළමෝ මඳ වේලාවක් කිසිත් නොකියා සිටියහ. වොරන් ඔවුන් සමග මිත්‍ර-ශීලීවීම ඔවුහු බලාපොරොත්තු නොවූහ. අවසානයේදී ගමන යාමට ඔවුහු එකඟවූහ. වොරන් පිරිමි ළමුන්ගෙන් සමුගත්විට, ඔහුට සමාදාන හැඟීමක් ඇති විය. ළමුන් ඔහුගේ මිතුරන් කරගැනීම කල යුතුව තිබූ හරි දේ බව ඔහු දැනගත්තේය (Adapted from Claudia Remington, “The Nest,” *Friend,* May 1980, pp. 2–5.)

- වොරන්ට සමාදාන හැඟීමක් ඇතිවුනේ මන්ද?
- ඔබ හරි දේ තෝරාගෙන යේසුස්වහන්සේ ඔබගෙන් අපේක්ෂාකල දේ කල නිසා ඔබට සමාදාන හැඟීමක් ඇතිවූයේ කවදාද?

හරි දේ තෝරාගැනීමෙන් ළමයින් ලද යම් අත්දැකීම් ගැන කථාකිරීමට ඔවුන්ට ආරාධනා කරන්න.

### යේසුස්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන දේවල් අපට කළහැකිය

සාකච්ඡාමය ක්‍රියාකාරීත්වය

“යේසුස්වහන්සේ මාගෙන් අපේක්ෂාකරන්නේ කුමක් කිරීමද?” යන ප්‍රශ්නය ළමුන් ලවා නැවතත් කියවන්න. ඔවුන් මෙම ප්‍රශ්නයට පිළිතුරුදීම පුහුණුවීමට යන බව ඔවුන්ට කියන්න. අංක ලියූ කොල කැබලි සහිත මල්ල හෝ භාජනය පෙන්වන්න. ළමයින්ට වාර අනුව කොල කැබල්ලක් තෝරාගන්න දෙන්න. එක් එක් ළමයා තෝරාගත් අංකයට අනුරූප අවස්ථාව කියවා, ළමයා ලවා ප්‍රශ්නයට පිළිතුරු ලබාගන්න. (ඔබට විශාල පංතියක් තිබේ නම්, අවස්ථා වැඩි ගණනක් එක්කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

1. ඔබ කැබලිවලින් යමක් ගොඩනගයි, ඔබගේ ළදරු සොහොයුරිය ඔබ සෑදූ දෙය කඩාදමයි.
    - ඔබ ඔබගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද?
    - යේසුස්වහන්සේ ඔබ කුමක්කිරීම අපේක්ෂා කරනසේක්ද?
2. ඔබගේ මිත්‍රයා ක්‍රීඩාකිරීමට ඔබගේ නිවසට පැමිණ ඇත. ඔබගේ සොහොයුරාට ඔබ සහ ඔබගේ මිත්‍රයා සමග ක්‍රීඩාකිරීම අවශ්‍යවෙයි. නමුත් ඔබ වඩා කැමති ඔබගේ මිත්‍රයා සමග ක්‍රීඩාකිරීමටය.
    - ඔබ ඔබගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද?
    - යේසුස්වහන්සේට අවශ්‍ය ඔබ කුමක් කිරීමද? (ක්‍රීඩාකිරීමට ඔබගේ සොහොයුරාට ආරාධනාකිරීම පමණක් පිළිතුර නොවනබව පෙන්වාදෙන්න; වෙනත් විසඳුම් ඉදිරිපත් කිරීමට ළමුන්ට උදව්කරන්න.)
3. යාබද නිවසේ ළමුන් සමග බෝල ගැසීමට ඔබට අවශ්‍යවෙයි. ඔවුහු ඔබට අපහාස වචන කියමින් ඔබට ගෙදර යන ලෙස කියති. ඔවුන්ටත් අපහාස වචන කීමට ඔබට හැඟීමක් ඇතිවේ.
    - ඔබ ඔබගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද?
    - යේසුස්වහන්සේ ඔබ කුමක් කිරීම අපේක්ෂාකරන සේක්ද?
4. ඔබ ක්‍රීඩාකිරීමට යාමට පෙර, ඔබගේ ඇඳ සකස්කරන ලෙස ඔබගේ මව ඔබට කියයි. ඔබගේ මිතුරෝ ඔබ එන තුරු ඉදිරි දොර ලඟ බලාසිටිති.
    - ඔබ කුමන ප්‍රශ්නය ඔබගෙන්ම ඇසිය යුතුද?
    - ඔබ කුමක්කිරීම යේසුස්වන්සේ ඔබගෙන් අපේක්ෂා කරනසේක්ද?

5. ඔබගේ නිවස වටා මිදුල පිරිසිදු කිරීමට ඔබගේ පියාට ඔබගේ උදව් අවශ්‍යවෙයි. ඊට වඩා නිවසට ගොස් ඔබ කියවමින් සිටි පොත නිම කිරීම ඔබට අවශ්‍යවේ.

   - ඔබ ඔබගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය කුමක්ද?
   - ඔබ කුමක් කිරීම යේසුස්වහන්සේ ඔබගෙන් අපේක්ෂා කරනසේක්ද?

හැම අවස්ථාකදීම අපි කලයුතු දේ ගැන යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලින් ප්‍රකාශ නොවන බව පැහැදිළි කරන්න. යේසුස්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ ඥානවන්ත ලෙස තේරීම් කිරීමට ඉගෙනගැනීමය. උන්වහන්සේට අවශ්‍යවන්නේ සිතන අන්දම මෙන්ම ප්‍රේමය සහ කරුණාව පෙන්වන අන්දම ගැනත් අප ඉගෙනගැනීමය.

**සාරාංශය**

ගීතය — ළමයින් සමග "යේසුස්වහන්සේ මෙන් වීමට මම උත්සාහ කරමි" යන ගීතය ගායනාකරන්න නැත-හොත් එහි වචන කියන්න.

සාක්ෂිය — හරි දේ තෝරාගැනීමෙන් අපට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන්වීමට හැකි බව ළමයින්ට මතක්කරන්න. යේසුස්වහන්සේ ඔවුන්ට ප්‍රේමකරන බව සහ හරි දේ තේරීම ඔවුන්ගෙන් අපේක්ෂාකරන බවත්, එවිට ඔවුන්ට ප්‍රීතිමත්, සමාදාන හැඟීම් ඇතිවන බවට සාක්ෂි දරන්න.

මෙම සතිය තුළදී ළමුන්ට තීරණයක් ගැනීමට තිබේනම්, තමන්ගෙන්ම මෙසේ ඇසීමට ඔවුන්ව දිරිගන්-වන්න. "මා කුමක් කිරීම යේසුස්වහන්සේ මගෙන් අපේක්ෂාකරන සේක්ද?"

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. ඔවුන් කුමක් කිරීම යේසුස්වහන්සේ අපේක්ෂා-කරන්නේදැයි තමන්ගෙන්ම ඇසීමට පංති සාමාජිකයන්ට සිහිපත්වීමට යාච්ඤාකරන ලෙස ළමයාගෙන් ඉල්ලන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැලපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් ලෙසද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ළමයින්ට කොල සහ ක්‍රේයොන් ලබාදී ඔවුන් කරතැයි යේසුස්වහන්සේ බලාපොරොත්තු වන, සභාවට පැමිණීම, ඔවුන්ගේ දෙමාපියන්ට උදව්කිරීම, හුදකලාවූ ළමයෙකු සැනසීම හෝ ඔවුන්ගේ සොහොයුරු සොහොයුරියන් සමග සෙල්ලම්කිරීම වැනි දේවල් ඇඳීමට කියන්න. හැම ළමයෙකුගේම කොළයේ, *මා කුමක් කිරීම යේසුස්වහන්සේ මගෙන් අපේක්ෂාකරන සේක්ද?* කියා ලියන්න.

2. "හරි දේ කිරීමට බියනොවන්න" *ළමා ගී පොත,* පි. 158)හෝ "නීෆායිගේ දිරිය" (*ළමා ගී පොත,* පි. 120) යන ගීත ගායනාකරන්න, නැතහොත් එහි වචන කියන්න. "හරි දේ කිරීමට බියනොවන්න" ගීතයට වචන මෙම අත් පොතේ පිටුපස ඇතුලත්වේ. ඔබ ගායනාකිරීමෙන් පසුව, වොරන්ගේ කථාව ගැන ළමයින්ට මතක් කරන්න. වොරන්ට අසීරු තේරීම් කිහිපයක් ගැනීමට සිදුවිය.

   - සමහර අවස්ථාවලදී හරි දේ තේරීම අසීරුවන්නේ මන්ද?

   සමහර අවස්ථාවලදී එසේ අසීරුවූවද, හරි දේ තේරීමට අපි නිතරම උත්සාහකරන්නේ නම්, අපට සාමකාමී, ප්‍රීතිමත් හැඟීම් ලැබෙනු ඇත.

නිෆායිගේ දිරිය

ස්වාමීන් අණකළේ නිෆායිට ගොස් ගෙනෙන ලෙස තහඩු
නපුරු ලාබන්ගෙන් නගර ගේට්ටු ඇතුලේ
ලේමන් ලැමුවෙල් දෙදෙනා උත්සාහයට බියෙන්
නිෆායි දිරියෙන් සිටියා. මෙයයි ඔහුගෙ පිළිතුර:
"මම යන්නෙමි; ස්වාමීන් අණකල දේ මම කරමි.
ස්වාමීන් සලසයි මගක් මම දනිමි; කීකරුවීම මගෙන් සොයයි එතුමා
මම යන්නෙමි. ස්වාමීන් අණකල දේ මම කරමි.
ස්වාමීන් සලසයි මගක් මම දනිමි. කීකරුවීම මගෙන් සොයයි එතුමා."

© 1986 by Wilford N. Hansen jr. and Lisa Tensmeyer Hansen. Used by permission.)

3. පාඩමේ අවසානයේ සඳහන් අත් පත්‍රිකාවෙන් පිටපතක් එක් එක් ළමයා සඳහා සකස්කරන්න. අත් පත්‍රිකාවේ පහත තිබෙන කුඩා වචනතීරු කපන්න (අංක ඉවත් කරන්න). ගීතයේ පිටපතක් සහ වචනතීරු යුගලක් එක් එක් ළමයාට දෙන්න. වචනතීරු සහ අත්පත්‍රිකාවේ සඳහන් ගීතය කියවා, වචනතීරු, ගීතයට ගැලපෙන ස්ථාන තීරණයකිරීමට ළමුන්ට උදව්කරන්න. ළමයින්ට මැලියම් ස්වල්පයක් හෝ ටේප් පටි ලබාදී, ඔවුන්ගේ ගීත පිටපතේ අදාල පරිදි අලවන ලෙස කියන්න. ඔවුන්ගේ නම් අත්පත්‍රිකාවේ ලියන්න. නැතහොත් ඔවුන් ලවා ලියවන්න.

ළමයින් ඔවුන්ගේ අත්පතිකා අලවා නිමවූ විට, "හරි මාර්ගය තෝරන්න" යන ගීතය වරක් හෝ දෙවරක් ගායනාකිරීමට ඔවුන්ට උදව්කරන්න. හොඳ වැඩක් කිරීම ගැන ඔවුන්ට ප්‍රශංසා කරන්න.

# හරි මාර්ගය තෝරන්න

*ජීවත්වෙමින් සතුටින් සිටීමට* ______(1)______ *මගක් ඇත.*

එය හැම දිනකම ______(2)______.

*මම* ______(3)______ *ඉගැන්වීම් ඉගෙනගනිමි.*

ඒවා මට උදව්කරමින් මාර්ගය පෙන්වයි

______(4)______ සතුටින් සිටින්න

මා නිතරම ______(5)______ යුතුය.

---

*(1)* නිවැරදි

*(2)* හරි දේ තෝරාගැනීමෙනි

*(3)* යේසුස්වහන්සේගේ

*(4)* හරි දේ තෝරා

*(5)* හරි දේ තෝරා

# මම දෙවියන්වහන්සේගේ දරුවෙක්මි

**3**
වෙනි
පාඩම

---

**අරමුණ**


අපි ස්වර්ගික පියාණන්වහන්සේගේ දරුවන් නිසා උන්වහන්සේ අප එකිනෙකාට ප්‍රේමකරන බව එක් එක් ළමයාට අවබෝධකරගැනීමට උපකාරවත්වීමය.

---

**සූදානම්වීම**

1. ගීතාවලිය 82:6 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න. හෙබ්‍රෙව් 12:9; මෝසස් 1:39; සහ සුභාරංචි මූලධර්ම (31110), 2වෙනි පරිච්ඡේදයද බලන්න.

2. කඩදාසි බෝනික්කෙක් කඩදාසි කැබැල්ලක් නවා එකෝඩියන් අනුරූපකට සාදාගන්න (පහත දැක්වෙන නිදර්ශනය බලන්න). කොලයේ නැමූ දාරය මත පුද්ගලයෙකුගේ රූපයක උඩු කය අඳින්න. රූපය වටේට කපන්න. නමුත් නැමූ දාරයේ ඇති ශරීරය හෝ එහි අත වටා නොකපන්න. බෝනික්කාගේ සම්බන්ධවී තිබෙන අත් දිග හැරෙයි. පංතිය තුළදී ළමයින් බලාසිටින විට බෝනික්කා කැපීමට ඔබට අවශ්‍යවිය හැක. නැතහොත් එක් එක් ළමයා වෙනුවෙන් කුඩා බෝනික්කන් සාදන්න.



3. වචනතීරු තුනක් සූදානම්කරන්න.

| ජීවය |
|---|
| භෞතික ශරීරය |
| පවුල |

4. "මගේ ස්වර්ගික පියාණන්වහන්සේ මට ප්‍රේමකරනසේක" (*ළමා ගී පොත, පි. 228*) සහ "මම දෙවියන්වහන්සේගේ දරුවෙක්මි" (ළමා ගී පොත, පි. 2) යන ගීත ගායනාකිරීමට හෝ එහි වචන කීමට සූදානම්වන්න. "මම දෙවියන්වහන්සේගේ දරුවෙක්මි" ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

5. අවශ්‍ය උපකරණ
   අ. බයිබලයක්
   ආ. කුඩා කැඩපතක්

ඇ. ඇඟිලි පහක අත්වැස්මක් (අත්වැස්මක් නොමැතිනම්, අත්වැස්මක පින්තූරයක් හෝ චිත්‍රයක් ගෙන ඒමට ඔබට හැකිය).

ඇ. පින්තූරය 2-2, බිළිඳෙකු සමග පවුලක් (62307), හෝ අළුත උපන් බිළිඳෙකුගේ ඡායාරූපයක්.

6. ඔබ පාවිච්චිකිරීමට කැමති යම් සාරවත් ක්‍රියාකාරීත්වයන් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදි යමක් කිරීමට ඔබ ළමයින් දිරිගැන්වූයේ නම්, ළමුන්ගෙන් එය සොයාබලන්න. "මා කුමක් කිරීම යේසුස්වහන්සේට අවශ්‍යවන සේක්ද?" යයි ඔවුන් ඔවුන්ගෙන්ම අසා තිබෙන බැවින් ඔවුන්ගේ අත්දැකීම් ගැන විමසීමට ඔබට අවශ්‍යවිය හැක.

### මා කවරෙක්ද?

අවධානශීලී ක්‍රියාකාරකම

ප්‍රශ්නය අසන්න:

- මා කවරෙක්ද?

ළමුන් පිළිතුරු දීමෙන් පසුව, ඔබගේ සම්පූර්ණ නම කියන්න.

එක් එක් ළමයා ඉලක්කකොට අසන්න, "ඔබ කවරෙක්ද?හැම ළමයෙක්ම ඔහුගේ හෝ ඇයගේ නම සඳහන්කරමින් පිළිතුරුදීමට සලස්වන්න. අප සෑම කෙනෙක්ම අනගි කෙනෙක් බව පැහැදිළිකරන්න.

සාකච්ඡාව

බිළිඳෙකු සමග පවුලක් පින්තූරය 2-2, පෙන්වා පවුලේ සාමාජිකයන්ව පෙව්වීමට ළමුන්ට කියන්න. නැතහොත් අළුත උපන් ළමයෙකුගේ පින්තූරයක් පෙන්වන්න.

- ඔබ සිතන පරිදි මෙම බිළිඳාගේ වයස කීයද?
- මෙම ළමයා පොළොවේ ඉපදීමට පෙර ඔහු ජීවත්වූයේ කොහේද?

මෙම පොළොවට පැමිණීමට පෙර, අප සියලුදෙනාම ස්වර්ගික පියාණන්වහන්සේ සමග ස්වර්ගයේ ජීවත්වූ බව පහදාදෙන්න. අපි උන්වහන්සේගේ දරුවන් වෙමු. අපි උන්වහන්සේට ස්වර්ගික පියාණන්න් යයි අමතන්නේ එනිසාය. අපි අපගේ ස්වර්ගික මෑණියන් හා ස්වර්ගික පියාණන්ගේ අනෙකුත් දරුවන් සමගද ජීවත්වුනෙමු. මෙම පොළොවේ ඉපදුන සෑම කෙනෙක්ම ස්වර්ගිය පියාණන්ගේ දරුවෙකි. ස්වර්ගික පියාණන් හා සමග ජීවත්වුන බව අපට මතක නැත. නමුත් අප ශුද්ධ ලියවිලි වල කියවන නිසා අප උන්වහන්සේගේ දරුවන් බව අපි දන්නෙමු.

ශුද්ධ ලියවිල්ල

ගීතිකා 82:6, *තුඹලා සියලු දෙනාම* යන අවසාන කොටස ශබ්දනගා කියවන්න. *වඩාත් උසස්ම* යනු ස්වර්ගික පියාණන්වහන්සේ බව පහදාදෙන්න.

ස්වර්ගික පියාණන්වහන්සේගේ සියලුම ඇදහිලිමත් ආත්මික දරුවන්ට පොලොවට පැමිණීමට අවශ්‍ය බව පහදාදෙන්න. උන්වහන්සේගේ බොහෝ ආත්මික දරුවන් දැනටත් ඉපදී ඇති නමුත්, තව බොහෝ දෙනෙක් පොලොවට පැමිණීමට බලා සිටිති.

### අපට ආත්මයක් ඇත

සාකච්ඡාව

"ආත්මය" නම් වචන තීරුව පෙන්වන්න.

මෙම පොලොවට පැමිණීමට පෙර අප ස්වර්ගයේ ජීවත්වන විට, අපට භෞතික ශරීර නොතිබුන බව පහදාදෙන්න. අපි ආත්මයන් වූයෙමු.

- ආත්මයක් යනු කුමක්ද?

අපගේ ආත්ම වනාහි අපට ජීවය ලබා දෙන අපගේම කොටසක් බව පහදාදෙන්න.

- ඔබ සිතන අන්දමට අපගේ ආත්ම කුමන ආකාරද?

කුඩා කැඩපතක් ළමුන් අතරට යවා, එක් එක් ළමයාට එතුලින් බැලීමට සලස්වන්න. කැඩපත මගින් ඔවුන්ගේ ආත්මවල පෙනීම ගැන යම් අදහසක් ලැබුනේදැයි ළමයින්ගෙන් අසන්න.

අපගේ අත්මද, අපගේ භෞතික ශරීර වාගේම බව පහදාදෙන්න. උදාහරණයක් ලෙස, ආත්මවලට ඇස්, කන්, අත් සහ පාද ඇත.

භාණ්ඩ පාඩම

අත් වැස්මක් මේසය මත තබන්න. අත්වැස්ම අතක හැඩයට තිබුනද, එයට සෙලවීමට නොහැකිවන්නේ එය ජීවමාන නොවන නිසා බව පහදාදෙන්න. අතක් අත්වැස්මක් තුලට දැමූවිට, එවිට අත්වැස්ම සෙලවිය හැකිය. ඔබගේ අත අත්වැස්ම තුලට දමා ඔබගේ ඇඟිලි සොලවන්න. අත්වැස්ම භෞතික ශරීරය බවත්, අත අත්මය වගේ බවත් පහදාදෙන්න. අපගේ ආත්ම ශරීර තුල නොමැතිව අපට ඒවා එහා මෙහා කල නොහැකිය. අත්වැස්මක් තුල තිබෙන අතක් දැකීමට නොහැකි ලෙස, අපගේ ශරීර තුල තිබෙන ආත්මද දැකිය නොහැකිය. (බලන්න බොයිඩ් කේ. පැකර්ගේ *Teach Ye Diligently*, [සෝල්ට් ලේක් නගරය: ඩෙසරට් පොත් සමා. 1975], පි. 231–33.)

## අපට භෞතික ශරීර ඇත

සාකච්ඡාව

"භෞතික ශරීරය" නම් වචනතීරුව පෙන්වන්න.

අප පොළොවට පැමිණිවිට, අප හැම කෙනෙකුටම භෞතික ශරීරයක් ලබාදුන් බව පහදා දෙන්න. ළමයින්ගේ භෞතික ශරීරවල ඇස්, කන්, අත් සහ පාද වැනි කොටස් කිහිපයක් නම් කිරීමට ළමයින්ට කියන්න.

- ඔබගේ භෞතික ශරීරවලට කල හැකි දේවල් මොනවාද?

ක්‍රියාකාරීත්වය

ළමුන්ගේ භෞතික ශරීරවලට කල හැකි බොහෝ දෙවල්වලින් පැනීම. තනි කකුලෙන් පැනීම, දැඟලීම, බඩගෑම හෝ නැටීම වැනි කිහිපයක් නම්කර, ඒවා ක්‍රියාකර පෙන්වන්න කියන්න.

කඩදාසි බෝනික්කාගේ සාකච්ඡාව

කඩදාසි බෝනික්කා ළමයින්ට පෙන්වන්න.

- අපි මෙම කඩදාසි බෝනික්කන්ට සමානවන්නේ කෙසේද? (අපටද අත්, කකුල් සහ හිස් ඇත.)
- අපි ඒවාට වඩා වෙනස්වන්නේ කෙසේද? (ඒවා සාදාතිබෙන්නේ කඩදාසි වලින්ය; අපට මස් සහ කටුවලින් සැදුන ශරීර ඇත. ඒවා ජීවමාන නැත; අපි ජීවමාන වෙමු. ඒවා සියල්ලම එක සමානව පෙනේ; අපි එකිනෙකාගෙන් වෙනස්ව පෙනේ.
- අපි සියල්ලෝම එක සමානව පෙනේ නම්, එය කුමකට සමානවේද?

ක්‍රීඩාව

ඔබ කරන ප්‍රකාශයෙන් ළමයින්ව විස්තර කෙරෙන හැම අවස්ථාවේදීම ඔවුන්ට නැගිට සිටීමට කියන්න. ප්‍රකාශයෙන් ඔවුන්ව විස්තර නොවන්නේ නම්, ඔවුන්ට හිඳගැනීමට කියන්න. ඔබගේ පංතියේ ළමුන් අතර ඇති සමානකම් සහ අසමානකම් විදහා පෙන්වන ප්‍රකාශ පාවිච්චිකරන්න. ඒවා නම්—

- සියලුම ගැහැණු ළමයි නැගිට සිටින්න.
- දුඹුරු ඇස් ඇති හැම කෙනෙක්ම නැගිට සිටින්න.
- නාසයක් තිබෙන සෑම කෙනෙක්ම නැගිට සිටින්න.
- ඔබට සුදු හිසකෙස් තිබේ නම් නැගිට සිටින්න.

අප සියල්ලන්ටම පොදු දේවල් බොහොමයක් තිබෙන නමුත්, මිනිසුන් දෙදෙනෙක් හැම අතින්ම එකසමාන නැති බව පෙන්වාදෙන්න. අප එකිනෙකාට අන් අයගේ ශරීරවලට සමාන භෞතික ශරීර ලබාදීමට ස්වර්ගික පියාණන්වහන්සේ සැලසුම් කල නමුත්, අනෙක් ශරීර මෙන් එකසමානව නොවන බව පහදාදෙන්න. අප එකිනෙකා අනෙක් හැම පුද්ගලයෙකුටම වඩා වෙනස්ය.

## අපට ප්‍රේමකරන පවුල් අපට සිටිති

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

"පවුල" නම් වචනතීරුව පෙන්වන්න.

ස්වර්ගික පියාණන්වහන්සේ අපට එපමණටම ප්‍රේමකරන බැවින් ශරීරයක් ලබාගැනීම සඳහා අප හැම කෙනෙක්ම පොළොවට එවූබව ළමයින්ට කියන්න. අප රැකබලා ගැනීමට හා අපට ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඉගැන්වීමට හැකි පවුල් අතරට උන්වහන්සේ අපව එවූසේක.

කථාන්තරය

පහත සඳහන් කථාන්තරය ඔබගේම වචනවලින් කියන්න.

එක් උදෑසනක ආරම්භයේදී එක් පිරිමි ළමයෙක් සහ ඔහුගේ පියා දීර්ඝ පා ගමනක් ආරම්භ කළෙහ. දෙනොම එක්ව මාළු ඇල්ලීමෙන් දවස ගතකිරීමට ඔවුන්ට අවශ්‍යවූ නිසා, ඔවුහු සිය බඩු බාහිරාදිය අසුරාගෙන ලක්ෂණ කුඩා වැවක් දෙසට ගමන්කිරීම ආරම්භ කළහ. ඔවුන් බොහෝ වේලාවක් ඇවිද යාමෙන් පසුව පිරිමි ළමයා වෙහෙසට පත්ව සෙමින් සෙමින් ඇවිදයාමට පටන්ගත්තේය.

වැව දර්ශනයවීමට පටන්ගත් විට, වැවේ දර්ශනීය නිල් පාට ජලය දැකීමට ආශාවෙන් පියා ඉක්මනින්ම ඉදිරියට ගියේය. පුතා ඉක්මනින්ම තමාට ලඟාවේයැයි ඔහු සිතීය.

පියා වැව ළඟට ගියවිට, පුතාට තමා සමග පැමිණීමට නොහැකිවී ඇති බව ඔහුට අවබෝධවිය. ඔහුට තම පුතා දැකගැනීමට නොහැකිවිය. බිලී පිත්ත අතැර දැමූ පියා, තම පුතාව සෑමතැනම සෙවීය. ඔහු මුළු ශක්තියෙන්ම කෑගැසීය. නමුත් ඔහුගේ පුතාගෙන් පිළිතුරක් නොලැබින. පියා බියට පත්විය. ඔහුගේ පුතා අතරමංවීද?ඔහුට කරදරයක්වීද?

පියා දණගසා යාච්ඤා කළේය. තම පුතාව සොයාගැනීමට උපකාරකරන මෙන් ඔහු ස්වර්ගික පියාණන්ගෙන් ඉල්ලා සිටියේය. ඉන්පසුව නැගිටගත් ඔහු මාර්ගය දිගේ නැවතත් ඇවිදගියේය. ඉක්මනින්ම ඔහු තම පුතාව සොයාගත්තේය. පියා තම පුතාව බදාගනිමින් ඔහුට කෙතරම් ආදරේද යන බව කීවේය (සකස්කිරීම ඔවෙන් සී. බෙතියන්, "පියෙකුගේ හදවතක් හැරවීම," එන්සයින්, මැයි 1971, පිටු. 28–30.)

සාකච්ඡාව

- තම පියා තමාට ප්‍රේමකරන බව පිරිමි ළමයා දැනගත්තේ කෙසේද? (ඔහුගේ පියා ඔහුව මාළු ඇල්ලීමට රැගෙන ගියේය, ඔහු අතරමංවූ විට ඔහු ගැන සොයා බැලීය. ඔහු ගැන යාච්ඤා කළේය. ඔහුව සොයාගැනීමෙන් ඔහු කෙතරම් සතුටුවූයේදැයි පෙන්වීය.)
- ඔබගේ පවුලේ අය ඔබට ප්‍රේමකරන බව ඔබ දැනගන්නේ කෙසේද?

ළමුන් ප්‍රතිචාර දැක්වීමෙන් පසුව, අපගේ දෙමාපියන් සහ පවුල් අපට ප්‍රේමකරන බව අපට පෙන්වීමට බොහෝ මාර්ග තිබෙන බව පහදාදෙන්න.

## අපට ප්‍රේමකරන ස්වර්ගික පියෙක් අපට ඇත.

සාකච්ඡාව

- ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට ප්‍රේමකරන බව ඔබ දන්නේ කෙසේද?

ගීතය

ස්වර්ගික පියාණන්වහන්සේ අපට ප්‍රේමකරන අතර අප සතුටින් සිටීම අපේක්ෂාකරන බව ළමුන්ට කියන්න. අපට ජීවත්වීම සඳහා උන්වහන්සේ දර්ශනීය ලෝකයක් ලබාදී ඇතිසේක. පහත පෙන්වාදී තිබෙන ක්‍රියාවන් කිරීමට ළමුන්ට උදව්කරමින් "මගේ ස්වර්ගික පියාණන්වහන්සේ මට අදරෙයි" යන ගීතය ගායනාකරන්න නැතහොත් එහි වචන කියන්න.

මට ඇසෙන හැමවිට (*කන් වටා අත් මිට මොලොවවන්න*)ගීයක් කුරුල්ලෙකුගේ (*පියාපත් මෙන් අත් වනන්න*)
හෝ නිල් නිල්වන් අහස බලන්න (*ආරුක්කුවක හැඩයට අත් ඔසවන්න*).
වැහි බිඳු මගෙ මුහුණේ මට දැනෙනවිට (*වැසි වැටෙන ලෙස ඇඟිලි සොලවන්න*)
සුළඟක් හෝ හමායන විට (*අත්දෙකම පිටුපසටත් ඉදිරියටත් වනන්න*).
රතු මලක් මා ඇල්ලූ සැමවිට (*මලක් ඉඹීම දක්වන්න*)
හෝ අපගේ ලිලී ගස ළඟින් යනවිට (*එක තැන අවිදින්න*),
මම සතුටුයි මේ මතරම් ලොවේ මා ජීවත්වන බව (*අල්ල සහ අත ඉදිරියට විහිදන්න*)
ස්වර්ගික පියාණන් මාවෙනුවෙන් සැදූ (*තමාව වැළඳගන්න*)

එතුමා මට දුන්නා මගේ ඇස් මට දකින්ට හැකිවෙන්ට (*ඇස් පෙන්වන්න*)
සමනළයෙකුගේ පියාපත් පාට (*මාපටැඟිලි එක්කර ඇඟිලි පියාපත්සේ සොලවන්න*)
එතුමා මට දුන්නා මගේ කන් මට අසන්න (*කන් පෙන්වන්න*)
අපූරු හඬ හැමදේකම (*කන්වටා අත්යවන්න*)
එතුමා මට ජීවිතයද, මනසද දුන්සේක (*හිසේ පැත්තක් පෙන්වන්න*). මගේ හිතද (පපුවට අත තබන්න):
මම සිතමි ගෞරවයෙන් එතුමා (*අත් නවන්න*)
සියලුම එතුමාගේ නිමැවුම්, මමත් එහි කොටසක්මි (*අල්ල සහ අත් පිටතට දිගහරින්න*)
එසේය, මම දනිමි ස්වර්ගික පියා මට ආදරෙයි (*පපුවට ඉහළින් අත් තබන්න*).

සාකච්ඡාව

- ස්වර්ගික පියාණන් ඔබට ප්‍රේමකරන බව ඔබට සිහිපත්කරන දේවල් මොනවාද?
- ඔබ ස්වර්ගික පියාණන්වහන්සේගේ දරුවෙකු බව සහ උන්වහන්සේ ඔබට ප්‍රේමකරන බව දැනගැනීමට එමගින් ඔබට හැඟීමක් දෙන්නේ කෙසේද?

**සාරාංශය**

ගීතය

"මම දේව දරුවෙක්මි" ගීතයේ පළමු පදය ළමුන් ලවා ගායනාකරවන්න. *දෙවියන්වහන්සේ* යනු ස්වර්ගික පියාණන් හඳුන්වන තවත් නාමයක් බව ළමුන්ට මතක්කරන්න.

එම ගීතයේ වචනවලින් අපට ප්‍රකාශකරන්නේ, අප හැම කෙනෙක්ම ස්වර්ගික පියාණන්ගේ ප්‍රේමනීය දරුවෙකු බව සහ අපට පොළොවට පැමිණ අපගේ භෞතික ශරීර ලබාගැනීමට උන්වහන්සේ සැලසුම්කල බවත් පෙන්වාදෙන්න. අපට ප්‍රේමකිරීමට සහ අපට ඉගැන්වීමට අප වෙනුවෙන් උන්වහන්සේ පවුල්ද සැලසුම්කල බවත්, එවිට අපට නැවතත් උන්වහන්සේ වෙත ගොස් උන්වහන්සේ සමග ජීවත්වීමට හැකිවේ.

සාක්ෂිය

ස්වර්ගික පියාණන්වහන්සේ අපට භෞතික ශරීරද, ජීවත්වීමට අලංකාර පොලොවක් සහ අපට ප්‍රේමකරන පවුල්ද ලබාදී තිබෙන නිසා, උන්වහන්සේ අපට ප්‍රේමකරන බව ඔබ දන්නාබවට සාක්ෂි දරන්න.

ළමයින්ට පොලොවට පැමිණීමට හැකිවීම ගැන අද රාත්‍රී යාච්ඤාකරන විට ස්වර්ගික පියාණන් වහන්සේට ස්තුතිකිරීමට ඔවුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් කියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් හොඳින් ගැලපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් මෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. කඩදාසි බෝතික්කන් කොටස්වලට කපා, හැම ළමයෙකුටම කැල්ලක් දෙන්න. බෝතික්කන් පාටකිරීමට හෝ සැරසීමට ළමුන්ට කියන්න. ළමුන් එය නිමකල විට, ඔවුන්ගේ බෝතික්කන් පංතියේ

අනෙක් ළමුන්ට පෙන්වන ලෙස ඔවුන්ට කියන්න. එක් එක් බොනික්කා කෙතරම් වෙනස්ව සහ අලංකාරව තිබේදැයි පෙන්වාදෙන්න. අපත් ඒ හා සමාන නමුත්, එක් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙ-කුට හැම අතින්ම සමාන නොවන බව ළමුන්ට සිහිපත් කරන්න.

2. ළමයින්ට රවුමක් තුල හිඳගැනීමට සලස්වන්න. බෝංචි බෑගයක් හෝ වෙනත් මෘදු භාණ්ඩයක් ළමයෙකුට යවා පාඩම ගැන ප්‍රශ්නයක් අසන්න. ප්‍රශ්නයට පිළිතුරුදීමට ළමයාට කියා, බෝංචිබෑගය නැවතත් ඔබට එවන්න කියන්න. සෑම ළමයෙකුටම අඩු වශයෙන් එක් ප්‍රශ්නයකට හෝ පිළිතුරු-දීමට වාරයක් ලැබෙන තුරු දිගටම කරන්න. පහත සඳහන් ප්‍රශ්න පාවිච්චිකරන්න. නැතහොත් ඔබම නිර්මානය කරගන්න:

   - මෙම පොළොවට පැමිණීමට පෙර අප සියල්ලෝම ජීවත්වූයේ කොහේද? (ස්වර්ගයේ.)
   - අප ජීවත්වූයේ කා සමගද? (ස්වර්ගික පියාණන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ සෑම කෙනෙක්ම සමග.)
   - අප දැන් ජීවත්වන්නේ කොහේද? (පොළොව මත.)
   - අපගේ ආත්මවල පෙනීම කුමක් වගේද? (අපගේ භෞතික ශරීර වාගේ.)

3. ළමුන්ට කඩදාසි සහ පැන්සල් හෝ ක්‍රේයොන් ලබාදී, ස්වර්ගික පියාණන්වහන්සේ ඔවුන්ට ප්‍රේමකරන බව සිහිපත්කරවන දේවල් ඇඳීමට ඔවුන්ට කියන්න.

4. ළමුන්ට නැගීසිටීමට සලස්වා ඔවුන් ලවා "ගුරුවරිය කියයි" ක්‍රීඩාව රඟදක්වන්න. ඔවුන්ට කිරීමට තිබෙන්නේ ඔබ උපදෙස් දීමට පෙර, ඔබ "ගුරුතුමිය කියයි" යනුවෙන් කියන විටම, ඔබ කියන දෙය කිරීම පමණක් බව පහදාදෙන්න. ළමුන්ට කිරීමට තිබෙන්නේ, ඔවුන්ගේ අත් නමාගැනීම, ඔවුන්ගේ උරහිස් ස්පර්ශකිරීම සහ වටේට හැරීම යනාදිය බව ඔවුන්ට කියන්න. සමහර අවස්ථාවලදී ඉල්ලීමට පෙර, "ගුරුවරිය කියයි" කියාද, සමහර අවස්ථාවලදී හුදෙක් ක්‍රියාත්මකවීමට ඉල්ලයි. ඔබ "ගුරු-තුමිය කියයි" කියා නොකියන විට, ළමයින් ක්‍රියාත්මකවූව හොත්, ක්‍රීඩාව අවසන්වන තුරු ඔවුන් හිඳගෙන සිටිය යුතුය. ක්‍රීඩාව ඔබට අවශ්‍ය වාරගණනක් කරගෙන යන්න.

   ළමයින්ගේ භෞතික ශරීර මෙම ක්‍රියාවන් සියල්ලම කිරීමට ඔවුන්ට හැකියාව ලබාදෙන බව ඔවුන්ට මතක්කරන්න.

# මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනයකිරීම තෝරාගමි

4
වෙනි
පාඩම

**අරමුණ**

පොළොවට පෙර ජීවිතයේදී අපි ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමග ජීවත්වී උන්වහන්සේව අනුගමනයකිරීම තෝරාගත් බව එක් එක් ළමයාට තේරුම්ගැනීමට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. යෝබ් 38:7; මෝසස් 4:1–4; ආබ්‍රහම් 3:24–28; සහ ඇදහිල්ලේ කරුණ 1:1 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. සුභාරංචි මූලධර්ම (31110), පරිච්ඡේද 3 ද බලන්න.
2. “මම දේව දරුවෙක්මි” යන ගීතයේ පළවෙනි පදය තාල අල්ලා ගායනාකිරීමට සූදානම් වන්න (*ළමා ගී පොත*, පි. 2). මෙම ගීතයට වචන මෙම දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත් කර ඇත.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් සහ අනගි මුතුඇටය (ඩී සහසී)
   ආ. හදේතෝ සටහන (1වෙනි පාඩම බලන්න).
   ඇ. පින්තූරය 2-3, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (සුභාරංචි කලා පින්තූර මල්ල 240; 62572); පින්තූරය 2-4, මෙලොවට පෙර ජීවිතය.
4. ඔබ පාවිච්චි කිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍යවන සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිමත්කර තිබේනම්, ළමයින් සමග එය සොයා බලන්න.

### අපි දෙවියන්වහන්සේගේ දරුවන් වෙමු

අවධානශීලී ක්‍රියාකාරකම

ඔබ ගීතයක තාලය ඇල්ලීමට යන බව ළමයින්ට කියන්න. ප්‍රවේශමෙන් ඊට ඇහුම්කන්දී, ඔබ අවසන් කලවිට ගීතයේ නම කීමට ඔවුන්ට කියන්න. “මම දේව දරුවෙක්මි” ගීතයට තාලය අල්ලන්න.

- මා තාලය ඇල්ලූ ගීතය කුමක්ද?
- ගීතයෙන් කියවෙන්නේ ඔබ කවරෙක් කියාද?

ළමුන් ලවා ගීතයේ පළවෙනි පදය කියවන්න.

සාකච්ඡාව සමාලෝචනයකිරීම

අප පොළොවට පැමිණීමට පෙර අප ජීවත්වූයේ කොහේදැයි ඉහත පරිච්ඡේදයේදී ඔබ සාකච්ඡාකල බව ළමුන්ට මතක්කර දෙන්න.

- අප පොළොවට පැමිණීමට පෙර අප ජීවත්වූයේ කොහේද?
- ස්වර්ගයේදී අප ජීවත්වූයේ කා සමගද?
- අප සියලුදෙනාම සොහොයුරු සොහොයුරියන් වන්නේ කෙසේද? (අපි සියලුදෙනාම ස්වර්ගික පියාණන්වහන්සේගේ දරුවන් වන්නෙමු.)

**ස්වර්ගයේදී අපි වැදගත් තේරීමක් කළෙමු.**

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

අප ඉපදීමට පෙර අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ සමග අප ජීවත්වන විට, සිදුවූ ඉතා ප්‍රබෝධමත් යමක් ගැන ඉගෙනගැනීමට යන බව ළමයින්ට කියන්න.

මෙලොවට පෙර ජීවිතය, පින්තූරය 2-4, පෙන්වන්න. මෙය ස්වර්ගයේ ආකාරය පෙන්වන එක් චිත්‍ර ශිල්පියෙකුගේ අදහසක් බව පහදාදෙන්න. ස්වර්ගයේදී අපි සියල්ලෝම ආත්ම බවත්, ස්වර්ගික පියාණන් සමග එකට හැසිරෙමින් කථාබස් කල බවත් පහදාදෙන්න. ස්වර්ගික පියාණන්වහන්සේ සමග ජීවත්වීම කුමන අන්දමේ දෙයක් විය හැකිදැයි සිතාබැලීමට ළමයින්ගෙන් ඉල්ලන්න. උන්වහන්සේව දැක, උන්වහන්සේ සමග සිටීමට හැකිවීම කෙතරම් ආශ්චර්යමත්ද කියා තේරුම්ගැනීමට ඔවුන්ට උදව්වන්න.

අපි ස්වර්ගයේ සිටියදී, ශ්‍රේෂ්ඨ රැස්වීමකට සහභාගිවීමට ස්වර්ගික පියාණන්වහන්සේ අපව කැඳවූ බව ළමයින්ට කියන්න. ස්වර්ගික පියාණන්වහන්සේගේ සියලුම දරුවෝ එහි සිටියහ. අප සමග කථාකිරීමට ස්වර්ගික පියාණන්ට අවශ්‍යවූසේක.

අපට භෞතික ශරීර ලබාගෙන හරි දේ තෝරාගැනීමට ඉගෙනගැනීම සඳහා යම් කාලයකට අපි උන්වහන්සේගෙන් වෙන්වී යාම අවශ්‍ය බව ස්වර්ගික පියාණන්වහන්සේ අපට ප්‍රකාශකල බව පහදාදෙන්න. මෙම කාරණා ඉටුකිරීම සඳහා ස්ථානයක් අපට ලබාදෙන බව ස්වර්ගික පියාණන්වහන්සේ අපට කීසේක.

- අප කිනම් ස්ථානයකට යාම ස්වර්ගික පියාණන්ට අවශ්‍යවූවේද? (පොළොවට.)

අප පොළොවට පැමිණිවිට, උන්වහන්සේ සමග ජීවත්වූබව අපට අමතකවන බව ස්වර්ගික පියාණන්වහන්සේ අපට කීසේක. අපගේ පොලොවේ කාලය අවසන්වූ පසුව, අපට නැවතත් උන්වහන්සේ සමග ජීවත්වීම සඳහා ස්වර්ගයට පැමිණීමට අපට යම් කෙනෙකුගේ උපකාරය අවශ්‍යබවද, උන්වහන්සේ කීසේක. අපට උපකාරකිරීමට යම් කෙනෙක් එවන බවට උන්වහන්සේ පොරොන්දුවූසේක.

සාකච්ඡාව

- ස්වර්ගික පියාණන්වහන්සේ සමග නැවතත් ජීවත්වීම සඳහා ඔබට ස්වර්ගයට යාමට උපකාරකිරීමට යම්කෙනෙක් එවීමට තරම් උන්වහන්සේ ඔබට ප්‍රේමකිරීම ගැන දැන ගැනීමෙන් ඔබට කෙබඳු හැඟීමක් ඇතිවේද?

අපට උදව්කිරීමට යම්කෙනෙක් එවන බව ස්වර්ගික පියාණන්වහන්සේ අපට කී විට, අපි සියල්ලෝම ප්‍රීතියෙන් කෑගැසූ බව පහදාදෙන්න (බලන්න යෝබ් 38:7).

පින්තූරය 2-3, පෙන්නන්න, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.

- මෙතුමා කවරෙක්ද?

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපත් සමග ස්වර්ගයේ ජීවත්වූ බව පහදාදෙන්න. උන්වහන්සේ අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ ආත්මික දරුවන්ගේ කුළුඳුලාණෝය.

ඇදහිල්ලේ කරුණ

සභාවක් වශයෙන් අපට ඇදහිල්ලේ කරුණු නම් ප්‍රකාශනයක් තිබන බවත්, එමගින් අපගේ විශ්වාසයන් ගැන කියැවෙන බවත් ළමුන්ට කියන්න. පළවෙනි ඇදහිල්ලේ කරුණේ මෙම ප්‍රථම භාගය මතකතබා ගැනීමට ළමුන්ට උදව්කරන්න: "සදාකාලික පියාණන්වන දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍රයාණන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැනත් අපි විශ්වාසකරම"

දෙවියන් වන සදාකාලික පියාණන්වහන්සේ යනු, ස්වර්ගික පියාණන්වහන්සේට තවත් නමක් බව ළමුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි කථාන්තරය සහ සාකච්ඡාව

අපට ඉගැන්වීම සඳහා කවරෙක් යැවිය යුතුදැයි ස්වර්ගික පියාණන්වහන්සේ ඇසූ බව ළමුන්ට කියන්න. අනගි මුතුඇටය පොතේ ආබ්‍රහම් 3:27 පෙරළා යේසුස්වහන්සේ කුමක් පිළිතුරු දුන්නේදැයි ශබ්දනගා කියවන්න. මෙන්න මම සිටිමි, මා යවන්න." අපට උපකාර පිණිස ස්වර්ගික පියාණන්වහන්සේ කියන ඕනෑම දෙයක් කිරීමට තමා සූදානම්බව යේසුස් වහන්සේ කීසේක. මෝසෙස් 4:2 අවසාන

කොටස (පියාණන්ගෙන් පටන්ගෙන) ශබ්දනගා කියවන්න. ස්වර්ගක පියාණන්වහන්සේට සියලුම මහිමය දෙන බවද යේසුස්වහන්සේ කීසේක. මහිමය යන්නෙහි අදහස කෙටියෙන් පහදාදෙන්න.

- යේසුස්වහන්සේ ස්වර්ගික පියාණන්වහන්සේට ප්‍රේමකල බව ඔබ කියන්නේ කෙසේද? (ස්වර්ගික පියාණන්වහන්සේට අවශ්‍ය සියල්ල කිරීමට උන්වහන්සේ කැමතිවූසේක).
- යේසුස්වහන්සේ ප්‍රේමකල වෙනත් අය කව්ද? (අප)

යේසුස්වහන්සේ කිරීමට කැමතිවූ දේවල් සමාලෝචනය කිරීම මගින් ස්වර්ගික පියාණන් වහන්සේට සහ අපට යේසුස්වහන්සේ දැක්වූ ප්‍රේමය ගැන අවධාරණය කරන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කැමතිවූ දෙවල්—

- පොළාවට පැමිණ අපට උපකාරකිරීමට.
- ස්වර්ගික පියාණන් ගැන සාක්ෂි දැරීමට.
- සතුටින් සිටීම සඳහා ජීවත්විය යුතු නිවැරදි මාර්ගය අපට ඉගැන්වීමට.
- ස්වර්ගික පියාණන්වහන්සේ සමග නැවතත් ජීවත්වීමට හැකිවීම සඳහා අප කල යුතු දේවල් අපට පෙන්වාදීමට.
- අප වෙනුවෙන් උන්වහන්සේගේ ජීවිතය පුදකිරීමට.

ලුසිෆර් නම් වෙනත් ආත්මික පුත්‍රයෙකුටද අපට උදව්කිරීම සඳහා පොළොවට යාමට අවශ්‍යවූ බව පෙන්වා දෙන්න. ඔහු පොළොවට පැමිණ නිවැරදි දේ කිරීමට අප සියල්ලන්ටම බලකරන බව ඔහු ස්වර්ගික පියාණන්වහන්සේට කීවේය. අපටම තෝරාගැනීමට අපට ඉඩදීමට ඔහු කැමති නොවීය. තමාට සියලුම ගෞරවය සහ මහිමය දෙන ලෙස ඔහු ස්වර්ගික පියාණන්වහන්සේට කීවේය.

ස්වර්ගික පියාණන්වහන්සේගේ තීරණය ආබ්‍රහම් 3:27න් ශබ්දනගා කියවන්න. "මම පළමු වැන්නා යවමි."

- ස්වර්ගික පියාණන්වහන්සේට උපකාර සඳහා උන්වහන්සේ තෝරාගත්තේ කවුරුද?

තමාව තෝරා නොගත් බැවින් ලුසිෆර් තදින් අමනාපවූ බව පහදාදෙන්න. ඔහු ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම පිළිනොගත්තේය. ඒ වෙනුවට ලුසිෆර් ස්වර්ගයේ මහා සටනක් ඇති කළේය. එය තුවක්කු සහ බෝම්බවලින් යුත් යුද්ධයක් නොවූ නමුත්, තමාව අනුගමනය කිරීමට ජනයාට කථාකර ඔවුන් පොළොඹවා ගැනීමට ගත් උත්සාහයකි. අපගේ සමහර ආත්මික සොහොයුරු සොහොයුරියන්ට තමාගේ නපුරු අදහස් නිවැරදිබව ලුසිෆර් ඒත්තු ගැන්වීය. එසේම ඔවුහු යේසුස්වහන්සේ වෙනුවට ලුසිෆර් අනුගමනයකිරීම තෝරාගත්හ.

ලුසිෆර්, සාතන් හෝ යක්ෂයා නමින් හැඳින්වෙන බවද ළමුන්ට කියන්න.

සාකච්ඡාව

- ඔබ තෝරාගත්තේ කවරෙක් අනුගමනය කිරීමද, යේසුස්වහන්සේද, නැතිනම් ලුසිෆර්ද?

යේසුස්වහන්සේ අනුගමනය කිරීම තෝරාගත් ළමුන්ට නැගිටසිටීමට කියන්න. යේසුස් වහන්සේව අනුගමනය කිරීම ඔවුන් සියල්ලෝම තෝරාගෙන තිබීම නිසා ඔවුන් සියල්ලෝම නැගිට සිටිය යුතුබව පහදාදෙන්න.

අප මෙම පොළොවේ සිටින නිසා අපි යේසුස්වහන්සේව අනුගමනයකලබව අප දන්නා බව පහදාදෙන්න. සාතන් අනුගමනයකල ආත්මවලට පොලොවේ ඉපිද භෞතික ශරීර ලබා ගැනීමට අවසර නොලැබින.

ඔබ යේසුස්වහන්සේව අනුගමනය කිරීම තෝරාගැනීම නිසා ඔබ කෙතරම් සතුටුවන්නේදැයි ළමුන්ට කියන්න. ඔවුන්ද සාතන් නොව යේසුස්වහන්සේව අනුගමනයකිරීම තෝරාගැනීම නිසා ඔබ ඔවුන් ගැන ආඩම්බරවන බව ඔවුන්ට කියන්න. හරි දේ තෝරාගැනීම නිසා ළමුන්ට ප්‍රශංසාකරන්න.

## අපට අවශ්‍යවන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව දිගටම අනුගමනයකිරීමය

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

යේසුස්වහන්සේව අනුගමනය කිරීමට ළමයින්ට බලකිරීමක් නොවුන බව අවධාරණයකරන්න. තෝරාගැනීම ඔවුන්ට භාරවිය. ඔවුන්ට සාතන්ව අනුගමනයකිරීමට හැකියාව තිබින. නමුත් ඔවුහු නිවැරදි මාර්ගය තෝරාගත්හ.

පොළොවේ මෙම ජීවිතය තුළද, එම තෝරාගැනීමේ බලය ඔවුන්ට තිබෙන බව ළමුන්ට කියන්න. සාතන් තවමත් ඔහුව අනුගමනයකිරීමට අපව පොළොඹවාගැනීමට උත්සාහ දරයි. අපි යේසුස්වහන්සේව අනුගමනයකිරීම ස්වර්ගික පියාණන්වහන්සේ අපේක්ෂාකරන්නේ එමගින් අපව සතුටට පත්කර අපට ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමග නැවතත් ජීවත්වීමට හැකියාව ලබාදෙන නිසාය. නමුත් යේසුස්වහන්සේව අනුගමනයකිරීමට අපට බලනොකෙරේ. යේසුස්වහන්සේ අපෙන් අපේක්ෂාකරන හොඳ දේවල් කිරීම හෝ සාතන් අපෙන් අපේක්ෂාකරන නරක දේවල් කිරීම හෝ තෝරාගැනීමට අපට පුළුවන.

හදේතෝ සටහන

හදේතෝ සටහන පෙන්වන්න. සටහනේ තිබෙන පින්තූරයේ සිටින්නේ කවරෙක්දැයි ළමුන්ගෙන් අසන්න. සටහනේ වචන පෙන්වමින් ඒවා කියවන්න. ඉන්පසු ඔබත් එක්ව ළමුන් සමග කියවන්න, “මම හරි දේ තෝරමි.”

සාකච්ඡාව

යේසුස්වහන්සේ අනුගමනය කිරීමට යන ළමුන්, පහත සඳහන් ප්‍රශ්නවලට (හෝ ඔබ නිර්මානය කල කිහිපයකට)ප්‍රතිචාර දක්වන අන්දම ගැන කීමට ඔවුන්ට කියන්න:

- ඔබ වැරදීමකින් යමෙකුට හිරිහැර කලේ නම්, ඔබ යේසුස් වහන්සේ අනුගමනයකිරීම තෝරාගැනීමට ඔබට කල හැකිවන්නේ කුමක්ද?
- ඔබ යේසුස්වහන්සේ අනුගමනය කිරීමට නම්, ඔබ මෙම පංතියේදී ක්‍රියාකරන්නේ කෙසේද? (ළමයින්ට මෙවැනි ක්‍රියා පෙන්වාදීමට සලස්වන්න, නිශ්ෂබ්දව හිඳගෙන සිටීම, සවන්දීම, අදාළ පරිදි සහභාගීත්වය සහ අනෙක් ළමුන්ට කරදර නොකිරීම.)
- යමෙක් ඔබට ත්‍යාගයක්දීම හෝ ඔබ වෙනුවෙන් යමක් කලවිටකදී, ඔබ යේසුස්වහන්සේව අනුගමනය කිරීම තෝරාගැනීමට නම්, ඔබ කල යුත්තේ කුමක්ද?
- ඔබ යේසුස්වහන්සේ අනුගමනය කිරීම තෝරාගැනීමට නම්, ඔබට අකරුණාවන්තවූ යමෙකුට ඔබ සලකන්නේ කෙසේද?

හදේතෝ සටහනට යොමුවී එහි වචන ළමුන් ලවා නැවත කියවන්න.

### සාරාංශය

සාක්ෂිය

අප පොලොවට පැමිණීමට පෙර, අප හැම කෙනෙක්ම තේරීමක් කලබවට සාක්ෂි දරන්න. අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනයකිරීම තෝරාගත් අතර, යේසුස්වහන්සේ අපට කිරීමට කියා තිබෙන දේවල් අප කලහොත්, අපි නැවතත් උන්වහන්සේ සහ ස්වර්ගික පියාණන් වහන්සේ සමග ජීවත්වන්නෙමු.

යේසුස්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන දේවල් ගැන සෑම සතියකදීම ප්‍රාථමිකයේදී ළමුන්ට ඉගෙනගැනීමට ලැබෙනබව පහදාදෙන්න.

අපගේ ගැලවුම්කරුවාණන්වීම සඳහා යේසුස්වහන්සේව පොළොවට එවීම ගැන ළමයින්ගේ යාච්ඤාවලදී ස්වර්ගික පියාණන්වහන්සේට ස්තුතිකිරීමට ඔවුන්ව දිරිගන්වන්න. ඔවුන්ට හරි තේරීම් කිරීම සඳහා උදව්කරන ලෙස ස්වර්ගික පියාණන්ගෙන් ඉල්ලන ලෙස යෝජනා කරන්න. එවිට ඔවුන්ට යම්දිනෙක නැවතත් උන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමග ජීවත්වීමට හැකිවේ.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩා හොඳින් ගැලපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම සමාලෝචනයක් හෝ සාරාංශයක් ලෙසද යාදාගත හැකිය. අමතර උපදෙස් සඳහා "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ළමයින්ගේ හදේතෝ මුදු දෙස බැලීමට ඔවුන්ට කියන්න. ළමයින් හදේතෝ මුදු පැළඳ නොසිටී නම්, එක් එක් ළමයාගේ ඇඟිල්ලක් වටා නූල් කැල්ලක් මුදුවක් ලෙස ගැටගැසීමට ඔබට හැකිය. ඔවුන්ගේ මුදු මගින් ඔවුන් යේසුස්වහන්සේව අනුගමනයකිරීමට තෝරාගත්බව සහ හරි තේරීම්කිරීම දිගටම කල යුතුබව ඔවුන්ට සිහිපත්කරන බව ළමයින්ට කියන්න.

2. "මම ස්වර්ගයේ ජීවත්වුනෙමි "යන ගීතයේ පළවන පදය ගායනාකරන්න නැතහොත් වචන කියන්න (*ළමා ගී පොත*, පි. 4):

   මම බොහෝ කලකට පෙර ස්වර්ගයේ ජීවත්වුනෙමි, එය සත්‍යවේ;<br>
   මා දන්නා මිනිසුන් හා මා එහි ජීවත්ව ප්‍රේම කළෙමි. ඔබද එසේමය.<br>
   එවිට ස්වර්ගික පියා ලස්සන සැලැස්මක් දුන්සේක,<br>
   පොලොව සහ මිනිසාගේ සදා ගැලවීම සියල්ලම

   ඔබ ගායනාකල පසුව, ගීතයේ කියැවෙන දේ ගැන පහත සඳහන් ප්‍රශ්න අසන්න (ළමුන්ට පිළිතුරු සැපයීමට පහසුකිරීමට, අවශ්‍ය පරිදි ගීතයේ පේළි නැවත නැවත කියන්න):

   - ගීතයේ පැවසෙන පරිදි ඔබ ජීවත්වූයේ කොහේද?
   - එහිදී ඔබ ජීවත්වූයේ කවුරුත් සමගද?
   - අපි ස්වර්ගික පියාණන් සමග ස්වර්ගයේ ජීවත්වනවිට්දී උන්වහන්සේ කල කටයුතු මොනවාද?
   - සැලසුම සකස්කලේ කුමක් ගැනද?

   ගීතයේ දෙවන පදය ගායනාකර ඒ හා සමාන ප්‍රශ්නම අසන්න:

   බොහෝ ප්‍රේමනීය අයෙක් තමාට අවශ්‍ය බව පියාණන් කීසේක<br>
   තම ජීවිතය පුදා අප සැමට නැවතත් ඉහළට යාමට හැකිවීම සඳහාය.<br>
   දිව්‍ය ගරුබව සොයන තවත් අයෙක් එහි සිටියේය.<br>
   මාව යවන්න මහිමය ඔබගේ යයි යේසු තුමා කීවේය.<br>
   © 1987 by Janeen Jacobs Brady. Used by Permission.)

3. ස්වර්ගය කුමක් වාගේදැයි ළමයින් සිතන අන්දමට පින්තූර ඇඳීමට ඔවුන්ට කියන්න.

4. "එතුමා සිය පුත්‍රයාණන් එවූසේක" (*ළමා ගී පොත*, පි. 34) හෝ "මම දේව සැලසුම අනුව යමි" (*ළමා ගී පොත*, පි. 164) යන ගීතය ගායනාකරන්න. නැතහොත් එහි වචන කියන්න. "එතුමා තම පුත්‍රයාණන් එවූසේක" යන ගීතයේ වචන මෙම දැනමුතුකම් පොතේ පිටුපස දක්වා ඇත.

   මම දේව සැලසුම අනුව යමි

   මගේ ජීවිතය ත්‍යාගයක්; මගේ දිවියට සැලැස්මක් ඇත.<br>
   මගේ දිවියට අරමුණක් ඇත; ස්වර්ගයෙන් එය ඇරඹේ.<br>
   මගේ තේරීම වුනේ පොලොවේ ලස්සන නිවසට ඒමය<br>
   සෙව්වේ මා උපතේ සිට දේව ආලෝකය පෙන්වීමට මගේ මග.<br>
   මා වෙතවූ දේව සැලසුම අනුව යමි මා,<br>
   තදින් අල්ලා වචනය සහ ප්‍රේමය එතුමාගේ.<br>
   මම කරමි වැඩ, මම කරමි යාච්ඤා;<br>
   එතුමාගේ මග යමි මා නිතර.<br>
   එවිට මම පොලොවේ සිටිමි සතුටින්<br>
   එසේම මාගේ උඩ ඇති නිවසේ.

# 5 වෙනි පාඩම

# මට නිවැරදි තේරීම්කිරීමට පුළුවන

**අරමුණ**

ස්වර්ගික පියාණන්වහන්සේ අපට කර්තෘත්වය දුන් නිසා අපට හරි දේ තෝරාගැනීමට හැකි බව තේරුම්ගැනීමට හැම ළමයෙකුටම උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 21:14–16 සහ දහම සහ ගිවිසුම 37:4 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. සුභාරංචි මූලධර්ම (31110), 4වෙනි පරිච්ඡේදයද බලන්න.
2. "හරි මාර්ගය තෝරන්න" යන ගීතය ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්වන්න (*ළමා ගී පොත*, පි. 160). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුලත්කර ඇත.
3. හයවෙනි පාඩමේ සාරවත් ක්‍රියාකාරකම 1, ඊළඟ සතියේදී යොදාගැනීමට ඔබට අවශ්‍ය නම්, (28වෙනි පිටුව බලන්න), පහත සඳහන් පරිදි සටහනක් එක් එක් ළමයා වෙනුවෙන් සකස්කර ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන්ට ගෙනයාමට සලස්වන්න.

   > කරුණාකර (ළමයාගේනම) ඔහුගේ (ඇයගේ) පළමු නම තෝරාගත්තේ කෙසේදැයි කියන්න. එවිට ඊළඟ වතාවේදී අපට ඒ ගැන පංතියේදී කථාකිරීමට පුළුවන. ඔබට ස්තුතියි.

   හයවෙනි පාඩමේ සාරවත් ක්‍රියාකාරකම 2, ඊළඟ සතියේදී යොදාගැනීමට ඔබට අවශ්‍ය නම්, ඊළඟ සතියේදී ළමයා සමග ගත් පවුලේ ඡායාරූපයක් එවන ලෙස එක් එක් ළමයාගේ දෙමාපියන්ගෙන් ඉල්ලා සටහනක් සකස්කරන්න. (ක්‍රියාකාරකම් දෙකම ඔබ යොදාගන්නේ නම්, මෙම සටහන ඉහත සඳහන් පරිදි විය හැකිය).
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් සහ දහම සහ ගිවිසුමක්.
   ආ. හදේතෝ සටහන (1වෙනි පාඩම බලන්න).
   ඇ. චොකලට් හෝ දිලිසෙන ගල් වැනි විවිධ පාටවල ද්‍රව්‍යයන් සහිත කුඩා භාජනයක් එක් පාටකින් සෑහෙන ප්‍රමාණයක් ලබාගන්න. එවිට එක් එක් ළමයාට පාට කිහිපයක් තෝරා ගැනීමට හැකිය).
5. ඔබට යොදාගැනීමට අවශ්‍ය ඕනෑම සාරවත් ක්‍රියාකාරකමක් සඳහා වුවමනාකරන සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිගන්වා තිබේනම් ඔවුන් සමග එය සොයාබලන්න.

**ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපෙන් බලාපොරොත්තුවන්නේ අප වෙනුවෙන් අපම තෝරාගැනීමය.**

අවධානශීලී ක්‍රියාකාරකම

කුඩා ද්‍රව්‍ය සහිත භාජනය පෙන්වා, ඉන් එකක් තෝරාගැනීමට එක් එක් ළමයාට කියන්න. ඔවුන් දැන් එකක් තෝරාගෙන තිබෙන බව ළමයින්ට කියන්න. අපි හැම දිනකට බොහෝ තෝරාගැනීම් කල යුතුවෙමු.

- ඔබ අද කල තේරීම් මොනවාද? (පිළිතුරුවලට, අඳින දෙය කුමක්දැයි තෝරාගැනීම, උදෑසන ආහාරයට කුමක් කෑමට ගන්නේදැයි තෝරාගැනීම නැතහොත් වැඩක් නැති විට කුමක් කරම්දැයි තෝරාගැනීම ඇතුලත්විය හැකිය).

තෝරාගැනීම් කිරීම පොලොවේ ජීවිතයේදී ඉතා වැදගත් කොටසක් බව ළමයින්ට කියන්න. සමහර තේරීම් පහසුවන අතර සමහර තේරීම් අපහසුය. තෝරාගැනීමට අප සතු අයිතිය අපට ලබාදී තිබෙන්නේ ස්වර්ගික පියාණන් සහ යේසුසේ ක්‍රිස්තුස්වහනසේ සමග අප ස්වර්ගයේ ජීවත්වන විටදීය.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

අප පොළොවට පැමිණීමට පෙර, ස්වර්ගික පියාණන්වහන්සේ අපව රැස්වීමකට කැඳවූ බව ළමයින්ට කියන්න. එම රැස්වීමේදී සිදුවූ දෙය පිළිබඳව පසුගිය පාඩමෙන් ළමුන්ට මතක තිබේදැයි බලන්න. ඔවුන්ට මතක නැතිනම්, පහත සඳහන් අදහස් ගෙනහැර දක්වා ඉක්මන් සමාලෝචනයක යෙදෙන්න:

මෙම රැස්වීමේදී ස්වර්ගික පියාණන්වහන්සේ විසින් අප උන්වහන්සේ හා සමානවීමට අපට උපකාරීවන සැලැස්මක් අප වනුවෙන් ඉදිරිපත්කලසේක. සැලසුම අනුගමනයකිරීම අපි තෝරා ගත්තෙමු. එනිසා අපි හැම කෙනෙක්ම පොළොවට පැමිණ භෞතික ශරීරයක් ලබාගත්තෙමු. අප පොළොවේ සිටිනවිට පණත් ඉටුකිරීම අප තෝරාගතහොත්, අපට නැවතත් ස්වර්ගික පියාණන් සමග ජීවත්වීමට හැකියාව ලැබෙන්නේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොවට පැමිණීමට ඉදිරිපත්වූයේ, ස්වර්ගික පියාණන්වහන්සේ සමග නැවතත් ජීවත්වීම සඳහා අප කල යුතු දේවල් අපට පෙන්වාදීම සඳහාය. ලුසිෆර්ටද පොළොවට පැමිණ පණත් ඉටුකරන ලෙස සෑම කෙනෙකුටම බලකිරීමට අවශ්‍යවිය. ජනතාවට කිසිම තේරීමක් කිරීමට ඉඩදීම ඔහුට අවශ්‍ය නොවීය. නමුත් ස්වර්ගික පියාණන්ගේ සැලසුම අනුගමනයකිරම යේසුස් වහන්සේ ටඅවශ්‍යවූසේක. ජනතාව ජීවත්විය යුතු අන්දම ගැන ඔවුන්ම තෝරාගැනීම උන්වහන්සේට අවශ්‍යවූසේක.

අපට වඩා හොඳ අපම තෝරාගැනීම බවත් එවිටහරි තේරීම්කිරීමට අපට ඉගෙනගත හැකි බවත් ස්වර්ගික පියාණන්වහන්සේ දැන සිටිබව පහදාදෙන්න. අපටම තෝරාගැනීමට තිබෙන හැකියාව කර්තෘත්වය වශයෙන් හැඳින්වේ. කර්තෘත්වය යන වචනය ළමුන් ලවා දෙවරක් කියවන්න.

ලුසිෆර් (ඔහු සාතන් වශයෙන්ද හැඳින්වේ)සහ ඔහුගේ අනුගාමිකයෝ ස්වර්ගික පියාණන් වහන්සේගේ සැලසුම හා තවමත් සටන්වදිති. ඔවුන්ට අවශ්‍යවන්නේ අප අපගේ කර්තෘත්වය පාවිච්චිකරමින් යේසුස්වහන්සේ අනුගමනයකරමින් හරි දේ කිරීම වෙනුවට, ඔවුන්ව අනුගමනයකිරීම තෝරාගැනීමය.

හදේතෝ සටහන

හදේතෝ සටහන පෙන්වන්න.

- අපට හරි දේ තෝරාගැනීමට උපකාරකිරීමට යේසුස්වහන්සේට අවශ්‍යවූයේ කුමක් කිරීමටද? (පොළොවට පැමිණ හරි දේ කුමක්දැයි අපට ඉගැන්වීමට උන්වහන්සේට අවශ්‍යවූ සේක. එවිටඅපට ඥානවන්ත ලෙස තෝරාගැනීමට හැකිවන්නේය.)

හදේතෝ සටහනේ වචන පෙන්වන්න. වචන ශබ්දනගා කියවා, ඔබත් සමග ළමුන්ට නැවතත් කීමට සලස්වන්න.

## හරි දේ කිරීම තෝරාගැනීමට ළමුන්ට පූළුවන

ශුද්ධ ලියවිලි සාකච්ඡාව

මතෙව් 21:14–16 එන කථාන්තරය ඔබගේම වචනවලින් කියන්න. සමහර නායක පූජකවරුන් යේසුස්වහන්සේ ගැලවුම්කරුවාණන් බවත්, ඔවුන්ට උපකාර පිණිස ස්වර්ගික පියාණන්වහන්සේ විසින් එවන ලද බවත් විශ්වාස නොකලබව පහදාදෙන්න. ඔවුන් යේසුස්වහන්සේ ගැන ඉතා ඕනෑකමින් පරීක්ෂාකාරීව සිටියේ උන්වහන්සේ තුල යම් වරදක් සොයා උන්වහන්සේව මරාදැමීමට කාරණාවක් සෙවීමටය.

යේසුස්වහන්සේ දේවමාළිගාව තුලදී අන්ධයන්ව සහ කොරුන්ව සුවපත්කල විට, නායක පූජකවරු අමනාපයට පත්වූ බව පහදාදෙන්න. ළමයින් යේසුස්වහන්සේට ප්‍රශංසාකිරීමට පටන්ගත් විට පූජකවරුන් වඩාත්

කෝපව, ළමුන්ව නවතන ලෙස ඔවුහු යේසුස්වහන්සේට කීහ. නමුත් උන්වහන්සේ පූජකවරුන් අමතා, කුඩා ළමුන් උන්වහන්සේට ප්‍රශංසාකරන බව ශුද්ධ ලියවිලිවල කියවා නැත්දැයි ඔවුන්ගෙන් ඇසූසේක.

මෙම කථාන්තරයෙහි සඳහන් ළමුන් පරිදි, ඔබගේ පංතියේ ළමුන්ටද යේසුස්වහන්සේව අනුගමනයකිරීම තෝරාගෙන උන්වහන්සේට ප්‍රශංසාකල හැකි බව පෙන්වා දෙන්න.

ශුද්ධ ලියවිල්ල

දහම සහ ගිවිසුම පෙරළා, දහම සහ ගිවිසුමේ 37:4 කොටසක් ශබ්දනගා කියවන්න: "සෑම මිනිසෙක්ම තමාම තෝරාගනිත්වා." මෙම ශුද්ධ ලියවිල්ලේ සඳහන් සෑම මිනිසෙකු නම්, සියලුම ජනතාව බව පහදාදෙන්න. අප කල යුතු දේ ගැන තෝරාගැනීමට අප සියල්ලන්ටම පුළුවන. ළමුන්ට නැගීසිට එම වාක්‍යඛණ්ඩය නැවත කීමට කියන්න.

හදේතෝ සටහන

හදේතෝ සටහන පෙන්වා සටහනේ වචන නැවතත් ළමුන් ලවා කියවන්න.

## හරි දේ තෝරාගැනීමට අපට පුළුවන

කථාන්තරය

යේසුස්වහන්සේට අවශ්‍ය දේ කිරීමට තෝරාගත් ළමයෙකු පිළිබඳ කථාන්තරය කියන්න. ඔබට පහත සඳහන් කථාන්තරය යොදාගැනීමට අවශ්‍යවිය හැකිය:

බ්‍රිටනි එක් ඉරුදින උදෑසනක නොඉවසිලිමත් හැඟීමකින් යුතුව අවදිවූවාය. ඇයට බොහෝ ප්‍රමාදවී නින්දට යාමටත්, ඉතා උදෑසනින්ම අවදිවීමටත් සිදුවිය. ඇයට නානකාමරයේ තම වාරය එනතෙක් සිටීමට සිදුවිය. ඉන්පසු ඇයට තමාගේ එක් සපත්තුවක් සොයාගැනීමට නොහැකිවිය. ඉන්පසුව ඇයගේ කකුල පුටුවක හැපින. ඇයගේ ලොකු සොහොයුරා ඇය හා කෝපව සිටියේ ඇය මුළු පවුලම ප්‍රමාදකිරීමට යන්නේ යයි ඔහු සිතූ නිසාය.

ප්‍රාථමිකයේදී බ්‍රිටනි ගායනා කලේ නැත. ඇය සිනහසුනේ නැත. ඇය කිසිවකට සවන්දුන්නේද නැත. ඇය ප්‍රාථමිකයේ සිටීම ගැනද කැමති නොවීය. ඇය පසුපස පේළියේ හිඳගෙන රවාගෙන සිටිමින්, තම සාක්කුවේ ඇති යමක් සමග සෙල්ලම්කරමින් සිටියාය.

- බ්‍රිටනි කල තේරීම් මොනවාද?

බ්‍රිටනිගේ ගුරුවරිය පාඩම සූදානම්කිරීමට බොහෝ වෙහෙසක් ගෙන තිබූ අතර, බ්‍රිටනි සවන් නොදෙන බවද දැනසිටියාය. පංතිය අවසන්වීමෙන් පසුව බ්‍රිටනිගේ ගුරුවරිය බ්‍රිටනි සමග හුදකලාව කථාකොට, ප්‍රශ්නය කුමක්දැයි ඇයගෙන් ඇසුවාය. බ්‍රිටනි හැඬීමට පටන්ගත්තාය. සතුටින් සිටීම ඇයට අවශ්‍යව තිබූ අතර, ඇයගේ ගුරුවරියද සතුටින් සිටීම ඇයට අවශ්‍යවිය.

බ්‍රිටනිගේ ගුරුවරිය ඇය අමතා, අත්හදාබැලීමක් උත්සාහකිරීමට කැමතිදැයි ඇයගෙන් ඇසුවාය. අත්හදාබැලීමක් විනෝදයක් විය හැකි යයි බ්‍රිටනි සිතුවාය. ඇයගේ ගුරුවරිය පහදාදෙමින්, හරි දේ තෝරාගනිමින් යේසුස්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන දේවල් කිරීමෙන් අපට සතුටින් සිටීමට උපකාරවනත්වන බව කීවාය. යේසුස්වහන්සේ ඇයගෙන් අපේක්ෂාකරන, *ඇය කල යුතු* දෙය ඊළඟ ඉරුදිනයේදී ප්‍රාථමිකයේදී කිරීමට උත්සාහකිරීමට බ්‍රිටනි එකඟවූවාය.

ඊළඟ සෙනසුරාදා, බ්‍රිටනිගේ ගුරුවරිය අත්හදාබැලීම ගැන ඇයට සිහිපත් කළාය. බ්‍රිටනි තමාටම මෙසේ කියාගත්තාය, "යේසුස්වහන්සේ මා කරනැයි අපේක්ෂාකරන දෙය හෙට මම කිරීමට යන්නෙමි."

ඉරුදින උදෑසන බ්‍රිටනි අවදිවූ විට, අත්හදාබැලීම උත්සාහකිරීම ගැන සතුටින් සිටියාය. ඇය ඉක්මණින්ම සභාවට යාමට ලැහැස්තිවී, තම සහෝදරියටද ලැහැස්තිවීමට උදව් කළාය. බ්‍රිටනි ප්‍රාථමිකයට ගියවිට, ඇය සිනහසෙමින් සිටියාය. ආරම්භක ගීතය ගායනා කල ඇය, ආරම්භක යාච්ඤාව කාලය තුලදී ගෞරවනීය ලෙස හිඳගෙන සිටියාය. බ්‍රිටනි අසල හිඳගෙන සිටි පිරිමි ළමයා නිතරම ඇයට කොඳුරමින් සිටි අතර, බ්‍රිටනිද විගසකින්ම පෙරළා කෙඳිරීමට පටන්ගත් අතර, සවන්දීමද නොකෙරින. පංතියට යාමට මොහොතකට පෙර, උඩ බැලූ බ්‍රිටනිට බිත්තියේ එල්ලා තිබූ යේසුස්වහන්සේගේ පින්තූරය පෙනින. යේසුස්වහන්සේ අපේක්ෂාකරන දෙය කිරීමට තමාට අවශ්‍යව තිබූ බව ඇයට

සිහිපත්විය. නිශ්ශබ්දව පංතියට ගිය බ්‍රිටනි, ඉදිරි පේළියේ හිඳගත්තාය. පාඩමට ඇහුම්කන්දුන් ඇය, ඇයගේ ගුරුවරිය ඇයගෙන් ඇසූ ප්‍රශ්න වලටද පිළිතුරු දුන්නාය. බ්‍රිටනිට සතුටු හැඟීම් ඇතිවිය. තමා හරි දේ තොරාගැනීම ගැන ඇය ප්‍රීතියට පත්වූවාය. හරි දේ තෝරාගෙන යේසුස්වහන්සේ ඇයගෙන් අපේක්ෂාකල දෙය කිරීමෙන් ඇයට සතුටු හැඟීමක් ඇතිවූබව ඇය දැනගත්තාය.

සාකච්ඡාව

- බ්‍රිටනිට සතුටක් ඇතිවූයේ මන්ද?
- ඔබ හරි දේ තෝරාගැනීම නිසා ඔබට සතුටක් දැනුනේ කවදාද?

**සාරාංශය**

ක්‍රියාකාරකම

හැම ළමයෙකුටම තමාගේ අතේ මාපටැඟිල්ල පිටතට විදහා මිටමොලවාගැනීමට කියන්න. ඔවුන් කළහැකි යම් තේරීම් කිහිපයක් ඔබ විස්තරකිරීමට යන බව ළමයින්ට කියන්න. එම විස්තරකල තේරීම යේසුස්වහන්සේ ඔවුන්ගෙන් අපේක්ෂාකරන්නක් නම්, ඔවුන් සිය මාපටැඟිල්ල ඉහළට එසවිය යුතුය. එම ප්‍රකාශයෙන් විස්තරවන්නේ සාතන් ඔවුන්ගෙන් අපේක්ෂාකරන දෙයක් නම්, ඔවුන් සිය මාපටැඟිල්ල පහළට දැක්විය යුතුය. පහත සඳහන් උදාහරණ යොදාගන්න, නැතහොත් කිහිපයක් ඔබම නිර්මාණයකරගන්න.

- ප්‍රාථමිකයට පැමිණීම ඔබ තෝරාගත්තේය.
- සෑම කෙනෙකුටම ගායනාකිරීමට නායකයා කී විට. ප්‍රාථමිකයේදී ගායනාකිරීම ඔබ තෝරාගත්තේය.
- යාච්ඤාකරන විට ඔබගේ දෙනෙත් විවරව තබාගැනීම ඔබ තෝරාගත්තේය.
- මිතුරෙකු සභාවට ගෙනඒම ඔබ තෝරාගත්තේය.
- සක්‍රමේන්තු කාලයේදී ඔබගේ මිතුරාට කෙඳිරීම ඔබ තෝරාගත්තේය.
- ඔබගේ පංතියට නිශ්ශබ්දව යාම ඔබ තෝරාගත්තේය.
- වෙනත් ළමයෙකු යමක හැපී වැටුනවිටදී එයට සිනහසීම තෝරාගත්තේ ඔබය.
- ශබ්දකිරීම මගින් අනෙක් ළමයින්ට කරදරකිරීම ඔබ තෝරාගත්තේය.
- කියාකාරකමේදී ගුරුවරියට උදව්කිරීම ඔබ තෝරාගත්තේය.
- යමෙක් වැරදි පිළිතුරක් දුන්විට ඔහුව සමච්චලයට ලක්කිරීම තෝරාගත්තේ ඔබය
- ගුරුවරිය කථාන්තරයක් කියනවිට එයට නිශ්ශබ්දව සවන්දීම ඔබ තෝරාගත්තේය.

ගීතය

"හරි මාර්ගය තෝරාගන්න" නම් ගීතය ගායනාකිරීමට හෝ වචනකීමට ළමුන් මෙහෙයවන්න.

සාක්ෂිය

ස්වර්ගික පියාණන්වහන්සේ අපට කර්තෘත්වය ලබා දීම ගැන ඔබ කෙතරම් කෘතඥ වන්නේදැයි ළමුන්ට කියන්න. හරි ද් තෝරාගැනීමට ළමුන්ට තිබෙන හැකියාව ගැන ඔබගේ විශ්වාසය පළකරන්න.

සතිය තුලදී ළමයින් එකිනෙකා විසින් කල හරි තේරීමක් ගැන පංතියට ප්‍රකාශකිරීමට සූදානම්ව පැමිණෙන ලෙස ඔවුන්ට කියන්න.

අත්පත්‍රිකා

ඊළඟ සතියේ පාඩම සම්බන්ධයෙන් ඔබ ලමයින් වෙනුවෙන් සටහන් සූදානම්කර තිබේනම්, හැම ළමයෙකුටම එයින් සටහනක් බැගින් දෙන්න. සටහන් ගැන ළමයින්ට පැහැදිළිකරදී, එම සටහන් ඔවුන්ගේ දෙමාපියන්ට දීමට කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

## සාරවත් ක්‍රියාකරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරා ගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. සියලුම ළමයින්ට නැගිටසිටීමට කියන්න. නායකයා වශයෙන් එක් ළමයෙකු තෝරා, ඔහුට හෝ ඇයට කාසියක් හෝ බොත්තමක් දෙන්න. නායකයාට පංතිය ඉදිරිපිට සිටගෙන කාසිය ඔහුගේ හෝ ඇයගේ එක් අතක සඟවාගෙන සිටින්න කියන්න. කාසිය තිබෙන අත කුමක්දැයි අනුමානකි-රීමට පංතියේ අනෙක් ළමුන්ට කියන්න. හැම කෙනෙක්ම අනුමාන ලෙස ප්‍රකාශකල පසුව, කාසිය තිබෙන්නේ කිනම් අතේදැයි නායකයා එළිදරව්කරයි. නිවැරදි ලෙස අනුමානකල ළමයි නායකයා ඉදිරියට එක් පියවරක් තබති. අනෙක් අය ඔවුන් සිටිතැනම සිටිති. ළමයෙක් නායකයා ළඟට පැමිණෙන තුරු නොනවත්වා කරගෙනයන්න.

   - සෑම අවස්ථාවකදීම ඔබලා සියලුදෙනාටම නිවැරදිව අනුමානකිරීමට නොහැකිවූයේ මන්ද? (අනුමානකිරීම සඳහා උපකාර වශයෙන් ඔබලාට කිසිදු තොරතුරක් නොලැබුනි.)
   - තෝරාගැනීමකදී අනුමානකිරීම හොඳ මාර්ගයක්ද?
   - අපගේ තීරණ සම්බන්ධයෙන් අප අනුමාන නොකලයුතු බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරකරන්න. අප කල යුතු දේවල් යේසුස්වහන්සේ අපට උගන්වා ඇතිසේක. ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන දේවල් අප කරන්නේ නම්, අප නිතරම හරි තේරීම් කරන්නෙමු.

2. ළමයින්ට කඩදාසි සහ ක්‍රේයොන් ලබාදී, ඔවුන් ප්‍රාථමිකයේදී කරනු ඇතැයි ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ බලාපොරොත්තුවන දේවල් චිත්‍රයට නැගීමට ඔවුන්ට කියන්න. නිශ්ෂබ්දව හිඳගෙන සිටීම, ගායනාකිරීම, ගුරුතුමියට උපකාරකිරීම හෝ නිශ්ෂබ්දව ඇවිදීම උදාහරණ විය හැකිය.

3. "කන්දෙන්න, කන්දෙන්න" ගීතය, පෙන්වාදී තිබෙන ක්‍රියාවන් යොදාගෙන ගායනාකිරීමට හෝ එහි වචනකීමට ළමුන්ට උදව්කරන්න (*ළමා ගී පොත,* පි. 107):

   කන්දෙන්න නිසල කුඩා හඬට (කනට අත යවන්න)!
   කන්දෙන්න! කන්දෙන්න (ඇඟිල්ල තොල්වලට යවන්න)!
   ඔබට තෝරාගැනීමක් ඇතිවිට (අත් පිටතට දමන්න, අත්ල උඩඅතට)
   එතුමා නිතරම ඔබට උපදෙස් දෙයි (අත් නමාගන්න).

   ගීතය කිහිපවාරයක් ගායනාකර ළමුන්ට වචන ඉගෙනගැනීමට උපකාරකරන්න.

# අපට විශේෂිතවූ පවුල් ඇත

**6**
වෙනි
පාඩම

---

**අරමුණ**

ළමයින් පවුල් තුළ හැදීවැඩීම ස්වර්ගික පියාණන්වහන්සේ සැලසුම්කල බව ළමුන්ට තේරුම්ගැනීමට උපකාරකිරීමය.

---

**සූදානම්වීම**

1. ලූක් 1:26–38 සහ මතෙව් 1:18–25 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.

2. පහත සඳහන් අකුරු කඩදාසියකින් කපාගන්න. එක් එක් අකුර අඟල් තුනක් හෝ හතරක් පමණ උසට කපාගන්න:

   පවුල

3. "ප්‍රීතිමත් පවුලක්" යන ගීතය ගායනාකිරීමට හෝ එහි වචන කීමට සූදානම්වන්න (*ළමා ගී පොත,* පි. 198). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුලත්කර ඇත.

4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්.
   ආ. ඔබගේ පවුලේ පින්තූරයක් (මනාපනම්).
   ඇ. කඩදාසි සහ පැන්සල් හෝ ක්‍රේයොන්.
   ඈ. පින්තූරය 2-5, ක්‍රිස්තුස්වහන්සේගේ පිළිසිඳගැනීම: පින්තූරය 2-6, කිතු උපත (සුභාරංචි කලා පින්තූර මල්ල 201: 62495).

5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

*සටහන:* පවුල් සාමාජිකයන්ගේ තත්වය ගැන සංවේදීවන්න. පවුලක වඩාත්ම වැදගත් දෙය නම්, පවුලේ සිටින සාමාජිකයන් ගණන නොව, නමුත් පවුල් සාමාජිකයන් එකිනෙකා කෙරෙහි දක්වන ප්‍රේමය සහ සැලකිල්ල බව ළමුන්ට තේරුම්ගැනීමට උපකාරකරන්න.

---

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිගැන්වූවා නම් ඔවුන් සමග එය සොයාබලන්න. පසුගිය සතිය තුළදී ළමයින් ඔහු හෝ ඇය හරි දේ තෝරගත් අවස්ථාවක් ගැන කීමට එක් එක් ළමයාට ආරාධනාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

### පවුල් ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුමේ කොටසකි

අවධානශීලී ක්‍රියාකාරකම

- පොළොවට පැමිණීමට පෙර ඔබ ජීවත්වූයේ කොහේද?

අප හැම කෙනෙක්ම ස්වර්ගික පියාණන්වහන්සේගේ සැලසුම අනුගමනයකරමින් පොළොවට පැමිණීම තෝරාගත්බව ළමයින් සමග සමාලෝචනය කරන්න. අප පොළොවට පැමිණි විට, අපට උදව්කිරීමට

සහ අපට ප්‍රේමකිරීමට මිනිසුන් ලබාදෙමින් ස්වර්ගික පියාණන් වහන්සේ අපට ආශිර්වාදකල බව ළමයින්ට කියන්න.

මෙම මිනිසුන් කවුදැයි සොයාගැනීමට උපකාරයක් වශයෙන් ඔබ ඔවුන්ට හෝඩුවාවල් දෙන බව ළමයින්ට කියන්න. වරකට එක බැගින් *පවුල* යන වචනයේ එක් එක් අකුර ඔසවාගෙන සිටීමට ළමයෙකුට කියන්න. අකුරෙහි නම සඳහන්කරන ලෙස ළමයින්ට කියන්න. ඉන්පසුව එම අකුරෙන් පටන්ගන්නා හෝඩුවාව දෙන්න. සුදුසු හෝඩුවාවල් ඊළඟ පිටුවේ ලබාදී ඇත.

1. පියා එහි කොටසකි.

2. නැන්දලා සහ මාමලා එහි කොටසකි.

3. මව එහි කොටසකි.

4. මම එහි කොටසකි

5. ප්‍රේමය එහි කොටසකි.

6. ඔබ එහි කොටසකි.

ඔබ සියලුම හෝඩුවාවල් දීමෙන් පසුව, *පවුල* යන වචනය ළමයින් සමග නැවත කියන්න.

සාකච්ඡාව

- අපට පවුල් අවශ්‍ය මන්ද?

අප ළදරුවන් මෙන් සිටියදී අප ගැන සැලකිල්ලක් දක්වන අය සමග ජීවත්වීම අපට අවශ්‍යව තිබින. අප හැම කෙනෙක් සඳහාම ස්වර්ගික පියාණන්වහන්සේ සැලසුම්කලේ අපට ආදරයකරන අපව රැකබලාගන්නා පවුලක් සමග ජීවත්වීමටය. අප වයසෙන් වැඩෙන විට, අපට ඥනාවන්ත තේරීම් කිරීමට අපගේ පවුලේ අය අපට උගන්වා අපට උපකාරද කරති.

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පවුලක ඉපදීම සඳහා ස්වර්ගික පියාණන්වහන්සේ සැළසුම් කළසේක

ශුද්ධ ලියවිලි කථාන්තරය සහ සාකච්ඡාව

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පවුලක ඉපදීම සඳහා ස්වර්ගික පියාණන්වහන්සේ සැලසුම් කලබව පහදාදෙන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ආදරයෙන් රැකබලාගැනීමට තෝරාගනු ලැබූ පොළොවේ මිනිසා සහ කාන්තාව ස්වර්ගික පියාණන්වහන්සේට ප්‍රේමකරමින් උන්වහන්සේ ගේ පණත් ආරක්ෂාකළ අය වෙති.

ක්‍රිස්තුස්වහන්සේගේ පිළිසිඳගැනීම, පින්තූරය 2-5 පෙන්වා, ලූක් පොතේ 1:26–38 හි දැක්වෙන ගේබ්‍රියෙල් සුරදූතයා මරියතුමිය බැහැදැකීමේ කථාන්තරය කියන්න.

- මේ පින්තූරයෙහි සිටින කාන්තාව කවරෙක්ද? (ලූක් 1:27 බලන්න.)

- මේ පින්තූරයෙහි සිටින මිනිසා කවරෙක්ද? (ලූක් 1:26 බලන්න.)

සුරදූතයා දුටුවිට මරියතුමිය පුදුමයට සහ මඳක් කණගාටුවටත් පත්වූ නමුත්, ස්වර්ගික පියාණන්වහන්සේට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට ඇය කැමතිව සිටි බව පහදාදෙන්න ලූක් 1:29–38 බලන්න).

- සුරදූතයා මරියතුමියට කුමක් පැවසුවේද? (ලූක් 1:31–32 බලන්න.)

- බිළිඳාගේ පියාණන්වන්නේ කවරෙක්ද? (ස්වර්ගික පියාණන්වහන්සේය.)

පින්තූරය 2-6, කිතු උපත පෙන්වන්න.

- මෙම පින්තූරයේ සිටින මිනිසා කවරෙක්ද?

යොසෙප් වනාහි යේසුස්වහන්සේගේ මව හා විවාහවී, යේසුස්වහන්සේව ආදරයෙන් රැකබලාගැනීමට ස්වර්ගික පියාණන්වහන්සේ විසින් තෝරාගත් ධාර්මික මිනිසෙක් බව ළමුන්ට කියන්න. යේසුස්වහන්සේ

ඉපදීමට පෙර, සුරදූතයෙක්ද ඔහු බැහැදුටු බව පහදා දෙන්න. මතෙව් 1:18–26 හි එන කථාව කෙටියෙන් කියන්න. මතෙව් 1:21 හි සඳහන් පරිදි සුරදූතයා යොසෙප්ට පැවසූ දෙය ශබ්දනගා කියවන්න.

- බිළිඳාට නම් තැබීම ගැන සුරදූතයා මරියතුමියට පැවසුවේ කුමක්ද?

*යේසුස්* යන නාමයේ අදහස ගැලවුම්කරුවාණන් බව පහදාදෙන්න. යේසුස්වහන්සේ අප සියලුදෙනාම පාපයෙන් ගළවාගෙන අපට නැවතත් ස්වර්ගික පියාණන් සමග ජීවත්වීමට යාම සඳහා උපකාරකරන-සේක. යේසුස්වහන්සේ ඉපදීමට පෙර පොළොවේ ජීවත්වූ අනාගත වක්තෘවරු ගැලවුම්කරුවාණන්ගේ නාමය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වනබවට අනාවැකි කීහ. *ක්‍රිස්තුස්* යන වචනයේ අදහස "ආලේප කල තැනැත්තා" නම්වේ. එහි අදහස ස්වර්ගික පියාණන්වහන්සේ විසින් තෝරාගත්බවය.

- යේසුස්වහන්සේට පවුලක් අවශ්‍යවූයේ මන්ද?

## අපගේ පවුල් අපට ප්‍රේමකරති

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

සියලුම පවුල් විවිධාකාර බව පහදාදෙන්න. සමහර පවුල්වල දෙමාපියන් දෙදෙනාම සිටින අතර, සමහර පවුල්වල ඇත්තේ එක් අයෙක් පමණය. සමහර පවුල්වල ළමයින් බොහෝ දෙනෙක් සිටින අතර, සමහර පවුල්වල සිටින්නේ ළමයින් ටිකදෙනෙක් හෝ එක් ළමයෙක් පමණය. සමහර පවුල්වල ළමයින්, දෙමාපියන්, මුනුබුරන්, නැන්දලා, සහ මාමලා සිටින අතර සියල්ලෝම එකට ජීවත්වෙති. සමහර ළමයින් ඔවුන්ගේ ඥාතීන් නොවන වැඩිහිටියන් සමග ජීවත්වන නමුත්, ඔවුහු ඔවුන්ට තවදුරටත් ආද-රයකරමින් ඔවුන්ව රැකබලා ගනිති. පවුල් එක්ව විවිධ දේවල් කරන නමුත් විවිධ අන්දමින් ප්‍රේමය දක්වති. පවුල්වල වැදගත් දෙය නම්, පවුල් සාමාජිකයන් එකිනෙකාට ප්‍රේමකරමින් සැලකිල්ල දැක්-වීමය. හැම කෙනෙකුටම අවශ්‍යවන්නේ පවුලේ කොටසක්වීමය.

සාකච්ඡාව

- ඔබ ළදරුවෙක්ව සිටියදී ඔබගේ පවුලේ අය ඔබ වෙනුවෙන් කල දේවල් මොනවාද?
- ඔබගේ පවුලේ අය දැන් ඔබ වෙනුවෙන් කරන දේවල් මොනවාද?
- ඔබගේ පවුලේඅනෙක් සාමාජිකයන් වෙනුවෙන් ඔබ කරන්නේ මොනවාද?

ළමා සහභාගීත්වය

ඔබගේ පවුලේ පින්තූරයක්, ඔබ එකක් ගෙනවිත් තිබේනම්, පෙන්වන්න. ඔබගේ පවුලේ සාමාජිකයන්ව පෙන්වාදෙමින් හැමකෙනෙක්ම ඔබට වැදගත්වන්නේ කෙසේදැයි කියන්න. ළමයින්ට ඔවුන්ගේ පවුල් ගැන සාකච්ඡකිරීමට කියන්න. තම පවුල්වල අය ඔවුන්ට ප්‍රේමකරන නිසා ඔවුන්ට සතුටක් හැඟුන අවස්ථාවන් ගැන කීමට ළමයින්ට කියන්න.

## අපගේ පවුල්වල අය අපට උපකාර කරති

සාකච්ඡාව

පවුල් සාමාජිකයන් එකිනෙකාට ප්‍රේමකරමින් උපකාරකිරීම ගැන උදාහරණ කිහිපයක් ඔබ දෙන විට ඊට සවන්දීමට ළමයින්ට කියන්න. ඔබ එක් උදාහරණයක් දුන් පසු, උදාහරණයේ එන අය එකිනෙකාට ප්‍රේමය පෙන්වූ අන්දම ගැන කීමට ළමයින්ට කියන්න. පහත සඳහන් උදාහරණ හෝ ඔබගේම කිහිපයක් නිර්මානය කරගන්න:

- කර්ක්ගේ කුඩා සොහොයුරා එරික් අඳුරට බියක් දැක්වීය. එනිසා ආරක්ෂාව හැඟීමට යාච්ඤාවක් කීමට කර්ක් ඔහුට උදව්කළේය. ඉන්පසු එරික්ට නින්දයාමට කර්ක් ගීතයක් ගායනා කළේය.
- කෙයිට්ලින්ගේ මව රෝහලයෙහි පිටත ගොස් සිටියාය. කෙයිට්ලින් කඩදාසියක් හදවතක හැඩයට කපා ඇය සිය මවට කෙතරම් ප්‍රේමකරන්නේදැයි සඳහන්කර එහි පණිවුඩයක් ලීවාය. ඇය එම පණිවුඩය සිය මවගේ කොට්ටය උඩ තැබුවේ මව නිවසට පැමිණිවිට ඇයට එය සොයාගැනීම සඳහාය.

- ඉයන්ගේ ආච්චී හැම සතියකම කාලය වැයකරමින් ඉයන්ට පාසල් වැඩවලදී වචන උච්චාරණයකිරීම පුහුණුවීමට උපකාරකළාය. ඇයගේ උපකාර සහ ප්‍රශංසාවන් මගින් ඔහුගේ ලැයිස්තුවේ සියලුම වචන ඉගෙනගැනීමට ඔහුට ධෛර්‍යයක් ලැබින.

- තම බෞතීස්මයට පෙර මෝර්මන්ගේ පොත කියවීමට ටෝනි ඉලක්කයක් තැබීය. සෑම සතියකම ඔහුගේ වැඩිමහල් සොහොයුරිය ඔහු සමග වාඩිවී ඔහු කියවනවිට ඊට සවන් දුන්නාය. ඇය අසීරු වචන ටෝනිට පැහැදිළිකළාය. සිය සොහොයුරියගේ උපකාරයෙන් ටෝනිට සිය ඉලක්කය සපුරාගැනීමට හැකිවිය.

- තම පංතියේ ළමුන් කිහිපදෙනෙක් තම බාල සොහොයුරාට සරදම්කරන බව හයිඩිට ඇසුනි. ඔහුට හැඬුම් ආ බැවින් හයිඩි ඔහුව වෙනතකට රැගෙන ගොස් ඔහු සමග ක්‍රීඩාකළාය. පසුව තම පංති ළමුන් ඇමතූ ඇය, ඔවුන් වෙනත් ළමුන්ට සරදම් නොකළ යුතුබව කීවාය.

භාණ්ඩ පාඩම — ඔබේ අත ඇඟිලි විදහාගෙන ඔසවන්න. අතක ඇඟිලි සහ මාපටඟිල්ල මෙන් පවුල සාමාජිකයන්ට එක්ව කටයුතුකිරීමට හැකි බව පහදාදෙන්න. තම ශුද්ධ ලියවිලි පොත් හෝ වෙනත් යම් භාණ්ඩයක් ඔවුන්ගේ මාපටඟිල්ල පාවිච්චි නොකර, එක් අතකින් ගැනීමට උත්සාහකිරීමට ළමුන්ට කියන්න. එම භාණ්ඩය ඔවුන්ගේ ඇඟිලි පමණක් යොදා ගෙන ගැනීමට ඔවුන්ට හැකියාවක් තිබුනද, ඔවුන්ගේ මාපටඟිල්ලද ඇඟිලි සමගම එකට පාවිච්චිකිරීම වඩාත් පහසු බව පහදාදෙන්න. පවුලක සෑම සාමාජිකයෙක්ම වැදගත් බව ළමුන්ට මතක්කරදෙන්න. පවුල් සාමාජිකයන් සියලුදෙනාම එක්ව වැඩකරන විට ඔවුන්ට වැඩ බොහොමයක් ඉටුකරගත හැකිය.

කලා ක්‍රියාකාරකම — ළමුන්ට කඩදාසි සහ ක්‍රේයොන් හෝ පැන්සල් ලබාදී ඔවුන්ගේ පවුල්වල අයගේ පින්තූර ඇඳීමට කියන්න. එක් එක් පින්තූරයේ *මගේ පවුලේ අය මට ආදරය කරති* යයි ලියා ලේබලයක් අලවන්න.

**සාරාංශය**

ගීතය — "ප්‍රීතිමත් පවුලක්" යන ගීතය ළමයින් සමග ගායනාකරන්න, නැතහොත් එහි වචන කියන්න.

සාක්ෂිය — ස්වර්ගික පියාණන්වහන්සේගේ අවශ්‍යතාවය වන්නේ අප එකිනෙකා පවුලක් මගින් ආදරයෙන් රැකබලාගැනීම බව සාක්ෂිදරන්න. සෑම පවුලක්ම විවිධාකාරබවත්, සෑම පවුලක්ම වැදගත්බවත් ළමයින්ට සිහිපත්කරන්න. තම පවුල් සතුටින් තැබීමට උපකාරවත්වීම සඳහා ඔවුන්ට බොහෝදේවල් කළ හැකිබවට සාක්ෂිදරන්න.

ළමයින් අඳින ලද චිත්‍ර ඔවුන්ගේ දෙමාපියන්ට පෙන්වා, ඔවුන් තම පවුල්වලට කෙතරම් ප්‍රේමකරන්නේදැයි ඔවුන්ට කීමට ළමුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. පවුල් ලබාදීම වෙනුවෙන් ස්වර්ගික පියාණන්වහන්සේට ස්තූතිකිරීමට එම ළමයාට කියන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්** — පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරා ගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද යොදාගත හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ඔබගේ සංස්කෘතිය අනුව අර්ථදායක නම්, තමාගේ නම තෝරාගත් ආකාරය ගැන පැවසීමට සූදානම්ව පැමිණෙන ලෙස හැම ළමයෙකුටම කියන්න. 5වෙනි පාඩම අවසානයේදී ළමයින්ගේ දෙමාපියන්ට සටහනක් ලියා, ඔවුන්ගේ ළමයාට ඔහුට හෝ ඇයට ඔවුන් නම තැබුවේ කෙසේදැයි ළමයාට කියන මෙන් දෙමාපියන්ගෙන් ඉල්ලා යැවීම මගින් මෙය කළහැකිය (21වැනි පිටුව බලන්න). අප ඉපදුන විට, අපගේ නම් තෝරන්නේ අපගේ පවුල්වල අය බව පංතිය තුළදී

පහදාදෙන්න. (හැකි නම්, සතිය තුලදී එක් එක් ළමයාගේ දෙමාපියන්ට පණිවුඩයක් දීමෙන්, ඔවුන්ගේ ළමයින්ගේ පළමු නම තෝරාගත්තේ කෙසේදැයි ඔහුට හෝ ඇයට කියා ඔවුන්ට සූදානම්ව පැමිණීමට සලස්වන ලෙස දෙමාපියන්ට සිහිපත්කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

2. එක් එක් ළමයාට ඔහුගේ හෝ ඇයගේ පවුලේ පින්තූරයක් නිවසෙන් රැගෙන ඒමට කටයුතු යොදන්න (පංතිය ආරම්භයේදීම මේවා එකතුකිරීමෙන් ඔවුන්ගේ සිත් වෙනතකට යොමුනොවනු ඇත). වරකට එකක් බැගින් ළමුන්ට මෙම පින්තූර බැලීමට සලස්වා, ඔවුන් ප්‍රියකරන ඔවුන්ගේ පවුල්වල අය ගැන කරුණක් හෝ දෙකක් ගැන කීමට කියන්න. (ඔබ 1වෙනි සාරවත් ක්‍රියාකාරකමද යොදාගැනීමට සැලසුම්කරන්නේ නම්, 5වෙනි පාඩම අවසානයේදී නිවසට යවන එම සටහනට පවුලේ පින්තූරයක් ඉල්ලීමද ඇතුළත් කිරීමට ඔබට හැකිය).

3. "අපි මෙහි එක්ව සිටුමු" ගීතය පවුල් සාමාජිකයන්ගේ නාමයන්ද පාවිච්චිකරමින්, ළමයින් සමග ගායනාකරන්න, නැතහොත් වචන කියන්න (*ළමා ගී පොත*, පි. 261).

   අපි මෙහි එක්ව සිටිමු, එක්වසිටුමු, එක්වසිටිමු;
   ඕ, මෙහි අපි පවුලක් තුල එක්ව සිටිමු.
   එතුල පියාද මව සහ සොයුරී හා සොයුරාද ඇත;
   ඕ, මෙන්න අපි මෙම දිළෙන හිරු දින එක්ව සිටින්නෙමු
   ආච්චී, සීයා මාමා, නැන්දා වැනි නාමයන් පාවිච්චිකර අමතර පදද ගායනාකිරීමෙන් සියලුම පවුල් සාමාජිකයන් නම්කෙරෙනු ඇත.

   ළමයින්ට ආදරයකරමින් උපකාරකරන පවුල් සමග ඔවුන්ට ජීවත්වීමට ස්වර්ගික පියාණන් වහන්සේ සැලසුම්කල බව ළමයින්ට සිහිපත්කරන්න.

4. එක් එක් ළමයාට ඔහුගේ හෝ ඇයගේ අතක සටහනක් කඩදාසි කැබැල්ලක පිටපත් කිරීමට කියන්න. ළමුන් ලවා ඇඟිලි මතු පිට පවුල් සාමාජිකයන් නියෝජනයවන ලෙස මුහුණු ඇඳීමට හෝ ඒවා මැද ආදරය පෙන්වීමට හදවතක් ඇඳීමට හෝ සලස්වන්න. පවුලක සාමාජිකයන් අතක ඇඟිලි මෙන් බව ළමයින්ට සිහිපත්කරන්න: හැම එකක්ම වැදගත්ය.

5. පවුල් සාමාජිකයන් එකිනෙකාට උපකාරකරන අන්දම ගැන ප්‍රදර්ශනය කෙරෙන අවස්ථාවන් රඟදක්වා පෙන්වීමට ළමුන්ට කියන්න. පාඩමෙහි දැක්වෙන අවස්ථාවන් හෝ ඔබගේම කිහිපයක් නිර්මානයකර යොදාගන්න.

6. පහත සඳහන් පදයේ වචන ඔබ කියවන විට, ළමයින්ට ඒවා ක්‍රියාකර පෙන්වීමට උදව්වන්න.

   මගේ පවුල

   ගස උඩ ඉන්නා කුරුල්ලන් මෙන් (තටු මෙන් අත් වනන්න).
   මට මාගේම පවුලක් ඇත (තමාව පෙන්වන්න).
   ඔවුහු මට ආහාර දෙති (කෑම කන අයුරු දක්වන්න).
   මට සෙල්ලම්කිරීම උගන්නති (උඩපනින්න).
   එවිට මට මුළුදිනම අරක්ෂිතව සතුටින් සිටිය හැක (ලොකු සිනාවක් දාන්න).

7. ළමයින් අත් අල්ලාගෙන රවුමක ඇවිදින විට පහත සඳහන් වචන ගායනාකරන්න, නැතහොත් වචන කියන්න:

   ඔබගේ පවුල ඔබට බොහොම අදරෙයි;
   ඔබගේ පවුල ඔබට බොහොම ආදරෙයි;
   හේ-හෝ පවුල-ඕ!
   ඔබගේ පවුල ඔබට බොහොම ආදරෙයි.

ඔබ ඊළඟ පදය කියන විට රවුමේ මැද සිටගැනීමට ළමයෙක් තෝරාගන්න:

මේ පවුලට පියෙක් ඇත,
මේ පවුලට පියෙක් ඇත,
හේ-හෝ පවුල -ඕ!
මේ පවුලට පියෙක් ඇත.

මෙම පදයට, පියා වෙනුවට මව යොදා නැවත කියන්න. රවුමේ මැද සිටින පළමු ළමයාට එකතු-වීමට තවත් ළමයෙකු යොදන්න. හැම ළමයෙක්ම රවුමේ මැද සිටගන්නා තෙක්, පවුලේ අන් සාමා-ජිකයන්ගේ නම්ද යොදමින් නොනවත්වා ගයන්න. සියලුම ළමයින් එකට සිටගත් විට, පළමු පදය තවත් වරක් ගායනාකරන්න.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත පොළොවට ප්‍රීතිය රැගෙන ආවේය

7
වෙනි
පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත පොළොවට රැගෙන ආ ප්‍රීතිය අත්විඳීමට හැම ළමයෙකුටම උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. ලූක් 2:1–20 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.

2. මාස දොළහේ දින දර්ශනයක් ගෙනෙන්න, නැතහොත් උපන්දින ක්‍රියාකාරකම සඳහා කාල දර්ශකයක් සාදන්න. කාල දර්ශකයක් සෑදීම සඳහා දිගු කඩදාසි පටියක්, සමාන කොටස් දොළහකට බෙදා එක කොටසක එක බැගින්, පිළිවෙලකට, මාස වල නම් ලියන්න.

3. ප්‍රාථමිකයේ ලේකම්වරයාගෙන්, කොට්ඨාශයේ ලේකම්වරයාගෙන් හෝ ළමයින්ගේ දෙමාපියන්ගෙන් විමසා ඔබගේ පංතියේ එක් එක් ළමයාගේ උපන්දිනය සොයාගන්න.

4. ප්‍රාථමිකයේ සභාපතිවරයාගේ අනුමැතිය සහිතව, මවකට හෝ ගර්භනීමවකට ආරාධනාකර ඇය බිළිඳු උපතකට සූදානම්වන අන්දම ගැන ළමයින්ට කෙටියෙන් ප්‍රකාශකිරීමට කියන්න. ඇයගේ චෛතසික හැඟීම්ද ඊට ඇතුළත්කිරීමට කියන්න.

5. "යූදාගේ මිටියාවතෙන් ඈතට, බොහෝ ඈතට" ගීතය ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්වන්න (ගීතිකා, අංක. 212).

6. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්.
   ආ. එක් එක් ළමයා සඳහා කුඩා කඩදාසි කෑල්ලක් සහ පැන්සලයක්.
   ඇ. ටේප් හෝ වෙනත් මැලියම් වර්ගයක්.
   ඈ. පින්තූරය 2-6, කිතු උපත (සුභාරංචි කලා පින්තූර මල්ල 201; 62495).

7. ඔබට පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

*සටහන:* ඔබ ළමයින්ගේ උපත ගැන සාකච්ඡාකරන විට, පවුලට එකතුකරගත් හෝ හදාවඩා ගත් දරුවන්ගේ හැඟීම් ගැන සංවේදීවන්න. ඔවුන්ගේ උපත්ද ප්‍රීතිමත් සිද්ධීන් බව ඔවුන්ට අවබෝධකිරීමට වගබලා ගන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිමත් කලානම් ඔවුන් සමග එය සොයාබලන්න.

### උපන්දිනයන් විශේෂිතවේ

අවධානශීලී ක්‍රියාකාරකම

ඔබ විශේෂිත දිනයක් ගැන සිතනබව ළමයින්ට කියන්න. ඔබ ඔවුන්ට යම් හෝඩුවාවක් දෙන බව පහදාදෙන්න. එම හෝඩුවාවට ඇහුම්කන්දී ඔබ සිතන දිනය ගැන ඔවුන් දැනගත් විට ඔවුන්ගේ අත් එසවීමට කියන්න. "සුභ උපන්දිනක්" වැනි ගීතයක් දිවමතුරන්න, නැතහොත් වෙනත් ප්‍රකට හෝඩුවාවක් දෙන්න.

- මා සිතන්නේ කුමන විශේෂිත දිනයක් ගැනද?
- ඔබගේ උපන්දිනදී ඔබ වඩාත් ප්‍රියකරන්නේ කුමක්ද?

දින දර්ශනය හෝ කාල දර්ශක ක්‍රියාකාරකම

කඩදාසි සහ පැන්සල් බෙදාදෙන්න. හැම ළමයෙකුටම ඔහුගේ හෝ ඇයගේ නම කඩදාසි කැල්ලක ලිවීමට කියන්න. (අවශ්‍යතාවය අනුව ළමයින්ට උදව්කරන්න.)

දින දර්ශනය හෝ කාල දර්ශකය පෙන්වන්න. ඔබ ඒවා කියවන විට ඔබත් සමග මාසවල නම් කියවන ලෙස ළමයින්ට ඇරයුම්කරන්න. එක් එක් මාසයක නම, වරකට එක බැගින් නැවතත් කියවා, එම මාසයේ උපන්දිනය යෙදී ඇති ළමුන්ට ඔවුන්ගේ නම් දින දර්ශනයේ හෝ කාල දර්ශකයේ ඇලවීම සඳහා ආරාධනාකරන්න.

- ඔබ ඉපදුන විට ඔබගේ පවුලේ අයට ඇතිවූ හැඟීම් ගැන ඔබ සිතන්නේ කුමක්ද?

ආරාධිත කථිකයා

මව හෝ ගර්භණී මව හඳුන්වාදී, බිළිඳෙකුගේ උපතකට සූදානම්වීම ගැන ඇයගේ හැඟීම් ප්‍රකාශකිරීමට ඇයට කියන්න.

සාකච්ඡාව

ළමුන්ගේ උපතට සූදානම්වීම සඳහා ඔවුන්ගේ පවුල්වල අය කර තිබිය හැකි, සෞඛ්‍ය සම්පන්නවීමට ඔවුන් වෙනුවෙන් යාච්ඤාකිරීම, නම් තේරීම, බිළිඳු ඇඳුම් සහ වෙනත් අවශ්‍ය දේවල් ලබාගැනීම සහ ඔවුන්ට නිදාගැනීමට ස්ථානයක් සැලසුම්කිරීම වැනි දේවල් ගැන ළමුන් සමග සාකච්ඡාකරන්න. ඔවුන්ගේ උපත් ප්‍රීතිමත් සහ සතුටුදායක අවස්ථා බව හැඟීමට ළමයින්ට උදව්කරන්න. ඔබ දෙමාපි-යෙක් නම්, ඔබගේ පවුලට බිළිඳෙක් ඉපදුන විට, ඔබ කල දේවල් සහ ඔබට ඇතිවූ හැඟීම් ගැන කීමට ඔබට අවශ්‍යවිය හැකිය.

උපතක් ලබා, භෞතික ශරීරයක් ලබාගැනීම, ස්වර්ගික පියාණන්වහන්සේගේ අප සඳහා වන සැලසුමේ වැදගත් කොටසක් බව ළමයින්ට සිහිපත් කරන්න.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපන්දිනය ශ්‍රේෂ්ඨ දිනයක් විය.**

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

ජනතාව බොහෝ කාලයක් බලාපොරොත්තුව සිටි බිළිඳෙකුගේ උපතක් ගැන ළමයින් ඉගෙන ගැනීමට යන බව ඔවුන්ට කියන්න. යම් දිනෙක ගැලවුම්කරුවෙක් ඉපදෙන බව බොහෝ කලකට පෙර අනාග-තවක්තෘවරු ප්‍රකාශකළහ. ජනතාවට ස්වර්ගික පියාණන් සමග නැවත ජීවත්වීමේ හැකියාව උන්ව-හන්සේ ලබාදෙනසේක. මෙම බිළිඳාගේ උපත බලාපොරොත්තුවෙන් ජනතාව බල බලා සිටියහ.

- මෙම බිළිඳාවූයේ කවරෙක්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.)

යේසුස්වහන්සේ උපත ලබන දිනය කිසිවෙක් නොදැන සිටිබව පෙන්වාදෙන්න. සමහර දෙමාපියෝ මෙම ශ්‍රේෂ්ඨ සිදුවීම ගැන බලා සිටින ලෙස තම දරුවන්ට ඉගැන්වූයේ, යේසුස් වහන්සේ ජීවත්වීමේ නිවැරදි මාර්ගය පෙන්වා, ඉන්පසුව හැම කෙනෙකුටම නැවතත් ස්වර්ගික පියාණන්වහන්සේ සමග ජීවත්වීමට හැකියාව ලබාදෙන බව ඔවුන් දැන සිටි නිසාය. අපගේ ගැලවුම්කරුවාණන් වශයෙන් යේසුස්වහන්සේ නොමැතිව, කිසිවෙකුට අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ සමග නැවතත් ජීවත්වීමට හැකියාව නොලැබෙන්නේය.

රංගනය සඳහා සූදානම්වීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉපදීමට බොහෝ කලකට පෙර ළමයින් ඉපිද සිටි බව ආරෝපනය කරගන්නා ලෙස ඔවුන්ට ආරාධනාකරන්න. ඔවුන් බෙත්ලෙහෙම් නගරය අසල ජීවත්වන බව ඔවුන්ට කියන්න. ගැලවුම්කරුවාණන්ගේ උපත බලාසිටින ලෙස ඔවුන්ගේ දෙමාපියන් ඔවුන්ට උගන්වා ඇත. අද රාත්‍රී ඔවුහු ඔවුන්ගේ පියවරුන්ගේ බැටළුවන් බලාගැනීමට ඔවුන්ට උදව් කරමින් ගොවිබිම්වල සිටිති.

- ඔබ බැටළුවන් බලාගැනීමට ඔබගේ පියවරුන් සමග යනවිට, රැගෙන යන දේවල් මොනවාද? (පිළිතුරුවලට, ඇඳීමට උණුසුම් යමක් හෝ කෑමට යමක් ඇතුළත්විය හැකිය.)

ළමයින්ට තම ඇස් වසාගෙන පහත දැක්වෙන දර්ශනය සිතින් මවාගැනීමට කියන්න:

සැන්දෑව ළඟාවෙයි. එඬේරු බැටළුවන් බැටළුගාලට එකතුකරමින් සිටිති. එහි ඔවුන්ට උදෑසන වනතුරු විවේකීව සිටිය හැකිය. රාත්‍රිය පැහැදිළි අතර, තාරකාවන් පිටතට ඒමට පටන්ගෙන ඇත. විගසකින්ම අහස දීප්තිමත් තාරකාවලින් පිරීයයි. සෑමදෙයක්ම සමාදානයෙන් පිරී නිසලව පවතී. (රාත්‍රීකාලය ඇඟවීමට පංතිකාමරයේ විදුලි පහන් නිවා දැමීමට ඔබට වුවමනාවිය හැකිය.)

**ශුද්ධ ලියවිලි කථාව සහ රඟදැක්වීම**

ලූක් 2:8–18 දැක්වෙන සුරදූතයා එඬේරුන්ට ප්‍රකාශවීමේ කථාව කියන්න. ඔබ කථාව කියන විට, බයිබලයෙන් පද කිහිපයක් ශබ්දනගා කියවන්න.

සුරදූතයා දුටුවිට එඬේරුන් බියට පත්වූ බව පෙන්වා දෙන්න. නමුත්, සුරදූතයා ඔවුන්ට මෙසේ කීවේය. "භය නොවෙල්ලා; බලව, මුළු සෙනගට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි" (ලූක් 2:10).

සුරදූතයා දැකීමෙන් බියට පත්වීමත්, ඉන්පසුව සුරදූතයාගේ ප්‍රකාශයෙන් පසුව සතුටට පත්වීමත් අභිරූපනයකිරීමට ළමුන්ට කියන්න.

යේසුස්වහන්සේගේ උපත ගැන එඬේරුන්ට ප්‍රකාශකල සුරදූතයා (ලූක් 2:11බලන්න)යේසු බිළිඳාව දැකගැනීමට හැකි ස්ථානය ගැනද ඔවුන්ට ප්‍රකාශකල බව පහදාදෙන්න (බලන්න ලූක් 2:12). එකෙ-නෙහිම ඒ දේවදූතයා සමග මහත් ස්වර්ගීය සේනා සමූහයක් "දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින්, ඉතා උස්තන්හි දෙවියන්වහන්සේට මහිමයද, පොළොවෙහි උන්වහන්සේට ප්‍රියවූ මනුෂ්‍යයන් අතරෙහි සමාදානයද වේවයි කියනු" එඬේරුන්ට ඇසුනි (ලූක් 2:13–14).

**ගීතය**

"යුදාගේ මීටියාවතෙන් ඈතට බොහෝ ඈත" ගීතය ගායනාකරන්න. නැතහොත් පළමු පදයේ වචන කියන්න. ළමුන් වචන දන්නේ නම්, ඔබත් සමහ එක්වන ලෙස ඔවුන්ට කියන්න.

යුදාගේ මීටියාවතෙන් ඈතට බොහෝ ඈත,
පුරාණයේ එඬේරුන්ට ඇසුනි ප්‍රීති ආරංචි:
දෙවියන්ට මහිමය, දෙවියන්ට මහිමය,
දෙවියන්ට මහිමය ඉතා උස්තන්හි;
පොළොවෙහි සමාදානයද, වේවා මිනිසුන්ට ආසිරිද;
පොළොවෙහි සමාදානයද, වේවා මිනිසුන්ට ආසිරිද!

**ශුද්ධ ලියවිලි කථාන්තරය සහ රංගනය සම්බන්ධයි**

සුරදූතයන් නැවතත් ස්වර්ගයට ගියවිට, එඬේරුන් යේසු බිළිඳා සොයායෑමට තීරණය කලබව පහදාදෙන්න (ලූක් 2:15 බලන්න). ළමුන් ලවා ඔවුන් තම පියවරුන් සමග යේසු බිළිඳා බැලීමට බෙත්-ලෙහෙමට යෑම ව්‍යාජලෙස රඟදක්වන්න (පංතියේ වෙනත් ස්ථානයකා යාමට ඔබට අවශ්‍යවිය හැකිය).

පින්තූරය 2-6, කිතු උපත පෙන්වන්න.

- මෙම පින්තූරයේ සිටින මිනිසුන් කව්ද?

එඬේරුන්ට සුරදූතයන් ප්‍රකාශකල ලෙසම ඔවුන්ට යේසු බිළිදාණන් දක්නට ලැබුන බව පහදාදෙන්න. උන්වහන්සේව ළදරු රෙදිවලින් ඔතා ගව ඔරුවක බහා තිබුනි (ළදරු රෙදි යනු, රෙදි කෑල්ලකින් ඇඳුමක් ලෙස ළදරුවා වටා රෙදිවලින් ඔතා තැබීම බව පහදාදීමට ඔබට අවශ්‍යවිය හැකිය). යේසුස්ව-හන්සේ ගැන බොහෝ දෙවල් දැකීමට සහ ඇසීමට ලැබීම ගැන එඬේරුන් කෘතඥතාවය පළකල අතර, තමන් ඇසූ දුටු දෙවල් ගැන අනෙක් මිනිසුන්ටද ඔවුහු ප්‍රකාශ කළහ (ලූක් 2:17–18 බලන්න).

## සාරාංශය

**ළමා සහභාගීත්වය**

එක් එක් ළමයාට නැගීසිටීමට ආරාධනාකර, එම රාත්‍රියේදී එඬේරුන් තම බැටළු රැළ රැකගනිමින් සිටියදී සිදුවූ එක් දෙයක් ගැන කීමට කියන්න. එපමණ කාලයක් ගැලවුම් කරුවාණන්ගේ උපත ගැන බලාපොරොත්තුවෙන් සිටි බොහෝ දෙනෙක් ඉතාමත් සතුටට පත්වූ බව අවධාරනය කරන්න.

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොවට පැමිණීම ගැන ඔබ කෙතරම් සතුටුවන්නේදැයි ළමයින්ට කියන්න. යේසුස්වහන්සේ ලෝකයාගේ ගැලවුම්කරුවාණන් බවට ඔබගේ සාක්ෂිය දරා, යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීම මගින්, යම් දිනෙක අපට නැවතත් ස්වර්ගික පියාණන්වහන්සේ සමග ජීවත්වීමට යාමට උපකාරවත්වන බව ළමුන්ට කියන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත ගැන තමන් ඉගෙනගත් දේවල් නිවසට ගොස් ඔවුන්ගේ පවුල්වල අයට පැවසීමට ළමුන් දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. යේසුස් වහන්සේගේ උපත ගැන කෘතඥතාවය පළකිරීමට ළමුන්ට යෝජනාකරන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චි කලහැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ගැලවුම්කරුවාණන්ගේ උපත වටා ඇති සිදුවීම් ක්‍රියාකර පෙන්වීමට ළමුන්ට උපකාර කරන්න. සළුවක් සහ සෙල්ලම් බෝනික්කෙක් වැනි සරළ මෙවලම් කිහිපයක් ගෙන ඒමට ඔබට වුවමනාවිය හැකිය.


2. "වරක් මම බිළිඳෙක්මි" ගීතයේ වචන කියමින් ක්‍රියාකර පෙන්වීමට ළමුන්ට උපකාර කරන්න. (මෙහි වචන "වරෙක හිම මිනිසෙක් සිටියේය" යන ගීතයේ තාලය අනුව ගායනා කලහැකිය. *ළමා ගී පොත,* පි. 249). පළවෙනි පදයට පහතට නැඹුරුවෙන ක්‍රියාද, දෙවන පදයට දිගහැරෙන ක්‍රියාද පාවිච්චිකරන්න.


   වරක් මම බිළිදෙක්මි, බිළිඳෙක්මි, බිළිදෙක්මි.
   වරක් මම බිළිඳෙක්මි, පොඩියි, පොඩියි, පොඩියි.

   දැන් මම ලොකුවට වැඩෙමි, ලොකුවට, ලොකුවට.
   දැන් මම ලොකුවට වැඩෙමි, උසට, උසට, උසට.

3. "ඈතක ගව ඔරුවක" (*ළමා ගීපොත,* පි. 42), "මරියා නළවයි" (*ළමා ගීපොත,* පි. 44), හෝ "ඕ," නැළවෙන් මා බිළිඳුනි" (*ළමා ගීපොත,* පි. 48), යන ගීත ගායනාකරන්න නැතහොත් වචන කියන්න. මෙම ගීතවලට වචන මෙම දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

4. යේසු බිළිඳා සහ ගවඔරුව ප්‍රදර්ශනය (පාඩම අවසානයේ දක්වා ඇත) එක් එක් ළමයා වෙනුවෙන් එහි පිටපතක් හෝ පිටපත්කිරීමක් සකස්කරගන්න. ගවඔරුව පාටකර, එයට දමන පිදුරු හෝ වියලි තණකොල හෝ නූල්කෑලි හෝ යමක් අලවා බිළිඳාට සිනිඳු කොට්ටයක් ලෙස සකස්කිරීමට හැම ළමයෙකුටම කියන්න. ඉන්පසුව යේසු බිළිඳාගේ පින්තූරයක් එක් එක් ළමයා ලවා පාටකිරීමට සලස්වන්න. ළමයින්ගේ යේසු බිළිඳාගේ පින්තූර කපා ගවඔරුවේ ඇලවීමට ඔවුන්ට උදව්කරන්න.





# 8
වෙනි
පාඩම

# ස්වර්ගික පියාණන්වහන්සේ මා රැකබලාගන්නාසේක

**අරමුණ**

ස්වර්ගික පියාණන්වහන්සේ අපට උපකාර අවශ්‍ය අවස්ථාවන්හිදී අපට ආශිර්වාදකරමින් උදව්කරන බවට වන එක් එක් ළමයාගේ ඇදහිල්ල ශක්තිමත්කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 2:1–15, 19–20 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.
2. හැම ළමයෙක් සඳහාම ඔහුගේ හෝ ඇයගේ මුහුණේ පින්තූරයක් ඇඳීමට තරම් විශාල ප්‍රමාණයකට කඩදාසි රවුමක් සාදන්න. එක් එක් රවුමේ මුදුනේ සිදුරක් සාදා රවුමේ දාරය වටා, *ස්වර්ගික පියාණන්වහන්සේ මා රැකබලාගන්නාසේක* කියා ලියන්න.
3. ස්වර්ගික පියාණන්වහන්සේ ඔබව රැකබලාගෙන ආරක්ෂාකරන බව ඔබට හැඟුන පෞද්ගලික අත්දැකීමක්, අනතුරකින් ඔබව ආරක්ෂාකරගැනීමක්, ඔබට ප්‍රශ්නයක් නිරාකරනය කරගැනීමට තිබීමක් හෝ ඔබට සහනය අවශ්‍යවූ අවස්ථාවක් වැනි යමක් බෙදාගැනීමට සූදානම්වන්න. නැතිනම්, ඔබගේ ප්‍රාථමිකයේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව, එවන් අත්දැකීමක් බෙදාගැනීමට ඔබගේ කොට්ඨාශයේ හෝ ශාඛාවේ සාමාජිකයෙකුට ආරාධනා කරන්න.
4. "මගේ තුති ඔබට, ආදර පියාණෙනි" ගීතය ගායනාකිරීම හෝ වචනකීමට සූදානම්වන්න (*ළමා ගී පොත*, පි. 7). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.
5. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්.
   ආ. එක් එක් ළමයා වෙනුවෙන්, මලක්, ලක්ෂණ ගලක් හෝ අගයකිරීමේ සටහනක් වැනි ත්‍යාගයක්.
   ඇ. ක්‍රේයොන් හෝ පැන්සල්.
   ඈ. එක් එක් ළමයා වෙනුවෙන් දිග නූල් කෑල්ලක්.
   ඉ. පින්තූරය 2-7, ශාස්ත්‍රවන්තයෝ (සුභාරංචි කලා පින්තූර මල්ල 203; 62120); පින්තූරය 2-8, මිසරයට පලායාම (සුභාරංචි කලා පින්තූර මල්ල 204; 62119); පින්තූරය 2-9, ඩේවිඩ් ඕ. මැකේගේ ළමා කාලය.
6. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතියතුළදී යමක් කිරීමට ඔබ ළමුන්ව දිරිගැන්වූයේ නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

### ස්වර්ගික පියාණන්වහන්සේ අප වෙනුවෙන් බොහෝ දේවල් කරනසේක

අවධානශීලී ක්‍රියාකාරකම

ළමුන්ට තම ඇස් වසාගැනීමට කියන්න. කුඩා ත්‍යාගයක් හැම ළමයෙකුගේම ඔඩොක්කුවට දමා ඉන්පසුව ඔවුන්ගේ ඇස් විවෘතකිරීමට ළමයින්ට කියන්න. ඔවුන්ගේ හදිසි සතුට ගැන කථාකිරීමට ඔවුන්ට මොහොතක් ඉඩදෙන්න.

- ඔබ සිතන අන්දමට මෙම ත්‍යාගය ඔබගේ ඔඩොක්කුවට දැමුවේ කව්ද?
- මා ඔබට ත්‍යාගයක් දුන් බව ඔබ සිතන්නේ මන්ද?
- ඔබ වෙනුවෙන් හොඳ දේවල් කරන වෙනත් අය කව්ද? (දෙමාපියන්, පවුල, මිතුරන්, දෙව්පියාණන්.)
- ඔබ වෙනුවෙන් ස්වර්ගීය පියාණන්වහන්සේ කර තිබෙන දේවල් මොනවාද? (අපව පොළොවට එවීමේ සැලසුම, අපට පවුලක් ලබාදීම, සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අපගේ ගැලවුම් කරුවාණන් ලෙස මෙළොවට එවීම යනාදිය පිළිතුරු විය හැකිය.)

ගීතය

"මගේ තුති ඔබට, ආදර පියාණෙනි" ගීතය ගායනා කරන්න, නැතහොත් වචන කියන්න

අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ අප වෙනුවෙන් කරන එක් දෙයක් නම්, අපට ප්‍රශ්න ඇති විට අප සනසා අප ආරක්ෂාකිරීම බව පහදාදෙන්න. අප ස්වර්ගික පියාණන්වහන්සේ තුල ඇදහිලිමත් නම්, උන්වහන්සේ අපට ධෛර්‍යයය ලබාදී, අපගේ ප්‍රශ්න විසඳන අන්දම ගැන යහපත් තීරණ ගැනීමට අපට උපකාරකරනසේක.

### යේසු බිළිඳාණන්ව ස්වර්ගික පියාණන්වහන්සේ ආරක්ෂාකලසේක.

ශුද්ධ ලියවිලි කථාන්තරය

පින්තූරය 2-7 පෙන්වන්න, ශාස්ත්‍රවන්තයෝ. මතෙව් 2:1–12 දැක්වෙන ක්‍රිස්තුස් ළදරුවා සොයාගිය ශාස්ත්‍රවන්තයන්ගේ කථාව කියන්න.

හෙරෝද් රජතුමා ශාස්ත්‍රවන්තයන් අමතා, ක්‍රිස්තුස් ළදරුවාට නමස්කාරකිරීමට, හෝ ප්‍රේමය පෙන්වීමට තමාටද අවශ්‍යයි ඔවුන්ට පැවසූ බව පහදාදෙන්න (ක්‍රිස්තුස් ළදරුවා යේසු බිළිඳාණන් අමතන තවත් නමක් බව පහදාදීමට ඔබට අවශ්‍යවිය හැකිය). නමුත් හෙරෝද් රජතුමාට සත්‍යලෙසම අවශ්‍යවූයේ යේසුස්වහන්සේට හිරිහැර කිරීමය. මතෙව් 2:12 ශබ්දනගා කියවා, ස්වර්ගික පියාණන්වහන්සේ ශාස්ත්‍රවන්තයන්ට නැවත හෙරෝද් රජු හමුවීමට නොයන ලෙස පවසා යේසුස්වහන්සේ ආරක්ෂා කලබව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි කථාන්තරය

පින්තූරය 2-8 මිසරයට පලායාම පෙන්වන්න. මතෙව් 2:13–15 දැක්වෙන කථාව කියන්න. 13වන පදය ශබ්දනහා කියවා විනාශකිරීම යනු, මරාදැමීම බව පහදාදෙන්න.

- සුරදූතයා යොසෙප්ට ප්‍රකාශවූයේ මන්ද? (මතෙව් 2:13 බලන්න.)
- යොසෙප්ට මිසරයට පලායන ලෙස සුරදූතයා කීවේ මන්ද? (එවිට හෙරෝද් රජතුමාට යේසුස්වහන්සේව සොයාගැනීමට නොහැකිවන නිසාය.)
- යේසු බිළිඳාණන්ව මරාදැමීමට හෙරෝද් රජතුමාට අවශ්‍යවූයේ මන්ද? (යේසුස්වහන්සේ හැදීවැඩී ඔහුගේ රාජ්‍යය ලබාගනීයැයි ඔහු බියට පත්වූ නිසාය.)

ස්වර්ගික පියාණන්වහන්සේ පරීක්ෂාකාරීව සිට, යේසුස්වහන්සේව සහ මරියතුමිය රැගෙන මිසරයට පලායන ලෙස යොසෙප්ට අනතුරු අඟවූ බව පහදාදෙන්න. ස්වර්ගික පියාණන් වහන්සේ නිතරම සේසුස්වහන්සේ ගැන පරීක්ෂාකාරීව සිටිසේක.

මතෙව් 2:19–20 ශබ්දනගා කියවන්න.

- සුරදූතයා යොසෙප්ට නැවතවරක් ප්‍රකාශවූයේ මන්ද? (මතෙව් 2:20 බලන්න.)
- යොසෙප්, මරියතුමිය සහ යේසු බිළිඳාණන්ට නැවත ඉශ්‍රායලයට පැමිණීම ආරක්ෂා සහිතවූයේ මන්ද? (හෙරෝද් රජතුමා මියගොස් සිටියේය. මතෙව් 2:19–20 බලන්න.)

### ස්වර්ගික පියාණන්වහන්සේ අප රැකබලාගන්නාසේක

සාකච්ඡාව

අප හැම කෙනෙක්ම ස්වර්ගික පියාණන්වහන්සේගේ දරුවන් බව ළමයින්ට මතක්කරන්න. උන්වහන්සේ යේසුස්වහන්සේව රැකබලාගන්නාසේම අපවද රැකබලාගන්නාසේක. අප උන්වහන්සේගේ පණත්වලට

කීකරුව, උන්වහන්සේගේ උපකාරය ඉල්ලන්නේ නම්, ස්වර්ගික පියාණන්වහන්සේ අපට උපකාරකරනසේක. (ස්වර්ගික පියානන්වහන්සේ අපට නිතර උපකාරකරන නමුත්, සමහර අවස්ථාවලදී අප උන්වහන්සේගේ බලාපොරොත්තුවන පරිදිම අපට උපකාර නොකරන බවද පෙන්වාදීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

- ඔබ ස්වර්ගික පියාණන්ගෙන් උදව් ඉල්ලන්නේ කෙසේද? (යාච්ඤාකරන්න.)
- ඔබ අසනීපව සිටිනවිටදී, ඔබ හුදකලාව සිටියදී, ඔබ බියට පත්ව සිටියදී ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට උපකාරවත්විය හැක්කේ කෙසේද?

කථාන්තරය

පින්තූරය 2-9 පෙන්වන්න, ඩේවිඩ් ඕ. මැකේගේ ළමාකාලය. ඩේවිඩ් ඕ. මැකේ (ඔහු සිය පියාගේ උකුලේ හිඳගෙන සිටියි)මෙම පින්තූරය පෙන්වා, මෙම පිරිමි ළමයා සභාවේ නමවන සභාපතිවරයාබවට පත්වීම දක්වා වර්ධනයවූ බව ළමයින්ට කියන්න. ඔහු කුඩා ළමයෙකුව සිටියදී ඔහු ලත් අත්දැකීමක් පිළිබඳ පහත සඳහන් කථාන්තරය කියන්න:

"එක් දිනක් ඔහුගේ පියා නිවසේ නොසිටි අවස්ථාවක, ඩේවිඩ්ට…නිවස අවටින් ශබ්දයක් ඇසී සොරුන් පැමිණ ඇතැයි ස්ථිරවම හැඟිනි. ඔහුගේ මවද, ඇයට [ශබ්ද] ඇසී තිබුනේ නම් බියට පත්ව සිටිය යුතු බව ඔහු දැන සිටියේය. ඇය බිය නොවෙතැයි ඔහු අපේක්ෂා කළේය. ඔහු මුළුමනින්ම අවදිව ඇඳේ වැතිර සිටියදී, …තම දෙමාපියන් ඔහුට උගන්වා ඇති පරිදි කල යුතු දේ කුමක්දැයි ඔහු තීරණය කළේය…. යාච්ඤාකිරීම. ඔහු නිතරම යාච්ඤාකළේ ඔහුගේ ඇඳ අසල දණගසාගෙනය. එනිසා දැන්ද, ඇඳෙන් බැස දණගසා යාච්ඤාකල යුතුයැයි ඔහුට හැඟිනි. ඇඳෙන් බැසීම ඉතා අසීරු පරීක්ෂාවකි; ඊට සිය සම්පූර්ණ ශක්තියත්, ආත්ම ශක්තියත් යෙදවීමට ඔහුට සිදුවූයේ, ඔහු බියට පත්ව සිටි නිසාය. නමුත් ඔහු එය කළේය!

"ඔහු ඇඳ අසල දණගසාගෙන, ඉතා උනන්දුවෙන් සහ සැබෑ ඇදහිල්ලෙන් යුතුව යාච්ඤා කළේය. ඉන්පසුව, එක් පුද්ගලයෙක්, තවත් පුද්ගලයෙකුට ශබ්දනගා කථාකරන්නාක් මෙන්, තමාට කථාකරන ශබ්දයක් ඔහුට ඇසිනි, 'බියට පත් නොවන්න. කිසිවකින් ඔබ හිරිහැරයට පත් නොවේ.' ඉන්පසුව නැවතත් ඇඳට නැඟුන ඩේවිඩ්, තදින් නිදාගත්තේය" මේරි එෆ්. ෆෙල්ට්, "ඩේවිඩ්: පොරොන්දුවක් ලැබූ පිරිමි ළමයෙකි, " *උපදේශකයා*, සැප්, පි. 330).

කථාන්තරය

සභාවේ ප්‍රේරිතයෙකු බවට පත්වූ, වැඩිහිටි හියු බී. බ්‍රවුන් ගැන පහත සඳහන් කථාව කියන්න:

"මා බාලයෙකුව සිටියදී, රාත්‍රියේදී නරක සිහිනයක් දුටුවිට, මම අවදිවී මෙසේ කෑගසමි, 'අම්මා ඔබ ඔතන සිටිනවාද? මවගේ කාමරය මගේ කාමරයට යාබදව තිබෙන නිසා, මගේ හඬ ඇසෙන ඇය ක්ෂණිකව මෙසේ පිළිතුරු දෙයි, "ඔව් පුතා මම මෙහි සිටිමි.'

"වසර ගණනකට පසුව, මා දූතමෙහෙයකට එංගලන්තයට ගිය විට, මම කෑගැසූ විට මට පිළිතුරුදීමට ඇය එහි නොසිටින නමුත්, ස්වර්ගික පියාණන්වහන්සේ එහි නිතරම සිටින බව මගේ මව මට සිහිපත් කළාය.

"මගේ දූතමෙහෙයේදී සහ මගේ ජීවිතය මුළුල්ලේම මම මෙසේ කෑගසා ඇත්තෙමි: 'පියාණෙනි ඔබ වහන්සේ ඔතන සිටිනසේක්ද?… නිතරම මම යම් පිළිතුරක් ලබා ඇත්තෙමි" (ජොලීන් මෙරිඩිත්ගේ "මිතුරාට මිතුරෙක්, " *මිතුරා,* අගෝ. පි. 7).

ස්වර්ගික පියාණන්වහන්සේ ශබ්දනගා අපට කථාකිරීමට ඉඩ නොතිබිය හැකි වුවද උන්වහන්සේ නිතරම අපගැන පරීක්ෂාකාරීව සිටින බව පහදාදෙන්න. සමහර අවස්ථාවලදී උන්වහන්සේ අපට සමාදාන හැඟීම් ලබාදීමෙන් හෝ අපගේ සිත්තුලට අදහස් දීමෙන්ද උපකාරකරනසේක.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම හෝ ආරාධිත කථිකයා

ස්වර්ගික පියාණන්වහන්සේ ඔබ ගැන පරීක්ෂාකාරීව සිට, ඔබව ආරාක්ෂාකල බව ඔබට හැඟුනු ඔබගේ පෞද්ගලික අත්දැකීමක් බෙදාගන්න. නැතහොත් කොට්ඨාශයේ හෝ ශාඛාවේ ආරාධිත සාමාජිකයාට ඔහුගේ හෝ ඇයගේ අත්දැකීම බෙදාගැනීමට කියන්න.

කලා ක්‍රියාකාරකම

එක් එක් ළමයාට ක්‍රේයොන් හෝ පැන්සල් සහ කඩදාසි රවුමක් දෙන්න. එක් එක් ළමයාට ඔහුගේ හෝ ඇයගේ මුහුණ එම රවුමේ ඇඳීමට කියන්න. එක් එක් රවුමේ මුදුනේ තිබෙන සිදුර තුලින් නූලක් දමා ගැටගසන්න. එවිට එම ළමයාට ඔහුගේ හෝ ඇයගේ ගෙලවටා එය පැළඳගත හැකිය. ළමයින්ගේ ගෙලවටා රවුම්වල තිබෙන වචන ශබ්දනගා කියවන්න. නැතහොත් ළමයින්ට ඒවා කියවීමට කියන්න.

**සාරාංශය**

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොව මත සිටියදී ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේව ප්‍රේමයෙන් යුතුව රැකබලාගත්තාසේ, ස්වර්ගික පියාණන්වහන්සේ අප එකිනෙකාවද ප්‍රේමයෙන් යුතුව රැකබලා-ගන්නාබවට ඔබගේ සාක්ෂිය දරන්න.

ළමයෙකු පෙන්වා මෙසේ කියන්න, “ස්වර්ගික පියාණන්වහන්සේ නිතරම (ළමයාගේ නම) රැකබලා-ගන්නාසේක.” එක් එක් ළමයා සඳහා මෙය දිගටම කරන්න.

ස්වර්ගික පියාණන් කෙරෙහි විශ්වාසය තබා අද රාත්‍රී ඔවුන් යාච්ඤාකරන විට උන්වහන්සේගේ ආරක්-ෂාකාරී සැලකිල්ල ඉල්ලීමට ළමයින් දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. ස්වර්ගික පියාණන්වහන්සේගේ ප්‍රේමනීය රැකවරනය වෙනුවෙන් උන්වහන්සේට කෘතඥතාවය පළකරන ලෙස එම ළමයාට කියන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ ළමයින්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, “පංති වේලාව” “ගුරු උපකාර” කොටස බලන්න.

1. ළමයින්ට ස්වර්ගික පියාණන්වහන්සේගෙන් උපකාර ඉල්ලිය හැකි අවස්ථාවන් විස්තර කෙරෙන කඩදාසි තීරු සූදානම්කරන්න. කඩදාසි තීරු භාජනයක දමා, වාර අනුව ඉන් එකක් තෝරාගෙන, එහි විස්තර කෙරෙන අවස්ථාවේ ඔවුන් ක්‍රියාකරන අන්දම පැවසීමට කියන්න. පහත සඳහන් අවස්-ථාවන් හෝ ඔබේම නිර්මානයන් පාවිච්චිකිරීමට ඔබට පුළුවන.

   අ. ඔබගේ පවුලේ අය විනෝද ගමණක් යාමට සූදානම්ව සිටිති. ගමන යන අතරතුරදී පවුලේ අයගේ ආරක්ෂාව ගැන ඔබගේ දෙමාපියෝ සැලකිල්ල දක්වති.
   ආ. ඔබගේ කුඩා සොහොයුරිය අසනීපව ආරෝග්‍යශාලාවේ සිටී. ඔබ ඇය ගැන කණගාටුවෙන් පසුවේ.
   ඇ. ඔබගේ පවුලේ අය සමග ගමන්කරන විටදී ඔබ ඔවුන්ගෙන් මගහැරේ.
   ඈ. ඔබගේ පාදයක් කැඩීගොස් වේදනාවෙන් සහ අසහනයෙන් ඔබ වෙහෙසට පත්ව සිටී. බලාපොරොත්තු කඩවීම ඔබට තදබල ලෙස හැඟේ.
   ඉ. අළුත් කොට්ඨාශයක හෝ ශාඛාවක ප්‍රාථමිකයට ඔබ යන පළමු දිනය මෙය නිසා ඔබට බියක් දැනෙයි.

2. පංතිය සෑම තැනම නොසැලකිලිමත් ලෙස පුටු තබා, පුටු වලින් නියෝජනයවන්නේ අපගේ ජීවිතවල තිබෙන ප්‍රශ්න බව ළමයින්ට කියන්න. ළමයෙකුගේ ඇස් ආවරනයකර ඔහුට හෝ ඇයට වචනයෙන් මග පෙන්වමින් කාමරය පුරාම ගෙනයන්න. අපට ස්වර්ගික පියාණන්ව දක්නට නොහැ-කිවුවද, උන්වහන්සේගේ පණත් අනුගමනය කිරීමෙන් අපගේ ජීවිතය මුළුල්ලේම අපට උපකාර ලැබෙන බව පහදාදෙන්න. ළමයෙකු පුටුවක හැපුනවිට, අප සියලුදෙනාම ප්‍රශ්නවල හැපෙන බවත්, අපගේ ප්‍රශ්නවලට මුහුණදී, අවශ්‍ය සැනසීම සහ උපකාරය ස්වර්ගික පියාණන්වහන්සේගෙන් ඉල්ලිය හැකිබවද පහදාදෙන්න. ඇස් ආවරනය කරගෙන පංතිය පුරා ගෙනයාමට කැමති හැම ළමයෙකුටම වාරයක් ලබාදෙන්න.

3. "දෙවියන් හැමදෙන රැකගනිති" (*ළමා ගී පොත*, පි. 229) හෝ "මම දනිමි දෙවියන් ජීවමානයි" *ළමා ගී පොත*, පි. 5), යන ගීත ගායනාකරන්න. නැතහොත් පද දෙකේම වචන කියන්න. "මම දනිමි දෙවියන් ජීවමානයි" ගීතයේ වචන මෙම දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

   දෙවියන් හැමදෙන රැකගනිති

   දෙවියන් ගණන්කර ඇත අහසේ
   ඉහළ දිලෙන සියලුම තාරකා.
   ලෝක එතරම් විශාලයි, කුරුල්ලන් පොඩියි;
   දෙවියන් හැමදෙන රැකගනිති.

   එතුමාට මතකයි රෑ සහ දවාල
   සෑ' ම ළමයගෙ වැඩ සහ සෙල්ලම්
   කුමක් කරම්දැයි එතුමා උගන්වයි
   දෙවියන් හැමදෙන රැකගනිති

   (Original Title: "Loving Care." *From Turning Up* of THE WORLD OF MUSIC series, © 1936 by Silver Burdett & Ginn. Used by Permission.)

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මා වැනි ළමයෙක්ව සිටිසේක

9
වෙනි
පාඩම

**අරමුණ**

යේසුස්වහන්සේගේ ළමාවිය පිළිබඳව ළමයින්ගේ දැනුම වර්ධනයකිරීම මගින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමට ඔවුන් තුල පවතින අභිප්‍රාය ශක්තිමත්කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 2:19–23 සහ ලූක් 2:40–52යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න. *සුභාරංචි මූලධර්ම* (31110), 11වෙනි පරිච්ඡේදයද බලන්න.
2. පින්තූරය 2-12 පෙන්වාදී තිබෙන පරිදි සහ පාඩමේ විස්තරකෙරෙන අන්දමට සන්තසක්, බයිබලීය පාසලක්, කඩදාසි සහ කෝටු පාවිච්චිකර සකස්කරන්න. ලූක් 2:52 පදයේ වචන එම සන්තස මත ලියන්න.
3. "යේසුන් වරක් කුඩා ළමයෙක්වූහ" ගීතය ගානාකරන්න, නැතහොත් පද දෙකේම වචන කියන්න (*ළමා ගී පොත*, පි. 55). හැකි නම්, සතියකට පෙර සහ මෙම පාඩම තිබෙන සතියේද ගායන වේලාවේදී ළමයින්ට මෙම ගීතය පුහුණුවීමට ළමයින්ට උපකාරකරන ලෙස ප්‍රාථමිකයේ සංගීත ප්‍රධානියාගෙන් ඉල්ලීමක් කරන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්.
   ආ. බෝතලයක්, පොරෝනාවක්, සහ ශබ්දනගන ක්‍රීඩා භාණ්ඩයක් වැනි ළමා උපකරන.
   ඇ. හදේතෝ සටහන (1වෙනි පාඩම බලන්න).
   ඈ. පින්තූරය 2-10, බයිබලීය පවුල් ජීවිතය; පින්තූරය 2-11, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ළමාකාලය (සුභාරංචි කලා පින්තූර කට්ටලය 206; 62124); පින්තූරය 2-12, බයිබලීය පාසලක්; පින්තූරය 2-13, යේසුස් පිරිමි ළමයා දේවමාළිගාව තුල (සුභාරංචි කලා පින්තූර මල්ල 205; 62500).
5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

**යේසුස්වහන්සේ වරක් ළමයෙකුව සිටිසේක.**

අවධානශීලී ක්‍රියාකාරකම

ළමා උපකරණ බෙදාදී, ළමයින්ට ඒවා දෙස බලමින් තබාගෙන සිටීමට කියන්න. එම උපකරණ පාවිච්චිකෙරෙන්නේ කුමක් සඳහාදැයි පහදාදෙන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වරක් ළමයෙකුව සිටිබව පෙන්නාදෙන්න.

- යේසුස්වහන්සේ මෙවැනි උපකරණ පාවිච්චිකල බව ඔබ සිතන්නේද?

යේසුස්වහන්සේ බිළිඳු අවධියේදී උන්වහන්සේ පාවිච්චිකල සමහර දේවල් ළමයින්ගේ බිළිඳු අවධියේදී ඔවුන් පාවිච්චිකල දේවල්වලට බොහෝ සමානබව පෙන්වාදෙන්න. සමහර දේවල් ඉතා වෙනස්ය. මෙම පාඩමේදී යේසුස්වහන්සේගේ ජීවිතයේ ළමා අවධිය ගැන ළමයින් ඉගෙනගන්නා බව පහදාදෙන්න.

## යේසුස්වහන්සේට නිවසක් තිබුනේය

පින්තූර සාකච්ඡාව

පින්තූරය 2-10 පෙන්වන්න. බයිබලීය පවුල් ජීවිතය. නාසරත්හි මිනිසුන් ජීවත්වූයේ මෙවැනි නිවාසවල බව ළමයින්ට කියන්න. නාසරත් යනු යේසුස්වහන්සේ හැදී වැඩුන නගරයවේ (මතෙව් 2:23 බලන්න). යේසුස්වහන්සේ මෙවැනි නිවසක ජීවත්වන්ට ඇත. පින්තූරය අධ්‍යයනය කිරීමට, ඒ ගැන කථාකිරීමට සහ ප්‍රශ්න ඇසීමට ඉඩදෙන්න. ළමයින්ට ප්‍රශ්න නොමැති නම්, පහත සඳහන් පරිදි ප්‍රශ්න කිහිපයක් ඇසීමට ඔබට අවශ්‍යවිය හැකිය:

- ඔබ සිතන අන්දමට පවුලේ අය සයනයකරන්නේ කොහේද? (කාන්තාව දිගහරින පැදුර සහ ඇය පිටුපස තිබෙන පෙට්ටගම ඔතනලද පැදුරු තබන ස්ථානය ලෙස පෙනෙන බව පෙන්වාදෙන්න. නිවාසවල වහලය සමතලාබවත්, හැම නිවසකම පිටත ඇති පියගැට පෙළ වහලය දක්වා දිවයන බවත් පහදාදෙන්න. සමහරවිට ළමයින් යම් අවස්ථාවලදී වහළය මත සයනයකරන්ට ඇත.)
- මෙම නිවසේ බිළිඳා සයනයකලේ කොහේද? (තොටිල්ල පෙන්වන්න. වඩු කාර්මිකයෙකුවූ යොසෙප් යේසු බිළිඳා සඳහා මෙවැනි තොටිල්ලක් සාදන්නට ඇති බව පහදාදෙන්න.)
- විශාල බුජම් පාවිච්චිවූයේ කුමකටදැයි ඔබ සිතන්නේද? (සමහරක් ජලය දැමීමටය, පවුලේ අය පාවිච්චිකල ජලය ගමේ ළිඳෙන් රැගෙන ඒමට සිදුවූයේ නිවාසවලට නළ ජලය නොතිබුන නිසාය. ළිඳක් යනු පිරිසිදු ජලය සහිත පොළොවේ හාරා තිබෙන ගැඹුරු විවරයකි.
- පොළොවේ වාඩිවී සිටින කාන්තාව කුමක් කරන්නේද? (පාන් සෑදීමට ධාන්‍ය අඹරන්නීය.)
- එකල විදුලි බලය නොතිබූ බැවින්, ඔවුන් මෙම නිවස අලෝකමත්කලේ කෙසේද? (ඔවුහු තෙල් ලාම්පු පාවිච්චි කළහ. ධාන්‍ය අඹරන කාන්තාව පිටුපස බංකුව මත ඇති ලාම්පුව පෙන්වන්න. සමහරවිට බුජම් කිහිපයක් ලාම්පු සඳහා වන තෙල් දැමීමට යොදාගෙන ඇත.)

පින්තූර සාකච්ඡාව

පින්තූරය 2-11 පෙන්වන්න, යේසුස්වහන්සේගේ ළමාකාලය.

- මෙම පින්තූරයේ සිටින අය කව්ද? (යේසුස්වහන්සේ සහ යොසෙප්ය.)
- ඔවුන් කරන්නේ මොනවාද?

යේසුස්වහන්සේ සමහරවිට යොසෙප්ගේ වැඩට උදව්කරන්ට ඇති අතර, තමා මෙන් වඩු කාර්මිකයෙක් වීමට යොසෙප් යේසුස්වහන්සේට උගන්වන්ට ඇත (මාර්ක් 6:3 බලන්න).

- ඔබ සිතන අන්දමට යේසුස්වහන්සේ තම නිවසින් ඉගෙනගත් වෙනත් දේවල් මොනවාද?

අපි බයිබලයේ කියවන කථා වැනි අනාගතවක්තෘවරුන් ගැන කථා, යේසුස්වහන්සේට උන්වහන්සේගේ නිවසේදී උගන්වන ලද බව අවධාරනය කරන්න. අපගේ දෙමාපියන් අපට උගන්වන පරිදි, උන්වහන්සේ-ටද යාච්ඤාකිරීමට සහ හරි දේ කිරීමට උගන්වන ලදී. අප මෙන්ම මරියතුමිය සහ යොසෙප්ද, ස්වර්ගික පියාණන්වහන්සේ තුල ඇදහිලිමත්වූහ.

## ළමා අවධියේදී යේසුස්වහන්සේ බොහෝ දේවල් කළසේක

කියාකාරකම

ළමයින්ට ඔවුන්ගේ අත් ඔසවා සිටීමට කියන්න. ඔවුන් අහාරයට ගන්නා විවිධ ආහාර ද්‍රව්‍යවල නම් කියන්න. යේසුස්වහන්සේ ආහරයට ගත්තේයයි ඔවුන් සිතන අහාර වර්ග කියවෙන විට ඔවුන්ගේ අත්ල උඩු අතට හැරවීමටත්, එම ආහාර ද්‍රව්‍ය උන්වහන්සේ නොගත්තේ යයි ඔවුන් සිතන්නේ නම්, අත්ල යටි අතට හරවන ලෙසත් ළමයින්ට කියන්න. යේසුස්වහන්සේ ආහාරයට ගන්නට ඇතැයි සිතෙන, ළමයින් ආහාරයට ගන්නා යම් ආහාර වර්ග සඳහන්කිරීමට වගබලා ගන්න. පාන්, මාළු, බැටළුමස්, මීපැණි, මිදි, අත්තික්කා, රටඉඳි සහ කරි වැනි ආහාර.

සාකච්ඡාව

- ඔබගේ ළමාකාලයත්, යේසුස්වහන්සේගේ ළමා කාලයත් අතර වෙනසක් ඇති ඔබ සිතන්නේද?
- ඔබගේ ළමාකාලය, යේසුස්වහන්සේගේ ළමාකාලයට සමානබව ඔබ සිතන්නේද?

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සිය ළමාකාලයේදී කර ඇතැයි සිතන කුමන දේවල් ළමයින් දැනට කරන්නේදැයි සාකච්ඡාකිරීමට ඔවුන්ට කියන්න. උදාහරණයක් ලෙස, පණිවුඩ ගෙන යාම, තම දෙමාපියන්ට උදව්කිරීම, පාසල් යාම, බිළිඳෙකු බලාගැනීම, ගීත ගායනාකිරීම, ක්‍රීඩා කිරීම, තරඟ දිවීම හෝ අශ්වයන් පිටයාම ඔවුන් කර තිබිය හැක. යේසුස්වහන්සේද මේවා හෝ ඒ හා සමාන දෙවල් කර තිබිය හැකිබවට යෝජනාකරන්න (උදාහරණ වශයෙන්, යේසුස්වහන්සේ කිසිදා අශ්වයෙක් පිට උඩ ගොස් නැති නමුත්, සමහරවිට බූරුවෙක් පිට ගොස් ඇතිසේක).

### යේසුස්වහන්සේ ශුද්ධ ලිඋවිලි අධ්‍යයනය කළසේක

පින්තූර සාකච්ඡාව

පින්තූරය 2-12 පෙන්වන්න, බයිබලීය පාසල. නාසරත්හි තරුණ ළමයි සිනගෝගයේ හෝ සභාවේ පාසල්වලට ගිය බව පහදාදෙන්න. පාසල් ගුරුවරයා සිනගෝග ග්‍රාමයේ ප්‍රධානියා වූයේය. ඔහු *රබ්බි* යනුවෙන් හැඳින්වින.

ළමුන් සියල්ලන්ටම එක්ව *රබ්බි* යයි කීමට කියන්න.

තිවසේ ඉගැන්වීමට අමතරව, යේසුස්වහන්සේ මෙවන් පාසලකට යාමට ඇත.

- මෙම පාසල ඔබගේ පාසලෙන් වෙනස්වන්නේ කෙසේද? (පිළිතුරුවලට ළමුන් ඇඳුම් අඳින පිළිවෙල, ඔවුන් හිඳගත් ආසන සහ ඔවුන් ලිවීමට පාවිච්චිකල මේසවල ආකාරය යනාදිය ඇතුළත්විය හැකිය.)

මේ කාලයේදී කුඩා ගැහැණු ළමයින් පාසල් නොගිය බව පහදාදෙන්න. ඔවුන්ගේ මව්වරුන් විසින් ඔවුන්ට උගන්වන ලදී.

සන්නස ප්‍රදර්ශනයකිරීම

පාසල්වල පොත් නොතිබූ බව පෙන්නාදෙන්න. යේසුස්වහන්සේගේ කාලයේ ළමුන් කියවීමට ඉගෙනගත්තේ සන්නස්වලින්ය. *සන්නස* යන වචනය ළමුන් ලවා නැවත කියවන්න.

ඔබ සකස්කල සන්නස ළමුන්ට පෙන්වන්න. සන්නසක් යනු, අකුරු ලියා ඇති කඩදාසියක් වැනි එක් එක් කෙළවර කෝටුවකට සම්බන්ධකර තිබෙන ද්‍රව්‍යයක් බව පහදාදෙන්න. එක් කෙළවරක් දිගහරින විට, අනෙක් කෙළවර එතෙන බැවින් පිටුවක ප්‍රමාණයේ කොටසක් පෙනීමට තිබේ. ඔබ සකස්කල සන්නස ප්‍රදර්ශනය කර මෙය පෙන්වාදෙන්න. ඉන්පසු පාඩමේ අවසාන කොටස සඳහා සන්නස පසෙක තබන්න.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

එම පිරිමි ළමුන් පාසල්වල අධ්‍යයනය කල සන්නස්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉපදීමටත් පෙර ජීවත්ව සිටි අනාගතවක්තෘවරුන්ගේ ඉගැන්වීම්වලින් සමන්විතවූ බව පහදාදෙන්න. බයිබලයේ කොටසක් වන පරණ ගිවිසුම පෙන්වන්න. බයිබලයේ මෙම කොටසට ඇතුළත්ව තිබෙන්නේ, සන්නස් කිහිපයක තිබූන යම් ලියවිලි සහ කථාන්තරය.

රබ්බි සිටින පින්තූරය උසුලාගෙන සිටින ළමයාට සන්නසේ එම පින්තූරය සහ ඔහුගේ පැත්තක තිබෙන සන්නස්ද පෙන්වීමට කියන්න. ළමයින් කියවීම සහ ලිවීම ඉගෙනගත්තේ සන්නස්වලින් බව පහදාදෙන්න. අපි බයිබලයෙන් කියවීම සහ ලිවීම ඉගෙනගැනීම මෙයට සංසන්දනය කල හැකිය.

ශුද්ධ ලියවිලි කථාන්තරය

යේසුස් පිරිමි ළමයා සිටින පින්තූරය 2-13 පෙන්වා, ලූක් 2:41—50 දැක්වෙන කථාව කියන්න.

මරියතුමිය සහ යොසෙප් පළමු දවස ගමන් අවසානයේදී යේසුස්වහන්සේව කොහේවත් දක්නට නොලැබුන විට, ඔවුන් කෙතරම් කණගාටුවටත්, බියටත් පත්වූවාදැයි තේරුම්ගැනීමට *ළමුන්ට උපකාරකරන්න. ඔවුන් විගසකින්ම යෙරුසලමට හැරීවිත්, අවසානයේදී උන්වහන්සේව හමුවන තුරු දින තුනක්ම උන්වහන්සේව සෙවූහ.

- මරියතුමියට සහ යොසෙප්ට යේසුස්වහන්සේව හමුවූයේ කොහේදීද?
- යේසුස්වහන්සේ දේවමාළිගාව තුල කුමක් කළේද? (ලූක් 2:46 බලන්න.)

යේසුස්වහන්සේ කථාකරමින් සිටියේ ශුද්ධ ලියවිලි විශාල වශයෙන් හදාරන ලද මිනිසුන් සමග බව පහදාදෙන්න. මෙම මිනිසුන් යේසුස්වහන්සේගේ අප්‍රමාණ දැනුම ගැන විස්මිතවූහ. ලූක් 2:47 ශබ්දනගා කියවන්න. *විස්මිතවීම* යනු පුදුමවීම බව පහදාදෙන්න.

### අපට වඩාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමට පුළුවන

සාකච්ඡාව

යේසුස්වහන්සේ මරියතුමිය සහ යොසෙප් සමග නැවතත් නසරත් නුවරට පමිණ එහි හැදී වැඩුනසේක. ඔබ සකස්කල සන්නස ගෙන එහි සඳහන් ලූක් 2:52 කියවන්න. වැඩිවීම යනු වැඩීම බව පහදාදෙන්න.

- මෙම ශුද්ධ ලියවිල්ලෙන් ප්‍රකාශවන යේසුස්වහන්සේ ප්‍රඥාවෙන් වැඩුනාහ, යන්නෙහි අදහස කුමක්ද?

ළමයින් හරි දේ තෝරාගැනීමට ඉගෙනගන්නා නිසා ඔවුන් හැම කෙනෙක්ම ප්‍රඥාවෙන් වැඩෙන බව පහදාදෙන්න. ඔවුන් මීට මාස කිහිපයකට පෙර සිටියාට වඩා දැන් කොපමණ ප්‍රඥාවන්තදැයි පෙන්-වීමට උදාහරණ කිහිපයක් දෙන්න.

- ශුද්ධ ලියවිල්ලෙහි අවසාන පදයෙන් කියවෙන යේසුස්වහන්සේ "දෙවියන්වහන්සේගේ කරුණාවෙහිද වැඩුනසේක, " යන්නෙහි අදහස කුමක්ද? (යේසුස්වහන්සේ නිතරම ස්වර්ගික පියාණන්වහන්සේ උන්වහන්සේගෙන් අපේක්ෂාකල පරිදි කටයුතුකල නිසා, ස්වර්ගික පියාණන්වහන්සේ සතුටුවූසේක.)
- ඔබ ස්වර්ගික පියාණන්වහන්සේගේ කරුණාවෙහි වැඩෙන්නේ කෙසේද?

අප වඩාත් යේසුස්වහන්සේ මෙන් වන විට, ස්වර්ගික පියාණන්වහන්සේ සතුටුවන බව පහදාදෙන්න. යේසුස්වහන්සේ නිතරම හරි දේ තෝරාගත්සේක.

- ඔබ සිතන ලෙස අන් අය විසින් විහිළුවට ලක්කරන ළමයෙකුට යේසුස්වහන්සේ සලකන්නේ කෙසේද?

ළමයින්ට තමන්ගෙන්ම මෙසේ ඇසීමට කියන්න, "අන් අය සමච්චලයට ලක්කරන ළමයෙකුට මා සලකන්නේ කෙසේද?"

- යේසුස් තරුණයා ක්‍රීඩාකරන විට ඔහුගේ මව හෝ යොසෙප් යමක්කරන ලෙස ඉල්ලාසිටි විට, ඔබ සිතන ලෙස උන්වහන්සේ කළේ කුමක්ද?

ළමයින්ට තමන්ගෙන්ම මෙසේ ඇසීමට කියන්න, "මා ක්‍රීඩාකරන විට, මගේ මව හෝ පියා යමක් කිරීමට මගෙන් ඉල්ලීමක් කල හොත්, මා කළයුත්තේ කුමක්ද?

යේසුස්වහන්සේ මනුෂ්‍යයන්ගෙත් "කරුණාවෙහි වැඩුණුබව" පහදාදෙන්න (ලූක් 2:52 බලන්න). ඔවුහු උන්වහන්සේ වටා සිටීමට කැමතිවූහ.

- යේසුස්වහන්සේගේ ළමා අවධියේ මිතුරෙක්ව සිටීමට ලැබුනේ නම්, ඔබ සතුටුවන්නේද?

හදේතෝ සටහන

හදේතෝ සටහන පෙන්වා එහි සඳහන් වචන නැවත කීමට ළමයින්ට කියන්න: "මම හරි දේ තෝරාගන්-නෙමි." ඔවුන් හරි දේ තෝරාගන්නා විට, ඔවුන් වඩාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් වනබව ඔවුන්ට සිහිපත්කරන්න.

### සාරාංශය

ගීතය

"යේසුන් වරක් කුඩා ළමයෙකු වූහ" ගීතය ළමයින් සමග ගායනාකරන්න. නැතහොත් පද දෙකේම වචන කියන්න. ළමුන්ට අපහසු වචන තිබේනම් පැහැදිළිකරන්න. උදාහරණයක් ලෙස, *ක්‍රීඩාව* යනු

වියවුල්වීම යයි පහදාදෙන්න. යේසුස්වහන්සේට අවශ්‍ය ලෙස කටයුතු සිදුනොවූ විට, උන්වහන්සේ වියවුල් නොවූසේක.

යේසුන් වරක් කුඩා ළමයෙකු වූහ,
මා වැනි කුඩා ළමයෙක් වූහ;
එතුමා එසේම පිරිසිදු මෘදු ශාන්ත වූහ,
කුඩා ළමයෙක් විය යුතු විලස.
එනිසා, කුඩා ළමයිනි,
දිරිගමු ඔබත් මාත්
එතුමාමෙන් වීමට,
දිරිගමු, දිරිගමු, දිරිගමු

කුඩා ළමුන් සේ ක්‍රීඩා කලේය එතුමා
තරුණන් කැමතිම ක්‍රීඩා
තරඟ පැරදුනත් එතුමා නොමවුනි වියවුල්
එතුමා නිතරම එසේම කීවේ ඇත්ත
එනිසා, කුඩා ළමුනි
වීමට එතුමා මෙන්,
දිරිගමු, දිරිගමු, දිරිගමු

සාක්ෂිය

හරි දේ තෝරාගෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් වීමෙන් අපට සතුටින් සිටිය හැකි බවට සාක්ෂිද-රන්න. අප ජීවත්විය යුතු ආකාරය පිළිබඳව යේසුස්වහන්සේගේ ජීවිතය ආදර්ශයක් සේ ලැබීම ගැන ඔබ කෙතරම් ස්තුතිවන්ත වන්නේදැයි ළමයින්ට කියන්න.

යේසුස්වහන්සේගේ ළමා අවධිය, යම් ආකාරයකින් ළමයින්ගේම ළමා අවධියට බොහෝදුරට සමානබව යෝජනාකරන්න. යේසුස්වහන්සේ මෙන් නිතරම හරි දේ තෝරාගැනීමට ඔවුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

---

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ලණුවක් හෝ නූලක් ගෙන හැම ළමයෙකුගේම උස මනින්න. එක් එක් ළමයාගේ උස ප්‍රමාණයට සරිලන ලණු හෝ නූල් කෑල්ල එම ළමයාටම තබාගැනීමට දෙන්න. ළමුන් ශරීරාකාරයෙන් වැඩෙන විට, ඔවුන් දෙවියන්වහන්සේ කෙරෙහි කරුණාවෙන්ද වැඩිය යුතු බව ඔවුන්ට සිහිපත්කරන්න. යේසුස්වහන්සේ කලාක් මෙන්, යහපත් තේරීම් කිරීමෙන් ඔවුන්ටද මෙය කළහැකිය.

2. ලූක් 2:52 ඔබ හා එක්ව කිහිප වතාවක් නැවත කීමට ළමුන්ට උදව්කරන්න. ඔවුන්ට ස්වර්ගික පියාණන්වහන්සේගේ කරුණාවෙහි වැඩීමට හැකියාව ලැබෙන ඔවුන්ට කළහැකි යම් විශේෂිත තේරීම් ගැන සාකච්ඡාකරන්න.

3. යේසුස්වහන්සේ සමහරවිට කෑමට පාවිච්චිකර ඇති අත්තික්කා, මීදි, රටඉඳි, චීස්, පාන්, ගෙඩිවර්ග හෝ වෙරළු වැනි ආහාරයක් ගෙනවිත් එය ළමයින්ට රසබැලීමට දෙන්න. ඔබ ගෙනෙන ආහාර කිසිදු ළමයෙකුට අපත්‍ය නොවන බවට කලින්ම ළමුන්ගේ දෙමාපියන් විමසා ස්ථිර කරගන්න. (උපවාස ඉරුදින ඔබ මෙම පාඩම උගන්වන්නේ නම්, ආහාර රැගෙන ඒමෙන් වළකින්න.)

4. බිළිඳුන්ට කළ හැකි දේවල් සාකච්ඡාකර, ළමුන්ට දැන් කළ හැකි දේවල් සමග ඒවා සසඳන්න. පහත සඳහන් ප්‍රශ්න අසන්න:

- බිළිඳෙකුට ඇවිදීමට පුළුවන්ද?ඔබට ඇවිදීමට පුළුවන්ද?
- බිළිඳෙකුට කථාකිරීමට පුළුවන්ද?ඔබට කථාකිරීමට පුළුවන්ද?

ළමයින් වැඩෙනවිට, හරි දේ තෝරාගැනීම මගින් ඔවුන්ගේ හැකියාවන්ද වඩාත් ගැලවුම් කරුවාණන්ට සමානවන බව පහදාදෙන්න.

5. එක් එක් ළමයාට ලුණු පාන් ගුලියක් ලබාදී (පහත දැක්වෙන වට්ටෝරුව බලන්න) ඔහුට හෝ ඇයට කුඩා භාජනයක්, මල් බඳුනක් හෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ළමයෙකුව සිටියදී පාවිච්චි කල බව සිතෙන යම් උපකරණයක් සෑදීමට කියන්න.

ලුණු පාන් ගුලිය

අවශ්‍ය උපකරණ:

පිටි කෝප්ප 2
ලුණු කෝප්ප 1
තෙල් තේහැඳි 1
ජලය
ආහාර වර්ණ (මනාපය පරිදි)

සාදාගන්නා ක්‍රමය: පිටි සහ ලුණු කලවම්කරන්න. තෙල් සහ ජලය ප්‍රමාණවත් ලෙස මිශ්‍රකොට මිශ්‍රනය මැටි ගුලියක් ලෙස සාදාගන්න. වරකට සුළු ප්‍රමාණයක් බැගින් ජලය එකතුකරමින් මිශ්‍රනය අතේ නොඇලෙන ලෙස සකස්කර ගන්න. යාන්තමට අනාගන්න. පිටි ගුලිය පාටකිරීම ඔබට අවශ්‍යනම්, ලුණු සහ පිටිවලට ජලය එකතුකිරීමට ප්‍රථම අවශ්‍ය වර්ණ ජලයට එකතුකරගන්න. පාන් ගුලිය සුළං නොවදින භාජනයක තබන්න.

# යාච්ඤාව තුළින් ස්වර්ගික පියාණන්වහන්සේ සමග කථාකිරීමට මට පුළුවන

10
වෙනි
පාඩම

**අරමුණ**

ගෞරවනීය ලෙස යාච්ඤාකිරීම මගින් ස්වර්ගික පියාණන්වහන්සේට සමීපව හැදී වැඩීමට ළමයින්ට හැකි බව තේරුම්ගැනීමට ඔවුන්ට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. මතෙව් 6:9 සහ 3නිෆායි 18:19–20 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න. සුභාරංචි මූලධර්ම (31110), 8වෙනි පරිච්ඡේදයද බලන්න.
2. පහත සඳහන් වචන තීරු සූදානම්කරන්න:

   | |
   |---|
   | තුඹ (*You*) |

   | |
   |---|
   | ඔබ (*Thee*) |

3. පහත සඳහන් ප්‍රශ්න කඩදාසි කැලිවල වෙන වෙනම ලියන්න. අඩුම වශයෙන් එක් ප්‍රශ්නයක් හෝ ඔබගේ පංතියේ හැම ළමයෙකුටම දෙන්න (ඔබගේ පංතිය කුඩා එකක් නම්, එක් ළමයෙකු සඳහා අඩුම වශයෙන් ප්‍රශ්න දෙකක් හෝ දෙන්න).
   අ. ඔබගේ පවුලේ යමෙකුට ටික කාලයකට නිවසින් පිටවීමට සිදුව තිබේ. ඔබගේ යාච්ඤාවන් තුලින් ස්වර්ගික පියාණන්ගෙන් ඔබට කුමක් ඉල්ලිය හැකිද?
   ආ. හරි දේ තෝරාගැනීමට අපගේ පාඩමෙන් අපට උගන්වන්නේ නම්, අපගේ පංතියේ යාච්ඤාවන් තුලින් ස්වර්ගික පියාණන්ගෙන් අපට කුමක් ඉල්ලිය හැකිද?
   ඇ. කරුණාවන්තවීමට අපගේ පාඩම අපට උගන්වන්නේ නම්, අපගේ පංති යාච්ඤාවන් තුලදී ස්වර්ගික පියාණන්ගෙන් අපට කුමක් ඉල්ලිය හැකිද?
   ඈ. ඔබගේ මිතුරා අසනීපව සිටින නිසා ක්‍රීඩාකිරීමට පැමිණිය නොහැකි නම්, ඔබගේ යාච්ඤාවන් තුලින් ඔබට ඉල්ලිය හැක්කේ කුමක්ද?
   ඉ. හැම දිනකම අපගේ උදෑසන සහ සවස යාච්ඤා තුලින් අපට කුමක් ඉල්ලිය හැකිද?
   ඊ. අප යාච්ඤාකරන විට අපගේ ප්‍රාථමිකයේ ළමුන් වෙනුවෙන් අපට කුමක් ඉල්ලිය හැකිද?
4. “යාච්ඤා ගීතයක්” මෙය ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්වන්න (*ළමා ගී පොත*, පි. 22).
5. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් සහ මෝර්මන්ගේ පොතක්
   ආ. පින්තූරය 2-14, පංති යාච්ඤාව (62200); පින්තූරය 2-15, බ්‍රිගම් යන්ග්; පින්තූරය 2-16, හීබර් ජේ. ග්‍රාන්ට්ගේ ළමා කාලය.
6. ඔබ පාවිච්චිකිරීම බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අවධානශීලී ක්‍රියාකාරකම

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකිරීමට පෙර, පංති යාච්ඤාව, පින්තූරය 2-14 පෙන්වා, “යාච්ඤාවේ ගීතයක්” යන ගීතය ගෞරවයෙන් යුතුව ගායනාකරන්න. නැතිනම් වචන කියන්න.

අපි නමමු අපේ හිස් අද යාච්ඤාවේදී,
අපි එක්ව නමමු අපේ අත්,
අපි වසමු අපේ ඇස් යාච්ඤාවේදී
අපි කථාකරමු සුර පියා සමග.

- යමෙක් පංතියේදී යාච්ඤාව කියන විට, එහි සිටින අප කල යුත්තේ කුමක්ද?

"යාච්ඤා ගීතයක්" නැවත ගායනා කරන්න. ගීතයේ වචන වලින් ළමයින්ගෙන් අපේක්ෂා කෙරෙන පරිදි කටයුතුකිරීම මගින් යාච්ඤාවට ළමයින්ව සූදානම්කරන්න.

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

### අප යාච්ඤාකිරීමට පෙර අපි සූදානම්වන්නෙමු

සාකච්ඡාව

- යාච්ඤාවට සූදානම්වීම සඳහා ගීතයෙන් කියවෙන අප කල යුතු දේවල් මොනවාද?
- අප යාච්ඤාකරන විට අපි අපගේ හිස් නමන්නේ මන්ද?

අප යාච්ඤාකරන විට අපගේ හිස් නැමීමෙන්, අපි ස්වර්ගික පියාණන්වහන්සේට අපගේ ප්‍රේමය, ගෞරවය සහ සැලකිල්ල පෙන්වන බව තේරුම්ගැනීමට ළමයින්ට උපකාර කරන්න. පොළොව මත සිටින රජෙකුට, සභාපතිවරයෙකුට හෝ වෙනයම් ඕනෑම පුද්ගලයෙකුට වඩා ස්වර්ගික පියාණන්-වහන්සේ බොහෝ ශ්‍රේෂ්ඨ සහ බොහෝසේ බලවත්වන්නාසේම, අප වෙනුවෙන් බොහෝ දෙවල්ද කර ඇතිසේක. අපි උන්වහන්සේට ප්‍රේමකරන බව සහ ගෞරවකරන බව පෙන්විය යුතුවෙමු.

- අප යාච්ඤාකරනවිට, අපගේ අත් නමාගන්නේ මන්ද?

යාච්ඤාවක් කරන විටදී ඔවුන්ගේ අත් සෙලවීමෙන් අන් අය යාච්ඤාවට සවන්දීමෙන් වළක්වන බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරකරන්න.

- අප යාච්ඤාකරන විට අපගේ ඇස් වසාගන්නේ මන්ද?

ළමුන්ගේ ඇස් මොහොතකට වසාගෙන පිළිතුරක් ගැන සිතීමට ඔවුන්ට ඉඩ සලසන්න.

ළමුන් ඇස්වසා සිටීමෙන් ඔවුන්ගේ අවධානය අවට දේවල්වලට යොමුවීම මඳ බව අවබෝධ කරගැ-නීමට ඔවුන්ට උදව්කරන්න. ස්වර්ගික පියාණන්වහන්සේ ගැන මෙන්ම ඔවුන් උන්වහන්සේට ප්‍රකාශ-කරන දෙය ගැනත් සිතීමට ඔවුන්ට එවිට හැකියාව ලැබේ.

### අප යාච්ඤාකරන විට, අපි ස්වර්ගික පියාණන්වහන්සේට සමීපබවක් අපට හැඟේ

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

අප අපගේ හිස් නමාගෙන, අපගේ අත් නමාගෙන සහ අපගේ ඇස් පියාගෙන සිටීමෙන්, අපගේ අවධානය අප අවට තිබෙන දේවලට නොව අපගේ යාච්ඤාවට යොමුකිරීමට අපට හැකි බව පහදාදෙන්න. අපට ශාන්ත හැඟීමක් ඇතිවීමෙන් ස්වර්ගික පියාණන් වෙත සමීප හැඟීමක්ද ඇතිවේ. උන්වහන්සේ සමග කථාකිරීමට අප සූදානම්වේ.

කථාන්තරය

පින්තූර 2-15, බ්‍රිගම් යන්ග් සහ 2-16, හීබර් ජේ. ග්‍රාන්ට්ගේ ළමා අවධිය පෙන්වා, යාච්ඤාකරන විටදී තමා ස්වර්ගික පියාණන්වහන්සේට සමීපවීමේ හැඟීමක් ලද කුඩා පිරිමි ළමයෙකු පිළිබඳ පහත සඳහන් කථාව ඔබගේම වචනවලින් කියන්න:

වසර ගණනාවකට පෙර, බ්‍රිගම් යන්ග් සභාවේ අනාගතවක්තෘවරයා සහ සභාපතිවරයාද විය. වයස අවුරුදු හයක් පමණවූ හීබර් ජේ. ග්‍රාන්ට් නම් පිරිමි ළමයා යන්ග් සභාපතිවරයාගේ එක් කුඩා පිරිමි ළමයෙක් සමග ක්‍රීඩාකළේය. යාච්ඤාකිරීමට පවුලේ සියල්ලන්ම එකට කැඳවන වේලාව වන තුරු, හීබර් නිතරම මෙන් යන්ග් සභාපතිවරයාගේ නිවසේ ක්‍රීඩා කරමින් සිටියි. හීබර් පවුලේ අය සමග

දණගසා, ඔහුගේ අත් නමාගෙන, ඔහුගේ හිස පහත් කරගෙන, ඔහුගේ ඇස් පියාගෙන, සභාපතිවරයා යාච්ඤාකරන විට ඊට සවන්දෙයි. යන්ග් සභාපතිවරයා ස්වර්ගික පියාණන්වහන්සේ සමග කථාකරන විලාසය නිසා, හීබර්ට දැනුනේ ස්වර්ගික පියාණන්වහන්සේ එම කාමරයේ සැබවින්ම වැඩසිටින්නාක් මෙන්ය. සමහර අවස්ථාවලදී හීබර් සිය දෙනෙත් පවා විවර කොට ස්වර්ගික පියාණන්වහන්සේ එහි සිටීදැයි බැලුවේය. ඇත්තවශයෙන්ම, ඔහු දුටුවේ යන්ග් සභාපතිවරයා සහ ඔහුගේ පවුලේ අය පමණි. නමුත් ස්වර්ගික පියාණන්වහන්සේ යන්ග් සභාපතිවරයාට ඇහුම්කන් දෙමින්, ඔහු ඉල්ලා සිටි උපකාර සහ මගපෙන්වීම් ලබාදෙමින් ඔහු සමග සිටි බව ඔහුට තවමත් ස්ථිරය.

හීබර් වයසින් වැඩුන විට, ප්‍රේරිතයෙක් බවට පත්වූ ඔහු පසුව සභාවේ සභාපතිවරයාද වූයේය (බලන්න හීබර් ජේ. ග්‍රාන්ට් සූභාරංචි ප්‍රමිතීන්, සකස්, ජී හෝමර්. ඩර්හැම් [සෝල්ට් ලේක් නගරය: *Improvement Era*, 1941], පිටු. 223–24.)

හීබර් ජේ. ග්‍රාන්ට් මෙන්, යාච්ඤාකිරීමේදී ඔබ ස්වර්ගික පියාණන්වහන්සේට සමීපවීමේ හැඟීමක් ලද පෞද්ගලික අත්දැකීමක් බෙදාගැනීමට ඔබටද අවශ්‍යවිය හැකිය.

අප යාච්ඤාකරන විට ස්වර්ගික පියාණන්වහන්සේ නිතරම අපට සවන්දෙන බව ළමයින්ට සිහිපත්කරන්න. අප යාච්ඤාකරන විට අපගේ හිස් පහත්කරගෙන, අපගේ අත් නමාගෙන සහ අපගේ ඇස් පියාගෙන සිටීමෙන්, ස්වර්ගික පියාණන්වහන්සේ අප සමීපයේ සිටින බව හැඟීමට අපට උපකාරවන්වේ.

## අප යාච්ඤාකරන විට අපි ගෞරවයෙන් යුතුව කථාකරන්නෙමු

ශුද්ධ ලියවිලි සාකච්ඡාව

අපගේ යාච්ඤාවන්හිදී අපි ස්වර්ගික පියාණන්ට කථාකරන විලාශයෙන්ද, අපි උන්වහන්සේට අපගේ ප්‍රේමය සහ ගෞරවය පෙන්වන බව පහදාදෙන්න.

- ඔබට යමෙක් සමග කථාකිරීමට අවශ්‍ය නම්, ඔවුන්ගේ අවධානය යොමුකරගැනීමට ඔබ ප්‍රකාශකරන පළවෙනි වචනය කුමක්ද? (ඔවුන්ගේ නමය.)
- ඔබට ස්වර්ගික පියාණන්වහන්සේ සමග කථාකිරීමට අවශ්‍යනම්, ඔබ ප්‍රකාශකරන පළමු දෙය කුමක්ද?

යාච්ඤාවේදී අප කියන පළමු දෙය නම් ස්වර්ගික පියාණන්ගේ නාමය බව පහදාදෙන්න. යේසුස්වහන්සේ මෙලෙස කිරීම අපට ඉගැන්වූයේ උන්වහන්සේ පොළොවේ සිටියදී බව ළමුන්ට කියන්න. මතෙව් 6:9 ශබ්දනගා කියවා, අපි සාමාන්‍යයෙන් "ස්වර්ගයේ වැඩසිටින්නාවූ තැනැන්වහන්සේ වන අපගේ පියාණන්වහන්සේ" යන නම කෙටිකරීමට "අපගේ ස්වර්ගයේ වැඩසිටින පියාණන් වහන්සේ" හෝ "ස්වර්ගික පියාණන්වහන්සේ" කියා අමතන බව පහදා දෙන්න.

අපගේ යාච්ඤා අවසන්කරන අන්දමද, යේසුස්වහන්සේ අපට පවසා ඇතිබව ළමයින්ට කියන්න. 3 නිෆායි 18:19 ශබ්දනගා කියවන්න.

- අපගේ යාච්ඤාවන් අවසන්කරන අන්දම ගැන යේසුස්වහන්සේ අපට කුමක් කියනසේක්ද? (උන්වහන්සේගේ නාමයෙනි. අපගේ යාච්ඤාවන් අප අවසන්කරන්නේ මෙම වචන වලින්ය, *යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙනි, ආමෙන්.*)
- අපි පංතියේ යාච්ඤාවක් හෝ පවුලේ යාච්ඤාවක් අසනවිට, යාච්ඤාව කියන පුද්ගලයා "ආමෙන්" කියයි. අප කුමක් කල යුතුද?

කණ්ඩායමක යාච්ඤාවක් අවසානයේදී අපි "ආමෙන්" කියන විට, එහි අදහසවන්නේ, එම කථාකරන පුද්ගලයා යාච්ඤාවේදී ප්‍රකාශකල කරුණුවලට අප එකඟවූ බව යයි පහදාදෙන්න. යාච්ඤාව ප්‍රකාශකල පුද්ගලයා සමග අපද යාච්ඤාකර ඇත.

වචනතීරු සාකච්ඡාව

අප ස්වර්ගික පියාණන්වහන්සේ සමග කථාකරන විට, "අපි නුඹට ස්තුති කරමු" "හෝ අපි නුඹෙන් ඉල්ලන්නෙමු" වශයෙන් අපි *නුඹ,* කියා නොකියන බව ළමයින් දැන සිටීදැයි ඔවුන්ගෙන් අසන්න.

"නුඹ" (*You*) යන වචන තීරුව පෙන්වන්න.

- *නුඹ* (*You*) වෙනුවට අපි පාවිච්චිකරන වචනය කුමක්ද? (ඔබ.) *Thee*

"නුඹ" (You) යන වචන තීරුව "ඔබ" (*Thee*) යන වචන තීරුවෙන් වසන්න. ළමුන් ලවා ගෞරවයෙන් යුතුව "අපි *ඔබ* වහන්සේට ස්තුති කරන්නෙමු" සහ "අපි *ඔබ* වහන්සේගෙන් ඉල්ලා සිටින්නෙමු" යයි නැවත කියවන්න.

- *නුඹ* වෙනුවට අපි *ඔබ* යයි කියන්නේ මන්ද? (එය අපි ස්වර්ගික පියාණන්ට සැලකිල්ල සහ ගෞරවකිරීම පෙන්වන තවත් ක්‍රමයකි.)

## අපගේ ආශිර්වාද වෙනුවෙන් ස්වර්ගික පියාණන්වහන්සේට ස්තුතිකිරීමට අපි යාච්ඤා කරන්නෙමු

ක්‍රීඩාව

අපි යාච්ඤාකිරීමේ ඉතා වැදගත් හේතුන් දෙකක් තිබෙන බව ළමයින්ට කියන්න. යාච්ඤා කිරීමේ පළමු වැදගත් හේතුව ළමයින්ට සොයාගැනීමට උපකාරවත්වීමට, ඔවුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. කණ්ඩායම් අතර මාරුවෙන් මාරුවට, ස්වර්ගික පියාණන්වහන්සේ ඔවුන් වෙනුවෙන් කල යම්දෙයක් වාර අනුව නම්කිරීමට ළමයින්ට කියන්න. හැම වතාවකදීම ඔවුන් නම්කල යුත්තේ කලින් සඳහන් නොකල දෙයකි. යම් කණ්ඩායමකට ඉක්මනින් පිළිතුරුදීමට නොහැකි නම්, එම වාරය අනෙක් කණ්ඩායමයට යයි. ක්‍රීඩාව මිනිත්තු කිහිපයක් හෝ කලින් සඳහන් නොකල යමක් කිසිම කණ්ඩායමකට සිතීමට නොහැකි අවස්ථාව දක්වා කරගෙන යන්න.

පහත දැක්වෙන පිළිතුරු කිසිවක් ළමයින් සඳහන්කර නොමැති නම්, ඒවා දැන් සඳහන් කරන්න:

- ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ ජීවිත අපට දුන්සේක.
- උන්වහන්සේ අපගේ පවුල් අපට දුන්සේක.
- උන්වහන්සේ මෙම පොළොව අපට දුන්සේක.
- උන්වහන්සේ අපට උපකාරකරීම සඳහා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එවූසේක.
- අපගේ යාච්ඤාවලට ඉතා හොඳ අන්දමින් පිළිතුරුදීමට උන්වහන්සේ පොරොන්දුවූසේක.

සාකච්ඡාව

පහත සඳහන් ප්‍රශ්න ළමයින් සමග සාකච්ඡාකරන්න:

- යමෙක් ඔබට ත්‍යාගයක් දුනහොත් හෝ ඔහු ඔබට කාරුණිකව ප්‍රේමය දක්වන්නෙකු නම්, ඔබ කුමක් කිව යුතුද?
- වෙන කිසිවෙකුටත් වඩා අපට ත්‍යාග බොහෝ ප්‍රමාණයක් දී තිබෙන්නේ කවිද? (ස්වර්ගික පියාණන්වහන්සේය.)
- යාච්ඤාකිරීමේ පළමු හේතුව කුමක්ද? (ස්වර්ගික පියාණන්වහන්සේ අපට ලබාදුන් බොහෝ ආශිර්වාදවලට උන්වහන්සේට ස්තුතිකිරීමටය.)

අපගේ දෙමාපියන්, පවුල් සාමාජිකයන් හෝ මිතුරන් අප වෙනුවෙන් කරන දේවලට අපි ඔවුන්ට ස්තුතිවන්තවන ලෙසම, ස්වර්ගික පියාණන්වහන්සේ අප වෙනුවෙන් කරන දේවලට අපි උන්වහන්සේටද ස්තුතිවන්ත විය යුතුබව අවධාරනය කරන්න. අපි ස්වර්ගික පියාණන් වහන්සේට ස්තුතිකරන විට උන්වහන්සේ සතුටුවනසේක.

## අපි යාච්ඤාකරන්නේ ස්වර්ගික පියාණන්වහන්සේගේ උපකාර ඉල්ලීමටය

කථාන්තරය

අපි යාච්ඤාකරන දෙවන හේතුව සොයාගැනීමට ළමුන්ට උපකාරවත්වීම සඳහා, ස්ටීවන් ගැන පහත සඳහන් කථාව ඔබගේම වචනවලින් කියන්න.

ස්ටීවන් තම දෙමාපියන්ද සමග අළුත් නගරයකට පදිංචියට ගියේ මෑතකදීය. පාසල් ගිය පළමු දිනයේදී ඔහු තම පංතියේ කිසිවෙකු ගැන දැනනොසිටියේය. ස්ටීවන්ගේ හැඟීම් නරක අතට පත්විය. නිවසට යාම ඔහුට අවශ්‍ය විය. ඔහු මේසය මත හිස තබාගත්තේ ඔහු හඬන බව කිසිවෙකුට නොපෙන්වීමටය.

ස්ටීවන් මේසය මත සිය හිස තබාගෙන සිටින බව ගුරුතුමියට ඉක්මණින්ම දැකගන්ට ලැබිනි. ඔහු අසනීපයෙන් යැයි සිතූ බැවින් ඇය, ඔහු හා කථාකිරීමට ඔහු ළඟට ගියාය. පාසැලේ හැඬීමට සිදුවීම ගැන ස්ටීවන් අසීරුතාවයට පත්වී, එය නවතාගැනීමට ඔහු උත්සාහ ගත් නමුත්, ඔහු එතරම්ම කණගාටුවෙන් සිටි නිසා එය ඔහුට කල නොහැකි විය.

කිසිවෙකුට නොඇසෙන ලෙස, ඉතා සෙමින්, ඔහු යාච්ඤාකළේය. "ස්වර්ගික පියාණෙනි, කරුණාකර, හැඬීම නවතාගැනීමට මට උපකාරවත්වන්න."

ඉක්මණින්ම හැඬීම නවතාගැනීමට ස්ටීවන්ට හැකිවිය. තමාට යහපත් හැඟීමක් දැනෙන බව ඔහු ගුරුතුමියට කීවේය. එසේම එය ඔහුට ප්‍රීතිමත් දිනයක් විය.

සාකච්ඡාව

- ස්ටීවන්ට යහපත් හැඟීමක් ඇතිවීමට උපකාරවත්වූයේ කුමක්ද?
- ඔබගේ යාච්ඤා ඔබට උපකාරවත්වූයේ කෙසේද?

ක්‍රියාකාරකම

අපි යාච්ඤාකිරීමේ දෙවන හේතුව නම්, ස්වර්ගික පියාණන්ගේ උපකාර ඉල්ලීම බව පහදා දෙන්න. උපකාර ඉල්ලා යාච්ඤාකිරීමට හැකි නිශ්චිත ක්‍රම ගැන තේරුම්ගැනීමට ළමුන්ට උදව්කිරීම සඳහා, ප්‍රශ්න පත්‍ර මේසය මත සහ පොළොව මත විසුරුවා හරින්න. හැම ළමයෙකුටම කඩදාසි කැල්ලක් තෝරාගැනීමට සලස්සන්න. හැම ප්‍රශ්නයක්ම කියවා, එය තෝරාගත් ළමයාට එයට පිළිතුරු සැපයීමට කියන්න.

ස්වර්ගික පියාණන්වහන්සේගේ උපකාර ලබාගැනීමට හරි දේ තෝරාගැනීමට අපි දැඩි උත්සාහයක් ගතයුතු බව තේරුම්ගැනීමට ළමුන්ට උදව්කරන්න. ඉන්පසුව අපි උපකාර පතා යාච්ඤාකරමින්, ස්වර්-ගික පියාණන්වහන්සේ සිතන අපට වඩාත් ගැළපෙනදේ කුමක්දැයි විමසිය යුතුවෙමු. අප යාච්ඤාකර ඉල්ලූ දෙය උන්වහන්සේ අපට ලබාදෙනසේක (බලන්න 3නිෆායි 18:20).

### සාරාංශය

සාකච්ඡාව

- අද අපගේ අවසාන යාච්ඤාවේදී ස්වර්ගික පියාණන්ට කුමක් වෙනුවෙන් ස්තුතිකිරීමට අපට හැකිද? (ප්‍රාථමිකයට පැමිණ යාච්ඤාව ගැන වැඩිදුර ඉගෙනගැනීමේ අවස්ථාවක් ලැබීම පිළිතුරුවලට ඇතුළත්විය හැකිය.)
- අපගේ යාච්ඤා තුලින් ස්වර්ගික පියාණන්වහන්සේගෙන් අපට ඉල්ලිය හැකි දේවල් මොනවාද?

සාක්ෂිය

ස්වර්ගික පියාණන්වහන්සේ සමග සෑම දිනකම කථාකිරීම කෙතරම් වැදගත්දැයි ඔබගේ සාක්ෂිය දරන්න. උදෑසන, සවස සහ අපට විශේෂ උපකාර අවශ්‍යවිටෙක හෝ විශේෂයෙන්ම ස්වර්ගික පියාණන්-වහන්සේට කෘතඥතාවය පුදකිරීමට හැඟෙන විට අපි යාච්ඤා කලයුතු බව ළමයින්ට මතක්කරන්න.

මෙම සතියේ සෑම දිනකම උදය සහ සවස යාච්ඤාකිරීම මතකතබාගැනීමට ළමුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. යාච්ඤාවට පෙර, "යාච්ඤාවේ ගීතයක්" සෙමින් ගායනාකරමින් සහ ගීතයෙන් ඔවුන්ගෙන් ඉල්ලන දේවල් කරමින්, යාච්ඤාකිරීම සඳහා ළමයින්ට සූදානම්වීමට කියන්න. ස්වර්ගික පියාණන්වහන්සේ සවන්දෙමින් සිටින බවත්, වචන

කියන්නේ එක් පුද්ගලයෙක් පමණක්වුවද, කාමරයේ සිටින සෑම කෙනෙක්ම යාච්ඤා කරන බවත් ඔවුන්ට මතක්කරන්න. යාච්ඤාව අවසානයේදී "ආමෙන්" කීමට ළමුන් සියලු දෙනාටම මතක්කරන්න.

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩා හොඳින් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම හෝ සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය- අමතර උපදෙස් සඳහා "පංති වේලාව" "ගුරු සූදානම" කොටස බලන්න.

1. පාඩමේ අවසානයේ දැක්වෙන, "මම ගෞරවයෙන් යාච්ඤාකරමි" මාතෘකාව ඇති අත් පත්‍රිකාවේ පිටපතක් හැම ළමයෙකුටම දෙන්න. ළමයින්ට ක්‍රේයොන් ලබාදී, ඔවුන්ගේ පින්තූර පාටකිරීමට කියන්න. තම පින්තූර ඔවුන්ගේ පවුල්වල අයට පෙන්වා, යාච්ඤාව ගැන අද ඔවුන් ඉගෙනගත් දේවල් ඔවුන්ගේ පවුල්වලට පැවසීමට ඔවුන්ව ධෛර්‍යයමත් කරන්න.

2. "අපි නමමු අපේ හිස්" ගීතය පෙන්වා තිබෙන ක්‍රියාවන් කරමින් ගායනාකිරීමට හෝ පළමු පදයේ වචන කීමට ළමුන්ට උදව්කරන්න (*ළමා ගී පොත*, පි. 25).

   අපි නමමු අපේ හිස් (*හිස් නමන්න*) වසමු අපේ ඇස් (*ඇස් වසන්න*)
   එසේම පොඩි යාච්ඤාවක් කියමු (*අත් නමන්න*).
   අපගේ පියාණන්ට අපි දයාවෙන් තුති පුදමු
   අපි සියල්ලෝ බෙදාගන්නා ආසිරි වෙනුවෙන් (අත් විහිදුවන්න).

3. යාච්ඤාකරන විට ළමයින් කිව යුතු දේවල් ඔවුන්ට සිහිපත්කිරීම සඳහා "ඇදහිල්ලෙන් මම යදිමි" ගීතය ගායනාකරන්න, නැතහොත් දෙවන පදයේ වචන කියන්න (*ළමා ගී පොත*, පි. 14).

   "ආදර ස්වර්ගික පියාණෙනි" කියා මම පටන්ගනිමි;
   මම තුති පුදමු එතුමාට එතුමා එවූ ආසිරි වලට;
   ඉන්පසු යටහත්ව අසමි මා එතුමාගෙන් මට ඇවසි දේ ගැන,
   යේසුස් ක්‍රිස්තුන්ගේ නාමයෙනි, ආමෙන්.
   (© 1978 by Janice Kapp Perry. Used by Permission.)

4. ක්‍රේයොන් හෝ පැන්සල් ළමයින්ට ලබාදී, ඔවුන් යාච්ඤාකරමින් සිටින ඔවුන්ගේම පින්තූර ඇඳීමට කියන්න. ඔවුන්ට ඇඳීමට හැකි දේවල් නම්, පවුල් යාච්ඤාව, උදය හෝ සවස පෞද්ගලික යාච්ඤාව, කෑම ගන්නා අවස්ථාවේ යාච්ඤාව හෝ ඔවුන් යාච්ඤාකරන වෙනත් ස්ථානයක් හෝ වේලාවක්ය.

# මම ගෞරවයෙන් යුතුව යාච්ඤාකරමි



11
වෙනි
පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අන්අයට කීමට මට පුළුවන

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන ඉගෙනගැනීමට අන් අයට උපකාරකිරීමට එක් එක් ළමයා ප්‍රබෝධමත් කිරීමය.

**සූදානම්වීම**

1. ඇල්මා 17–19, 23 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.
2. "මම සිතමි දූත මෙහෙයකට ඔවුහු මා කැඳවති" ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්වන්න (*ළමා ගී පොත*, පි. 169).
3. අවශ්‍ය උපකරණ:
   අ. මෝර්මන්ගේ පොතක්
   ආ. හදේතෝ සටහන (1වෙනි පාඩම බලන්න).
   ඇ. පින්තූරය 2-17, මොසායාගේ පුතුන් හතරදෙනා යාච්ඤාවට දණගසති; පින්තූරය 2-18, ඇමොන් ලැමෝනි රජතුමාට උගන්වයි.
4. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිමත්කලා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

සමාලෝචනය

ළමුන්ගේ ගෞරවනීයබව ගැන සහ යාච්ඤාවේදී කියන වචන ගැන අදහස් දක්වන්න. කලින් පාඩම ගැන ක්ෂණික සමාලෝචනයක් දී යාච්ඤාවේ ඇති වැදගත්කම ගැන අවධාරනය කරන්න.

**ධර්මදූතයෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අන් අයට කියති**

අවධානශීලී ක්‍රියාකාරකම

"මම සිතමි දූතමෙහෙකට ඔවුහු මා කැඳවති" ළමුන් සමග ගායනාකරන්න, නැතහොත් වචන කියන්න.

මම සිතමි දූතමෙහෙයකට ඔවුහු මා කැඳවති
වැඩෙන විට මා අඩියක් දෙකක් පමණ.
මම සිතමි එවිට මා සූදානම් කියා
ඉගැන්වීම දේශනාව වැඩකිරීම දම්දූතයො සේ.

සිතමි මම හැකියයි මට බෙදාගන්ට සුභආරංචි
සමග ඔවුන් සැබෑව දැනගන්නට ඇවැසි.
ඇවැසියි මට වෙන්නට දම්දූතයෙක්
සේවය උදව්ව සමිඳුට කරමින් පසුවන විට මා තරුණවියේ.

- ඔබ හඳුනන යම් ධර්මදූතයන් සිටින්නේද?

ළමයින් දන්නා හඳුනන දූතමෙහෙයන්හි සේවයකරන පවුල් සාමාජිකයන් හෝ ඔබගේ ප්‍රදේශයේ ධර්මදූතයන් වැනි, ධර්මදූතයන් ගැන කථාකිරීමට ඔවුන්ට ඉඩ සලසන්න.

• ධර්මදූතයන් කරන්නේ මොනවාද?

මෙම පාඩමෙන් ළමුන්ට ඔවුන්ගේ තරුණකාලයේදීම ධර්මදූතයන් වියහැකි මාර්ග ගැන ඉගෙනගැනීමට හැකි බව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි සාකච්ඡාව

මෝර්මන්ගේ පොත ළමයින්ට පෙන්වා, ඇල්මා 17:6–12 දැක්වෙන මොසායාගේ පුතුන්ගේ කථාව කියන්න. මොසායාගේ පුතුන්ගෙන් එක්කෙනෙකුට රජෙක්වීමට හැකියාව තිබුනද, ඒ වෙනුවට ඔවුන්ට ධර්මදූතයන්වීමට වුවමනාවූ බව පහදාදෙන්න. ඔවුන්ට අවශ්‍යව තිබුනේ, මේ වනවිට ඉතා දුෂ්ඨබවට පත්ව සිටි ලැමනයිට්වරුන්ට ඉගැන්වීමටය. මොසායාගේ පුත්‍රයන්ට අවශ්‍යවූයේ, හැම පුද්ගලයෙකුටම සුභාරංචිය ඇසීමේ අවස්ථාවක් ලබාදීමය. ලැමනයිට්වරුන් එපමණටම දුෂ්ඨවූ නිසා, මොසායාගේ පුතුන් ඔවුන්ට ඉගැන්වීමට යාම භයානක දෙයක්ව තිබූ බව පහදාදෙන්න.

• ඔබ සිතන අන්දමට ලැමනයිට්වරුන්ට ඉගැන්වීමට යාමට පෙර, මොසායාගේ පුතුන් ඒ සඳහා තමන්ව සූදානම්කරගත්තේ කෙසේද?

පින්තූරය 2-17, මොසායාගේ පුතුන් දණගසාගෙන යාච්ඤාකිරීම පෙන්වන්න.

මොසායාගේ පුතුන් යාච්ඤාකර, ඔවුන්ට යහපත් ධර්මදූතයන්වීමට උපකාරකරන ලෙස ස්වර්ගික පියාණන්වහන්සේගෙන් ඉල්ලාසිටි බව පහදාදෙන්න. තමන්වහන්සේ ඔවුන්ව රැකබලාගන්නා බවත්, බොහෝ ජනයාට ඉගැන්වීමට ඔවුන්ට හැකියාව ලැබෙන බවත් ස්වර්ගික පියාණන්වහන්සේ ඔවුන්ට කීසේක (බලන්න ඇල්මා 17:10–11). ඇල්මා 17:12 ශබ්දනගා කියවන්න. යාච්ඤාකිරීම නිසා ලැමනයිට්වරුන්ට ඉගැන්වීමට යාමට මොසායාගේ පුතුන්ට ධෛර්‍යයක් ලැබුන බව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි කථාන්තරය

මොසායාගේ පුතුන් සියල්ලෝම ඉගැන්වීම සඳහා විවිධ පළාත්වලට ගියබව පහදාදෙන්න. පින්තූරය 2-18, ඇමොන් ලැමෝනි රජතුමාට ඉගැන්වීම පෙන්වා, ඇල්මා 17:17–25 දැක්වෙන කථාව කියන්න. මොසායාගේ එක් පුත්‍රයෙක්වන ඇමොන්, සිය කැමැත්තෙන්ම ලැමනයිට් වරුන්ගේ රජතුමා වන, ලැමෝනි රජතුමාගේ සේවකයෙකුබවට පත්වූබව පහදාදෙන්න. රජතුමාගේ බැටළුවන් බලාගැනීමට ඇමොන්ව පත්කරන ලදී. ලැමෝනි රජතුමාට සිටි හොඳම සේවකයා ඇමෝන් විය. ඇමොන් එපමණටම යහපත් ආදර්ශයක් තැබූ බැවින්, ලැමෝනි රජතුමා සහ ඔහුගේ ජනතාවට සුභාරංචිය ඉගෙනගැනීමට අවශ්‍යවිය.

ඇමොන් සහ ඔහුගේ සොහොයුරන්ගේ වැඩකටයුතු නිසා, ලැමනයිට්වරුන් දහස් ගණනක් සභාවට බැඳුන බව පහදාදෙන්න (බලන්න ඇල්මා 23:5).

සාකච්ඡාව

• ලැමනයිට්වරුන්ට සුභාරංචිය ඉගැන්වීම සඳහා ඇමොන් සහ ඔහුගේ සොහොයුරන් තම ජීවිත අවදානමකට ලක්කළේ මන්ද? (සුභාරංචිය මගින් තම ජීවිතවලට සතුට ලබාදුන් බැවින්, එය අන් අය හා බෙදාගැනීමට ඔවුන්ට අවශ්‍ය විය.)

• ලැමනයිට්වරුන්ට සුභාරංචිය ඉගැන්වීමට හැකියාව ලබාගැනීම සඳහා ඇමොන් කළේ කුමක්ද? (උපකාර සඳහා ඔහු යාච්ඤා කළේය; ඔහු යහපත් ආදර්ශයක්ද තැබීය.)

## අපට ධර්මදූතයන් වීමට හැකිය

අපට ධර්මදූතයන් වීමට හැකි එක් ක්‍රමයක් නම්, අන් අයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කියාදීම බව පහදාදෙන්න. සැමකෙනෙක්ම යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන දැනගැනීම වැදගත්වේ.

කථාන්තරය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන ඉගෙනගැනීමට අන් අයට උපකාරකල ළමයෙක් පිළිබඳ කථාවක් කියන්න. පහත සඳහන් කථාව යොදාගැනීමට ඔබට පුළුවන:

ස්ටේක් සම්මන්ත්‍රනවලට සවන්දීම සමහර අවස්ථාවලදී තැඩ්ට අසීරුතාවයක් වූයේ, එම බොහෝ කථාවන් වැඩිහිටි අය සඳහා බව ඔහුට පෙනීගිය නිසාය. නමුත් ස්ටේක් සභාපතිතුමා කථාකරමින්,

"ළමයිනි, ඔබලාටත් ධර්මදූතයන් වියහැකිය" යි ප්‍රකාශකල විට, ඊට සවන්දුන් තැඩ්, තමාටද ධර්මදූතයෙක්වී යේසුස්වහන්සේ ගැන අන්අයට කියාදීමට හැකි මාර්ග ගැන කල්පනාකළේය.

පසුදින උදෑසන කෑම වේලාවේදී, සභාව ගැන ඉගෙනගැනීමට තම අසල්වැසි මර්ෆි මහත්මියට ආරාධනාකිරීම ගැන ඔහුගේ දෙමාපියන් සමග සාකච්ඡා කළේය. එය හොඳ අදහසක් බව තැඩ්ගේ දෙමාපියන් අදහස්කල බැවින්, මර්ෆි මහත්මියගේ නිවසට ගිය තැඩ්, ඇය, යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන ඉගෙනගැනීමට කැමතිදැයි ඇගෙන් ඇසුවේය. මර්ෆි මහත්මිය සිය කැමැත්ත ප්‍රකාශකල බැවින්, ඉක්මණින්ම ඇය ධර්මදූතයන්ගෙන් ඉගෙන ගැනීමට පටන්ගත්තාය.

- යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන ඉගෙනගැනීමට මර්ෆි මහත්මිය කැමතිදැයි තැඩ් ඇයගෙන් විමසුවේ නැතිනම් සිදුවිය හැකිව තිබුනේ කුමක්ද?

තැඩ්ගේ මව සහ පියාද තැඩ්ගේ ආදර්ශය අනුගමනයකිරීමට පටන්ගත්හ. ඔවුහු තම මිතුරන් සහ ඔවුන්ට හමුවූ අන් අය සමග සභාව ගැන කථාකළහ. සමහර අයට සභාව ගැන දැනගැනීමට අවශ්‍යනොවූනද, සමහර අය කැමතිවූහ. සමහරෙක් බව්තීස්මවූහ. මර්ෆි මහත්මිය බව්තීස්මවූ විට, ඇයට ගැලවුම්කරුවාණන් ගැන වැඩිදුර ඉගෙනගැනීමට උපකාරකිරීම වෙනුවෙන් ඇය තැඩ්ට ස්තුතිකළාය.

**සාකච්ඡාව**

තැඩ්ව උදාහරණයක් ලෙස යොදාගෙන, ළමයින්ටද ධර්මදූතයන්බවට පත්වී, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන අන් අයට කියාදීමට හැකි බව පෙන්වා දෙන්න.

- යේසුස්වහන්සේ ගැන ඔබට කීමට හැක්කේ කුමන අයටද?

යේසුස්වහන්සේ ගැන කියාදීමට හැකි පුද්ගලයන් ගැන සිතාබැලීමට ළමයින්ට උදව්කරන්න. මිතුරන්, අසල්වැසියන් සහ සභාවේ සාමාජිකයන් නොවන හෝ සභාවට සහභාගි නොවන ඔවුන්ගේ ඥාතීන් වැනි අයටය.

යහපත් ආදර්ශයක්වීමෙන්, අන් අයට කරුණාවන්තවීමෙන් සහ සිතාබැලීමෙන්, සුභාරංචිය අනුව ජීවත්වීමෙන්ද අප එකිනෙකාට ධර්මදූතයෙක් වීමට හැකි බව පහදාදෙන්න. ඇමොන් හොඳ ධර්මදූතයෙකුවූ එක් ක්‍රමයක් වූයේ යහපත් ආදර්ශයක් තැබීම බව ළමයින්ට සිහිපත් කරන්න.

**කථාන්තරය**

හොඳ ධර්මදූතයන්වූ ළමයින් පිළිබඳ පහත සඳහන් කථාව ඔබගේම වචනවලින් කියන්න:

එක් දිනක් ධර්මදූතයන් දෙදෙනෙක් නිවසක දොරට තට්ටු කළහ. ජේම්ස් මහත්මිය නම් කාන්තාවක් දොර විවෘත කළාය. ඇය ඇමතූ ධර්මදූතයෝ තමන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවෙන් බව කීහ. ධර්මදූතයන්ව නිවස තුලට ආරාධනාකල ජේම්ස් මහත්මිය, සභාව ගැන වැඩිදුර දැනගැනීමට තමා කැමතිබව ඔවුන්ට කීවාය. මෙමගින් ධර්ම දූතයෝ බොහෝ සතුටට පත්වූහ.

ධර්මදූතයන් ඇමතූ ජේම්ස් මහත්මිය, සභාවට අයත් පවුලක් පදංචිව සිටි නිවසට යාබද නිවසේ තමා ජීවත්ව සිටි බව කීවාය. එම පවුලේ ළමයින් ඉතා ආචාරසම්පන්න සහ *කරුණාවන්ත අය බව ඇය කීවාය. ඔවුන් සෑමකෙනක් සමගම සාධාරණ ලෙස ක්‍රියාකල අතර, අන් අයගේ දේපලවලටද ගෞරවයෙන් සැලකූහ. ප්‍රියජනක අසල්වැසියන් වීමට එම ළමයින්ට ඉගැන්වූ සභාව ගැන ඉගෙනගැනීමට තමා කැමතිබව ජේම්ස් මහත්මිය කීවාය.

- ජේම්ස් මහත්මියගේ නිවසට යාබද නිවසේ ජීවත්වූ ළමයින් ධර්මදූතයන්වූයේ කෙසේද?
- ඔබගේ අසල්වැසියන්ට සහ මිතුරන්ට යහපත් ආදර්ශයක්වීමට ඔබට හැකිවන්නේ කෙසේද?

**රංගන ක්‍රියාකාරකම**

ළමයින් රඟපෑමේ අවස්ථාවන් කිහිපයක් රඟපෑමට යන බවත්, එමගින් ඔවුන්ට කරුණාවන්ත සහ කල්පනාසහිත ධර්මදූතයන් වීමට හැකිවන බවත් පහදාදෙන්න.

ළමයින්ට යම් අවස්ථාවකට සවන්දීමට සලස්වන්න. ඉන්පසුව එම අවස්ථාව රඟදැක්වීමේදී කලයුතු දේවල් කිරීමට ළමයින් තෝරාගන්න. අඩුම වශයෙන් එක් අවස්ථාවකට හෝ සහභාගිවීමට හැම ළමයෙකුටම අවස්ථාවක් ලබාදෙන්න. පහත සඳහන් අවස්ථාවන් හෝ ඔබගේම යමක් නිර්මානයකරගන්න:

*1වෙනි අවස්ථාව (ළමුන් තිදෙනෙකු අවශ්‍යවේ )*

*ඔබලා දෙදෙනෙක් වීථියක ගමන් කරති. කුඩා ළමයෙක් විශාල ගසකට නැගීමට යනබව ඔබ දකියි. එම ළමයා මෙය කිරීම භයානක දෙයක් බව ඔබ දනී.*

- ඔබ කරන්නේ කුමක්ද?

*2වෙනි අවස්ථාව (ළමුන් දෙදෙනෙක් අවශ්‍යවේ )*

*සිල්ලර බඩුතොගයක් රැගෙන යන අසල්වැසියෙක් ඔබ දකී. එක් බඩුමල්ලක් කැඩීගොස්, දොඩම් පොළොව පුරාම විසිරී යයි.*

- ඔබ කරන්නේ කුමක්ද?

*3වෙනි අවස්ථාව (ළමුන් 3 දෙදෙනෙක් හෝ වැඩි ප්‍රමාණයක් අවශ්‍යවේ )*

*ඔබ ඔබගේ මිතුරන් සමග ක්‍රීඩාකරමින් සිටී. අසලක සිට මේ දැන් පැමිණි ළමයෙකුට ඔබත් සමග ක්‍රීඩාකිරීමට අවශ්‍යවේ.*

- ඔබ කරන්නේ කුමක්ද?

*4වෙනි අවස්ථාව (ළමුන් 4දෙනෙකු හෝ වැඩි ප්‍රමාණයක් අවශ්‍යවේ )*

*අළුත් පවුලක් ඔබගේ අසල්වැසියන්සේ පදිංචියට පැමිණෙයි. ඔවුන් සභාවේ සාමාජිකයන් නොවේ. ලබන සතියේ ප්‍රාථමිකයේ ක්‍රියාකාරීත්වයට පැමිණීමෙන් ළමුන්ට සතුටුවීමට හැකි බව ඔබ සිතයි*

- ඔබ කරන්නේ කුමක්ද?

රඟපෑමේ ක්‍රියාකාරීත්වයෙන් පසුව, යහපත් ධර්මදූතයන්වීම ගැන ළමුන්ට ස්තුතිකරන්න.

**සාරාංශය**

හදේතෝ සටහන

හදේතෝ සටහන පෙන්වන්න, නැතහොත් ඔවුන්ගේ හදේතෝ මුදු දෙස බැලීමට ළමුන්ට කියන්න. ධර්මදූතයන්වීම මගින් ඔවුන් හරි දේ තෝරාගෙන, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනයකරන බව ළමයින්ට කියන්න. සටහනේ වචන ළමුන් ලවා නැවත කියවන්න. (නැතහොත් ඔවුන්ගේ මුදුවල ඇති මුල් අකුරුවල අදහස කියන්න.)

සාක්ෂිය

යහපත් ධර්මදූතයන්වීමට වුවමනාවීම ගැන ළමුන්ට ප්‍රශංසාකරන්න. සෑම පුද්ගලයෙකුටම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන ඉගැන්වීමේ ඇති වැදගත්කම ගැන ඔබගේ සාක්ෂිය දරන්න. යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන දැනගැනීමෙන් අපට සතුට ගෙනදෙන්නේය.

ළමයින්ට ඔහුට හෝ ඇයට ධර්මදූතයෙකුවීමට හැකි එක් මාර්ගයක් ගැන ලබන සතිය තුලදී සිතාබැලීමට එක් එක් ළමයාට සහායවන්න. මෙම අදහස් පටලවාගෙන පුළුල් ලෙස සිතා බැලීමට වුවමනා නැත. මිත්‍රශීලීවීමෙන් සහ අන් අයට උපකාරකිරීමෙන් මෙන්ම සභාව ගැන දැනගැනීමට මිනිසුන්ට ආරාධනාකිරීම මගින්ද ඔවුන්ට ධර්මදූතයන් වීමට හැකි බව ළමයින්ට සිහිපත්කරන්න.

ධර්මදූතයන්වීමට හැකි මාර්ග ගැන තම පවුල්වල අය සමග කතාකිරීමට ළමුන් දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ඔබගේ ප්‍රාථමිකයේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව, ඔබගේ ප්‍රදේශයේ සේවයකරන ධර්මදූතයන්ට හෝ සේවයේ යෙදුන ධර්මදූතයෙකුට ආරාධනාකර, පංතියේ අවසාන මිනිත්තු කිහිපය තුල පංතියට සහභාගිවී ධර්මදූතයන්වීම සඳහා ළමයින් දැනට කල යුතු දේවල් මොනවාදැයි ඔවුන් සමග කථාකිරීමට කියන්න.

2. ධර්මදූතයන් ඔබට උපකාරකල අවස්ථාවක් හෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ සභාව ගැන යම්කිසිවෙකුට ඉගෙනගැනීමට උපකාරකිරීමට ඔබට හැකිවූ අවස්ථාවක් ගැන හෝ ළමයින්ට කියන්න. එම අත්දැකීම තුලින් ඔබට ඇතිවූ හැඟීම් ගැන ඔවුන්ට කියන්න.

3. තමන් ධර්මදූතයන්සේ සිතා තමාගේම චිත්‍රයක් ඇඳීමට ළමයින්ට කියන්න. හැම චිත්‍රයකටම පහත දැක්වෙන පරිදි ලේබලයක් අලවන්න:

(ළමයාගේ නම)
ධර්මදූත
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල
ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

4. "මට ඇවසියි වීමට දම්දූතයෙක් දැන්" (*ළමා ගී පොත*, පි. 168), "දේවල් මා කරනා" (*ළමා ගී පොත*, පි. 170), හෝ "සැබෑව එතුමාගේ අපි ගෙනෙමු ලොවට" (*ළමා ගී පොත*, පි. 172) ගායනාකරන්න. නැතහොත් පළමු පදයේ වචන කියන්න.

මට අවැසියි වීමට දම්දූතයෙක් දැන්

මට ඇවැසියි වීමට දම්දූතයෙක් දැන්.
මට නැත ඕනෑ සිටිනට වැඩෙන තුරා මා.
මට ඇවැසියි ගැන්මට බෙදා සුභාරංචි වියේදී මා තරුණ,
මන්ද ඇත මට සාක්ෂියක් මාගේම.

දේවල් මා කරනා

යාමට රට රටවල මා වැඩිය පොඩී
කියැමුට හා දෙසුමට වචනය දේව,
හැක මට පෙන්වීමට දන්නා බව මා එහි සැබෑව,
සරළව ඉතා, දේවලින් මා කරනා.

සැබෑව එතුමාගේ අපි ගෙනෙමු ලොවට

අපි ඇත්තෙමු ඉපදී, මෙන් නිෆායි පැරණී,
මාපියන්ට හොඳ සමිඳුට කරනා පෙම්.
අපට ඇත උගන්වා, අපි තේරුම්ගමු,
අපි වෙමු කලයුතු ස්වාමීන් අණ කලසේ.

*ගීත කාණ්ඩය:*
අපි හමුදාවකි මෙන් හෙලාමන්.
වියේදී තරුණ අපේ, ඇත අපට උගන්වා.
වෙමු අපි එසේම සමිඳුගෙ දම් දූතයන්,
ගෙනුමට ලොවට සැබෑව එතුමාගේ
(© 1983 by Janice Kapp Perry. Used by Permission.)

# බෞතීස්මවීම සඳහා සූදානම්වීමට මට පුළුවන

12
වෙනි
පාඩම

**අරමුණ** එක් එක් ළමයාගේ බෞතීස්මවීමට ඇති කැමැත්ත වර්ධනයකිරීම සහ බෞතීස්මයට සූදානම්වන අන්දම ගැන ළමුන්ට අවබෝධයක් ලබාදීමය.

**සූදානම්වීම**

1. මතෙව් 3:13–17 සහ දහම සහ ගිවිසුම 20:72–74 යාච්ඤාවෙන් යුතුව අධ්‍යායනයකරන්න. යොහාන් 1:25–34 සහ *සුභාරංචි මූලධර්ම* (31110), 20වෙනි පරිච්ඡේදයද බලන්න.
2. හැකි නම්, ආරම්භක හෝ අවසාන අභ්‍යාසයේදී "බෞතීස්මය" නම් ගීතය ළමුන් ලවා ගායනාකරවීමට ප්‍රාථමිකයේ සංගීත ප්‍රධානියාට කියන්න (*ළමා ගී පොත*, පි. 100).
3. යොහාන් බව්තීස්තය යේසුස්වහන්ස්ව බෞතීස්ම කිරීම, පින්තූරය 2-19, ආවරණය කිරීමට තරම් විශාල ගොරෝසු කඩදාසියක් ලබාගන්න. එම කඩදාසිය ඔබගේ පංතියේ සිටින ළමුන්ගේ සංඛ්‍යාව තරම් හැකි පමණ කුඩාවට කපන්න. පින්තූරය නොපෙනෙන ලෙස කොළ කැලි ටික පින්තූරය මත දමන්න.
4. ගොරෝසු කඩදාසියක් ගෙන විශාල පා සටහන් හයක් සකස්කරගන්න.
5. පාඩම අවසානයේ ඇති චිත්‍ර පිටුවේ පිටපතක් හෝ පිටපත්කිරීමක් හෝ සකස්කරගන්න.
6. ඔබගේ බෞතීස්මය සම්බන්ධ කරුණු වන, ඔබව බෞතීස්ම කල තැනැත්තා, ඔබව බෞතීස්ම කල ස්ථානය වැනි තොරතුරු කිහිපයක් සහ බෞතීස්මවීම පිළිබඳ ඔබගේ හැඟීම් ගැන කෙටියෙන් කථාකිරීමට සූදානම්වන්න.
7. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්
   ආ. ටේප් හෝ වෙනත් මැලියම් ද්‍රව්‍යයක්
   ඇ. පින්තූරය 2-19, යොහාන් බව්තීස්තය යේසුස්වහන්සේව බෞතීස්ම කරයි (සුභාරංචි කලා පින්තූර කට්ටලය 208; 62133; පින්තූරය 2-20, පිරිමි ළමයෙකු බෞතීස්මවෙයි (62018).
8. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍යවන සූදානම්වීම් කරන්න.

*වැඩිමහල් ළමයින්ට උගන්වන ගුරුවරුන්ගේ දැනගැනීම සඳහාය:* සාරවත් ක්‍රියාකාරකම් 5, 6 සහ 7 සැලසුම්කර තිබෙන්නේ, විශේෂයෙන්ම ළඟදීම බව්තීස්ම වන වැඩිමහල් ළමුන් සඳහාය.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බෞතීස්මවූසේක

අවධානශීලී ක්‍රියාකාරකම

යොහාන් බව්තීස්තය යේසසුස්වහන්සේව බව්තීස්මකිරීමේ ආවරනයකර තිබෙන පින්තූරය පෙන්වන්න. කඩදාසිය යට තිබෙන පින්තූරයේ සිටින්නේ වැදගත් දෙදෙනෙකු බව ළමුන්ට කියන්න. ඒ දෙදෙනා කව්රුන්දැයි අනුමානකිරීමට උත්සාහකරන ලෙස ළමුන්ට කියන්න. නමුත් සම්පූර්ණ පින්තූරය දකින

තුරු, කිසිවක් ශබ්දනගා නොකීමට ඔවුන්ට කියන්න. වරකට එක බැගින්, එක් එක් ළමයා ලවා ආවරනයකර තිබෙන පින්තූරය මත තිබෙන කොළ කෑලි ඉවත්කරන්න.

සියලුම කොළ කෑලි ඉවත්කල පසුව, මෙසේ අසන්න:

- මෙම පින්තූරයේ සිටින අය කව්ද?
- ඒ අය කරන්නේ මොනවාද?

ශුද්ධ ලියවිලි කථාව

මතෙව් 3:13–17 සඳහන්වන පරිදි, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බව්තීස්මය පිළිබඳ කථාව කියන්න. යේසුස්වහන්සේව බෞතීස්මකරන ලෙස ඉල්ලූවිට, යොහාන් බව්තීස්ත පුදුමයට පත්වූ බව පැහැදිළිකරන්න. යේසුස්වහන්සේ පව්කර නොමැතිබව යොහාන් දැනසිටි නිසා, යේසුස් වහන්සේ බව්තීස්මවීම අවශ්‍යයයි ඔහු සිතුවේ නැත. නමුත් යොහාන් ඇමතූ යේසුස් වහන්සේ, බව්තීස්මවීම ස්වර්ගික පියාණන්වහන්සේගෙන් ලැබුන පණතක් නිසා, ස්වර්ගික පියාණන්ගේ සියලුම පණත්වලට කීකරුවීමට තමන්වහන්සේට අවශ්‍යබව කීසේක.

පින්තූරයේ තිබෙන ගංගාව පෙන්වා, යොහාන්, යේසුස්වහන්සේව බව්තීස්ම කළේ ජොර්දාන් ගංගාවේ බවත්, යොහාන් යේසුස්වහන්සේව දියෙහි ගිල්වා බව්තීස්මකල බවත් පහදාදෙන්න. *දියෙහි ගිල්වීම* යනු, සම්පූර්ණයෙන්ම ජලයෙන් වැසීමය.

මතෙව් 3:17 ශබ්දනගා කියවා, ඒවා ස්වර්ගික පියාණන්වහන්සේගේ වචන බව පහදාදෙන්න. අපි බෞතීස්මවන විටද, ස්වර්ගික පියාණන්වහන්සේ සතුටුවන බව ළමයින්ට කියන්න.

ක්‍රීඩාව

"අවසාන වචන" නම් ක්‍රීඩාව ළමුන් සමග කරන්න. යටින් ඉරි ඇඳි පද අත්හැර, පහත සඳහන් ප්‍රකාශ කියවන්න. අදාළ වචන පිරවීමට ළමයෙකුට කියන්න.

ළමයෙකුට පිළිතුර අමතක නම්, නිවැරදි පිළිතුර ලැබෙන තුරු අනෙක් ළමයා වෙතට යන්න. (පිළිතුරු දීමට නොහැකි ළමයාව අසීරුවට පත් නොකරන්න)හැම ළමයෙක්ම නිවැරදිව ප්‍රශ්නයකට පිළිතුර දෙන තුරු, නොනවත්වාම කරන්න. අවශ්‍ය පරිදි ළමයින්ට උදව් කරන්න. අවශ්‍යතාවය පරිදි ප්‍රශ්නය දෙවරක් අසන්න.

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේව යොහාන් බව්තීස්තය විසින් බෞතීස්මකරන ලදී.
2. යේසුස්වහන්සේව යෝර්දාන් ගංගාවේ බෞතීස්මකරන ලදී.
3. යේසුස්වහන්සේ බව්තීස්මවූයේ ස්වර්ගික පියාණන්වහන්සේගේ පණත්වලට (ඉගැන්වීම්වලට) කීකරුවීම සඳහාය.
4. යේසුස්වහන්සේව බෞතීස්මකිරීමේදී, උන්වහන්සේව සම්පූර්ණයෙන්ම ජලයෙන් වසන ලදී.
5. යේසුස්වහන්සේ බව්තීස්මවීමෙන් පසු, උන්වහන්සේට සහ යොහාන්ට ස්වර්ගික පියාණන් වහන්සේගේ හඬශබ්දය ඇසිනි.
6. අපි අටවෙනි වියට එළඹුන විට, අපටද යේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනයකරමින් බෞතීස්මවීමට හැකිය.

### බෞතීස්මවීම මගින් අපටද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනයකළ හැකිය

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

ළමයින් අටවන වියට එළඹුන විට, ඔවුන්ට බෞතීස්මවීමට හැකි බව කියන්න. ඔවුන් අටවන වියට එළඹුන විට බෞතීස්මවීමට හැකිවීම සඳහා ඔවුන් දැන් සිටම සූදානම්ව ඇත.

අප බෞතීස්මවන විට, අපි ස්වර්ගික පියාණන් සමග ගිවිසුමකට (පොරොන්දුවකට) එළඹෙන්නෙමු. උන්වහන්සේගේ පණත්වලට කීකරුවීමටත්, අන්අයට සමාවදීමට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව

අනුගමනයකිරීමටත් අපි පොරොන්දු වෙන්නෙමු. ඒ වෙනුවට, උන්වහන්සේ අපව සභාවට පිළිගෙන, අපට මගපෙන්වීමට සහ උපකාරකිරීමට පොරොන්දුවනසේක.

ඔබගේ බෞතීස්මය පිළිබඳව පංතියට කියන්න. ඔබ බෞතීස්මවූයේ කොහේද, (තටාකයක හෝ ගංගා-වකද යන වග), ඔබව බෞතීස්ම කලේ කවුද, ඔබ බව්තීස්මවීම බැලීමට එහි සිටියේ කවුද, යනාදිය සඳහන්කිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. ඔබ ළමාවියේදී බෞතීස්ම වූයේ නම්, එම වයසේදී ඔබගේ පින්තූරයක් ළමයින්ට පෙන්වන්න. බෞතීස්මවීම ගැන ඔබට ඇතිවූ සතුට හෝ සභාවේ සාමාජික-යෙකුවීම ගැන ආශාව වැනි හැඟීම්, ඔවුන් සමග බෙදාගන්න.

යම් දිනකදී ඔවුන්ටද, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ඔබ මෙන් බෞතීස්මවීමට හැකිවන බව ළමයින්ට කියන්න.

කථාන්තරය

ළමයෙකු බෞතීස්මවීම පිලිබඳ කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාව කීමට ඔබට වුවමනාවිය හැකිය:

මාකෝස්ගේ පවුලේ අය සභාවට බැඳුනේ ඔහු සත්වැනි වියේ පසුවනවිටදීය. මාකෝ හැර පවුලේ අන් සියල්ලෝම බෞතීස්ම වූහ. ඔහුට තවමත් වයස සම්පූර්ණවී නොතිබිනි. තම පවුලේ අය සමග බෞතීස්-මවීමට නොලැබීම ගැන මාකෝස් දැඩි කලකිරීමට පත්වූවද, ඔහුගේ මව ඔහු අමතා, ඉක්මණින්ම ඔහුද බෞතීස්මවීමේ වයසට පත්වන බවත්, ඒ සඳහා ඔහු බලාසිටින කාලය ඊට සූදානම්වීම සඳහා යෙදවිය යුතුබවත් ඔහුට කීවාය.

- බෞතීස්මවීම සඳහා මාකෝට සූදානම්විය හැක්කේ කෙසේද?

ඊළඟ වසර තුලදී මාකෝ හරි දේ තෝරාගෙන, යේසුස්වහන්සේ ඔහුගෙන් අපේක්ෂාකරන දේවල් කිරීමට දැඩිලෙස උත්සාහ කළේය. අවසානයේදී මාකෝස් අටවෙනි වියට පත්විය. ඔහු සම්පූර්ණ-යෙන්ම සුදු ඇඳුමෙන් සැරසුන අතර, ඔහුගේ පියා ඔහුව බෞතීස්ම කළේය. මාකෝස්ගේ පියා ඔහුව ජලයෙන් පිටතට ගත්විට, මාකෝස් බොහෝ ප්‍රීතියට පත්වූයේ, ඔහුටද යේසුස්වහන්සේ මෙන් ගිල්වීමේ බෞතීස්මය ලැබීමට හැකිවූ නිසාය. යේසුස්වහන්සේගේ සභාවේ සාමාජිකයෙකු වීමට ලැබීම ගැනද ඔහු සතුටුවූවේය.

## බෞතීස්මය සඳහා අපට දැන්සිටම සූදානම්වීමට හැකිය

පියසටහන් ක්‍රියාකාරකම

පින්තූරය 2-20, පිරිමි ළමයෙකු බෞතීස්මවීම පෙන්වා, හැකිනම්, එම පින්තූරය පංතිකාමරයේ දොරේ අලවන්න.

- මෙම ළමයා යේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනයකරන්නේ කෙසේද?

මේ මොහොතේ සිටම ළමයින්ට බෞතීස්මය සඳහා සූදානම්වීමට හැකි බව ඔවුන්ට සිහිපත් කරන්න. කඩදාසි පියසටහන් සහ චිත්‍ර හයේ පිටපතක් පාඩම අවසානයේදී පෙන්වන්න. චිත්‍රවලින් නියෝජනය-වන්නේ ඔවුන්ව බෞතීස්මය කරා යොමුකරවන පියවරවල් බව ළමයින්ට කියන්න. පහත සඳහන්ව තිබෙන ප්‍රශ්න අසමින්, ප්‍රදර්ශනයවන හැම පියවරක් ගැනම සාකච්ඡා කරන්න. ඔබ හැම පියවරක් ගැනම සාකච්ඡාකල පසුව, බෞතීස්ම පින්තූරයට මාවතක් නිර්මානය කරමින් ළමයෙකු ලවා පොළොවේ පියසටහනක් තබන්න.

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ස්වර්ගික පියාණන්වහන්සේ තුල විශ්වාසකරන්න.
    - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ස්වර්ගික පියාණන්වහන්සේ ගැන අප ඉගෙනගත යුත්තේ මන්ද?
    - උන්වහන්සේලා ගැන අපට ඉගෙනගත හැක්කේ කොහෙන්ද?
2. ස්වර්ගික පියාණන්වහන්සේට යාච්ඤාකරන්න.
    - බෞතීස්මවීමට සූදානම්වීම සඳහා යාච්ඤාව අපට උපකාරවත්වන්නේ කෙසේද?

3. සමාවදී අන් අයට ප්‍රේමකරන්න.

- අප සමාව දුන්විට කුමක් සිදුවන්නේද?
- අපගේ ප්‍රේමය අපි අන් අයට පෙන්වන්නේ කෙසේද?

4. සෑම දිනකම හරි දේ තෝරන්න.

- අපට හරි දේ තෝරාගැනීමට හැකි මාර්ග මොනවාද?

5. ශුද්ධ ලියවිලි කථා කියවන්න නැතහොත් ඒවාට සවන්දෙන්න.

- ශුද්ධ ලියවිලි කියවීමෙන් ඔබට ලැබුනු උපකාර මොනවාද?

6. 8 හැවිරිදි වියට පත්වන්න.

- ඔබ අට හැවිරිදිවියට පත්වීමට පෙර සිටම බෞතීස්මවීමට සූදානම්වීම සඳහා ඔබට කල හැකි දෙවල් මොනවාද?

පියවර සටහන් සියල්ලම පොළොවේ ඇතිරීමෙන් පසුව, වරකට එක් අයෙක් බැගින්, කාමරය හරහා පියවර සටහන් උඩින් බෞතීස්ම පින්තූරය දක්වා යාමට ළමයින්ට කියන්න. ඔවුන් එක් එක් පියවර සටහන මත පා තබන විට, ඔවුන් බෞතීස්මයට සූදානම්වන අන්දම ගැන කීමට ළමුන්ට උදව්කරන්න.

**සාරාංශය**

අත්පත්‍රිකා

එක් එක් ළමයාට පින්තූර හයේ කට්ටලයේ පිටපතක් බැගින් නිවසට ගෙනයාමට දෙන්න. ඔවුන්ගේ පිටපත්වල ඔවුන්ගේ නම් ලියන්න. නැතහොත් ළමයින්ටම ලියාගැනීමට කියන්න.

සාක්ෂිය

බෞතීස්මයේ තිබෙන වැදගත්කම ගැන ළමයින්ට ඔබගේ සාක්ෂිය දරන්න. අපි බෞතීස්මවූ විට ස්වර්ගික පියාණන්වහන්සේ සතුටුවන බව ළමයින්ට සිහිපත්කරන්න.

බෞතීස්මය ගැන ඔවුන් ඉගෙනගත් දේවල් ඔවුන්ගේ පවුල්වල අයට ඉගැන්වීම සඳහා චිත්‍ර පිටුව පාවිච්චිකිරීමට ළමුන්ට යෝජනාකරන්න. චිත්‍රවලින් ප්‍රදර්ශනය කෙරෙන පියවර හය අනුගමනය කරමින් බෞතීස්මය සඳහා සූදානම්වීමට හැම ළමයෙක්ම දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ළමයින් පංතියෙන් පිටවීමට සූදානම්වනවිට, නැවත වරක් පියවර සටහන් මතින් පංතියෙන් පිටව යාමට ඔවුන්ට සලස්වන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් හොඳින් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, “පංති වේලාව” “ගුරු උපකාර” කොටස බලන්න.

1. එක් එක් ළමයා සඳහා කඩදාසියක පියවර සටහනක් අඳින්න. එක් එක් පියසටහනේ *“මම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරමි”* කියා ලියන්න.
2. ඔබ රැස්වන ගොඩනැගිල්ලේ බෞතීස්ම තටාකයක් තිබේ නම්, එය නැරඹීම සඳහා ළමුන්ව රැගෙනයාමට සැළසුම්කරන්න.
3. “මගේ උපන්දිනය මා ප්‍රියකරමි” ගීතය ගායනාකරන්න. නැතහොත් පළමු පද දෙකේ වචන කියන්න. (*ළමා ගී පොත*, පි. 104). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

4. "බෞතීස්මය" (*ළමා ගී පොත,* පි. 100). නැතහොත්, "යේසුස් ක්‍රිස්තුස් බෞතීස්මවූවිට" (ළමා ගී පොත, පි. 102) යන ගීත ගායනාකරන්න. නැතහොත් වචන කියන්න. "බෞතීස්මය" ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

   යේසුස් ක්‍රිස්තුස් බෞතීස්මවූ විට

   යේසුස් ක්‍රිස්තුස් බෞතීස්මවූවිට
   යෝර්දාන් ගඟ පහළ
   දේව සිරසේ තුන් දෙනෙක්
   සතුටින් එහි සිටියෙ බලා
   පියාණන් දෙව්ලොවෙන් කළේ කතා
   යේසුස් ක්‍රිස්තුස් වූ විට බෞතීස්ම
   ශුද්ධ ආත්මයාණන් බැස්සේ පහළට
   පරවියෙක් ලෙස හිමිහිට

   තවද දැන් මා වූ විට බෞතීස්ම
   එම ආදර්ශය අනුව යමි මා
   ගිලී වෙමි බෞතීස්ම
   උතුම් පූජක බලය තුලින්
   එවිට සාමාජිකයෙක්මි මා
   සුර පියාගේ රාජ්‍යයේ
   එසේම ලබමි උතුම් ආත්මය
   හැම පැයේම පෙන්වීමට මග මට

5. පින්තූරය 2-19, යොහාන් බෞතීස්තය යේසුස්වහන්සේව බෞතීස්මකිරීමට පසුව තිබෙන පින්තූරය 2-20 පෙන්වා, බෞතීස්මවීම ගැන ඔවුන් දන්නා කරුණු ගැන ඔවුන් සමග සමාලෝචනයක යෙදෙන්න. බෞතීස්මවීම බලාපොරොත්තුව සිටීම විශේෂිත අත්දැකීමක් බව තේරුම්ගැනීමට ඔවුන්ට උදව්කරන්න. එය ඔවුන්ට කල හැකි එක් වැදගත්ම දෙයකි. පහත සඳහන් කරුණු සාකච්ඡාකරන්න:

   අ. අපි බෞතීස්මවූ විට, අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සෙගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයන් වන්නෙමු. (තමන් සාමාජිකයන් නොවන නිසා බාල ළමුන් ඒ ගැන සැලකිලිමත් වූවහොත්, අටවැනි වියේ පසුනොවන ළමුන්ව සාමාජිකයන් වශයෙන් සැළකිය හැක්කේ, ඔවුන් අටවැනි වියට පත්වූවිට බව ඔවුන්ට සහතික කරන්න. කෙසේ වෙතත්, සභාවේ නිළ සාමාජිකයන්වීම සඳහා ඔවුන් බෞතීස්මවිය යුතුය.

   ආ. බෞතීස්මවීම සඳහා අපි අඩුම වශයෙන් අටවෙනි වියේ වත් සිටිය යුතුවෙමු.

   ඇ. අපගේ බෞතීස්මය ගැන කථාකිරීමට සභානායකවරයා හෝ ශාඛා සභාපතිවරයා අපව හමුවනු ඇත.

   ඈ. අපි බෞතීස්මවන විට, අපි සුදු ඇඳුමෙන් සැරසෙන්නෙමු (පින්තූරය 2-20 බලන්න).

   ඉ. අපි ජලයෙන් සම්පූර්ණයෙන්ම වැසීගොස්, ගිල්වීමේ බෞතීස්මය ලබන්නෙමු. (ළමයින් ජලය යට සිටින්නේ තත්පරයක් හෝ දෙකක් පමණක් බව සහ ජලය එතරම් ගැඹුරු නැතිබව මෙන්ම ඔවුන්ව බෞතීස්මකරන පුද්ගලයා ඔවුන්ව ආරක්ෂාසහිතව අල්ලාගෙන සිටින බවත් ළමයින් තේරුම්ගන්නා බවට වගබලාගන්න.)


   ඊ. අපව බෞතීස්මකරන පුද්ගලයා, පූජකවරයෙක් හෝ මෙල්කිසෙදෙක් පූජකවරය දරන අයෙක් විය යුතුය.

   උ. අපව බෞතීස්ම කරනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බෞතීස්මකල ආකාරයටමය. උන්වහන්සේ අප වෙනුවෙන් ආදර්ශයක් තැබූසේක.


6. ඔබගේ ප්‍රාථමිකයේ සභාපතිවරයාගේ අවසරය ඇතුව, පූජකවරය දරන්නෙකුට ආරාධනාකර ළමයින් බෞතීස්මකරන විට සිදුවන දේ පිළිබඳව ඔවුන් සමග කථාකිරීමට කියන්න. බෞතීස්ම කිරීමේදී එම ළමයා සහ එය ඉටුකරන පුද්ගලයා සිටගෙන සිටින ආකාරය සහ ඔවුන් ළමුන්ගේ අත් අල්ලාගන්නා අන්දමද පැහැදිළිකිරීමට ඔහුට කියන්න. බෞතීස්මය ඉටුකරන පුද්ගලයා ළමයාව සීරුවෙන් ජලය යටට දමා නැවතත් ඉක්මණින්ම ජලය මතුපිටට ගන්නා බව පැහැදිළි කිරීමට ඔහුට කියන්න. ළමයින් මේ අන්දමින් බෞතීස්මවන විට ඔවුන් යේසුස්වහන්සේ මෙන් බෞතීස්මවන බව ළමයින්ට සිහිපත්කරන්න.


   ඔබගේ සභානායකවරයා හෝ ශාඛා සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව බෞතීස්මයක් ඉටුකරන ආකාරය පංතිකාමරය තුළදීම ප්‍රදර්ශනයකර පෙන්වීමට පූජකවරය උසුලන්නාට කියන්න. (ප්‍රදර්ශන කාලය තුල පූජකවරය ලසුලන්නා විසින් බෞතීස්ම යාච්ඤාව නොකිවයුතුය.)

7. සෑම අවස්ථාවකදීම එකම ආකාරයකටම නොවෙනස්ව කියන යාච්ඤා අතරින් බෞතීස්ම යාච්-ඤාවද එකක්බව පහදාදෙන්න. මෙම යාච්ඤාවේ වචන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එළිදරව්කර ඇතිසේක. දහම සහ ගිවිසුමේ 20:73 දැක්වෙන යාච්ඤාව (බලය පවරන ලදුව යනුවෙන් පටන්-ගෙන)ශබ්දනගා කියවන්න.









හ
දේ
තෝ


මෝර්මන්ගේ පොත
ශුද්ධ බයිබලය



13
වෙනි
පාඩම

# මට උපකාරකිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාවට පුළුවන

**අරමුණ**

ළමුන් බෞතීස්මවූවාට පසුව ඔවුන්ට උපකාරකිරීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව ඔවුන්ට ලැබෙන බව තේරුම්ගැනීමට ඔවුන්ට උපකාරවත්වීමය.

**සූදානම්වීම**

1. යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න, දහම සහ ගිවිසුම 49:13–14, 130:22, සහ ඇදහිල්ලේ කරුණ 1:1; 4. මොරෝනායි 10:5; දහම සහ ගිවිසුම 9:8–9; 85:6 සහ සුභාරංචි මූලධර්ම (31110), 21වෙනි පරිච්ඡේදයද බලන්න.
2. ගොරෝසු කඩදාසියකින් පහත සඳහන් "මල් ප්‍රශ්න" සකස්කරන්න:




අඟල් හතරේ සිට හය දක්වා දිග කෝටුවල මල් අමුනාගෙන ඒවා පෝච්චියක හෝ බඳුනක දමන්න.

3. "මම දනිමි මගේ පියා ජීවමානයි" ගීතය ගායනාකරන්න. නැතහොත් වචන කියන්න (*ළමා ගී පොත,* පි. 5). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.
4. අවශ්‍ය උපකරණ:
   අ. දහම සහ ගිවිසුමේ පිටපතක්
   ආ. පින්තූරය 2-19, යොහාන් බව්තීස්තය යේසුස්වහන්සේව බෞතීස්මකිරීම (සුභාරංචි කලා පින්තූර කට්ටලය 208; 62133).
5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමයින් දිරිගැන්වූවා නම්, ළමුන් සමග එය සොයාබලන්න.

### ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව ලබාගැනීමට අපට පුළුවන

අවධානශීලි ක්‍රියාකාරකම

පින්තූරය 2-19, යොහාන් බෞතීස්තය යේසුස්වහන්සේව බෞතීස්මකිරීම පෙන්වන්න. හැම ළමයෙකුටම ප්‍රශ්න මලක් තෝරාගැනීමට කියා පසුගිය සතියේ පාඩම සමාලෝචනය කරන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බෞතීස්මය ගැන ප්‍රශ්නයක් මලකින් පටන්ගන්නා වචනයකින් අසන්න. මල තෝරාගත්

ළමයාට ප්‍රශ්නයට පිළිතුරුදිය නොහැකි නම්, පංතියේ අනෙක් ළමුන්ට උපකාරකිරීමට ඉඩ සලසන්න (පිළිතුර නොදන්නා ළමයාව අපහසුතාවයට පත් නොකිරීමට ප්‍රවේශම්වන්න).

ඇසිය හැකි ප්‍රශ්න:

- *යේසුස් ක්‍රිස්තුස්වහන්සේව බෞතීස්ම කළේ කවිද?* (යොහාන් බව්තීස්තය.)
- *යේසුස්වහන්සේව බෞතීස්ම කළේ කොහේද?* (යෝර්දාන් හංගාවේය.)
- *ගිල්වීම යනු කුමක්ද?* (සම්පූර්ණයෙන්ම ජලයෙන් වැසීම.)
- *යේසුස්වහන්සේව බෞතීස්ම කළේ මන්ද?* (ස්වර්ගික පියාණන්වහන්සේට කීකරුවීමට සහ අප වෙනුවෙන් ආදර්ශයක් තැබීමටය.)
- *අපට බෞතීස්මවිය හැක්කේ කවදාද?* (අප අටවැනි වියට පත්වූවිටය.)

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

පින්තූරය 2-19 සිටින දෙදෙනා කව්දැයි ළමුන්ගෙන් අසන්න.

- යේසුස්වහන්සේව බව්තීස්ම කිරීමෙන් පසුව, යේසුස්වහන්සේ සහ යොහාන්ට ඇසුන හඬ ශබ්දය කාගේද?

යේසුස්වහන්සේ බව්තීසමවීම ස්වර්ගික පියාණන්වහන්සේ බලාසිටි බවත්, යේසුස්වහන්සේ බව්තීස්මවූවිට උන්වහන්සේ සතුටුවූ බවත් ළමයින්ට සිහිපත් කරන්න. යේසුස්වහන්සේ බව්තීස්මවන අවස්ථාවේ තවත් විශේෂ තැනැත්වහන්සේ කෙනෙක් එහි සිටිබව ළමයින්ට කියන්න. මෙම තැනැත්වහන්සේ ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස්වහන්සේට උපකාරකරන සේක. උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ හෝ ශුද්ධ ආත්මය වශයෙන් හැඳින්වේ.

ඇදහිල්ලේ කරුණ

ළමයින්ට සිටගැනීමට සලස්වා ඇදහිල්ලේ පළමුවැනි කරුණ ඔබත් සමග නැවත කීමට කියන්න

ශුද්ධ ලියවිල්ල

අපට ප්‍රේමකරමින් අපට උපකාරකිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේට අවශ්‍යවන නිසා උන්වහන්සේ ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හා සමාන බව පැහැදිළි කරන්න. නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේට ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේට මෙන් මාංශ සහ කටු සහිත ශරීරයක් නැත. දහම සහ ගිවිසුමේ 130:22 *ආත්මික තැනැත්වහන්සේ* දක්වා ශබ්දනගා කියවන්න. අපට ශුද්ධාත්මයාණන් දැකීමට නොහැකි නමුත්, අපට හරි දේ කිරීමට උදව්කිරීමට උන්වහන්සේට හැකි බව පැහැදිළිකරන්න. අපි හරි දේ තෝරාගන්නාවිට උන්වහන්සේ අපට ප්‍රීතිමත්, සතුටු හැඟීමක් දෙනසේක.

ශුද්ධ ලියවිල්ල

ළමුන් බෞතීස්මවීමෙන් පසුව, මෙල්කිසෙදෙක් පූජකවරය උසුලන මිනිසුන් විසින් ඔවුන්ට ශ්‍රේෂ්ඨ ආශිර්වාද දෙකක් ලබාදෙන බව ඔවුන්ට කියන්න. දහම සහ ගිවිසුම 49:14 ශබ්දනගා කියවා, මෙම ශුද්ධ ලියවිල්ලෙන් එම එක් ආශිර්වාදයක් ගැන අපට කියන බව ළමුන්ට කියන්න. *මෙය කරන කවරෙක් වුවද* යනු, බෞතීස්මවන කවර පුද්ගලයෙක් වුවද යන අදහස බව, පැහැදිළිකරන්න.

ඇදහිල්ලේ කරුණ

හතරවන ඇදහිල්ලේ කරුණෙන් කොටසක් කටපාඩම්කිරීමට ළමුන්ට උදව්කරන්න: "ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව…[කෙරෙහි] අපි විශ්වාසකරමු." ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව බව්තීස්මයෙන් පසුව අපට ලැබෙන එක් ශ්‍රේෂ්ඨ ආශිර්වාදයක් බව ළමුන්ට කියන්න.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

අපට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව තිබෙන විට, සත්‍යය කුමක්ද, නිවැරදි දෙය කුමක්ද කියා දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උපකාරකරන බව පැහැදිළිකරන්න. අප බෞතීස්මවී ස්ථිරකිරීමට පෙර පවා, අපට උදව්කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට හැකි වුවද, මෙම දීමනාව අපට ලැබුන පසුව, ශුද්ධාත්මයාණන්වහන්සේව අපගේ නිරන්තර සහකරුවෙක් වශයෙන් ලබාගැනීමට අපට පුළුවන. මෙහි අදහස වන්නේ, නිවැරදි දෙය කිරීමට අප උත්සාහ දරන තාක් කල්, උන්වහන්සේගේ පෙළඹවීම නිතරම අප සමගම වන බවය.

## අපට සභාවේ ස්ථිරවූ සාමාජිකයන් විය හැකිය

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

බෞතීස්මයෙන් පසුව අප ලබන අනෙක් ආශිර්වාදය නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ස්ථිරකිරීම බව පහදා දෙන්න. මෙය ස්ථිරකිරීම වශයෙන් හැඳින්වේ. ළමුන් ලවා *ස්ථිරකිරීම* යන වචනය කිහිපවරක් කියවන්න.

පින්තූර කථාව

පාඩම අවසානයේ දැක්වෙන "රොබෙටාගේ" ස්ථිරකිරීම පිළිබඳ කථාව කියන්න. ළමුන්ට ඔබ වටා එකතුවීමට කියන්න. එවිට ඔබ කථාව කියන විට ඔවුන්ට පින්තූර බැලීමට පුළුවන.

සාකච්ඡාව

ඔබ කථාව කියා නිමවූ විට, පහත සඳහන් ප්‍රශ්න අසන්න:

- රොබෙටාට දුන්නේ කුමක්ද? (ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවය.)
- ඇයට එය දීම සඳහා යාච්ඤාව කීවේ කවුද? (ඇයගේ පියාය.)
- රොබෙටාගේ පියාට තිබෙන අධිකාරීබලය කුමක්ද? (මෙල්කිසෙදෙක් පූජකවරය.)
- ඔබ සිතන අන්දමට රොබෙටාගේ උණුසුම් හැඟීමට හේතුව කුමක්ද? (ශුද්ධාත්මයාණන් වහන්සෙගේ බලපෑමය.)

එම කථාව නැවත කීමට ළමුන්ට කියන්න. එක් එක් පින්තූරය ගැන කීමට විවිධ ළමයින්ට ආරාධනා-කරන්න.

## සත්‍යය කුමක්දැයි දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උපකාරකරනසේක

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

සභාව සත්‍යබව දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උදව්කරන බව පහදාදෙන්න. සමහර අවස්ථාවල අප සතුටින් සහ කෘතඥපූර්වක වන බැවින්, අපගේ හැඟීම් ගැන අන් අයට කීමට පවා අපට අවශ්‍යවේ. උපවාස සහ සාක්ෂි රැස්වීම්වලදී අප අපගේ සාක්ෂිය දරන විට, මෙය නිතරම සිදුවන්නේය.

- උපවාස සහ සාක්ෂි රැස්වීමකදී ඔබ කවදා හෝ ඔබගේ සාක්ෂිය දරා තිබේද?

ළමුන් කිසිවෙක් ඔවුන්ගේ සාක්ෂි දරා තිබේනම්, ඔවුන්ට ඇතිවූ හැඟීම් ගැන පැවසීමට ඔවුන්ට කියන්න.

සමහර අය ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවූ විට, ඔවුන්ට මඳක් හැඬුම් එන බව කියන්න. මේවා දුක් කඳුළු නොවේ. ඒවා සතුටු කඳුළුය. සමහර අවස්ථාවලදී සාක්ෂි රැස්වීම්වලදී, ඔවුන් යාච්ඤාකරන විටදී, ශුද්ධ ලියවිලි කියවන විටදී හෝ සභාවේ සවන්දෙමින් සිටිනවිටදී ඔවුන්ටඋණුසුම්, සමාදාන හැඟීම් ඇතිවිය හැකි බව ළමුන්ට කියන්න. මෙම සමාදාන හැඟීම නම්, මෙම දේවල සත්‍යය සහ නිවැරදි බව ගැන ඔවුන්ට දන්වන ශුද්ධාත්මයාණන්ගේ කෙඳිරීම් හඬය

ගීතය

"මා පියාණන් ජීවමාන බව මම දනිමි" ගීතය ළමුන් සමග ගායනාකරන්න. නැතහොත් වචන කියන්න.

මෙම ගීතයෙන් කියවෙන "ආත්මය" නම්, ශුද්ධාත්මයාණන් බව පැහැදිළි කරන්න. ස්වර්ගික පියාණන්-වහන්සේ ජීවමාන බව සහ උන්වහන්සේ අපට ප්‍රේමකරන බව දැනගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අපට උදව්කරනසේක.

## අපට මගපෙන්වීමට සහ අනතුරු ඇඟවීමට ශුද්ධාත්මයාණන් වහන්සේට පුළුවන

කථාන්තරය සහ සාකච්ඡාව

සාරා ජේන් ජෙනී කැනන්ගේ කථාව ඔබගේම වචනයෙන් කියන්න. ශුද්ධාත්මයාණන්වහන්සේ ඇයට කොඳුරා කීවේ කුමක්දැයි ළමුන්ගෙන් අසන්න.

සාරා ජේන් වනාහි, බොහෝ කලකට පෙර අළුත් වාසස්ථානයක් සොයාගැනීමට අමෙරිකාවේ වනාන්-තරය හරහා ගමන්කල පුරෝගාමී ගැහැණු ළමයෙකි. ඇය යූටා නගරයට ළඟාවීමෙන් පසුව, තම

නැන්දනිය සමග ජීවත්වූයේ ගෘහ භාණ්ඩවලින් තොර නිවසකය. කැන්වස් රෙද්දක් බිත්ති මත වහළක් ලෙස ඇද, එය රැඳවීමට විශාල ගල් දෙකක් බිත්ති කොන් දෙකේ තබා තිබින.

සාරා ජේන් එක් දිනක් නිවසේ ඇඳුම් මසමින් සිටියදී "ඉක්මණින්ම පැත්තකට යන්න" යන හඬශබ්ද-යක් අයට ඇසිනි. අවට වෙනත් කිසිවෙක් නොසිටි නමුත්, සාරා ජේන් කාමරයේ අනෙක් පැත්තට පිටව ගියාය. ඇය පිටව ගිය විගසම, වහළය දරා සිටි එක් ගලක් කාමරය තුලට වැටුනි. සාරා ජේන් පිටව ගොස් නොතිබුනේ නම්, එම ගල ඇයගේ ඇඟ මතට වැටීමට ඉඩ තිබින (බලන්න "ඉක්මණින්ම පැත්තකට යන්න, " *පසු-දවස්වල ශුද්ධවන්ත කාන්තාවන්ගේ ජීවිතවල අපූර්ව සිදුවීම්,* සකස්. ලියොන්-ආර්. හාස්හෝන්, 2වන කාණ්ඩය. [සෝල්ට් ලේක් නගරය: ඩෙසරට් පොත් සමාගම. 1973–75], 2:34.)

- සාරා ජේන්ට කථා කළේ කවුද?
- ශුද්ධාත්මයාණන්වහන්සේ ඇයට කුමක් කීසේක්ද?
- සාරා ජේන් කුමක් කළේද?
- සාරා ජේන් ඉවත්ව නොගියේ නම්, කුමක් සිදුවීමට තිබුනේද?

ශුද්ධාත්මයාණන්වහන්සේ අපට ඇසෙන හඬකින් නිතරම කථානොකරන බව ළමුන්ට සිහිපත්කරන්න. බොහෝ අවස්ථාවලදී අප කුමක් කල යුතුද කියා උන්වහන්සේ අපට හැඟීම් ලබා දෙනසේක.

**සාරාංශය**

සමාලෝචන ක්‍රියාකාරකම

ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ළමුන් දන්නා දේවල් කියන ලෙස ඔවුන්ට කියන්න. සමාලෝචනයක් ලෙස මල් ප්‍රශ්න නැවත ඇසීමට ඔබට අවශ්‍යවිය හැකිය. මෙවැනි ප්‍රශ්නද ඔබට ඇසිය හැකිය:

- ඔබ බෞතීස්මවීමෙන් පසුව ඔබට ලැබිය හැකි වටිනා දීමනාව කුමක්ද? (ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව.)
- ශුද්ධාත්මයාණන්වහන්සේ යනු *කවරෙක්ද?* (යේසුස්වහන්සේට සහ ස්වර්ගික පියාණන්ට උපකාරවන්වන තැනැත්වහන්සේ කෙනෙකි; ආත්මයකි; අපට සහනය සහ උපකාරකරන යම්කෙනෙකි.)
- ශුද්ධාත්ම දීමනාව අපට ලැබෙන්නේ *කිනම් අවස්ථාවේද?* (අප බෞතීස්මවීමෙන් පසුව; අප සභාවේ සාමාජිකයන් ලෙස ස්ථිරකිරීමෙන් පසුව.)
- ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීම් අපට දැනෙන්නේ *කොහේද?* (අපගේ හදවත් සහ සිත්වලට; "නිවසේදී," "සභාවේදී, " හෝ "අප හරි දේ තෝරාගන්නා ඕනෑම ස්ථානයකදී" යන පිළිතුරුද පිළිගත හැකිය.
- අප සමග සිටීමට ශුද්ධාත්මයාණන්වහන්සේව ස්වර්ගික පියාණන්වහන්සේ එවන ලද්දේ *මන්ද?* (අපට උපකාරකිරීමට සහ සහනය ලබාදීමට; අපට මගපෙන්වීමට සහ අපට අනතුරු ඇඟවීම; සත්‍යය කුමක්දැයි අපට කීමට; ප්‍රේමයේ සහ සමාදානයේ හැඟීම් අපට ලබාදීමට.)

සාක්ෂිය

ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව සහ උන්වහන්සේ අපට උපකාරකරමින්, මගපෙන්වන අන්දම ගැන ඔබගේ හැඟීම් ළමුන් සමග බෙදාගන්න. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට සාක්ෂි දැරීමක් ගැන හෝ ඔබට උපකාරකල අත්දැකීමක් ගැන කථාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

හරි දේ තෝරාගැනීමට ළමුන්ව දිරිගන්වන්න. එවිට ශුද්ධාත්මයාණන්වහන්සේව නිතරම ඔවුන් සමග තබාගැනීමට ඔවුන්ට පුළුවන.

අවසාන යාච්ඥාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ඔබට ත්‍යාගයක් වශයෙන් ලැබුන යමක් රැගෙන එන්න. නමුත් එය තවදුරටත් පාවිච්චිකිරීමට නොහැකි කැඩීගිය, ගෙවීගිය හෝ සම්පූර්ණයෙන්ම පාවිච්චිකල, බිඳුන පිඟානක්, පැරණි ඇඳුමක් හෝ හිස් අහාර පෙට්ටියක් වැනි යමක් වියයුතුය.

   තවදුරටත් පාවිච්චිකල නොහැකි ත්‍යාගය ළමුන්ට පෙන්වන්න. එම ත්‍යාගය පිළිබඳ රසවත් තොරතුරු වන, ඔබට එය දුන්නේ කවුද, කවදාද හෝ එය ඔබට දුන්නේ මන්ද යනාදිය ඔවුන්ට කියන්න. එම ත්‍යාගය කලකදී ඔබට වැදගත් යමක්වූවද, දැන් එය කැඩීගිය, ගෙවීගිය හෝ හිස්ව ඇති නිසා තවදුරටත් ප්‍රයෝජනවත් නොවන බව තේරුම් ගැනීමට ළමුන්ට උදව්කරන්න.

   ඔබ බෞතීස්මවී ස්ථිරවූ විට, ඔබට වෙනස් අන්දමේ ත්‍යාගයක් ලැබෙන බව පැහැදිළි කරන්න. මෙය බොහෝ වටිනා ත්‍යාගයකි. එය ගෙවීනොයන හෝ හිස් නොවන යම්දෙයකි. මෙම මිළ කල නොහැකි ත්‍යාගය පාවිච්චිකරන විට, වටිනාකම වැඩිවන්නේය.

   - මෙම ත්‍යාගය කුමක්ද?

   මෙම ත්‍යාගය කුමක්දැයි ළමයින් අනුමානකල විට (හෝ ඔබ ඔවුන්ට කියා තිබේ නම්) මෙම ත්‍යාගය ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව බව, ඔවුන් තම ජීවිතකාලය පුරාම බොහෝ ත්‍යාග ලබන නමුත්, ශුද්ධාත්මයානන්ගේ දීමනාව ඔවුන් මෙම පොළොව මත සිටින විටදී ලබන ඉතාමත්ම වටිනා ත්‍යාගය බව ඔවුන්ට කියන්න.

2. "කුඩා නිසල හඬ" ගීතය ගායනාකරන්න. නැතහොත් වචන කියන්න (*ළමා ගී පොත*, පි. 106).

   කුඩා නිසල හඬක් තුලින්, අත්මය කථාකරයි මට
   මට පෙන්වා මග, මට පෙනෙනා නපුරෙන් ගැලවීමට මා.
   කළොත් උත්සහ මා හරි දේ කිරීමට, අඳුර තුලින් ගෙනයයි එතුමා මාව,
   පෙන්වා මග, රැකගෙන මා, එතුමන් එළිය මට දෙන්න.

   ගීතයේ අවසාන කොටස ඔබ ගායනාකරන විට හෝ වචන කියන විට, පහත දැක්වෙන ක්‍රියාවන් කරන්න:

   සවන්දෙන්න, සවන්දෙන්න (මිට මෙලවූ අත කණ ළඟට තබන්න).
   ශුද්ධාත්මය කොඳුරනසේක (දබරැඟිල්ල තොල් මත තබන්න).
   සවන්දෙන්න සවන්දෙන්න (මිට මෙලවූ අත කණ ළඟට තබන්න
   කුඩා නිසල හඬට (අත් හදවත මතට).

3. නිශ්චලතාවයේ කුඩා හඬ මගින් ළමුන්ට මග පෙන්විය හැකිවීම පෙන්වීම සඳහා ළමුන් සමග පහත සඳහන් නිශ්චල ක්‍රීඩාව කරන්න:

   මෙම ක්‍රීඩාව සඳහා ඔබ සැඟවීමට යන යම් කුඩා භාණ්ඩයක් ළමුන්ට පෙන්වන්න. ඔබ භාණ්ඩය සඟවන අතරතුරදී එක් ළමයෙකුට මොහොතකට කාණ්ඩායමෙන් පිටවීමට කියන්න. එම ළමයා නැවත පැමිණිවිට, ඔහුට හෝ ඇයට එම භාණ්ඩය සොයාගැනීම සඳහා ප්‍රවේශමෙන් යුතුව සවන්දිය යුතු බව කියන්න. සඟවා තිබෙන භාණ්ඩය සොයාගැනීමට කුමන පැත්තකට හැරිය යුතුදැයි ළමයාට පෙන්වාදීම සඳහා පැන්සලයක් සෙමින් තට්ටුකිරීම, මෘදු ලෙස අත්පුඩි ගැසීම හෝ ගීතයක් මිමිනීම වැනි කුඩා හඬක් නගන්න. ළමයා නිවැරදි දිශාව දෙස බලන විට මෘදු ලෙස යමකට තට්ටුකරන්න. සැඟවූ ස්ථානයට ළමයා ලඟාවී, සඟවා තිබෙන භාණ්ඩය සොයාගන්නා තුරු, වඩාත් ඉක්මණින් තට්ටුකරන්න. (නැතහොත් ශබ්දනගා මුමුනන්න.) භාණ්ඩය සොයාගැනීමට වෙනත් ළමයෙකුට අවස්ථාවක් දෙමින්, කැමත්ත පරිදි ක්‍රියාකාරකම වැඩි වාරගණනක් දිගටම කරන්න.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිශ්චලතාවයේ කුඩා හඬට සවන්දීම මගින් ළමයින්ට ඔවුන්ගේ ජීවිතවලට මග පෙන්වීම ලබාගත හැකි බව ඔවුන්ට පහදාදෙන්න. ශුද්ධාත්මයාණන්වහන්සේ නිතරම ශබ්දනගා කථානොකරන බව ළමුන්ට මතක්කර දෙන්න. සමහර අවස්ථාවලදී අපි යම් හරි දෙයක් කරන විට උන්වහන්සේ අපට උණුසුම් හැඟීමක් දෙන අතර, යම් වැරදි දෙයක් අප කරන විට (හෝ කිරීමට ප්‍රයත්න දරනවිට) නරක හැඟීමක් වැනි දෙනසේක. අප කල යුතු දෙය කුමක්දැයි ශුද්ධාත්ම-යාණන්වහන්සේ අපට කියන විට, අපි ප්‍රවේශමෙන් ඊට අවධානය යොමුකල යුතු වෙමු.

4. විවිධ පාටැති ක්‍රේයොන්වලින් කඩදාසි කැල්ලක එක් එක් ළමයාගේ අත් පිටපත් කිරීමට ඔවුන්ට උපකාරකරන්න. එම අත් එක පිට එක තබා ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගැනීමට අත් තැබීම නියෝජනය කරන්න. එක් එක් පින්තූරයට ළමයාගේ නම යොදා ලේබලයක් අලවන්න.

"ශුද්ධ ආත්මයාණන්" (*ළමා ගී පොත*, පි. 105), ගීතය හෝ "මා කැමතියි උපන්දිනට මගේ" (*ළමා ගී පොත*, පි. 104) ගීතයේ තුන්වන පදය ගායනාකරන්න. නැතහොත් වචන කියන්න. මෙම ගීතවල වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

# රොබෙටාගේ ස්ථිරකිරීම




මෙය රොබෙටාට විශේෂිත දිනයකි. ඇය බෞතීස්මවූයේ මේ දැන්ය. දැන් ඇයව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ ස්ථිරකරනු ලැබ,ඇයට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව දෙනු ලැබේ. (රොබෙටාව ඇයගේ පියා විසින් බෞතීස්මකර, ස්ථිරකර තිබුනද, මෙල්කිසෙදෙක් පූජකවරය සුදුසුලෙස උසුලන ඕනෑම කෙනෙකකුට මෙම නියෝග ඉටුකිරීමට හැකි බව ළමයින්ට කීමට ඔබට අවශ්‍යවිය හැකිය.)



රොබෙටා සිය පියාගේ උපකාරයෙන් ජලයෙන් පිටතට පැමිණීමට පසුව, ඇයගේ මව වියලි ඇඳුම් අතැතිව ඇය හමුවීමට බලා සිටියි. ඇයගේ තෙමුනු හිසකෙස් විගසින්ම පිළිවෙළට පීරනු ලැබ, ඇය සිනහසෙමින් ප්‍රීතියෙන් සිටී!




රොබෙටා සූදානම්වීමෙන් පසුව, තමා එන තුරු බලාසිටින ඇයගේ පවුලේ අය සහ මිතුරන් වෙතට ඇය නැවත යන්නීය. ඇය සිය පියා සමග කාමරයේ ඉදිරිපස පුටුවකට යන්නීය.



සභානායකවරයා (ශාඛා සභාපතිවරයා) විසින් රොබෙටා විසින් තෝරනලද මිනිසුන්ට පැමිණ වලල්ලේ සිටගැනීමට කියයි.රොබෙටා කැඳවන ලද්දේ ඇයගේ පියා,සීයා,ඇයගේ මාමා සහ ඇයගේ නිවාස ගුරුවරුන්වය.මෙම සියලුම මිනිසුන් මෙල්කිසෙදෙක් පූජකවරය උසුලන අය වෙති.



රොබෙටා සිය හිස නමා ඇස් පියා ගනියි. මෙම මිනිසුන් ඔවුන්ගේ අත් ඇයගේ හිස මත තබා සිටියදී, ඇයගේ පියා ඇයගේ නමින් ඇය අමතා, ඇයව සභාවේ සාමාජිකාවක් ලෙස ස්ථිරකර, ඇයට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව ලබාදෙයි.



ස්ථිර කිරීමෙන් පසුව, රොබෙටා වළල්ලේ සිටින අයට අතට අත දෙන අතර ඔවුහු ඇයට සුභ-පතති. සිය අභ්‍යන්තරයේ උණුසුම් හැඟීමක් රොබෙටාට ඇතිවෙන අතර, තමා හරි දේ තෝරාගෙන තිබෙන බව ඇය දැනගනියි.

# 14
වෙනි
පාඩම


# හරි දේ තෝරාගැනීමට නිර්භීතවන්න

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පරීක්ෂාකිරීමට සාතන් උත්සාහ කළද, උන්වහන්සේ හරි දේ තෝරාගත් ලෙස ළමයින්ටද එසේ කළ හැකි බව තේරුම්ගැනීමට ඔවුන්ට උපකාර කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 4:1–11 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.
2. සුදුසු කඩදාසියකින් හෝ පෙන්වාදී තිබෙන එවැනි කඩදාසි වර්ගයකින් සරළ ඔටුන්නක් සාදන්න:



3. "හරි දේ තෝරන්න" ක්‍රීඩා පුවරුව (පාඩම අවසානයේ පෙන්වාදී ඇති පරිදි) ගොරෝසු කඩදාසියකට හෝ කාඩ්බෝඩ් එකකට පිටපත්කර ගන්න.
4. ක්‍රීඩාව සඳහා වන ප්‍රශ්න (පිටු 71–72) වෙනම කොළයක ලියා, ඒවා කුඩා බෑගයක හෝ වෙනත් භාජනයක දමන්න.
5. "හරි දේ කර නොබා" ගායනාකිරීමට හෝ පළමු පදයේ වචන කීමට සූදානම්වන්න. (*ළමා ගී පොත*, පි. 158). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.
6. කැමැත්ත පරිදි: වැඩිමහල් පිතිගර්ගේ ලිපිය පිටපත්කර එය ලිපි කවරයක දමන්න.
7. අවශ්‍ය උපකරණ:
   - අ. බයිබලයක්.
   - ආ. ගල් කිහිපයක්.
   - ඇ. "හරි දේ තෝරන්න" ක්‍රීඩාව නැවත කිරීමේදී සළකුණු කිරීමට පාවිච්චිකිරීම සඳහා බොත්තම් දෙකක් හෝ විවිධ හැඩයෙන් යුත් හෝ පාටින් යුත් වෙනත් කුඩා භාණ්ඩ දෙකක්.
   - ඈ. හදේතෝ සටහන (බලන්න 1වෙනි පාඩම ).
   - ඉ. පින්තූරය 2:21, වැඩිහිටි රෙක්ස් ඩී. පිතිගර්; පුරාණයේ පාවිච්චිකල දේව මාළිගාව පින්තූරය 2-22, (සුභාරංචි කලා පින්තූර කට්ටලය 118; 62300).
8. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනා කල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

### අප වෙනුවෙන් තෝරාගැනීම් කිරීමට අපට පුළුවන

අවධානශීලී ක්‍රියාකාරකම

"හරි දේ තෝරාගන්න" නම් ක්‍රීඩා පුවරුව පෙන්වා පාඩමට සාවධානව කන්දී සිටීමට ළමුන්ට කියන්න. එවිට ක්‍රීඩාවට ඇතුළත් ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුන්ට හැකිවනු ඇත.

සාකච්ඡාව

- කවදා හෝ යමක් කිරීමට කිසිවෙක් ඔබට අභියෝග කර තිබේද?

• යමෙක් ළමුන්ට යම්කිසිවක් කිරීමට අභියෝග කල අවස්ථාවන් ගැන කීමට ඔවුන්ට කියන්න.

ලිපිය

සභාවේ ප්‍රධාන අධිකාරියේ සාමාජිකයෙක් වන වැඩිමහල් රෙක්ස් ඩී. පිනිගර් විසින් ළමුන්ට එවා තිබෙන ලිපියක් ඔබ අත තිබෙන බව ඔවුන්ට කියන්න. ඔහු සත්වන වියේ පසුවන විට, අභියෝගයක් සමගින් ඔහු ලැබූ අත්දැකීමක් ගැන ඔහු කියන බව පහදාදෙන්න. පින්තූරය 2-21, වැඩිමහල් පිනි-ගර්ගේ පින්තූරය පෙන්වා, ලිපිය කියවන්න. නැතහොත් ඒ ගැන කියන්න. (ඔබ ලිපියේ පිටපතක් සකස්කර එය ලිපිකාවරය තුල දමා තිබේනම්, දැනමුතුකම් පොතෙන් කියවනු වෙනුවට, එම ලිපියෙන් කියවන්න.)

"මගේ හිතාදර මිතුරනි,

" 'මම ඔබට අභියෝග කරමි!' මෙම වචන පිරිමි ළමයින්ට සහ ගැහැණු ළමයින්ට නිතරම මෙන් ඔවුන්ගේ මිතුරන්ගෙන් ඇසෙන ඒවාය. ඔවුන් ඔබගෙන් බලාපොරොත්තුවන්නේ ඔබ කෙතරම් නිර්භීතද, ශක්තිමත්ද නැතිනම් ධෛර්‍යමත්ද කියා ඔවුන්ට ඔප්පුකර පෙන්වීමය. ඔබගේ දෙමාපියන් හෝ ගුරුවරු විසින් ඔබ නොකල යුතු යයි ඔබට කියා ඇති යම් දෙයක් කිරීමට ඔවුන් ඔබගෙන් ඇසිය හැකිය–එය නොකළ යුතු වැරදි ක්‍රියාවක් වශයෙන් ඔබ සිතන යම්දෙයක්ය. මා දැන සිටින පරිදි, වැරදි යයි අපි සිතන යම් දෙයක් අපි කරන විට, ශක්තිය වෙනුවට අපි දුර්වලබවක් පෙන්නුම් කරන්නෙමු. යම් පුද්ගලයෙක් සැබෑ නිර්භීත බව සහ ශක්තිය පෙන්වනු ලබන්නේ, හරි දේ කිරීමට ඔහුට ධෛර්‍යය ඇතිනම් පමණි.

"මා සත්වන වියේ පමණ පසුවෙද්දී වරක්, මා ඉතා ප්‍රියකල මිතුරෙක් මට සිටියේය. අපි දෙදෙනාම නිවසේ සිට පාසලට ඇවිදගෙන ගියෙමු.... අපි නිර්භීතවීම ගැන කථාකල අතර, එවැනි බොහෝ දේවල් කිරීමටද අපට හැකිවිය.

"සමහර අවස්ථාවලදී අගලක් උඩින් පැනීමට හෝ ගසකට නැගීමට හෝ අපි එකිනෙකාට අභියෝග කළේ, වැඩිමහල් පිරිමි ළමුන් හෝ ගැහැණු ළමුන් කරනු අප දැක ඇති දේවල් අපටත් කිරීමට තරම් අපි නිර්භීත බව ඔප්පුකර පෙන්වීම සඳහාය.

"එක් දිනක් අපි දෙදෙනා මාගේ නිවසට පැමිණිවිට, අපි පාර අයිනේ සිටගෙන පාසලේ සිටින වේග-වත්ම ධාවකයා කවුදැයි කථාකරමින් සිටියෙමු.... අන් මිතුරන්ට වඩා වේගයෙන් දිවීමට මට හැකි බව මා ඉතා තදින් කියා සිටි විට, මා වෙතට හැරුණු ඔහු මෙසේ කීවේය, 'ඔබ එතරම්ම වේගවත් නම්, අර කාරය මෙතනට ඒමට පෙර පාර හරහා දුවන්න යයි මම ඔබට අභියෝග කරමි!'

"පාර දෙස බැලූ මට වැඩි ඈතක නැති කාරය පෙනින. වචනයක් වත් කථානොකර මා වේගවත් සහ නිර්භීත බව ඔප්පුකිරීමට මම පාරට පැන්නෙමි. මොහොතකින් කාරය මහත් හඬ නංවමින් තිරිංග තද කළේය!එහි බම්පරයේ වැදුන මා, සිහිසුන්ව බිමවැටිනි.

"මා දෙනෙත් හරිනවිට, මගේ ශරීරයේ වේදනාවත්, රිදුම්දෙන අහංකාරය සහ මගේ මවගේ කාන්සාවෙන් පිරි මුහුණත් දුටු මට, මා වේගවත් හෝ නිර්භීතවී හෝ නැති බව මට අවබෝධ විය. මා මෝඩ වැඩක් කර තිබින. මා මට මෙන්ම අන් අයටද කණගාටුව ගෙනදී තිබුනි....

"මා ඉගෙනගත් පාඩම...මගේ ජීවිතය මුළුල්ලේම මට මහත් වටිනාකමක් ගෙනදුන්නේය. යම් පුද්ගල-යෙක් බාර ගත යුතු එකම අභියෝගය වන්නේ, හරි දේ කිරීමට නිර්භීතවීමය.

"ස්වර්ගික පියාණන්වහන්සේ හෝ ඔබගේ දෙමාපියන් ඔබ නොකල යුතුයයි සිතන, යම් වැරදි දෙයක් කිරීමට, ඔබ අභියෝගයක් බාරගන්නේ නම්, අවසානයේදී ඔබට හිමිවන්නේ කණගාටුව සහ බලාපො-රොත්තු කඩවීමේ හැඟීම් පමණකි. ඔබ නිර්භීතව හරි දේ කළහොත්, ඔබට ඔබ ගැනම යහපත් හැඟී-මක් ඇතිවේ.

"මිතුරෙක් මෙන් තවෙකෙකුට මා ධෛර්‍යය දෙන්නේ, ඔබගේ දෙමාපියන්ට සහ ස්වාමීන් වහන්සේගේ ඉගැන්වීම්වලට කීකරුවන ලෙසය.... හරි දේ කිරීමට තීර්භය වීමෙන්, ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මිතුරෙක් බවට පත්වන අතර, ඔබ උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ආශිර්වාදද භුක්තිවිඳිනු ඇත.

"ඔබට නිතරම හරි දේ කිරීමට ලැබේවා.

"ආදරයෙන් යුතුව, ඔබගේ මිත්‍ර, රෙක්ස් ඩී. පිනිගර්" ("මිතුරෙකුගෙන් මිතුරෙකුට," *මිතුරා,* ඔක්තෝ. 1974, පිටු. 10–11).

සාකච්ඡාව

- රෙක්ස් පිනිගර් ළමයා කල තේරීම කුමක්ද? (කාරය ඉදිරිපිටට යාම ඔහු තෝරාගත්තේය.)
- ඔහු හරි දේ තෝරාගත්තේද?
- ඔහු කල යුතුව තිබුනේ කුමක්ද?
- ඔබ සිතන ලෙස මෙම අනතුරින් ඔහු ඉගෙනගත්තේ කුමක්ද?
- යමක් කිරීමට යම් අයෙක් ඔබට අභියෝගකල විට, ඔබ එය කල යුතුද?

වැඩිමහල් පිනිගර් ඔවුන්ට කියා තිබෙන්නේ "නිර්භීතව හරි දේ කිරීම" බව ළමයින්ට මතක්කරන්න.

- හරි දේ කිරීමට නිර්භීතවන්න යන්නෙහි අදහස කුමක්ද?

විශේෂයෙන්ම යමෙක් යම් වැරදි දෙයක් කිරීමට අපට අභියෝගකරන විට, හරි දේ කිරීම නිතරම අපහසු බව පහදාදෙන්න. අප ශක්තිමත් සහ නිර්භීත අය බව අපගේ මිතුරන් සිතනවාට අපි කැමති අතර, ඔවුන් අපට විහිළුකරනු දැකීමට අපි කැමති නැත්තෙමු. හරි දේ කිරීමට නිර්භීතවීම යනු, හරි දේ කිරීම අසීරුවුවද, එය කිරීම බව පැහැදිළි කරන්න.

ගීතය

ළමයින්ට නැගීසිටීමට සලස්වා, "හරි දේ කිරීමට නිර්භීතවන්න" ගීතයේ පළමු පදය ගායනා කරන්න. නැතහොත් වචන කියන්න. ළමුන් ගීතය නොදනී නම්, ඔවුන්ට වචන ඉගෙනගැනීම සඳහා එය ගැයීම හෝ වචනකීම කිහිපවරක් කරන්න. ඊළඟ අවස්ථාවේදී යම් අඥාණ ක්‍රියාවක් කිරීමට යමෙක් ඔවුන්ට අභියෝග කල විටදී, මෙම ගීතයේ වචන ගැන සිතීමට ඔවුන්ට පුළුවන් බව ළමුන්ට යෝජනාකරන්න. හරි දේ කිරීමට මෙම ගීතයේ වචන ඔවුන්ට සිහිපත්කරමින්, එය කිරීමට අවශ්‍ය ධෛර්‍යය ලබාගැනීම-ටද එය ඔවුන්ට උපකාරවත්වනු ඇත.

හදේතෝ මුදුව

හදේතෝ මුදු ළමුන් පැළඳ සිටීනම්, ඒවා දෙස බැලීමට ඔවුන්ට කියන්න. හරි දේ කිරීමට ඔවුන්ගේ මුදු ඔවුන්ට සිහිපත්කරන බව පෙන්වා දෙන්න.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

යම් වැරදි දෙයක් කිරීමට පෙළඹීම පරීක්ෂාවක් බව ළමුන්ට කියන්න. *පරීක්ෂාව* යන වචනය ළමුන් ලවා කිහිප වරක් කියවන්න. වැරදි තේරීම් කිරීමට සාතන් මිනිසුන්ව පොළඹවන බව පහදාදෙන්න. ස්වර්ගික පියාණන්ට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවශ්‍යවන්නේ සෑම කෙනෙක්ම හරි තේරීම් කිරීමය. මන්ද, සතුටුවීමේ එකම මාර්ගය වන්නේ හරි දේ කිරීමට නිතරම උත්සාහකිරීමය. අපි සතුටින් සිටිනවාට සාතන් කැමති නැති අතර, වැරදි තේරීම්වලින් අප අසතුටට පත්වන බව ඔහු දන්නේය.

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලවා වැරදි තේරීම් කිරීම සාතන්ට අවශ්‍යවිය

ශුද්ධ ලියවිලි කථාන්තරය

මතෙව් 4:1–11 දැක්වෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේව වනාන්තරයේදී පරීක්ෂාකිරීම පිළිබඳ කථාව කියන්න. යේසුස්වහන්සේ බව්තීස්මවීමෙන් පසුව, හුදකලාවී උපවාසකිරීමට සහ යාච්ඤාකිරීමට උන්වහන්සේට අවශ්‍යවූ බව පහදාදෙන්න. එවිට ස්වර්ගික පියාණන්වහන්සේට සමීපවීමේ හැඟීමක් උන්වහන්සේ තුළ ඇතිවන්නේය. උන්වහන්සේ දහවල් හතළිහක් සහ රාත්‍රී හතළිහක් උපවාස කළසේක. එහි අදහස වන්නේ උන්වහන්සේ දින හතළිහක් කිසිත් නොකා සිටි බවය.

- ඔබ දීර්ඝ කාලයක් කිසිවක් නොකා සිටියහොත් ඔබට කුමන හැඟීමක් ඇතිවන්නේද?
- දින හතළිහක් උපවාස කිරීමෙන් පසුව, යේසුස්වහන්සේට ඇත්වූ හැඟීම් ගැන ඔබ කුමක් සිතන්නේද?

යේසුස්වහන්සේ ආහාර නොගෙන සිටීමෙන් උන්වහන්සේ ඉතා කුසගිනිව දුර්වලව ඇති නිසා, උන්වහන්සේව පරීක්ෂාකිරීමට මෙය හොඳ අවස්ථාවක් බව සාතන් සිතූ බව පහදා දෙන්න. සාතන්ට අවශ්‍යවූයේ යේසුස්වහන්සේ පරීක්ෂාකර, උන්වහන්සේගේ බලය වැරදි ආකාරයෙන් යෙදවීමටය.

ගල්, කඩදාසි ඔටුන්න සහ පින්තූරය 2-22, පැරණිකාලයේ පාවිච්චිකල දේවමාළිගාව යනාදිය පිටතට ගන්න. සාතන් යේසුස්වහන්සේව පරීක්ෂාකිරීම සහ මෙම දේවල් අතර ඇති සම්බන්ධය කුමක්දැයි දැනගැනීමට ප්‍රවේශමෙන් යුතුව සවන්දීමට ළමුන්ට කියන්න.

ගල් ඔසවා අල්ලාගන්න. මතෙව් 4:3 කියවන්න. ගැලවුම්කරුවාණන් ලවා ගල් රොටී බවට පත්කිරීමට සාතන් පළමුවෙන් උත්සාහ දැරූ බව පහදාදෙන්න. තමන්වහන්සේ කුසගින්නෙන් පසුවූවද, තම බලය පාවිච්චිකර මෙවැනි දේවල් කිරීම හරි නැති බව යේසුස්වහන්සේ දැන සිටිසේක. ඒ වෙනුවට සාතන් ඇමතූ උන්වහන්සේ, හරි දේ කිරීම තරම්ම, ආහාර වැදගත් නොවන බව කීසේක (බලන්න මතෙව් 4:4).

පින්තූරය 2-22, පැරණි කාලයේ පාවිච්චි කල දේවමාළිගාව, ඔසවා අල්ලාගන්න. සාතන් ඊළඟට උත්සාහ කළේ, දේවමාළිගාවෙන් බිමට පැන, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව ගැලවුම්කරුවාණන් ලවා ඔප්පුකර පෙන්වීමටය. සාතන් යේසුස්වහන්සේ අමතා, උන්වහන්සේ බිමට පනින්නේ නම්, දේව දූතයන් උන්වහන්සේට තුවාල නොවී ගලවා ගන්නා බැවින්, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව එමගින් ඔප්පුවන බව කීවේය (බලන්න මතෙව් 4:6). සාතන් උන්වහන්සේට කිරීමට කී දෙය යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කලසේක. අඥාන ක්‍රියාවන් කරමින් තමන්ව ආරක්ෂාකිරීමට ස්වර්ගික පියාණන් වහන්සේගෙන් අපේක්ෂාකිරීම, යුතුකමක් නොවන බව උන්වහන්සේ දැන සිටිසේක (බලන්න මතෙව් 4:7).

ඔටුන්න ඔසවා අල්ලාගන්න. සාතන් තවත් එක් පරීක්ෂාවක් උත්සාහ කලබව පහදාදෙන්න. සාතන් යේසුස්වහන්සේ අමතා, උන්වහන්සේ බිම වැටී සාතන්ට නමස්කාර කරන්නේ නම්, ලෝකයේ සියලුම වස්තූන් සහ රාජධානීන් උන්වහන්සේට ලබාදෙන බව කීවේය (බලන්න මතෙව් 4:8–9). යේසුස්වහන්සේ නමස්කාරකල යුත්තේ ස්වර්ගික පියාණන්වහන්සේට පමණක් බව උන්වහන්සේ දැන සිටිසේක. සාතන්ට පිටවී යෑමට උන්වහන්සේ අණ කළසේක.

**ශුද්ධ ලියවිල්ල**

යේසුස්වහන්සේ සාතන්ට ප්‍රකාශකල දෙය දැන ගැනීමට මතෙව් 4:10 ශබ්දනගා කියවන්න.: "සාතන් අහක්ව යව" ළමුන්ට නැගිට සිටීමට සළස්වා, මෙම වචන නැවත කීමට කියන්න.

යේසුස්වහන්සේ නිතරම හරි දේ තෝරාගත්තේ, උන්වහන්සේ හරි දේ ප්‍රියකරමින්, ස්වර්ගික පියාණන්වහන්සේගේ සියලුම පණත්වලට කීකරුවීමට පොරොන්දුවී සිටි නිසා බව පහදා දෙන්න.

## යේසුස්වහන්සේ කළාක් මෙන් අපටද හරි දේ තෝරාගැනීමට පුළුවන

**හදේතෝ සටහන**

හදේතෝ සටහන පෙන්වා ළමුන් ලවා සටහනේ ඇති වචන කියවන්න. නිතරම හරි තේරීම් කිරීමට උත්සාහකිරීම මගින් අපට වඩාත් යේසුස්වහන්සේ මෙන් වීමට පුළුවන් බව ළමුන්ට පහදාදෙන්න. හරි දේ තෝරාගැනීමට අප උත්සාහ කරන්නේ නම්, ස්වර්ගික පියාණන්වහන්සේ අපට උපකාර කරනසේක.

**ක්‍රීඩාව නැවත කිරීම**

"හරි දේ තෝරාගැනීමේ" ක්‍රීඩාව කිරීමට ළමුන්ට උදව්කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිතරම හරි දේ තෝරාගත් අන්දම ගැන සහ ඔවුන්ටද හරි දේ තෝරාගන්නා අන්දම ගැන මතකතබා ගැනීමට මෙම ක්‍රීඩාව උපකාරවත්වන බව ඔවුන්ට කියන්න.

පංතිය කණ්ඩායම් දෙකකට බෙදා, එක් එක් කණ්ඩායමට බොත්තමක් හෝ වෙනත් භාණ්ඩයක් සළකුණක් ලෙස දෙන්න. ක්‍රීඩා පුවරුවේ "යන්න" යන ලේබලය අතර තිබෙන හිස් තැන එක් එක් කණ්ඩායමට අයත් සළකුණ තැබීමට කියන්න. එක් එක් කණ්ඩායමේ ළමුන්ට ඔබ සූදානම් කල ප්‍රශ්න පත්‍රයෙන් වාර අනුව ප්‍රශ්න තෝරාගැනීමට කියන්න (ප්‍රශ්න එක් වරකට වඩා පාවිච්චි කළහැකිය). එක් එක් ප්‍රශ්නය කියවා, කණ්ඩායම් සාමාජිකයන් එක්ව ඊට පිළිතුරු දීමට කියන්න. ඔවුන් නිවැරදිව පිළිතුරු දුන හොත්, ප්‍රශ්නයට පසුව පෙන්වා දී තිබෙන හිස් කොටු ගණනාවක්ම ඔවුන් සළකුණුකරනු ඇත. ඔවුන් ප්‍රශ්නයකට වැරදි ලෙස පිළිතුරු දුන හොත්, ඔවුන් තම සළකුණ කලින් තිබූ කොටුවේම තැබිය යුතුය.

යම් කණ්ඩායමක් හදේතෝ කොටුවට පැමිණි විට, ඔවුහු ඉනිමග දිගේ ඉහළින් ඇති කොටුවට නගිති. ඔවුන් "වැතේ" (වැරදි තේරීම)කොටුවට පැමිණිය හොත් ඔවුහු පහළින් ඇති කොටුවට බසිති.

*ක්‍රීඩාව සඳහා ප්‍රශ්න*

1. තරුණ රෙක්ස් පිතිගර් කාරය ඉදිරියට දිවගියේ මන්ද? (*හිස් කොටු දෙකක් ඉදිරියට යන්න.*)
2. අභියෝගය භාරගැනීමෙන් වැඩිමහල් පිතිගර් සතුටුවූවේද, නැතහොත් ශෝකවූවේද? (*එක් හිස් කොටුවක් ඉදිරියට යන්න.*)
3. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කොපමණ දින ගණනක් වනාන්තරයේ උපවාස කලසේක්ද? (*හිස් කොටු දෙකක් ඉදිරියට යන්න.*)
4. යේසුස්වහන්සේව පරීක්ෂාකිරීමට උත්සාහකළේ කවුද? (*හිස් කොටු තුනක් ඉදිරියට යන්න.*)
5. උපවාසය යනු කුමක්ද? (*හිස් කොටු පහක් ඉදිරියට යන්න.*)
6. කොපමණ විවිධ මාර්ග යොදාගෙන සාතන් යේසුස්වහන්සේව පරීක්ෂාකිරීමට උත්සාහ කළේද? (*හිස් කොටු දෙකක් ඉදිරියට යන්න.*)
7. ගල්වලින් කුමක් කිරීමට සාතන් යේසුස්වහන්සේට කීවේද? (*හිස් කොටු හතරක් ඉදිරියට යන්න.*)
8. දේවමාළිගාව උඩදී සාතන් යේසුස්වහන්සේට කුමක් කිරීමට කීවේද? (*හිස් කොටු තුනක් ඉදිරියට* යන්න.)
9. බිම වැටී තමන්ට නමස්කාර කරන්නේ නම්, සාතන් යේසුස්වහන්සේට පොරොන්දුවූයේ මොනවාද? (හිස් කොටු පහක් ඉදිරියට යන්න.)
10. සාතන් යේසුස්වහන්සේට කිරීමට කියූ දේවල් උන්වහන්සේ කළසේක්ද?
11. යමෙක් කිසියම් වැරදි දෙයක් හෝ අඥාන දෙයක් කිරීමට අපට අභියෝගකරන විට, ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බලාපොරොත්තුවන්නේ අප කුමක් කිරීමද? (*හිස් කොටු පහක් ඉදිරියට යන්න.*)
12. අපට තෝරාගැනීමක් කිරීමට තිබෙන විට අපි කුමක් කළයුතු වෙමුද? (*හිස් කොටු හයක් ඉදිරියට යන්න.*)
13. පරීක්ෂාව යනු කුමක්ද? (*හිස් කොටු හයක් ඉදිරියට යන්න.*)
14. අපි වැරදි තේරීම් කළහොත්, අපි සතුටු වන්නෙමුද, නැතහොත් අසතුටු වන්නෙමුද? (*එක් හිස් කොටුවක් ඉදිරියට යන්න.*)
15. යම්කිසිවෙක් යමක් කිරීමට ඔබට අභියෝග කළහොත්, ඔබ එය කිරීමට අවශ්‍යද? (*හිස් කොටු දෙකක් ඉදිරියට යන්න.*)

*ප්‍රශ්නවලට පිළිතුරු*

1. එය කිරීමට ඔහු තම මිතුරාගේ අභියෝගය බාරගත්තේය.
2. කණගාටුවිය.
3. හතළිහකි.
4. සාතන්.
5. කිසි කෑමක් හෝ බීමක් නැතිව සිටීම.

6. තුනකි.

7. ඒවා රොටීවලට හැරවීමටය.

8. බිමට පැන තමන්වහන්සේ ස්වර්ගික පියාණන්වහන්සේගේ පුත්‍රයාණන් බව ඔප්පුකර පෙන්වීමටය.

9. ලෝකයේ සියලුම රාජ්‍යයන් සහ එහි බලය.

10. නැත.

11. හරි දේ තෝරාගන්න.

12. හරි දේ තෝරාගන්න.

13. වැරදි දෙයක් කිරීමේ අභියෝගය.

14. අසතුට.

15. නැත.

**සාරාංශය**

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම — යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පරීක්ෂාවට ලක්වූවද,, උන්වහන්සේ නිතරම හරි දේ තෝරාගත් බව පහදා-දන්න. ළමයින්ට තෝරාගැනීමක් කිරීමට අවශ්‍ය විටදී, ඔවුන් තමන්ගෙන්ම මෙසේ ඇසිය යුතු බව ළමයින්ට සිහිපත් කරන්න. "ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ මා කුමක් කිරීම අපේක්ෂාකරන සේක්ද?" "හරි දේ කිරීමට නිර්භීතවන්න" (හෝ "හරි දේ තෝරන්න") යන ගීත ගායනා කරමින්, ඔවුන්ගේ මූදු දෙස බැලීමටද ඔවුන්ට පුළුවන.

හදේතෝ සටහන — හදේතෝ සටහනේ වචන නැවත කීමට ළමුන්ට කියන්න.

සාක්ෂිය — හරි දේ තෝරාගැනීමෙන් ළමුන්ට සතුට ලැබෙන බවට සාක්ෂි දරන්න. අඥාන තේරීමක් කිරීමට යම් කිසිවෙක් ඔබට අභියෝගකල අවස්ථාවක් ගැන කීමට ඔබට අවශ්‍යවිය හැකිය. ඔබගේ තෝරාගැනීම ගැනත්, පසුව ඒ ගැන ඔබට ඇතිවූ හැඟීම ගැනත් පැහැදිළිකරන්න.

යමෙක් යම් අඥාන ක්‍රියාවක් කිරීමට ඔවුන්ට අභියෝග කළවිට, හරි දේ තෝරාගැනීමට ළමුන්ව දිරිගන්වන්න

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැලපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. පහත සඳහන් වචන කීමට හෝ ඒවා "ඔබ සතුටින් නම්" ගීතයේ තාලය අනුව ගායනාකිරීමට ළමුන්ට උදව්කරන්න, පෙන්වාදී තිබෙන රඟපෑම් යොදාගන්න. (ළමා ගී පොත, පි. 266).

   පෙන්වීමට මා තෝරාගත් බව හරි දේ මම කියමි සැබෑව (තොල්වලට තට්ටුකර [හෝ අත්පුඩි ගසා] වටයක් හැරෙන්න).
   පෙන්වීමට මා තෝරාගත් බව හරි දේ මම කියමි සැබෑව (තොල්වලට තට්ටුකර වටයක් හැරෙන්න).
   මම දනිමි ගැලවුම්කරුවාණන්ගේ ක්‍රමය මා කිව යුතු දේ එය කියයි;
   පෙන්වීමට මා තෝරාගත් බව හරි දේ, මම කියමි සැබෑව (තොල්වලට තට්ටුකර වටයක් හැරෙන්න).

“මම කියම් සැබෑව” යන පදයට “මම කාරුණික වෙමි” හෝ “මම කියම් මගේ යාච්ඤා” යන පද යොදාගෙන කිහිපවරක්ම ගායනා කිරීමට හෝ වචන කීමට ඔබට අවශ්‍යාවිය හැකිය.

2. ළමුන්ට තෝරාගැනීමක් කිරීමට අවස්ථාවක් ලැබුනුවිට, ඔවුන් හරි දේ තෝරාගැනීමට නිර්භීතවන අන්දම රඟදක්වා පෙන්වීමට ඔවුන්ට කියන්න. පහත සඳහන් අවස්ථා හෝ ඔබගේම නිර්මාන කිහි-පයක් පාවිච්චිකරන්න:

   අ. වෙළඳසලකින් වොකලට් කිහිපයක් සොරකම්කිරීමට මිතුරෙක් ඔබට අභියෝගකරයි.

   ආ. ඔබගේ ප්‍රාථමිකයේ අනෙකුත් ළමයි අළුත් ළමයෙක් හැඳ පැළඳ සිටින අන්දම ගැන ඔහුට විහිළුකරයි.

   ඇ. ඔබගේ කුඩා සොහොයුරිය ඔබගේ ප්‍රියතම ක්‍රීඩා භාණ්ඩය කඩා දමයි.

   ඈ. ඔබගේ මව නිවසේ වැඩ කටයුතු කිහිපයක් කරන ලෙස ඔබට කියා තිබියදී, ඔබගේ මිතුරෙක් නිවසට පැමිණ පිටතට ගොස් ක්‍රීඩාකිරීම සඳහා ඔබව කැඳවයි.


   ඉ. ඔබගේ මිතුරන් ක්‍රීඩාකරමින් සිටින බෝලය කාර්‍ය බහුල මහා මාර්ගයට දිවගොස් ගෙන ඒමට ඔවුහු ඔබට අභියෝග කරති.

   ඊ. අමුත්තෙක් ඔබට වොකලට් එකක් පිළිගන්වයි.

3. පින්තූරය 2-38, පළමු දර්ශනය පෙන්වා, ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:14–20 දැක්වෙන කථාව කෙටියෙන් කියන්න. තමා ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව දර්ශනයකල බව ජෝසෆ් ස්මිත් අනෙක් මිනිසුන්ට ප්‍රකාශකල විට, බොහෝ මිනිස්සු ඔහුව විශ්වාස නොකළහ. ඔවුහු ඔහුට විහිළුකරමින් අවඥා කළහ. දර්ශනය සැබෑවක් නොවන බව කියන ලෙස ඔවුහු ඔහුට කීහ (බලන්න ජෝ. ස්—ඉ 1:21–26). නමුත් ජෝසෆ් ස්මිත් හරි දේ කිරීමට නිර්භීත විය—ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවශ්‍ය දේවල් ඔහු කළේය.

4. (දැනමුතුකම් පොතේ අරම්භයේ දක්වා ඇති) හදේතෝ පළිහේ පිටපතක් සහ ක්‍රේයොන් හෝ පැන්ස-ලක් බැගින් හැම ළමයෙකුටම දෙන්න. ළමුන්ට ඔවුන්ගේ පළිහ පාටකිරීමට කියන්න. නිර්භීතව හරි දේ කිරීම පළිහක් මෙන් අඥාන තේරීම්වල ප්‍රතිඵලවලින් ඔවුන්ව ආරක්ෂාකරන බව ළමුන්ට පැහැ-දිළි කරන්න. ඔවුන්ට හරි දේ තෝරාගැනීම සිහිපත්වීමට නිවසේ යම් ස්ථානයක ඔවුන්ගේ පළිහ තබන ලෙස ළමුන්ට කියන්න.

# හරි
# දේ
# තෝරන්න



# 15 වෙනි පාඩම


# එන්න, මා අනුගමනය කරන්න

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමට එක් එක් ළමයා තුල ඇති කැමැත්ත ශක්තිමත් කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 4:18–22, ලූක් 5:1–11, සහ යොහාන් 14:15, 15:17 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.
2. කඩදාසිවලින් විශාල පිය සටහන් කට්ටල තුනක් කපා ගන්න. එම පියසටහන්වල පහත දැක්වෙන පරිදි ලියන්න:
   අ. එන්න/මා අනුගමනය කරන්න
   ආ. මගේ /පණත් තබන්න
   ඇ. එකිනෙකාට/ප්‍රේමකරන්න




3. “එන්න, මා අනුගමනය කරන්න” ගීතය ගායනාකරන්න. නැතහොත් පළමු පදයේ වචන කියන්න (ගීතිකා, අංක. 116).
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්.
   ආ. හදේතෝ සටහන (බලන්න 1වෙනි පාඩම).
   ඇ. එක් එක් ළමයා සඳහා කඩදාසි කෑලි දෙකක් සහ පැන්සලක්
   ඈ. පින්තූරය 2-23, තම පියාගේ පියවර අනුගමනය කරන ළමයෙක්; පින්තූරය 2–24, මාලුඅල්ලන්නන් කැඳවීම (සුභාරංචි කලා පින්තූර කට්ටලය 209; 62496).
5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකළ පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිමත්කලා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අවශ්‍යවන්නේ අප උන්වහන්සේව අනුගමනය කිරීමය.**

අවධානශීලී ක්‍රියාකාරකම

ළමුන් ලවා “නායකයා අනුව යන්න” රඟදක්වන්න. කාමරයේ එක් පැත්තක ළමුන්ට පේළියට සිටගැනීමට කියන්න. පේළියේ සිටින පළවෙනි ළමයා, දුවයි, තනි කකුලෙන් පනියි, උඩ පනියි නැතිනම් වෙනත් යම් ක්‍රියාවක් කරමින් කාමරයේ අනෙක් පැත්තට යයි. අනෙක් ළමුන් පළමු ළමයාව අනුගමනයකරමින් ඔහු හෝ ඇය කළ ක්‍රියාවම කරයි. ඉන්පසුව පළමු ළමයා පේළියයේ අන්තිමට යන අතර, දෙවන ළමයා නායකයා බවට පත්වෙයි. හැම ළමයෙකුටම නායකයාවීමේ අවස්ථාවක් ලැබෙන තුරු ක්‍රීඩාව දිගටම කරන්න.

අද පාඩමෙන් ළමයින්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීම ගැන ඉගෙනගන්නට ලැබෙන බව ඔවුන්ට කියන්න.

| | |
|---|---|
| කථාන්තරය | පින්තූරය 2-23, ළමයෙක් තම පියාගේ පියවර අනුගමනය කිරීම පෙන්වා, පහත සඳහන් කථාව ඔබගේම වචනවලින් කියන්න (ඔබගේ පංතියේ ළමුන් අයිස් ගැන නොදනී නම්, කථාව ඔබ පළාතේ දේශගුණික පරිසරය අනුව වෙනස්කර ගන්න): |

ගිනි ඇවිළීම සඳහා අවශ්‍ය දර එකතුකරගැනීමට තම පියාට උදව්වීමට සෑම් ඔහු සමග පිටත්ව ගියේය. එය ශීත ඍතුවවූ බැවින් හිම ඝනත්වයෙන් අධිකවිය. සෑම් සහ ඔහුගේ පියාද එකිනෙකාට අතේ ගෙනයා හැකි දර ප්‍රමාණයක්ද රැගෙන නැවතත් නිවස දෙසට ගමන් ඇරඹූහ. සෑම්ට තම දරවල බරත් සමග ගැඹුරු හිමේ ඇවිදීම අසීරුවිය. සෑම්ගේ පියා සෑම් අමතා, හිම මත තබන තමාගේ පියවර දිගේ ඇවිද එන ලෙස ඔහුට කීවේය. සෑම් තම පියාගේ පියවර අනුගමනය කළවිට, ගමන්කිරීම ඔහුට වඩාත් පහසුවිය.

- සෑම් තම පියාගේ පියවර අනුගමනය කලේ මන්ද?
- ඔබ සිතන අන්දමට සෑම් තම පියාගේ පියවර අනුව යන විට, ඔහුට ගමන්කිරීම පහසුවූයේ මන්ද?

| | |
|---|---|
| ශුද්ධ ලියවිලි කථාන්තරය | පින්තූරය 2-24, මසුන් අල්ලන්නන් කැඳවීම පෙන්වන්න. මතෙව් 4:18–22 සහ ලූක් 5:1–11 දැක්වෙන කථාව කියන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොව මත සිටියදී උන්වහන්සේ විසින් උන්වහන්සේගේ ගෝලයන් හෝ උදව්කරුවන් වශයෙන් මිනිසුන්ව කැඳවූ බව පහදාදෙන්න. |

ඔබ කථාව කියන අතර, අදාළ විට මතෙව් 4:19 ශබ්දනගා කියවන්න. "මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් කරන්නෙමි" මෙහි අදහස නම්, ජනයාට ඉගැන්වීමේදී උපකාරවීමට යේසුස් වහන්සේට මෙම මිනිසුන් අවශ්‍යවූ බවය.

- මෙම මසුන් අල්ලන්නන් යේසුස්වහන්සේව අනුගමනය කලේ මන්ද?
- තමන්වහන්සේව අනුගමනයකරමින් ගෝලයෙකුවීමට යේසුස්වහන්සේ ඔබට කථාකල හොත්, ඔබ කුමක් කරන්නේද?

| | |
|---|---|
| සාකච්ඡාව | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගෝලයන් කැඳවීමේ කථාව, සෑම් සහ ඔහුගේ පියාගේ කථාවට සංසන්දනය කරන්න. සෑම්ගේ පියා තමාව අනුගමනය කිරීමට සෑම්ට ප්‍රකාශකල පරිදි, යේසුස් වහන්සේද උන්වහන්සේව අනුගමනයකරන ලෙස අප සියලුදෙනාටම කියනසේක. සෑම් තම පියාගේ පියවර අනුගමනය කළහොත්, ඔහුට ගමන්කිරීම පහසුවන බව සෑම්ගේ පියා දැන සිටියේය. අපද උන්වහන්සේව අනුගමනය කළහොත්, අපගේ ජීවිතවලට පහසුවක් ඇතිවී අපි සතුටුවන බව ගැලවුම්කරවාණන් දන්නාසේක. |

- යේසුස්වහන්සේව අනුගමනයකිරීම යනුවෙන් අදහස්වන්නේ කුමක්ද?
- අපි යේසුස්වහන්සේව අනුගමනය කළහොත් අපගේ ජීවිතය අපට පහසුවක් වන්නේ කෙසේද?

| | |
|---|---|
| ගීතය | "එන්න, මා අනුගමනයකරන්න" ගීතය ගායනාකරන්න, නැතහොත් පළමු පදයේ වචන කියන්න. ළමුන්ට අසීරු (අඩිපාරේ යෑම වැනි) වචන පහදාදෙන්න. |

"එන්න මා අනුගමනයකරන්න" ගැලවුම්කරුවාණන් කීසේක.<br>
ඉන්පසු එතුමාගේ අඩිපාරේ අපි යමු,<br>
මන්ද එසේ එමගින්ම අපට එක්කෙනෙක් විය හැකිය<br>
දෙවියන්ගේ ප්‍රේමනීය ඒකජාතක පුතනුවන් සමග.

යේසුස්වහන්සේ මෙන් වීමට උත්සාහකිරීමෙන් සහ උන්වහන්සේගේ පණත්වලට කීකරුවීමෙන් අපට උන්වහන්සේව අනුගමනයකිරීමට හැකි බව පැහැදිළිකරන්න. අපි උන්වහන්සේගේ මාර්ග ගැන ඉගෙනගෙන, උන්වහන්සේ අපට කිරීමට ප්‍රකාශකරන දෙවල් කරන විට, අපි උන්වහන්සේගේ පියවර අනුගමනය කරන්නෙමු.

| | |
|---|---|
| පියසටහන ක්‍රියාකාරකම | "එන්න" "මා අනුගමනයකරන්න" සඳහන්ව තිබෙන පියවර සටහන් දෙක පෙන්වන්න. එම වචන ළමුන් සමග කියවන්න. ළමුන් ලවා එම වාක්‍ය ඛණ්ඩය කිහිපවරක් කියවන්න. |

හදේතෝ සටහන පංතියේ ඉදිරිපස ප්‍රදර්ශනයකරන්න. කාමරයේ අනෙක් පස තම පියසටහන් තැබීමට ළමයෙකුට කියන්න. (පාඩම කෙරීගෙන යනවිට සහ හැම පියවර යුගලක්ම පොළොව මත තබා නිමවූ විට, හදේතෝ සටහනේ තිබෙන ගැලවුම්කරුවාණන්ගේ පින්තූරය ඉදිරියට යාම හැකි මාර්ගයක් ඔවුන් විසින් නිර්මානය කල යුතුය.

**පණත් තැබීම යේසුස්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන සේක**

ශුද්ධ ලියවිලි සාකච්ඡාව

යේසුස්වහන්සේව අනුගමනයකිරීම යනු, උන්වහන්සේ අපට කියා තිබෙන දේවල් කිරීමට කැමතිවීම බව පහදාදෙන්න. යේසුස්වහන්සේ අපට කිරීමට කියා තිබෙන දේවලින් එක් දෙයකට ඔබ කියවන විට සවන්දෙන ලෙස ළමුන්ට කියන්න.

යොහාන් 14:15 ශබ්දනගා කියවන්න. මේවා යේසුස්වහන්සේගේ වචන බව පහදා දෙන්න. ඔබත් සමග එම ශුද්ධ ලියවිල්ල නැවත කීමට ළමුන්ට කියන්න.

- අප කුමක් කළයුතු යැයි යේසුස්වහන්සේ කියන සේක්ද?
- යේසුස්වහන්සේගේ පණත් තබන්න යනුවෙන් අදහස්වන්නේ කුමක්ද?

පියසටහන් ක්‍රියාකාරකම

"මගේ පණත්" "තබන්න" යන ලේබලය ඇති පියසටහන් පෙන්වා, එම වාක්‍ය කණ්ඩය නැවත කීමට ළමුන්ට කියන්න. මෙම පියසටහන්, පළමු පියසටහන් යුගලට ඉදිරියෙන් මඳක් ඈතින් තැබීමට ළමයෙ-කුට කියන්න. (එක් පියවරකින් තවත් පියවරකට ළමයෙකුට යෑමට හැකි වන පරිදි පියසටහන් සමීප-යෙන් තිබිය යුතුය.

සාකච්ඡාව

යේසුස්වහන්සේව අනුගමනය කලහැකි අවස්ථා කිහිපයක් ළමුන්ට විස්තර කරන්න. එම එක් එක් අවස්-ථාවන්හිදී ළමුන් ක්‍රියාකරන අන්දම වාර අනුව පැහැදිළිකිරීමට ඔවුන්ට කියන්න. පහත සඳහන් උදාහරණ පාවිච්කරන්න, නැතහොත් පංතියට අදාළ පරිදි ඔබේම අවස්ථාවන් කිහිපයක් නිර්මානයකර ගන්න:

1. ඔබ පාසලේ සෙල්ලම්කරමින් සිටියදී, මුදල් සහිත පසුම්බියක්සම්භවෙයි.
   - ඔබ යේසුස්වහන්සේව අනුගමනය කරන්නේ කෙසේද?
2. ඔබ නින්දට යාමට සූදානම්ය. ඔබ බොහෝ විඩාපත්ව සිටින බැවින් කෙළින්ම නින්දට යාම ඔබට අවශ්‍යවේ.
   - ඇඳට නැඟීමට පෙර ඔබ යේසුස්වහන්සේව අනුගමනය කරන්නේ කෙසේද?
3. ඔබගේ කුඩා සොහොයුරියට මහා මාර්ගයට දිවයාමට නොදී ඇයව බලාගන්නා ලෙස ඔබගේ මව ඔබට කියා ඇත. මේ අවස්ථාවේදී ඔබගේ මිතුරන් කිහිපදෙනෙක් පැමිණ ඔවුන් සමග ක්‍රීඩාකිරීමට යාමට ඔබට ආරාධනාකරයි.
   - ඔබ යේසුස්වහන්සේව අනුගමනයකරන්නේ කෙසේද?
4. අළුත් ළමයෙක් ඔබගේ පංතියට පැමිණීම ආරම්භකර ඇති අතර ළමයින් කිහිපදෙනෙක් ඔහුට සමච්චල්කරති.
   - ඔබ යේසුස්වහන්සේ අනුගමනයකරන්නේ කෙසේද?
5. ළමුන් කිහිපදෙනෙක් ඔවුන්ගේ ඥාතීන් බැලීමට යාමට ඔබට ආරාධනාකර තිබෙන නමුත්, ඔබට සභාවට යාම සඳහා කල් වේලා ඇතිව ඔවුන් නැවත පැමිණෙන්නේ නැත.
   - ඔබ යේසුස්වහන්සේව අනුගමනයකරන්නේ කෙසේද?

ළමුන්ට යේසුස්වහන්සේව අනුගමනයකිරීම තෝරාගැනීමට හැකි වෙනත් අවස්ථා විස්තරකිරීමට ඔවුන්ට කියන්න. යේසුස්වහන්සේට අවශ්‍ය පරිදි අපි කටයුතුකරමින් අපි උන්වහන්සේව අනුගමනය-කරන විට, අපි හරි දේ තෝරාගන්නා බව පෙන්වා දෙන්න.

## අපි එකිනෙකාට ප්‍රේමකිරීම යේසුස්වහන්සේට අවශ්‍යවනසේක

ශුද්ධ ලියවිල්ල

ළමයින්ට යේසුස්වහන්සේගේ පියසටහන් අනුගමනයකිරීමේ තවත් මාර්ගයක් සොයාගැනීමට උපකාරකිරීම සඳහා යොහාන් 15:17 ශබ්දනගා කියවන්න. මේවා යේසුස්වහන්සේගේ වචන බව පැහැදිළිකරන්න. ශුද්ධ ලියවිල්ල ඔබත් සමග නැවත කීමට ළමුන්ට කියන්න.

- යේසුස්වහන්සේට අවශ්‍යවන්නේ අප කවරෙකුට ප්‍රේමකිරීමද?

පියසටහන් ක්‍රියාකාරකම

"එකිනෙකාට" "ප්‍රේමකරන්න" යන ලේබලය සහිත පියසටහන පෙන්වන්න. ළමුන් සමග එම වචන කියවා ඔවුන් ලවා වාක්‍ය කණ්ඩය නැවත කියවන්න. කලින් කලාක් මෙන් පිය සටහන් බිම ඇතිරීමට ළමුන්ට කියන්න.

කථාන්තරය

හීබර් නම් තරුණ පිරිමි ළමයෙක් යේසුස්වහන්සේ අනුගමනය කල අන්දම ගැන කියවෙන පහත සඳහන් කථාව කියන්න. නැතිනම්, කියවන්න:

හීබර් ශීතලෙන් වෙව්ලමින් තම තුනී කබායෙන් ඔහුගේ ශරීරය ඔතාගත්තේය. ඔහුගේ උපන් දිනය ළඟාවෙමින් තිබුන අතර සියල්ලටම වඩා ඔහුට අවශ්‍යව තිබුනේ උණුසුම් කබායකි. නමුත් ඔහු තම මවගෙන් ඒ ගැන ඇසුවහොත්, ඇය කණගාටුවන බව ඔහු දැන සිටියේය. මන්ද, ඔහුට කබායක් මිළදී-ගැනීමට තරම් වත්කමක් ඇයට නොතිබින. හීබර්ගේ පියා, හීබර් බිළිඳු අවධියේදීම මියගොස් සිටි බැවින්, ඔවුන්ට අවශ්‍ය මුදල් ඉපැයීම සඳහා හීබර්ගේ මව බොහෝ වෙහසවී වැඩකළාය. ඇය නිතරම මෙන් බොහෝ රෑ බෝවන තුරු අන් අයගේ ඇඳුම් මැසුවාය.

හීබර්ගේ උපන්දිනයදා, ඔහුට සුභ උපන්දිනයක් ප්‍රාර්ථනාකල ඔහුගේ මව, ඔහු වෙනුවෙන් මසනලද ලක්ෂණ කබායක් ඔහුට පිළිගැන්වූවාය. එය හැඳගෙන එහි උණුසුම විඳගැනීමට පිටතට යන අවස්ථා-වක් එනතුරු හීබර්ට ඉවසිල්ලක් නැතිවිය.

සති කිහිපයකට පසුව පණිවුඩයකට යන අතර, ස්වෙටරයක් පමණක් හැඳසිටින පිරිමි ළමයෙක්ව හීබර් දුටුවේය. කොපමණ ශීතලක් ඔහුට දැනිය යුතුදැයි හීබර් දැනසිටියේය කිසිවක් සිතන්නේවත් නැතිව තම කබාය ගැලවූ හීබර් එය පිරිමි ළමයාට දුන්නේය.

හීබර් පරණ කබායම හැඳ සිටිනු දුටු ඔහුගේ මව, ඔහුගේ අළුත් කබායට සිදුවූයේ කුමක්දැයි ඔහුගෙන් ඇසුවාය.

හීබර් පැහැදිළිකරමින්, "මට වඩා බොහෝ විශාල ලෙස එය අවශ්‍යව තිබූ මා දුටු පිරිමි ළමයෙකුට මම එය දුනිමි" යයි කීවේය.

"ඔබගේ පරණ එක ඔහුට දීමට ඔබට තිබුනා නොවේද" යයි ඔහුගේ මව ඇසුවාය.

තම මවට අවබෝධවී ඇතැයි යන බලාපොරොත්තුවෙන් හීබර් ඇය දෙස බැලූ විට, ඇයගේ දෙනෙත් කඳුළින් පිරීතිබෙනු ඔහු දුටුවේය. "ඇත්තවශයෙන්ම ඔබට එය කළනොහැක හීබර්" යයි කියමින් ඇය ඔහුව තරයේ වැළඳගත්තාය. (බලන්න ලුසිලි සී. රීඩ්න්, "කබාය" *ළමා මිතුරා,* නොවැ. 1996, පි. 5.)

- හීබර් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කලේ කෙසේද?

මෙම කථාන්තරයේ එන පිරිමි ළමයා, හැදී වැඩී සභාවේ හත්වන සභාපතිවරයා බවට පත්වූ හීබර් ජේ. ග්‍රාන්ට් බව ළමුන්ට කියන්න.

සාකච්ඡාව

අන් අයට ප්‍රේමය පෙන්වීමට හැකි මාර්ග ගැන සිතාබැලීමට ළමුන්ට කියන්න. ඔවුන්ට අදහස් ගැන සිතාබැලීමට උපකාරයක් වශයෙන් පහත දැක්වෙන ප්‍රශ්න යොදාගැනීමට ඔබට අවශ්‍යවිය හැකිය:

- යමෙක් බිම වැටී තුවාලවනු ඔබ දුටුවිට, ප්‍රේමය පෙන්වීම සඳහා ඔබට කුමක් කලහැකිද?
- පාසැලේදී යමෙක් දහවල් අහාරය නොමැතිව සිටීනම්, ප්‍රේමය පෙන්වීමට ඔබට කුමක් කල හැකිද?

අන්අයට ප්‍රේමකිරීම හැඟීම්වලට හෝ වචනවලට වඩා වැඩිදෙයක්බව පහදාදෙන්න. අප කරන ක්‍රියාවලින් අපි ප්‍රේමය පෙන්වන්නෙමු. පසුගිය සතිය තුළදී ළමුන් අන් අයට ප්‍රේමය පෙන්වූ අන්දම ගැන කීමට ඔවුන්ට ආරාධනාකරන්න.

**අපි හරි දේ තෝරාගනිමින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන්නෙමු**

පියසටහන් ක්‍රියාකාරකම

හැම ළමයෙකුටම පියවරෙන් පියවරට පා තබමින් හදේතෝ සටහනේ යේසුස් වහන්සේගේ පින්තූරය ඉදිරිපිට සිටගැනීමට අවස්ථාවක් ලබාදෙන්න. යේසුස්වහන්සේ අනුගමනයකිරීමට මෙම සතියේදී ඔහු හෝ ඇය කරන එක් දෙයක් ගැන කීමට එක් එක් ළමයාට කියන්න.

අපි හරි දේ තෝරාගන්නා විට, අපි යේසුස්වහන්සේව අනුගමනයකරන බව ළමුන්ට සිහිපත්කරන්න. හදේතෝ සටහන පෙන්වා, "මම හරි දේ තෝරාගන්නෙමි" යයි නැවත කීමට ළමුන්ට කියන්න.

**සාරාංශය**

ක්‍රියාකාරකම

එක් එක් ළමයාට කඩදාසි කැලි දෙකක් සහ පැන්සලය බැගින් දෙන්න. තමන්ගේම පා සටහන්වල පිටපත් දෙකක් ඇඳ සකස්කර ගැනීමට ළමුන්ට කියන්න. ඔවුන්ගේ කඩදාසිවල උඩකොටසේ, *මම යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරමි* යයි ලියන්න. නැතහොත් ඔවුන්ට ලිවීමට කියන්න. යේසුස්වහන්සේව අනුගමනයකිරීම සිහිපත්වීම සඳහා ළමුන්ට තම පියසටහන් නිවසට ගෙනයාමට ඉඩදෙන්න.

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමෙන් ඔබ සතුටට පත්වූ අන්දම ගැන ළමුන්ට කියන්න. ඔවුන්ද උන්වහන්සේව අනුගමනය කරන්නේ නම්, අපට නැවතත් ස්වර්ගික පියාණන් වහන්සේ සමග ජීවත්වීමට යාම සඳහා යේසුස්වහන්සේ මගපෙන්වන බවට සාක්ෂිදරන්න.

යේසුස්වහන්සේගේ පියසටහන් අනුගමනයකිරීමට නිතරම උත්සාහකිරීමට ළමුන්ව දිරිගන්වන්න. ඔවුන්ගේ කඩදාසි පියසටහන් ගැන තම දෙමාපියන් සමග සාකච්ඡාකිරීමට යෝජනාකරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. ළමුන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනයකිරීමට සහ හරි දේ තෝරාගැනීම සඳහා උපකාරකරන මෙන් ස්වර්ගික පියාණන්වහන්සේගෙන් ඉල්ලන ලෙස ළමයාට යෝජනාකරන්න.

---


**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරා ගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද යොදාගත හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ඔබ (අත්පුඩිගැසීම, හිසවැනීම හෝ ගමන්කිරීම වැනි) යම් ක්‍රියාවක් කිරීමට යන බව ළමුන්ට කියන්න. ඔබ කල ක්‍රියාව නැවතකිරීමට ළමුන්ට කියන්න. මෙය එක් වරක් කරන්න; ඉන්පසුව වෙනත් ක්‍රියාවක් කරමින් එම ක්‍රියා දෙකම නැවත කිරීමට ළමුන්ට කියන්න. වරකට එක බැගින් අළුත් ක්‍රියාවක් එක්කරමින් එය දිගටම කරන්න. ළමුන් කී දෙනෙකුට එය සිහිතබා ගනිමින් නිවැරදි පිළිවෙලට නැවත කිරීමට හැකිදැයි බලන්න.

   ගැලවුම්කරුවාණන් අනුගමනය කිරීමට මෙය සමානකරන්න. අපි උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කල යුත්තේ හුදෙක් එක් දෙයකින් පමණක් නොව, නමුත් අප කරන හැම දෙයකින්මය.

2. එක් එක් පංති සාමාජිකයා සඳහා කඩදාසි දම්වැල් බෝනික්කන් සකස්කරන්න. (වැඩිමහල් ළමුන්ට තමන්ගේම බෝනික්කන් සෑදීමෙන් සතුටුවිය හැකිය.) එකෝඩියන් හැඩයට කඩදාසි කැල්ලක් නමන්න. බෝනික්කාව නැමූ කඩදාසිය මත තබන්න. (පහත දැක්වෙන අනුරූපය බලන්න) පසුව බෝනික්කාව කපාගන්න. හැම ළමයෙකු සඳහාම දම්වැල් සාදා එක් එක් දම්වැලේ යටින් එකිනෙ-කාට ප්‍රේමකරන්න යනුවෙන් හරස් අතට ලියන්න. එකිනෙකාට ප්‍රේමකිරීම යේසුස්වහන්සේ අපට කියා තිබෙන එක් වඩාත් වැදගත් දෙයක් බව පැහැදිළි කරන්න.




3. "මම යේසුන් මෙන් වීමට තැත්කරමි" (ළමා ගී පොත, පි. 78), "එකිනෙකාට ප්‍රේමකරන්න" (ළමා ගී පොත, පි. 136), හෝ "පණත් තබන්න" (ළමා ගී පොත, පි. 146), පළමු පදය ගායනා කරන්න. නැතහොත් ගීතයේ වචන කියන්න. "මම යේසුන් මෙන් වීමට තැත්කරමි" සහ "එකිනෙකාට ප්‍රේම-කරන්න" යන ගීතවල වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත. "පණත් තබන්න" ගීතයේ වචන අනෙක් පිටුවේ සඳහන්වේ.

පණත් තබන්න

පණත් තබන්න;
පණත් තබන්න!
මෙමගින් ආරාක්ෂාවක් ඇත;
මෙමගින් සාමයක් ඇත.
එතුමා එවයි ආසිරි
එතුමා එවයි ආසිරි
දිවැසිවර වචනය:
පණත් තබන්න.
මෙමගින් ඇත අරක්ෂාව සහ සාමය

# 16
වෙනි
පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සුවකිරීමේ බලය ඇත

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේට සුවකිරීමේ බලය ඇති බව සහ රෝගීන් සුවකිරීමට පූජකවරයේ ආශිර්වාද උපකාරවත්වන බව තේරුම්ගැනීමට එක් එක් ළමයාට උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 9:18–19, 23–26; මාර්ක් 5:22–24, 35–43; ලූක් 8:41–42, 49–56; යාකොබ් 5:14–15; සහ දහම සහ ගිවිසුම 42:48 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.
2. පාඩමේ අවසානයේ දැක්වෙන චිත්‍රය පිටපත්කර හෝ ඇඳ එය කොටස්වලට කපන්න. මෙම චිත්‍ර "මා කවරෙක්ද?" යන ක්‍රියාකාරකමට පාවිච්චිකල හැකිය.
3. අවශ්‍ය උපකරණ:
   - අ. බයිබලයක් සහ දහම සහ ගිවිසුමක්
   - ආ. ප්‍රථමාධාර කට්ටලයක් හෝ මිනිසුන් රෝගීවූ හෝ තුවාලවූ විට සුවකිරීමට අවශ්‍යවන බෙහෙත්, වෙලුම් පටි සහ කැස්සට ගන්නා සිරප් වැනි ද්‍රව්‍ය කිහිපයක් සහිත බෑගයක්.
   - ඇ. ආශිර්වාදිත තෙල් සහිත කුඩා බෝතලයක්.
   - ඈ. පින්තූරය 2-25, යේසුස්වහන්සේ යායිරස්ගේ දියණියට ආශිර්වාදකිරීම (සුභාරංචි කලා පින්තූර කට්ටලය 215; 62231); පින්තූරය 2-26, යේසුස්වහන්සේ රෝගීන් සුවකිරීම; පින්තූරය 2-27, රෝගීන් මෙහෙයවීම (62342).
4. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

### සමහර අවස්ථාවලදී අපට රෝග වැළදේ

අවධානශීලී ක්‍රියාකාරකම

ප්‍රථමාධාර කට්ටලය හෝ බෑගය ළමුන්ට පෙන්වා, එය තුල තිබෙන්නේ අප අසනීපව හෝ තුවාලවී සිටින විට, සුවය පතා අපි පාවිච්චිකරන යම් ද්‍රව්‍යයන් බව පැහැදිළිකරන්න. ඒවා කුමක් සඳහාදැයි අනුමානකිරීමට එක් එක් ද්‍රව්‍යය පිළිබඳව ළමුන්ට හෝඩුවාවල් සපයන්න (උදාහරණයක් ලෙස, "තුවාලයක් හෝ කැපුමක්වූ විට කුණුු සහ විෂබීජ ඉවත්කිරීමට එය ප්‍රයෝජනවත්වේ").

හැම ද්‍රව්‍යයක් පිළිබඳවම ළමුන් අනුමානකල පසුව, එම ද්‍රව්‍යය ඔවුන්ට පෙන්වා මිනිසුන්ට සුවය ලැබීමට එය පාවිච්චිකරන අන්දම ගැන කෙටියෙන් කියන්න. මෙම ද්‍රව්‍යයන් තම දෙමාපියන්ගේ අනුදැනුමෙන් තොරව පාවිච්චි නොකිරීමට ළමුන්ට මතක්කරන්න.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

හැම කෙනෙකුටම වාගේ රෝග වැළඳීම හෝ තුවාලවීම සිදුවන බව පහදාදෙන්න. සමහර අවස්ථාවලදී තුවාල හෝ රෝගාබාද පවතින්නේ සුළු වේලාවක් වන අතර, අපගේ දෙමාපියන්ට පහසුවෙන්ම අපව සුවපත්කල හැකිය. නමුත් වෙනත් අවස්ථාවලදී අපගේ රෝගාබාද බරපතළවන අතර, උපකාර පතා අපව වෛද්‍යවරයෙකු වෙත ගෙනයාමට අපගේ දෙමාපියන්ට සිදුවනු ඇත.

අප රෝගීවූවිට අපට උපකාරවීමට වෙනත් මාර්ගයක් තිබෙනබව පහදාදෙන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොව මත ජීවත්වන විට, උන්වහන්සේ බොහෝ මිනිසුන්ට ආශිර්වාදකර ඔවුන්ව සුවපත්කලසේක. ඔවුන්ව සුවපත්කිරීමට උන්වහන්සේ පූජකවරය පාවිච්චිකලසේක.

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රෝගීන් සුවපත්කලසේක

ශුද්ධ ලියවිලි කථාන්තරය

පින්තූරය 2-25, යේසුස්වහන්සේ යායිරස්ගේ දියණියට ආශිර්වාදකිරීම පෙන්වා, ලූක් 8:41–42, 49–56 දැක්වෙන පරිදි යේසුස්වහන්සේ යායිරස්ගේ දියණිය මළවුන්ගෙන් නැගිටුවීමේ කථාව කියන්න (මතෙව් 9:18–19, 23–26 සහ මාර්ක් 5:22–24, 35–43ද බලන්න).

යායිරස්ට බලවත් ඇදහිල්ලක් තිබුන බව පහදාදෙන්න. යේසුස්වහන්සේ පැමිණ තම රෝගී දියණියට ආශිර්වාද කලහොත් ඇය සුවපත්වන බව ඔහු විශ්වාස කළේය. යේසුස්වහන්සේ යායිරස්ගේ නිවසට ගිය විට, තවත් බොහෝ අයද උන්වහන්සේගේ උපකාරය පතා එතුමා වටා එක්රැස්වූහ. යේසුස්වහන්සේ වෙනත් රෝගී කාන්තාවකට උවටන්කරමින් සිටින විට, යායිරස්ට පණිවුඩයක් රැගත් මිනිසෙක් එතැනට පැමිණියේය.

ලූක් 8:49–50 ශබ්දනගා කියවන්න.

- පණිවුඩකරු යායිරස්ට කීවේ කුමක්ද? (ලූක් 8:49 බලන්න.)
- යේසුස්වහන්සේ යායිරස්ට කීවේ කුමක්ද? (ලූක් 8:50 බලන්න.)

යේසුස්වහන්සේ යායිරස්ගේ නිවසට පැමිණිවිට, සෙනගට නොහඬන ලෙස උන්වහන්සේ කීසේක. මන්ද, යෞවනිය මියගොස් සිටියේ නැත. නමුත් ඇය මියගොස් බව මිනිසුන් සිතා සිටි නිසා, ඔවුහු යේසුස්වහන්සේට සිනහසෙමින් උන්වහන්සේට සමච්චල් කළහ (බලන්න ලූක් 8:52–53).

උන්වහන්සේගේ ගෝලයන්වූ පේතෘස්, යාකොබ්, සහ යොහාන්ද, යායිරස් සහ ඔහුගේ බිරිඳ හැර අන් සියලුදෙනාම යේසුස්වහන්සේ පිටත රැඳවූසේක. ඉන්පසු යේසුස්වහන්සේ යෞවනියගේ අත අල්ලා නැගිටින ලෙස ඇයට කීසේක. යෞවනිය නැවතත් සම්පූර්ණයෙන්ම සුවය ලැබ ඇය නිදාසිටි ඇඳෙන් නැගිටසිටියාය.

- ඔබ සිතන ලෙස, පේතෘස්, යාකොබ් සහ යොහාන් මෙන්ම යායිරස් සහ ඔහුගේ බිරිඳ හැර අන් සියල්ලෝම යේසුස්වහන්සේ විසින් නිවසින් පිටත්කලේ මන්ද? (සමහරවිට අන් සියල්ලෝම උන්වහන්සේට සිනහසුන නිසාත්, යෞවනිය සුවපත්කිරීමට උන්වහන්සේට හැකිවේයයි ඔවුන් විශ්වාස නොකළ නිසාත් විය හැකිය. ඔවුන් තුල විශ්වාසය නොතිබින.)
- යායිරස්ගේ දියණිය සුවපත්කිරීමට යේසුස්වහන්සේට හැකිවූයේ කෙසේද? (උන්වහන්සේට පූජකවරය තිබින; යෞවනියගේ දෙමාපියන්ට ඇදහිල්ල තිබින.)

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

පින්තූරය 2-26, යේසුස්වහන්සේ රෝගීන් සුවකිරීම පෙන්වා, ළමයින් රෝගීව සිටින විට, යේසුස්වහන්සේ පැමිණ ඔවුන්ට ආශිර්වාද කලහොත් ඇතිවන හැඟීම ගැන සිතාබැලීමට ළමුන්ට කියන්න. යේසුස්වහන්සේ පොලොව මත ජීවත්ව සිටියදී කුඩා ළමුන්ට උන්වහන්සේ දැක්වූ ප්‍රේමය තරම්ම ප්‍රේමයක් උන්වහන්සේ ඔවුන් එකිනෙකාටද දක්වන බව අවධාරනය කරන්න. උන්වහන්සේ දැනට මෙම ලෝකයේ නොමැති නමුත්, උන්වහන්සේ වෙනුවෙන් කටයුතුකිරීමට ධර්මිෂ්ඨ මිනිසුන්ට උන්වහන්සේ පූජකවරය ලබාදී ඇතිසේක. යේසුස්වහන්සේ දැනට මෙහි සිටිමින් අපව සුවකරන්නාසේ, අපව සුවපත්කිරීමට අශිර්වාද කිරීමට ඔවුන්ට පුළුවන.

### පූජකවරය උසුලන මිනිසුන්ට, අපට ආශිර්වාදකිරීමට පුළුවන.

සාකච්ඡාව

පින්තූරය 2-27, රෝගීන් මෙහෙයවීම පෙන්වන්න.

- මෙම පින්තූරයේ සිදුවන්නේ කුමක්ද?

මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසුන් රෝගීව සිටින යමෙකුට ආශිර්වාදයක් දුන් විට, අපි එය රෝගීන් මෙහෙයවීම වශයෙන් හඳුන්වන බව පැහැදිළිකරන්න. *මෙහෙයවීම* යන වචනය කිහිපවරක් ළමුන් ලවා කියවන්න.

ආශිර්වාද කල තෙල් බෝතලය ළමුන්ට පෙන්වන්න. මෙම තෙල් පූජකවරය උසුලන මිනිසුන් විසින් විශේෂයෙන්ම ආශිර්වාදකර තිබෙන බව පහදාදෙන්න. අසනීපව සිටින යමෙකුට සුවවීමට උදව් අවශ්‍යවූ විට, මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසුන් දෙදෙනෙක් තෙල් පාවිච්චිකරමින් අසනීපව සිටින පුද්ගලයාට ආශිර්වාදයක් දෙනු ලැබේ (බලන්න යාකොබ් 5:14–15).

- ඔබ කිසිදා මෙහෙයවීමට ලක්ව තිබේද?

ළමුන්ට ලැබුන පූජකවරයේ ආශිර්වාදයක් ගැන හෝ ඔවුන්ගේ පවුලේ අයට ආශිර්වාදකරනු දැක තිබී-මක් හෝ ගැන කියන ලෙස ඔවුන්ට කියන්න. පූජකවරය උසුලන්නන් විසින් ඔබට හෝ ඔබගේ පවුලේ සාමාජිකයෙකුට රෝගී ආශිර්වාදයක් දුන් අවස්ථාවක් ගැන ළමුන්ට කීමට ඔබට අවශ්‍යවිය හැකිය.

කථාන්තරය

පූජක ආශිර්වාදයක් තුලින් සුවය ලද කෙනෙක් පිළිබඳ කථාන්තරයක් කියන්න. ඔබ ගැන හෝ ළමයින් දන්නා කෙනෙක් වන, කොට්ඨාශයේ හෝ ශාඛාවේ යමෙක් නම් වඩාත් ප්‍රතිඵල දායකය. එවන් කථාවක් ඔබ නොදනී නම්, පහත සඳහන් කථාව ඔබට යොදාගත හැකිය:

ජෙසිකා පාසලේ සිට නිවසට පැමිණිවිට, දොර ළඟදී ඇය හමුවූ ඇයගේ පියා ඇය අමතා, ඇයගේ අළුත් බිළිඳු සොහොයුරා එම උදෑසන උපන් බව ඇයට කීවේය. බලාපොරොත්තු වූවාටත් වඩා කල් ඇති උපන් බිළිඳා බොහෝ කෙසඟව දුර්වලව සිටියේය. බිළිඳා පැය කිහිපයකට වඩා ජීවත්නොවන බව වෛද්‍යවරයා කීවේය.

සිය පියා කෙතරම් ශෝකයකින් සිටින්නේදැයි ජෙසිකාට පෙනේ. ජෙසිකාට දුකක් දැනිනි. මන්ද ඇයට අවශ්‍යවූයේ බිළිඳා ජීවත්ව සිටීමය.

ජෙසිකාගේ පියා ඔවුන්ගේ නිවාස ගුරුවරයෙකුට පණිවිඩයක් හැර පැමිණ බිළිඳාට ආශිර් වාදයක් දීමට තමාට උපකාරකිරීමට කීවේය. නිවාස ගුරුවරයා පැමිණිවිට, ඔවුන් සියල්ලෝම ජෙසිකාගේ මව සහ අළුත් සොහොයුරා සිටින නිදන කාමරයට ගියහ. ජෙසිකාගේ පියා සහ නිවාස ගුරුවරයා ඔවුන්ගේ අත් අළුත් බිළිඳාගේ හිස මත මෘදු ලෙස තැබූ අතර, ජෙසිකාගේ පියා බිළිඳාට පොළොවේ ඔහුගේ දූත-මෙහෙය ඉටුකිරීම සඳහා ජීවත්වීමට ආශිර්වාද කළේය. උණුසුම් සහගත සැනසීමකින් සහ සමාදානය-කින් ජෙසිකා පිරීගියේය. පූජකවරයේ බලය නිසා, ඇයගේ කුඩා සොහොයුරා ශක්තිමත්ව වැඩෙනු ඇතැයි ඇය දැනසිටියාය (සකස්කිරීම "මතකතබාගැනීමේ අවස්ථාවන්," *ළමා මිතුරා,* පෙබ. 1963, පි. 41.)

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ සුවය පතන හැම පුද්ගලයෙකුටම ප්‍රේමකරන නමුත්, සමහර අවස්ථාවලදී මිනිසුන්ට රෝගී ආශිර්වාදය දුන්නද ඔවුන් සුවනොවන බව පහදා දෙන්න. සමහරෙක් සුව නොවන්නේ, ඔවුන්ගේ රෝගාබාධය හෝ අකර්මන්‍යතාවය විඳදරාගෙන ජීවත්වීමට ප්‍රයත්න දැරීමෙන් ඔවුන්ට ශක්තිමත් පුද්ගලයන් බවට පත්වීමට හැකි බව ස්වර්ගික පියාණන්වහන්සේ දැනසිටින නිසාය. අනෙක් අය සුවපත්නොවන්නේ, ඔවුන් මරණයට පත්ව ස්වර්ගික පියාණන්වහන්සේ වෙත යාමට නිසි වේලාව පැමිණ තිබෙන නිසාය (බලන්න ධ්‍යසහසී 42:48). හැම යාච්ඤාවකටම හොඳම පිළිතුර ස්වර්-ගික පියාණන්වහන්සේ දන්නා බවට අප තුල ඇදහිල්ල තිබිය යුතුය.

ක්‍රියාකාරකම

ළමයින් කිහිපදෙනෙකුට පංතිය ඉදිරිපිටට පැමිණ "මා කවරෙක්ද" යන ක්‍රියාකාරකම සඳහා වන චිත්‍රය උසුලාගෙන සිටීමට කියන්න. එම චිත්‍රය නියෝජනය කරන්නේ කුමක්දැයි කීමට ළමුන්ට කියන්න.

රෝගීන් මෙහෙයවීම සඳහා සහභාගීත්වය දරන දේවල් සහ පුද්ගලයන් ගැන ඔබ යම් විස්තරයක් කිරීමට යන බව පැහැදිළිකරන්න. එක් එක් විස්තරයට අදාළවන චිත්‍රය කුමක්දැයි තීරණයකිරීමට ළමුන්ට කියන්න.

1. රෝගී පුද්ගලයෙකුට ආශිර්වාදයක් දීමේදී මාව ප්‍රයෝජනයට ගැනේ. පූජකවරය උසුලන්නා මගෙන් බිංදු කිහිපයක් රෝගී පුද්ගලයාගේ හිස මතට දමයි. මා කවුද? (ආශිර්වාදිත තෙල්.)

2. ජීවත්වන අන්දම ගැන මම ජනතාවට පෙන්වා දුනිමි. මා තුල ඇදහිල්ල තිබීමෙන් ජනතාවට රෝග-වලින් සුවවීමට උපකාරවත්වෙයි. මා කවුද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.)

3. මට විශේෂ ආශිර්වාදයක් අවශ්‍යවේ. මට උණ වැළඳී ඇත. මට සුවයක් හැඟීම සඳහා ආශිර්වාදයක් දෙන ලෙස මගේ පියාට මම කීවෙමි. මා කවුද? (රෝගී ළමයෙක්.)

4. පූජකවරය නම් විශේෂ බලයක් මට ලබාදී ඇත. ජනතාවට ආශිර්වාද කිරීම සඳහා එම බලය මට පාවිච්චි කළ හැකිය. මා කවුද? (මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසෙකි.)

5. රෝගී පුද්ගලයෙක් ආශිර්වාදයක් ඉල්ලන විට, මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසුන්ව කැඳවනු ලැබේ. සාමාන්‍යයෙන් යම් නියමිත මිනිසුන් කිහිපදෙනෙක් ඒ සඳහා සහභාගිවෙති. එම ප්‍රමාණය මම වෙමි. මගේ ප්‍රමාණය කීයද? (ප්‍රමාණය 2කි.)

6. පූජකවරය උසුලන මිනිසුන් රෝගීන් ආශිර්වාදකරන විට, ඔවහු රෝගී පුද්ගලයාගේ හිස මත මාව තබති. මා කවුද? (අත්.)

**සාරාංශය**

සමාලෝචන සාකච්ඡාව — ප්‍රථමාධාර කට්ටලය හෝ බෑගය නැවතත් පෙන්වන්න.

- අපි මෙම ද්‍රව්‍යයන් පාවිච්චිකරන්නේ කුමක් සඳහාද?
- අපි රෝගීවූ විට හෝ තුවාලවූ විට, අපට උපකාරවිය හැකි වෙනත් දෙයක් නම්කරන්න.

සාක්ෂිය — යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ සුවකිරීමට උන්වහන්සේ තුල තිබෙන බලය ගැන ඔබගේ සාක්ෂිය දරන්න. යේසුස්වහන්සේ ධර්මිෂ්ඨ මිනිසුන්ට මෙල්කිසදෙක් පූජකවරය ලබාදීම නිසා අප රෝගීවූ විට අපට ආශිර්වාදකිරීමට ඔවුන්ට හැකියාව තිබීම ගැන ඔබ කෙතරම් ස්තුතිවන්ත වන්නේ-දැයි ළමුන්ට කියන්න.

ළමුන් ඉගෙනගත් දේවල් ඔවුන්ගේ පවුල්වල අය සමග බෙදාගන්නා අන්දම ගැන සිතාබලන ලෙස ළමුන්ට කියන්න. ගැලවුම්කරුවාණන් වහන්සේ විසින් යායිරස්ගේ දියණිය සුවකළ කථාන්තරය ළමුන්ගේ පවුල්වල අය කීමට ඔවුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

---

**සාරවත් ක්‍රියාකාරකම්** — පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් හොඳින් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද යොදාගත හැකිය. අමතර උපදෙස් සඳහා “පංති වෙලාව” “ගුරු උපකාර” කොටස බලන්න.




1. *සුවකිරීමේ දීමනාව ගැන අපි විශ්වාස කරමු,* යයි හුණුලැල්ලේ ලියා ජෝසෆ් ස්මිත් විසින් මෙම ශ්‍රේෂ්ඨ සත්‍යයය, ඇදහිල්ලේ හත්වන කරුණේ කොටසක් ලෙස අපට ලබාදුන් බව පහදාදෙන්න. ළමුන්ට නැගීසිට එම වාක්‍යය නැවත කීමට කියන්න. එක් වරකට වචනයක් හෝ දෙකක් බැගින් මකාදමමින් එය කටපාඩම් කිරීමට ඔවුන්ට උදව්කරන්න. වාක්‍යය සම්පූර්ණයෙන්ම කටපාඩම්වී, මකාදමන තුරු, එම වාක්‍යය ළමුන්ට දිගටම කීමට කියන්න.


2. “ඇදහිල්ල” ගීතයේ පළවෙනි පදය පහතින් දක්වා තිබෙන රඟපෑම් කරමින් ගායනා කරන්නන. නැතහොත් වචන කියන්න (ළමා ගී පොත, පි. 96). සුවය සඳහා ඇදහිල්ල වැදගත්වන බව ළමුන්ට කියන්න.

ඇදහිල්ල දැනේ හිරු නැගෙනාසේ (*අත්වලින් හිස වටා රවුමක් යවන්න*).
හැම අළුත් දිනක්ම ආලෝකකරමින් (*අත් උරහිස දක්වා සෙමින් පහත්කරන්න*),
ඇදහිල්ල දැනේ ස්වාමීන් අසති (*අත් මිටමොලවා කන් පිටුපසට තබන්න*).
මගේ යාදිනි මා යදින හැම විටම (*යාච්ඤාකරන ලෙස අත් එක්කරන්න*).
ඇදහිල්ල කුඩා බීජයක් සේය (*වම් අත වකුටුකොට දකුණු අතින් බීජ ඉසින සේ දක්වන්න*):
සිටවූවොත් එය වැඩේ (*දකුණු අතින් පැලයත්, වම් අතින් වැඩෙන බවත් පෙන්වන්න*).
ඇදහිල්ල මගේ හද තුලින් ප්‍රසාරනයවෙයි (*හදවත මතුපිටින් අත් තබන්න*).
මම හරි දේ කරනවිට (*දකුණු අතේ දබර ඇඟිල්ලෙන් ඉහළ පෙන්වන්න*).
මම දනිමි (*දකුණු අතේ දබර ඇඟිල්ලෙන් හිස අල්ලන්න*).

3. 3 නිෆායි 17:5–9 දැක්වෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිෆායිට්වරුන් සුවකිරීමේ කථාව කියන්න. හැකි නම්, කථාව ප්‍රදර්ශනයකර පෙන්වීම සඳහාපින්තූරය 317 සුභාරංචි කලා පින්තූර කට්ටලය (හෝ රැස්වීම්ශාලාවේ පුස්තකාලයේ 62541 පින්තූරය) පාවිච්චිකරන්න. ළමයින්ගේම ශරීරවල ඇස්, කන්, සහ පාද වැනි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සුවකල අංග ස්පර්ශකිරීමට ඔවුන්ට කියන්න. නිෆායිට්වරුන්ව යේසුස්වහන්සේ සුවකල විට ඔවුන්ට කෙතරම් ප්‍රීතිමත් හැඟීමක් ඇතිවන්ට ඇත්-දැයි ළමුන් සමග කථාකරන්න. 8වන පදයේ (*මන්ද මම දකිමි*) යන්නෙන් පටන්ගෙන ශබ්ද නගා කියවා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල තිබීම වැදගත් බව ළමුන්ට මතක්කරන්න.

4. එක් එක් ළමයා වෙනුවෙන් පාඩමේ අවසානයේ ඇති පින්තූරය පිටපත් හෝ කොපි කරන්න. ළමුන්ට ක්‍රේයොන් ලබාදී පින්තූර පාටකිරීමට ඔවුන්ට කියන්න. පූජක ආශිර්වාද තුලින් රෝගී ජනතාව සුවකිරීමට හැකි අන්දම ගැන පින්තූර පාවිච්චිකර ඔවුන්ගේ පවුල්වල අයට කියාදීමට ළමුන් දිරිගන්වන්න.




17

වෙනි

පාඩම

# පූජකවරය මට උපකාරකරයි

**අරමුණ**

තමන්ට පූජකවරය උපකාරවත්වන අන්දම ගැන තේරුම්ගැනීමට එක් එක් ළමයාට උපකාරවත්වීමය

**සූදානම්වීම**

1. මාර්ක් 4:35-41 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. සුභාරංචි මූලධර්ම (31110) 13වෙනි පරිච්ඡේදයද බලන්න.

2. "ආචාරින්වහන්ස, කුණාටුව වැඩිවෙයි" ගීතයේ පළමු පදය සහ ගීත කණ්ඩය ගායනා කරන්න. නැතහොත් වචන කියන්න (ගීතිකා අංක, 105). වඩාත් අසීරු වචනවල තේරුම ළමුන්ට පැහැදිළි-කිරීමට සූදානම්වන්න.

3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්
   ආ. විදුලි ලාම්පුවක් හෝ කුඩා පහනක්. එයින් එකක් ගෙනඒමට අපහසු නම්, පංති කාමරයේ විදුලි පහන පාවිච්චිකරන්න.
   ඇ. පින්තූරය 2-20, පිරිමි ළමයෙක් බව්තීමවෙයි (62018); පින්තූරය 2-27, රෝගීන් මෙහෙයවීම (62342); පින්තූරය 2-28, කුණාටුව නවතයි (සුභාරංචි කලා පින්තූර කට්ටලය 214; 62139); පින්තූරය 2-29, සක්‍රමේන්තුව බෙදාදීම (62021); පින්තූරය 2-30, ගැහැණු ළමයෙක් ස්ථිරකරයි (62020); පින්තූරය 2-31, බිළිඳෙක් ආශිර්වාද කරයි; පින්තූරය 2-32, අළුත විවාහවූ යුවලක් දේව මාළිගාව ඉදිරිපිට; පින්තූරය 2-33, පියෙක් තම දියණියට ආශිර්වාද කරයි.

4. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

*සටහන:* පියා නොමැති නිවාසවල සිටින ළමුන්ගේ හෝ පූජකවරය නොමැති පියවරුන් ඇති ඔබගේ පංතියේ ළමයින්ගේ හැඟීම් ගැන සංවේදීවන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

අරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදි යමක් කිරීමට ඔබ ළමුන්ව දිරිගැන්වූයේ නම්, ඔවුන් සමග එය සෙයාබලන්න.

### පූජකවරය ශ්‍රේෂ්ඨතම බලයවේ

අවධානශීලී ක්‍රියාකාරකම

විදුලි ලාම්පුවක්, කුඩා පහනක් හෝ ඔබගේ පංති කාමරයේ විදුලි පහනක් උපයෝගීකරගෙන *බලය* නමැති වචනයේ අදහස ප්‍රදර්ශනයකර පෙන්වන්න. විදුලි පහන නිවා දමා සාකච්ඡාව ආරම්භ කරන්න. හැම දෙයක්ම නිසි ස්ථානවල තිබුනද, විදුලි ලාම්පුව හෝ පහන ආලෝකය ලබා නොදෙන බව පෙන්වා දෙන්න.

- ලාම්පුව ක්‍රියාකිරීමට පෙර කුමක් සිදුවිය යුතුද?

විදුලි පහනේ සුවිචය දැමූ විට සිදුවන්නේ කුමක්දැයි දැකගැනීමට ළමුන්ට ඉඩ සලසන්න. ආලෝකය ලබාදීමට පෙර විදුලි ලාම්පුවට හෝ ලාම්පුවට විදුලි බලය තිබිය යුතුබව පහදාදෙන්න.

ශුද්ධ ලියවිලි කථාන්තරය

මෙම පාඩම වෙනත් අන්දමේ බලයක් ගැන බව ළමුන්ට කියන්න—එය විදුලි බලයටත් වඩා වැඩි විශාල බලයකි. පහත සඳහන් කථාන්තරයට සවන්දීමට ළමුන්ට ආරාධනාකර, කුමන අන්දමේ බලයක් පාවිච්චිවන්නේදැයි සිතාබැලීමට ඔවුන්ට කියන්න. මාර්ක් 4:35–41 දැක්වෙන කථාව කියන්න.

- අහිතකර කුණාටුවකදී ඔබ බෝට්ටුවක් තුල සිටිනවිට ඔබට ඇතිවන හැඟීම් මොනවාද?

ගෝලයන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අවදිකලේ ඔවුන් කුණාටුවට බියවූ නිසා බව පහදා දෙන්න. ගෝලයන් යේසුස්වහන්සේගෙන් ඇසූ දෙය දැනගැනීමට මාර්ක් 4:35–41 ශබ්දනගා කියවන්න (ආචාරීන්වහන්ස, වශයෙන් පටන් ගන්න). බෝට්ටුව දියේ ගිලී ඔවුන් මිය යතැයි ගෝලයෝ බියට පත්වූහ.

පින්තූරය 2-28, කුණාටුව නැවැත්වීම පෙන්වා, යේසුස්වහන්සේ කළේ කුමක්දැයි බැලීමට මාර්ක් 4:39 ශබ්දනගා කියවන්න. ළමුන් ලවා "නිශ්ශබ්දවෙව, නිශ්චලවෙව" යන වචන නැවත කියවන්න.

කුණාටුව එතරම් ඉක්මණින්ම නැවතීම ගැන ගෝලයෝ පුදුමයට පත්වූ බව පහදා දෙන්න. ඔවුන් එකිනෙකාගෙන් ඇසූදෙය දැනගැනීමට මාර්ක් 4:41 ශබ්දනගා කියවන්න. "සුළඟ සහ මුහුද පවා මූන්වහන්සේට කීකරුවීමට මූන්වහන්සේ කවරෙක්ද?" යේසුස්වහන්සේට සුළඟ සහ මුහුද පාලනයකිරීමට බලය තිබීම ගැන උන්වහන්සේගේ ගෝලයෝ පුදුමයට පත්වූහ.

ගීතය

"අචරීන්වහන්ස කුණාටුව වැඩිවෙයි" ගීතය ගායනාකරන්න. නැතහොත් පළමු පදයේ වචන කියන්න. ඔබ ආරම්භකිරීමට පෙර, මෙම ගීතය ඔවුන් මේ දැන් ඇසූ කථාවට සමානබව ළමුන්ට කියන්න. ගීත කණ්ඩයේ එන, ("නිශ්ශබ්දවෙව, නිශ්චලවෙව") යන යේසුස්වහන්සේගේ වචනවලට සවන්දීමට ළමුන්ට කියන්න. (මෙම ගීතයේ වචන කුඩා ළමුන්ට තේරුම්ගැනීමට අපහසු විය හැකි නමුත්, ගීතයේ අදහස ආත්මයාණන්ගේ උදව්වෙන් ඔවුන්ට තේරුම්ගැනීමට හැකිය. යම් අසීරු වචන ළමුන්ට තේරුම්කර දීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

ඔබ වචන ගායනාකරන හෝ කියවන විට, ළමුන් විවිධ ක්‍රියාවන් අංගචලනයෙන් කිරීමේදී ඔවුන්ට උපකාරකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. බෝට්ටුවක් පැද්දෙන්නාක් මෙන් ඉදිරියට සහ පස්සට යාමටද, ඔවුන්ගේ අත්වලින් රැළි ගසන ආකාරය පෙන්වීමටද, ගෝලයන්ගේ මුහුණුවල ඇති බිය පෙන්වීම වැනි දෙවල් කිරීමට ඔවුන්ට පුළුවන.

ආචාරිනී, කුණාටුව වැඩිවෙයි!<br>
තරංග තදින් ගසයි!<br>
අහස අඳුරු වලාවෙන් වැසීයයි. සෙවනක් හෝ උදව්වක් ළඟනැත.<br>
අප විනාශවීම ගැන සළකන්නේ නැද්ද ඔබතුමා?<br>
නිදන්නේ කෙසේද ඔබතුමා<br>
හැම මොහොතම තදින් තර්ජනය කරමින්<br>
කෝපයේ ගැඹුරේ ඇතිද සොහොනක්?

*ගීත කණ්ඩය:*<br>
සුළඟ සහ රැල්ළ ඔබගේ කැමැත්තට කීකරුයි:<br>
නිසලවනු, නවතිනු.<br>
කුණාටු ගසන මුහුද කෝපවූවද<br>
යකෙක්, මිනිසෙක් හෝ එය කුමක් වූවද,<br>
නැව ගිලීමට සමත් වතුරක් එහි නැත<br>
මුහුදේ, පොළොවේ හා අහසේ ස්වාමියා.<br>
ඔවුන් හැමෝම ඔබගේ කැමත්තට හොඳින් කීකරුයි<br>
නිසලවනු, නවතිනු; නිසලවනු, නවතිනු.<br>
ඔවුන් හැමෝම ඔබගේ කැමැත්තට හොඳින් කීකරුයි:<br>
නිසලවනු, නිසලවනු, නවතිනු.

- කුණාටුව නැවැත්වීමට හැකිවීම සඳහා යේසුස් ක්‍රිස්තුස්වහන්සේට තිබූ ශ්‍රේෂ්ඨ බලය කුමක්ද? (පූජකවරයේ බලයයි, එය ස්වර්ගික පියාණන්වහන්සේගේ නාමයෙන් ක්‍රියාකිරීමේ බලයවේ.)

ළමුන්ට *පූජකවරය* යයි ශබ්දනගා කීමට කියන්න.

## පූජකවරය මගින් අපට ආශිර්වාදිත විය හැකිය

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

සභාවේ බොහෝ මිනිසුන්ට මෙම බලයම තිබෙන බව පැහැදිළිකරන්න. ස්වර්ගික පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සභාවේ සුදුසු මිනිසුන්ට පූජකවරය ලබාදෙනසේක. ස්වර්ගික පියාණන්වහන්සේ විසින් මෙම මිනිසුන්ට මගපෙන්වන විට, අපට උපකාරකිරීමට සහ ආශිර්වාද කිරීමට මෙම පූජකවරය පාවිච්චිකිරීමට ඔවුන්ට පුළුවන.

- පූජකවරය උසුලන ඔබ දන්නා යමෙක් සිටීද?

පින්තූර සාකච්ඡාව

වරකට එක බැගින් පූජකවරයේ නියෝග පින්තූර පෙන්වන්න. පින්තූර අල්ලාගැනීමට හෝ පෙන්වීමට ළමුන්ට සලස්වා, එක් එක් පින්තූරයේ සිදුවන දේ කීමට ඔවුන්ට උදව්කරන්න. මේ සියල්ලම කරනු ලබන්නේ පූජකවරය උසුලන මිනිසුන් බවට අවධාරනය කරන්න. මෙම නියෝගයන් පිළිබඳව ළමුන් ලබා ඇති යම් අත්දැකීම් ගැන කථාකිරීමට ඔවුන්ට කියන්න.

පින්තූරය 2-27, රෝගීන් මෙහෙයවීම පෙන්වන්න. රෝගීන් මෙහෙයවීම පිළිබඳව 16වෙනි පාඩමෙන් ළමුන් ඉගෙනගත් දේවල් ගැන ඔවුන්ට මතක්කරන්න. පූජකවරය උසුලන මිනිසුන්ට රෝගීන් සුවපත්වීම සඳහා ආශිර්වාද දීමට හැකි බව සිහිපත්කරගැනීමට ළමුන්ට උපකාර කරන්න.

- ඔබ රෝගීව සිටි නිසා කවදාහෝ ඔබට රෝගීන් මෙහෙයවීමක් ලැබී තිබේද?

පින්තූරය 2-29, සක්‍රමේන්තුව බෙදාදීම පෙන්වන්න. ආරෝනික පූජකවරයේ පූජකවරුන්ට හෝ මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසුන් සක්‍රමේන්තුව ආශිර්වාදකරන බවත්, ආරෝනික පූජකවරයේ උපස්ථායකවරුන් සක්‍රමේන්තුව බෙදාදෙන බවත් පහදාදෙන්න. සක්‍රමේන්තුවට උදව් කරන ළමුන්ගේ වැඩිමහල් පවුල් සාමාජිකයන් හෝ මිතුරන් ගැන ප්‍රකාශකිරීමට ඔවුන්ට කියන්න.

පින්තූරය 2-20, පිරිමි ළමයෙක් බෞතීස්මකිරීම පෙන්වන්න. අප හැම කෙනෙක්ම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන්, පූජකවරය උසුලන මිනිසෙකු මගින් බෞතීස්මකරන බව ළමයින්ට මතක්කරන්න. යොහාන් බෞතීස්තය පූජකවරය ඉසිලූ බැවින්, යේසුස්වහන්සේව බෞතීස්ම කිරීමට ඔහුට හැකිවිය.

- ඔබලාගෙන් කිසිවෙකු කිසිදාක බෞතීස්මයකට සහභාගිවී තිබේද? (ළමයින් කිසිවෙක් දැනටමත් බෞතීස්මවී තිබේනම්, ඔවුන්ගේ බෞතීස්මය ගැන ඇසීමට ඔබට අවශ්‍යාවිය හැකිය.)

පින්තූරය 2-30, ගැහැණු ළමයෙක් ස්ථිරකිරීම පෙන්වන්න. ඔවුන් බව්තීස්මවීමෙන් පසුව, මෙල්කිසදෙක් පූජකවරය උසුලන මිනිසුන් ඔවුන් හැම කෙනෙක්ම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයන් වශයෙන් ස්ථිර කරන බව ළමයින්ට සිහිපත්කරන්න. මේ අවස්ථාවේදී ඔවුන්ට ශුද්ධාත්මයානන්ගේ දීමනාවද, පූජකවරයේ බලය තුලින් ලබාදෙනු ලැබේ.

පින්තූරය 2-31, බිළිඳෙකු ආශිර්වාදකිරීම පෙන්වන්න. සභාවේ බිළිඳුන්ට නමක් තැබීමේදී පූජකවරයේ ආශිර්වාදයක් ලබාගැනීමට හැකි බව ළමුන්ට කියන්න. මේ අන්දමට මෑතකදී ආශිර්වාදයක් ලැබූ ඔවුන් දන්නා බිළිඳෙකු ගැන ඔබට කීමට ළමුන්ට කියන්න. (මේ අන්දමට බිළිඳු අවධියේදී ආශිර්වාදයක් නොලැබීම නිසා යම් ළමුන් සැළකිල්ලක් දක්වන්නේ නම්, පූජකවරයේ ආශිර්වාදයක් ලබාගැනීමට ඔවුන්ට බොහෝ අවස්ථාවන් තිබෙන බව ඔවුන්ට සහතිකවන්න.

පින්තූරය 2-32, අළුත විවාහවූ යුවලක් දේවමාළිගාව ඉදිරිපිට සිටීම පෙන්වන්න. ළමුන් වැඩිවිය පත්වනවිට, විවාහවීම සඳහා ඔවුන්ට දේවමාළිගාවට ගිය හැකි බව පහදාදෙන්න. පූජකවරයේ මුද්‍රාකිරීමේ බලය සතු මිනිසුන් ධර්මිෂ්ඨ යුවලවල් දේවමාළිගාවේදී විවාහකරනු ලැබේ. දේවමාළිගා විවාහ මගින් පවුල් සදාකාලයටම එක්කිරීමට හැකියාව ලබාදේ.

කථාන්තරය

යම්කිසි ප්‍රශ්නයක් ඇතිවූ විටදී, ඔවුන්ට පූජක ආශිර්වාදයක් ලබාගත හැකි බව ළමුන්ට කියන්න. පින්තූරය 2-33, පියෙක් තම දියණියට අශිර්වාදකිරීම පෙන්වා, ප්‍රශ්නයකට මුහුණදුන් ගැහැණු ළමයෙකු පූජක ආශිර්වාදයක් ලබාගත් කථාවක් කියන්න. පහත දැක්වෙන කථාව කීමට ඔබට වුවමනාවිය හැකිය:

ප්‍රථමවරට පාසල් යාමට සූසෑන් සූදානම්වෙමින් සිටියාය. පාසල් ගමන ආරම්භකිරීම ගැන සූසෑන් සතුටින් සිටිය නමුත්, දැන් අවසානයේදී පළමු දිනය පැමිණ තිබීමෙන් ඇය තැතිගෙන සිටියාය.

සූසෑන් මුළු උදය කාලයේම නිහඬව සිටියාය. ඇයගේ මව ඇයගේ ප්‍රියතම උදෑසන ආහාරය පිළි-යෙලකර තිබූ නමුත්, ඇය එය දුටුවද ඇය සිනහසුනේ නැත. ඇය කෑමගැනීමට උත්සාහ කළ නමුත් ඇයට නොහැකිවිය.

සූසෑන් සිය මව අමතා ඇයට අසනීපයක් දැනෙන බව කීවාය. ඇයට උණ තිබේදැයි බැලීමට ඇයගේ මව ඇගේ හිස අල්ලා බැලුවාය. ඇය ඇයගේ උගුර දෙස බැලුවාය. නමුත් එය රතුපාටවී නොතිබුනේය. අසනීපය කොහේදැයි සූසෑන්ගේ මව ඇගෙන් ඇසුවාය. තමාගේ ශරීරයේ යම් අසහනයක් තිබෙන බව සූසෑන් කීවාය.

මෙය ඇයගේ පළමු පාසල් දිනය නිසා සමහරවිට, ඇයට ඇතුළාන්තයේ යම් අමුත්තක් දැනෙන බව සූසෑනිගේ පියා කීවාය. ඇය මඳක් බියට පත්ව සිටියේ ඇයට මුළු දවසේම නිවසින් පිටත සිටීමට සිදුවන නිසාත්, කුමක් සිදුවන්නේදයි නොදැන සිටි නිසාත්ය. සූසෑන්ගේ පියා පැහැදිළි කරමින්, ඔහු තම අළුත් රැකියාවට ගිය පළමු දිනයේදී තමාටද එම හැඟීමම ඇතිවූ බව කීවේය.

ඇය පාසල් යාමට පෙර ඇයට ආශිර්වාදයක් දීමට සූසෑන්ගේ පියා යෝජනා කළේය.

සූසෑන්ට තිබූ බිය සහ අසහනකාරී තත්වය ඉවත්ව යාමට ආශිර්වාදය ඇයට උදව්වනු ඇත. සූසෑන්ගේ පියා සිය අත් ඇයගේ හිස මත තබා ඇයට විශේෂ ආශිර්වාදයක් දුන්නේය.

එම දහවලේ සූසෑන් නිවසට පැමිණිවිට, ඇය සතුටින් සිටියාය. තමා සිය පාසලට කැමති බවත් ගුරු-තුමිය ප්‍රියජනකබවත් ඇය සිය මවට කීවාය. පාසලේදී තමාට යහපත් හැඟීමක් ඇතිවීමට තම පියා විසින් විශේෂ ආශිර්වාදයක් ලබාදීම ගැන සූසෑන් සතුටුවූවාය.

මෙවැනි ආශිර්වාද පීතෘ වශයෙන් නිතරම හැඳින්වෙන බව පහදාදෙන්න. අපට ආශිර්වාදයක් දීමට අපගේ පියවරුන්ට නොහැකි නම්, අපට ආශිර්වාදයක් අවශ්‍යවූවිට එය ලබාදෙන ලෙස මෙල්කිසදෙක් පූජකවරය උසුලන වෙනත් මිනිසුන් වන, අපගේ නිවාස ගුරුවරු, වෙනත් පවුල් සාමාජිකයන් හෝ සභානායක හෝ ශාඛා සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කිරීමට අපට පුළුවන.

## සාරාංශය

පින්තූරය සමාලෝචනය

- අපට පූජකවරයේ ආශිර්වාදයක් අවශ්‍ය හෝ වුවමනාවිය හැක්කේ කිනම් අවස්ථාවකද?

ළමුන් නියෝගය ගැන සඳහන්කරන විට, එය පෙන්නුම්කෙරෙන පින්තූර හැම එකක්ම පෙන්වන්න. ළමුන් සියල්ලටම එක්ව ශබ්දනගා එක් එක් නියෝගයේ හෝ ආශිර්වාදයේ නම කියන ලෙස ඔවුන්ට කියන්න. මේවා පූජකවරයේ බලයෙන් අපට ලබාදිය හැකි ආශිර්වාද වලින් සුළු ප්‍රමාණයක් පමණක් බව සඳහන් කරන්න.

සාක්ෂිය

අපගේ ජීවිතවලදී අපට උපකාරවත්වීමට—යේසුස්වහන්සේට තිබූ—එම පූජකවරයම අපට තිබීම ගැන කෘතඥතාවය පළකරමින් ඔබගේ සාක්ෂිය දරන්න.

ළමුන්ට පූජකවරයේ ආශිර්වාදයක් අවශ්‍යවූ විට, ඔවුන්ගේ පියවරුන්ගෙන් (හෝ වෙනත් මෙල්කිසදෙක් පූජකවරය උසුලන්නෙක්ගෙන්) එවැන්නක් ඉල්ලීමට ඔවුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. පූජකවරයේ ආශිර්වාද ගැන තම කෘතඥතාවය පළකිරීමට ළමයාට යෝජනාකරන්න.

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර උපදෙස් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. ඔබගේ ප්‍රාථමිකයේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව, ඔබගේ පංතියේ ළමයෙකුගේ දෙමාපියෙකුට ආරාධනාකර, ළමයෙකුට නම් තබා ආශිර්වාදකිරීම ගැන යමක් කීමට කියන්න. දෙමාපියන්ට ඇතිවූ හැඟීම ගැනද, ඔවුන් බිළිඳාට ඇන්දවූ ලක්ෂණ ඇඳුම් ගැන සහ නිවාස ගුරුවරුන් සහ පවුල් සාමාජිකයන් මෙන්ම අනෙකුත් සමීප මිතුරන් බලාසිටිමින් සහභාගීත්වය දැක්වීම කෙතරම් විශේෂිත දෙයක්වන්නේදැයි කියන ලෙස දෙමාපියන්ට කියන්න. එසේම පූජකවරයේ බලය පාවිච්චිකරමින් බිළිඳාට නමක් තබා, ආශිර්වාදයක් දීමට හැකිවීම ගැන පියාට ඇතිවූ හැඟීම ගැන කියන ලෙසද දෙමාපියාට කියන්න.
2. මාර්ක් 4:35–41 දැක්වෙන කථාවේ චරිත රඟදැක්වීමට ළමුන්ට කියන්න.
3. ළමුන්ට ක්‍රේයොන් සහ පැන්සල් ලබාදී, සක්‍රමේන්තුව බෙදාදීම වැනි නියෝගයක චිත්‍රයක් ඇඳීමට එක් එක් ළමයාට කියන්න. හැම ළමයෙකුගේම චිත්‍රයේ නියෝගයේ නම සඳහන්කර ලේබලයක් අලවන්න.
4. පූජකවරයේ නියෝග ගැන සඳහන්වන පහත සඳහන් ගීතයක් හෝ ගීත කිහිපයක් ගායනා කරන්න. නැතහොත් වචන කියන්න: "පූජකවරය නැවත පිහිටුවා ඇත" (*ළමා ගී පොත,* පි. 89), "මා සක්‍රමේන්තුව ගැනීමට පෙර" (*ළමා ගී පොත*, පි. 73), "මා දේවමාළිගාව දැකීමට සතුටුය" (ළමා ගී පොත, පි. 95), "බෞතීස්මය" (ළමා ගී පොත, පි. 100), "ශුද්ධාත්මයාණන්" (ළමා ගී පොත, පි. 105). "බෞතීස්මය" සහ "ශුද්ධාත්මයාණන්" යන ගීතවලට වචන දැනමුතු කම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

   පූජකවරය නැවත පිහිටුවා ඇත

   පූජකවරය නැවත පිහිටුවා ඇත,<br>
   සත්‍යය මිනිසාට දන්වා ඇත,<br>
   දෙවියන් පොළොවට කථාකර ඇත,<br>
   එතුමාගේ බලය නැවතත් මෙහි ඇත.

   මා සක්‍රමේන්තුව ගැනීමට පෙර

   මා සක්‍රමේන්තුව ගැනීමට පෙර, මම නිහඬව හිඳගෙන සිටිමි.<br>
   යේසුන් පොළොවට පැමිණ මා වෙනුවෙන් මියගිය බව මම දනිමි.

   යේසුන් දන්නා සියලුම යෞවන යෞවනියන් ගැන මම සිතමි,<br>
   බොහෝ කලකට පෙර, එතුමා පොළොවේ ඇවිද්ද දිනයන්.

   මා වතුර සහ පාන් ගෙන දිරිගම් වීමට බොහෝසේ<br>
   යේසුන් පෙම්කල ගලීලයේ දරුවෙකුසේ.

   මා දේවමාළිගාව දැකීමට සතුටුයි

   මා දේවමාළිගාව දැකීමට සතුටුයි.<br>
   යම් දිනක යමි මම එහි<br>
   ශුද්ධාත්මයන් හැඟීමට,

සවන්දීමට සහ යැදීමට.
මන්ද දේවමාළිගාව දේව ගෘහයවේ,
මනරම් ලක්ෂණ තැනක්වේ.
මම බාලවියේදීම සූදානම් වෙමි;
මෙය මාගේ පූජනීය කාර්යයකි.

මා දේවමාළිගාව දැකීමට සතුටුයි.
යම්දිනෙක යමි මම එහි.
පියා සමග ගිවිසුම්කරමි මම;
කීකරුවීමට පොරොන්දුවෙමි මම.
මන්ද දේවමාළිගාව ශුද්ධ තැනක්වේ
එහි අපි එකට මුද්‍රාවේ.
දේව දරුවෙකුසේ, මෙම සැබෑව මා උගෙන ඇත:
පවුලක් සදහටමය.

(© 1980 by Janice Kapp Perry. Used by Permission.)

# 18 වෙනි පාඩම

# යාච්ඤාවලට ඉතාමත් හොඳ අන්දමින් පිළිතුරු ලැබේ

**අරමුණ**

ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ යාච්ඤාවලට නිතරම සවන්දී, හොඳම අන්දමින් ඒවාට පිළිතුරු දෙන බව ළමුන්ට තේරුම්ගැනීම සඳහාය.

**සූදානම්වීම**

1. ලූක් 1:15–17 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. සුභාරංචි මූලධර්ම (31110), 8වෙනි පරිච්ඡේදයද බලන්න.
2. "විගසින් මම කීකරුවෙමි" ගීතයේ මුළු පද තුනම ගානාකරන්න. නැතහොත් වචන කියන්න (ළමා ගී පොත, පි. 197). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.
3. ඔබගේ යාච්ඤාවකට පිළිතුරුදෙමින් ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට උදව්කල අවස්ථාවක් පිළිබඳ ඔබගේ අත්දැකීමක් බෙදාගැනීමට සූදානම්වන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්
   ආ. පින්තූරය 2-34, යොහාන් බෞතීස්තයට නමක් තැබීම
5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

**උපකාර පතා අපට යාච්ඤාකල හැකිය**

අවධානශීලී ක්‍රියාකාරකම

"විගසින් මම කීකරුවෙමි" ගීතයේ මුළු පද තුනම ළමයින් සමග ගායනාකරන්න. නැතහොත් වචන කියන්න.

- අපගේ දෙමාපියන්ට සහ ස්වර්ගික පියාණන්වහන්සේට අපි කීකරුවිය යුත්තේ මන්ද? (අපට හොඳම දෙය කිරීමට උදව්කිරීමට ඒ අයට පුළුවන් නිසාය.)

කථාන්තරය

පහත සඳහන් කථාව කියන්න:

මෙරඩිත් එක් රාත්‍රියකදී නරක සිහනයක් දුටුවාය. ඇයට මග වැරදී බියට පත්ව සිටුනු ඇය සිහිනෙන් දුටුවාය. ඇය අවදිවූවිට, ඇය හැඬීමට පටන්ගත්තාය.

- ඔබ මෙරඩිත් නම් ඔබ කරන්නේ කුමක්ද?

මෙරඩිත් තම පියාට කථාකල විට ඔහු වීත් ඇයට හාදුවක් දුන්නේය. මෙරඩිත්ට යහපත් හැඟීමක් ඇතිවුන බැවින් නැවතත් ඉක්මණින්ම නින්දට වැටුනාය.

- මෙරඩිත් සිය පියා කැඳවූයේ මන්ද? (ඇයට උපකාර අවශ්‍යව තිබූ අතර, තමාට උපකාර කිරීමට ඔහුට හැකි බව ඇය දැන සිටියාය.)

- ඔබට උපකාර අවශ්‍යවූ විට ඔබ කැඳවන්නේ කවුරුද? (පිළිතුරුවලට, ස්වර්ගික පියාණන් වහන්සේ, දෙමාපියන්, පවුලේ අනෙක් සාමාජිකයන් සහ මිතුරන් ඇතුළත්විය හැකිය.)
- ස්වර්ගික පියාණන්වහන්සේගෙන් උපකාර ලබාගැනීමට ඔබ උන්වහන්සේ කැඳවන්නේ කෙසේද? (යාච්ඥාකිරීමෙනි.)

කථාන්තරය

ප්‍රේරිතවරු දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සාමාජිකයෙකුවීම දක්වා වැඩුනු, ජෝන් ඒ, විඩ්ස්සෝ ගේ පහත සඳහන් කථාව ළමුන්ට කියන්න.

ජෝන්ගේ තරුණ කාලයේදී ඔහුගේ පියා මියගිය අතර, ජෝන්ගේ මව සිය ළමයින්ව රැකබලාගැනීමට වෙහෙසවී වැඩකළාය. ඇයට උපකාරකිරීම සඳහා රැකියාවක් කිරීම ජෝන්ට අවශ්‍යවිය. පාසල් වේලාවෙන් පසුව වැඩකිරීම සඳහා රැකියාවක් සොයාගැනීම පහසුනොවූ නමුත්, අවසානයේදී ඔහු එකක් සොයාගත්තේය. එක් දිනක් ඔහු සේවය කල මිනිසා ඔහු සති කිහිපයක්ම හොඳින් සේවය කල බව පවසා ඔහුට ඩොලර් පහක රත්රන් කැල්ලක් ගෙව්වේය.

"ඩොලර් පහක්! එය මුදලකි! මම සතුටින් කුල්මත්වීමි! එයින් බාගයක් මගේ මවට දීමට මට පුළුවන; අළුත් පොතක් මිළදීගෙන ඉතිරිය ඉතිරිකිරීමට මට පුළුවන. දිළිසෙන රත්රන් කැල්ල මගේ කලිසමේ සාක්කුව තුලට දමාගෙන, මගේ වාසනාව ගැන මගේ මවට කීමට මම වහා දිවගියෙමි යයි ජෝන් කීවේය.

"නිවසට යන අතර, මුදල්....අතගාබැලීමට මම සාක්කුවට අත දැම්මෙමි. එය එහි නොතිබින! මම නැවතත් මුළු සාක්කුවම අතගා බැලුවෙමි. රත්රන් කැල්ල එහි නොවීය! ඒ වෙනුවට, සාක්කුවේ සිදුරක් මට හමුවුන අතර, එතුලින් කාසිය ලිස්සාගොස් වැටී ඇත. එය මහත් අවාසනාවකි! දැඩි කණගාටුවක් ඇතිවූ බැවින් මම, දිය අගලක ගැටිය මත හිඳගෙන හැඬුවෙමි."

ජෝන් රත්රන් කැල්ල සොයමින් තමා පැමිනි මාර්ගයේ ආපසු ඇවිද ගියේය. ඔහු ඇවිදගිය පාර ලෑලිවලින් (බෝඩ්වලින්) සකස්කර තිබූ අතර, සෑම ලෑල්ලක් අතරම තිබූ හිදැස් අතර ඔහු හොඳින් බැලීය. නමුත් මුදල් සොයාගැනීමට ඔහුට නොහැකිවිය. අවසානයේදී මුදල් සදහටම නැතිවීගොස් ඇතිබව ඔහු තීරණය කළේය.

ක්‍රියාකාරකම (මනාපය පරිදි)

ජෝන් නැතිවුන කාසිය සොයන ලෙස ළමයින්ටද කාමරය වටා සෙමින් ඇවිදිමින් එය සොයන විලාසය රඟදක්වන ලෙස ඔවුන්ට කියන්න. ඉන්පසුව ඔවුන්ගේ ආසනවලට යන ලෙස ඔවුන්ට කියන්න.

- ඔබ ජෝන් නම්, ඔබගේ ඊළඟ පියවර කුමක්ද?

කථාව සම්බන්ධිතයි

ජෝන් මෙසේ කීවේය: "නැතිවුන රත්රන් කැල්ල තිබෙන්නේ කොතැනදැයි ස්වාමීන් වහන්සේ දන්නා බැවින්, එය නැතිවී වැඩි වේලාවක් ගතවී නැති නිසා, එය සොයාගැනීමට උන්වහන්සේ මට උදව්කරනසේක.

"එනිසා මම විශාල ගසක් පිටුපසට ගොස් දණගසාගෙන, මට සිදුවූ කරදරය ගැන සියල්ලම ස්වාමීන්වහන්සේට පවසා, මා වෙනුවෙන් තිබෙන හොඳම දෙය එය නම්, [රත්රන් කැල්ල] සොයාගැනීමට මට උදව්කරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලීමි. මා සිටගත් විට, මට වඩා හොඳ හැඟීමක් ඇතිවිය. ස්වාමීන්වහන්සේ මගේ යාච්ඥාව අසාතිබෙන බව ස්ථිරවම මට දැනිනි.

"[අඳුර පැතිරෙමින් තිබින]. පොළොව මත තිබෙන කිසිවක්, විශේෂයෙන්ම කුඩා රත්රන් කැබැල්ලක් කිසිවෙකුට පැහැදිළිව සොයාගැනීමට නොහැකිය. නමුත් මම එම මොහොතේම ඇවිදගෙන ගියෙමි. නමුත් මේ අවස්ථාවේ සෙමින් නොවේ. මන්ද, ස්වාමීන්වහන්සේ මා හට උදව්කරන බව මම දැන සිටියෙමි. දෙවෙනි ගොඩනැගිල්ලේ අඩක් පසුකරන විට, තණ පියස්ස මත මගේ නැතිවුන ඩොලර් පහේ රත්රන් කැල්ල තිබින.... මා සතුටින් කෑ නොගැසුවා පමණය. මගේ මව කෙතරම් සතුටුවනු ඇද්ද,

මා මිළදී ගැනීමට සැළසුම්කල පොතින් කෙතරම් සතුටක් ලැබෙනු ඇත්ද. වැටට හේත්තුවූ මම "මගේ මුදල් සොයාගැනීමට මට උදව්කිරීම ගැන ස්තුතියි ඔබවහන්සේට, අහෝ ස්වාමීන්වහන්ස" යයි කීවෙමි.

"එම අවස්ථාවේ සිට, ස්වාමීන්වහන්සේ යාච්ඤාවන් අසන බව මම දැන සිටියෙමි. එසේම එම දිනයේ සිට, මගේ සාක්කුවල සිදුරු නොතිබීමට වගබලාගැනීමටද මම ප්‍රවේශම්වුනෙමි" (ජෝන් ඒ. විඩ්ස්සෝගේ "නැතිවුන රත්රන් කැල්ල" *ළමා මිතුරා,* සැප්තැ. 1947, පි. 369).

සාකච්ඡාව

- ජෝන් තම කාසිය ගැන කොපමණ වාරයක් යාච්ඤාකළාද?
- පළමු වතාවේදී ජෝන් යාච්ඤාකලේ කුමක් ගැනද? (ඔහුගේ මුදල් සොයාගැනීමට ඔහුට උපකාරකරන ලෙස ස්වර්ගික පියාණන්වහන්සේගෙන් ඉල්ලීමය.)
- ජෝන්ගේ යාච්ඤාවට ලැබුන පිළිතුර කුමක්ද?
- ජෝන් දෙවන වතාවේදී යාච්ඤාකලේ කුමක් ගැනද? (ඔහුට උදව්කිරීම ගැන ස්වර්ගික පියාණන්වහන්සේට ස්තුතිකිරීමටය.)
- ඔබ යාච්ඤාකළ විටදී ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට උදව්කර තිබෙන්නේ කෙසේද?

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

අපගේ පොළොවේ දෙමාපියන් මෙන්, ස්වර්ගික පියාණන්වහන්සේ අපට ප්‍රේමකරන අතර උදව්කිරීමට සූදානම්ව සිටිනබව අවධාරනය කරන්න. අප උදව් ඉල්ලූවිට, ස්වර්ගික පියාණන් වහන්සේ අපට සවන්දෙනසේක. ඔබගේ යාච්ඤාවකට පිළිතුරු වශයෙන් ස්වර්ගික පියාණන්වහන්සේ ඔබට උදව්කල අවස්ථාවක් ගැන ළමුන්ට කියන්න.

## යාච්ඤාවලට විවිධ මාර්ගවලින් පිළිතුරු ලැබේ

ශුද්ධ ලියවිලි කථාන්තරය

බයිබලය අතැතිව ඊළඟ කථාන්තරය බයිබලයෙන් බව ළමුන්ට කියන්න.

පින්තූරය 2-34, යොහාන් බෞතීස්තයට නම්තැබීම පෙන්වා, ලූක් 1:5–17 දැක්වෙන කථාන්තරය කියන්න.

සෙකරියස් සහ එලිසබෙත් යන දෙදෙනාම ධර්මිෂ්ඨ අය බවත්, වසර ගණනාවක සිට දරුවෙකු පතා ඔවුන් යාච්ඤාකර තිබෙන බවත් පහදාදෙන්න. දැන් ඔවුන් දෙදෙනාම මහළුව සිටින අතර, ඔවුන්ට තවමත් දරුවෙකු නොමැත.

සෙකරියස් දේවමාළිගාව තුළදී පළමු වතාවට දේවදූතයා දුටු විට ඔහු පුදුමයට සහ මදක් බියටත් පත්වූ බව පහදාදෙන්න. දේවදූතයා සෙකරියස්ට කී දෙය ලූක් 1:13–14 න් ශබ්දනගා කියවන්න. දේවදූතයා පොරොන්දුවූ දෙය සිදුවූ බව සහ සෙකරියස්ට සහ එලිසබෙත්ට පිරිමි ළමයෙකු ලැබුන බව පහදාදෙන්න.

සෙකරියස්ගේ සහ එලිසබත්ගේ සියලුම යාච්ඤාවන් ස්වර්ගික පියාණන්වහන්සේ අසා තිබෙන බව අවධාරනයකරන්න. ඒ මොහොතවන තුරු ඔවුන්ගේ දරුවා උපතලැබීමට සුදුසු අවස්ථාවක් නොතිබුනි. එම බිළිඳා, යොහාන්, යොහාන් බව්තීස්තය නම් ශ්‍රේෂ්ඨ අනාගත වක්තෘවරයෙකු මෙන් වැඩෙන බව දේවදූතයා සෙකරියස්ට කීවේය. යොහාන් මෙම කාලයේ උපත ලැබූ බැවින්, බොහෝ මිනිසුන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන විශ්වාසකරමින් උන්වහන්සේව අනුගමනය කිරීමට හැකිවිය.

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

එලිසබෙත් සහ සෙකරියස් මෙන්, සමහර අවස්ථාවලදී, අපට යාච්ඤාකරන්නේ දැනට නොව, පසුකාල-යෙකදී අපට සුදුසු යම්දෙයක් ගැනය. ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ සියලුම යාච්ඤාවන් අසමින්, අපට වඩාත්ම සුදුසු ක්‍රමයකට සහ සුදුසු කාලයේදී ඒවාට පිළිතුරු දෙනසේක.

ජෝන් විඩ්ස්සෝ තම නැතිවුන රත්රන් කාසිය ගැන යාච්ඤාකළ විට, කාසිය තිබෙන තැන ගැනත්, ඔහුට එය සොාගැනීමට උදව්කරන බවත් එහෙත් "ඒ අවස්ථාව මට හොඳම අවස්ථාව බව උන්වහන්සේ සිතුවොත් පමණක්" බව ජෝන්ට සිහිපත්වූ නිසා බව ළමුන්ට මතක්කරන්න. ජෝන්ට ඒ අවස්ථාවේම කාසිය සොයාගැනීමට ලැබුනේ ඔහුට එය සොයා ගැනීමට තිබූ හොඳම අවස්ථාව එයවූ නිසාය.

සමහර අවස්ථාවලදී අපට සුදුසු නොවන දෙයක් අපි අපගේ දෙමාපියන්ගෙන් ඉල්ලිය හැකිය. එහෙත් ඔවුන් "නැත" යයි කිවහැකිය. ඒ අන්දමින්ම අපට සුදුසු නොවන බව ස්වර්ගික පියාණන්වහන්සේ සිතියහැකි යම් දෙයක් අපි උන්වහන්සේගෙන් ඉල්ලූවිට උන්වහන්සේටද කිව හැක්කේ "නැත" කියාය.

කථාන්තරය

පහත සඳහන් කථාන්තරය ඔබගේම වචනවලින් කියන්න.

මයිකල් කැස්ස නිසා අසනීපව නිවස තුල සිටියදී හිම වැටීම ආරම්භවිය—ශීත ඍතුවේ පළවෙනි විශාල හිම වැටීමය. පිටතට ගොස් හිම මත සෙල්ලම්කිරීමට මයිකල් සිය මවගෙන් අවසර ඉල්ලුවේය. නමුත් ඇය "නැත" යයි කීවාය. ඔහුගේ කැස්ස දරුණු අතට හැරෙතැයි ඇය බියවූවාය.

හිම මත සෙල්ලම් කිරීමට මයිකල්ට තදබල ආශාවක් ඇතිවිනි. එනිසා ස්වර්ගික පියාණන් වහන්සේ තම මවගේ අදහස වෙනස්කරනු ඇතැයි සිතා ඔහු යාච්ඤා කළේය. ඔහුගේ මිතුරෙකු වන ඇලෙක්ස් පැමිණ, අයිස් මත සෙල්ලම්කිරීමට කැමතිදැයි ඔහුගෙන් විමසූ විට, තමාට දිවා අහාරය ගැනීමට තිබන බවත්, නමුත් දිවා අහාරයෙන් පසුව, ඔහුට සෙල්ලම් කිරීමට හැකිවනු ඇතිබවත් කීවේය. මන්ද මව තමාට හිම මත සෙල්ලම්කිරීමට අවසරදීමට ඔහු යාච්ඤාකල බවත් කීවේය.

දිවා ආහාරයෙන් පසුව තමාට පිටතට ගොස් හිම මත සෙල්ලම්කිරීමට හැකි දැයි මයිකල් නැවතත් තම මවගෙන් ඇසුවේය. ඇය තමාට පිටතට යෑමට අවසර දෙනු ඇතැයි සිතා තමා යාච්ඤාකල බවද ඔහු ඇයට කීවේය. මයිකල්ගේ මව අසතුටුවූවාය. මයිකල් අමතු ඇය, ඔහු අද පිටතට ගොස් හිම මත සෙල්ලම්කිරීමට ස්වර්ගික පියාණන්වහන්සේ අවසර දුනහොත්, ඔහුගේ අසනීපය තවත් වැඩිවන බව කීවාය.

- මයිකල්ගේ යාච්ඤාව ස්වර්ගික පියාණන් ඇසූ බව ඔබ සිතන්නේද?
- ස්වර්ගික පියාණන්වහන්සේ එම යාච්ඤාවට පිළිතුරු දුන්නේ කෙසේද?

ඇලෙක්ස් නැවත පැමිණිවිට, තමාට පිටතට යාමට නොහැකි බව මයිකල් කීවේය. ස්වර්ගික පියාණන්වහන්සේ මයිකල්ගේ යාච්ඤාවට පිළිතුරු දී නොමැතිබව ඇලෙක්ස් කීවේය. මයිකල් පැහැදිළිකරමින්, ස්වර්ගික පියාණන්වහන්සේ තමාගේ යාච්ඤාවට පිළිතුරු දුන් නමුත්, පිළිතුරවූයේ "නැත" යන්න බවද මයිකල් පැහැදිළි කළේය.

**සාරාංශය**

සාක්ෂිය

අප හැම කෙනෙකුටම වඩාත් හොඳ කුමක්ද කියා දන්නා ස්වර්ගික පියාණන්වහන්සේ, නිතරම අපගේ යාච්ඤාවලට වඩාත් හොඳම ක්‍රමයකට පිළිතුරු සපයන බවට ඔබගේ සාක්ෂිය දරන්න. සමහර අවස්ථාවලදී කියන "ඔව්" කියන උන්වහන්සේ, සමහර අවස්ථාවලදී "නැත" කියාද කියන අතර, තවත් අවස්ථාවලදී අප යාච්ඤාකල දෙය ලබාගැනීමට මදක් බලාසිටින ලෙසද අපට කියනසේක.

සමාලෝචනය

- ජෝන් විඩ්ස්සෝගේ යාච්ඤාවට ස්වර්ගික පියාණන්වහන්සේ පිළිතුරු සැපවූයේ කෙසේද?
- එලිසබෙත් සහ සෙකරියස්ගේ යාච්ඤාවලට ස්වර්ගික පියාණන්වහන්සේ පිළිතුරු සැපවූයේ කෙසේද?
- ස්වර්ගික පියාණන්වහන්සේ මයිකල්ගේ යාච්ඤාවට පිළිතුරු සැපවූයේ කෙසේද?

ස්වර්ගික පියාණන්වහන්සේ "නැත" හෝ "ඔව්" හෝ "මේ අවස්ථාවේ නොවේ" කියා පිළිතුරු දුන්නද, උන්වහන්සේගේ පිළිතුරු පිළිගන්නා ලෙස ළමුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් හොඳින් ගැලපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චි කල හැකිය. අමතර උපදෙස් සඳහා, “පංති වෙලාව” “ගුරු උපකාර” කොටස බලන්න.

1. ළමුන් දැන් දෙමාපියන් සේ ව්‍යාජ ලෙස රඟපා, තම ළමුන්ට වඩාත් හොඳ දෙය කුමක්දැයි තීරණය-කිරීමට යන බව කියන්න. ඔවුන්ගේ ළමයින් විසින් කරන එක් එක් ඉල්ලීමට “ඔව්” “නැත” හෝ “මේ අවස්ථාවේ නොවේ” කියා පිළිතුරු දෙන ලෙස ඔවුන්ට කියන්න. පහත සඳහන් අවස්ථාවන් හෝ ඔබගේම නිර්මානයන් පාවිච්චි කරමින් ළමුන් ඉල්ලිය හැකි යම් යම් දේවල් විස්තරකරන්න. එක් එක් අවස්ථාවට උචිත ප්‍රතිචාරය කුමක්දැයි සාකච්ඡා කරන්න.

   අ. එය රාත්‍රී ආහාර වේලාවය. ඔබගේ ළමයා උණුසුම්ව කුසගිනිව සිටිමින් අයිස් ක්‍රීම් එකක් කෑමට ඉල්ලයි.

   - ඔබ කියන්නේ කුමක්ද?
   - ඔබ එසේ කියන්නේ මන්ද?

   ආ. එය ශීතල වර්ෂා දිනයකි. පිටතට ගොස් ක්‍රීඩාකිරීම සඳහා ඇඳගැනීමට ඔබගේ ළමයා නාන ඇඳුමක් ඉල්ලයි.

   - ඔබ කියන්නේ කුමක්ද?
   - ඔබ එසේ කියන්නේ මන්ද?

   ඇ. ඔබගේ ළමයින් ඔවුන්ගේ වැඩ සියල්ලම නිමාකර ඇත. තවමත් දහවල්වී නොමැත. පිටතට ගොස් ක්‍රීඩාකිරීමට හැකිදැයි ඔවුහු අසති.

   - ඔබ කියන්නේ කුමක්ද?
   - ඔබ එසේ කියන්නේ මන්ද?

   ඈ. ඔබගේ ළමයා ක්‍රීඩා භාණ්ඩයක් මිළදී ගැනීමට මුදල් ඉතිරිකරමින් සිට අවසානයේදී එය ප්‍රමාණවත් වෙයි. ක්‍රීඩා භාණ්ඩය මිළදීගැනීමට වෙළඳසැලට දැන්ම යන ලෙස ඔහු කියයි. ඔබ (දෙමාපියා) තව මිනිත්තු කිහිපයකින් වෙළඳසලට යාමට සිටියි.

   - ඔබ කියන්නේ කුමක්ද?
   - ඔබ එසේ කියන්නේ මන්ද?

   ඉ. ඔබගේ ළමයා අශ්වයන්ට කැමැත්තක් දක්වන අතර, ඇය සතුව අශ්වයෙක් අවශ්‍යබව කියයි. ඇයගේ වයස අවුරුදු පහක් පමණි.

   - ඔබ කියන්නේ කුමක්ද?
   - ඔබ එසේ කියන්නේ මන්ද?

   ඊ. ඔබගේ ළමයි ඔවුන්ගේ ක්‍රීඩා භාණ්ඩ හෝ පොත් ප්‍රවේශම් නොකරයි. ඔවුන්ට තිබෙන ඒවා ප්‍රවේශම්කරනු වෙනුවට ඔවුන් අළුත් ඒවා මිළදීගැනීමට කියයි. වෙළඳසලේදී තමන්ගේ ප්‍රියතම පොතක් දකින ඔවුහු එය ලබාගැනීමට හැකිදැයි අසති.

   - ඔබ කියන්නේ කුමක්ද?
   - ඔබ එසේ කියන්නේ මන්ද?

දෙමාපියන්ට අවශ්‍යවන්නේ ඔවුන්ගේ ළමයින් සඳහා හොඳම දෙය කිරීම බව පහදා දෙන්න. ස්වර්ගික පියාණන්ටද අවශ්‍යවන්නේ උන්වහන්සේගේ දරුවන්ට හොඳම දෙය ලබාදීමය. ස්වර්ගික පියාණන්වහන්සේ අපගේ යාච්ඤාවලට නිතරම පිළිතුරු දෙන අතර, උන්වහන්සේ ඒවාට පිළිතුරු දෙන්නේ අපට හොඳම අකාරයටය. අපගේ මෙළොව දෙමාපියන් සමහර අවස්ථාවලදී, "ඔව්", "නැත" හෝ "මේ අවස්ථාවේ නොවේ" යයි කියන පරිදිම, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේද සමහර අවස්ථාවලදී අපගේ යාච්ඤාවලට, "ඔව්" කියාද, සමහර අවස්ථාවලදී "නැත" කියාද, තවත් සමහර අවස්ථාවලදී "මේ අවස්ථාවේ නොවේ" කියාද පිළිතුරු දෙනසේක.

2. ජෝන් ඒ. විඩ්ට්සෝගේ කථාන්තරය ප්‍රකාශකිරීම වෙනුවට, ඔබගේ ප්‍රදේශයේ තිබේ නම්, *ආරම්භක පාඨමාලා වීඩියෝපටය,* 1වන කාණ්ඩය, 16 වන කොටස, "නැතිවුන රත්රන් කැල්ල" (53178, 3:08) පෙන්වන්න.

3. ඔබගේ ප්‍රාථමිකයේ සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව, "ළමයෙකුගේ යාච්ඤාව" (*ළමා ගී පොත,* පි. 12), නම් ගීතය ළමුන් වෙනුවෙන් ගායනාකිරීමට අමුත්තන් කිහිප දෙනෙකුට ආරාධනා කරන්න.

4. "මට කියන්න, ආදර පියාණෙනි" (ළමා ගී පොත, පි. 176), හෝ "මට ඇවසියි මගේ සුර පියාණන්" (ළමා ගී පොත, පි. 18), ගීත ගායනාකරන්න. නැතහොත් වචන කියන්න.

මට කියන්න, ආදර පියාණෙනි

මට කියන්න ආදර පියාණෙනි, ඔබගේම මාර්ගෙන් මම යදිම්,
ඔබගේ කැමත්ත කුමක්ද මා කියන සහ කල යුතු අද දින.
ඔබගේ කැමැත්ත දැනගෙන කිරීමටමට උගන්වන්න, අහෝ සාමිනි;
ඔබගේ ප්‍රේමවචන තේරුම්ගැනීමට මට උදව්කරන්න.

මට මග පෙන්වයි ඔබගේ ප්‍රේමනීය සුරතින්;
ඔබගේ හඬ අසමින්, කීකරුයි ඔබගේ ආසිරි පණත්වලට.
හැම මොහොතෙම දැනගැන්මට ඔබතුමා සමීපබව
ලැබදෙයි ශක්තිය, දුරුවෙයි සැම බිය.

මට ඇවසියි මගේ සුර පියාණන්
මට ඇවසියි මගේ සුර පියාණන්
සැම දින කිරීමට උදව්
ඇවසියි එතුමාට සිටීම මා සතුටින්
දැහැමි මග තෝරාගැනීමට
ඇවසියි එතුමාට සිටීම මා සතුටින්
දැහැමි මග තෝරාගැනීමට

19
වෙනි
පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මට ප්‍රේමකරනසේක


**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියලුම ළමුන්ට ප්‍රේමකරමින් ආශිර්වාදකිරීම ගැන එක් එක් ළමයාට හැඟීමක් ඇතිකරගැනීමට උපකාර කිරීමය.

**සූදානම්වීම**

1. මතෙව් 25:34–40, මාර්ක් 10:13 සහ 3 නිෆායි 17 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.

2. හැකි නම්, ක්‍රීඩාව නැවත කිරීමට පහත සඳහන් ද්‍රව්‍ය සූදානම්කරගන්න:
   අ. ගොරෝසු කොළයකින් පිඟානක ප්‍රමාණයට රවුමක් කපාගන්න. රවුමෙන් තුනෙන් එකක් පමණ රතු පාටින්ද, තුනෙන් එකක් කහ පාටින් සහ තුනෙන් එකක් නිල් පාටින්ද පාට කරන්න.



   ආ. පාට කල කාඩ් හෝ කොලකෑලි දොළහක් සකස්කරගන්න: රතුපාටින් හතරක්ද, කහපාටින් හතරක් සහ නිල් පාටින් හතරක් වශයෙනි (විශාල පංතියකට නම්, වැඩිපුර කාඩ් අවශ්‍යවේ).
   ඇ. හැම කාඩ් එකකම පහත සඳහන් පරිදි සමාලෝචන ප්‍රශ්නයක් ලියන්න:

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රේමකරන්නේ කාටද?

   යේසුස්වහන්සේ ඔබට ප්‍රේමකරන බව ඔබ දන්නේ කෙසේද?

   "ළදරුවන් මා ළඟට එන්ට හැරපල්ලා" මෙසේ කීමෙන් යේසුස්වහන්සේ අදහස් කලේ කුමක්ද?

   දෙමාපියන් තම ළදරුවන්ව යේසුස්වහන්සේ දැකගැනීමට ගෙන ආ විට, යේසුස්වහන්සේගේ ගෝලයන් (උදව්කරුවන්) උත්සාහ කළේ කුමක් කිරීමටද?

   යේසුස්වහන්සේ අමෙරිකාවේ රෝගීන්ට සහ හිරිහැරයට පත් ජනතාවට ප්‍රේමකරන බව පෙන්වූ-යේ කෙසේද?

   අමෙරිකාවේ ළමයින්ට ආශිර්වාද කිරීමෙන් පසුව යේසුස්වහන්සේ කලේ කුමක්ද?

   යේසුස්වහන්සේ තම දරුවන්ට ආශිර්වාදකිරීමෙන් පසුව අමෙරිකාවේ දෙමාපියන් දුටු, එම දරුවන් සමග සිටගෙන සිටි පුද්ගලයා කවුද?

   යේසුස්වහන්සේ ළමුන්ට ආශිර්වාද කළේ මන්ද?

   යේසුස්වහන්සේට අපගේ ප්‍රේමය අප පෙන්වන්නේ කෙසේද?

   ඈ. පිට පැත්තේ ප්‍රශ්නාර්ථයක් අඳින ලද කුඩා පෙට්ටියක හෝ මල්ලක කාඩ් ටික දමන්න.
   ඉ. පාට කල රවුමට දැමීමට හැකි බොත්තමක් හෝ කාසියක් ගෙනෙන්න.

3. "එම රසවත් කථාව කියවූවිට මම සිතමි" ගීතයේ පද දෙකම ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්-වන්න (*ළමා ගී පොත*, පි. 56). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් සහ මෝර්මන්ගේ පොතක්
   ආ. පින්තූරය 2-35, ක්‍රිස්තුස්වහන්සේ සහ ළමයි (සුභාරංචි කලා පින්තූර කට්ටලය 216; 62467); පින්තූරය 2-36, යේසුස්වහන්සේ නිෆායිට් ළමුන්ට ආශිර්වාදකිරීම.

5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

---

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුඩා ළමුන්ට ප්‍රේමකරමින් ඔවුන්ට ආශිර්වාදකලසේක

සමාලෝචන ක්‍රීඩාව සඳහා වන කාඩ් සහිත පෙට්ටිය හෝ මල්ල පෙන්වන්න. පාඩම අවසානයේදී ඔවුන් ක්‍රීඩාවක් කිරීමට යන බව ළමුන්ට කියන්න. ක්‍රීඩාවේ ඇතුළත්වන ප්‍රශ්න වලට පිළිතුරු දැනගැනීම සඳහා ඔවුන් පාඩමට ප්‍රවේශමෙන් යුතුව සවන්දීම අවශ්‍යවේ.

අවධානශීලී ක්‍රියාකාරකම

"එම රසවත් කථාව කියවූ බව මම සිතමි" ගීතයේ පද දෙකම ළමයින් සමග ගායනා කරන්න. නැතහොත් වචන කියන්න. (ළමයින් ගීතය නොදන්නේ නම්, එය ඔවුන්ට උගන්වන්න. නැතිනම් ගායනාකරන්න.) ගීතයේ වචන සාකච්ඡාකර, යේසුස්වහන්සේ ඔවුන්ගේ කර වටා අත දමාගෙන සිටීමට හෝ ඔවුන්ගේ හිස මත අත තබාගෙන සිටීමට හෝ ලැබීම කෙතරම් ආස්වාදජනක දෙයක්දැයි සිතාබැලීමට ඔවුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි කථාන්තරය

පින්තූරය 2-35, ක්‍රිස්තුස්වහන්සේ සහ ළමයි ප්‍රදර්ශනයකර, බයිබලය පෙන්වන්න. ඔබ පැවසීමට යන කථාන්තරය බයිබලයේ තිබෙන බව පැහැදිළිකරන්න. මාර්ක් 10:13–16 දැක්වෙන කථාව කියන්න.

යේසුස්වහන්සේ උගන්වමින් සිටින අතර ළමයින් පැමිණ උන්වහන්සේට බාධා පමුණුවා, කරදරකරනු ඇතැයි ගෝලයන් බියවූ බව පහදාදෙන්න. නමුත් ගැලවුම්කරුවාණන්ට අවශ්‍යවූයේ ළමුන් තමන්වහන්සේ සමීපයට පැමිණීමය. මාර්ක් 10:14 (*ළදරුවන් මා ළඟට එන්ට හැරපල්ලා,* යන්නෙන් පටන්ගෙන) ශබ්දනගා කියවන්න. මෙම ශුද්ධ ලියවිල්ලේ *ඉවසපල්ලා*, යන්නෙහි අදහස ඉඩ දීම හෝ අවසරදීම බව පහදාදෙන්න. යේසුස්වහන්සේගේ වචන වන *ඉවසන්න* යන්නට *ඉඩදෙන්න* යන වචනය ආදේශකර, වෙතට යන වචනය ඉවත්කර නැවත කියවන්න: "බිළිඳුන් මා වෙතට එන්න ඉඩදෙන්න."

- ළමුන් උන්වහන්සේ වෙතට පැමිණිවිට යේසුස්වහන්සේ කුමක් කළසේක්ද?

මාර්ක් 10:16 ශබ්දනගා කියවන්න, යේසුස්වහන්සේ කුමක් කළේදැයි දැනගැනීමට ළමුන්ට උදව්කිරීම සඳහා, 17වෙනි පාඩමෙන් පූජකවරය ගැන ඔවුන් ඉගෙනගත් දේවල් ඔවුන්ට මතක්කර දෙන්න. අපගේ පියවරු හෝ වෙනත් පූජකවරය උසුලන්නන් විසින් අපට දෙනු ලබන ආශිර්වාද යේසුස්වහන්සේ විසින් අපට දෙනු ලබන ආශිර්වාදවලට සමාන බව පහදාදෙන්න.

- ළමයින් තමා වෙතට පැමිණීම යේසුස්වහන්සේට අවශ්‍යවූයේ මන්ද? (උන්වහන්සේ ඔවුන්ට ප්‍රේමකල නිසා ඔවුන්ට ආශිර්වාදකිරීමට අවශ්‍යවූ නිසාය.)

උන්වහන්සේ වැඩිහිටියන්ට ඉගැන්වීමේ නිරතව සිටියද, යේසුස්වහන්සේ ඔවුන්ව වඩාගෙන ඔවුන්ට ආශිර්වාදකිරීමට කාළය මිඩංගු කළේ, උන්වහන්සේ තුල බිළිඳුන්ට තිබූ විශාල ප්‍රේමය නිසා බව පෙන්වා හන්න.

සාක්ෂිය

යේසුස්වශන්සේ ළමයින්ට ප්‍රේමකරන බවට ඔබගේ සාක්ෂිය දරන්න. "එම රසවත් කථාව මම කියවූ බව මම සිතමි" යන ගීතය ළමුන් සමග නැවත ගායනාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

ශුද්ධ ලියවිලි කථාන්තරය

පින්තූරය 2-36, යේසුස්වහන්සේ නිෆායිට් ළමුන්ට ආශිර්වාද කිරීම ප්‍රදර්ශනය කරන්න. ළමුන්ට පින්තූරය දෙස බැලීමට සලස්වා, ඔවුන් එහි දකින දෙය කුමක්දැයි ඔබට කීමට කියන්න. මෝර්මන්ගේ පොත පෙන්වන්න. යේසුස්වහන්සේ අමෙරිකාවේ ජනතාවට මෙන්ම ශුද්ධවූ දේශයේ ජනතාවටද ඉගැන්වූ බව සහ උන්වහන්සේගේ අමෙරිකා ගමන ගැන මෝර්මන්ගේ පොතේ විස්තර කෙරෙන බවද පහදාදෙන්න. 3 නිෆායි 17 දැක්වෙන කථාව කියන්න.

අමෙරිකාවේ ජනතාවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වීම අවසන්කල විට, උන්වහන්සේ ඔවුන්ගෙන් සමුගැනීම ගැන ඔවුහු අකමැතිවූ බව පහදාදෙන්න. යේසුස්වහන්සේ ජනතාවට බොහෝ සේ ප්‍රේමකල නිසා, රෝගීන්ටද, හිරිහැරයට පත්වූවන්ට සහ ආබාධිතයන්ටද උන්වහන්සේ ආශිර්වාදකර ඔවුන්ව සුවපත්කලසේක (බලන්න 3 නිෆායි 17:7–10).

ඉන්පසුව සියලුම කුඩා දරුවන් තමන්වහන්සේ වෙතට ගෙන ඒමට යේසුස්වහන්සේ කීසේක. ඔවුන්ව තමන්වහන්සේ වටා රැස්කල උන්වහන්සේ අසිරිමත් යාච්ඤාවක් කීසේක (බලන්න 3 නිෆායි 17:11–15).

මෙම යාච්ඤාවේ වචන එතරම්ම ශ්‍රේෂ්ඨ සහ අසිරිමත් බැවින් ඒවා ලියා තැබීමට පවා නොහැකි බව මෝර්මන්ගේ පොතේ සඳහන්වන බව ළමුන්ට කියන්න (බලන්න 3 නිෆායි 17:15).

ඉන්පසුව යේසුස්වහන්සේ කුඩා දරුවන් එකිනෙකා වඩාගෙන ඔවුන්ට ආශිර්වාදකර, ඔවුන් වෙනුවෙන් ස්වර්ගික පියාණන්වහන්සේට යාච්ඤාකල බව පහදාදෙන්න. බලා සිටි දෙමාපියන්ට දේවදූතයන් ඔවුන්ගේ ළමුන් සමග සිටින බව දැකගත හැකිවිය (බලන්න 3 නිෆායි 17:21–24). ඔවුන් වෙනුවෙන් යේසුස්වහන්සේ තුල තිබූ ශ්‍රේෂ්ඨ ප්‍රේමය අත්විඳීමට එහි සිටි සියලුම මිනිසුන්ට හැකිවිය.

සාකච්ඡාව

- යේසුස්වහන්සේ ළමුන්ට ආශිර්වාදකර ඔවුන් වෙනුවෙන් යාච්ඤා කල විට ඔවුන්ට ඇතිවූ හැඟීම් ගැන ඔබගේ අදහස කුමක්ද?
- ඔබ යේසුස්වහන්සේ ගැන සිතනවිට ඔබට ඇතිවන හැඟීම කුමක්ද?

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රේමකරනසේක

සාකච්ඡාව

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පෞද්ගලිකවම දැනට මෙහි නොසිටියද, උන්වහන්සේ පොළොව මත සිටියදී එකල ජීවත්ව සිටි ළමුන්ට ප්‍රේමකල තරම්ම, අපටද ප්‍රේමකරන බව පහදාදෙන්න.

- යේසුස්වහන්සේ අපට ප්‍රේමකරන බව අප දැනගන්නේ කෙසේද? (පිළිතුරුවලට පහත සඳහන් කරුණු ඇතුළත්විය හැකිය: උන්වහන්සේ අප වෙනුවෙන් පොළොව මැවූසේක; උන්වහන්සේ අපට අනුගමනයකිරීමට පණත් දුන්සේක; උන්වහන්සේ අප වෙනුවෙන් සිය ජීවිතය දුන්සේක; උන්වහන්සේ සභාවට මගපෙන්වමින් තම අනාගතවක්තෘවරුන්ගේ මාර්ගයෙන් අපට කථාකරනසේක; උන්වහන්සේ අප වෙනුවෙන් යහපත් ආදර්ශයක් තැබූසේක.)

ළමා සහභාගීත්වය

ස්වර්ගික පියාණන්වහන්සේගේ මගපෙන්වීම යටතේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොවද, ඒ මත සියලුම ගස්වැල් සහ සතුන්ද මැවූබව ළමුන්ට සිහිපත්කරන්න.

ළමුන් ප්‍රියකරන සතෙක් හෝ ගසක් නම්කිරීමට හැම ළමයෙකුටම කියන්න. යේසුස්වහන්සේ විසින් මවන ලද මෙම දේවල් ළමුන් දකිනවිට, යේසුස්වහන්සේ ඔවුන්ට ප්‍රේමකරන බව ඔවුන්ට සිහිපත්වේ.

පින්තූර සාකච්ඡාව

පින්තූරය 2-35, ක්‍රිස්තුස්වහන්සේ සහ ළමයි සහ 2-36, යේසුස්වහන්සේ නිෆායිට් ළමුන්ට ආශිර්වාදකිරීම නැවතත් පෙන්වන්න.

- යේසුස්වහන්සේ මෙම ළමුන්ට ප්‍රේමකරන නිසා ඔවුන් සතුටින් සිටින බව ඔබ සිතනවාද?
- යේසුස්වහන්සේ ඔබට ප්‍රේමකරන නිසා ඔබ සතුටුවන්නේද?

## අපි යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකරන බව උන්වහන්සේට පෙන්වීමට අපට පුළුවන

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොව මත නොසිටියද, උන්වහන්සේ අපට දක්වන ප්‍රේමයට අප ගේ ස්තුතිය පළකිරීමෙන්, අප තුල උන්වහන්සේට තිබෙන ප්‍රේමය පෙන්වීමට අපට පුළුවන. අප යේසුස්වහන්සේට ප්‍රේමකරන බව පෙන්වීමේ එක් මාර්ගයක් නම්, උන්වහන්සේගේ පණත් තැබීම බව පහදාදෙන්න.

ශුද්ධ ලියවිල්ල

යේසුස්වහන්සේට අපතුල ඇති ප්‍රේමය උන්වහන්සේට පෙන්වීමේ තවත් මාර්ගයක් ගැන ළමුන්ට කීම සඳහා මතෙව් 25:40 ශබ්දනගා කියවන්න. (*රජතුමා* යනු යේසුස් ක්‍රිස්තුස්වහන්සේට යෙදෙන තවත් නමක් බව පහදාදෙන්න.)මෙම ශුද්ධ ලියවිල්ලෙන් ගැලවුම් කරුවාණන්වහන්සේ අපට කියන්නේ, අපි අන් අයට කරණාවන්ත නම්, එය උන්වහන්සේට කරුණාවන්තවීමට සමාන බව යයි පහදාදෙන්න. අපි අන් අයට කරුණාවන්ත ලෙස සළකන විට, අප යේසුස්වහන්සේට ප්‍රේමකරන බව අපි උන්වහන්සේට පෙන්වන්නෙමු.

ක්‍රීඩාව සමාලෝචනයකිරීම

අද පාඩමෙන් ළමුන් ඉගෙනගත් දේවල් ඔවුන්ට සිහිපත්කිරීමට උපකාරවත්වීම සඳහා පහත දැක්වෙන ක්‍රීඩාවන් කරන්න. (ක්‍රීඩාවලට අවශ්‍ය සියලුම උපකරණ සූදානම්කිරීම අපහසු නම්, අවශ්‍ය පරිදි ක්‍රීඩාව සකස්කරගන්න. නැතහොත්, සූදානම්වීම කොටසේ දැක්වෙන ප්‍රශ්න කියවා ළමුන්ට වාර අනුව ඒවාට පිළිතුරුදීමට කියන්න.)

පෙට්ටියේ හෝ මල්ලේ තිබෙන කාඩ්පත් පිටතට ගෙන, ඒවායෙහි පාට අනුව මුහුණ පහතට හරවා පොළොව මත හෝ මේසය මත ගොඩගසන්න. පාට කල රවුම් කාඩ්පත් ළඟ තබන්න.

බොත්තමක් හෝ කාසියක් රවුම මතට දැමීමට ළමයෙකුට කියා, ඉන්පසුව බොත්තම වැටුන ප්‍රදේශයේ ඇති රවුමේ පාටට සරිලන පාට තෝරාගැනීමට ඔහුට කියන්න. කාඩ්පතේ සඳහන් ප්‍රශ්නය ශබ්දනගා කියවා, ප්‍රශ්නයට පිළිතුරුදීමට ළමයාට කියන්න. හැම ළමයෙකුටම වාරයක් ලබාදෙන්න.

කාඩ්පත ගත් ළමයාට පිළිතුරුදීමට නොහැකි නම්, අවශ්‍ය පරිදි සංඥාවන් දීමට ඔබට හෝ අන් පංති සාමාජිකයන්ට පුළුවන. කාලය තිබේ නම්, කිසිදු සංඥාවක් නොදී ක්‍රීඩාව නැවත කරන්න. යේසුස්වහන්සේ ගැන සහ උන්වහන්සේ ඔවුන්ට ඇති ප්‍රේමය ගැන ළමුන් එපමණටම දැනසිටීම ගැන ඔවුන්ට ප්‍රශංසා කරන්න.

### සාරාංශය

සාක්ෂිය

යේසුස්වහන්සේ ඔවුන් හැම කෙනෙකුටම ප්‍රේමකරන බව සහ නිතරම ඔවුන්ට ප්‍රේමකරන බවද ළමුන්ට කියන්න. යේසුස්වහන්සේගේ ළමුන් සමග සිටීමට සතුටුවන අතර, ඔවුන්ට උපකාර කරමින් ආශිර්වාදකිරීමට කැමැත්තෙන් සිටිනසේක. ඔබගේ පංතියේ හැම ළමයෙකුටම යේසුස්වහන්සේ ප්‍රේමකරමින් ඔවුන්ව අගයකරන බවට ඔබගේ සාක්ෂිය දරන්න.

යේසුස්වහන්සේ ළමුන්ට ප්‍රේමකරන නිසා, ඔවුන් වෙනුවෙන් උන්වහන්සේ කල සියලුම දේවල් ගැන සතිය තුළදී සිතාබැලීමට ඔවුන්ව දිරිගන්වන්න. ඔවුන් සිතන දේවල් ගැන ලැයිස්තුවක් සාදා හෝ ඒවා චිත්‍රයට නගා, එම ලැයිස්තුව හෝ චිත්‍ර ඊළඟ සතියේදී ප්‍රාථමිකයට රැගෙන ඒමට ළමුන්ට කීමට ඔබට අවශ්‍යවිය හැකිය.

පණත්වලට කීකරුවීමෙන් සහ අන් අයට කරුණාවන්තවීමෙන් ඔවුන් යේසුස්වහන්සේට ප්‍රේමකරනබව පෙන්වීමට ඔවුන්ට හැකි බව ළමයින්ට සිහිපත්කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. යේසුස් ක්‍රිස්තුස්වන්සේට සහ උන්වහන්සේ දක්වන ප්‍රේමයට ස්තුතිවන්තවීමට ළමයාට යෝජනාකරන්න.

ළමයින් පංතියෙන් පිටවයන විට, එක් එක් ළමයාට මෙසේ කොඳුරා කියන්න. "යේසුස්වහන්සේ ඔබට ප්‍රේමකරනවා මෙන්ම, මමද ඔබට ප්‍රේමකරමි."

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් හොඳින් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් ලෙසද පාවිච්චිකල හැකිය. අමතර මගපෙන්වීම් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. තද කඩදාසියකට සවිකල කුඩා කැඩපතක් පංතියට රැගෙන එන්න. ළමයින්ට කැඩපත බැලීමට ඉඩනොදෙන්න. කඩදාසියේ පිට පැත්තෙන් අල්ලාගෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බොහෝසේ ප්‍රේමකරන යම් කිසිවෙකුගේ රහසිගත පින්තූරයක් ඔබ සතුව තිබෙන බව ඔබගේ පංතියට කියන්න. වරකට එක් ළමයා බැගින් පැමිණ එම "පින්තූරය" බැලීමට කියන්න. හැම කෙනෙකුටම පින්තූරය බැලීමට වාරයක් ලැබෙන තුරු, පින්තූරය රහසක් ලෙස තබාගැනීමට ඔවුන්ට කියන්න. ඔවුන් හැම කෙනෙකුටම යේසුස්වහන්සේ ප්‍රේමකරන බව ළමයින්ට මතක්කරන්න.

2. "යේසුන් බිළිඳුන්ට ප්‍රේමකළහ" (*ළමා ගී පොත*, පි. 59) හෝ "මට මගේ ගැලවුම්කරුගේ ප්‍රේමය හැඟේ" (*ළමා ගී පොත*, පි. 74) ගීතය ගායනාකරන්න. නැතහොත් වචන කියන්න. මෙම ගීතවලට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

3. පහත සඳහන් පදය ක්‍රියාකාරීව කිරීමට ළමුන්ට උදව්කරන්න:


   ජේසුන් සියලුම ළමුන්ට ප්‍රේමකරති

   ජේසුන් සියලුම ළමුන්ට ප්‍රේමකරති (අත් පිටතට විහිදා පෙන්වන්න).
   කුඩා දරුවන් තාමත් පොඩි (අත්වලින් දණහිස දක්වා උස ළමයෙකු පෙන්වන්න).
   බිළිඳා තොටිල්ලෙ සිටින (අත්වලින් තොටිල්ලක් පෙන්වන්න).
   උස සහ බොහොම පොඩි අයටද (හිසට උඩින් අත් ඔසවන්න).
   (From *Finger Fun For Little Folk* by Thea Cannon. © 1949 by the Standard Publishing Company, Cincinnati, Ohio. Used by Permission.)

   ඔබට අවශ්‍ය පරිදි වාර ගණනාවක්ම කරන්න.

4. එක් එක් ළමයා සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ චිත්‍රයේ පිටපතක් ළමයින් සමග එක්ව සකස්කරන්න (පාඩමේ අවසානයේ දක්වා ඇත). පින්තූරයේ දැක්වෙන ළමුන්ගේ මුහුණු ළමුන් ලවා ඇඳීමට සලස්වා, ඉන්පසු ඔවුන් ඇඳි චිත්‍ර පාටකිරීමට කියන්න. හැම ළමයෙකු සඳහාම චිත්‍රයක් සකස්කිරීමට ඔබට නොහැකි නම්, එක් පිටපතක් සකස්කර, පින්තූරයේ සිටින ළමුන්ගෙන් එක් ළමයෙකුගේ චිත්‍රයක් පාටකිරීමට ඔබගේ පංතියේ හැම ළමයෙකුටම කියන්න.

   යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොළොවේ ජීවත්ව සිටි කාලයේ ඔවුන්ද ජීවත්ව සිටියා නම්, උන්වහන්සේ ඔවුන්වද සිය දෑතට ගෙන ආශිර්වාදකිරීමට ඉඩ තිබුන බව ළමුන්ට කියන්න. දැනට යේසුස්වහන්සේ පොළොවේ නොමැතිවුවද, පොළොවේ සිටින සියලු දෙනාටම උන්වහන්සේ තවදුරටත් ප්‍රේමකරන බව සිහිපත්කරන්න.



# 20
වෙනි
පාඩම

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අනගි නිධානයකි

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් ගැන වැඩිදුරටත් ඉගෙනගනීමට එක් එක් ළමයාට තිබෙන ආශාව පෝෂණය කිරීමය.

**සූදානම්වීම**

1. දහම සහ ගිවිසුම 19:23–24 සහ ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:14–20 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න. මතෙව් 3:13–16; 4:1–11; 6:9; මාර්ක් 10:13–16; 3 නීෆායි 18:19; සහ සුභාරංචි මූලධර්ම (31110) 10වෙනි පරිච්ඡේදයද බලන්න.
2. *යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අනගි නිධානයකි* යයි කඩදාසියක ලියන්න. කඩදාසිය නවා එය කුඩා පෙට්ටියක හෝ භාජනයක දමන්න. එම භාජනය පංති කාමරයේ සඟවන්න. එය සොයාගැනීමට පහසු ස්ථානයක්වීමට වගබලාගන්න. (ඔබගේ පංතියේ ළමුන්ට කියවීමට නොහැකි නම්, ඒ වෙනුවට යේසුස්වහන්සේගේ පින්තූරයක් හෝ බයිබලයක් හෝ මෝර්මන්ගේ පොතක් සඟවන්න.
3. අවශ්‍ය උපකරණ:
   අ. ශුද්ධ ලියවිලි පොත් දෙකක්
   ආ. ඔබට පෞද්ගලිකව වටිනා උපකරණයක්
   ඇ. බෝංචි බෑගයක් හෝ වෙනත් මෘදු ද්‍රව්‍යයක්
   ඈ. පින්තූරය 2-37, කන්ද උඩ දේශනාව (සුභාරංචි කලා පින්තූර කට්ටලය 212; 62166); පින්තූරය 2-38, පළමු දර්ශනය (සුභාරංචි කලා පින්තූර කට්ටලය 403; 62470); පින්තූරය 2-39, ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයා (සුභාරංචි කලා පින්තූර කට්ටලය 401; 62002); ජීවමාන අනාගතවක්තෘවරයාගේ පින්තූරයක් (සභා සඟරාවකින් හෝ රැස්වීම් ශාලාවේ පුස්තකාලයෙන්).
4. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයා බලන්න. යේසුස්වහන්සේ ළමුන්ට ප්‍රේමකරන නිසා උන්වහන්සේ ඔවුන් වෙනුවෙන් කල දේවල්වල ලැයිස්තුවක් හෝ චිත්‍රයක් ඇඳීමට ඔබ ඔවුන්ට කියා තිබේ නම්, මෙම ලැයිස්තු හෝ චිත්‍ර ගැන මිනිත්තු කිහිපයක් සාකච්ඡාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

### අපට බොහෝ නිධාන ඇත

අවධානශීලී ක්‍රියාකාරකම

පෞද්ගලික වටිනාකමකින් යුත් ඔබ රැගෙන ආ භාණ්ඩය ළමුන්ට පෙන්වන්න. එම භාණ්ඩය ගැන, එය පාවිච්චිකරන අන්දම, එය ඔබට ලැබුන අන්දම, හෝ එය කොපමණ කාලයක් ඔබ සතුව තිබුනේද වැනි තොරතුරු ස්වල්පයක් කියන්න. එය ඔබට වැදගත්වන අන්දමත්, එය නැතිවුනහොත්, සොරකම්කලහොත්, හෝ කැඩී බිඳී ගියහොත් ඔබට කෙතරම් කණගාටුවක් දැනෙන්නේදැයි පෙන්වා දෙන්න. මෙම භාණ්ඩය ඔබගේ එක් නිධානයක් බව පහදාදෙන්න.

- නිධානයක් යනු කුමක්ද? (යම් ඉතා වටිනා දෙයකි.)

කථාන්තරය

ඉතා වටිනා යමක් සන්තකයේ තිබූ ළමයෙකු ගැන කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාන්තරය කීමට ඔබට අවශ්‍යවිය හැකිය:

රූත්ගේ පාසල් මිතුරියක් සතුව මාල පෙත්තක් තිබූ අතර ඇය එය දිනපතාම පාසලට පැළඳගෙන ගියාය. රූත් සිතුවේ ඇය දැක තිබූ ඉතාමත්ම ලක්ෂණ මාල පෙත්ත එය බවය. එවැනි එකක් තමාටත් තිබුනේ නම් හොඳයයි ඇය සිතුවාය.

රූත්ගේ උපන් දිනයදා උදෑසන, ඇයගේ මව ඇයට ත්‍යාගයක් දුන්නාය. එය ලක්ෂණ කඩදාසියකින් සහ රිබන් පටියකින් ඔතන ලද කුඩා පෙට්ටියකි. එය තුළ ලක්ෂණ රත්රන් මාල පෙත්තක් තිබෙන බව ඇය දුටුවාය. එය හදවතක හැඩයෙන් තිබූ අතර, එහි මැද දිළිසෙන රෝසපාට ගලක් අල්ලා තිබින. රූත්ට සිය ඇස් අදහාගත නොහැකිවිය.

සාකච්ඡාව

- මාල පෙත්ත ගැන රූත්ට ඇතිවූ හැඟීම් ගැන ඔබට කුමක් සිතෙන්නේද?
- ඔබට තිබෙන යම් නිධාන මොනවාද? (සුරතලෙක්, ප්‍රියතම සෙල්ලම්බඩුවක් හෝ පොතක්, හෝ ආභරණ වැනි යමක් යෝජනාකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.)

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වචනද ශ්‍රේෂ්ඨ නිධානයකි

නිධානය සෙවීමේ ක්‍රියාකාරීත්වය

අප හැම කෙනෙකුටම සතු කරගත හැකි අන් සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ නිධානයක් තිබෙන බව පහදාදෙන්න (ළමුන්ගේ නිධාන වශයෙන් ඔවුන් සඳහන් කල සමහර දේවල් කිහිපයක් නම්කරන්න). අපට සතුකර ගැනීමට හැකි වෙනත් ඕනෑම භාණ්ඩයකට වඩා මෙම නිධානයට බොහෝ වටිනාකමක් ඇත. මෙම නිධානය මුදල්වලට මිළදී ගත නොහැකිය. එසේම එය කඩාදැමීමට හෝ සොරකම්කිරීමට හෝ නොහැකිය. මෙම නිධානය කොතරම් වටින්නේද යත්, බොහෝ මිනිසුන් මෙය ලබාගැනීම සඳහා ඔවුන් සතු සෑම දෙයක්ම අත්හැරීමට වුවද කැමතිවේ. සමහරු ඒ සඳහා ඔවුන්ගේ ජීවිත පවා පූදකිරීමට සූදානම්ය.

මෙම ශ්‍රේෂ්ඨ නිධානය කුමක්දැයි සොයාගැනීම සඳහා ඔවුන් නිධානයක් සොයායාමට යන බව ළමුන්ට කියන්න. ඔබ කාමරයේ නිධානයක් සඟවා තිබෙන බව පහදාදෙන්න. ළමුන්ට නිහඬව නිධානය සෙවීමට කියන්න.

ළමුන් පෙට්ටිය හෝ භාජනය සොයාගත් විට, ළමයෙකු ලවා එය විවෘතකර, පණිවුඩය ශබ්දනගා කියවීමට ඔහුට කියන්න. ඉන්පසුව එම පණිවුඩය ඔබත් සමග නැවත කීමට ළමුන්ට කියන්න (ඔබ යේසුස්වහන්සේගේ පින්තූරයක් හෝ ශුද්ධ ලියවිලි පොතක් සැඟවූයේ නම්, මෙම භාණ්ඩය නියෝජනය කරන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් බව පහදාදෙන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අපට ශ්‍රේෂ්ඨ නිධානයක් බව ළමුන්ට කියන්න.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අපට ශ්‍රේෂ්ඨ නිධානයක් වන්නේ කෙසේද?

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අපට නිධානයක් වන්නේ, ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ අනුගමනයකිරීම මගින් සතුටින් සිටින්නේ කෙසේදැයි එමගින් අපට පෙන්වාදෙන නිසාය.

ශුද්ධ ලියවිල්ල

දහම සහ ගිවිසුමේ 19:23 ප්‍රථම කොටස ශබ්දනගා කියවන්න (*වචන,* වල සිට). යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙය ප්‍රකාශකල බව පහදාදෙන්න. උන්වහන්සේට අවශ්‍යවන්නේ අප උන්වහන්සේ ගැන සහ උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන ඉගෙනගැනීමය.

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් ශුද්ධ ලියවිලිවලින් ඉගෙනගැනීමට අපට පුළුවන

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

පින්තූරය 2-37, කන්ද උඩ දේශනාව, පෙන්වන්න. පින්තූරයේ සිදුවන්නේ කුමක්දැයි විස්තර කිරීමට ළමුන්ට ඉඩ සලසන්න.

ගැලවුම්කරුවාණන් පොළොව මත සිටියදී, උන්වහන්සේ නගරයෙන් නගරයට යමින්, ජනතාව ජීවත්විය යුතු අන්දම ගැනත්, එවිට ඔවුන්ට සතුටින් සිටීමට හැකිව, යම්දිනෙක ස්වර්ගික පියාණන්වහන්සේ

සමග ජීවත්වීමට නැවත යාමට හැකි බවත් ඉගැන්වූසේක. බොහෝ දෙනෙක් උන්වහන්සේට සතුටින් ඇහුම්කන් දෙමින්, උන්වහන්සේ ගිය සෑම තැනකම උන්වහන්සේ අනුව ගියෝය. සමහර අවස්ථාවලදී දහස්ගණන් ජනතාව උන්වහන්සේ වටා එක්රැස්ව උන්වහන්සේට සවන්දෙමින්, උන්වහන්සේගෙන් ඉගෙනගත්හ.

- ජනතාව යේසුස්වහන්සේට සවන්දෙමින් සිටින විට ඔවුන්ට ඇතිවූ හැඟීම් ගැන ඔබට කුමක් සිතෙන්නේද?

සමහර අවස්ථාවලදී යේසුස්වහන්සේගේ ගෝලයන් (උදව්කරුවන්) ජනතාව බැහැරකිරීමට උත්සාහ කළේ, උන්වහන්සේ විඩාපත්ව විවේකය අවශ්‍යව සිටි නිසා බව පහදාදෙන්න. යේසුස්වහන්සේ නිතරම ඔවුන්ට කියා සිටියේ උන්වහන්සේගේ ඉගැන්වීම් අසාගැනීමට ජනතාවට ඉඩහරින ලෙසය. උන්වහන්සේට අවශ්‍යවූයේ සියලුම ජනයා උන්වහන්සේට සවන්දෙමින් ඉගෙනගැනීමය. එවිට ඔවුන්ට සදා පවතින ප්‍රීතිය සහ සතුට ලබාගත හැකිය.

ශුද්ධ ලියවිලි පොත් දෙක පෙන්වන්න. යේසුස්වහන්සේගේ ඉගැන්වීම් බොහොමයක් ශුද්ධ ලියවිලිවලින් අපට ඉගෙනගැනීමට හැකි බව පහදාදෙන්න. අළුත් ගිවිසුමේ මාතෘකා පිටුව පෙරළන්න. යේසුස්වහන්සේ පොළොව මත සිටියදී උන්වහන්සේ ඉගැන්වූ සමහර දේවල් අළුත් ගිවිසුමේ ලියා තිබෙන බව පහදාදෙන්න.

ක්‍රීඩාව

යේසුස්වහන්සේ පොළොව මත සිටියදී උන්වන්සේ ආදර්ශය මගින් අපට බොහෝ දේවල් ඉගැන්වූ බව පහදාදෙන්න. උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තුවන්නේ උන්වහන්සේගේ ආදර්ශය අනුගමනයකරමින් එතුමා කළ දේවල් කිරීමය. යේසුස්වහන්සේ විසින් කරන ලද මෙන්ම අපට උගන්වන ලද සමහර දේවල් ළමුන්ට සිහිපත්කරගැනීමට උපකාරකිරීම සඳහා ළමුන් සමග “මම” සිතමි …නම් ක්‍රීඩාව කරන්න.

ක්‍රීඩාව කිරීම සඳහා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ පහත සඳහන් සිද්ධීන්වල විස්තර කියවා ලබාදී තිබෙන ප්‍රශ්න වරකට එකක් බැගින් අසන්න. බෝංචි බෑගයක් හෝ වෙනත් මෘදු භාණ්ඩයක් අත ඔසවා සිටින ළමයෙකුට ලබාදී, ප්‍රශ්නයට පිළිතුරු දීමට එම ළමයාට කියන්න. අඩු වශයෙන් එක් ප්‍රශ්නයකට හෝ පිළිතුරුදීමේ අවස්ථාවක් හැම ළමයෙකුටම ලබාදෙන්න.

1. යේසුස්වහන්සේ යොහාන් බෞතීස්තය සමග යෝර්දාන් ගංගාවේ සිටගෙන සිටීම වැනි අවස්ථාවක් ගැන මම සිතමි (මතෙව් 3:13–15 බලන්න).

   - යෝර්දාන් ගංගාවේදී යේසුස්වහන්සේට සිදුවූනේ කුමක්ද?
   - යේසුස්වහන්සේව බෞතීස්මකරනු ලැබුවේ කෙසේද? (ගිල්වීම මගිනි.)
   - අපට බෞතීස්මවීමට උගන්වා තිබෙන්නේ කෙසේද? (ගිල්වීම මගිනි.)

2. යොහන් බෞතීස්තය යේසුස්වහන්සේව බෞතීස්මකරන විට එහි සිටි ඉතා විශේෂ පුද්ගලයෙකු ගැන මම සිතමි. හැමකෙනෙකුටම උන්වහන්සේව දැකීමට නොහැකිවූ නමුත්, උන්වහන්සේ එහි සිටින බව යේසුස්වහන්සේ සහ යොහාන් දැනසිටියහ (බලන්න මතෙව් 3:16).

   - මා සිතන්නේ කා ගැනද? (ශුද්ධාත්මයාණන්ය.)
   - ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගැනීමට අපට උගන්වා තිබෙන්නේ කුමක් කිරීමටද? (බව්තීස්මවී ස්ථිරවීමය.)

3. යේසුස්වහන්සේ කෑමක් හෝ බීමක් නොමැතිව දහවල් හතළිහක් සහ රාත්‍රී හතළිහක් සිටි කාලය ගැන මම සිතමි (බලන්න මතෙව් 4:1–11).

   - යේසුස්වහන්සේව පරීක්ෂාකිරීමට උත්සාහ කළේ කවුද?

- යේසුස්වහන්සේ කළේ කුමක්ද? (උන්වහන්සේ හරි දේ තෝරාගෙන පිටවී යාමට සාතන්ට අණ කලසේක.)

- අපව පරීක්ෂාවකට නතුවූ විට, අපට උගන්වා තිබෙන්නේ කුමක් කිරීමද? (හරි දේ තෝරාගැනීමය.)

4. යේසුස්වන්සේගේ ගෝලයන් ළමුන් පිටතට යැවීමට උත්සාහකල අවස්ථාව ගැන මම සිතමි (මාර්ක් 10:13–16).

   - යේසුස්වන්සේ තම ගෝලයන්ට කුමක් කීසේක්ද? (ළමුන්ට උන්වහන්සේ ප්‍රේම කල නිසා ළමුන්ට නවතින ලෙස උන්වහන්සේ කීසේක.)

   - යේසුස්වහන්සේ ප්‍රේම කරන අය කවුද? (අප සියලුදෙනාම.)

   - යේසුස්වහන්සේ අපට උගන්වන්නේ මන්ද? (උන්වහන්සේ අපට ප්‍රේමකරන බවත්, අප සතුටින් සිටීම උන්වහන්සේට අවශ්‍ය බවත්ය.)

5. ජනතාවට යාච්ඤාකරන අන්දම ගැන යේසුස්වහන්සේ ඉගැන්වූ කාලය ගැන මම සිතමි (මතෙව් 6:9 සහ 3 නිෆායි 18:19 බලන්න).

   - යේසුස්වහන්සේ ඉගැන්වූ පරිදි අපි යාච්ඤාකල යුත්තේ කාටද?

   - යේසුස්වහන්සේ ඉගැන්වූ පරිදි අපගේ යාච්ඤා අවසන් කලයුත්තේ කෙසේද?

   - අප යාච්ඤාකල යුතු අවස්ථා මොනවාද? (සියලුම පිළිතුරු පිළිගෙන, ස්වර්ගික පියාණන් වහන්සේට සම්පවීමට, උන්වහන්සේට ස්තුතිකිරීමට, හෝ උන්වහන්සේගෙන් උපකාර ඉල්ලීමට හැඟුනු විට, අපට යාච්ඤාකිරීමට හැකි බව ළමුන්ට සිහිපත්කරන්න.)

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් ජීවමාන අනාගතවක්තෘවරයාගෙන් ඉගෙනගැනීමට අපට පුළුවන

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් ශුද්ධ ලියවිලි කියවීම මගින් ඉගෙනගැනීමට අපට හැකි වුවද, ශුද්ධ ලියවිලිවල යේසුස්වහන්සේගේ සියලුම ඉගැන්වීම් ඇතුළත් නොවන බව පහදාදෙන්න. යේසුස්වහන්සේ පොළොවෙන් පිටත්ව ගියද, උන්වහන්සේ ඉගැන්වීම නතරකළේ නැත. දැන් උන්වහන්සේ අනාගතවක්තෘවරු මගින් අපට උගන්වනසේක. යේසුස්වහන්සේ උන්වහන්සේගේ අනාගතවක්තෘවරයාට කථාකොට, අපට දැනගැනීමට අවශ්‍ය දේවල් ඔහුට කියනසේක. ඉන්පසුව අනාගතවක්තෘවරයා යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අපට දෙන්නේය.

ශුද්ධ ලියවිලි කථාන්තරය

පින්තූරය 2-38, පළමු දර්ශනය පෙන්වා, ජෝසෆ් ස්මිත්—ඉතිහාසයෙහි 1:14–20හි දැක්වෙන කථාව කීමට ඔබට උදව්කිරීමට ළමුන්ට කියන්න.

ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයෙකුවී සත්‍යය ඉගැන්වීමට ස්වර්ගික පියාණන්වහන්සේ විසින් සූදානම්කල බව අවධාරනයකරන්න. ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ ජෝසෆ් ස්මිත්ට ප්‍රකාශවී, එම කාලයේ තිබූ කිසිදු සභාවක් සත්‍ය නොවන බව ඔහුට කීසේක. පසුව, සත්‍ය සභාව නැවත ගෙන ඒමට ජෝසෆ්, යේසුස්වහන්සේට උපකාරකළේය.

- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය සභාවේ වර්තමාන නාමය කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව.)

ළමුන් සියල්ලන්ටම එක්ව නාමය නැවත කීමට කියන්න.

පින්තූර සාකච්ඡාව

පින්තූරය 2-39, ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයා පෙන්වන්න. ජෝසෆ් ස්මිත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ ප්‍රථම අනාගතවක්තෘවරයා බවට පත්වූ

බව පහදාදෙන්න. සභාවේ මුල්කාලීන සාමාජිකයන්ගෙන් යේසුස්වහන්සේ බලාපොරොත්තුවන්නේ කුමක්දැයි දැනගැනීමට ඔහු ඔවුන්ට උදව්කළේය.

ජීවමාන අනාගතවක්තෘවරයාගේ පින්තූරය, ජෝසෆ් ස්මිත්ගේ පින්තූරයට යාබදව තබා ප්‍රදර්ශනයකරන්න.

- මේ කවරෙක්ද?

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජෝසෆ් ස්මිත් සමග කථාකල ලෙසම, ජීවමාන අනාගතවක්තෘවරයා සමගද කථාකරන බව පහදාදෙන්න. අපි අනාගතවක්තෘවරයාගේ වචන අසනවිට, අපි යේසුස් වහන්සේ ඉගැන්වීම් අසන්නෙමු.

සාක්ෂිය

අනාගතවක්තෘවරයෙකු සිටීම කෙතරම් ආසිරිමත් දෙයක්දැයි ළමුන්ට කියන්න. වර්තමාන අනාගත-වක්තෘවරයා ගැලවුම්කරුවාණන්ගේ ඉගැන්වීම් අපට ලබාදෙන සත්‍ය අනාගත වක්තෘවරයෙකු බවට සාක්ෂිදරන්න.

## යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් අපට වැදගත්වේ

කථාන්තරය

සභාවේ සාමාජිකයෙකුවී ගැලවුම්කරුවාණන්ගේ ඉගැන්වීම් දැනගැනීමට ලැබීමේ අසිරිමත් බව අපට සමහර අවස්ථාවලදී අමතකාවිය හැකි බව ළමුන්ට කියන්න. යේසුස්වහන්සේගේ ඉගැන්වීම් එතරම්ම අනගි නිධානයක් බව අපි මතකතබාගත යුතුවෙමු.

සභාවේ සාමාජිකයෙකු වශයෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් ඉගෙනගැනීමේ ඇති වැදගත්කම පෙන්වූ ඔබ හඳුනන යමෙක් පිළිබඳ කථාවක් කියන්න. එවන් කථාවක් ඔබ නොදන්නේ නම්, පහත සඳහන් කථාව කියන්න:

ධර්මදූතයන් සමග කථාකර තිබූ ඇලට්, ඔවුන් ඉගැන්වූයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් බව දැනගත්තාය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකාවක් වීමට ඇයට අවශ්‍යව තිබූ නමුත්, ඇය බව්තීස්මවීම ගැන ඇයගේ පියා කැමති නොවීය. යේසුස්වහන්-සේගේ ඉගැන්වීම් ඉගෙනගෙන යේසුස්වහන්සේගේ සභාවේ සාමාජිකාවක් වීමට ඇලට්ට තිබූ ආශාව ගැන ඔහුට අවබෝධ නොවීය. කලක් බලාසිටින ලෙස ඔහු ඇලට්ට කීවේය. ඇලට්ද බලාසිටි නමුත්, සභාවට යාම දිගටම කල ඇය, සභාවේ සාමාජිකාවක වීම ඇයට කෙතරම් වැදගත් දෙයක්දැයි සිය පියාට අවබෝධවීම සඳහා දිගටම යාච්ඤා කළාය.

නත්තල් සමයේදී, නත්තල සඳහා ඇයට අවශ්‍ය කුමක්දැයි ඇලට්ගේ පියා ඇයගෙන් ඇසුවාය. ඇයට අවශ්‍ය එකම දෙය නම්, බව්තීස්මවීම සඳහා ඔහුගේ අවසරය බව ඇය ඔහුට කීවාය. බව්තීස්මවීම ඇලට්ට එතරම්ම වැදගත් නම්, එම අවසරය තමා දිය යුතු බව ඔහු තීරණය කළේය. ඇලට් නත්තල් උත්සවය දින බව්තීස්මවූවාය. ඇයට ලැබුන එකම ත්‍යාගය මෙයවූ නමුත්, ඇයට බොහෝ ප්‍රීතිය රැගෙන ආ එය, අනගි නිධානයක් විය.

- ඇලට්ට අවශ්‍යවූ ත්‍යාගය කුමක්ද?
- මෙම ත්‍යාගය එතරම් වැදගත්වූයේ මන්ද?

## සාරාංශය

සාකච්ඡාව

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්වලට අපි කෙතරම් කෘතඥවිය යුතුදැයි ළමුන් සමග සාකච්ඡා-කරන්න. අපි කෘතඥවිය යුතු කරුණු—

- ගැලවුම්කරුවාණන්වහන්සේ මෙන් අපටද බව්තීස්මවිය හැකිය.
- අප බව්තීස්මවීමෙන් පසුව අපට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගත හැකිය.

- අපට උදව් අවශ්‍යවූ විට අපට යාච්ඤාකල හැකිය.
- හරි දේ තෝරාගන්නා අන්දම ගැන අපට ඉගෙනගත හැකිය.
- ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ අපට ප්‍රේමකරන බව අපි දන්නෙමු.
- අපට ඉගැන්වීම සඳහා ශුද්ධ ලියවිලි සහ අනාගතවක්තෘවරුන් අපට ඇත.

සාක්ෂිය

මෙය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය සභාව බවට ඔබගේ සාක්ෂිය දරා, සාමාජිකයෙකු වශයෙන් යේසුස්වහන්සේගේ ඉගැන්වීම් ඉගෙනගැනීමට හැකිවීම ගැන ඔබ කෙතරම් කෘතඥවන්නේදැයි ළමුන්ට කියන්න.

එක් එක් ළමයාට නැගීසිටීමට ආරාධනාකර, යේසුස්වහන්සේගේ ඉගැන්වීම් ගැන ඔහුගේ හෝ ඇයගේ කෘතඥතාවය ප්‍රකාශකිරීමට කියන්න. (සෑම ළමයෙක්ගෙන්ම මෙය කිරීම බලාපොරොත්තු නොවන්න.) අවශ්‍ය පරිදි ළමුන්ට උදව්කරන්න.

ගැලවුම්කරුවාණන්ට සහ උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන කෘතඥතාවය ප්‍රකාශකිරීම සාක්ෂිය දැරීමේ එක් ක්‍රමයක් බව පෙන්වා දෙන්න. ළමුන් දැන් ඔවුන්ගේ සාක්ෂි බෙදාගත් බව ඔවුන්ට කියන්න.

ඔවුන්ගේ සාක්ෂි තම පවුල්වල අය සමග බෙදාගැනීමට ළමුන්ව දිරිගන්වන්න. ඔවුන්ට ආත්මික පෙළඹවීම ලැබෙන විට, උපවාස සහ සාක්ෂි රැස්වීම්වලදීද සාක්ෂි දරමින්, යේසුස් වහන්සේගේ ඉගැන්වීම් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය සභාව ගැන ඔවුන් දන්නා දේවල් බෙදාගැනීමටද ඔවුනට පුළුවන.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

---

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරා ගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් වශයෙන්ද පාවිච්චිකල හැකිය. අමතර මගපෙන්වීම් සඳහා, "පංති වේලාව" "ගුරු උපකාර" බලන්න.

1. පාඩමේ අවසානයේ දැක්වෙන චිත්‍රයේ පිටපතක් බැගින් එක් එක් ළමයා වෙනුවෙන් සකස්කරන්න. සමහර අය ඔවුන්ගේ ප්‍රියතම වස්තූන්, චිත්‍රයේ මැද තිබෙන නිදන් පෙට්ටි වැනි පෙට්ටිවල තබන බව පහදාදෙන්න.

   - නිදන් පෙට්ටිවල ඔබ තබන්නේ කුමන දේවල්ද?

   අප සතුව තිබෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් වැනි, සමහර වටිනා වස්තූන් නිදන් පෙට්ටිවල දැමීමට නොහැකි ඒවා බව ළමුන්ට මතක්කරන්න. යේසුස්වහන්සේගේ ඉගැන්වීම් නියෝජනය කෙරෙන (බව්තීස්මය, යාච්ඤාව, සකුමේත්තුව, ප්‍රේමය) යන චිත්‍ර හතර ගැන සාකච්ඡාකරන්න.

   ළමුන් ලවා ඉගැන්වීම් ඇතුළත් චිත්‍රයේ සිට නිදන් පෙට්ටියට ඉරි ඇඳ, ඉන්පසුව එම චිත්‍ර පාටකරවන්න.

2. යේසුස්වහන්සේ අපට කිරීමට උගන්වා තිබෙන දේවල් වාර අනුව රඟදැක්වීමට ළමුන්ට කියන්න. රඟදක්වන ඉගැන්වීම් මොනවාදැයි අනුමානකිරීමට අනෙක් ළමුන්ට කියන්න. උදාහරණවලට යාච්ඤාකිරීම, ගෞරවාන්විතවීම, දසයෙන් කොටස ගෙවීම, දෙමාපියන්ට උදව්වීම හෝ සොහොයුරු සොහොයුරියන්ට කාරුණිකවීම ඇතුළත්විය හැකිය.

3. "මම "යේසුන් මෙන්වීමට තැත් දරමි", (ළමා ගී පොත, පි. 78). බිළිඳුන්ට යේසුන් ආදරෙයි" (ළමා ගී පොත, පි. 59). හෝ "මා හිරු කිරණක් වීම යේසුන්ට අවශ්‍යය" (ළමා ගී පොත, පි. 60), යන ගීත ගායනාකරන්න, නැතහොත් වචන කියන්න. මෙම ගීතවල වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්ව ඇත.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්
# අනගි නිධානයකි



# මට ගෞරවනීයවීමට පුළුවන

**21**
වෙනි
පාඩම

**අරමුණ** ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ගෞරවය දැක්වීමට එක් එක් ළමයාව දිරිගැන්වීමය.

**සූදානම්වීම**

1. ලූක් 2:1–16 සහ 3 නිෆායි 17:11–12, 21–24 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකරන්න.
2. මුඛය, ඇස්, කන්, අත් සහ බාහුව සහ පය සහ පාද වැනි කැපූ කොටස්, පාඩමේ අවසානයේ ඇති අනුරූපය අනුව සූදාම්කරන්න. කැපූ කොටස් මල්ලක හෝ වෙනත් භාජනයක දමන්න.
3. පහත සඳහන් වචන තීරු සූදානම්කරන්න.

| |
|---|
| ගෞරවය |

4. "ගෞරවයෙන්, නිහඬව" (ළමා ගී පොත, පි. 26) සහ "ගෞරවනීයවීමට මම තැත් දරමි" (ළමා ගී පොත, පි. 28) යන ගීත ගායනාකිරීමට හෝ වචනකීමට සූදානම්වන්න.
5. අවශ්‍ය උපකරන:
   අ. බයිබලයක් සහ මෝර්මන්ගේ පොතක්.
   ආ. පින්තූරය 2-36, යේසුස්වහන්සේ නිෆායිට් ළමුන්ට ආශිර්වාද කිරීම; පින්තූරය 2-40, ගෞරවනීය ළමයෙක්; පින්තූරය 2-41, යේසු උපත (සුභාරංචි කලා පින්තූර කට්ටලය 200; 62116).
6. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම්-කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම** සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමුන්ව දිරිගැන්වූයේ නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

අවධානශීලී ක්‍රියාකාරකම

ආරම්භක යාච්ඤාවර පෙර, "ගෞරවයෙන්, නිහඬව" ගීතය ගායනාකරන්න, නැතහොත් වචන කියන්න.

ගෞරවයෙන්, නිහඬව, ප්‍රේමයෙන් අපි ඔබතුමා ගැන සිතමූ;
ගෞරවයෙන්, නිහඬව, සෙමින් ගයමි අපෙ කාලය
ගෞරවයෙන්, නිහඬව, යටහත්ව දැන් අපි යාච්ඤා කරමූ,
ඔබගේ ශුද්ධාත්මය අපේ සිත් තුළ සිටින්ට ඉඩදෙන්න අද.

පින්තූරය 2-40, ගෞරවයෙන් යුත් ළමයා පෙන්වන්න. පින්තූරයේ සිටින ළමයා ස්වර්ගික පියාණන්ව-හන්සේ සමග යාච්ඤාවෙන් කථාකිරීමට සූදානම්වන බව ළමුන්ට කියන්න.

- යාච්ඤාකිරීමට අපි සූදානම්වන්නේ කෙසේද? (අපි අපගේ අත් නමාගෙන, ඇස් වසාගෙන, අපගේ හිස් පහත්කර ගන්නෙමූ.)
- යාච්ඤාවට සූදානම්වීමේදී අපි අපගේ අත් නමාගෙන, අපගේ ඇස් වසාගෙන, අපගේ හිස් පහත්කරන්නේ මන්ද?

අපි මෙම දේවල් කරනවිට, අප යාච්ඤාකරන විට අපගේ ස්වර්ගික පියාණන්ගේ සමීපතාවය හැඟීමට අපට පහසුබව පහදාදෙන්න. අපි අපගේ පොළොවේ දෙමව්පියන් සමග කථාකරන විට ඔවුන් සවන්දී සිටීම අපට වැදගත්වන්නා සේම, අපි යාච්ඤාකරන විට ස්වර්ගික පියාණන් වහන්සේගේ සමීපතාවය අපට හැඟීමද වැදගත්වන බව පහදාදෙන්න.

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

ආරම්භක යාච්ඤාවෙන් පසුව, ප්‍රේමනීය ස්වර්ගික පියාණන්වහන්සේ කෙනෙක් සිටීම ගැන සහ යාච්ඤාව තුලින් උන්වහන්සේ සමග කථාකිරීමට ලැබීමේ වරප්‍රසාදය ගැන ඔබගේ කෘතඥතාවය කෙටියෙන් ප්‍රකාශකරන්න.

### ගෞරවය යනු ප්‍රේමයේ සහ සැළකිල්ලේ හැඟීමකි

වචන තීරු සාකච්ඡාව

ගෞරවයෙන් යුත් ළමයා අසල ඇති "ගෞරවය" නම් වචන තීරුව පෙන්වන්න. වචන තීරුවේ තිබෙන වචන කියවා, ළමුන් ලවා එය නැවත කියවන්න.

- ගෞරවය යනු කුමක්ද?

ගෞරවය යනු නිහඬව සිටීමට වඩා වැඩිදෙයක් බව අවධාරනය කරන්න. ගෞරවය යනු, ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් පවතින විශේෂ ප්‍රේමනීය හැඟීමක්වේ.

ළමුන්ගේ දෙමාපියන් ඔවුන්ට යාච්ඤාකිරීමට උදව්කරනවිටදී හෝ යේසුස්වහන්සේ පිළිබඳ කථාන්තර ඔවුන්ට කියනවිටදී හෝ, ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේගේ මනරම් නිර්මානයන් ඔවුන් දකිනවිටදී හෝ අසනවිටදී, ඔවුන්ට ඇතිවන හැඟීම් ගැන ළමුන්ට සිතාබැලීමට කියන්න. මෙම උණුසුම් සාමකාමී හැඟීම් ගෞරවයේ හැඟීම් බව පහදා දෙන්න. ස්වර්ගික පියාණන්ගේ ආත්මයේ සමීපතාවය ගැන දැනගැනීමට අපට මෙම හැඟීම් උපකාරවන්වේ.

පින්තූරයේ සාකච්ඡාව

පින්තූරය 2-36, යේසුස්වහන්සේ නිෆායිට් ළමුන්ට ආශිර්වාදකිරීම, පෙන්වන්න. පින්තූරය ගැන විස්තර ඔබට කියන ලෙස ළමුන්ට කියන්න (3 නිෆායි 17:11–12, 21–24 බලන්න).

- නිෆායිට් ළමුන්ට යේසුස්වහන්සේ ගැන ඇතිවුන හැඟීම් පිළිබඳව ඔබ සිතන්නේ කුමක්ද?

පින්තූරය 2-41, යේසු උපත, ළමුන්ට පෙන්වා, යේසුස්වහන්සේ උපත පිළිබඳ කථාව කීමට ළමුන්ට කියන්න (බලන්න ලූක් 2:1–16). පින්තූරයේ සිටින අය දෙස ප්‍රවේශමෙන් යුතුව බැලීමට ඔවුන්ට කියන්න.

- යේසු බිළිඳානන් දුටු මිනිසුන්ට ඇතිවූ හැඟීම් ගැන ඔබට කුමක් සිතන්නේද?
- ඔබ යේසු බිළිඳානන් දුටුවේ නම් ඔබට ඇතිවන හැඟීම් ගැන ඔබ සිතන්නේ කුමක්ද?

අපි ප්‍රේමාන්විත අන්දමින් ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ ගැන සිතන විට අපි ගෞරවනීය වන බව පහදාදෙන්න.

### අපගේ ක්‍රියා මගින් අපි ගෞරවය පෙන්වන්නෙමු

සාකච්ඡාව

- අපගේ ගෞරවනීය හැඟීම් (ප්‍රේමය හෝ සැළකිල්ල) ස්වර්ගික පියාණන්ට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අප පෙන්වන්නේ කෙසේද?

අප සිටින ස්ථානය කුමක්වුවද ඒ ගැන නොසළකා, ගෞරවනීය හැඟීම් අප තුල ඇතිවීම වැදගත් නමුත්, විශේෂයෙන්ම සභාව තුලදී ගෞරවනීයවීමට මතකතබාගතයුතු බව පහදා දෙන්න. රැස්වීම්

ගෘහය ස්වර්ගික පියාණණ්වහන්සේගේ ගෘහය වන අතර, අපි ස්වර්ගික පියාණන්වහන්සේගේ ගෘහය තුළදී ගෞරවනීයවන විට, අප උන්වහන්සේට ප්‍රේමය දක්වන බව ස්වර්ගික පියාණන්වහන්සේ දන්නාසේක.

ගීතය

"මම ගෞරවනීයවීමට තැත් දරමි" ගීතය ළමයින් සමග ගායනා කරන්න, නැතහොත් වචන කියන්න.

මම මගේ සුර පියාට ප්‍රේමකරමි
එසේවීමට මම තැත් දරමි
ගෞරවනීය වෙමි මා සිටිනවිට ගෘහය තුල
එවිට එතුමා මා අසල සිටිති

ක්‍රියාකාරකම

කැපූ කොටස් බහාලන ලද මල්ල හෝ භාජනය පෙන්වන්න. එක් එක් ළමයාට පැමිණ මල්ලෙන් කැපූ කොටසක් ගෙන, එම කැපූ කොටස අනෙක් ළමුන්ට පෙන්වා, මෙසේ ඇසීමට කියන්න, "ස්වර්ගික පියාණන්වහන්සේගේ ගෘහය තුළදී ගෞරවය පෙන්වීම සඳහා (කැපූ කොටසින් පෙන්වන කරුණ) ඔබ කුමක් කළ යුතුද?"

දිය හැකි පිළිතුරු:

මුඛය—සෙමින් කථාකිරීමට, සිනහසීමට, ගීත ගායනාකිරීමට, යාච්ඤාකිරීමට, යම්කෙනෙක් කථාකරන විට, වසාතබාගැනීමට.
ඇස්—ගුරුවරිය හෝ කථිකයා දෙස බැලීමට, යාච්ඤාකරන විට වසාගැනීමට.
අත් සහ බාහු—ඍජුව තබාගැනීමට, ප්‍රශ්නයකට පිළිතුරුදීමේදී එසවීමට, යාච්ඤාකරන විට නමාගැනීමට.
පය සහ පාද—සෙමින් ගමන්කිරීමට, ඍජුව තබාගැනීමට.
කන්—කියන දෙයට සවන්දීමට.

ක්‍රියාකාරකම

පහත සඳහන් නිහඬ ක්‍රියාකාරකමේ වචන කීමට සහ එය රඟදැක්වීමට ළමුන්ට උපකාරකරන්න:

මම නිතරම ගෞරවයෙන් යුතුවෙමි
මගේ හිසේ සිට (*අත් හිස මත තබන්න*)
මගේ පාද දක්වා (*පාද අල්ලන්න*).
මම ඇවිදින විට (*සිටින තැන සෙමෙන් ඇවිදින්න*),
මම යනවිට මම සෙමෙන් පියවර තබමි.
මම කථාකරන විට,
වචන සෙමෙන් පිටවෙයි (*ඇඟිල්ල තොල්වල තබන්න*),
ශබ්ද නොනගා සහ නිර්භීතව (*හිස පැත්තෙන් පැත්තට හරවන්න*).
මම සවන්දෙන විට (*බොකුටුකල අත කනට*)
තොල් වසා තිබෙයි (*තොල් තදකරන්න*)
තවද මගේ අත් මම නමාගමි (*අත් නමාගන්න*).
මම යාච්ඤාකරන විට
මගේ හිස මම පහත්කරමි (*හිස පහත්කරන්න*)
තවද මගේ ඇස් මම වසාගමි (*ඇස් වසාගන්න*).
මම නිතරම ගෞරවනීය වන්නෙමි
මගේ හිසේ සිට (*අත් හිස මත තබන්න*)
මගේ පාද දක්වා (*පාද අල්ලන්න*).
(Adapted from Diana Eckersell Janson, "I'm Always Reverent," *Friend*, Sept. 1993, p. 32.)

### අන් අයට ගෞරවනීයවීම සඳහා උපකාරකිරීමට අපට පුළුවන

ගුරුවරයාගේ ඉදිරිපත්කිරීම

තම ක්‍රියාවන් තමා අවට සිටින්නන්ට බලපාන බව ළමුන්ට මතක්කරන්න. සභාව තුල ගෞරවනීය-වීමට මෙය තවත් යහපත් හේතුවකි.

- ප්‍රාථමිකයේ ඔබ අසල සිටින යමෙක් ශබ්දකරන විට ඔබට එයින් ඇතිවන හැඟීම කුමක්ද?

අප වටා සිටින යමෙක් ශබ්දකරන විට, ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සිතීම අපට අසීරු බව පෙන්වා දෙන්න. ඒ අන්දමින්ම, අපද ශබ්දකරමින් එවැනි වෙනත් අගෞරවයවන දේවල් කරන විට, අන් අයට ගෞරවනීයවීමට අපි බාධා පමුණු වන්නෙමු. තමන්ට සහ අන් අයටද ගෞරවය සැලසෙන අන්දමට කටයුතු කිරීමට ළමුන්ව දිරිගන්වන්න.

කථාන්තරය

මිතුරෙකුට වඩාත් ගෞරවනීයවීමට උපකාර කල ඔබ දන්නා ළමයෙකු ගැන කථාවක් කියන්න. නැතිනම් පහත සඳහන් කථාන්තරය කියන්න.

පැටී ඉතා ප්‍රීතිමත් ගැහැණු ළමයෙකු වූවාය. ඇය සිනහසීමට සහ ගායනාකිරීමට සතුටක් දැක්වූවාය. නමුත් අන් හැමටම වඩා ඇය සතුටුවූයේ කථාකිරීමටය. කථාකිරීම සඳහා ඇයට නිතරම බොහෝ දේවල් තිබුන අතර, ඇය සවන්දෙන ඕනෑම කෙනෙකාක්ව ප්‍රිය කළාය. පැටීගේ හොඳම මිතුරිය වූයේ මේරිය. ඇයද පැටී තරම්ම කථාවට කැමැත්තක් දැක්වූවාය.

එක් ඉරුදිනක පැටී මේරි ජෝයිගේ ප්‍රාථමික පංතියට ගියාය. අරම්භක පාඩම පැවැත්වෙද්දී, පැටී තම අළුත් පාවහන් ගැන මේරි ජෝට කීමට පටන්ගත් නමුත්, මේරි ජෝ තම හිස වනා නිහඬවන ලෙස පැටීට සංඥා කළාය.

කිසිවෙක් තමාට සවන් නොදෙන නිසා, කථාකිරීම නවතා දැමූ පැටී, ගුරුතුමිය කියමින් සිටින කථාන්තරයට සැළකිල්ලක් දැක්වීමට පටන්ගත්තාය. ගැලවුම්කරුවාණන් ගැන ඉගෙනගත් ඇය ප්‍රාථ-මිකයේදී සතුටක් ලැබුවාය.

ගැහැණු ළමුන් පිටවයන විට, පංතියේදී ගෞරවනීයවීම වෙනුවෙන් ඔවුන්ගේ ගුරුවරිය ඔවුන්ට ස්තුති-කළාය. පංතිය නිමවීමෙන් පසුව, මේරි ජෝ පැටී අමතා, ප්‍රාථමික කාලයේදී තමා ඇය සමග කථා නොකලේ මන්දැයි පැහැදිළි කළාය. ස්වර්ගික පියාණන්වහන්සේට සහ යේසුස් වහන්සේට තමා ප්‍රේ-මකල නිසා නිතරම සභාව තුළදී ගෞරවනීය වීමට උත්සාහකල බවත් මේරි ජෝ කීවාය.

සාකච්ඡාව

- ප්‍රාථමිකයේදී ගෞරවනීයවීමට මේරි ජෝට අවශ්‍යවූයේ මන්ද?
- පැටීට ගෞරවනීයවීමට මේරි ජෝ උපකාරකලේ කෙසේද?
- අන් අයට ගෞරවනීයවීමට ඔබ උපකාරකරන්නේ කෙසේද?

### සාරාංශය

සාක්ෂිය

ළමුන් ගෞරවනීය වීමෙන් ඔවුන්ට ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන වැඩිදුරටත් ඉගෙනගෙන, උන්වහන්සේලාගේ ප්‍රේමය අත්විඳීමටද උපකාරවත්වන බවට ළමුන්ට සාක්ෂි දරන්න. ඔබට ස්වර්ගික පියාණන් සහ යේසුස්වහන්සේ ගැන විශේෂ ගෞරවය හැඟුන පෞද්ගලික අත්-දැකීමක් බෙදාගැනීමට අවශ්‍යවිය හැකිය.

ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස්වහන්සේ වෙනුවෙන් ළමුන් තුල තිබෙන ප්‍රේමනීය සහ ගෞරව-නීය හැඟීම් ප්‍රකාශකිරීමට ඔවුන්ට ඉඩ සලසන්න.

ළමුන් වෙනත් රැස්වීම්වලට සහභාගිවන විට හෝ ප්‍රාථමිකය නිමවී ඔවුන් රැස්වීම් ගෘහයෙන් පිටව යන විටද, ගෞරවනීයවීමට ඔවුන්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

**සාරවත් ක්‍රියාකාරකම්**

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරාගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් ලෙසද පාවිච්චිකල හැකිය. අමතර මගපෙන්වීම් සඳහා "පංති වේලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. පහත සඳහන් ඇඟිලි ක්‍රීඩාව කිරීමට ළමුන්ට උපකාරකරන්න:

   අයිස් පතුරක් සේ තිහඬව (*අත් ඉහළට ඔසවා ඇඟිලි සොලවමින්, නැවත පහළට ගෙනෙන්න*).
   මල් පිපෙන්නාක් මෙන් තිහඬව (*අත මිට මොලවා ඉන්පසුව මල් පුදින්නාක් මෙන් ඇඟිලි සෙමින් දිගහරින්න*).
   සමනලයෙකුසේ තිහඬව (*මාපටඇඟිලි එක්කර ඇඟිලි තටු මෙන් වනන්න*).
   සෙමින් සෙමින් පසුකර යයි
   මමත් එලෙස තිහඬ වෙමි (*එක් අතක් හදවත මත තබන්න*).
   මම ප්‍රාථමිකයට එන විට (*අත් එක්කර නමන්න*).

2. බෝංචි බෑගයක් හෝ වෙනත් මෘදු භාණ්ඩයක් ළමයෙකුට දී, ගෞරවය දැක්විය හැකි එක් මාර්ග-යක් ගැන කීමට එම ළමයාට, ඔහුට හෝ ඇයට කියන්න. (පිළිතුරුවලට ඍජුව හිඳගෙන සිටීම, සවන්දීම, යේසුස්වහන්සේ ගැන සිතීම, අතක් එසවීම, සෙමින් ඇවිදීම, අත් අයට ගෞරව කිරීම සහ අත් නමාගැනීම ඇතුළත්විය හැකිය). ඉන්පසුව බෝංචි බෑගය නැවතත් ඔබට දීමට එම ළමයාට කියන්න. හැම ළමයෙකුටම වාර ගණනක්. ගෞරවය පෙන්වීමේ මාර්ග ගැන වැඩිවශයෙන් සිතාබැලීමට ළමුන් දිරිගන්වන්න.

3. ගෞරවය සම්බන්ධ අවස්ථා කිහිපයක් රඟදැක්වීමට ළමුන්ට උදව්කරන්න. පහත සඳහන් අදහස් හෝ ඔබගේම කිහිපයක් පාවිච්චිකරන්න:

   - පාඩම අතරවාරයේදී ප්‍රාථමිකයේ ඔබගේ ගුරුතුමියට යමක් කීම ඔබට අවශ්‍යවෙයි. ගෞරවයෙන් යුතුව ඔබ මෙය කරන්නේ කෙසේද?
   - ඔබගේ පංතියේ ළමුන් ගායනාකරන ගීතය ඔබ නොදනී. ගෞරවය පෙන්වීමට ඔබට කලහැක්කේ කුමක්ද?
   - සක්‍රමේන්තු වෙලාවේදී ඔබගේ කුඩා සොහොයුරා ඔබ සමග කථාකරයි. ඔහුට ගෞරවාන්විත වීමට උපකාරකිරීම සඳහා ඔබට කුමක් කලහැකිද?
   - මිනිසුන් යාච්ඤාකරන විට ඔබ කාමරයක් තුලට ගමන්කරයි. ඔබ ගෞරවය පෙන්වන්නේ කෙසේද?

4. පහත සඳහන් ඇඟිලි ක්‍රීඩාව කිරීමට ළමුන්ට උදව්කරන්න.

   මෙන්න සභාව (*ඇඟිලි නවා, එම ඇඟිලි ඇතුල්කර අත් වසන්න*).
   මෙන්න කොත (*කොතක් මෙන් දබර ඇඟිල්ල දික්කරන්න*).
   දොර විවෘතකරන්න (*අත් දිගහරින්න. ඇඟිලි නවා තබාගන්න*).
   තවද මිනිසුන්ව බලන්න (*ඇඟිලි සොලවන්න*).
   දොර වසන්න (*ඇඟිලි ඇතුල්කර නැවතත් අත් වසාගන්න*).
   ඔවුන් යාච්ඤාකරනු අසා සිටින්න (*අත් මුදාලන්න*).
   දොර අරින්න ඔවුන් සියල්ලෝම විසිර යති.

   මෙම ඇඟිලි ක්‍රීඩාව කිරීමෙන් පසුව, සක්‍රමේන්තු කාලය තුළදී මෙම ඇඟිලි ක්‍රීඩාව පාවිච්චිකරන ළමයෙකුගේ කථාවක් කියන්න. සෑම කෙනෙක්ම නිශ්ශබ්දව හිඳගෙන සිටින බව අවට බලන ළමයාට පෙනෙනවිට, ඔහු හෝ ඇය මිනිසුන්ව ගෞරවනීය කිරීමට ඇඟිලි යොදාගැනීමට තීරණ-යකර, ඔහුගේ හෝ ඇයගේ ලපැත්තේ එය තිහඬව තබයි.

5. "ගෞරවය නම් ප්‍රේමයයි" (*ළමා ගී පොත*, පි. 31) හෝ "පියාණෙනි මම ගෞරවනීය වෙමි" (*ළමා ගී පොත*, පි. 29) යන ගීත ගායනාකරන්න. නැතහොත් වචන කියන්න.

ගෞරවය නම් ප්‍රේමයයි
ගෞරවය යනු නිහඬව සිටීමට වඩා වැඩි දෙයකි:
එය ඉහළ සිටින පියාණන් ගැන සිතීමය,
එතුමාගේ ආසිරි ගැන සිතනවිට, මට හැඟීමක් ඇතිවේ,
මම ගරුකටයුතු වෙමි. මන්ද ගෞරවය නම් ප්‍රේමයයි.
මා ගරුකටයුතු වීමේදී, එය මගේ වචනයෙන් සහ මගේ ක්‍රියාවෙන් පෙනේ.
අනුගමනය කිරීමේ මග පැහැදිළිය.
මා ගෞරවනීය වන විට, මගේ හදින් මම එය දනිමි
සුර පියාණන් සහ යේසුන් සමීපයේ සිටිති.
© 1987 by Maggie Olauson. Used by Permission.)

පියාණෙනි, මම ගෞරවනීය වෙමි
පියාණෙනි, මම ගෞරවනීය වෙමි
ඔබගේ ගෘහය තුල සෙමින් ඇවිදිමි;
නමමි මගේ අත්, නමමි මගේ හිස
යාච්ඤා කියනවිට වසමි මගේ ඇස්
මට ඇසෙන වචනවලට සවන්දෙමි,
මන්ද ඔබගේ ගෘහය තුල මට සමීපය ඔබතුමා.
වේවා මගේ සිතිවිලි වඩාත් හොඳ
වඩාත් ගරු ලෙස කථාකිරීමට හැකි වේවා මට.



22
වෙනි
පාඩම


# සමාදානකරන්නෝ ආශිර්වාද ලද්දෝය

**අරමුණ**

නිවසේ සමාදානකරුවෙක්වීමට එක් එක් ළමයා දිරිගැන්වීමය

**සූදානම්වීම**

1. මතෙව් 5:1–12 (හෝ 3 නිෆායි 12:1–12) සහ 7:1–5, 12 (හෝ 3 නිෆායි 14:1–5, 12 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.
2. පංතියේ එක් එක් ළමයා සහ ඔබ වෙනුවෙන්ද පහත දැක්වෙන ආදර්ශයෙන් විශාල පිටපතක් බැගින් සකස්කරන්න (ඔබගේ පිටපත 26වෙනි පාඩම සඳහා ඉතිරිකර ගන්න).



3. හැකි නම්, සියල්ලෝම එක්ව විනෝදවන පවුල් පින්තූර කිහිපයක් ලබාගන්න.
4. පංතියේ එක් එක් ළමයා වෙනුවෙන් කඩදාසියක මුදුනේ *සමාදානකරන්නෝ ආශිර්වාද ලද්දෝය* කියා ලියන්න.
5. "සිනහව" ගීතය ගායනාකිරීමට හෝ වචන කීමට සූදානම්වන්න (ළමා ගී පොත, පි. 267). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.
6. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක් හෝ මෝර්මන්ගේ පොතක්
   ආ. පැන්සල් හෝ ක්‍රේයොන්
   ඇ. හදේතෝ සටහන
   ඈ. පින්තූරය 2-37, කන්ද උඩ දේශනාව (සුභාරංචි කලා පින්තූර කට්ටලය 212; 62166); පින්තූරය 2–42, පවුලේ විනෝදය.
7. ඔබ පාවිච්චි කිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුලදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූවා නම්, ඔවුන් සමග එය සොයාබලන්න.

### අපගේ නිවාස තුල හැඟීම් ප්‍රීතිදායක හෝ කණගාටුදායක හෝ විය හැකිය

අවධානශීලී ක්‍රියාකාරකම

හැම ළමයෙකුටම කඩදාසි මුහුණක් දෙන්න. "සිනහව" යන ගීතය ඔබත් සමග එක්ව ගායනාකිරීමට වචන කීමට ළමයින්ට කියන්න. වචන වලින් යෝජනාකර තිබෙන පරිදි මුහුණේ තරහව හෝ සිනහව ආරූඩකරගන්න.

සාකච්ඡාව

පින්තූරය 2–42, පවුලේ විනෝදය සහ ඔබ ලබාගත් පවුල් සාමාජිකයන් එකට එක්ව විනෝදවීමේ වෙන යම් පින්තූරයක් පෙන්වන්න. ළමුන්ගේ කඩදාසි මූහුණු හරවා පින්තූරවල සිටින මිනිසුන්ගේ හැඟීම් මොනවාදැයි පෙන්වීමට ඔවුන්ට කියන්න.

- ඔබ සිතන ලෙස මෙම මිනිසුන් සියලුදෙනාම සතුටින් සිටින්නේ මන්ද?

පවුල් සාමාජිකයන් අඬ දබර කරගන්නා විට ඔවුන්ගේ හැඟීම් ගැන පෙන්වීමට මූහුණු අනෙක් පැත්ත හරවන ලෙස ළමුන්ට කියන්න.

- අඬ දබර කරගැනීමෙන් පවුල් සාමාජිකයන් කණගාටුවට පත්වන්නේ මන්ද?

ක්‍රියාකාරකම

ළමුන්ගේ කඩදාසි මූහුණු, කණගාටු මූහුණුවල පැත්තට හරවන ලෙස ඔවුන්ට කියා, පවුල්වල අය කණගාටුවට පත්වන එක් දෙයක් ගැන කීමට හැම ළමයාටම කියන්න. ඉන්පසුව කඩදාසි මූහුණුවල ප්‍රීතිමත් පැත්ත හරවා ඔවුන්ගේ පවුල්වල අය ප්‍රීතියට පත්කරන දේවල් කීමට ඔවුන්ට කියන්න.

- ඔබ වඩාත් සතුටුවන්නේ ඔබගේ පවුල් සාමාජිකයන් ප්‍රීතියෙන් සිටිනවිටද නැතිනම් ඔවුන් කණගාටුවෙන් සිටින විටද?

පින්තූර එකතුකරන්න. එවිට ළමුන්ගේ සිත් එමගින් වික්ෂිප්ත නොවනු ඇත. පංතිය අවසානයේදී ළමුන්ට ඒවා නිවසට රැගෙනයාමට ආපසු දෙන්න.

## සමාදානකරුවන්වීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපට ඉගැන්වූසේක

සාකච්ඡාව

පින්තූරය 2-37, කන්ද උඩ දේශනාව පෙන්වා, එම පින්තූරය ගැන ළමුන් දන්නා දේවල් ඔබට කියන ලෙස ඔවුන්ට කියන්න. යේසුස්වහන්සේ කන්දක් උඩට ගොස්, අපගේ නිවාස සතුටින් තබාගත හැකි යම් මාර්ග ඇතුලත් බොහෝ දේවල් ජනතාවට කියා දුන් බව පහදාදෙන්න.

මතෙව් 5:9 (හෝ 3 නිෆායි 12:9) ශබ්දනගා කියවන්න. ජනතාවට සමාදානකරුවන්වීමට යේසුස්වහන්සේ ඉගැන්වූ බව පහදාදෙන්න. *සමාදානකරුවා* යන වචනය ඔබත් සමග නැවත කීමට ළමුන්ට කියන්න.

- සමාදානකරුවා යනු කවරෙක්ද?

සමාදානකරුවා යනු, අමනාපවනු වෙනුවට සතුටින් සිටීමට අන් අයට උපකාරකරන්නෙකු බව පහදාදෙන්න. *සමාදානය* යනු, සංසුන්කම සහ සතුටයි. එබැවින් සමාදානකරන්නා නිවසක් සංසුන් සහ ප්‍රීතිමත් ස්ථානයක් බවට පත්කරයි.

ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමාදානකරුවාණන් බැවින් අප එකිනෙකාටද සමාදානකරුවන් වීමට පුළුවන. ඒ කෙසේදැයි යේසුස්වහන්සේ අපට කියා ඇතිසේක.

මතෙව් 7:12 (හෝ 3 නිෆායි 14:12) ශබ්දනගා කියවන්න. අන් අය ඔවුන්ට සළකනු දැකීමට ඔවුන් කැමතිවන අන්දමටම, ඔවුන්ද අන් අයට සැළකිය යුතු බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාර කරන්න. එවිට ඔවුන් සමාදානකරන්නන් බවට පත්ව ඔවුන්ගේ නිවාසවලටද ප්‍රීතිමත් හැඟීම් රැගෙන ඒමට උදව්කරනු ඇත.

රඟදැක්වීමේ ක්‍රියාකාරකම

ළමුන්ට යම් අවස්ථාවන් විස්තරකර, ඒ ගැන සිතාබලා එක් එක් අවස්ථාවකදී සමාදාන කරුවෙක් ක්‍රියාකරන අයුරු රඟදැක්වීමට ඔවුන්ට උදව්කරන්න. එම අවස්ථාවට සම්බන්ධවී සිටින සෑම කෙනෙක්ම සතුටට පත්වන මාර්ග ගැන සිතාබැලීමට ළමුන්ට උදව්කරන්න. පහත සඳහන් අවස්ථාවන් හෝ ඔබගේම නිර්මානයන් කිහිපයක් පාවිච්චිකරන්න:

1. ඔබ විවේකීව පොතක් දෙස බලාසිටින විට, ඔබගේ සොහොයුරිය එහි පැමිණ ඔබගේ අතින් එම පොත උදුරාගෙන එය බැලීමට ඇයට අවශ්‍ය නිසා ඉවත ගෙන යයි.

    - ඔබ කැමති කුමන අන්දමට සළකනු ලැබීමටද?
    - ඔබ සමාදානකරන්නෙකු නම්, ඔබ කියන්නේ හෝ කරන්නේ කුමක්ද?

2. ඔබ ප්‍රියකරන විස්කෝතුවක් ගැනීමට ඔබ මුළුතැන්ගෙට යයි. ඔබගේ සොහොයුරා විස්කෝතු භාජනය වෙත දිවගොස්, අවසාන විස්කෝතුව රැගෙන එය අනුභව කරයි, ඔබ අමනාපයට පත්වෙයි.

    - ඔබ කැමති කුමන අන්දමට සළකනු ලැබීමටද?
    - ඔබ සමාදානකරන්නෙකු නම් ඔබ කියන්නේ හෝ කරන්නේ කුමක්ද?

3. ඔබ මිතුරෙකු සමග චිත්‍ර අඳියි. ගසක් දම්පාටින් පාටකිරීම ගැන ඇය ඔබට විහිළුකරයි. වේදනාවට පත්වන ඔබ ඇයට විහිළුකිරීම සඳහා පහත් නමක් ගැන සිතයි.

    - ඔබ කැමති කුමන අන්දමට සළකනු ලැබීමටද?
    - ඔබ සමාදානකරන්නෙකු නම්, ඔබ කියන්නේ හෝ කරන්නේ කුමක්ද?

ශුද්ධ ලියවිල්ල

මතෙව් 7:12 (හෝ 3 නිෆායි 14:12) පංතියට නැවත කියවන්න. නැතහොත් අනුවාදය කරන්න.

හදේතෝ සටහන

හදේතෝ සටහන ප්‍රදර්ශනය කරන්න. අන් අය තමන්ට සළකනු ලැබීමට තමන් සතුටු අන්දමට ඔවුන්ද අන් අයට සළකන විට, ඔවුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරමින් හරි දේ තෝරාගන්නා බව ළමුන්ට කියන්න. සටහනේ වචන ඔබත් සමග නැවත කීමට ළමුන්ට කියන්න.

### අප සියලුදෙනාටම සමාදානකරන්නන් වීමට පුළුවන

කථාන්තරය

පහත සඳහන් සමාදානකරන්නන් පිළිබඳ කථාව ඔබගේම වචනයෙන් කියන්න.

සභානායකවරයෙක් තමාට උපකාරකරන මෙන් මිනිසුන් කිහිපදෙනෙකුට කීවේය. බාල ළමුන්ට මාසයක කාලයක් තම නිවාසවල සමාදානකරන්නන්වීමට කී ඔහු ඔවුන් කරන දෙය ගැන කිසිවෙකුට නොකියන ලෙසද කීවේය. කරුණාවන්තවෙමින්, කල්පනාකාරීව යහපත් ආදර්ශයක් තබන ලෙස ඔහු ඔවුන්ට කීවේය. දබරකරගැනීම නැවැත්වීමට උදව්කරමින්, ඔවුන්ගේ පවුල් සාමාජිකයන්ට ප්‍රේමය පෙන්වීමේ මාර්ග සෙවීමට ඔහු ඔවුන්ට කීවේය. බාල ළමුන් මසක කාලයකින් සභානායකවරයා වෙත පැමිණ සිදුවූ දෙය ඔහුට පැවසිය යුතුව තිබිනි.

මාසයක කාලයකින් ඔවුන් සියල්ලෝම නැවත හමුවී, ඔවුන් කල දෙවල් කීහ. සමාදාන කරන්නන් වීමට ඔවුන් ගත් උත්සාහයන් නිසා ඔවුන්ගේ නිවාස ප්‍රීතිමත් ස්ථානයන් බවට පත්වූ බව බාල ළමුන් සියල්ලෝම කීහ (බලන්න ෆ්‍රැන්ක්ලින් ඩී. රිචඩ්ස්, සම්මන්ත්‍රන වාර්තාව, ඔක්තෝ. 1974, පි. 153; හෝ *එන්සයින්,* නොවැ. 1974, පි. 106.)

සාකච්ඡාව

- බාල ළමුන්ට සභානායකවරයා කිරීමට කීවේ කුමක්ද?
- ඔවුන් එය කලවිට සිදුවූයේ කුමක්ද?
- ඔබ ඔබගේ නිවසේ සමාදානකරන්නෙකු වන්නේ කෙසේද?

කලා ක්‍රියාකාරකම

*සමාදානකරන්නෝ ආශිර්වාද ලද්දෝය* යි ඔබ ලියන ලද කඩදාසි හැම ළමයෙකුටම දෙන්න. කඩදාසිය මුදුනේ ලියා තිබෙන වචන ශබ්දනගා කියවා, ළමයින්ට එක්ව එම වචන නැවත කීමට කියන්න. ළමුන්ට පැන්සල් හෝ ක්‍රේයොන් ලබාදී ඔවුන්ගේ පවුල්වල අය සතුටින් සිටීම චිත්‍රයට නැගීමට ඔවුන්ට කියන්න.

සමාදානකරන්නන්වීම ඔවුන්ට සිහිපත්කරවන නිවසේ යම් ස්ථානයක ඔවුන් අඳින ලද පින්තූර එල්ලා තැබීමට ළමුන්ව දිරිගන්වන්න.

**සාරාංශය**

ගීතය

කඩදාසි මුහුණු බෙදාහැර නැවත වරක් "සිනහව" ගීතය ගායනාකරන්න. නැතිනම් වචන කියන්න. සමාදානකරන්නන් වීමෙන් තරහ මුහුණු ප්‍රීතිමත් මුහුණු බවට පත්කිරීමට ඔවුන්ට හැකිවන බව ළමුන්ට සිහිපත්කරන්න.

සාක්ෂිය

අප සමාදානකරන්නන් වීම ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අපේක්ෂාව බවට සාක්ෂි දරන්න. ළමයින් නිවසේ සමාදානකරන්නන් වීමට උත්සාහකරන විට, ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට සතුටුවීමට හැකි බව ළමුන්ට මතක්කරන්න.

ලබන සතිය තුළදී නිවසේ සමාදානකරන්නෙකු වීමට උත්සාහකිරීමට හැම ළමයෙක්ම දිරිගන්වන්න. ලබන සතියේදී ඔවුන්ගේ අත්දැකීම් පංතියට පැවසීමට සූදානම්ව එන ලෙස ළමුන්ට කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න. පංති සාමාජිකයන්ට ඔවුන්ගේ නිවාසවල සමාදා-නකරන්නන් වීමට උදව්කරන ලෙස ස්වර්ගික පියාණන්වහන්සේගෙන් ඉල්ලීමට ළමයාට යෝජනාකරන්න.

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරා ගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් ලෙසද පාවිච්චිකල හැකිය. අමතර මගපෙන්වීම් සඳහා, "පංති වෙලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. පින්තූරය 2-3, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හෝ යේසුස්වහන්සේගේ වෙනත් පින්තූරයක් පෙන්වන්න. යේසුස්වහන්සේ ඔවුන්ව බැහැදැකීමට ඔවුන්ගේ නිවාසවලට පැමිණීම ඇඟවීමට ළමුන්ට කියන්න. යේසුස්වහන්සේ ඔවුන්ව බැහැදැකීමට පැමිණීමෙන් ඔවුන්ට කොතරම් සතුටක් හැඟේදැයි සිතීමට ඔවුන්ට කියන්න.

    - සූදානම්වීමට ඔබ කරන දේවල් මොනවාද?
    - යේසුස්වහන්සේ පැමිණි විට ඔබ කටයුතුකරන්නේ කෙසේද?

    යේසුස්වහන්සේ ඔවුන්ව බැහැදැකීමට පැමිණෙන්නේ නම්, ඔවුන් කරන යම් දේවල් රඟදැක්වීමට ළමුන්ට කියන්න. යේසුස්වහන්සේ ඔවුන්ගේ නිවාසවල සිටින්නේ නම්, බෙදාගැනීම, එකිනෙකාට කරුණාවන්තවීම සහ දබරකර නොගැනීම මගින් සමාදාන කරන්නන් වීමට බොහෝ වෙහෙසවී උත්-සාහ කිරීමට ඔවුන්ට සිදුවේ. එවිට යේසුස්වහන්සේ ඔවුන්ගේ නිවාසවලට රැගෙන ආ යහපත් හැඟීම්වලින් සතුටුවීමට ඔවුන්ට හැකිවන්නේය.

    සමාදානකරන්නෙකු වීමට ඔවුන්ට හැකි එක් මාර්ගයක් නම්, යේසුස්වහන්සේ ඔවුන්ගේ නිවාසවලට පැමිණීමේදී ඔවුන් හැසිරෙන ආකාරය ගැන සිතීම බව ළමුන්ට කියන්න.

2. "ප්‍රීතිමත් පවුලක්" ගීතය ගායනාකරන්න. නැතහොත් වචන කියන්න (ළමා ගී පොත, පි. 198). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

    ළමුන් සමාදානකරන්නන්වූ විට, තම පවුල් සතුටින් සිටීමට ඔවුන් උදව්කරන බව ළමුන්ට සිහිපත්-කරන්න.

3. “ඔබ සතුටින් නම්” ගීතය ගායනාකරන්න. නැතිනම්, වචන කියන්න (ළමා ගී පොත, පි. 266). මෙම ගීතයට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

ඔබ සතුටින් නම් ඔබ ඒ බව දනී, අත්පුඩි ගසන්න.
ඔබ සතුටින් නම්, ඔබ ඒබව දනී, අත්පුඩි ගසන්න.
ඔබ සතුටින් නම්, ඔබ ඒ බව දනී.
එවිට ඔබගේ මහුණින් තිර ලෙසම එය පෙනේ.
ඔබ සතුටින් නම්, ඔබ ඒ බව දනී, අත්පුඩි ගසන්න.

4. අන් අයගේ ක්‍රියාවලට දක්වන ප්‍රතික්‍රියා ළමුන්ට පාලනය කල හැකි බව පෙන්වීමට, එකිනෙකාට මුහුණදී සිටගැනීමට ළමුන්ට කියන්න. එක් ළමයෙක් ඍජුව මුහුණ තබාගෙන (මුහුණින් කිසිවක් ප්‍රකාශනොකරමින්) සිටීමට උත්සාහ කිරීමේදී, අනෙක් ළමුන් ඔහුව සිනහ ගැන්වීමට හෝ වෙන යම් ප්‍රකාශයක් මුහුණින් පෙන්වීමට බලති. මෙයට සහභාගිවීමට කැමති සියලුම ළමුන්ට වාර අනුව මෙම ක්‍රියාකාරකම උත්සාහකිරීමට ඉඩ සලසන්න.

   නිවසේ සමාදානය නැතිකිරීමට යම් කෙනෙක් යමක් කිරීමේදී, තම ප්‍රතික්‍රියාවන් පාලනය කිරීමට ළමුන් උත්සාහකල යුතු බව තේරුම්ගැනීමට ඔවුන්ට උපකාරකරන්න. උදාහරණයක් ලෙස, සහෝදරයෙක් හෝ සහෝදරියක් කෑගසාගන්නා විට, ඔවුන්ට ඇතිවන පළමු සිතිවිල්ල විය හැක්කේ කෑගැසීමෙන්ම පිළිතුරු දීමය. නමුත් ඔවුන් සමාදානකරන්නන්වීමට උත්සාහ කරන්නේ නම්, ප්‍රතික්‍රියා දැක්වීමේ වඩා යහපත් මගක් සොයාගැනීමට ඔවුන්ට පුළුවන.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත් බැටළු එඬේරාණන්ය

23
වෙනි
පාඩම

**අරමුණ** සෑම පුද්ගලයෙක්ම යේසුස්වහන්සේට වැදගත්වන බව තේරුම්ගැනීමට ළමුන්ට උපකාරකිරීමය.

**සූදානම්වීම**

1. ලූක් 15:1–7 සහ යොහාන් 10:1–18 යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනය කරන්න.
2. පින්තූරය 2-44, නැතිවන බැටළුවා ගොරෝසු කඩදාසියක අලවන්න. ඉන්පසුව එය ප්‍රහේළිකා කොටස්වලට කපාගන්න. බැටළුවා සම්පූර්ණයෙන්ම ප්‍රහේළිකා කඩදාසියේ තිබීමට වගබලාගන්න. (මෙම ප්‍රහේළිකා කොටස් ඉදිරි පංතිවලට ප්‍රයෝජනයට ගැනීම සඳහා ආරක්ෂා කරගන්න.) පංතිය ආරම්භවීමට පෙර, බැටළුවා සහිත ප්‍රහේළිකා කොටස් ලෙහෙසියෙන් සොයාගැනීමට නොහැකි ලෙස පංතියේ කොතැනක හෝ සඟවන්න.
3. පාඩමේ අවසානයේ තිබෙන අනුරුවට අනුව, ඔබද ඇතුළුව පංතියේ සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම බැටළුවාගේ පිටපතක් හෝ ඡායා පිටපතක් සකස්කරන්න. එක් එක් පුද්ගලයාගේ නම බැටළුවා මත ලියන්න.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්
   ආ. පින්තූරය 2-43, බැටළු එඬේරෙක්
5. ඔබ පාවිච්චිකිරීමට බලාපොරොත්තුවන ඕනෑම සාරවත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සූදානම්වීම් කරන්න.

**යෝජනාකල පාඩම වැඩිදියුණුකිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමුන් දිරිගැන්වූයේ නම්, ඔවුන් සමග එය සොයාබලන්න. ළමුන් සිය නිවාසවල සමාදානකරන්නන්වීමට උත්සාහකිරීමේදී ඔවුන් ලැබූ අත්දැකීම් ගැන වාර්තාවක් ඔබට ඔවුන්ගෙන් ලබාගැනීම අවශ්‍යවනු ඇත.

### බැටළු එඬේරෝ ඔවුන්ගේ බැටළුවන් ආරක්ෂා කරති

අවධානශීලී ක්‍රියාකාරකම

පින්තූරය 2-43 පෙන්වන්න. බැටළු එඬේරෙක්

- මෙම මිනිසා කවරෙක්ද?

මෙම පින්තූරයේ සිටි මිනිසා, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පොලොව මත සිටිනවිටදී ජීවත්වූ අයට සමාන එඬේරෙක් බව පහදාදෙන්න.

- ඔහු ඇඳගෙන සිටින්නේ මොනවාද?

එඬේරා අඳින කබාය පෙන්වන්න. මෙම බැටළුහමින් හෝ ලොම්වලින් සකස්කල කබාය, කාන්තාරයේ දහවල දැඩි හිරුරැස්වලින් සහ රාත්‍රිකාලයේ ශීතලෙන් එඬේරාව ආරක්ෂාකරන බව පහදාදෙන්න. ඔහුගේ හිස්වැස්මද අව්රශ්මියෙන් ඔහුව ආරක්ෂාකරයි. එඬේරෙක් ජලය භාජනයක් සහ යෂ්ටිය නමින් හඳුන්වන මුගුරක්ද රැගෙන යයි.

- එඬේරෙක් කුමක් කරන්නේද?

එඬේරා බැටළුවන් බලාගන්නා බව පහදාදෙන්න. බැටළුවා එඬේරාගේ හඬශබ්දය හඳුනන අතර, ඔවුහු ඔහු ගෙනයන තැනකට යති. එඬේරා පිටුපසින් සිට බැටළුවන් මෙහෙයවන්නේ නැති බව පෙන්නා දෙන්න. ඔහු ඔවුන්ට යන තැන පෙන්වන්නේ ඉදිරියෙන් යමින් බව පහදාදෙන්න. එඬේරා තම බැටළුවන්ට සාරවත් තණ පිට්ටනිවලට මගපෙන්වන අතර එහිදී ඔවුන්ට කෑමට හොඳ තණකොල ලැබේ. ඔහු ඔවුන්ට ජලය තිබෙන ස්ථානද පෙන්වයි. රාත්‍රී කාලයේදී ඔහු නැවතත් ඔවුන්ව බැටළු ගාල් වෙත රැගෙන යයි. එය තාප්පයකින් හෝ වැටකින් වටකරන ලද ස්ථානයක්වන අතර, එහිදී බැටළුවන්ට වන සතුන්ගෙන් සහ සොරුන්ගෙන් ආරක්ෂාව ලැබේ. එඬේරා බැටළු ගාලේ දොරටුව අසල සිටිමින් ඔහුගේ බැටළුවන් ආරක්ෂාකරයි. එඬේරා ඔහුගේ බැටළුවන් ගණන්කර කිසිවෙකු නැතිවී නොමැති බවට වගබලාගනියි.

## හැම බැටළුවෙක්ම ඔවුන්ගේ එඬේරාට වැදගත්ය

කථාන්තරය

සියලුම එඬේරුන්, යේසුස්වහන්සේගේ කාලයේ හෝ වර්තමාන කාලයේ වුවද, තම බැටළුවන් බලාගෙන ඔවුන්ව ආරක්ෂාකරන බව පහදාදෙන්න. පහත සඳහන් කථාව ඔබගේම වචනයෙන් කියන්න:

කැරී සහ ජිමී ගොවිපළක ජීවත්වූහ. ඔවුන්ගේ පවුලේ අය බැටළුවන් ඇතිකල අතර, කැරීට සහ ජිමීටද ඔවුන්ගේම කුඩා බැටළු පැටවුන් රැළක් සිටියේය. ඔවුහු තම බැටළු පැටවුන් හොඳින් බලාගත්හ. ඔවුහු යහපත් එඬේරුන් වූහ.

එක් රාත්‍රියක තද සුළඟක් විය. සුළඟින් කැරී සහ ජිමීගේ බැටළු පැටවුන් සිටි ගාලේ වැටෙන් කොටසක් කැඩීගියේය. ගෙරවීම් ශබ්දයෙන් බියට පත් බැටළු පැටවුන් සියල්ලෝම ගාලෙන් පිටවී දිවගියහ.

උදෑසන පැමිණිවිට කැරී සහ ජිමී ඔවුන්ගේ බැටළු පැටවන් සොයාබැලීමට පිටතට දිවගියෝය. නමුත් බැටළුවන් කිසිදු තැනක සොයාගැනීමට නොවීය. කැරී සහ ජිමී ශෝකයට පත්වූහ. ඔවුහු තෙත පොලොවේ ඇති බැටළුවන්ගේ අඩිපාර දිගේ ගියහ. ඉක්මණින්ම සියල්ලෝම, එහෙත් එකෙකු හැර ඔවුන්ගේ බැටළු පැටවුන්ව සොයාගැනීමට කැරී සහ ජිමී සමත්වූහ.

- ඔබ සිතන ලෙස කැරී සහ ජිමී කලේ කුමක්ද?

කැරී සහ ජිමී බැටළු පැටවුන්ව නැවතත් ගාලට දක්කාගෙන ගොස්, නැතිවූ බැටළුවා සොයා ගියහ. අඩිපාරවල් දෙකක්, අනෙක් අඩිපාරවල් වලින් වෙන්ව වෙනත් පැත්තකට ගොස් තිබෙන බව ඔවුහු දුටුහ. ඔවුහු මෙම අඩිපාරවල් දෙක අනුව ගියහ.

අවසානයේදී කැරීට සහ ජිමීට බැටළු පැටවා හමුවිය. උගේ කකුල වළකට වැටී එය අපහසුව දුර්වලව තිබුනේය. ඔවුහු ප්‍රවේශමෙන් යුතුව බැටළු පැටවා නිවසට උසුලාගෙන ගියහ. ජිමී ඌව උසුලාගෙන සිටියදී, කැරී උගේ පාදවල සීරීම් පිරිසිදු කළේය. කැරී සහ ජිමී ඔවුන්ගේ සියලුම බැටළු පැටවුන් සොයාගැනීමට ලැබීම ගැන බොහෝ සතුටට පත්වූහ.

- කැරී සහ ජිමී ඔවුන්ගේ අනෙක් බැටළු පැටවුන් සොයාගැනීමෙන් පසුව, අවසාන බැටළු පැටවා ගැන දිගටම සොයා බැලුවේ මන්ද?

ප්‍රහේළිකා ක්‍රියාකාරීත්වය

ඔබ සකස්කල ප්‍රහේළිකා කොටස් පොළොව මත හෝ මේසයක් මත තබා, ප්‍රහේළිකාව සකස්කිරීමට ළමුන්ට උපකාර කරන්න.

එක් කෑල්ලක් අඩු බව ළමුන්ට අවබෝධවූ විට, එම අඩු කෑල්ලේ බැටළුවෙකුගේ රූපයක් තිබෙන බව පෙන්වා දෙන්න.

- බැටළුවෙක් නැතිවී සිටින බව දුටු විට, යහපත් එඬේරා කරන්නේ කුමක්ද?

ශුද්ධ ලියවිලි කථාන්තරය

බයිබලය ඔසවා තබාගෙන, බැටළුවෙක් නැතිවූවිට යහපත් එඬේරා කුමක් කරන්නේදැයි යේසුස්වහන්සේ බයිබලය තුළින් අපට ප්‍රකාශකරන බව ළමුන්ට කියන්න. යේසුස්වහන්සේ පොළොව මත සිටියදී උන්වහන්සේ කථාන්තර කීම මගින් ජනතාවට ඉගැන්වූ බව පහදා දෙන්න. එඬේරා සහ නැතිවූ බැටළුවා උන්වහන්සේගේ එවන් එක් කථාවකි. ලූක් 15:4 ශබ්දනගා කියවන්න.

- යහපත් එඬේරෙක් කළ යුතු දේ ගැන බයිබලය කියන්නේ කුමක්ද?

රඟදැක්වීමේ ක්‍රියාකාරකම

ළමුන්ට ඔවුන් එඬේරන් සේ සිතාගැනීමට කියන්න. ඔවුන් එකිනෙකා කබායක් හැඳගෙන, මුගුරක් අතින් ගෙන යාම මවා පා, බැටළුවාගේ පින්තූරය තිබෙන ප්‍රහේළිකා කෑල්ල සොයා බැලීමට ඔවුන්ට කියන්න. ප්‍රහේළිකා කෑල්ල සොයාගත් විට, සියලුම එඬේරුන්ට ප්‍රශංසාකර, ප්‍රහේළිකාව සම්පූර්ණකරන්න.

එම කෑල්ල සොයාගත්විට ඔවුන්ට ඇතිවුන හැඟීම් ගැන ළමුන්ගෙන් අසන්න.

ශුද්ධ ලියවිල්ල

ලූක් 15:5–6හි දැක්වෙන උපමා කථාවේ එන එඬේරාට තම නැතිවූන බැටළුවා සොයාගත්විට ඇතිවුන හැඟීම් ගැන කියන්න. යේසුස්වහන්සේ ප්‍රකාශකල පරිදි යහපත් එඬේරා කරන දෙය සහ ඔහුට ඇතිවන හැඟීම් හා ළමුන්ගේ අත්දැකීම් සසඳන්න.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යහපත් එඬේරාණන්වන අතර අපි උන්වහන්සේගේ බැටළුවන් වෙමු**

ශුද්ධ ලියවිලි කථාන්තරය

යොහාන් 10:14 ශබ්දනගා කියවන්න

- මෙම ශුද්ධ ලියවිල්ලේ එන යහපත් එඬේරා කවුද?

ශුද්ධ ලියවිල්ලේ වචන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වචන බව පහදාදෙන්න. යහපත් එඬේරාණන් නම් උන්වහන්සේය.

- යේසුස්වහන්සේගේ රැළේ බැටළුවන් වන්නේ කවුද? (රැළ යනු, බැටළු කණ්ඩායමක් බව පහදාදෙන්න.)

ඔවුන් යේසුස්වහන්සේගේ රැළේ බැටළුවන් කිහිප දෙනෙක් බව තේරුම්ගැනීමට ළමුන්ට උදව්කරන්න. ගැලවුම්කරුවාණන් තමන්වහන්සේව බැටළුවෙකුට සමාන කළේ, එඬේරෙක් බැටළුවන් රැකබලාගන්නා ලෙස, අප එකිනෙකාටද උන්වහන්සේ ප්‍රේමකරමින් රැකබලාගන්නා නිසා බව පහදාදෙන්න. අප එකිනෙකා ආරක්ෂා සහිතව සතුටින් සිටීම උන්වහන්සේට අවශ්‍යවනසේක. එඬේරා හැම බැටළුවෙක්ම හඳුනන පරිදි, යේසුස්වහන්සේද අප එකිනෙකාව හඳුනනසේක. අප සියල්ලෝම උන්වහන්සේට වැදගත්ය.

ක්‍රියාකාරකම

ළමුන්ගේ නම් සඳහන් කඩදාසි බැටළුවන් පෙන්වන්න. බැටළුවෙක් උසුලාගෙන, "(ළමයාගේ නම) කියා යේසුස්වහන්සේගේ රැළේ බැටළුවෙකි." ඉන්පසුව මේසය මත හෝ පොළොව මත සිටින බැටළුවා පෙන්වන්න. මෙම ක්‍රියාකාරකම සියලුම ළමයින්ගේ නම්, ඔබද ඇතුළුව කියා නිම වන තුරු දිගටම කරන්න. ඔබ පැමිණ නැති ළමයෙකුගේ නම කියන විට, මෙවැනි යමක් කියන්න: "(ළමයාගේ නම) යේසුස්වහන්සේගේ රැළේ එක් බැටළුවෙකි. ඇය අද ප්‍රාථමිකයේ නැති බව යේසුස්වහන්සේ දන්නාසේක. උන්වහන්සේගේ සියලුම බැටළුවන් මෙහි සිටීම උන්වහන්සේට අවශ්‍යවනසේක.

ක්‍රියාකාරකමෙන් පසුව සියලුම බැටළුවන් එකතුකර, ළමුන්ට එක්ව බැටළුවන් ගණන්කිරීමට කියන්න. ළමුන් සියල්ලෝම පංතියක හෝ රැළක බොහෝ බැටළුවන්ද සිටිය යුත්තේ මේ අන්දමින් බව පෙන්වා දෙන්න. මෙම ගණන අද පංතියේ සිටින ළමුන් ගණන හා සසඳන්න. ළමුන් අසනීපයෙන් හෝ නගරයෙන් පිටත ගොස් සිටීමෙන් හැර ඔවුන් සියල්ලෝම හැම සතියකම පැමිණීම ඔබ බලාපොරොත්තුවන්නේ, ඔවුන්ව රැකබලාගෙන ඔවුන්ට ඉගැන්වීම ඔබට අවශ්‍ය නිසා බව ළමුන්ට කියන්න. යේසුස්වහන්සේගේ බැටළුවන් ප්‍රාථමිකයට පැමිණීම උන්වහන්සේට කෙතරම් වැදගත්දැයි අවධාරනය කරන්න.

ළමුන්ට එඬේරුන් වී අද ප්‍රාථමිකයට නොපැමිණි ළමුන්වූ—නැතිවුන බැටළුවන් සෙවීමට යෝජනා කර—ඔවුන්ට නැවත ප්‍රාථමිකයට යාමට උදව්කරන්න.

## සාරාංශය

සාක්ෂිය

හැම ළමයෙක්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේට වැදගත්වන බව සහ ඔවුන් එකිනෙකාට යේසුස් වහන්සේ ප්‍රේමකරමින් රැකබලාගන්නා බවට සාක්ෂි දරන්න.

එක් එක් ළමයාට ඔහුගේ හෝ ඇයගේ නම සඳහන් බැටළුවා දෙන්න. ඔවුන්ගේ බැටළුවන් නිවසට රැගෙන ගොස්, එඬේරුන් සහ යහපත් එඬේරාණන් ගැන ඔවුන් අද ඉගෙනගත් දේවල් ඔවුන්ගේ පවුල්වල අය සමග බෙදාගැනීමට කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකරන්න.

---

## සාරවත් ක්‍රියාකාරකම්

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ඔබගේ පංතියේ ළමුන්ට වඩාත් ගැළපෙන ඒවා තෝරා ගන්න. ඔබට ඒවා පාඩමට මෙන්ම, සමාලෝචනයක් හෝ සාරාංශයක් ලෙසද පාවිච්චිකල හැකිය. අමතර මගපෙන්වීම් සඳහා, "පංතිවෙලාව" "ගුරු උපකාර" කොටස බලන්න.

1. අද ප්‍රාථමිකයට නොපැමිණි ළමයෙකුට දීම සඳහා සටහනක් ලිවීමට හෝ චිත්‍රයක් ඇඳීමට හෝ ළමුන්ට කියන්න. එහි මෙවැනි ප්‍රකාශයක් විය හැකිය, "ඔබව අද ප්‍රාථමිකයේ දක්නට අපට බැරිවිය" හෝ "පැමිණ ප්‍රාථමිකයේ අප හා එක්වන්න."

2. ළමුන්ගේ බැටළුවන් පාට කිරීමට හෝ බූල් සහිතවීමට පුළුන් බෝල බැටළුවන් මත ඇලවීමට ළමුන්ට කියන්න.


3. ක්‍රියාකාරකමේ සඳහන් "යේසුස්වහන්සේ සියලුම ළමුන්ට ප්‍රේම කරනසේක" පදය කිරීමට ළමුන්ට ඉඩ සලසන්න.


   යේසූත් සියලු ළමුන්ට ආදරෙයි (*අත් විහිදා ඔසවන්න*),
   කුඩා අය තාමත් පොඩි (*අතින් දණක් උස ළමයෙක් පෙන්වන්න*),
   තොටිල්ලේ බිළිඳාණන් (*අත්වලින් තොටිල්ලක් පෙන්වන්න*),
   වරක් කුඩාවූ එපමණ ලොකු හා උස (*හිසට උඩින් අත් ඔසවන්න*).
   (From *Finger Fun for Little Folk* by Thea Cannon. © 1949 by the Standard Publishing Company, Cincinnati, Ohio. Used by Permission.)

4. "යේසූත් කුඩා ළමුන්ට ආදරෙයි" (ළමා ගී පොත, පි. 59) හෝ "ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය මට හැඟේ" (ළමා ගී පොත, පි. 74) ගීත ගායනාකරන්න. නැතහොත් වචන කියන්න. මෙම ගීතවලට වචන දැනමුතුකම් පොතේ පිටුපස ඇතුළත්කර ඇත.

5. "එඬේරාණන්ගේ හදවත ප්‍රියයි" ගීතය ගායනා කරන්න. නැතහොත් වචන කියන්න (ගීතිකා අංක, 221).

   ප්‍රියයි එඬේරාණන්ගේ හදවත,
   ප්‍රියයි එතුමාගේ රැළේ බටළුවන්;
   ප්‍රියයි එතුමා ඔවුන්ට දෙන ප්‍රේමය,
   ප්‍රියතමයි රන් රිදීවලට වඩා.
   ප්‍රියයි එඬේරාණන්ගේ හදවත,
   ප්‍රියයි එතුමාගේ "වෙනත්" නැතිවූ බැටළුවන්;
   කඳු උඩ සොයාබලයි.
   ජලය තුල එතරම් ගැඹුරු.
   කතර තුල ඔවුහු තැන තැන යති,
   කුසගිනිව අසරණව ශීතලව;
   කඩිනම්ව බේරාගැනීමට ඔහු යයි
   ගෙනෙමින් ඔවුන්ව නැවතත් රැළට.





24
වෙනි
පාඩම

# මට කෘතඥතාවය පෙන්වීමට හැකිය

**අරමුණ**

ස්වර්ගීය පියාණන් වහන්සේට කෘතඥතාවය හැඟීමට සහ ප්‍රකාශකිරීමට එක් එක් ළමයෙක්ට දිරිගැන්වීම පිණිසය.

**සූදානම**

1. ලූක් 17:11–19 සහ 1 තෙසලෝනික 5:18 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. "මුලු ලොව පුරා ළමයින්" (ළමා ගීපොත, පි. 16) ගායනා කිරීමට හෝ වචනකීමට සූදානම් වෙන්න.
3. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්.
   ආ. කුඩා කෝප්පයක්, ලොකු හැන්දක්, වතුර බඳුනක්, කෝප්පයක් සහ වතුර බඳුන තැබීමට තරම් ප්‍රමාණයෙන් ලොකු වූ තාච්චියක් හෝ පැතලි දීසියක්.
   ඇ. එක් එක් ළමයාට පාටපැන්සල් සහ කඩදාසි.
   ඈ. රටහුණු ලෑල්ලක්, රටහුණු සහ මකනකෑල්ලක්.
   ඉ. 2-45 පින්තූරය, ලාදුරු රෝගීන් දසදෙනා. (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම -221; 62150).
4. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතියතුලදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යවන්න.

**බොහෝ ආශිර්වාද අපට දෙන ලදී.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

හිස් කෝප්පය, හැන්ද, සහ වතුර බඳුන පෙන්වන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ ඔවුන්ට දෙන ලද බොහෝ ආශිර්වාද ගැන සිතීමට ළමුන්ට කියන්න. එක් එක් ආශිර්වාදයක් ඔවුන් නම් කරන සෑම විටම වතුර බඳුනෙන් එක් වතුර හැන්දක් කෝප්පයට වත් කිරීමට ඔවුන්ට පහදා දෙන්න.

ඉහිරෙන වතුර එකතුවීමට, කෝප්පය සහ වතුර බඳුන තාච්චියේ හෝ දීසියේ තබන්න. මේසයක් හෝ පොළොව වැනි පැතලි මතුපිටක් මත තාච්චිය හෝ දීසිය තබන්න.

ළමයින්ට ඔවුන්ගේ ආශිර්වාද ගැන සිතීමට උපකාර වීම පිණිස පහත සඳහන් ප්‍රශ්න ඇසීමට ඔබට අවශ්‍යවෙනවා ඇත.

- ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දී තිබෙන ලස්සන මැවීම් සමහරක් මොනවාද?
- අපට ආශිර්වාදිත කර තිබෙන විශේෂ පුද්ගලයින් සමහරෙක් කවුද?
- අපගේ විශ්මජනක ශරීර වලට කළ හැකි දේවල් මොනවාද?

ආශිර්වාද නම් කරමින් කෝප්පය පිරී ඉතිරී යන තෙක් පිරවූ වතුර හැඳි කෝප්පයට දැමීමට ළමුන්ට වාර සලස්වා දෙන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ අපට ආදරය කරන බවත් බොහෝ ආශිර්වාද ලබා

දී ඇති බවත් විස්තර කරන්න. මෙම ආශිර්වාද ගැන අප සිතන විට, ස්වර්ගීය පියාණන් වහන්සේට අප ස්තුති වන්ත වන අතර ආදරයෙන්ද පිරී යයි. කෝප්පය ජලයෙන් පිරී පිටාර ගියාක් මෙන්, ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දී තිබෙන බොහෝ ආශිර්වාද නිසා අපට ආදරයෙන් පිරී යාමට හැකිවේ.

**අපට කෘතඥතාවය හැඟෙන අතර එය පෙන්විය යුතුය.**

කථාන්තරය සහ සාකච්ඡාව

පහත සඳහන් කතාන්තරය ඔබගේ වචනයෙන් කියන්න:

ලෝරාගේ උපන් දිනය පැමිණෙන බැවින්, ඇයට විශෙෂ තෑග්ගක් සෑදීමට ලෝරාගේ ආච්චි අම්මාට අවශ්‍ය වූවාය. ආච්චි අම්මාගේ පෙනීම දුර්වල බැවින් අතේ මැසීම අපහසු වූ නිසා, ලෝරාට බෝනික්-කෙකු සෑදීමට ඇ තීරණය කළාය. ගොතන ලද කොණ්ඩයෙන් යුතුව, විලාසිතා මැහුම් වලින් මුහුණ සකස් කොට, අලංකාර රේන්ද ඇඳුමකින් සරසා පැය ගණනාවක් ගතකරමින් ඇ බෝනික්කෙකු සෑදුවාය. ලෝරාගේ උපන් දිනයේදී, බෝනික්කාව ඔතා ලෝරාට දීමට ආච්චි එය ගෙන ගියාය.

ඔබ කථාව දෙවිදියකට අවසන් කිරීමට යන බව ළමයින්ට කියන්න. ඉතා හොඳට සවන් දී කුමණ අවසානය හොඳදැයි තීරණය කිරීමට ළමයින්ට කියන්න.

*1 වෙනි අවසානය.*

ලෝරා ඇයගේ උපන් දිනය හා තෑගි ගැන කළබල වූවාය. ඒවා සියල්ලම ඇය ඉක්මනට විවෘත කළාය. ආච්චි අම්මාගේ තෑග්ග රැගෙන එය විවෘත කළ ඇ ස්වල්ප වේලාවක් බෝනික්කා දෙස බලා සිට, බෝනික්කා පසෙකට තල්ලුකර දමා ඊලඟ තෑග්ග ගත්තාය.

- ලෝරා බෝනික්කාට කැමති උනාද කියා ඔබ සිතනවාද?
- ලෝරාගේ ආච්චිට කුමක් හැඟුනාද කියා ඔබ සිතනවාද?

*2 වෙනි අවසානය.*

ලෝරා ඇයගේ උපන් දිනය ගැන කළබල වී, එක එක තෑග්ග ප්‍රවේශමෙන් ඇ විවෘත කළාය. ආච්චි-ගෙන් ලැබුන පාර්සලය විවෘත කළ ඇයට, උණුසුම් හැඟීමක් ඇතිවිය. බෝනික්කාගේ ප්‍රවේශමෙන් ගොතන ලද කොන්ඩය, විසුතුරු විලාසිතා මැහුම් වලින් සකස් කරන ලද මුහුණ සහ රේන්ද ඇඳුම ප්‍රවේශමෙන් අත ගෑවාය. ආච්චි ලඟට දුව ගොස් ඇයව තදින් බදා ගත්තාය. “අනේ ඔබට ස්තුතියි ආච්චි” ඇය කෙඳුරුවාය.

- ලෝරා බෝනික්කාට කැමති උනාද කියා ඔබ සිතනවාද?
- ලෝරාගේ ආච්චිට කුමක් හැඟුනාද කියා ඔබ සිතනවාද?
- ඇයගේ ආච්චි පැය ගණනක් ගතකරමින් සෑදූ බෝනික්කා ගැන ලෝරා ආච්චිට ප්‍රශන්සාව සහ ආදරය පෙන්වූයේ කථාවේ කුමණ අවසානයේදීද?

සාකච්ඡා

කෘතඥතාවය යන වචනය රට හුණු ලෑල්ලේ ලියා ළමයින් සමග කියවන්න. කෘතඥතාවය යනු ස්තුති-වන්ත වීමේ හැඟීමක් යයි පහදා දෙන්න. යමෙකු අපට යම් දෙයක් කළ විට හෝ දුන්විටක, අප ස්තුති වන්තවීමෙන් අපගේ කෘතඥතාවය අප පෙන්විය යුතුය.

- කථාවේ දෙවෙනි අවසානයේදී ලෝරා බෝනික්කා වෙනුවෙන් කෘතඥතාවය පෙන්වූයේ කෙසේද?

කෘතඥතාවයේ හැඟීම් පෙන්වමින් අප සතුටු වන අතර, ස්තුතිය ලබන පුද්ගලයාද සතුටු වන බව පැහැදිලි කරන්න. කෘතඥතාවයේ හැඟීම් ලෝරා පෙන්වූ බැවින් ලෝරා සහ ඇයගේ ආච්චි ආදරය සහ ප්‍රීතියේ හැඟීම් බෙදාගත් බව පැහැදිලි කරන්න.

ශුද්ධ වූ ලියවිලි කථාන්තරය හා සාකච්චා

2-45, ලාදුරු රෝගීන් දසදෙනා පෙන්වා, ලූක් 17:11–19 සඳහන් කථාන්තරය කියන්න.

ශරීරයේ කොටස් විනාශ කරන ලාදුරු රෝගය භමේ රෝගයක් බව විස්තර කරන්න. ලාදුරු රෝගය බෝවන රෝගයක් යයි ජනතාව සිතූ නිසා ඔව්හු එයට භයවූහ. එබැවින් ලාදුරු රෝගීන් තම දෙමව්පියන්ට හා මිතුරන්ට ඈත්වී සිටියහ.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කී දෙය ලාදුරු රෝගීන් කළ නිසා, ඔව්හු ලාදුරු රෝගයෙන් සුවය ලැබූ බව විශේෂයෙන් පැහැදිලි කරන්න. ඔවුන්ගේ පවුල්වල අය සහ මිතුරන් සමග නැවත ජීවත් වීමට හැකියාව ලැබුනේය.

- යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙම මහත් හාස්කම ඔබට කළා නම් ඔබට කෙසේ හැඟෙන්නේද?

ලූක් 17: 15–17 ඔබ ශබ්ද නගා කියවන විට ලාදුරු රෝගීන් ඔවුන්ගේ කෘතඥතාවය පෙන්වූ අන්දම දැනගැනීම පිණිස ළමුන්ට සවන්දීමට සලස්වන්න.

- ලාදුරු රෝගීන් කීදෙනෙකු සුවය ලැබුවාද?

ඇඟිලි දහයක් එසවීමට ළමුන්ට සලස්ස වන්න.

- යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ස්තුති කිරීමට ලාදුරු රෝගීන් කීදෙනෙකු ආපසු පැමිණියේද?

ඇඟිලි නවයක් පහතට හෙළීමට ළමුන්ට සලස්වන්න. මෙම මහත්වූ හාස්කම නිසා, දහදෙනෙකුගෙන් එක් මිනිසෙකු පමණක් යේසුස් වහන්සේට කෘතඥතාවය පෙන්වූ බව විශේෂයෙන් පැහැදිලි කරන්න.

- යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ස්තුති කිරීමට එක් මිනිසෙකු පමණක් නැවත පැමිණියේ කුමක් නිසාදැයි ඔබ සිතන්නෙහිද?

**අපගේ යාච්ඤාවලදී ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීමට අපට හැකි වේ.**

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා

තෙසලෝනික 5:18 ශබ්ද නගා ළමයින්ට කියවන්න.

- මෙම ශුද්ධ වූ ලියවිල්ල අප කුමක් කළ යුතුදැයි කියන්නේද?

අප එක් එක්කෙනාට බොහෝ ආශිර්වාද ස්වර්ගීය පියාණන් වහන්සේ දී තිබෙන බව ළමයින්ට මතක් කරන්න. අපගේ ආශිර්වාද වලට උන්වහන්සේට ස්තුති කරන විට උන්වහන්සේ සතුටුවන සේක.

- උන්වහන්සේ අපට දෙන බොහෝ ආශිර්වාද වලට ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීමට අපට හැකිවන්නේ කෙසේද?

ගීතය

“ළමුන් මුලු ලොව පුරා” යන්න ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

මුලු ලොව පුරා දවස නිමාවේ,
සගයේ පියාගේ දරුවෝ දණ නමා යාච්ඤාවේ,
ස්තුතියි ඔබට සියලු දෙනා කියත්,
ස්තුතියි ඔබට ස්තුතියි ඔබට කියති නොයෙක් සේ.
“ග්‍රේසියස්.” “මාලෝ” “වර් ඩැන්කන් ඩර්” ලොව පුරා මුදු හඬින් ඇසේ.
සමහරු කියති “ටැක්”, අන්‍යයන් “මර්සි”,
“කන්ශා ෂිම්සු”, ඔබට අපි තුති දෙමු.
අප අහසේ පියාට ඇසේ ඒවා;
එක් එක් බසක් දනී එතුමා.,
අප සගයේ පියා දනිති ඒවා;
ඔහු ආදරෙයි, ආදරෙයි, සැම හටම.

සාකච්ඡා

- අප යාච්ඤා කරන්නේ කොයි වේලාවේද?

අප යාච්ඤාකරන විවිධ අවස්ථාවන් සහ සෑම යාච්ඤාවකදීම ස්වර්ගී යපියාණන් වහන්සේට ස්තුති කිරීමට තිබෙන දේවල් ගැන සාකච්ඡා කරන්න. නිදසුනක් වශයෙන්, කෑමට පෙර යාච්ඤාකරමින් ස්තුති කිරීමට අපට හැකිය. අපගේ යාච්ඤාවලදී ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීමට සිහි තබා ගැනීමේ වැදගත් කම ගැන විශේෂයෙන් පහදා දෙන්න.

**අපගේ ක්‍රියා මගින් අපගේ කෘතඥතාවය පෙන්වීමට හැකිය.**

සාකච්ඡා කිරීමේ ක්‍රියාකාරකම්

අපගේ ක්‍රියාකාරකම් වලින්ද කෘතඥතාවය පෙන්වීමට අපට හැකි බව පහදා දෙන්න. අප පණත්වලට කීකරු වෙමින් ස්වර්ගීය පියාණන් වහන්සේ අපට කියන දේවල් කරන විට, ස්වර්ගීය පියාණන් වහන්සේට අප ආදරය කරන බවත් උන්වහන්සේ අපට දෙන දේවල් වලට ප්‍රශංසා කරන බවත් අපට පෙන්වීමට හැකිය.

යම් පුද්ගලයෙකු ඔහුගේ හෝ ඇයගේ ක්‍රියා තුලින් කෘතඥතාවය පෙන්වීමට හැකි යම් අවස්ථාවන් විස්තර කරන්න. ස්වර්ගීය පියාණන් වහන්සේට කීකරු වීමෙන් එක් එක් පුද්ගලයෙකුට කෘතඥතාවය පෙන්වීමට හැකිබව කීමට ළමයින්ට කියන්න. පහත සඳහන් අවස්ථාවන් සාකච්ඡා කරන්න. නැතහොත් ඔබේම යමක් නිර්මාණය කරන්න:

1. මේරි ඇයගේ පවුලේ වැඩිමහල් ළමයාය. බාල සහෝදරයන් දෙදෙනෙකු සහ බාල සහෝදරියන් දෙදනෙකු ඇයට සිටිති. ඇයගේ පවුලට ඇය ස්තුතිවන්ත වෙයි.
   - මේරි ඇයගේ පවුල උදෙසා ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති වන්ත වන බව ඇයට පෙන්වීමට හැකි වෙන්නේ කෙසේද? (පවුලේ එක් එක් සාමාජිකයෙකුටම ආදරය හා කරුණාව පෙන්වීමෙන්ය.)
2. වැඩි මුදලක් උපයා ගැනීමට ජෝන් තම අසල්වැසියන්ට වැඩ කළේය. ඔහුට රැකියාවක් සොයා ගැනීමට පිහිට වූ බැවින් ඔහු ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුතිවන්තය.
   - ඔහුගේ කෘතඥතාවය ස්වර්ගීය පියාණන් වහන්සේට පෙන්වීමට ජෝන්ට හැකි වන්නේ කෙසේද? (ඔහු උපයන කොටසෙන් දසයෙන් එක කොටස ගෙවීමෙන්ය.)
3. සොකර් ක්‍රීඩා කිරීමට කිම් කැමතිය. ශක්තිමත් නිරෝගී ශරීරයක් ස්වර්ගීය පියාණන් වහන්සේ ඇයට දුන් නිසා ඇය ස්තුතිවන්තය.
   - ඇයගේ ශරීරය සඳහා ස්වර්ගීය පියාණන් වහන්සේට කෘතඥතාවය පෙන්වීම පිණිස කිම්ට කුමක් කළ හැකිද? (ප්‍රඥාවේ වචනයට කීකරු වීම, හොඳ ආහාර අනුභව කරමින් ශරීරය ගැන සැලකිළිමත් වීමය.)
4. ධර්ම දූතයන් ලීගේ පවුලේ අයට ශුභාරංචිය උගන්වා, මුලු පවුලව බව්තීස්මවූහ. ධර්මදූතයින්ට ලී ඉතාමත් ස්තුතිවන්තය.
   - ස්වර්ගීය පියාණන් වහන්සේට කෘතඥතාවය පෙන්වීම සඳහා ලීට කුමක් කළ හැකිද? (ඔහු ලොකු කෙනෙකු වූ විට ධර්මදූත සේවයේ යෙදීමට සූදානම් වීමය.)
5. ඈනා ඉරුදින තෙක් බලාසිටී. ප්‍රාතමිකයට යෑමට ඇය කැමතිය. සභාවට ඇය ස්තුතිවන්ත වෙයි.
   - ඇය කෙතරම් ස්තුතිවන්තදැයි ස්වර්ගීය පියාණන් වහන්සේට පෙන්වීම සඳහා ඈනාට කුමක් කළ හැකිද? (සියලුම රැස්වීම් වලට යෑම; සභාවේදී ගෞරවාන්විතව හැසිරීම.)

### සාරාංශය

චිත්‍ර ක්‍රියාකාරකම් — ළමයි ස්තුතිවන්ත වීමේ දේවල් ගැන පිංතූර ඇඳීමට කඩදාසි සහ පාට පැන්සල් ඔවුන්ට දෙන්න. ඔවුන්ගේ පිංතූර ගැන පන්තියේ අනික් ළමයින්ට කීමට ඔවුන්ට ආරාධනා කරන්න.

සාක්ෂිය — ඔබ ඔවුන්ගේ ගුරුවරිය වීම ගැන කොතරම් ස්තුතිවන්තේදැයි ළමයින්ට කියන්න. මෙම ආශිර්වාදයට ස්වර්ගීය පියාණන් වහන්සේට කෘතඥතාවය පෙන්වන අන්දම ගැන පහදාදෙන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ අපට බොහෝ ආශිර්වාද දීතිබෙන බවද, අපගේ ආශිර්වාද වලට අප කෘතඥතාවයේ හැඟීමෙන් උන්වහන්සේට ස්තුතිකරන විට උන්වහන්සේ සතුටුවන බව සාක්ෂි දරන්න.

ඉදිරි සතිය තුලදී ඔවුන්ගේ යාච්ඤා හා ඔවුන්ගේ ක්‍රියා තුලින් ඔවුන්ගේ ආශිර්වාද සඳහා ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීම පිණිස සිහිතබා ගැනීමට ළමයින්ව දිරිමත් කරන්න.

ළමයින් අවසාන යාච්ඤාවට සූදානම් වන විට, පංති යාච්ඤාවේදී ස්වර්ගීය පියාණන්ට කුමණ දේවල් ගැන ස්තුතිකිරීමට හැකිදැයි කියා ළමුන්ගෙන් අහන්න. අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

### සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට පෙර නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව", අමතර මගපෙන්වීම් වලට බලන්න.

1. ළමයින්ගේ ප්‍රියතම සතුන්, එලවළු සහ පලතුරු ගැන කීමට ඔවුන්ට කියන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ සැලසුම්කොට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙම සියල්ල අපගේ ප්‍රීතිය උදෙසා මැවූ බව ළමයින්ට විශේෂයෙන් පැහැදිලි කරන්න. මේ සියල්ලට අපගේ කෘතඥතාවය පෙන්වීමට අප සිහි තබාගත යුත්තෙමු.

2. සතුන් සමහරෙකුගේ පිංතූර නේවන්න. සතුන්ට අවශ්‍ය සැලකීම, ජලය, ආහාර, බලාගැනීම, ආදරය වැනි දේවල්ගැන සාකච්ඡා කරන්න. සතුන් සහ වෙනත් මැවීමේ දේවල් රැකබලාගැනීම ස්වර්ගීය පියාණන් වහන්සේට ඒවා උදෙසා අපගේ කෘතඥතාවය පෙන්වීම බව පහදා දෙන්න.

3. පවුල් නිවාස සැන්දෑ වීඩියෝ අතිරේකයේ 2(53277) "දෙවියන්වහන්සේට සහ මැවිල්ලට ගෞරව කිරීම" යන කොටස ඇත්නම් එය පෙන්වන්න. අපට ජීවත්වීමට හා ප්‍රීතිවීමට අවශ්‍ය සියලුම දේවල් ස්වර්ගීය පියාණන් වහන්සේ සැලසුම් කොට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මැව්ව බව විශේෂයෙන් පැහැදිලි කරන්න. අපගේ බොහෝ ආශිර්වාද වලට අප ඔවුන්ට කෙතරම් ස්තුතිවන්ත විය යුතුදැයි පෙන්විය යුතුය.

4. "අපගේ පියාණන්ට ස්තුතිවේවා" (ළමා ගීපොත පි:20), "මා වැනි කුඩා ළමයෙකුට පුලුවන්ද?" (ළමා ගී පොත පි: 9), හෝ "මම තුති දෙමි, ආදර පියාණෙනි" (ළමා ගී පොත පි 7), යනාදිය ගායනා කරන්න නැතහොත් වචන කියන්න. "මම තුති දෙමි ආදර පියාණෙනි" යන්නෙහි වචන මෙම අත්පොතේ පිටුපස අඩංගු වේ.

   ගායනා කිරීමෙන්ද ස්වර්ගීය පියාණන් වහන්සේට තුතිකළ හැකි බව ළමයින්ට කියන්න. ප්‍රශංසාවේ ගීත ස්වාමීන් වහන්සේට යාච්ඤා වැනි බව පහදා දෙන්න. (ධ සහ ගි 25:12 බලන්න).

අප පියාණන්ට තුති වේවා.

අපේ පියාට තුති පුදමු,
සියල්ල අපට එතුමා දෙන බැවින්.

ඇස් සහ කණ සහ අත් සහ කකුල්,
ඇඳීමට ඇඳුම්, සහ කෑමට ආහාර,

පියා, මව, කුඩා බබා
සගයේ පියා සියල්ල දෙයි.

අපේ පියාට ස්තුති පුදමු,
සියල්ල අපට එතුමා දෙන බැවින්.

මා වැනි කුඩා ළමයෙකුට පුලුවන්ද?

මා වැනි කුඩා ළමයෙකුට පුලුවන්ද
තුති දෙන්න හරියට පියාට?
අහෝ ඔව්! ඔව් යහපත සත්‍ය,
ඉවසීම, සියල්ලට කරුණාව!
සමිඳුන්ට ආදරින් ඔබේ කොටස කරමින්;
මුළු හදින් කියමින් මෙසේ;
අප පියාණන්ට, තුති වේවා!
අප පියාණන්ට තුතිවේවා
සගයේ පියාණෙනි, තුති අපි පුදමු!

25
වෙනි
පාඩම

# "ඔබට ස්තූතියි" කීමට මතක තබා ගන්න

**අරමුණ**

අන්‍යයන්ගෙන් ඔවුන්ට ලැබෙන කරුනාවේ හා ආදරයේ ක්‍රියා වලට ස්තූති කිරීම පිණිස ළමයින්ට මතක්කිරීම සඳහා දිරි ගැන්වීමට.

**සූදානම**

1. ලූක් 17: 11–19 සහ දහම ගිවිසුම 78:19, යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. පෙන්වාදී තිබෙන ඔබට-ස්තූතියි සටහනක් සූදානම් කරගන්න.

> ඔබට ස්තූතියි. ඔබ මාගේ ගුරුවරිය නිසා
> මම සතුටුවෙමි
> ආදර,
> රෙබේකා.

3. අවශ්‍ය උපකරන
   අ. බයිබලයක් සහ දහම සහ ගිවිසුමක්.
   ආ. පැන්සල් හෝ පාට පැන්සල්ද එක් එක් ළමයාට කොලකෑල්ලක්.
   ඇ. රට හුණු ලෑල්ල, රට හුණු සහ මකණයක්.
   ඈ. 2-45, පිංතූරය, ලාදුරු රෝගීන් දසදෙනා (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 221:62150).
4. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

*සටහන:* "ඔබට ස්තූතියි" උචිත අවස්ථාවකදී ළමුන්ට කීමට මෙම පාඩමේ දී විශේෂ පරිශ්‍රමයක් දරන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ළමුන්ට ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**විශේෂ වචන දෙකක් අපට භාවිතා කළ හැකිය.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ළමයින් සියලුදෙනාම සමග බෙදා ගැනීමට ඔබට අවශ්‍ය විශේෂ වචන දෙකක් තිබෙන බව ළමුන්ට කියන්න. ඕනෑම කෙනෙක් විසින් මෙම විශේෂ වචන දෙක භාවිත කළ හැකිය, නමුත් එය අවශ්‍ය ප්‍රමාණයට නිතර භාවිතා වන්නේ නැත. "ඔබට ස්තූතියි" එක් ළමයෙකුට කොඳුරන්න. "ඔබට ස්තූතියි" කියා තවත් ළමයෙකුට කීමට ඔහුට හෝ ඇයට කීමට සලස්වන්න. සෑම ළමයෙකුටම වචනය ඇසෙන තෙක් කරගෙන යන්න. අන්තිම ළමයාට නැගිට සිට වචන දෙක හඬනගා කීමට සලස්වන්න.

- "ඔබට ස්තූතියි" යන්න අප කියන්නේ කුමණ අවස්ථාවකදීද?

අන්‍යයන් අපට කරුණාවන්ත දේවල් කරනවාට අප සියලු දෙනාම කැමති නමුත්, සමහර විට ඔවුන්ට ස්තුති කිරීමට අපට අමතක වන බව පහදා දෙන්න.

ශුද්ධ වූ ලියවිලි කථාන්තර

ලාදුරු රෝගීන් දස දෙනා, වන 2–45 පින්තූරය, පෙන්වා පළමු පින්තූරය ගැන ඔවුන්ට මතක කුමක්-දැයි ඔබට කීමට ළමයින්ට කියන්න. ලාදුරු රෝගීන් දස දෙනා ගැන කථාන්තරය ළමයින් ලවා රඟදැක්වීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත (ලූක් 17:11–19 - බලන්න).

පිංතූරයට යොමු වෙමින්, ක්‍රිස්තුස් වහන්සේට ස්තුති කරන ලාදුරු රෝගියාව පෙන්වන්න.

- මෙම මිනිසා යේසුස් වහන්සේ වෙතට නැවත පැමිණියේ කුමක් නිසාද?
- අනිත් මිනිසුන් කළේ කුමක්ද?

ලාදුරු රෝගීන් දස දෙනාම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සුවකළ නමුත්, උන්වහන්සේට ස්තුති කිරීමට මතක් වූයේ එක්කෙනෙකුට පමණි. එක් පුද්ගලයෙකුට මතක් වූ බැවින් යේසුස් වහන්සේ සතුටු වන අතර, අන්‍යයන් එසේ නොකළ නිසා දුකට පත් වූ සේක.

සාකච්ඡාව

- ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට කුමක් වෙනුවෙන් අප ස්තුති කළ යුතුද?
- අප ස්තුති කළ යුත්තේ තවත් කාටද? (අපගේ පවුල් වලට, ගුරුවරුන්ට, මිතුරන්ට සහ අපට කරුණාවන්ත යමක් කරන ඕනෑම කෙනෙකුටය.)

### අන්‍යයන්ට ස්තුති කිරීමට අපට හැකිය.

කථාන්තර සහ සාකච්ඡා

රට හුණු ලෑල්ලේ සරල චිත්‍ර ඇඳ පෙන්වා දෙමින්, පහත සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න. (මාළු බාන බිලී පිත්තක්, මාළුවෙකු සහ කේක් එකක් වැනි දේවල්):

ගඟ අසබඩ කඳවුරු බැඳ මාළු අල්ලමින් සෙනසුරාදා මුලු දවසම විනෝද වීමට කාලොස් කැමතිය. නමුත් ඔහුගේ පියාගේ මරණින් පසු කාලොස්ට බොහෝ දේවල් වෙනස් විය. මාළු ඇල්ලීමට ඔහුව ගෙන යාමට කිසිවෙකු නැති විය.

කාලෝස්ට කණගාටුවත් හුදකලාවේ හැඟීමකුත් ඇති විය. ඔහුගේ ප්‍රාථමික ගුරුවරයා වන, ටේලර් සහෝදරයා, ඔහු දුකෙන් සිටින බව දැන, ඔහුව සතුටු කිරීමට අවශ්‍ය විය. මාළු ඇල්ලීමට යෑම පිණිස ටේලර් සහෝදරයා කාලෝස්ට ආරාධනා කළේය.

මාළු ඇල්ලීමට නැවත යන නිසා කාලෝස් සතුටු විය. ඔහු සූදානම් වී, ඔහු සමග යෑමට ටේලර් සහෝ-දරයා එන තෙක් බලා සිටියේය. කාලෝස්ට සහ ටේලර් සහෝදරයාට එදින ගඟ අසබඩදී ප්‍රිය උපදවන දිනයක් විය. මාළුන් කීපදෙනෙක් ඔවුන් ඇල්ලූ අතර, කාලෝස් ගේ මව සහෝදරයින් සහ සහෝදරියන් සමග එදින රාත්‍රී කෑමට ඔව්හු මාළු අනුභව කළහ.

ටේලර් සහෝදරය ඔහුව මාළු ඇල්ලීමට එක්ක ගිය නිසා ඔහුට ස්තුති කිරීමට කාලෝස්ට අවශ්‍ය විය.

- ටේලර් සහෝදරයාට ස්තුති කිරීමට කාලෝස්ට කළ හැකි වූයේ කුමක්ද?

ළමයින් උත්තර දුන්නාට පසු, ඔවුන්ගේ යෝජනා වලට ස්තුති කර, කාලෝස් කිරීමට තීරණය කළ දෙය ඔවුන්ට කියන්න:

ටේලර් සහෝදරයාට ස්තුති කිරීම පිණිස, ලස්සන දෙයක් කිරීමට කාලෝස් තීරණය කළේය. කේක් එකක් සෑදීමට කාලෝස් තම මවට උදව් කළේය. පසු දින කේක් එක රැගෙන ඔහු ටේලර් සහෝදරයාගේ ගෙදර ගියේය. කාලෝස් ටේලර් සහෝදරයාට කේක් එක දී මෙසේ කීවේය, "මාළු ඇල්ලීමට මා එක්ක-ගෙන ගිය බැවින් ඔබට ස්තුතියි."

- කාලෝස් ඔහුට කේක් එක ගෙනා විට ටේලර් සහෝදරයාට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?
- කාලෝස්ට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?

ශුද්ධ වූ ලියවිලි

දහම සහ ගිවිසුම 78:19 ශබ්ද නගා කියවන්න. අප ස්තූති වන්ත වෙනවා නම්, අප සතුටට පත්වන බව මෙම ශුද්ධ වූ ලියවිල්ල කියන බව පහදා දෙන්න.

- "ඔබට ස්තූතියි" ඔබ යමෙකුට කීවිට ඔබට හැඟෙන්නේ කෙසේද?
- "ඔබට ස්තූතියි" යමෙකු ඔබට කීවිට ඔබට හැඟෙන්නේ කෙසේද?

ළමයින්ගේ සහභාගීත්වය

ඔවුන් යමෙකුට කළ යම් දෙයකට ඔවුන්ට ස්තූති කළ අවස්ථාවන් ගැන කීමටත්, ඔවුන්ට ස්තූති කළ විට ඔවුන්ගේ හැඟීම් පහදා දීමටත් ළමයින්ට ආරාධනා කරන්න. ඔබේම පුද්ගලික අත්දැකීමක් ගැන කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

**"ඔබට ස්තූතියි" යන්න බොහෝ ක්‍රම වලින් අපට කීමට හැකිය.**

කථාන්තරය

පහත සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියවන්න:

වෙලස් සහෝදරිය ප්‍රාථමික ගුරුවරියකි. ඇයගේ පංතියේ ළමයින්ට උගන්වමින්ද ආදරය කරමින්ද ඇ ප්‍රීති වූවාය. සෑම ඉරු දිනකම හොඳ පාඩමක් ඉගැන් වීමට ඈ සූදානම් වෙමින් පරිශ්‍රම දැරුවාය. ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුන් වහන්සේට ඈ ආදරය කළ අතර, යේසුස් වහන්සේ ඔවුන් එක් එක්කෙනාට කෙතරම් ආදරය කරනවාද කියා ඇයගේ සාක්ෂිය ළමයින්ට ඈ කීවාය. ඇයගේ පංතියේ ළමයින්ට ඇයගේ ආදරය හා අවධානය පෙන්නුවාය. ඔවුන්ගේ උපන්දින සහ වෙනත් විශේෂ අවස්ථාවන් ඇය නිතර මතක තබා ගත්තාය.

එක් ඉරු දිනක සභා රැස්වීම් වලින් පසු, වෙලස් සහෝදරියගේ දොරට යමෙකු තට්ටු කළේය. ඇයගේ පංතියේ එක් ගැහැණු ළමයෙකු වන, ඇය රෙබේකාය. ලස්සන රෝස පාට ලියුම් කවරයක බහාලූ යමක් රෙබේකා වේල්ස් සහෝදරියට දුන්නාය.

- ලියුම් කවරය තුල තිබූ දෙය අනුමාන වශයෙන් ඔබලාට කියන්න පුලුවන්ද?

ඔබ සූදානම් කළ "ඔබට ස්තූතියි" යන සටහන එලියට ගෙන කියවන්න.

- ඇය මෙම සටහන කියවූ විට වෙලස් සහෝදරියට කුමක් හැඟෙන්නට ඇද්දැයි ඔබ සිතන්නෙහිද?

සාකච්ඡාව

- "ඔබට ස්තූතියි" රෙබේකා ඇයගේ ගුරුවරියට කීවේ කෙසේද?
- අප ස්තූතිය ප්‍රකාශ කිරීමේ වෙනත් ක්‍රම මොනවාද?
- කරුණාවන්ත දේවල් ඔබට කරන්නේ කවුද?

රට හුණු ලෑල්ලේ අන්තිම ප්‍රශ්නයට ළමයින්ගේ පිළිතුරු ලැයිස්තුගත කරන්න. ළමයින් සියලු දෙනාටම පිළිතුරු දීමට අවස්ථාවක් ලැබුනාට පසු, රට හුණු ලෑල්ලේ ලැයිස්තුවට යොමු වී, එක් එක් පුද්ගලයාට කුමක් උදෙසා ස්තූති කළ හැකිද කියා ළමයින්ගෙන් අහන්න. නිදර්ශනයක් වශයෙන්, ළමයින්ගෙන් මෙසේ අසන්න:

- සභාපතිත්වයේ සාමාජිකයින්ට ස්තූති කිරීමට ඔබට හැකි වන්නේ කුමකටද?
- ප්‍රාථමිකයේ සංගීතය මෙහෙය වන්නාට හෝ පියානෝ වාදිකයාට ස්තූති කිරීමට ඔබට හැකි වන්නේ කුමකටද?

චිත්‍ර ක්‍රියාකාරකම්

ඔබට ස්තූතියි සටහන් සෑදීමට පැන්සල් හෝ පාට පැන්සල් සහ කඩදාසි දෙන්න. ඔබට-ස්තූතියි යන්න ඔවුන්ගේ සටහන් වල ලිවීමට හෝ ලිවීමට උපකාර කර, පැන්සල් හෝ පාට පැන්සල් වලින් එම සටහන් අලංකාර කිරීමට ඔවුන්ට සලස්වන්න.

ඔවුන්ට ස්තූති කිරීමට අවශ්‍ය යම් කෙනෙකුට මෙම සටහන් ඔවුන්ට දීමට හැකි බව පහදා දෙන්න. ඔවුන් එම සටහන් දෙන්නේ කාටද කියා කීමට සලස්වන්න. අන්‍යයන්ට ස්තූති කිරීමෙන් ස්තූතිය ලබන තැනැත්තා සතුටු වෙනවා පමණක් නොව, අපද සතුටු වන බව ළමයින්ට මතක් කර දෙන්න.

**සාරාංශය**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම්

පංතිය අවසාන කිරීමට පෙර, ප්‍රාථමික කාලයේදී යම් දෙයක් හොඳට කළ එක් එක් ළමයෙකුට ඔහුට හෝ ඇයට ස්තූති කරන්න. නියත වශයෙන් සහ අවංකව කරන්න. ඔබට ළමයෙකුට මෙසේ ස්තූති කළ හැකි වේ—

- පංති කාලයේදී ගෞරවාන්විතව වාඩිවී සිටීම.
- පාඩමට සවන්දීම.
- ආරම්භක යාච්ඤාව කීම.
- අන්‍යයන්ට කරුණාවන්තව සැලකීම.
- ආරම්භක අභ්‍යාස වලදී ගායනා කිරීම.
- කථාකිරීමට පෙර අතක් එසවීම.
- ප්‍රශ්නයකට පිළිතුරු දීම.
- පංති වේලාවේදී සතුටින් සිටීම.

සාක්ෂිය

ඔබගේ පංතියේ එක් එක් ළමයෙකු සිටීම ගැන කෘතඥතාවය ප්‍රකාශ කරන්න. "ඔබට ස්තූතියි" යන සරල වචනය කෙනෙක් කොතරම් සතුටු කිරීමට හැකිද කියා ළමයින්ට මතක් කරන්න.

"ඔබට ස්තූතියි" යන විශේෂ වචන සතිය තුලදී ඔවුන්ගේ පවුල සහ මිතුරන් සමග කී වතාවක් භාවිතා කළ හැකිද කියා බැලීමට ළමයින්ව දිරි ගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාර කම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව", අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. ළමයින්ට නැගිට, ඔවුන්ගේ පුටු වටේට ගමන් කිරීමට ඉඩ ලබා ගත හැකි අන්දමට පුටු පසෙකට තබා සකස් කරගැනීමට ළමයින්ට කියන්න.

   "මට කණ් දෙකක් තිබේ" (ළමා ගී පොත, පි. 269) පහත සඳහන් අභිනය භාවිතා කරමින්, පළවෙනි පදය හා ගීත කණ්ඩය ගායනා කිරීමට හෝ වචන කීමට ළමයින්ට උපකාර කරන්න.
   සත්‍ය ඇසීමට කණ් දෙකක් ඇත මට (කණ් පෙන්වන්න),
   යහපත දැකීමට ඇස් දෙකක් (ඇස් පෙන්වන්න).
   ගෙන යෑමට මා පා දෙකක්
   යායුතු තැනට යෑමට (පුටුව වටේ ඇවිදින්න).
   ගීත කණ්ඩය:
   ඥාණවන්තව එය භාවිතා කරමි.
   වැඩෙහි සහ මගේ ක්‍රීඩාවේ (බෝලයක් උඩ දමන බව අඟවන්න).
   සගයේ පියාට තුති දෙමි
   මෙලෙස මා හැදූ බැවින් (වාඩි වෙන්න, අත් නමා ගන්න, හිස නමන්න).

2. සියලුම ළමයින්ට අල්ලා ගැනීමට තරම් දිග තිබෙන නූල් කැල්ලකට හෝ ලනුවකට බොත්තමක් හෝ මුද්දක් අමුනා ලනුවේ කොන් එකට තබා ගැට ගසන්න. රවුමට ළමයින්ට වාඩිවීමට සලස්වා ලනුවට උඩින් අත් තබා ගන්න කියන්න. ඔබ "නවතින්න" කියන තෙක්, බොත්තම හෝ මුද්ද එක් ළමයෙකුගෙන් අනික් ළමයාට යවන්න සලස්වන්න. නවත් වන විට බොත්තම හෝ මුද්ද ඇති ළමයා මෙසේ කියයි, "මම ස්තුති වන්ත වෙමි (පුද්ගලයාගේ නම) යමකට." සෑම ළමයෙකුටම පිළිතුරු දීමට අඩුම වශයෙන් එක් අවස්ථාවක් හෝ ලැබෙන තෙක් ක්‍රීඩාව කරගෙන යන්න.

3. "මම වීමට මම ස්තුති වන්ත වෙමි" (ළමා ගී පොත පි. 11) ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

   රෑට සයනේ හුදකලාවේ.
   ඇස් පියා බලමි මම
   තුති දීමට බොහෝ දේ ගැන
   දෙවිඳු මට දුන්.
   මිතුරන්, ගුරුවරුන්, දකිමි මම,
   අන්‍යයන් මට ආදරය කරන.
   බොහෝ මෙම ආසිරි හැඟෙයි මට
   මා නිසා තුති දෙමි.

4. ළමයි ස්තුති වන්ත විය යුතු හැඩයේ යමක් සෑදීමට ලුනු (පිටි) බෝලය සූදානම් කරන්න. (ලුනු (පිටි) බෝලයේ වට්ටෝරුව 43 වන පිටුවේ සඳහන්ය). ළමයින් ගේ නිර්මාණ ගෙදර ගෙන ගොස් ඔවුන් යාච්ඤාකරන ස්ථානයට ලඟ තැනකින් තබා ගැනීමට කියන්න. එවිට ඔවුන්ගේ ආශිර්වාද වලට යාච්ඤාවේදී ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීමට මතක තබා ගන්නවා ඇත.

5. ඊතර් 2:16–18 සහ 6:4–11 සඳහන් වන පාරු තුල සිටි ජෙරඩ් වරුන්ගේ කථාන්තරය කියන්න. ගැලපෙන භාජන දෙකක් එක් කොට ගැටිය මත තබමින් පාරු පෙන්වා දීමට ඔබට හැකිවේ.

   ජෙරාඩ් වරුන්ට මෙන් ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල් වලට පාරු සෑදීමට ස්වාමීන් වහන්සේ කීවේයයි සිතාගැනීමට ළමයින්ට කියන්න. අවුරුද්දකට වඩා වැඩි කාලයක් මෙම කුඩා පාරු තුල මහ සාගරය මත සිටි බව ඇඟවීමට ඔවුන්ට කියන්න. සාගරයේ ඒ මේ අතට වැනෙමින් සම්පූර්ණ-යෙන්ම ගිලුනු අවස්ථාවන්ද ඔවුන්ට ඇති විය. බොහෝ සත්තුද පාරු තුල සිටියෝය.

   - එවැනි කථාවක් ගැන ඔබට හැඟෙන්නේ කෙසේද?

   ජෙරාඩ් වරුන්ට එම චාරිකාව ගැන ඇතිවූ හැඟීම් බලා ගැනීමට ඊතර් 6:9 ශබ්ද නගා කියවන්න. දුශ්කර අවස්ථාවන් අපට ඇති වූවත්, ස්තුතිවන්ත වීමට අපට බොහෝ දේවල් තිබෙන බව වටහා ගැනීමට ළමයින්ට උපකාර කරන්න. නිදර්ශනයක් වශයෙන්, අප අසනීප වී සිටිනවානම්, අපට සත්කාර කරන පුද්ගලයින් සඳහා අපට ස්තුතිවන්ත විය හැකිය. ස්තුති වන්ත වීම පිණිස දේවල් අප නිතර සොයනවා නම්, අපගේ බොහෝ ආශිර්වාද අපි දකින්නෙමු.

6. ඊලඟ සතිය තුලදී, ඔබට-ස්තුතියි සටහන් පංතියේ ළමයින්ට යවන්න. ඔහු හෝ ඇය ඔබගේ පංතියේ සිටීම ගැන ඔබ කොතරම් අගය කොට සලකනවාද කියා එක් එක් ළමයෙකුට කියන්න. එක් එක් ළමයා පංතියට උපකාර කිරීම පිණිස කළ යම් විශේෂ දෙයක් සඳහන් කරන්න.

# හරි දෙය තෝරා ගැනීමෙන් මට යහපත් හැඟීමක් ඇතිවේ

**26**
වෙනි
පාඩම

---

**අරමුණ**

හරි දෙය කිරීමෙන් අප සතුටු වන අතර වැරදි දෙය කිරීමෙන් අප අසතුටු වන බව එක් එක් ළමයෙකුට තේරුම් ගැනීමට උපකාර වීම පිණිසය.

---

**සූදානම**

1. ලූක් 15:11–24 යාච්ඤාවෙන් අධ්‍යානය කරන්න.
2. "සිනාව" (ළමා ගී පොත පි. 160) ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. මෙම ගීතිකා වලට වචන මෙම අත් පොතේ පිටුපස අඩංගු වී ඇත.
3. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්
   ආ. එක් එක් ළමයෙකුට කුඩා ගලක් හෝ බෝංචි ඇටයක්.
   ඇ. 22 වෙනි පාඩමෙන් සිනහ වෙන/රවන මුහුණක්.
   ඈ. එක් එක් ළමයෙකුට පැන්සලක් හෝ පාට පැන්සලක්.
   ඉ. එක් එක් ළමයෙකුට විශාල කඩදාසි රවුමක්.
   ර්. 2-6 පිංතූරය, අකීකරු පුත්‍රයා (ශුභාරංචිය චිත්‍ර පිංතූර මෙවලම 200: 62155).
4. සාරවත් කිරීමේ ක්‍රියාකාර කම්භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

*සටහන:* අවුරුදු අටට බාල ළමයින් තවමත් ගණන් දිය යුතු නොවන නිසා පව් වලට කමා වීම අවශ්‍ය නොවන බව මතක තබා ගන්න. හරි දෙය කිරීමට ළමයින්ට දිරිගන්වන්න, ඔවුන් කළ දේවල් වලට ඔවුන් වරදකරුවන් යයි හැඟීමට ඉඩ නොතබන්න.

---

**යෝජිත පාඩම් වැඩි දියුනු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**නරක දෙය කිරීමෙන් අප අපහසුතාවයට පත් වෙයි.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ළමයෙකුට එක් සපත්තුවක් ගලවා එය තුලට කුඩා ගල් කැටයක් හෝ බෝංචි ඇටයක් දැමීමට සලස්වන්න. සපත්තුව නැවත දමා කාමරය වටේ අඩි ස්වල්පයක් ඇවිදීමට සලස්වන්න. ඔහුගේ හෝ ඇයගේ කකුලට දැනෙන්නේ කුමක්ද කියා අනිත් ළමයින්ට කීමට ළමයාට කියන්න.

දේවල් හරියාකාරව නොවූ විට, අපහසුතාවයක් හා අසතුටක් අපට දැනේ, එවිට වැරැද්ද කුමක්ද කියා අපි බොහෝ සේ සිතන්නෙමු.

එම ද්‍රව්‍ය ඉවත් කොට කාමරය වටේ නැවත ඇවිදීමට ළමයාට කියන්න. ඔහුගේ හෝ ඇයගේ කකුලේ කෙතරම් අපහසුවක් දැනෙනවාද කියා පංතියට කීමට ළමයාට සලස්වන්න.

එක් එක් ළමයාට ගල් කැටයක් හෝ බෝංචි ඇටයක් දී, සහභාගී වීමට කැමති අයට ගල් කැට හෝ බෝංචි ඇට සපත්තු තුලට දමා ගැනීමට සලස්වන්න. එම ද්‍රව්‍ය නිසා කෙතරම් අපහසුතාවයක් දැනෙ-නවාද කියා දැනගැනීමට නැගිට අඩි ස්වල්පයක් ඇවිදීමට සලස්වන්න. ගල්කැට හෝ බෝංචි ඇට

එකතු කොට, එම ද්‍රව්‍ය ඉවත් කළ විට ඔවුන්ගේ කකුල් වලට කොතරම් පහසුතාවයක් දැනෙනවාද කියා බලා ගැනීමට නැවත නැගිට ඇවිදීමට සලස්වන්න.

ගල් කැටය හෝ බෝංචි ඇටය වැරදි ක්‍රියාවකට සමාන කරන්න. වැරදි යමක් අප කළ විට, අපහසුතාවයක් හෝ අසතුටක් අපට ඇතිවේ. ලමුත් අප කළ වැරැද්ද වෙනුවෙන් අප දුක්වී, අපගේ වැරදි තීරණය නිවැරදි කර ගැනීමට අප උත්සාහ කිරීම, අපගේ සපත්තුවේ තිබෙන ගල් කැටය හෝ බෝංචි ඇටය ඉවත්කිරීම වැනිය. අපහසුතාවයේ හැඟීම් පහව ගොස් නැවත අපට සතුටු වීමට හැකිය.

අපහසුතාවයේ හැඟීම් වෙනුවට සතුටු දායක හැඟීම් ගැන පාඩමේ උගන්වන බව පහදා දෙන්න.

**අපහසුතාවයේ හැඟීම් වෙනුවට සතුටුදායක හැඟීම් අපට ඇතිකර ගැනීමට හැකිය.**

- වැරදි යමක් ඔබ කළවිට ඔබට හැඟෙන්නේ කෙසේද?

කතාන්තරය සහ සාකච්ඡා

යම් වැරදි දෙයක් කිරීමෙන් අසතුටට පත්වූ එක් ගැහැණු ළමයෙක් ගැන කියන පහත සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න. ඇයගේ අසතුටු දායක හැඟීම් වෙනුවට සතුටුදායක හැඟීම් ඇති කර ගැනීම පිණිස ඇය කළ දෙය දැනගැනීමට ළමයින්ට සවන්දීමට කියන්න.

කුඩා පළතුරු සහ එළවළු සහිත ලස්සන සෙල්ලම් භාන්ඩයක් ඇන්ජලාගේ මිතුරිය වන මාරියාට තිබුනේය. මෙම ආහාර සමග සෙල්ලම් කිරීමට ඇන්ජලා ඉතාම කැමති අතර එය ඇගේම වූයේනම් ඇය කැමති විය. දිනක් මාරියා ඒ දෙස නොබලන විටක කුඩා පළතුරු සහ එළවළු අහුරක් ඇන්ජලා සාක්කුවට දමාගත්තාය. ඇන්ජලා එම ආහාර ගැන කිසිවෙකුට නොකියා ගෙදර ගෙන ගියාය.

- ඇන්ජලා රැගෙන ගිය එම සෙල්ලම් ආහාර සමග ක්‍රීඩා කරන විට ඇය විනෝද වූවාද කියා ඔබ සිතන්නෙහිද?

කිසිවෙකුට පෙනෙන ආකාරයට සෙල්ලම් ආහාර සමග සෙල්ලම් කිරීමට ඇන්ජලාට නොහැකි විය, මක්නසාද එය ගත්ත බව ඇයගේ මව දැනගැනීම ඇයට අවශ්‍ය නොවීය. පළතුරු සහ එළවළු ඇඳ යට ඈ සැඟවූ අතර, ඒවා සමග ක්‍රීඩා කිරීමට අවශ්‍ය වූ විට ඇය ඇඳ යටට බඩගා යයි. ඇයට අවශ්‍ය වූ සෙල්ලම් බඩු ඇයට දැනට තිබුනත් ඇයගේ ඇතුලාන්තයෙහි අසතුටු තාවයේ හැඟීම් පවතියි.

- ඇයගේ අසතුටු දායක හැඟීම් වෙනස් කර ගැනීමට ඇන්ජලාට කුමක් කළ හැකිද?

ඔවුන්ගේ සුදුසු යෝජනා වලට ළමයින්ට ප්‍රශංසා කර, ඇන්ජලා කළ දෙය පහදා දෙන්න.

ඇය ඇඳ යටට වී සෙල්ලම් කරනවා ඇන්ජලාගේ මව දැක කුමක් කරනවාදැයි ඇයගෙන් ඇසුවාය. සෙල්ලම් කරන ආහාර ඇන්ජලා ඇගේ මවට පෙන්වා ඇය කොතරම් අසතුටෙන් ඉන්නවාද කියා විස්තර කළාය. නැවත සතුටු වීම පිණිස ඇය කළ යුතු දෙය තේරුම් ගැනීමට ඇන්ජලාගේ මව ඇයට උපකාර කළාය. ඇන්ජලා සෙල්ලම් ආහාර මාරියාට ආපසු දී, එය ගෙන ගිය නිසා සමාවීමට මාරියාට කීවාය. සෙල්ලම් ආහාර ආපසු දුන්නාට පසු, ඇන්ජලාට සතුටක් සහ සහනයක් ලැබුනේය. ඇයගේ වැරදි තීරණය නිවැරදි කර ගැනීමට හැකි වූ බැවින් ඇය සතුටු වූවාය.

- ඇන්ජලා කළ වැරැද්ද කුමක්ද?

සාකච්ඡාව

සිනහවෙන/රවන මුහුණේ චිත්‍රය පෙන්වන්න. අසතුටු මුහුණ පෙන්වා සතුටු මුහුණ පෙන්වන්න.

- සෙල්ලම් ආහාර ඇය ගත්තාට පසු ඇන්ජලාගේ හැඟීම් පෙන්නුම් කරන්නේ කුමන මුහුණෙන්ද? (අසතුට පෙන්නුම් කරන චිත්‍රය හැරවීමට ළමයෙකුට ආරාධනා කරන්න.)
- ඇයගේ වැරදි තීරණය නිවැරදි කර ගැනීමට ඇන්ජලා කළේ කුමක්ද?

- ආහාර ආපසු දුන් විට ඇන්ජලාගේ හැඟීම් පෙන්නුම් කරන්නේ කුමණ මුහුනෙන්ද? (සතුට පෙන්නුම් කරන චිත්‍රය හැරවීමට ළමයෙකුට ආරාධනා කරන්න.)

සමහර විට අප සියලු දෙනාම වැරදි දේවල් කරන බව ළමයින්ට කියන්න. වැරදි දේවල් කිරීමෙන් අප අසතුටට පත්වේ. නමුත් අප සමාවෙන්න කියා වැරදි තීරණ නිවැරදි කිරීමට උත්සහ ගන්නා විට නැවතත් අපට සතුටු විය හැකිය.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වන්නේ අප සතුටින් සිටීමය.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම්

සමාවෙන්න කීමත් වැරදි තීරණ නිවැරදි කරගැනීමත් පසුතැවිලි වීමේ පියවර දෙකාක් බව පහදා දෙන්න.

පසුතැවිලි වීම යන වචනය කිහිප වරක් කියවීමට ළමයින්ට සලස්වන්න.

අප හරි දෙය තෝරා ගැනීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වූ නමුත්, සමහර විට අප වැරදි දේවල් කරන බව උන්වහන්සේ දන්නා බව පහදා දෙන්න. අප වැරදි දෙයක් කළ විට එයට පසුතැවිලි වීමේ මාර්ගය උන්වහන්සේ සලස්වා තිබෙන සේක. අප පසුතැවිලි වුව හොත් අපගේ වැරදි වලට කමාව ලබාදී නැවත සතුටු වීමට සලස්වන බවට උන්වහන්සේ පොරොන්දු දී තිබෙන සේක. පසු තැවිලිවීම යේසුස් වහන්සේගේ සභාවේ සාමාජිකයන්ගේ වැදගත් කොටසකි.

යම් වැරදි දෙයක් කිරීම අපගේ සපත්තුවේ ගල්කැටයක් තිබෙනවා වැනි දෙයක් බව ළමයින්ට පහදා දෙන්න. අපට අපහසුතාවයක් දැනෙයි. පසුතැවිලි වීම යනු ගල් කැටය ඉවත්කර දමනවා වැනිය. ප්‍රශ්න ඉවත්කිරීම සතුටට කරුණකි.

ශුද්ද වූ ලියවිලි කතාන්තර

යම් වැරදි දෙයක් කිරීමට තෝරාගත් එක පුතෙකු පසුව පසුතැවිලි වී හරිදෙය කළ බවට කථාන්තර-යක් මෙම ශුද්ධ ලියවිලි පොතෙහි ගැලවුම් කාරයාණන් කියන බව පැහැදිලි කර බයිබලය පෙන්වන්න. පුතා කළ දෙය සහ ඔහුගේ පියා ඔහුට උපකාර කළ අන්දම ගැන සවන්දීමට ළමයින්ට කියන්න.

ලූක් 15:11–24 සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න. අකීකරු පුත්‍රයා, පිංතූරය 2-46, සුදුසු අවස්ථාවකදී පෙන්වන්න.

සමහර විට "අකීකරු පුත්‍රයා" යයි මෙම කථාන්තරයට කියන බව පැහැදිලි කරන්න. අකීකරු යන වචනයේ තේරුම නාස්ති කිරීමයයි ළමයින්ට කියන්න. තවත් වෙහෙසී වැඩ කිරීමට ඔහුට අවශ්‍ය නොවූ බැවින්, බාල පුත්‍රයා ඔහුගෙන් මුදල් ඉල්ලූ බව පහදා දෙන්න. ඔහු කැමති දෙය කිරීමට ඔහුට අවශ්‍ය විය. ඔහුට මුදල් ලැබුනු පසු, ඔහු එය නාස්ති කළේය. අයහපත් දේවල් සඳහා ඔහු මුදල් නාස්ති කළේය.

පුතා මුදල් සියල්ල නාස්ති කළාට පසු, ඔහු මෝඩ වැඩ කරමින් වැරදි දේවල් කළ බව අවබෝධ කර ගත්බව පහදා දෙන්න. ඔහු පියා වෙත හැරී අවුත් සමාවෙන්ට කියා කීමට තීරණය කළේය. ඔහුගේ පියාගේ පුතෙක් යයි කීමට තරම් නුසුදුසු බව ඔහුට හැඟුන නමුත්, ආපසු ගෙදර පැමිණ ඔහුගේ පියාගේ සේවකයෙකු පිණිස වැඩ කරන්න ඉල්ලීමට තීරණය කළේය.

- ඔහු වැරදි වැඩ කළ බව අවබෝධ කරගත්තාට පසු පුතාට කෙසේ හැගුනාද කියා ඔබ සිතන්නෙහිද?

ලූක් 15:20–24 ශබ්ද නගා කියවන්න.

- තම පුතා ගෙදර පැමිණි විට පියා කළේ කුමක්ද?
- ඔහුගේ පියා ඔහු පිලිගත් විට පුතාට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?

මෙම තරුණ මිනිසා වැරදි දේවල් කිරීම වෙනස්කර හරිදේවල් කිරීම ගැන තරුණ මිණිසාගේ පියා සතුටු වුනාක් මෙන්, අපගේ වැරදි තීරණ නිවැරදි කිරීමට අප උත්සහ දරන විට අපගේ දෙමව්පියන් සහ ස්වර්ගීය පියාණන් සතුටු වන සේක. හරි දෙය කිරීමට අප තෝරා ගන්නා විට අපිද ප්‍රීති වන්නෙමු.

**අපගේ වැරදි තේරීම් නිවැරදි කරගත් විට අපට සතුටු දායක හැඟීම් ඇතිවිය හැකිය.**

ක්‍රියාකාරකම්

එක් එක් ළමයෙකුට කඩදාසි රවුමක් සහ පැන්සලක් හෝ පාට පැන්සලක් දෙන්න. ඔවුන්ගේම සිනහ වෙන/රවන මුහුණු ඇඳීමට ළමයින්ට සලස්වන්න. සම්පූර්ණ කරන ලද සිනහවෙන/රවන මුහුණ ආදර්-ශයක් වහයෙන් පෙන්වා අවශ්‍ය ලෙස ඔවුන්ට උපකාර කරන්න.

යමෙකු වැරදි ලෙස තෝරාගත් යම් යම් අවස්ථාවන් විස්තර කරන්න. වැරදි තේරීම කළාට පසු එක් එක් පුද්ගලයෙකුගේ හැඟීම් පෙන්වීමට ළමයින්ගේ කඩදාසි මුහුණු ඉහලට එසවීමට සලස්වන්න. අනතුරුව එම පුද්ගලයා වැරදි තේරීම නිවැරදි කරගන්නා අන්දම ගැන අසා, එක් එක් පුද්ගලයෙකු එසේ කළාට පසු ඔවුන්ගේ හැඟීම් පෙන්වන කඩදාසි රවුම භාවිතා කිරීමට සලස්වන්න. පහත සඳහන් නිදර්ශන හෝ ඔබේම නිර්මාණ භාවිතා කරන්න:

1. තෝමස් පාසල ඇරී ගෙදර යන විට වැටක් උඩට නැඟී ඔහුගේ හොඳම කලිසම ඉරාගත්තේය. පාසැල් ඇඳුම් ඇන්දවිට වැට උඩට නොනැඟීමට ඔහුගේ මව කීපවතාවක්ම කී නිසා මව කළබල වන බව ඔහු දැනගත්තේය.
   - තෝමස් කුමක් කළ යුතුද?
2. එකක් ඇයටත් එකක් ඇයගේ සහෝදරියටත් දීමට, කාරින්ගේ මව ඇයට දෝසි කෑලි දෙකක් දුන්නාය. තම සහෝදරිය ගියාට පසු, කාරින් කෑලි දෙකම කෑවාය.
   - කාරින් කුමක් කළ යුතුද?
3. බෙන් ක්‍රීඩා කිරීමට ඔහුගේ මිතුරාගේ නිවසට ගිය නමුත්, මිතුරා නිවසේ නොසිටියේය. බෙන් යන්ට හදන විට, තම මිතුරාගේ සෙල්ලම් බඩුවක් වත්තෙහි තිබෙනවා ඔහු දුටුවේය. බෙන් එය නිවසට රැගෙන ගොස් එය සමඟ සෙල්ලම් කළේය.
   - බෙන් කුමක් කළ යුතුද?
4. රේචල් පාසැල් යන විට පසුම්බියක් ඇහින්දාය. පසුව පසුම්බියක් දුටුවාදැයි ගැහැණු ළමයෙකු ඇසූ විට, රේචල්, "නැත" කීවාය.
   - රේචල් කුමක් කළ යුතුද?
5. ෆිලිප් ඔහුගේ සහෝදරයා සමග පස්සා මිදුලේ සෙල්ලම් කරමින් සිටියේය. ඔහුගේ සහෝදරයා පිලිප් අකමැති යමක් කළ බැවින්, ෆිලිප් ඔහුට තලා ඔහු ඇඬෙව්වේය.
   - දැන් ෆිලිප් කුමක් කළ යුතුද?

ගීත

සිනහවෙන/රවන මුහුණු උඩට ඔසවා "සිනහව" යන ගීය ගායනා කරමින් හෝ වචන කියන අතර, සුදුසු විට කඩදාසි මුහුණ හැරවීමට සලස්වන්න.

**සාරාංශය**

සාක්ෂිය

අප හරි දෙය තෝරන විට සතුටු දායක හැඟීම් අපට ඇති විය හැකි බවට ළමයින්ට සාක්ෂි දරන්න. වැරදි තේරීම් අප නිවැරදි කරන විටද අපට සතුටු දායක හැඟීම් ඇති විය හැකිය. අප යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ ඉගැන්වීම් ඉතා ඕනෑකමින් ඉගෙන ගෙන අනුගමනය කරන විට, ඉතා අඩුවෙන් අප වැරදි තේරීම් කරන බව පහදා දෙන්න.

ළමයි ඔවුන්ගේ කඩදාසි මුහුණු ගෙදර අරන් ගොස් ඔවුන් සතුටු දායක හා අසතුටු දායක හැඟීම් ගැන ඉගෙන ගත් බව ඔවුන්ගේ පවුලේ අයට කීමට යෝජනා කරන්න.

ගීත

"හරි මාර්ගය තෝරාගන්න" යන්න ළමයින් සමග ගායනා කරන්න නැත්නම් වචන කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. ළමයින්ගේ වැරදි තේරීම් හඳුනාගෙන ඒවා නිවැරදි කරගැනීමට ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් උපකාර ඉල්ලීමට ළමයාට මතක්කරන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳින් ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරාගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් වශයෙන් හෝ ඔබට ඒවා භාවිතා කළහැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව", අමතර මග පෙන්වීම් බලන්න.

1. "අපගේ වැරදි තේරීම් නිවැරදි කරගත් විට අපට සතුටුදායක හැඟීම් ඇති විය හැකිය," යන කොට-සෙහි ඔබ විස්තර කර අවස්ථාවන් භාවිතා කරමින් වැරදි තේරීම් වලක්වා ගැනීමට හෝ මගහරවා ගැනීමට සිතීම පිණිස ළමයින්ට උපකාර කරන්න. ඔවුන්ගේ විසඳුම් රඟපෑමට සලස්වන්න.

2. "ඔබට සතුටු නම්" (ළමා ගී පොත, පි. 266), සතුටුදායක තේරීම් ගැන අලුත් පද සෑදීමට සහ රඟපෑමට උපකාර කරමින් ගායනාකරන්න නැතහොත් වචන කියන්න.

   නිදර්ශනයක් වශයෙන්

   ඔබ සතුටුනම් ඔබ දනී, මිතුරන්ට පිහිට වෙන්න (අත්පුඩි ගහන්න)!
   ඔබ සතුටුනම් ඔබ දනී, මිතුරන්ට පිහිට වෙන්න (අත්පුඩි ගහන්න)!
   ඔබ සතුටුනම් ඔබ දනී, හරි දෙය තෝරා පෙන්වන්න.
   ඔබ සතුටුනම් ඔබ දනී, මිතුරන්ට පිහිට වෙන්න (අත්පුඩි ගහන්න)!

   වෙනත් හැකි දේවල්.

   සත්‍ය පවසන්න (දෙවරක් කට අල්ලන්න).
   සෙල්ලම් බඩු බෙදාගන්න (එක අතක් දිගු කරන්න, පසුව අනිත් අත).
   ඔබගේ යාච්ඤා කියන්න (අත් අකුලා හිස් නමන්න).

   ඔබගේ සියලුම අදහස් අඩංගු වූ අන්තිම පදය ගායනා කරමින් ඔබට අවසාන කිරීමට අවශ්‍ය වෙනවා ඇත:

   ඔබ සතුටු නම් ඔබ එය දනී, මිතුරන්ට පිහිට වෙන්න. (අත්පුඩි ගහන්න) සත්‍යය පවසන්න. (දෙවරක කට අල්ලන්න), සෙල්ලම් බඩු බෙදා ගන්න (එක අතක් දිගු කරන්න, පසුව අනිත් අත) ඔබගේ යාච්ඤා කියන්න (අත් අකුළා හිස නමන්න)!

3. ළමයින්ට රවුමකට වාඩිවෙන්න සලස්වන්න. නැවත මතක් කිරීමේ ප්‍රශ්නයක් අසා ප්‍රශ්නයට පිළි-තුරු දීමට ඔබට අවශ්‍ය ළමයා වෙතට ඇට මල්ලක් හෝ වෙනත් මෘදු උපකරණයක් වීසි කරන්න. ළමයා පිළිතුරු දුන්නාට පසු, ඇට මල්ල නැවත ඔබ වෙතට වීසි කිරීමට ඔහුට හෝ ඇයට සලස්-වන්න. එක් එක් ළමයා අඩු වශයෙන් එක ප්‍රශ්නයකට පිළිතුරු දෙන තෙක් මෙය කරගෙන යන්න.

   ඇසීමට හැකි ප්‍රශ්න.

   - ඔබේ සපත්තුව තුල ගල් කැටය හෝ බෝංචි ඇටය තිබුනු විට ඔබගේ කකුලට හැඟුනේ කුමක්ද?
   - වැරදි දෙයක් කළ විට අපට හැඟෙන්නේ කුමක්ද?
   - සොරකම් කරගත් සෙල්ලම් ආහාර සමග ක්‍රීඩා කරද්දී ඇන්ජලාට විනෝද වීමට නොහැකි වූයේ කුමක් නිසාද?
   - ඇයගේ අසතුටු දායක හැඟීම් වෙනස් කිරීමට ඇන්ජලා කළේ කුමක්ද?
   - වැරදි තේරීමක් නිවැරදි කර ගැනීමට අප උත්සහ දරන විට අපට හැඟෙන්නේ කෙසේද?

# 27 වෙනි පාඩම

# බෙදා ගැනීම මගින් අන්‍යයන්ට ප්‍රීති වීම පිණිස උපකාර කිරීමට මට හැකිවේ

**අරමුණ**

අන්‍යයන් සමග බෙදාගැනීම මගින් ඔවුන්ට ප්‍රීති වීමට උපකාර කිරීම පිණිස ළමයින් දිරි ගැන්වීමටය.

**සූදානම**

1. මාර්ක් 6:30–44 සහ යොහාන් 6:1–13 යාච්ඤාවෙන් කියවන්න.
2. එක් එක් ළමයාට සහ ඔබට සුළු සංග්‍රහයක් සූදානම් කරන්න. එය නිරාහාර ඉරුදින නම්, ආහාර නොවන වෙන දෙයක් සූදානම් කර පාඩමට අවශ්‍ය වන අන්දමට සකස්කර ගන්න.
3. "දෙන්න, කීවේය. කුඩා ඇල" (ළමා ගී පොත පි. 236) යන්නෙහි තුන්වෙනි පදය ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. මෙම ගීතයට වචන අත්පොතේ පිටුපස අඩංගුවී ඇත.
4. අවශ්‍ය උපකරණ:
   අ. බයිබලයක්
   ආ. බෙදාගැනීමට හැකි උපකරණ ස්වල්පයක්එනම් බෝලයක්, පොතක් සහ දොඩම් ගෙඩියක් වැනි දේවල්. මෙම ද්‍රව්‍ය කඩදාසි හෝ රෙදි මල්ලක තබන්න.
   ඇ. 2–47, පිංතූරය පන්දහසකට කන්ට්දීම (62143); පිංතූරය 2–48, ලනු පැනීම (62523); පිංතූරය 2–49, පිරිමි ළමයි අතිරස බෙදාගනිති; පිංතූරය 2–50, ළමයි සෙල්ලම් කැට බෙදා ගනිති.
5. සාරවත් කිරීමේ ක්‍රියාකාර කම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩි දියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ඔබ ළමයින්ව දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

### අපට බෙදාගැනීමට හැකිය.

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

කඩදාසි හෝ රෙදි මල්ලේ ඔබ ගෙන ආ ද්‍රව්‍ය වරකට එකක් බැගින්, එක එක පෙන්වා පහත සඳහන් ප්‍රශ්න භාවිතා කරමින් සාකච්ඡා කරන්න:

- මා පමණක් මෙය (ද්‍රව්‍යයේ නම) භාවිතා කරනවා නම් පුද්ගලයින් කී දෙනෙකුට විනෝද විය හැකිද?
- මා එය බෙදා ගන්නවා නම් පුද්ගලයින් කී දෙනෙකුට විනෝද විය හැකිද?
- මට එය බෙදා ගැනීමට හැකි ක්‍රම මොනවාද?

සාකච්ඡාව

ළමයින් සමග සියලුම ද්‍රව්‍ය ගැන ඔබ සාකච්ඡා කළාට පසු, මෙසේ අසන්න:

- තවත් අයෙකු සමග බෙදා ගැනීමට හැකි යමක් ඔබ ළඟ තිබෙනවාද? ඔබ එය බෙදා ගන්නේ කෙසේද?

විශේෂ ද්‍රව්‍ය නම්කර ඒවා කවුරු සමග බෙදා ගන්නවාද ඒවා ඔවුන් කෙසේ බෙදා ගන්නවාද කීමට ළමයින් දිරි ගන්වන්න.

මේ දේවල් ළමයින් මෙතෙක් සඳහන් කර නොමැති නම්, අපගේ කාලය, අපගේ හැකියාවන් සහ ශුභාරංචිය අපට බෙදාගත හැකි බව යෝජනා කරන්න.

- අපගේ කාලය බෙදා ගැනීමට අපට හැකි වන්නේ කෙසේද?
- අපගේ හැකියාවන් බෙදා ගැනීමට අපට හැකි වන්නේ කෙසේද?
- ශුභාරංචිය බෙදා ගැනීමට අපට හැකි වන්නේ කෙසේද?

**බෙදාගැනීමට යේසුස් වහන්සේ අපට ඉගැන්වූ සේක.**

ශුද්ධ ලියවිලි කථාන්තර සහ සාකච්ඡා

බෙදා ගැනීම මගින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේට සහ වෙනත් බොහෝ පුද්ගලයින්ට උපකාර කළ තරුණ පිරිමි ළමයෙකු ගැන කථාන්තරයක් එහි අඩංගු බව පහදා දෙමින් බයිබලය පෙන්වන්න. යොහාන් 6:1–13 සඳහන් කථාන්තරය කියන්න. (මාර්ක් 6:30–44 බලන්න) පන්දහසකට කන්ට දීම, සුදුසු අවස්ථාවකදී 2-47 පිංතූරය පෙන්වන්න.

- රොටි සහ මාලු කීපයක් තරුණ පිරිමි ළමයා ලඟ තිබුනාද? (6:9 බලන්න.)
- රොටි පහක් සහ මාලු දෙදෙනෙකු පුද්ගලයින් කීදෙනෙකුට කවන්නට හැකි වේ දැයි ඔබ සිතන්නෙහිද?
- යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පුද්ගලයින් කීදෙනෙකුට කන්ට දුන් සේක් ද? (යොහාන් 6:10 බලන්න.)

මෙය විශාල ජනතාවක් බව තේරුම් ගැනීමට ළමයින්ට උපකාර කරන්න. කෑම කන ලද පුද්ගලයින්, පන්දහසක් පමණ කණ්ඩායමකින් යුත් පුද්ගලයන් බව සමාන කරන්න. එය ළමයින්ට වඩාත් හුරු දෙයක් වන්නේය. (නිදර්ශනයක් වශයෙන්, "අපේ නගරයේ සිටින බොහෝ පුද්ගලයන් වැනි කොටසකට යේසුස් වහන්සේ කන්ට දුන්සේක." නැතහොත් "ප්‍රදේශයේ විශාල ක්‍රීඩා භූමියේ සිටීමට හැකි තරම් බොහෝ පුද්ගලයින්ට යේසුස් වහන්සේ කන්ට දුන්සේක").

එම කෑම පිරිමි ළමයාටම කන්ට තිබුන බව පහදා දෙන්න. නමුත් බෙදා ගැනීමට ඔහු කැමති වූ නිසා, මිනිසුන් දහස් ගණනකට උපකාර කළ හාස්කමක් ගැලවුම් කරුවාණන් ඉටුකළ සේක.

- පිරිමි ළමයා එය බෙදාගත් විට ජනතාවට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?
- එය බෙදාගත් තරුණ පිරිමි ළමයාට කුමක් හැඟෙන්ට ඇත්දැයි ඔබ සිතන්නෙහිද?

ගීතය

" 'දෙන්න කීවේය,' කුඩා ඇල" යන්නෙහි තුන්වන පදය ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බොහෝ දේවල් අප සමග බෙදාගෙන ඇති අතර අප අන්‍යයන් සමග බෙදා ගැනීම උන්වහන්සේට අවශ්‍ය බව ළමයින්ට මතක්කරන්න.

**බෙදාගැනීමෙන් අප සහ අන්‍යයන්ද සතුටට පත්කිරීමට අපට හැකිවේ.**

පිංතූර ගැන සාකච්ඡාව

යේසුස් වහන්සේගේ කාලයේ එම තරුණ පිරිමි ළමයා බෙදා ගැනීමට මගක් සෙව්වාක් මෙන්, අන්‍යයන්ට සතුටු වීම පිණිස උපකාර කිරීමට අපටද බෙදාගැනීමේ බොහෝ මාර්ග සොයා ගැනීමට හැකිය. ළමයින්ගේ බෙදාගැනීමේ පිංතූර (2-48, 2-49, සහ 2-50), වරකට එකක් බැගින් පෙන්වමින්, එක් එක් පිංතූරයක් ගැන පහත සඳහන් ප්‍රශ්න අසන්න:

- මෙම පිංතූරයේ ළමයින් කරන්නේ කුමක්ද?
- ඔවුන් බෙදාගන්නේ මොනවාද?
- බෙදාගැනීම ගැන ඔවුන්ට කුමක් හැඟෙන්නේද? කුමක් නිසාද?

ළමයින්ගේ සහභාගීත්වය

ළමයින්ගේ බෙදා ගැනීමේ අවස්ථාවන් සහ බෙදාගැනීමේදී ඔවුන්ගේ හැඟීම් ගැන කථා කිරීමට ළමයින්ට සලස්වන්න.

අප බෙදා ගන්නා විට, සතුටට පත්වීමට අප උපකාර කරන්නේ අන්‍යයන්ට පමනක් නොව, අපද සතුටට පත්වන බව පෙන්වා දෙන්න.

ළමයින් බෙදාගැනීමට කැමැත්ත දක්වනවා නම් ඔවුන්ට ප්‍රශංසා කරන්න; සියලුම දෙනාට යහපත් හැඟීම් ගෙන දෙන බෙදා ගැනීම ගැන ඔවුන් සමග සාකච්ඡා කරන්න. බෙදාගැනීම මගින් යහපත් හැඟීම් අපට ලැබෙන බව විශේෂයෙන් පැහැදිලි කරන්න.

කථාන්තරය

ඔහු හෝ ඇය බෙදාගත් බැවින් සතුටට පත්වූ අතර, අන්‍යයන්ද සතුටට පත් කළ ළමයෙකු ගැන කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාන්තරය කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත:

ඩේවිඩ්ට අලුත් පාට පැන්සල් පෙට්ටියක් තිබුනි. ඔහු පිංතූරයක් ලස්සනට පාට කරමින් සිටින අතර ඔහුගේ මව ඔහුගේ කුඩා සහෝදරිය කාමරයට එක්කගෙන ආවාය. ඇලිසන් සමග ඔහුගේ පාට පැන්සල් බෙදාගෙන පාට කිරීමට ඇයට උපකාර කිරීමට මව ඩේවිඩ්ට කීවාය. බෙදාගැනීමට ඩේවිඩ් කැමති වූයේ නැත. ඇලිසන්ට හොඳට පාට කිරීමට නොහැකි නිසා, ඔහුගේ පාට පැන්සල් ඇය අතින් කැඩේවි යයි ඔහු භය වූයේය. ඔහු වැඩිය කැමති නැති පාටක් ඇයට ඔහු දුන්නේය.

ඇලිසන්ට දුන් පාට පැන්සල ඩේවිඩ්ට ඉක්මණට අවශ්‍ය වී, ඇයගෙන් එය ආපසු ගැනීමට ඔහු උත්සහ කළේය. ඇලිසන් අඬන්නට පටන් ගත්තාය. ඔහුගේ සහෝදරියට ඇඬීමට ඔහු සැලැස්වූ බැවින් ඩේවිඩ්ට අපහසු තාවයක් හැඟී, ඇයට එය ඉතාම හොඳට කිරීමට නොහැකි වූවත්, ඇයද පාට කිරීමට කැමති බව ඔහු අවබෝධ කරගත්තේය. ඩේවිඩ් ඔහුගේ පාට පැන්සල් දෙස බලා දෙදෙනාටම පාවිච්චි කිරීමට ගොඩක් තිබෙන බවට තීරණය කළේය. ඇලිසන්ට පාටක් තෝරාගැනීමට ඔහු ඉඩදුන් අතර ඇයගේ කඩදාසියෙහි ඇය සතුටින් පාට කළාය. ඩේවිඩ්ද සතුටු වූවේය (Adapted from Majorie A, Parker "Inside the Lines" *Friend*, Feb. 1993. පිටු. 28–29.)

- ඇලිසන් සතුටු වූයේ කුමක් නිසාද?
- ඩේවිඩ් කැමති වූයේ කුමක් නිසාද?

**සාරාංශය**

ක්‍රියා කාරීත්වය

ඔබ ගෙනා සංග්‍රහය පෙන්වන්න.

- මෙම සංග්‍රහ සියල්ල මට පමණක් තබා ගත්තා නම් ඔබට හැඟෙන්නේ කෙසේද?
- සංග්‍රහයෙන් මා කුමක් කරනවාට යේසුස් වහන්සේ කැමති වන සේක්ද?

සංග්‍රහය ළමයින් දෙදෙනෙක් අතර බෙදා, මෙසේ කියන්න.

- ඔබගේ සංග්‍රහය සමග යේසුස් වහන්සේට අවශ්‍ය වන්නේ ඔබ කුමක් කිරීමද?

පංතියේ සියලු දෙනා සමග ඔවුන්ට තිබෙන දෙය බෙදා ගැනීමට ළමයින් දෙදෙනාට සලස්වන්න. එම සංග්‍රහය බෙදාගැනීමේදී ඔබට ඇතිවූ හැඟීම්ද එය බෙදාගෙන ඔබට පමණක් තබාගත්තා නම් ඔබට හැඟෙන්නේ කෙසේද කියා පංතියට කියන්න.

සංග්‍රහය බෙදීමේදී ඔවුන්ට ඇතිවූ හැඟීම් ගැන සංග්‍රහය බෙදූ ළමයින්ට කීමට කියන්න. ඉන්පසු සංග්‍රහය ඔවුන් සමග බෙදාගැනීමේදී ඔවුන්ට ඇති වූ හැඟීම් කීමට ඉතිරි ළමයින්ට ආරාධනා කරන්න.

සාක්ෂිය

බෙදාගැනීම සතුට ලඟාකර දෙන බවට ළමයින්ට සාක්ෂි දරන්න. බෙදාගැනීම මගින් ඔබ සතුටට පත් වූ අවස්ථා වක් ගැන කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

මෙම සතිය තුළදී යමෙකු සමග යමක් බෙදා ගැනීමට එක් එක් ළමයාව දිරි ගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. බෙදාගැනීමට ළමයින්ට කැමැත්ත ඇති වීම පිණිස උපකාර කිරීමට ස්වර්ගීය පියාණන් වහන්සේ ගෙන් ඉල්ලීමට ළමයාට මතක්කරන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියා කාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව", අමතර මගපෙන්වීම් බලන්න.

1. සහාවක් වශයෙන් අපට ඇදහිල්ලේ කරුණු ඇති බවත්, අප ත්‍යාගශීලී විය යුතු බවත් එහි සඳහන් වන බවත් ළමයින්ට කියන්න. ත්‍යාගශීලී වීම යනු වෙනත් පුද්ගලයින් සමග බෙදාගැනීම බවත් වෙනත් කරුණාවන්ත ක්‍රියා කරමින් ඔවුන්ට ප්‍රේමය දැක්වීමය. දහතුන්වන ඇදහිල්ලේ කරුණේ කොටසක් කට පාඩම් කිරීමට ළමයින්ට උපකාර කරන්න; "ත්‍යාගශීලී වීම... වීම ගැන අපි විශ්වාස කරන්නෙමු."

2. "යාච්ඤාවක්" (ළමා ගී පොත පි. 22) යන්න ගායනා කරන්න. නැතහොත් වචන කියන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ අපට බොහෝ විස්මජනක ආශිර්වාද දී තිබෙන බවද, අපගේ එම ආශිර්වාද අන්‍යයන් සමග බෙදාගන්නා විට උන්වහන්සේ සතුටු වන බවද ළමයින්ට මතක් කරන්න.

   සගයේ පියාණෙනි, මෙම ලස්සන දිනයේ මා ක්‍රීඩා කරන<br>
   විට කරුණාවන්ත වීමටද සතුටු වීමටද පිහිට උන මැනව<br>
   නිතර අවංකව සාධාරන වීමට පිහිට උන මැනව.<br>
   මාගේ ආශිර්වාද අන්‍යයන් සමග බෙදා ගැනීමට පිහිට උන මැනව.

3. ළමයි ඔවුන්ගේ මිතුරන් හෝ පවුලේ සාමාජිකයන් සමග බෙදාගැනීමට කැමති යම් ද්‍රව්‍යයක් සෑදීමට ලුනු පිටි ගුලිය ළමයින්ට දී එය සෑදීමට එක් එක්කෙනාට උපකාර කරන්න. (ලුනු පිටි ගුලියේ වට්ටෝරුව 43 වෙනි පිටුවේ සඳහන් වී ඇත.)

4. පැන්සල් හෝ පාට පැන්සල් බඳුනක් පෙන්වන්න. පැන්සල් හෝ පාට පැන්සල් එකම එක බඳුනක් ඔබට තිබෙන බවද, නමුත් සියලුම ළමයි පිංතූර ඇඳීම ඔබට අවශ්‍ය බවද පහදා දෙන්න. එම බඳුන ළමයෙකුට දෙන්න.

   - සියලු දෙනාටම ඇඳීමට හැකි වෙන පරිදි, මෙම පාට පැන්සල් (හෝ පැන්සල්) වලින් (ළමයාගේ නම) කළ හැකි කුමක්ද?

   එක් එක් ළමයෙකුට කොල කැල්ලක් දී, පාට පැන්සල් හෝ පැන්සල් එක් එක් ළමයා බෙදාගෙන ඔවුන්ම බෙදාගන්නා අන්දමට පිංතූර ඇඳීමට සලස්වන්න.

5. ධර්ම දූතයෙක්ව සිටින ආකාරය අංග චලනයෙන් දැක්වීමට ළමයින්ට සලස්වන්න (දොරවල් වලට කිට්ටු කිරීම, ශුද්ධ වූ ලියවිලි කියවීම, ඉගැන්වීම, සහ වෙනත් ධර්මදූත ක්‍රියාකාරකම් කිරීම).

   - ධර්මදූතයින් බෙදාගන්නේ කුමක්ද?
   - ශුභාරංචිය අන්‍යයන් සමග බෙදා ගන්නා විට ධර්මදූතයින් ගේ හැඟීම් කෙසේදැයි ඔබ සිතන්නෙහිද?

# 28
වෙනි
පාඩම

# මට කරුණාවන්ත වීමට හැකිය

**අරමුණ** අන්‍යයන්ට කරුණාවන්ත වීමට එක් එක් ළමයෙක්ව දිරි ගැන්වීමට.

**සූදානම**

1. ලූක් 10:25–37 සහ යොහාන් 13:34–35, 15:12, යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. මතෙව් 22:36–40 සහ ශුභාරංචි මූලධර්ම (31110), 30 වෙනි පරිච්ඡේදයද බලන්න.
2. "සියලු දෙනාට ආදරය කරන්න යේසු කීහ" (ළමා ගී පොත පි. 61) යන්න ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වන්න. මෙම ගීතයට වචන අත්පොතේ පිටුපස අඩංගු වී ඇත.
3. අවශ්‍ය උපකරණ
   අ. බයිබලයක්
   ආ. කපන ලද සටහන්, 2-1, තුවාල වූ මිනිසා; කපන ලද සටහන 2-2, පූජකයා; කපන ලද සටහන, 2-3 ලෙවියා; කපන ලද සටහන, 2-4, සමාරිතයා.
4. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩ6 දියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ළමයින්ව ඔබ දිරි ගන්වනවා නම් ඒ අනුව යන්න. සතිය තුලදී ඔවුන් යම් යම් දේවල් බෙදා ගත් අන්දම ගැන කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

**සියලු දෙනාටම කරුණාවන්ත වීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ඉගැන්වූ සේක.**

ක්‍රියා කාරීත්වයට යොමු කිරීම

පාඩමේ අග තිබෙන ශුද්ධ දේශයේ සිතියම ළමයින්ට පෙන්වන්න.

- මෙය කුමක්ද? (සිතියමක්)

ළමයින් සිතියම ගැන නොදන්නේ නම්, යම් ප්‍රදේශයක රටක් හෝ නගරයක් වැනි දෙයක චිත්‍ර යක් සිතියමක් බව පහදා දෙන්න. එක ස්ථානයක සිට තව ස්ථානයකට යන අන්දම පෙන්වා දීමට පුද්ගලයින් සිතියම් භාවිතා කරති. ගොඩ බිම, මුහුද, සහ ගංගා වැනි සිතියමේ සලකුණු ටිකක් පෙන්වා දෙන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොළොවේ සිටින විට ජීවත් වූ ස්ථානය වන ශුද්ධ දේශය මෙම සිතියමෙන් පෙන්වන බව පහදා දෙන්න.

යුදාව පෙන්වන්න. ශුද්ධ දේශයේ මෙම කොටසේ ජීවත් වූ ජනතාව යුදෙව්වරු යැයි කියනු ලැබූ බව පහදා දෙන්න.

සමාරිය පෙන්වන්න. සමාරියේ ජීවත් වූ ජනතාවට සමාරිය වරුන් යැයි කියනු ලැබූ බව පහදා දෙන්න.

යේසුස් වහන්සේගේ කාලයේදී යුදෙව්වරුන් සහ සමාරියවරුන් එකිනෙකා තේරුම් නොගත්තේය. නැතහොත් අකමැති විය. සමාරිය වරුන්ට වඩා යුදෙව් වරු හොඳ යැයි ඔවුහු සිතුවෝය. සමාරිය වරුන්ගේ නිවසකින් යුදෙව්වරු කෑම නොකති, නැතහොත් සමාරිය වරුන් සූදානම් කළ කෑම

නොකති. යුදෙව්වරු කොතරම් සමාරිය වරුන්ට අකමැතිදැයි කීවොත් ඔවුන්ට ගලීලයට යෑමට (ගලීලය පෙන්වන්න) අවශ්‍ය වුවහොත්, සමාරිය තුලින් යෑම කෙටි වුවත්, ඔව්හු සමාරිය වටෙන් යති. ගලීලයට යෑමට සමාරිය වටෙන් යෑම කොතරම් දුරද කියා පෙන්වන්න.

කපන ලද සටහන් සමග ශුද්ධ ලියවිලි කථාන්තර

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොළොවේ සිටින විට, උන්වහන්සේගේ ඉගැන්වීම් තේරුම් ගැනීමට උපකාර වන පිණිස නිතර උන්වහන්සේ ජනතාවට කථාන්තර කීබව පැහැදිලි කරන්න. උන්වහන්සේ කී එක් කථාන්තරයක් නම් සාමාරියෙකු ගැනය.

ලූක් 10:30–37 සඳහන් යහපත් සාමාරියා ගේ කථාන්තරය කියන්න. සුදුසු අවස්ථා වලදී කපන ලද සටහන් ඔසවා දැක්වීම සඳහා උපකාර වීමට ළමයි ස්වල්ප දෙනෙකුට ආරාධනා කරන්න.

ඔබ කථාන්තරය කියන අතර පහත සඳහන් කරුණු ගැන විශේෂ යෙන් පැහැදිලි කරන්න:

1. තුවාල වූ මිනිසා යේරුසලමේ සිට යෙරිකෝ වට ගමන් කළේය. (සිතියමෙහි නගර දෙක පෙන්වන්න).
2. උපකාර කිරීමට නොනැවතී එතනින් ගිය පළවෙනි මිනිසා යුදෙව් පූජක වරයෙකි. පූජකවරු දේව මාලිගාවේ කටයුතු කරන බැවින් ධර්මිෂ්ඨ ශුද්ධ මිනිසුන් යැයි සිතූහ.
3. උපකාර කිරීමට නොනැවතී එතැනින් ගිය දෙවෙනි මිනිසා ලෙවියෙකි. ලෙව්වරුද දේව මාලිගාවේ කටයුතු කරන බැවින් යුදෙව් ආගමේ වැදගත් අය වූහ.
4. තුන්වන මිනිසා සාමාරියයෙකි. තුවාල වූ මිනිසාට උපකාර කිරීමට ඔහු නැවතුනේය.

මෙම සාමාරියයා කරුණාවන්ත මිනිසෙකු වූ බැවින්, යහපත් සාමාරියයා යැයි ඔහුට කියන ලදී.

කපන ලද සටහන් ඔබ වෙතට ආපසු දීමට ළමයින්ට සලස්වන්න.

රඟ දැක්වීමේ ක්‍රියාකාරීත්වය

ළමයින් කිහිප දෙනෙකු ලවා යහපත් සමාරියයාගේ කථාන්තරය රඟ දක්වන්න, නැතහොත් පහත සඳහන් දේවල් කරමින් සියලුම ළමයින්ට "යෙරිකෝවට මා පසු පස එන්න" ක්‍රීඩා කිරීමට සලස්වන්න:

තුවාල වූවාක් මෙන් පෙන්වමින් එක ළමයෙකුට බිම හාන්සි වීමට හෝ පුටුවක වාඩි වීමට සලස්වන්න. ඔබ සහ අනිත් ළමයින් යෙරිකෝවට යන පාරේ ගමන් කරන මෙන් පෙන්වන්න. ළමයි ඔබව අනුගමනය කරමින් ඔබ කරන දේ කිරීමට සලස්වන්න.

පළමුවෙන්ම පාරේ ගමන් කරන පූජකයා මෙන් කරන්න. කාමරය වටේ ගමන් කිරීමට පටන්ගන්න. එකිනෙහිම පාර අයිනේ වැතිර සිටින යමෙකු ඔබ දකින්නෙහිය. ඔහු අධික ලෙස තුවාල වී සිටී.

- පූජකයා කුමක් කළේද?

තුවාල වූ මිනිසාට ඔබ උදව් නොකරන බව පෙන්වීම සඳහා, පාරේ අනිත් පැත්තට යන්න.

ඉන්පසු ඔබ ලෙවියෙක් යයි පෙන්වන්න. කාමරය වටේ ඇවිදින්න. පාර අයිනේ යමෙකු සිටිනවා ඔබ දකින්නෙහිය. ඔහුගේ වස්ත්‍ර සොරා ගෙන අධික ලෙස තුවාල කර ඇත.

- ලෙවියා කුමක් කළේද?

නැවතී තුවාලවූ මිනිසා දෙස බැලුවේය. ඔහුට පිහිට නොවී ඔබගේ ගමන යන්න.

දැන් පෙන්වන්න ඔබ සමාරියයා බව කාමරය වටේ ඇවිදින්න. යමෙකු අධික ලෙස තුවාල ලැබ පාර අයිනේ වැතිර සිටිනවා ඔබ දකින්නෙහිය.

- සමාරියයා කුමක් කළේද?

සමාරියයාගේ කරුණාවන්ත ක්‍රියා රඟ දක්වන්න. (ඔබගේ පංතිය විශාල නම්, සේවය කිරීමේ විවිධ ක්‍රියා අංග චලනයෙන් රඟ දැක්වීමට ළමයින්ට පැවරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.) මිනිසාගේ

තුවාල පිරිසිදු කිරීම, බුරුවා මත ඔහු තැබීම, තානායමට ඔහු රැගෙන යෑම, මිනිසාට අවශ්‍ය වෙනත් දේවලට මුදල් දීමට තානායම් කාරයාට පොරොන්දු වීම පෙන්වන්න.

දැන් ඔවුන් තුවාල වූ මිනිසාව රැකබලා ගත් බව ළමයින්ට කියන්න. ආපසු ඇවිත් වාඩිවීමට කියන්න. වාඩිවී ඔවුන්ගේ අත් නිශ්චලව උකුල මත තබා ගැනීමට ඔවුන්ට සලස්වන්න.

සාකච්ඡාව

- කරුණාවන්ත වූයේ කොයි මිනිසාද?
- ගැලවුම්කරුවාණන්ට අවශ්‍ය දෙය කළේ කොයි මිනිසාද?

යේසුස් වහන්සේ මෙම කථාන්තරය කියා දුන් පසු, අපද යහපත් සමාරියයා මෙන් වී අන්‍යයන් හට කරුණාවන්ත විය යුතුයි කී බව පහදා දෙන්න.

**අන්‍යයන්ට කරුණාවන්තව සැලකීමට ඔබට හැකිය.**

සියලුම දෙනාටම කරුණාවන්ත වීම නිතරම පහසු නැත, විශේෂ යෙන්ම යමෙකු අපව අපහසුතාවයට පත්කළ විට හෝ අපට අකරුණාවන්තව සලකන විටදී බව පහදා දෙන්න.

කථාන්තරය

වෙනත් ළමයෙකු ඇයට අකරුණාවන්තව සැලකූ විට මහඟු පාඩමක් ඉගෙන ගත් ගැහැණු ළමයෙකු ගැන පහත සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න. ඇයගේ ප්‍රශ්න සඳහා ඇයගේ විසඳුම් වලට සවන් දීමට ළමයින්ට කියන්න.

ලුයිසා සහ ටොඩ් මිතුරන් වූ අතර එක්ව සෙල්ලම් කිරීමෙන් විනෝද වූහ. කෙසේ වෙතත් එක් සැන්දෑවක ඔව්හු තර්ක කළහ. ලුයිසා ටොඩ්ට නමක් කී අතර, ටොඩ් ලුයිසා පහතට තල්ලු කළේය. ඇ අඬන්නට පටන් ගත් විට, ඔහු ඇයට මුහුණ විකෘති කොට විහිළු කළේය.

- ඔබ ලුයිසා නම් කුමක් කරන්නේද?

ලුයිසා පියා සොයාගෙන ගියාය. ඇයට ඔහු පිහිටවන බව ඈ දැන සිටියාය. ටොඩ් ඇයව තල්ලු කර දමා ඇයට දුෂ්ඨ වූ බව පියාට කීවාය. එළියට ගොස් ටොඩ්ට දඬුවම් කිරීමට ඈ පියාට කීවාය.

ටොඩ්ට දඬුවම් කිරීම හොඳම දෙය නොවන බව ලුයිසාගේ පියා ඇයට කීවේය. ඒවෙනුවට ලුයිසාට කුස්සියට ගොස් පාන් පෙති දෙකක ජෑම් තැවරීමට ඔහු කීවේය. පසුව එක පාන් පෙත්තක් ගෙන ගොස් ටොඩ්ට දීමට ඇයට කීවේය. ඇය එසේ කළහොත් සතුරෙකු වෙනුවට ඇයට මිතුරෙකු සිටින බව ලුයිසියාගේ පියා කීවේය.

පියා කීලෙසට ලුයිසා කළාය. ඇය ආපසු එළියට ගොස් පාන් සහ ජෑම් ටොඩ්ට දුන් විට, ඇය දෙස ස්වල්ප වේලාවක් බලා සිට තෑග්ග ගත්තේය. ටොඩ් සහ ලුයිසා එකිනෙකා සමග සිනාසී පාන් සහ ජෑම් කමින් විනෝද වීමට වාඩි වූවෝය. ඔවුහු නැවත මිතුරන් වූහ. (උපුටා ගත්තේ ලුසිලි සී. රීඩ්න් ගේ "පාන් පෙත්තක් සහ ජෑම්", ළමයින් ගේ මිතුරා, අප්‍රි. 1967, පි13.)

සාකච්ඡා

- ටොඩ් ලුයිසාව තල්ලු කළ පසු කුමක් කිරීමට ඇයට අවශ්‍යවීද?
- යමෙකු අපට කරුණාවන්ත නම් අපගේ පලවෙනි ප්‍රතික්‍රියාව කුමක්ද?
- ලුයිසා ටොඩ්ට කරුණාවන්ත වූ විට කුමක් වූයේද?
- ලුයිසා ටොඩ්ට කරුණාවන්ත නොවූයේ නම් කුමක් සිදුවෙන්නට තිබුනාද?

අන්‍යයන් අපට කරුණාවන්ත නොවූ වත් අප ඔවුන්ට කරුණාවන්ත වීම යේසුස් වහන්සේට අවශ්‍ය බව ළමයින්ට මතක්කරන්න.

ශුද්ධ වූ ලියවිලි | බයිබලය පෙන්වා යොහාන් 15:12 ශබ්ද නගා කියවන්න. මේවා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වචන බව පහදා දෙන්න. එකිනෙකාට ප්‍රේම කිරීම උන් වහන්සේ අපට අණ කළ සේක. එකිනෙකාට අප කරුණාවන්ත වන විට, අප අපගේ ප්‍රේමය පෙන්වන්නෙමු.

ගීතය | "සියල්ලට ප්‍රේම කරන්න යේසු කීහ" යන්න ළමයි සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න. එකිනෙකාට කරුණාවන්ත වීමට සහ යේසුස් වහන්සේ අපට කී දෙය කිරීමට අපට මතක් කිරීමට මෙම ගීතයට පුලුවන් බව පහදා දෙන්න.

සාකච්ඡාව | ළමයින්ට කරුණාවන්ත වීමට තෝරා ගත හැකි අවස්ථාවන් සමහරක් විස්තර කර, එම එක් එක් අවස්ථාවකදී ඔවුන් කරන්නේ කුමක්ද කියා ළමයින් ගෙන් අහන්න. ක්‍රියා කරන අන්දම තීරණය කිරීමට උපකාරයක් උවමනා නම් ගීතයේ වචන ගැන සිතීමට ඔවුන්ට මතක් කරන්න. පහත සඳහන් අවස්ථාවන් හෝ ඔබේම නිර්මාණ භාවිතා කරන්න:

1. ඔබ පාරේ ඇවිදගෙන යන විට, පා පැදියක ගිය යමෙකු අනතුරකට පත්ව සිටින බව ඔබ දකින්නෙහිය. ඔබ ටිකක් ලන්වූ විට, ඔබට නිතර විහිළු කරන පිරිමි ළමයා බව ඔබ දකින්නෙහිය. ඔහුගේ කලිසමේ කකුල ඔහුගේ පා පැදියේ දම්වැලට පැටලී තිබේ. උපකාරයක් නැතිව ඔහුට සෙලවීමට නොහැකිය.
   - පිරිමි ළමයාට කරුණාව දැක්වීමට ඔබ කරන්නේ කුමක්ද?
2. ලබන සතියේ පැවැත් වෙන ඔබගේ උපන් දිනයට විශේෂ සාදයක් ඔබ සැලසුම් කර ඇති අතර, එක කෙනෙකු හැර අසල්වැසි සියලුම ළමයින්ට ආරාධනා කිරීමට ඔබට උවමනාය. අසල්වැසියන් අතරෙන් ඇය අලුත් කෙනෙකි. ඈ කිසි විටක සිනහ නොවන අතර ඇය සෙල්ලම් කිරීම එතරම් විනෝද දායක නැත.
   - මෙම ගැහැණු ළමයාට කරුණාව දැක්වීම පිණිස ඔබට කුමක් කළ හැකිද?
3. ඔබගේ මිතුරන් සමග ක්‍රීඩා කරන විට ඔබ වැටෙන්නෙහිය. ඔබගේ එක මිතුරෙක් ඔබ කම්මැලියෙක්ය කියා ඔබට සිනහසෙයි. දැන් ඔබගේ මිතුරා වැටී අඬමින් සිටියි.
   - ඔබගේ මිතුරාට කරුණාව දැක්වීමට ඔබට කුමක් කළ හැකිද?
4. පාසැලේ ඔබගේ පංතියේ ළමයෙක් ඇවිදීමට ඔහුට උපකාර වන පිණිස බන්ධනයක් භාවිතා කරයි. සියලුම ළමයි ක්‍රීඩා කිරීමට යන විට, ඔහු ඉතා සෙමින් ඇවිදින බැවින් පිටුපසින් සිටී. බොහෝ විට ඔහු තනියම වාඩි වී සිටිමින් අනිත් අය බෝල ගහනවා බලා සිටියි.
   - මෙම පිරිමි ළමයාට කරුණාව දැක්වීම පිණිස ඔබට කුමක් කළ හැකිද?

**සාරාංශය**

නැවත බැලීම | පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් පාඩම නැවත බැලීමට ළමයින්ට සලස්වන්න.

- අද පාඩමෙන් අප ඉගෙන ගන්නේ කුමක්ද?
- කරුණාව දැක්වීම වැදගත් වන්නේ කුමක් නිසාද?
- අප කරුණාව දක්වන විට, අප අනුගමනය කරන්නේ කාගේ නිදර්ශනයක්ද?

ශුද්ධ වූ ලියවිලි | යොහාන් 13:34–35 ශබ්ද නගා කියවන්න. අප අන්‍යයන්ට ආදරය කරමින් ඔවුන්ට කරුණාව දක්වන විට අප යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන් (අනුගාමිකයන්) යයි අප පෙන්වන බව ළමයින්ට පහදා දෙන්න.

සාක්ෂිය

අප අන්‍යයන්ට කරුණාවන්ත වෙමින් ආදරය දැක්වීම යේසුස් වහන්සේට අවශ්‍ය වන බවට ළමයින්ට සාක්ෂි දරන්න. සෑම කෙනෙකුටම, අපට නිතර අකරුණාවන්තව සලකන අයට පවා අප කරුණාවන්ත විය යුතු බව ළමයින්ට මතක්කරන්න. කරුණාවන්ත කම තෝරා ගනිමින් යේසුස් වහන්සේව අනුගමණය කිරීමේ වැදගත්කම ගැන ඔබගේ සාක්ෂිය දරන්න.

එන සතිය තුල අන්‍යයන්ට කරුණාවන්ත වීමට විශේෂ පරිශ්‍රමයක් දැරීමට ළමයින්ව දිරිගන්වන්න. යමෙකුට සැලකීමට ඔවුන්ට අවශ්‍ය වූ විට "සෑමට ආදරය කරන්න යේසු කීහ" යන ගීතයේ වචන සිහිපත් කිරීමට ළමුන්ට මතක් කරන්න. ඔවුන් කරුණාවන්ත වීමට තෝරා ගත් විට ඇතිවන සිදුවීම් ගැන සැලකිලි මත් වීමට ඔවුන්ට කියන්න. එන සතියේදී ඔවුන් ගේ අත්දැකීම් ගැන කීමට සූදානමින් පැමිණීමට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳින් ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව" අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. කරුණාවන්ත වීමෙන් අන්‍යයන්ට ආදරය දැක්වීමට හැකි ක්‍රම ගැන පිංතූර ඇඳීමට කඩදාසි සහ පාට පැන්සල් හෝ පැන්සල් ළමයින්ට දෙන්න. අන්‍යයන්ට කරුණාවන්ත වීමට මට හැකිය යන වචනය අඩංගු ලේබලයක් එක් එක් ළමයෙකුගේ පිංතූරයෙහි අලවන්න.

2. "කරුණාව මගෙන් ඇරඹේ" (ළමා ගී පොත, පි. 145) යන්න ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

   සියල්ලන්ට කරුණාවන්ත වීමට මට අවැසියි,  
   එය හරි දෙයයි, ඔබට පෙනේ.  
   මටම මා කියමි, සිහිය තබා ගන්න මෙය:  
   කරුණාව මගෙන් ඇරඹේ.


   ඔවුන්ට කරුණාවන්ත විය හැකි පුද්ගලයින්ද (එනම් පවුලේ සාමාජිකයන්, මිතුරන්, හෝ පංතියේ ළමයි) මෙම පුද්ගලයින්ට කරුණාව දැක් විය හැකි ගැනද සිතීමට ළමයින්ට උපකාර කරන්න. අපට කරුණාව නොදක්වන හෝ අපට වඩා වෙනස් මෙන් පෙනෙන අයට කරුණාව දැක්වීමේ වැදගත්කම ගැන අවබෝද කර ගැනීමට ළමයින්ට උපකාර කරන්න.

3. "විශේෂ තෑග්ග කරුණාවයි" (ළමා ගී පොත, පි. 145) ළමයි සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

   විශේෂ තෑග්ග කරුණාවයි.  
   බොහෝ සතුට එය ගෙනෙයි,  
   මා අන්‍යයන්ට කරුණා කරන විට,  
   මගේ හදවත ගී ගයයි.

   ගීතය ගායනා කර හෝ වචන කියා අවසන් වූ විට එක් එක් ළමයෙකුගේ ඇඟිල්ල හෝ මැණික්කට්ටුව වටේ නූල් හෝ කැටි නූල් කෑල්ලක් ගැටගසන්න. සියලු දෙනාටම කරුණාවන්ත වීමට නූල් පොට මතක් කරන බව ළමයින්ට පහදා දී, ප්‍රාථමිකයේ ඉතිරි කාලයේදී එම නූල හෝ කැටි නූල පැළඳගෙන සිටීමට යෝජනා කරන්න.

# ශුද්ධ දේශය


ග
ප
ඉ
ණ
දමස්කය
සිරියා රට
ජෝර්දාන් ගඟ
ගලීලය
ගලීලයේ මුහුද
කානා
නාසරෙත්
මධ්‍යධරණී
මුහුද
සමාරිය
සමාරියා
ජෝර්දාන් ගඟ
යෙරිකෝව
යෙරුසලම
බෙත්ලෙහෙම
මළ
මුහුද
යුදා
බෙයර්ෂෙබා

29
වෙනි
පාඩම

# යහපත් ආදර්ශයක් වීමට මට හැකිය

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් වශයෙන් (ආදර්ශවත් වීම) ඔවුන්ගේ ආලෝක බැබළවීම පිණිස ළමයින් දිරිගැන්වීමටය.

**සූදානම**

1. මතෙව් 5:14:16 යාච්ඤාවෙන් අද්‍යානය කරන්න.
2. පාඩමෙහි අවසානයේ ඇති නිදර්ශනය භාවිතා කරමින් කඩදාසි ඉටිපන්දම් හතරක් සහ කඩදාසි මලු හතරක් පිටපත්කර කපාගන්න. කඩදාසි ඉටිපන්දම් වල පහත සඳහන් නම් කරන්න.

   *සූසන්*

   *ජෝසේ*

   *එරික් සහ පීටර්.*

   *?*

   සතිය පටන්ගැනීමට පෙර, නම් සහිත ඉටිපන්දම් තුන පෙන්වා එක් එක් ඉටිපන්දමක් කඩදාසි මල්ලෙන් වසා තබන්න. හතර වෙනි ඉටිපන්දම ("?") සහ මල්ල පසුව පාවිච්චි කිරීමට ඉතිරි කරගන්න.
3. නිදර්ශනයේ ඇති ඉටිපන්දම භාවිතා කරමින් එක්එක් ළමයාට ඉටිපන්දම බැගින් සාදන්න.
4. "හරි මාර්ගය තෝරා ගන්න" (ළමා ගී පොත, පි. 160) සහ "මා හිරුරැසක් වීමට යේසුට ඕනෑ" (ළමා ගී පොත, පි. 60) යන්න ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.
5. අවශ්‍ය උපකරණ
   අ. බයිබලයක්
   ආ. ඉටි පන්දමක් සහ ඉටිපන්දම් අලවන කඳක් හෝ උපකාරකයක්.
   ඇ. ඉටිපන්දම මුලුමනින්ම වසන්නට පුලුවන් මල්ලක් හෝ පෙට්ටියක්.
   ඈ. හදෙතො (CTR) සටහනක් (පලවෙනි පාඩම බලන්න)
   ඉ. පැන්සල් හෝ පාට පැන්සල්.
6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතාකිරීමට ඔබට උවමනානම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

*සටහන:* පාඩම වෙලාවේදී ඔබ භාවිතා කළ ඉටිපන්දම පත්තු නොකළ යුතුය. රැස්වීම් ගෘහයේ ඉටිපන්දම් පත්තු කිරීම සභාවේ නීතිවලට පටහැනිය.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න. කරුණාව දැක්වීමේ ඔවුන්ගේ අත්දැකීම් ඔබ සමග බෙදාගැනීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. ඔබ ළමයින්ට කථාකරන විට කොඳුරන්න.

**"ඔබගේ ආලෝක බබළවන්න," යයි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූ සේක.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

සමහර ළමයි ආපසු කෙඳිරීමට පටන් ගන්නා තෙක්, මෙම සතිය තුළදී ඔවුන් කළ දේවල් හෝ ප්‍රාථමිකයේ ඔවුන් කැමති දේවල් ගැන අසමින් ඔබ ළමයින්ට නොකඩවා කොඳුරන්න. ඔවුන් අවට සිටින වෙනත් පුද්ගලයින් කරන දේවල් බොහෝ විටදී පුද්ගලයන් කරන බව පෙන්වා දීමට කෙඳිරීම අත්හදා බැලීමේ කොටසක් බව, ස්වල්ප වේලාවකට පසු ළමයින්ට පහදා දෙන්න. ඔබ ඔවුන්ට කෙඳුරූ බැවින් ළමයි කෙඳිරීමට පටන් ගත් බව පෙන්වා දෙන්න. ඔබගේ ආදර්ශය ඔව්හු අනුගමණය කළහ.

ඔවුන් ඔබගේ ආදර්ශය අනුගමණය කළාක් මෙන්, ඔවුන් ගේ මිතුරන්ද ඔවුන් ගේ ආදර්ශය අනුගමණය කරන බව ළමයින්ට කියන්න. අප යහපත් ආදර්ශ වීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍යා වන්නේය.

- යහපත් ආදර්ශයක් යනු කුමක්ද?

අප කරන දේවල් දුටු විට අපේ මිතුරන්ද බොහෝ විට එම දේවල් කරන බව පහදා දෙන්න. අප යහපත් දේවල් කරමින් හරි දෙය තෝරනවා ඔවුන් දුටුවානම්, ඔවුන් හටද හරි දෙය තේරීමට පහසු වනවා ඇත.

ප්‍රහේළිකා (තුන් තේරවිලි)

පහත සඳහන් ප්‍රහේළිකා (තුන් තේරවිලි) විසඳීමට ළමයින්ට ආරාධනා කරන්න.

මා ඉටි වලින් සාදා ඇත.
මගේ ඇතුලේ පාන්තිරයකි.
මගේ අරමුණ එලිය දීමයි.
ගිනිකූරකින් මා පත්තුකළ හැකිය.
මා කුමක්ද?

ළමයින් ප්‍රහේලිකාව (තුන් තේරවිල්ල) විසඳුවාට පසු, ඔබ ගෙනආ ඉටිපන්දම පෙන්වා එය පාවිච්චි කරන්නේ කුමක් සඳහාද යන්න සාකච්ඡා කරන්න.

ශුද්ධ ලියවිලි කථාන්තර

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොළෙවෙහි ජීවත් වූ කාලයේ, විදුලි ආලෝකය නොතිබුන බව පහදා දෙන්න. ඉර බැස ගියාට පසු අන්ධකාර වූ අතර මිනිසුන්ට පෙනීමට ආලෝකය ලබා ගැනීම සඳහා මිනිසුන් ඔවුන්ගේ නිවෙස් වල ඉටිපන්දම් පත්තු කළහ.

අන්‍යයන්ට යහපත් ආදර්ශයක් වීම ගැන පාඩමක් යේසුස් වහන්සේ එක් දිනක් උන්වහන්සේගේ ගෝලයන්ට ඉගැන්වූ සේක. (මතෙව් 5:14–16 බලන්න). අන්‍යයන්ට ඔවුන්ගේ ක්‍රියා උපකාර වන අන්දම, ගෝලයන්ට වටහා ගැනීමට උපකාර වීම පිණිස එම ක්‍රියා ඉටිපන්දමක ආලෝකයට යේසුස් වහන්සේ සමාන කළ සේක. මතෙව් 5:15 සඳහන් වන පරිදි ගෝලයින්ට යේසුස් වහන්සේ කී දේවල් ශබ්දනගා කියවන්න.

උපකරණ පාඩම

ඉටිපන්දම මල්ලක් (කුරණියක්) පෙට්ටියක් යට තබන්න.

- අන්ධකාරය ඇති බැවින් අප ඉටිපන්දමක් දල්වා පසුව එය මල්ලකින් (කුරණියකින්) (පෙට්ටියකින්) වැසූ විට කුමක් වන්නේද? (කිසිවෙකුට ආලෝකය නොපෙනෙයි.)

මල්ල හෝ පෙට්ටිය ඉවත් කර ඉටිපන්දම් අලවන කඳක් උඩ ඉටිපන්දම තබන්න.

- අන්ධකාරය ඇති වූ විට ඉටිපන්දම් අලවන කඳක් උඩ තබා ඉටිපන්දම ඇලවූ විට කුමක් සිදුවන්නේද? (කාමරයට ඉටිපන්දම ආලෝකය ලබාදී, සියලු දෙනාටම පෙනෙන්ට සලස්වනවා ඇත.)

යේසුස් වහන්සේගේ ගෝලයින් ඉටිපන්දමක් මෙන් වී අන්‍යයන්ට ආලෝකය ලබා දීම උන්වහන්සේගේ කැමැත්ත විය. යේසුස් වහන්සේගේ ඉගැන්වීම් ගෝලයින් අනුගමනය කරමින් යහපත් ආදර්ශ වන්නේ නම්, එවිට ඔවුන් කුමක් කළ යුතු දැයි අනිත් මිනිසුන්ට පෙනෙනවා ඇත.

සාකච්ඡා

මතෙව් 5:16 යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට කී දේ ශබ්ද නගා කියවන්න. මෙම උපදේශයම අපද අනුගමණය කිරීම යේසුස් වහන්සේට අවශ්‍යා බව පහදා දෙන්න.

- මෙම ශුද්ධ වූ ලියවිල්ලෙහි ඔබගේ ආලෝකය බබළවන්න යන්නෙහි අදහස කුමක්ද? (යහපත් ආදර්ශයක් වීමය.)

- අප යහපත් ආදර්ශවන විට අපගේ මිතුරන්ට සහ අප අවට සිටින අයට කුමක් සිදුවිය හැකිය.

**ළමයින්ට යහපත් ආදර්ශ විය හැකිය.**

අන්‍යයන්ට යහපත් ආදර්ශයක් වීමෙන් අපගේ ආලෝකය බැබළ වීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ උපදේශය අප සියලු දෙනාම අනුගමණය කිරීමෙන් හැකිවන බව ළමයින්ට කියන්න. යේසුස් වහන්සේ අනුගමණය කිරීමට අප තෝරා ගත් විට, අප දෙස බලා අනිත් පුද්ගලයන්ට ඒ ගැන ඉගෙන ගැනීමට හැකිවෙයි.

කඩදාසි ඉටිපන්දම වසා තිබෙන කඩදාසි මල්ල ඉවත් කිරීමට ළමයෙකුට කියන්න. ඉටිපන්දමේ තිබෙන නම හෝ නම් කියවන්න. එම ඉටිපන්දම සමග සම්බන්ධ කථාන්තරය කියවන්න. අනිත් මලු දෙක හා ඉටිපන්දම් දෙක සම්බන්ධ අනිත් කථාන්තර දෙකද කියන්න.

සූසන් සම්බන්ධ කථාන්තරය

කැරොලින්ගේ උපන් දින සාදයට සූසන්ට ආරාධනා කරන ලදී. සාදයට යෑමට ඇ උනන්දු වූ අතර විනෝද වීමට ගැන සහතික වී සිටියාය. කෙසේ වෙතත්, ඇය නිවසට පැමිණෙන විට යන වේලාවේදී මෙන් උනන්දුවක් නොතිබුනි. සාදය කෙසේදැයි සූසන් ගේ මව ඇසුවාය.

සාදයේ දී සීතකළ තේ වලින් සංග්‍රහ කළ බව සූසන් පැහැදිලි කළාය. වැඩිහිටි අයට පවත්වන සාදයකට සමාන යැයි කැරෝලින්ගේ මව කියා ඇත.

- සූසන්ට තේ පිරිනැමූ විට ඇය කුමක් කළාද කියා ඔබ සිතන්නෙහිද?

සූසන් තේ නොබොන බව කැරෝලින්ගේ මවට කීවාය. ඇයගේ ශරීරයට තේ හොඳ නැති බව ඇයගේ දෙමව්පියන් සහ ප්‍රාථමිකයේ ගුරුවරු උගන්වා තිබෙන බව ඇය පහදා දුන්නාය.

තේ නොබිව්ව නිසා සූසන්ගේ මව සූසන් ගැන ආඩම්බර වූවාය. කැරෝලින් සහ ඇයගේ මව සභාවේ සාමාජිකයන් නොවන බැවින් සූසන්ගේ පවුලේ අය මෙන් ඒවා විස්වාස නොකළ බව ඇය පහදා දුන්නාය.

මාස කීපයකට පසු, සූසන්ට සහ ඇයගේ මවට කැරෝලින්ගේ මවගෙන් ලිපියක් ලැබුනි. සූසන් සාදයේදී ඇයගේ විශ්වාසය නිසා නැගී සිටි බැවින්, සභාව ගැන වැඩියෙන් දැන ගැනීමට කැරෝලින් ගේ පවුලේ අය තීරණය කළ බව කැරෝලින්ගේ මව පහදා දුන්නාය. ධර්මදූතයින් විසින් ඔවුන්ට උගන්වන ලදී. සූසාන් ඇයට යහපත් ආදර්ශයක් වූවාක් මෙන් ඇයද තවත් කෙනෙකුට යහපත් ආදර්ශයක් වීමට හැකි වේ යැයි බලාපොරොත්තු වන බව කැරෝලින්ගේ මව කීවාය.

- සූසන් ඇයගේ ආලෝකය බැබලවීමට සැලැස්සුවේ කෙසේද?

ජෝසේ සම්බන්ධ කථාන්තරය

ජෝසේ සහ ඔහුගේ පවුල අවට පිහිටි ප්‍රදේශයකට අලුතෙන් පැමිණි අය වූහ. ජෝසේගේ පලමුවෙනි අලුත් මිතුරා පාඕලෝ නැමැති පිරිමි ළමයෙක් වන අතර ඔහු සභාවේ සාමාජිකයෙකු නොවීය. ජෝසේ සහ පාඕලෝ දෙදෙනාම පාපන්දු වලට කැමතිය. ඊලඟ ඉරුදින පාපන්දු ක්‍රීඩාවකට යෑමට දිනක් පාඕලෝ ජොසේට ආරාධනා කළේය. ඉරුදින පාපන්දු ක්‍රීඩා වලට නොයා යුතු බව ජොසේ දැන සිටියේය. නමුත් ඔහු නොගිය හොත් පාඕලෝ ගේ සිත රිදේවි යයි ඔහු කනස්සල්ලට පත්වූයේය.

- ඔබ ජොසේ නම් කුමක් කරන්නෙහිද?

පාපන්දු ක්‍රීඩාවට යනවා වෙනුවට ජොසේ සභාවට යෑමට තීරණය කර, පාඕලෝට ඔහුත් සමග සභාවට යෑමට ආරාධනා කළේය. ජෝසේ සමග සභාවට යෑමට පාඕලෝ එකඟ විය.

- ජොසේ යහපත් ආදර්ශයක් වූයේ කෙසේද?

එරික් සහ පීටර් සම්බන්ධ කථාන්තරය

දිනක් ඕලන්දයේදී ධර්ම දූතයින් බැලීමට ස්ත්‍රියක් පැමිණියාය. යාච්ඤා කරන අන්දම ඇයට ඉගැන්වීමට ඇය සහෝදරියගෙන් ඉල්ලා සිටියාය. ඇයගේ පුත්‍රයන් වන එරික් සහ පීටර්, ප්‍රාථමිකයට එන බවත් එයට ඉතාම කැමති බවත් ඇය පහදා දුන්නාය. යාච්ඤා කිරීමට ප්‍රාථමිකයේ දී ඔව්හු ඉගෙන ගතිති.

ස්වල්ප දවසකට පෙර ඇයගේ ළදරු ගැහැණු ළමයා අසනීප වූ බව ස්ත්‍රිය විස්තර කළාය. ස්වල්ප වේලාවකට කාමරෙන් පිටතට ගිය ඇය, ආපසු පැමිණෙන විට එරික් සහ පීටර් ළදරුවාගේ ඇඳ ලඟ දණ ගසාගෙන සිටියහ. ළදරුවාට ආශිර්වාද කර ඇයව සුවපත් කරන මෙන් ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් පීටර් ඉල්ලුවේය. යාච්ඤා කිරීමට ප්‍රාථමිකයේ දී ඇයගේ පුත්‍රයන් ඉගෙන ගත් බැවින් ඇය සතුටු වන අතර ඇයටද යාච්ඤා කරන අන්දම ධර්මදූතයින් ගෙන් ඉගෙන ගැනීමට අවශ්‍ය බව කීවාය. යාච්ඤ ාකරන අන්දම ධර්ම දූතයින් ස්ත්‍රියට ඉගැන්වූහ. එරික් සහ පීටර් ඔවුන් ගේ මවට යහපත් ආදර්ශයක් වූ බැවින් ඔව්හු සතුටු වූහ.

- එරික් සහ පීටර් ඔවුන් ගේ ආලෝකය බැබළවූයේ කෙසේද?

ළමා සහභාගීත්වය

සියලුම කථාන්තර ඔබට කීවාට පසු, කඩදාසි මල්ලෙන් වසන ලද "?" ඉටිපන්දම පෙන්වන්න. මල්ල ඉවත් කිරීමට ළමයෙකුට කියන්න. යහපත් ආදර්ශයක් වූ ඕනෑම ළමයෙකු සඳහා "?" ඉටිපන්දම නැගී සිටින බව පහදා දෙන්න. ඔවුන් යහපත් ආදර්ශයක් වූ අවස්ථාවන් ගැන කීමට ළමයින්ට ආරාධනා කරන්න.

**අපගේ ආලෝකය බැබළීමට අපට සැලැස්විය හැකිය.**

ශුද්ධ වූ ලියවිලි

මතෙව් 5:16 ශබ්ද නගා නැවත කියවන්න. අපගේ ආලෝකය බැබළවීමට සැලැස් වීමට යේසුස් වහන්සේ අපට කියන බව ළමයින්ට මතක් කරන්න. යහපත් ආදර්ශය මගින් අපගේ ආලෝකය බැබළවීමට සැලැස් වීම වැදගත් වන බව විශේෂයෙන් පැහැදිලි කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ පසු දවස් වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සාමාජිකයන් වශයෙන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අප අනුගමණය කළ යුතු අතර අන්‍යයන්ටත් යේසුස් වහන්සේ ගේ ඉගැන්වීම් අනුගමණය කිරීමට උපකාර කළ යුතුය.

ගීතය

"මා හිරුරැසක් වීමට යේසුට ඕනෑ" යන්න ළමයින් සමග ගායනා කරන්න නැත්නම් වචන කියන්න. ශුද්ධ වූ ලියවිලි කියන අන්දමට යේසුස් වහන්සේට "හිරුරැසක්" වීම යනු අපගේ ආලෝකය බැබළවීමට සැලැස්වීම බව තේරුම් ගැනීමට ළමයින්ට උපකාර කරන්න.

ක්‍රියාකාරකම්

ඔබ අවස්ථාවන් කිහිපයක් විස්තර කරන්ට යන බවද එම එක් එක් අවස්ථාවකදී ඔවුන්ට ගැනීමට හැකි තීරණ දෙකක්ද දෙන බව ළමයින්ට කියන්න. එක් එක් තීරණයකටම සැලකිළි මත්ව සවන් දීමට ළමයින්ට කියන්න. තීරණය යහපත් එකක් නම්, ඉටිපන්දම් අලවන කඳක් මත ඔවුන්ගේ ඉටිපන්දම දැක්වීමට එක් එක් ළමයෙකු ඔවුන්ගේ ඇඟිල්ලක් උසට අහසට එසවිය යුතුය. තේරීම යහපත් නම්, ඔවුන් එක් එක්කෙනා ඇඟිල්ල අනිත් අතින් වසා ගතයුතු වන අතර ඔවුන්ගේ ආලෝකය කුරණියෙන් සඟවන බව දැක්වීමටය. එක් එක් අවස්ථාවකට පසු, කුමණ තේරීමක් වඩා හොඳද, අපගේ ආලෝකය බැබළවීමට සලස්වන ආදර්ශයක් වන්නේ කුමක් නිසාද යන්න සාකච්ඡා කරන්න.

පහත සඳහන් අවස්ථාවන් හෝ ඔබේම නිර්මාණ භාවිතා කරන්න.

1. ඔබගේ අසල්වැසි මිතුරියන් සමග මුලු උදය වරුවේම ක්‍රීඩා කරමින් බොහෝ විනෝද වන්නෙහිය. දවල් කෑමෙන් පසු පාරෙන් එහා පැත්තේ පවුලක් බැහැදැකීමට පැමිණි ගැහැණු ළමයෙක් එලියට පැමින ඇයටද ක්‍රීඩා කිරීමට අවශ්‍ය බව පෙනෙන්ට තිබේ. ඔබ කුමක් කරන්නෙහිද?

   අ. ඔබ සහ ඔබගේ මිතුරියන් ඇය නාඳුනන බැවින්ද, ඔබ කුමක් ක්‍රීඩා කරන්නේද කියා ඇය නොදන්නා බැවින්ද, ඔබ සමග ක්‍රීඩා කිරීමට ඔබ ඇයට ආරාධනා නොකරන්නෙහිය.

   ආ. ඔබගේ මිතුරියන්ට ඔබ මෙසේ කියන්නෙහිය, "පැමිණ අප සමග ක්‍රීඩා කිරීමට අප අර අලුත් ගැහැණු ළමයාට ආරාධනා කරමු. ක්‍රීඩා කිරීමට ඇයට අවශ්‍ය බව පෙනේ."

2. ඔබ මිතුරියන් සමග බෝල ගසමින් සිටී. ඔබ බෝලය වේගයෙන් ගැසූ නිසා ඔබගේ අසල්වැසියාගේ ජනේලයේ වීදුරුව බිඳෙයි. ඔබ කුමක් කරන්නෙහිද?

   අ. ඔබ බෝල ගසමින් සිටියදී බෝලය වේගයෙන් ගැසූ බැවින් ජනේලයේ වැදී වීදුරුව බිඳුනු බව අසල්වැසියාට ඔබ කියන්නෙහිය. ඔබ ඒ ගැන කණගාටු වන බවත්, කැඩුනු ජනේලයට ඔබ ගෙවන බවත් පහදා දෙන්නෙහිය.

   ආ. ඔබ ගොස් කැඩුනු ජනේලය දෙස බලයි. එය ගොඩක් කැඩී නොමැති බැවින්, එය කිසි දිනක කිසිවෙකුට නොපෙනෙන බව ඔබ ඔබේ මිතුරියන්ට කියයි. ඔබ නොකඩවාම බෝල ගසමින් වඩාත් සැලකිළිමත් වීමට උත්සහ දරයි.

3. පාසලේදී ආහාර ගැනීමට යෑමට (හෝ ප්‍රාථමික පංතියට යෑමට බලාගෙන) පෝලිමේ බලා ගෙන සිටී. පෝලිමේ සිටි සමහර ළමයි කළබල වී ක්‍රීඩා කිරීමට පටන් ගනිති. ඔබගේ පිටුපසින් සිටින ළමයා ඔබව තල්ලු කරයි. ඔබ කුමක් කරන්නෙහිද?

   අ. කිසිවෙකු තල්ලුනොකර පෝලිමේ සිටිනවා.

   ආ. ඔබව තල්ලු කළ පුද්ගලයාව තල්ලු කරනවා.

හරි දෙය තෝරා ගැනීමෙන් යහපත් ආදර්ශයක් වීමේ වැදගත්කම ගැන ළමයින්ට මතක් කරන්න.

**සාරාංශය**

**හදෙතෝ (CTR) සටහන**

ගැලවුම් කාරයාණන්ගේ ඉගැන්වීම් අප අනුගමණය කරනවා නම් අප හරි දෙය තෝරා ගන්නා බව හදෙතෝ (CTR) සටහන පෙන්වමින් ළමයින්ට මතක් කරන්න.

සූසන්, ජොසේද, එරික් සහ පීටර් යහපත් ආදර්ශ වූවාක් මෙන්, අන්‍යයන්ට යහපත් ආදර්ශ වීමට ළමයින්ව දිරි ගන්වන්න.

**ඉටිපන්දම් ක්‍රියාකාරීත්වය**

කඩදාසි ඉටිපන්දමක් එක් එක් ළමයෙකුට දෙන්න. ඔවුන්ගේ ඉටිපන්දමේ ඔවුන් ගේ නම් ලියන්න නැතහොත් ළමයින් ලවා ලියවන්න.

නිවස, පාසල, සහ සභාවේ යහපත් ආදර්ශ මගින් ඔවුන්ගේ ආලෝකය බැබළවීමට හැකි ක්‍රම ගැන සිතීමට ළමයින්ට උපකාර කරන්න.

මෙම සතිය තුළදී ඔහු හෝ ඇය යහපත් ආදර්ශයක් වීමේ එක් මාර්ගයක් ගැන කීමට එක් එක් ළමයාට සලස්වන්න.

යහපත් ආදර්ශයක් වීමෙන් ඔවුන්ගේ ආලෝකය බැබළීමට සැලැස්වීම මතක්කිරීම පිණිස ඔවුන් ගේ ඉටිපන්දම් ගෙදර ගෙන යාමට ළමයින්ට සලස්වන්න.

**සාක්ෂිය**

යහපත් ආදර්ශයක් වීමේ වැදගත් කම ගැන ළමයින්ට සාක්ෂිදරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන ඉගෙන ගැනීමට ඔබ යහපත් ආදර්ශයක් වූ අන්දම හෝ වෙන කෙනෙකුගේ ආදර්ශය ඔබට උපකාර වූ අන්දම ගැන ඔබගේ පුද්ගලික අත්දැකීමක් බෙදා ගැනීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

**ගීතය**

"හරි මාර්ගය තෝරා ගන්න" ළමයින් සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනාකර අන්‍යයන්ට යහපත් ආදර්ශයක් වීමට ළමයින්ට උපකාරකිරීමට ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් ඉල්ලීමට කියන්න.

ඔවුන්ගේ කඩදාසි ඉටිපන්දම් ඔවුන් ඉදිරියේ ඔසවාගෙන නිශ්චලව ඇවිදිමින්, ඔබගේ පංති කාමරයෙන් පිටවී යාමට ළමයින්ට ආරාධනා කරන්න. (පංතියෙන් පසු ගෙදර ගෙන යෑමට යම් කෙනෙකු එන තෙක ළමයි සිටිනවා නම් එම පුද්ගලයාට ඔවුන්ගේ ඉටිපන්දම් පෙන්වීමට ආරාධනා කරන්න.)

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව", අමතර මග පෙන්වීම් බලන්න.

1. "අපගේ ආලෝකය බැබළවීමට අපට සැලැස්විය හැකිය" යන කොටසෙහි ඔවුන් යාච්ඤකළ, අවස්ථාවන්ට වඩා හොඳ විසඳුම් යන්න රඟදැක්වීමට ළමයින්ට සලස්වන්න. සූසන්, ජෝසේද, එරික් සහ පීටර්ගේ කථාන්තරද ළමයින්ට රඟ දැක්විය හැකිය.

2. "මා කරන ලෙස කරන්න" (ළමා ගී පොත, පි. 276) ගායනා කරන්න නැතහොත් වචන කියන්න. මෙම ගීතයට වචන අත් පොතේ පිටුපස අඩංගු වේ. අනිත් ළමුන්ට අනුගමණය කිරීම පිණිස ක්‍රියාවකින් පෙන්වමින් වාර අනුව ගීය මෙහෙය වීමට ළමයින්ට සලස්වන්න.

   නැතහොත්, එක් එක් ළමයෙකුට වාර අනුව නායකත්වය දෙමින් "නායකයා අනුගමණය කරන්න", ක්‍රීඩා කිරීමට සලස්වන්න.

   මෙම ගීතයේ හෝ ක්‍රීඩාවේ, සියලු දෙනාම නායකයාව අනුගමණය කරන බව පෙන්වා දෙන්න. ඔවුන් හරි දෙය තෝරා ගත් විට, ඔවුන් අවට සිටින අයට ඔවුන් යහපත් ආදර්ශ වන බව ළමයින්ට මතක් කරන්න.

3. "බැබළෙන්න" (ළමා ගී පොත, පි. 144) ගායනා කරන්න නැතහොත් වචන කියන්න.


   මගේ ආලෝකය කුඩා එකකි,
   ඇදහීමේ ඇයදීම මගේ ආලෝකය;
   අහා! දෙවිඳුගේ මග හිරු මෙන් බැබළේ,
   එහිය එය දැල්වූයේ.

   *ගීත කණ්ඩය:*
   බැබළෙන්න, බැබළෙන්න, බැබළෙන්න දීප්තියෙන් පැහැදිලිව;
   බැබළෙන්න, බැබළෙන්න දවස මෙහිය දැන්.

   මගේ කුඩා ආලෝකය නොසඟවමි මම;
   සමිඳු මට එසේ කියා ඇත.
   පෙනෙන්ට එය මට දී තිබේ,
   බැබළෙනවා සියල්ලෝ දකිනු ඇත.

   ගීත කණ්ඩය:

4. ක්‍රියාකාරීත්වයට යොමු කිරීමේදී කොඳුරමින් ඇසූ අන්දමට, එක් එක් ළමයෙකුගෙන් නැවත බැලීමේ ප්‍රශ්නයක් අසන්න. සැලකිළිමත්ව අසා සිටීම සහ සිතීම ගැන ඔවුන්ට ප්‍රශංසා කරන්න.



# මට කීකරු වීමට හැකිය

30
වෙනි
පාඩම

**අරමුණ**

කීකරු වීම මගින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ ආදර්ශය අනුගමණය කිරීම සඳහා එක් එක් ළමයෙක්ව දිරිගැන්වීමටය.

**සූදානම**

1. නික්ම යෑම 20:12, මතෙව් 26:36–46, යොහාන් 8:28–29 සහ කොලොස්සි 3:20 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ශුභාරංචි (31110), 35 වෙනි පරිච්ඡේදය බලන්න.
2. පහත සඳහන් වචන තීරුව සාදන්න.

| කීකරු වීම |
|---|

3. මට කීකරු වීමට හැකිය යන්න කඩදාසියක ලියා හැඳින්වීමේ ලකුණු එක් එක් ළමයෙකු වෙනුවෙන් සාදන්න. එක් එක් ළමයෙකු ගේ කමිසයට හෝ ඇඳුමට ඇලවීමට අලවන පටි හෝ කටු රැගෙන එන්න, නැතහොත් හැඳින් වීමේ ලකුණ ළමයින්ගේ බෙල්ල වටේ එල්ලීමට කැටි නූල් ගෙන එන්න.
4. "වහාම මම කීකරු වෙමි" (ළමා ගී පොත, පි. 197) සියලුම පද තුනම ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. මෙම ගීතයට වචන අත් පොතේ පිටුපස අඩංගු වී ඇත.
5. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. 2–51 පිංතූරය, පාත්තයා පාත්ත පැටවු සමග 2–52 පිංතූරය, යේසුස් වහන්සේ ගෙත්සෙමනෙහි යාච්ඤකිරීම. (පිංතූර මෙවලම් මල්ල 227; 62175).
6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

*වැඩිහිටි ළමයින්ගේ ගුරුවරුන්ට සටහනක්:* සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් 1 ක්‍රියාකාරීත්වයට යොමු වීම වශයෙන් ඔබට භාවිතා කිරීමට අවශ්‍ය වෙනවා ඇත.

**යෝජිත පාඩම් වැඩි දියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමයින්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න. සතිය තුළදී ඔවුන් යහපත් ආදර්ශ වූ ක්‍රම ගැන ළමයින්ට කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

### කීකරු කම සතුට ලඟා කරයි.

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

2–51 පිංතූරය පෙන්වන්න, පාත්තයා සහ පාත්ත පැටවු. සභාවේ සාමාන්‍ය අධිකාරියේ වැඩිහිටි තියඩෝරා එම්. බර්ටන් ගැන පහත සඳහන් කථාන්තරය ඔබගේ වචනයෙන් කියන විට පිංතූරය අල්ලා ගෙන සිටීමට ළමයෙකුට කියන්න.

තියඩෝරා එම්. බර්ටන් අවුරුදු පහක් පමණ වයසැති කාලයේදී, ඔහුගේ ආච්චි අම්මා ගේ ගොවිපල බැහැදැකීමට ගියේය. ගොවිපලේ එලිමහනේ ක්‍රීඩා කිරීමට තියඩෝරා කැමතිය. කුකුළු පැටව් සිටින

කිකිළිය ලඟට වඩා ලංනොවීමට මෙම ගමනේදී තියඩෝරා ගේ ආච්චි අම්මා ඔහුට අනතුරු ඇඟෙව්-වාය, මක් නිසාද පැටවුන්ට ඔහු රිදවීමට උත්සාහ දරනවා ඇතැයි කිකිළිය සිතන නිසාය. වඩාත් ලංනොවීමට තියඩෝරා පොරොන්දු වූවේය.

සිනිඳු මයිල් වලින් යුත් කහ පාට කුකුළු පැටව් තියඩෝරා දුටු විට, ඔහුට ඇල්ලීමට සිත්විය. කුකුල් පැටවා ඉවතට දිව් අතර, කිකිළි අම්මා තියඩෝරා වෙතට දුව අවුත් ඇගේ තියුණු හොටෙන් තියඩෝරගේ අතට කෙටුවාය. තියඩෝරා අඬමින් ආච්චි අම්මා වෙතට දිව්වේය.

ඔහු ඇඬීම නතර කරන තෙක් තියඩෝරාගේ ආච්චි අම්මා ඔහුව වැලඳ ගෙන සිට, පැටවුන්ට තියඩෝරා රිදවන්ට යනවා ඇතැයි කිකිළි අම්මා සිතූ බව පහදා දුන්නාය. ඇය ඇයගේ කුකුළු පැටව් ආරක්ෂා කතරීමට උත්සහ කරන විට ඈ ඔහුට කෙටුවාය.

තියඩෝරාව නැවත එළිමහනට යැවූ ආච්චි අම්මා කිකිළිගෙන් ඈත් වී සිටීමට ඔහුට මතක් කළාය. පාත්ත අම්මාටද වඩා ලං නොවීමට ඇය ඔහුට අනතුරු ඇඟෙව්වේ මක් නිසාද ඇයටත් පැටව් සිටින නිසාය. පාත්ත අම්මා කිකිළිට වඩා විශාල වන අතර, ඇයගේ පැටවුන්ටද රිදවන කෙනෙකුට ඇය ඇත්ත වශයෙන්ම තුවාල කරනවා ඇත. පාත්ත පැටව් නොඅල්ලන බවට තියඩෝර පොරොන්දු වූයේය.

තියඩෝර කිකිළි අම්මාගෙන් ඈත්ව සිටියේය. නමුත් පාත්ත අම්මා සහ පාත්ත පැටව් ඔහු දුටු විට වඩා හොඳින් දැක ගැනීමට ඔහු වඩාත් ලංවූයේය. ඇගේ අත්තටු විහිදුවා බෙල්ල දික්කොට ශබ්ද නගා ඔහුට පිම්ඹාය. තියඩෝරා භය වී ආපසු ගෙට දිව්වේය. (See Theodore M. Burton, *Friend*, Oct. 1973. pp. 18–19.)

සාකච්ඡා

- කිකිළිය හෝ පාත්තයා ලඟට නොයෑමට ආච්චි අම්මා තියඩෝරට කීවේ කුමක් නිසාද?
- ඔහුගේ ආච්චි අම්මාට ඔහු අකීකරු වූ විට තියඩෝර්ට හැඟුනේ කෙසේද?
- ඔහුට මෙසේ හැඟුනේ කුමක් නිසාද?
- මෙම අත්දැකීමෙන් තියඩෝර් ඉගෙන ගත්තේ කුමක්ද කියා ඔබ සිතන්නෙහිද?

කිකිළිය සහ පාත්තයා ඔවුන්ගේ පැටව් ආරක්ෂා කර ගත්තාක් මෙන් තියඩෝර් ආරක්ෂා කර ගැනීමට ඔහුට පුද්ගලයින් සිටින බව ඔහුගේ ආච්චි අම්මා ඔහුට කී බව ළමයින්ට කියන්න. අපගේ දෙමව්පියන් සහ පවුල්ද ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේද අපව රැකබලා ගනිමින් ආරක්ෂා කරන සේක. අපට ආරක්ෂා වෙමින් සතුටින් සිටීමට කළ යුතු දේවල් ඔව්හු අපට උගන්වති. ඔවුන්ට කීකරු වීමට ඉගෙන ගැනීම වැදගත් වේ.

වචන තීරුව

"කීකරු වීම" යන වචන තීරුව පෙන්වන්න. ශබ්ද නගා වචනය කීප වරක් ඔබ සමග කීමට ළමයින්ට සලස්වන්න. ස්වර්ගීය පියාණන් වහන්සේට, අපගේ දෙමව්පියන්ට, සහ අපගේ නායකයන්ට අවශ්‍ය දේවල් කරන විට අප කීකරු වන බව පහදා දෙන්න.

කීකරු වීම යන වචනය කියා පංතිය ලවා නැවත කියවන්න. කීකරු වෙන්න යන වචනයේ තේරුම කීකරු වීමට සමාන බව පහදා දෙන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කළාක් මෙන් ස්වර්ගීය පියාණන් වහන්සේට කීකරු වීමට අපට හැකිය.**

ශුද්ධ වූ ලියවිලි

ස්වර්ගීය පියාණන් වහන්සේට කීකරු වීම වැදගත් බව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උගන්වා තිබෙන බව බයිබලයේ සඳහන් වී තිබේ යයි පහදා දෙන්න. යොහාන් 8:28–29 පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ ශබ්ද නගා කියවන්න: "මාගේම කැමැත්තෙන් මා කිසිවක් නොකර මාගේ පියාණන් වහන්සේ මට ඉගැන්වූ ලෙස... උන්වහන්සේට ප්‍රසන්න වූ දේවල් මම නිතර කරමි"

මෙවා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වචන වන අතර, එහි අර්ථය නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිතරම කළේ ස්වර්ගීය පියාණන් වහන්සේට අවශ්‍ය වන දේවල් බව පහදා දෙන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ සතුටු වන බවට උන්වහන්සේ දන්නා දේවල් පමණක් උන්වහන්සේ කළ සේක.

ශුද්ධ ලියවිලි කථාන්තර

පිංතූර 2-52 පෙන්වන්න, යේසුස් වහන්සේ ගෙත්සෙමනෙහි යාච්ඤා කිරීම, මතෙව් 26:36–39 සඳහන් කථාන්තරය කෙටියෙන් කියන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ යාච්ඤාවෙහි කී දෙය ශබ්ද නගා කියවන්න. "අහෝ මාගේ පියාණෙනි, මේ කුසලානය මා කෙරෙන් පහ වෙන්නට පුලුවන් නම් එසේ වේවා" (මතෙව් 2:39) ස්වර්ගීය පියාණන් වහන්සේ වෙතට ආපසු අපට යෑමට උපකාර වෙන වෙනත් මගක් තිබුනා නම් යේසුස් වහන්සේ දුක්විඳ මරණයට පත් නොවන බව පහදා දෙන්න.

ඉන් පසු යේසුස් වහන්සේ කී දෙය ශබ්ද නගා කියවන්න: "එසේ වී නමුත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවා" (මතෙව් 26:39) එය අපහසු වූවත් ස්වර්ගීය පියාණන් වහන්සේට අවශ්‍ය දෙය යේසුස් වහන්සේ කිරීමට කැමති වූ බව එහි අර්ථයයි පහදා දෙන්න. යේසුස් වහන්සේ කළ දෙය මෙන් අපහසු යමක් කිරීමට අපට නොකියන බව පහදා දෙන්න. කෙසේ වෙතත් ස්වර්ගීය පියාණන් වහන්සේට අවශ්‍ය වන කුමණ දෙයක් හෝ කිරීමට අප කීකරු විය යුත්තෙමු.

- අපට කිරීමට ස්වර්ගීය පියාණන් වහන්සේ කියා තිබෙන යම් දේවල් මොනවාද? (පිළිතුරු මේවා විය හැකිය, යාච්ඤා කිරීම, එකිනෙකාට ප්‍රේම කිරීම, බව්තීස්මය ලබා ස්ථිර වීම සහ අවංක වීම වේ.)

**අපගේ දෙමව්පියන්ට කීකරු වීමට අපට හැකිය.**

ශුද්ධ වූ ලියවිලි සාකච්ඡා

ස්වර්ගීය පියාණන් වහන්සේට අප කීකරු වන විට අපගේ දෙමව්පියන්ටද අප කීකරු වන්නෙමු. (ඔබගේ පංතියේ සමහර ළමයි ඔවුන්ගේ දෙමව් පියන් සමග ජීවත් නොවන්නේ නම්, අවශ්‍යතාවය අනුව මෙම සාකච්ඡාව සකස්කර ගන්න. නිදර්ශනයක් වශයෙන් ළමයින්ගේ ආච්චි අම්මලාට සහ සීයලාට ඔවුන් කීකරු විය යුතුය.) දස පණතෙන් එකක් දෙමව්පියන්ට කීකරු වීමට අපට කියන බව පෙන්වා දෙන්න. නික්ම යෑම 20:12 පළවෙනි කොටස ශබ්ද නගා කියවන්න. "පියාටත් තාගේ මව්ටත් ගෞරව කරව්." අපගේ දෙමව්පියන්ට කීකරු වීම ඔවුන්ට ගෞරව කිරීමේ එක්මාර්ගයක් බව පහදා දෙන්න.

- අපගේ දෙමව්පියන්ට අප කීකරු විය යුත්තේ කුමක් නිසාද?

කොලොස්සි 3:20 ශබ්ද නගා කියවන්න. (ස්වාමීන් වහන්සේ යනු යේසුස් ක්‍රිස්තුස් වහන්සේට කියන තවත් නමක් බව ළමයින්ට මතක්කරන්න). එම පදයේ පළවෙනි කොටස කට පාඩම් කිරීමට ළමයින්ට උපකාර කරන්න. "දරුවෙනි, සියලු කාරණා වලදී තම මව්පියන්ට කීකරු වෙයල්ලා' ".

- ඔබගේ දෙමව්පියන්ට කීකරු වෙන විට ඔබට හැඟෙන්නේ කෙසේද?
- ඔබ කීකරු වෙන විට ඔබගේ දෙමව්පියන්ට හැඟෙන්නේ කෙසේද?

ගීතය

"වහාම මම වෙමි කීකරු" යන්නෙහි සියලුම පද තුන නැගිට ගායනා කිරීමට ළමයින්ට සලස්වන්න.

ස්වර්ගීය පියාණන් වහන්සේට සහ ඔවුන් ගේ දෙමව්පියන්ට කීකරු වීම සඳහා දැන්මම තීරණය කිරීමට ළමුන්ව දිරිගන්වන්න.

කථාන්තර

ඔහු හෝ ඇය, ඔහුගේ හෝ ඇයගේ දෙමව්පියන්ට කීකරු වී සතුටු වූ ළමයෙකු ගැන කථාන්තරයක් කියන්න.

කැත්රින් ඇයගේ මිතුරිය වන ඒප්‍රිල්ගේ නිවසෙහි ක්‍රීඩා කිරීමට කැමතිය. කැත්රින්ට පැයක් පමණ ක්‍රීඩා කළ හැකි යැයි කැත්රින් ගේ මව කීවාය. පැයක් ගතවූ බව ඒප්‍රිල්ගේ මව කීවිට, කැත්රින්ට සමු ගැනීමට අපහසු විය. ඒප්‍රිල් සහ ඇය ක්‍රීඩා කරන ක්‍රීඩාව අවසන් කිරීමට ඇයට අවශ්‍ය විය. කැත්රින් මොහොතක් සිතා මව කී ආකාරයට ගෙදර යෑමට තීරණය කළාය. එකිනෙහිම ඒප්‍රිල්ට ආයුබෝවන් කියා ඈ ගෙදර දිව්වාය.

කැත්රින් ගෙදර යන විට, ඇයගේ ආච්චි අම්මා ඇය එන තෙක් බලා සිටියාය. කැත්රින්ට පැමිණ ඇයගේ නිවසේ රාත්‍රිය ගත කිරීමට ආච්චි අම්මාට අවශ්‍ය වුවද, ඇයට වහාම ගෙදර යැමටද උවමනා විය. මව කී අන්දමට ඇය ගෙදර නොපැමිණියේ නම්, ආච්චි අම්මා බැහැදැකීමේ අවස්ථාව ඇයට අහිමි වෙනවා ඇත.

- කැත්රින්ට හැඟුනේ කෙසේදැයි ඔබ සිතන්නෙහිද?

අප කීකරු වෙන විට උනන්දු සහගත ප්‍රතිඵල නිතර නොලැබෙන නමුත් සතුටුදායක සමාදානයේ හැඟීම් අපට ඇතිවන බව විශේෂයෙන් පහදා දෙන්න. හරි දෙය තෝරා ගත් බව අප දන්නා බැවින් එම හැඟීම් අපට ඇතිවෙයි.

**සාරාංශය**

ළමයාගේ සහභාගීත්වය

ඔවුන් කීකරු වූ අවස්ථාවක් සහ ඔවුන්ගේ හැඟීම්ද, නැතහොත් අනාගතයේදී ඔවුන්ට කීකරු වීමට හැකි මාර්ගයක් ගැන කීමට වරකට එක්කෙනෙකු බැගින් ළමයින්ට ආරාධනා කරන්න. (ස්වර්ගීය පියාණන් වහන්සේ ගේ එක් පණතක් තැබීම, ක්‍රීඩා කිරීමට එලියට යැමට පෙර දෙමව්පියන්ගේ අවසරය ලබා ගැනීම, නිවස පිරිසිදු කිරීමට උපකාර වීම, නැතහොත් දෙමව්පියන් පලමු වරට කථාකළ විට පැමිනීම යනාදිය වේ.)

එක් එක් ළමයෙකුගේ වාරය අවසානයේදී "හැඳින්වීමේ ලකුණක්" ඔහුට හෝ ඇයට දෙන්න. ඔවුන් ගේ හැඳින්වීමේ ලකුණු ඔවුන්ට නිතර පෙනෙන තැනකින් තැබීමට ළමයින්ව දිරිගන්වන්න. එවිට ඔවුන්ට කීකරු වීම පිණිස මතක් කිරීමට හැඳින්වීමේ ලකුණ උපකාර වන්නේය. ඔවුන්ගේ පවුල් වලට හැඳින්-වීමේ ලකුණ ගැන විස්තර කිරීමටද පාඩමෙන් අද ඉගෙන ගත් දේ බෙදා ගැනීමටද ළමයින්ට යෝජනා කරන්න.

සාක්ෂි

ස්වර්ගීය පියාණන් වහන්සේට සහ දෙමව්පියන්ට කීකරු වීම තුලින් ඔබගේ ජීවිතයට ආශිර්වාද ලැබුණු බවට ඔබගේ සාක්ෂිය බෙදා ගන්න. කීකරු වීමෙන් ඔබට සතුට ලඟාකර දුන් අවස්ථාවක් ගැන කීමට ඉබට අවශ්‍ය විය හැකිය.

ලබන සතිය තුලදී ඔවුන්ගේ දෙමව්පියන්ට කීකරු වීම පිණිස ළමයින්ව දිරි ගන්වන්න.


අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳින් ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර", යන්නෙහි "පංති වේලාව", අමතර මගපෙන්වීම් වලට බලන්න.

1. ඇතුලේ වඩාකුඩා වූ රවුම් දෙකක් සහිත ලොකු රවුමක් රටහුණු ලැල්ලේ අඳින්න. (උදාහරණය බලන්න)



ඇස් වසා බැඳීම පැළඳගෙන කුඩාම රවුම මැද X අකුර සෑදීම මෙම ක්‍රියාකාරීත්වයේ අදහස බව පහදා දෙන්න. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී උත්සහ කිරීමට කියන්න. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ ඇයගේ ඇස් බැඳ රට හුණු කැල්ලක් ඔහුට හෝ ඇයට දෙන්න. ඇස් බැන්ඳ ළමයාව දෙතුන් වතාවක් කරකවා ඉන්පසු රට හුණු ලැල්ල ඉදිරියේ ඔහු හෝ ඇය තබන්න. රට හුණු ලැල්ලේ X අකුර සෑදීමට ළමයාට සලස්වන්න. X තැබීමේ ස්ථානය ගැන උපදෙස් ලැබුනාට පසු තවත් X අකුරක් තැබීමට ළමයාට කියන්න. ඇස් වසා බැන්ඳ ළමයාට උපදෙස් දීමට දෙවෙනි ළමයා සලස්වා මෙසේ කියවන්න “වඩා උසට,” “තවත් පහතට”, “වමට”, “දකුණට”.

ඇස් බැන්ඳ ළමයා අනිත් ළමයාගේ උපදෙස් වලට කීකරු වූවාට පසු ඔහු හෝ ඇය එය කෙතරම් හොඳට කලාද යන්න ලකුණු කළ ස්ථාන දෙක දෙස බලා සාකච්ඡා කරන්න.

- ඇය (ඔහු) උපදෙස් වලට කීකරු වූවාට පසු (ඇස් බැන්ඳ ළමයා) වඩාත් හොඳට X අකුර කළේ මන්ද?

අනිත් ළමයා උපදෙස් දෙන විට ඇස් බැඳ රවුමේ X අකුර තැබීමට උත්සහ කිරීම පිණිස කැමති එක් එක් ළමයෙකුට සහභාගි වීමට සලස්වන්න.

රවුම වඩාත් හොඳට පෙනෙන වෙනත් කෙනෙකුගේ උපදෙස් වලට කීකරු වූ විට රවුමේ ලකුණ තැබීමේදී ඇස් වසා බැන්ඳ ළමයි වඩාත් සාර්ථක වූ බව පෙන්වා දෙන්න. සමහර විට අපගේ ජීවිතයේ දේවල් අපට පෙනෙනවාට වඩා හොඳට ස්වර්ගීය පියාණන් වහන්සේට සහ අපගේ දෙමව්පියන්ට පෙනෙන බව පහදා දෙන්න. අපට උපකාර කිරීම පිණිස ඔව්හු අපට උපදෙස් දෙති. ස්වර්ගීය පියාණන් වහන්සේට සහ අපගේ දෙමව්පියන්ට අපි කීකරු වන විට, අපි සතුටු වන්නෙමු.

2. පහත සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න:

 මතෙව් ගිනිකූරු වලට කැමතිය. ඉරිපන්දම් පත්තු කරනවා නම් නැතහොත් ගිනි ඇවිලීම පටන්ගන්නවා නම්, උදව් කිරීමට නිතර ඔහුට අවශ්‍ය විය. සමහර විට ඔහුගේ දෙමව්පියන් ගිනිකූරක් ගැසීමට ඔහුට ඉඩදී ඔහුගේ ආරක්ෂාව නිශ්චිත කිරීමට නිතර ලඟින් සිටියෝය.

 එක් දිනක් ඔහුගේ දෙමව්පියන් කාමරයේ නොසිටි වෙලාවක, මේසය උඩ ගිනිපෙට්ටියක් තිබෙනවා මතෙව් දුටුවේය. එක් එක් ගිනිකූරක් ඔහුම පත්තු කිරීම කෙතරම් විනෝදයක්ද කියා ඔහු සිතුවේය. ඔහු සැලකිලිමත් වන බවට ඔහුට සහතිකය.

 එමගිනිකූරු සෙල්ලම් බඩු නොවන බවත් අවසරයෙන් තොරව කිසිම දිනක ඒවා භාවිතා නොකළ යුතු බවත් ඔහුගේ මව බොහෝ අවස්ථාවලදී ඔහුට කියා ඇති බව මතෙව් කල්පනා කළේය. හෙමිහිට මතෙව් ගිනිකූරු තිබූ තැනින් ඉවත්වී එලිමහනට ගොස් සෙල්ලම් කළේය.

 මතෙව්ගිනිකූරු අරන් තිබුනා නම් සිදුවීමට තිබූ ප්‍රතිඵල ගැන ළමයි සමග කථාකරන්න. කිසිවෙකු නොදැන සිටියත් මතෙව්ගේ කීකරුකම පවුලට උපකාරයක් වූ බව විශේෂයෙන් පැහැදිලි කරන්න.

 මෙසේ අසමින් සාකච්ඡාව ඔබට පවත්වාගෙන යාමට අවශ්‍ය වෙනවා ඇත:

- ඔවුන්ට සෙල්ලම් කිරීමට එම ගිනිකූරු ඔවුන්ගේ නිදන කාමරයට ගෙන ඒමට වැඩිමහල් සහෝදරයා ඔහුට කියනවා නම් මතෙව් කුමක් කළ යුතුද?

 වැරදි යයි අප දන්නා යමක් කිරීමට යමෙකු කියනවා නම්, අප කීකරු නොවිය යුතු බව පහදා දෙන්න. වැරදි යමක් කිරීමට අපට කියන විට එයට අප කීකරු වීම ස්වර්ගීය පියාණන් වහන්සේ බලාපොරොත්තු නොවන සේක.

3. පහත සඳහන් සරල උපදෙස් ඇතුලත් කඩදාසි කැලි සූදානම් කරන්න:

 - රට හුණු ලැල්ල මකන්න.
 - පංතියේ එක් එක් සාමාජිකයා සමග අතට අත දෙන්න.

- “මා කරන ලෙස කරන්න” ගායනා කරන්න නැතහොත් වචන කියන්න.
- එක් එක් පංති සාමාජිකයෙකු ගැන කරුණාවන්ත යමක් කියන්න.
- ඔබ ස්තුති වන්ත වන දේවල් පහක් කියන්න.
- සතිය තුළදී පවුලේ සාමාජිකයෙකුට ඔබ කරන්ට යන දෙයක් රඟ දක්වන්න.

කඩදාසි කැබලි භාජනයක තබන්න. වාර අනුව භාජනයෙන් කඩදාසියක් තෝරා ගෙන එහි ලියා ඇති උපදෙස් වලට කීකරු වීමට ළමයින්ට සලස්වන්න.

4. පංතිය පටන් ගැනීමට පෙර, ඔබගේ පංතියේ සුලු නිධන් සෙවීමකට මඟපෙන්වන සංඥා සූදානම් කර සඟවා තබන්න. එක් එක් මග පෙන්වන සංඥාව ඊලඟ මග පෙන්වන සංඥාවට ළමයින්ට මග පෙන්විය යුතු අතර අන්තිම මග පෙන්වීම් සංඥාව නිධානය වෙතට මගපෙන්විය යුතුය. නිධන් සෙවීමේ අවසානයේදී එක් එක් ළමයාට සුලු සංග්‍රහයක් හෝ තෑග්ගක් පිරිනැමීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.


   නිධානය සොයාගැනීමට එක් එක් මග පෙන්වන සංඥාවකම උපදෙස් වලට කීකරු විය යුතු අන්දම ගැන ළමයි සමග සාකච්ඡා කරන්න. නිධන් සෙවීම පටන් ගැනීමට පළවෙනි මග පෙන්වන සංඥාව ශබ්ද නගා කියවන්න.

   ළමයින් නිධන් සෙවීම අවසන් කළාට පසු අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේට අප කීකරු වෙනවා නම්, සියලුම ධනයට වඩා උතුම්ම ධනය උන්වහන්සේ අපට දෙන සේක: එනම් උන්වහන්සේ සමග සදාකාලයටම ජීවත්වීමට උන්වහන්සේ අපට සලස්වන සේක.

5. උත්පත්ති 6-8 සඳහන් නෝවා සහ නැව යන කථාන්තරය නැවත බලන්න. නෝවා කීකරු වූ බැවින්, ඔහු සහ ඔහුගේ පවුල ඉතිරි වූ බව පහදා දෙන්න. නොවා කළාක් මෙන්, ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පණත් වලට කීකරු වීමට ළමයින්ව දිරිගන්වන්න.

   පාඩමේ අවසානයේදී එක් එක් ළමයෙකුට බෙදා දෙන සටහනේ පිටපත් දෙන්න. නැවේ පිංතූරය පාට කර, ඔවුන්ට කීකරු වීමට හැකි දෙයක් පෙන්වන පිංතූරයක් ඇඳීමට සලස්වන්න.

නොවා කීකරු විය



මට කීකරු වීමට හැකිය

# 31 වෙනි පාඩම

# මම නීතියට කීකරු වෙමි

**අරමුණ**

දේශයේ නීතියට ගරුකිරීම හා කීකරු වීමේ වැදගත්කම ගැන අවබෝධ කර ගැනීම පිණිස එක් එක් ළමයාට උපකාර කිරීමට.

**සූදානම**

1. මතෙව් 22:15–22 සහ ඇදහිල්ලේ කරුණු 1:12 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. එක් එක් ළමයාට කැල්ලක් ලැබෙන අන්දමට ප්‍රමාණවත් ලුනු පිටි බෝලයක් සූදානම් කරන්න. 43 වෙනි පිටුවෙහි ලුනු පිටි බෝලය සාදන වට්ටෝරුව සඳහන්වී ඇත. (ලුනු පිටි බෝලය නොමැති නම්, ළමයින්ට භාවිතා කිරීම පිණිස පාට පැන්සල් සහ කඩදාසි රැගෙන එන්න.)
3. ළමයි හොඳට දන්නා නීති හා පාලන ක්‍රම වලට සම්බන්ධ අවස්ථාවන් කිහිපයක්, කඩදාසියක ලැයිස්තු ගත කරන්න. අවස්ථාවන්ට නොම්මර දමමින්, පංතියේ එක් එක් ළමයෙකුට අඩුම වශයෙන් එක් අවස්ථාවක් වත් විස්තර කරන්න. ඔබගේ පංතියේ ළමයින්ට වඩා සුදුසු අන්දමට, පහත සඳහන් හෝ වෙනත් අවස්ථාවන් නිර්මාණය කර භාවිතා කරන්න:
   - පාසැලට බොහෝ පරක්කු වී ඔබ පැමිණ ඇත. සතර මං හන්දියෙන් පාර පනිනවා වෙනුවට, ගෙවල් පේළිය ලඟින් පාර පැන්නා නම්, වඩා ඉක්මණට ඔබට එන්ට තිබුනේය. නීතියට කීකරු වෙනවා නම් ඔබ කුමක් කරන්නෙහිද?
   - ඔබ ඔබගේ පියා සමග සාප්පු සවාරියකදී දෝසි කැල්ලක් ඉල්ලන්නෙහිය. ඔබගේ පියා බැහැ යැයි කී නමුත්, ඔබගේ පියා කඩිසරව වෙලඳ සැලට මුදල් ගෙවන අතර ඔබ දෝසි කැල්ලක් දැක කිසිවෙකුට නොපෙනෙන ලෙස ඔබගේ සාක්කුවට දමා ගන්නෙහිය. නීතියට කීකරු වෙනවා නම් ඔබ කුමක් කරන්නෙහිද?
   - රැහැනකින් බඳිනලද බල්ලා ඇවිද්ද වීමට ඔබ රැගෙන යන්නෙහිය. උද්‍යානයක් ලඟට ඔබ පැමිණි විට නැවතී ක්‍රීඩා කිරීමට ඔබට අවශ්‍ය වූ නමුත් “බල්ලන් ගෙන යෑම තහනම්ය” කියා දැන්වීමක් තිබුනේය. අවට වැඩිහිටි කෙනෙකු ඔබ නොදුටු බැවින්, ඔබ ක්‍රීඩා කරන අතර බල්ලා රැහැනෙන් ගසක බැඳිය හැකිය. නීතියට කීකරු වෙනවා නම් ඔබ කුමක් කරන්නෙහිද?
   - මාර්ග සලකුණු ඇති වීදියේ එක් කොණකින් ඔබ පාර පනින්නෙහිය. රථවාහනද නොයන අතර අවට කිසිවෙකු නොසිටියේය. නමුත් ඉන්න කියා ඔබගේ එළිය පෙන්නුම් කරයි. නීතියට කීකරු වෙනවා නම් ඔබ කුමක් කරන්නෙහිද?
   - පරීක්ෂා කිරීමට අවශ්‍ය පොතක් ඔබ පුස්තකාලයේ සිටින විට ලැබුන, නමුත් පුස්තකාල අවසර පත ඔබ ගෙදර දමා පැමිණියෙහිය. ඉදිරියේ ඇති මේසය ලඟ පුස්තකාල භාරකරු නොසිටි නිසා පොත රැගෙන ඔබ යන විට නොපෙනෙයි. නීතියට කීකරු වෙනවා නම් ඔබ කුමක් කරන්නෙහිද?
4. අවස්ථාවන් තිබෙන අන්දමට හැකිතරම් කුඩා කඩදාසි කැබලි සූදානම් කරගන්න. කඩදාසි වල නොම්මර දමා භාජනයක හෝ මල්ලක ඒවා තබන්න.

5. එක් එක් ළමයාට හඳුනා ගැනීමේ කඩදාසි ලකුණක් සාදන්න.

නීතියට කීකරු
වීම කෙරෙහි අපි
විශ්වාස කරමු.

6. පහත සඳහන් වචන තීරු සාදන්න:

| නීතියට කීකරු වීම කෙරෙහි අපි විශ්වාසකරමු |
| --- |

7. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. කාසියක් (හැකිනම්, ජාතික නායකයෙකුගේ පිංතූරයක් සමග.)
   ඇ. කටු, අලවන පටි, හෝ කැපි නූල් (ළමයින්ගේ ඇඳුම් වලට හඳුනා ගැනීමේ ලකුණු ඇලවීමට)
   ඈ. 2-53 පිංතූරය, කායිසර් වෙතට පිරිනැමීම.

8. සාරවත් ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒඅනුව යන්න.

**පාලන ක්‍රම හා නීති අපට උපකාර විය හැක.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ලුනු පිටි බෝලයෙන් කැල්ලක් ළමුන්ට දී ගොවිපොළක සිටින සතෙකුගේ රූපයක් සෑදීමට සලස්වන්න. (ලුනු පිටි බෝලයක් සාදා ගැනීමට නොහැකි නම් ඔබගේ පංතියේ ළමයින්ට මෙම ක්‍රියාකාරීත්වය වඩා අපහසු නම්, පාට පැන්සලක් හා කඩදාසියක් ළමයින්ට දී ගොවිපළක සිටින සතෙකු ඇඳීමට එක් එක්කෙනාට සලස්වන්න. ඒ අනුව සාකච්ඡාව සකස් කර ගන්න.)

මේසයක් උඩ හෝ බිම සියලුම සතුන් පෙනෙන්ට තබන්න. ඔවුන්ගේ සතුන්ට ආහාර, වතුර සහ ආරක්ෂාව සලස්වා ගොවියෝ ඔවුන්ව ඉතාම හොඳට රැකබලා ගත යුතු බව පහදා දෙන්න. සතුන් තැනින්-තැන ඇවිදිනවා නම්, ඔවුන්ව නැතිවීමට හෝ තුවාල වීමට ඉඩ තිබේ.

- සතුන් තැනින් තැන ඇවිදීම වැළැක්වීමට අපට කුමක් කළ හැකිද? (වැටක් බැඳීම)

ලුනු පිටි බෝලයෙන් කැල්ලක් ඔබගේ අත් දෙකේ අල්ල හා මේසය මත තබා රෝල් කර දිග ලණුවක් සාදන්න. එය තුලට සතුන් වටකර වැටක් සාදන්න. සතුන් ආරක්ෂා කර තබා ගැනීමට වැටවල් උපයෝගී වන බව පහදා දෙන්න. (පාඩමේ ඉතිරි කොටසේදී සතුන්ව ප්‍රදර්ශනය සඳහා තබන්න. පාඩම අවසානයේදී ඔවුන් ගේ සතුන් ගෙදර ගෙන යෑමට ළමයින්ට ඉඩ දෙන්න.)

අපවද ආරක්ෂා කර තැබීමට අපට දේවල් තිබෙන බව පහදා දෙන්න. මෙම දේවල් වලට නීති සහ පාලන ක්‍රම යැයි කියනු ලැබේ. නීති සහ පාලන ක්‍රම වැටවල් වැනිය. මක් නිසාද අප අනතුරු දායක දෙවල් කිරීමෙන් සහ අප සහ වෙනත් පුද්ගලයින් අසතුටට පත්වීම ඒවා මගින් වැළැක්විය හැකිය. නීති සහ පාලන ක්‍රම වලට අප කීකරුවෙනවා නම් අපට ආරක්ෂාව සහ සතුට ලබා ගැනීමට ඒවා උපකාර වේ.

සාකච්ඡා

ඔබගේ පංතියේ සෑම ළමයෙකුටම පුරුදු ටික්-ටැක්-ටෝ (ඇඟිලි වලින් කරන ක්‍රීඩාවක්) වැනි සරල ක්‍රීඩාවක් තෝරා ගන්න. ක්‍රීඩාවේ පාලන ක්‍රම ගැන ඔබට කීමට සලස්වා, එම පාලන ක්‍රම වලට කීකරු නොවී ක්‍රීඩා කිරීමට උත්සහ කළහොත් සිදුවිය හැකි සිද්ධි ගැන සාකච්ඡා කරන්න. ක්‍රීඩාව සාර්ථක අන්දමින් ක්‍රීඩා කිරීමට සහ එහි විනෝදය ලබා ගැනීමට පාලන ක්‍රම අවශ්‍ය වන බව දැනගැනීමට ළමයින්ට උපකාර කරන්න.

- ක්‍රීඩා පාලන ක්‍රම හැරෙන විට වෙනත් වර්ගයේ පාලන ක්‍රම මොනවාද?
- ඔබගේ නිවසේ ඇති සමහර පාලන ක්‍රම මොනවාද?

"සෙල්ලම් කළාට පසු සෙල්ලම් බඩු අයින්කර තබන්න" වැනි, එක් එක් ළමයාගේ පවුල් වල අනුගමණය කරන පාලන ක්‍රම ඔහුට හෝ ඇයට කීමට සලස්වන්න. එක් එක් ළමයා පාලන ක්‍රම සඳහන් කරන විට, මෙසේ අහන්න.

- මෙම පාලන ක්‍රමය ඔබට උපකාර වන්නේ කෙසේද?

එක් එක් ළමයෙකු පවුලේ පාලන ක්‍රම කීවාට පසු, අපගේ නිවෙස් හැරෙන විට වෙනත් ස්ථාන වල අපට පාලන ක්‍රම තිබෙන බව පහදා දෙන්න.

- පාසැලේ හෝ ප්‍රාථමිකයේ සමහර පාලන ක්‍රම මොනවාද?
- මෙම පාලන ක්‍රම ඔබට උපකාර වන්නේ කෙසේද?

## අපගේ රට අපට නීති දී තිබේ.

කථාන්තර සහ සාකච්ඡා

අපගේ නිවසේ, පාසලේ සහ ප්‍රාථමිකයේ තිබෙන්නාක් මෙන්ම, අපගේ නගරයේ සහ රටේද පාලන ක්‍රම තිබේ. මෙම පාලන ක්‍රම වලට නීති යැයි කියනු ලැබේ. අපේ නිවසේ, පාසැලේ, සහ ප්‍රාථමිකයේ පාලන ක්‍රම මෙන්ම, මෙම නීති උපකාර කරමින් අපව ආරක්ෂා කරයි. නීති වලට අප කීකරු වෙන විට ඒවා අපව ආරක්ෂා කරමින් උපකාර කරන අන්දම ඉගෙන ගත් ළමයෙකු ගැන කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාන්තරය හෝ ඔබේම නිර්මාණයක් භාවිතා කරන්න:

ජෙරීට නිතරම ඔහුගේම බල්ලෙකු අවශ්‍ය විය. ඔහුගේ උපන් දිනයට ලස්සන බලු පැටවෙක් ඔහුට දුන් විට ඔහු ඉතාම සතුටු විය. බල්ලාට පැල් යැයි නම් කළේය. ජෙරී සහ පැල් එක්ව බොහෝ විනෝද වූහ.

වැට නොබඳින ලද වත්තක් ඇතුලේ බල්ලන් සිටින විට, ඔවුන් බැඳ තිබිය යුතුයැයි කියන නීතියක් ජෙරීගේ රටේ තිබුනේය. මිතුරෙකුගේ ගෙදරට පැල්වත් රැගෙන යෑමට දිනක් ජෙරී තීරණය කළේය. පැල්ගේ පටිය ඔහුට සොයා ගැනීමට නොහැකි වූ බැවින් ගෙවල් ස්වල්පයකට එපිට ජීවත් වූ මිතුරාගේ ගෙදරට, පටිය නොමැතිව පැල්ව ගෙන යෑමට ජෙරී තීරණය කළේය.

පාර පහලට ඔවුන් ඇවිදගෙන යන විට, පාරේ අනිත් පැත්තේ බළලෙකු සිටිනවා පැල් දුටුවේය. කුමක් සිදු වූවාද කියා ජෙරීට සිතාගැනීමට වත් නොහැකි වූ අතර පැල් පාරට දුව ගොස් වාහනයකට හැපුනේය.

ජෙරී කඳුලු වගුරවමින්, බල්ලා ඔසවාගෙන නිවසට ගියේය. ජෙරීගේ මව ඔවුන්ව පශුවෛද්‍යවරයා ලඟට ගෙන ගිය අතර, ඔහු පැල්ගේ කැඩුණු කකුලට සාත්තු කළේය.

පැල්ව මැරෙන්ට තරම් තිබුනු බව ඔහුගේ මව ගෙදර ගිය විට කීවාය. ජෙරී නීතියට කීකරු වී බල්ලා බැඳගෙන ගියා නම් පැල්ට තුවාල නොවන බව ජෙරී අවබෝධ කරගත්තේය. එම නීතිය තිබෙන්නේ ජෙරී සහ ඔහුගේ බල්ලා ආරක්ෂා කරගැනීමට බව ඔහු අවබෝධ කරගත් විට, එම නීතියට කිසිම දිනක අකීකරු නොවීමට ඔහු තීරණය කළේය.

- බල්ලන් බැඳ තිබීමට ජෙරීගේ නගරයෙහි නීතියක් තැබුවේ කුමක් නිසාද කියා ඔබ සිතන්නෙහිද?

- පැල්ගේ අනතුර වලක්වා ගැනීමට හැකි වෙන්ට තිබුනේ කෙසේද?
- අප අනුගමණය කළ යුතු නීති සහ පාලන ක්‍රම අපට තිබෙන්නේ කුමක් නිසාද?

සාකච්ඡා

නීති සාදා තිබෙන්නේ අපට උපකාර කිරීමට සහ ආරක්ෂා කිරීමට බව පහදා දෙන්න. ඔවුන් ගේ ප්‍රදේශයේ ප්‍රධාන නීති සමහරක් නම් කිරීමට ළමයින්ට කියන්න. එක් එක් නීතියක්ද එය නිර්මාණය කර තිබෙන්නේ කුමක් නිසාද යන්න සාකච්ඡා කරන්න. එක් එක් නීතියක්ම උපකාර වන අන්දම දැනගැනීමට ළමයින්ට උපකාර කරන්න.

ඔබගේ ප්‍රදේශයට අදාලවෙනවා නම් පහත සඳහන් සමහර අදහස් භාවිතා කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

*රථ වාහන නීති.*

- නැවතීමේ සියලුම ලකුණු ලග නවතින්න. අනතුරු වලක්වා ගැනීමට මෙය අපට උපකාර වේ.
- වේගයේ සීමාව පිළිපදින්න. ජනයාට ආරක්ෂා සහිතව රථ පැදවීමටත් හදිසි අවස්ථාවකදී වාහනය ඉක්මණට නවත්වා ගැනීම පිණිසත් වේගයේ සීමා තබා ඇත.

*සුරතල් සතුන් සඳහා නීති.*

- ඔබගේ වත්තෙන් පිට ඔබගේ සුරතලා සිටින විට බැඳ තැබීමේ පටිය දමා තියන්න. බඳින පටිය දැමීමේ නීතිය සතුන් ආරක්ෂා කරගැනීම සහ තුවාල වීම වැළැක්වීමත්, (ජෙරීගේ බල්ලා පැල්ට මෙන්) ජනතාවගේ දේපල සතුන්ගෙන් වන අලාභහානි වලින් ආරක්ෂා කර ගැනීමටත්ය.
- සතුන්ට හිංසා නොකරන්න. මේ අන්දමේ නීති තුවාල වීමෙන් සතුන් ආරක්ෂා කරයි.

*පුද්ගලික දේපල සම්බන්ධව නීති.*

- සොරකම් නොකරන්න. යමෙකුට අයිති දේවල් අප ගන්නවා නම්, සියලු දෙනාම අසතුටට පත්වන්නෝය.
- කුණු කසළ නොදමන්න. සියලු දෙනාම කුණු කසළ දමනවා නම් අපගේ පුරය හෝ නගරය අවලස්සනද අපිරිසිඳුද වන්නේය. එය පිරිසිඳු කිරීමට අපගේ දෙමව්පියන්ට (බදු) ගෙවීමට සිදුවන්නේය.

**අප නීතියට කීකරු වීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වෙනවා ඇත.**

සාකච්ඡා

- බදු යනු කුමක්ද?

සියලු දෙනාටම ප්‍රයෝජනවත් වන දේවලට එනම් පොලිස් නිලදාරීන්ට, ගිනි නිවන හමුදාවේ අයට, පාරවල් වලට හා පාසැල් වලට ගෙවීමට උපකාර වීම පිණිස අපගේ රජයට හෝ රටට අප දෙන මුදල බදු නමින් හැදින්වෙන බව පහදා දෙන්න. මෙම දේවල් නොමැති නම් කුමක් මෙන් වෙයිද යන්න කෙටි-යෙන් සාකච්ඡා කරන්න. සියලු දෙනාම මේවාට ගෙවමින් උපකාර කරන බව සහතික කිරීමට බදු නීති තිබෙන බව පහදා දෙන්න.

ශුද්ධ වූ ලියවිලි කථාන්තර

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කාළයේ ජනතාවට බදු නීති තිබුනු බව පහදා දෙන්න. 2-53 පිංතූරය පෙන්වන්න, සීසර් වෙතට පිරිනැමීම, මතෙව් 22:15–22 සඳහන් කථාන්තරය කියන්න.

ඔවුන්ගේ රටට ගරුබුහුමන් දැක්වීමට මුදල් ගෙවිය යුතුදැයි ජනතාව යේසුස් වහන්සේගෙන් ඇසූ බව පහදා දෙන්න. ගරු බුහුමන් මුදල්ද බදු මුදල් හා සමානය.

ඔබ ගෙනා කාසිය පෙන්වන්න. කාසියක් උන්වහන්සේට පෙන්වීමට යේසුස් වහන්සේ ජනතාවට කී බව පහදා දෙන්න. රටේ නායකයා වන කායිසර් ගේ පිංතූරයක් කාසියේ තිගෙන බව උන්වහන්සේ පෙන්වා දුන් සේක. (ඔබ ගෙන ආ කාසියේ ජාතියේ නායකයාගේ පිංතූරය තිබෙනවා නම් එය පෙන්වන්න.) මතෙව් 22:21 සඳහන් පරිදි, යේසුස් වහන්සේ ජනතාවට කී දෙය ශබ්ද නගා කියවන්න. (එවිට උන්වහන්සේ කී සේක, යන ස්ථානයෙන් පටන් ගන්න.)ඔවුන්ගේ රටේ නීති සහ ස්වර්ගීය පියාණන් වහන්සේගේ නීති වලට ජනතාව කීකරු විය යුතු බව යේසුස් වහන්සේ කී බව පහදා දෙන්න. ඔවුන්ගේ රටේ නීති වලට කීකරු වීම වැදගත් බව යේසුස් වහන්සේ ජනතාවට ඉගැන්වූ සේක.

## නීතියට කීකරු වීම කෙරෙහි අපි විශ්වාස කරමු.

වචන තීරුව

වචන තීරුවේ වාක්‍යය ශබ්ද නගා කියවන්න. මෙය දොළොස් වන ඇදහිල්ලේ කරුණේ කොටසක් බවත්, සභාවේ විශ්වාසයේ එක් ප්‍රකාශයක් බවත් පහදා දෙන්න.

වාක්‍යය කිහිප වතාවක් පංතිය එක්ව නැවත කියවීමට සලස්වන්න.

ක්‍රීඩාව

අවස්ථාවන් ලැයිස්තුව හා භාජනය හෝ අංක තැබූ මල්ල මේසය මත හෝ බිම තබන්න. "නීතියට කීකරු වීම" යන ක්‍රීඩාව ඔවුන්ට දැන් ක්‍රීඩා කළ හැකි බව පංතියට කියන්න. ඉන්පසු වාඩිවී මොහොතක් හෝ දෙකක් බලා සිටින්න. කිසිවෙකු ප්‍රතිචාරයක් නොදක්වන්නේ නම්, මෙසේ අසන්න:

- කිසිම කෙනෙක් ක්‍රීඩා නොකරන්නේ මන්ද? (කිසිවෙකු පාලන ක්‍රම නොදන්නා බැවින්ය.)

අංකය ලියන ලද කඩදාසි පිළිවෙලට තැබීමෙන්, අවස්ථාවන් ගැන තේරුම් ගැනීමට ළමයි උත්සහ දැරුවා නම්, උත්සහ දැරීම ගැන ප්‍රශංසා කර මෙසේ කියන්න:

- "නීතියට කීකරු වීම" ක්‍රීඩාව ඔබලා ක්‍රීඩා නොකරන්නෙහුද?
- ඇයි නැත්තේ?

පාලන ක්‍රම සහ නීති මගපෙන්වීමට උදව් කරමින් අපට උපදෙස් දෙන බව පහදා දෙන්න. ක්‍රීඩාවේ පාලන ක්‍රම පහදා දෙන්න.

1. භාජනයෙන් (හෝ මල්ලෙන්) අංකයක් ගන්න.
2. අංක එක ලබාගත් පුද්ගලයා ගෙන් පටන් ගෙන, ඔබගේ වාරය පිළිවෙලින් ගන්න.
3. ඔබගේ වාරය තුළදී නැගිට සිටින්න.
4. ඔබගේ අංකය ගුරුවරයාට දෙන්න. අනිත් ළමයින්ගේ උපකාරය නොමැතිව ගුරුවරයාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.
5. ඔබගේ වාරයට පෙරත් පසුවත් ඔබගේ පුටුවේ නිශ්චලව වාඩිවී සිටින්න.

එක් එක් ළමයෙක් භාජනයෙන් හෝ මල්ලෙන් අංකයක් තෝරා ගනිමින්, ක්‍රීඩා කිරීමට සලස්වන්න.

ඔහුගේ හෝ ඇයගේ අංකයට සමාන අවස්ථාව එක් එක් ළමයෙකුට කියවන්න.

එක් එක් ළමයෙකු ප්‍රශ්නයට පිළිතුරු දුන්නාට පසු, හඳුනා ගැනීමේ ලකුණු ළමයින්ට දෙන්න. ළමයින් ගේ අදහස් සහ පිළිතුරු වලට ඔවුන්ට ප්‍රශංසා කරන්න.

## සාරාංශය

ළමයින් ගේ ඉදිරිපත් වීම්

ඔවුන්ගේ හඳුනා ගැනීමේ ලකුණු ගැන ඔවුන්ගේ පවුල් වල අය අසන විට ළමයින් කියන්නේ කුමක්ද කියා අසන්න. ඔවුන් ඔවුන්ගේ පිළිතුරු බෙදා ගන්නා විට, අපට සතුටින් එකට ජීවත් විය හැකි අන්දමට නීතිවලට කීකරු වීමේ වැදගත් කම ගැන, බැරෑරුම් ලෙස කියන්න.

**සාක්ෂිය**

අපගේ යහපතට නීති නිර්මාණය කර තිබෙන බවට සාක්ෂි දරන්න. ඔබ නීතියට කීකරු වීම ගැන ස්තුති වන්ත වන පුද්ගලික අත්දැකීමක් බෙදා ගැනීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. ස්වර්ගීය පියාණන් වහන්සේගේ නීති සහ ඔවුන්ගේ රටේ නීති වලට කීකරු වීමට ළමයින්ට මතක් කරන්න.

මෙම සතිය තුළදී සැලකිළිමත්ව කීකරු වීමට එක් නීතියක් තෝරා ගැනීමට එක් එක් ළමයෙක්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. නීති වලට කීකරු වීම පිණිස සිහි තබා ගැනීමට උපකාර කරන ලෙස ස්වර්ගීය පියාණන් වහන්සේ ගෙන් ඉල්ලීමට ළමයින්ට යෝජනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳින් ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිත කළ හැකිය, "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව," අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. දොළොස් වෙනි ඇදහිල්ලේ කරුණ කට පාඩම් කිරීමට ළමයින්ට කියන්න: "කීකරු කමින්, නීති ගරුක වීමෙන්, හා සහයෝගය දෙමින්, රජ වරුන්ට, සභාපති වරුන්ට, පාලකයින්ට, හා නඩුකාරයින්ට යටත් විය යුතු බව අපි විශ්වාස කරම." හොඳින් නොදන්නා යම් වචන ඇත්නම් ළමයින්ට පහදා දෙන්න.

   හඳුනා ගැනීමේ ලකුණෙහි ලියා තිබෙන ඇදහිල්ලේ කරුණේ කොටසක් වන "නීතියට කීකරු වීම කෙරෙහි අපි විශ්වාස කරමු" යන්න වයසින් බාල ළමයින්ට කට පාඩම් කිරීමට හැකිය.

   "දොළොස් වෙනි ඇදහිල්ලේ කරුණ" (ළමා ගී පොත, පි. 131) ළමයින්ට කට පාඩම් කිරීමට උපකාර වන පිණිස ඔබට ගායනා කිරීමට අවශ්‍ය වෙනවා ඇත.

2. පවුලේ සාමාජිකයන් ආරක්ෂාවෙන් හා සතුටින් තැබීමට උපකාර වන පවුල් වල ඇති පාලන ක්‍රම පහක් ගැන සිතීමට පංතියේ ළමයින්ට කියන්න. හැම පාලන ක්‍රමයක්ම නම් කළාට පසු එක් එක් ළමයාට ඇඟිල්ලක් එසවීමට කියන්න. පාලන ක්‍රම පහ නම් කළාට පසු එක් එක් ළමයාගේ ඇඟිලි පහම එසවී ඇති අතර, හුණු ලෑල්ලේ එක් එක් ළමයෙකුගේ අත බලා අඳින්න. සෑම බලා ඇඳීමකදී ළමයාගේ නම ලේබල් කරන්න. උපකාර කිරීමේ ඔවුන්ගේ අත් වලට ළමයින්ට ස්තුති කර, ඔවුන්ගේම පවුලේ පාලන ක්‍රම වලට කීකරු වීමට මතක් වීම පිණිස ඔවුන්ව දිරිගන්වන්න.

3. ඇඟිලි සම්බන්ධව කරන පහත සඳහන් ක්‍රීඩාව ළමයින් සමග කරන්න.

   මම නවත්වන්නෙමි (*යමක් නවත් වන්නාක් මෙන් අල්ල ඉදිරියට තබා අත් දෙකම ඉදිරියට ඔසවන්න*),
   මම බලමි (*එය ආවරනය කරන්නාක් මෙන් ඇස් වලට උඩින් අත් දෙක තබන්න.*)
   මම සවන්දෙමි (*කෝප්පයක ආකාරයෙන් කන පිටුපසට අත තබන්න*)
   එවිට මා දැන ගන්නවාට සහතිකයි (*ඇඟිල්ල ඉදිරියට පිටුපසට වනන්න*)
   මම ආරක්ෂා සහිතව (*තමාව පෙන්වන්න) ක්‍රියා කරමි.*)
   මා කොහේ ගියත් කමක් නැත (*අවට පෙන්වීමට අත් ඉදිරියට විහිදුවන්න*)
   පාර පණින තැනින් පමණක් මම පාර පණිමි. (*පුටුව වටා අත් හරහට යවන්න*)
   මහමග භාගෙට පමණක් නොවේ (*ඔලුව සොලවන්න*);
   ඉදිරිය මම බලමි (*ආවරණය කරන මෙන් ඇස් උඩින් අත් තබන්න*).
   ඉදිරිය ගැන සිතමි (*ඔලුවේ පැත්තකට තට්ටු කරන්න*),
   අනතුරුව මම පා තබමි (*එතනම ඇවිදින්න*).

   රථ වාහන නීති වලට (*මාර්ග නීති) කීකරු වීමේ වැදගත් කම ගැන ළමයින්ට මතක් කරන්න*).

# 32 වෙනි පාඩම

# එකිනෙකාට ප්‍රේම කරන්න

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ ආදර්ශය අනුගමණය කරමින් අන්‍යයන්ට උපකාර කිරීම මගින් ප්‍රේමය දැක්වීමට හැකි බව ළමයින්ට අවබෝධ කර ගැනීමට උපකාර කිරීමටය.

**සූදානම**

1. මාර්ක් 6:34–44, ලූක් 17:11–19; යොහාන් 13:15, 34–35; සහ 3 නීපායි 17 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. ක්‍රියාකාරීත්වයට යොමු වීම සඳහා කඩදාසි වලින් විශාල හදවතක් කපන්න.
3. පාඩමෙහි අග තිබෙන පරිදි "මා නුඹලාට ප්‍රේම කළාක් මෙන්" යන්නෙහි බෙදා ගැනීමේ සටහන් සහ හදවත් ප්‍රෙහේලිකා එක් එක් ළමයා වෙනුවෙන් පිටපත් කර හෝ බලා අඳින්න. හැකි නම්, පාට කඩදාසියක ප්‍රෙහේලිකාව පිටපත් කර හෝ බලා අඳින්න. තිත් ඉරි දිගේ ප්‍රෙහේලිකාව කෑලි වලට කපන්න.
4. "එකි නෙකාට ප්‍රේමකරන්න" (ළමා ගී පොත, පි. 136) සහ "සියල්ලන්ට ප්‍රේම කිරීමට යේසු කීහ" (ළමා ගී පොත, පි. 61) ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. "එකි නෙකාට ප්‍රේම කරන්න" ට වචන අත් පොතේ අග අඩංගු වී ඇත.
5. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක් සහ මෝර්මන් ග්‍රන්ථයක්
   ආ. මැලියම් හෝ පාප්ප.
   ඇ. 2-36 පිංතූරය, නීපායි වරුන්ගේ ළමයින්ට යේසුස් වහන්සේ ආශිර්වාද කිරීම; පිංතූර 2-45, ලාදුරු රෝගීන් දසදෙනා (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 221; 62150); 2-47 පිංතූරය, පන්දහසකට කන්ට දීම (62143); පිංතූර 2-54, අන්තිම රාත්‍රි භෝජනය (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 225; 62174).
6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩි දියුණු කිරීම.**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**ප්‍රේමය ලැබීම වැදගත්ය.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

විශාල කඩදාසි හදවත ළමයින්ට පෙන්වන්න.

- ඔබ හදවතක් දුටු විට කුමක් සිතන්නෙහිද? (ප්‍රේමය)
- යමෙකු ඔබට ප්‍රේම කරන බව ඔබට කීමට හැකි කෙසේද?

(පවුලේ සාමාජිකයන්, මිතුරන් සහ ප්‍රාථමිකයේ ගුරුවරු) යන අය ඔවුන්ට ප්‍රේම කිරීම සහ එම අය ඔවුන්ට ප්‍රේමය දක්වන අන්දම ගැන කථාකිරීමට ළමයින්ට සලස්වන්න.

- පුද්ගලයන් ඔවුන්ගේ ප්‍රේමය ඔබට දක්වන විට ඔබට හැඟෙන්නේ කුමක්ද?
- ඔබ අන්‍යයන්ට ප්‍රේමය දක්වන විට ඔවුන්ට හැඟෙන්නේ කුමක්ද කියා ඔබ සිතන්නෙහිද?

අපට ප්‍රේමය කරන බව සියලු දෙනාටම දැනගැනීමට අවශ්‍ය බව පෙන්වා දෙන්න.

**එකිනෙකාට ප්‍රේම කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ඉගැන්වූ සේක.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොළොවේ ජීවත් වීමට පෙර, "ඇසට ඇසක්" යන නීතිය අනුව ජනතාව ජීවත් වූ බව පහදා දෙන්න. ජනතාව ඔබට දුෂ්ඨ කම් හෝ සතුරු කම් කරනවා නම් අපද ඔවුන්ට දුෂ්ඨ කම් හෝ සතුරු කම් කිරීම යනු එහි අදහස විය. යේසුස් වහන්සේ පොළොවට පැමිණියාට පසු, ජීවත් වීමට වෙනත් ක්‍රමයක් ජනතාවට ඉගැන්වූ සේක.

ශුද්ධ ලියවිලි කථාන්තර

2-54 පිංතූරය පෙන්වන්න. අන්තිම රාත්‍රි භෝජනය. යේසුස් වහන්සේ කුරුසයේ ඇණ ගැසීමට පෙර, ඔවුන් හමුවී ඔවුන් සමග අන්තිම ආහාර වේල වැළදූ බව පහදා දෙන්න. අන්තිම රාත්‍රි භෝජනය යැයි මෙම ආහාර වේල හැඳින්වීමට පටන්ගත්තේය. ඉක්මණටම උන්වහන්සේ උන්වහන්සේ ගේ ගෝලයින් හැරයන බව මෙම ආහාර වේල වළඳන විට ගැලවුම් කාරයාණන් ඔවුන්ට කී අතර උපදේශ සමහරක්ද උන්වහන්සේ ඔවුන්ට දුන්සේක

බයිබලය පෙන්වා යොහාන් 13:34–35 ශබ්ද නගා කියවන්න. මේවා යේසුස් වහන්සේ ගේ වචන බව පහදා දෙන්න. (එකිනෙකාට ප්‍රේම කරන්න පළවෙනි වතාවට කීමේ සිට) 34 වෙනි පදයේ පළවෙනි කොටස ශබ්ද නගා නැවත කියවන්න.

- පණතක් යනු කුමක්ද?

මෙම ශුද්ධ ලියවිල්ලේ එකිනෙකාට ප්‍රේම කිරීමට යේසුස් වහන්සේ මතක් කළා පමණක් නොවන බව පහදා දෙන්න; එකිනෙකාට ප්‍රේම කිරීමට උන්වහන්සේ අපට ආඥාවක් දුන් සේක. අප යේසුස් වහන්සේව අනුගමණය කරනවා නම්, අපි අන්‍යයන්ට ප්‍රේම කරන්නෙමු.

ගීතය

"සියල්ලන්ට ප්‍රේම කරන්න යේසු කීහ" පෙන්වා දී තිබෙන අභිනය භාවිතා කරමින් එය ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

සියල්ලන්ට ප්‍රේම කරන්න යේසු කීහ (අත් විහිදුවන්න);<br>
ඔවුන්ට කරුණාවන්ත වෙන්න (අසල්වැසියා වෙත හැරී අතට අත දෙන්න)<br>
හද ඔබගේ ප්‍රේමයෙන් පිරුණු විට (හදවතට අත තබන්න)<br>
අන්‍යයෝ ඔබට ප්‍රේම කරති (තමාවම වැළඳගන්න)

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන්‍යයන්ට උපකාර කරමින් ඔවුන්ට ප්‍රේමය දැක්වූ සේක.**

ශුද්ධ වූ ලියවිලි

යොහාන් 13:15 ශබ්ද නගා කියවන්න.

- ආදර්ශයක් වීමේ අදහස කුමක්ද?
- අපට යහපත් ආදර්ශයක් තැබුවේ කවුද?

ඔබ දැන් කියවූ ශුද්ධ ලියවිල්ලේ වචන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කී බව ළමයින්ට කියන්න. අනිත් පුද්ගලයින්ට ප්‍රේම කරමින් සහ ඔවුන්ට කරුණාවන්ත වීම, යේසුස් වහන්සේ අපට තැබූ එක් ආදර්ශයක් බව පහදා දෙන්න.

ශුද්දධ ලියවිලි කථාන්තර සහ සාකච්ඡා

2-45 පිංතූර, ලාදුරු රෝගීන් දසදෙනා පෙන්වන්න. පිංතූරයෙන් පෙන්වා දෙන කථාන්තරය කීමට ළමයින්ට කියන්න. (ලූක් 17:11–19 බලන්න.)

- ලාදුරු රෝගීන් දසදෙනාට උපකාර කිරීම පිණිස යේසුස් වහන්සේ කුමක් කළසේක්ද?
- උන්වහන්සේ ඔවුන්ව සුව කළේ කුමක් හෙයින්ද?

පන්දහසකට කන්ට දීම 2-47 පිංතූරය පෙන්වා, පිංතූරයෙන් පෙන්වන කථාන්තරය කීමට ළමයින්ට කියන්න. (මාර්ක් 6:34–44 බලන්න). අවශ්‍ය නම් ඔවුන්ට උපකාර කරන්න.

- ජනතාවට උපකාර කිරීම පිණිස යේසුස් වහන්සේ කුමක් කළසේක්ද?
- උන්වහන්සේ ඔවුන්ට උපකාර කළේ කුමක් නිසාද?

යේසුස් වහන්සේ නීෆායිට් ළමයින්ට ආශිර්වාද කරන 2-36 පිංතූරය පෙන්වා, 3 නීෆායි 17 සඳහන් කථාන්තරය කියන්න. යේසුස් වහන්සේ ඇමෙරිකාවේ නීෆායිට්වරු වෙතින් ස්වර්ගීය පියාණන්වහන්සේ වෙතට, ආපසු යෑමට සූදානම් වූ විට, උන්වහන්සේ ඔවුන් අතහැර යෑම නීෆායිට්වරුන්ට අවශ්‍ය නොවීය. (3 නීෆායි 17:4–5 බලන්න). යේසුස් වහන්සේ තව ස්වල්ප වේලාවක් නතරවී සියලුම රෝගීන් සුව කොට, සියලුම ළමයින්ට ආශිර්වාද කළ සේක.

- යේසුස් වහන්සේ නීෆායිට් වරු සමග නතරවී සිටියේ කුමක් හෙයින්ද?
- යේසුස්වහන්සේ ලෙඩුන්ව සුව කොට ළමයින්ට ආශිර්වාද කළේ කුමක් නිසාද?

මේ එක් එක් කථාන්තරයකම, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජනතාවට උපකාර කළේ උන්වහන්සේ ඔවුන්ට ප්‍රේම කරන නිසා බව පෙන්වා දෙන්න.

### අනයයන්ට උපකාර කිරීමෙන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය අපට අනුගමණය කළ හැකිය.

ශුද්ධවූ ලියවිලි

යොහාන් 13:35 නැවත කියවන්න. අපගේ ප්‍රේමය අන්‍යයන්ට අප පෙන්වන විට, අප යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය අනුගමණය කරන බව ඔව්හු දැනගන්නෝය.

ගීතය

"එකිනෙකාට ප්‍රේම කරන්න" යන්න ගීතිකාව ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

කථාන්තරය

අන්‍යයන්ට උපකාර කරමින් ඔවුන් හට අප ප්‍රේමකරන බව පෙන්වීමෙන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය අපට අනුගමණය කළහැකි බව පහදා දෙන්න. යම් කෙනෙකුට කරුණාවන්ත යමක් කර එම පුද්ගලයාට ප්‍රේමය දැක්වූ ළමයෙකු ගැන කථාවක් කියන්න. පහත සඳහන් කථාන්තරය කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

තෝමස් බොහෝ අසනීප වූ බැවින් දිගු කාළයක් ඇඳෙහිම සිටීමට අවශ්‍ය විය. ඔහු සහ ඔහුගේ මිතුරන් එක්ව කිරීමට කැමති සියලුම විනෝද දේවල් ඔහුට නැතිව ගියේය. ඔහු අසනීපව සිටියදී වරක් හෝ දෙවරක් ඔහුගේ මිතුරෝ ඔහු බැහැ දැකීමට පැමිණියහ. නමුත් ඔහුගේ මිතුරා වන ජුවාන් ඔහු බැහැ දැකීමට බොහෝ විට පැමිණියේය. අනිත් පිරිමි ළමයින් එලිමහනේ ක්‍රීඩා කරන විට, බොහෝ විට ජුවාන් තෝමස් ගේ ඇඳ ලඟට වී තෝමස් සමග කථාකරමින් සහ සිනාසෙමින් ඔහුට සුව වීමට උපකාර කළේය.

- තෝමස්ට ප්‍රේම කරන බව පෙන්වීමට ජුවාන් කළේ කුමක්ද?
- ජුවාන් ගැන තෝමස්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද? තෝමස් ගැන ජුවාන්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?

අන්‍යයන්ට උපකාර කිරීමෙන් අපගේ ප්‍රේමය ඔවුන්ට පෙන්වීමට හැකි බොහෝ මාර්ග තිබෙන බව පහදා දෙන්න. අපගේ පවුල් වලට, අපගේ මිතුරන්ට, අපගේ අසල්වැසියන්ට, වැඩිහිටි පුද්ගලයින්ට, අසනීප වී සිටින අයට හෝ වෙනත් අයට, අපගේ උපකාරය අවශ්‍ය අයට කරුණාවන්ත දේවල් අපට කළ හැකිය.

ක්‍රියාකාරීත්වය

ඔවුන්ට සිදුවිය හැකි සිද්ධියක පළවෙනි කොටස ඔබ ඔවුන්ට කියන විට සවන් දීමට ළමයින්ට සලස්වන්න. ප්‍රේමය දැක්වීමට ඔවුන් කුමක් කරනවාද කියමින් එක් එක් සිද්ධිය අවසාන කිරීමට ඔවුන්ට කියන්න. එම සිද්ධීන් එකක් හෝ එයට වඩා ළමයින් ලවා රඟ දැක්වීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. පහත සඳහන් සිද්ධීන් හෝ ඔබේම නිර්මාණ භාවිත කළ හැකිය.

1. ඔබ සහ ඔබගේ පියා බස් රිය එන තෙක් කොණක වාඩිවී සිටින්නෙහිය. වැඩිහිටි මිනිසෙකු බස් රියට නැගීමට ඉක්මණින් එනවා ඔබ දකින්නෙහිය. ගමන් කිරීමට උපකාර වීම පිණිස වේවැලක් ඔහුට තිබුන නමුත් ඉක්මණට යෑමට ඔහුට නොහැකි විය. බස් රිය පැමිණ දොර ඇරිනි. ඔබ පඩිපෙළ නගින අතර සමහර විට බස් රියට නැගීමට ඔහුට වෙලා නැති බව ඔබට අනුමාණ කළ හැකිය.
    - මෙම මිනිසාට ප්‍රේමය දැක්වීමට ඔබට කළ හැකි වන්නේ කුමක්ද?
2. ඉරු දින උදෑසන ඔබ සභාවට යමින් සිටින්නෙහිය. එක අතක ඇගේ ළදරුවාද අනිත් අතෙහි පොත්ද ඇති තරුණ මවක් ඔබ දකින්නෙහිය.
    - ගැලවුම් කරුවාණන්ගේ ආදර්ශය අනුගමණය කරමින් මෙම කාන්තාවට ප්‍රේමය දැක්වීමට ඔබට කුමක් කළ හැකි වන්නෙහිද?
3. ඔබ පාසලේ සිට ගෙදර පැමිණි විට, ඔබගේ මව මැසීමට උත්සහ දරමින් සිටියාය. ඔබේ කුඩා සහෝදරයා කලබල කරමින්ද අඬමින්ද සිටී, මක්නිසාද ඔබගේ මව ඔහුට කථාන්තරයක් කීමට ඔහුට අවශ්‍ය වූ නිසාය.
    - ඔබගේ මවට සහ ඔබගේ කුඩා සහෝදරයාට ප්‍රේමය දැක්වීමට ඔබට කුමක් කළ හැකිවන්නෙහිද?
4. එක් ඉරු දිනක, වෙනත් රටකින් පැමිණි අලුත් ගැහැණු ළමයෙකු ප්‍රාථමිකයේ දී ඔබට හමුවේ. ඇය ඉතා ලැජ්ජාශීලී වූ අතර වැඩිය කථා නොකළාය. පසුව රැස්වීම් ගෘහයේ ඉදිරි පස දොර ලඟ ඇය අඬමින් සිටිනවා ඔබ දකින්නෙහිය.
    - අලුත් ගැහැණු ළමයාට ප්‍රේමය දක්වමින් උපකාර කිරීමට ඔබට කුමක් කළ හැකි වන්නෙහිද?

**සාරාංශය**

ප්‍රහේළිකා ක්‍රියාකාරීත්වය

බෙදා දෙන සටහන් වූ හදවතක් සහ හදවත් ප්‍රහේළිකාවේ කැලි සමූහයක් එක් එක් ළමයාට දෙන්න. ප්‍රහේළිකාව එකතු කොට තබා බෙදා දෙන සටහන වූ හදවතට ඇලවීමට එක් එක් ළමයෙකුට උපකාර කරන්න. ප්‍රහේළිකාවේ සහ බෙදා දෙන සටහනේ හදවතෙහි තිබෙන වචන, ළමයින් සමග ශබ්දනගා කියවන්න.

ඔවුන්ගේ බෙදා දෙන සටහන් ගෙදර ගෙන යෑමට ළමයින්ට ඉඩ දෙන්න. අන්‍යයන්ට ප්‍රේමය දැක්වීම ගැන අද ඔවුන් ඉගෙන ගත් දේවල් ඔවුන් ගේ පවුල් වල අයට කීමට ළමයින්ව දිරිගන්වන්න.

වෙලා තිබේ නම්, ඔහු හෝ ඇය ප්‍රේම කරන පුද්ගලයෙකු නම් කර, එම පුද්ගලයාට ප්‍රේමය දැක්වීමට ඔහුට හෝ ඇයට හැකි මාර්ගයක් නම් කිරීමට එක් එක් ළමයෙකුට කියන්න. උපකාර කිරීම මගින් අන්‍යයන්ට ප්‍රේමය දැක්වීමට ළමයින්ව දිරිගන්වන්න.

සාක්ෂිය

අප එකිනෙකාට ප්‍රේම කිරීම ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය බවට සාක්ෂි දරන්න. ඔබ අන්‍යයන්ට ප්‍රේමය දක්වන විට ඔබට හැඟෙන ආකාරය ළමයින්ට කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. ගැලවුම් කාරයාණන් කළාක් මෙන්, අන්‍යයන්ට ප්‍රේමය දැක්වීමට උපකාර කරන මෙන් ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් ඉල්ලීමට ළමයාට යෝජනා කරන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව,” අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. ඔවුන් ප්‍රේමය දක්වන යමෙකුට ලිපියක් ලියා, එම පුද්ගලයා කෙරෙහි ඔවුන් කෙතරම් සැලකිළි මත් වෙනවාද යන්න විස්තර කිරීමට එක් එක් ළමයෙකුට සලස්වන්න. වයසින් බාල ළමයින්ට ඔවුන් ප්‍රේම කරන පුද්ගලයින්ගේ පිංතූර ඇඳීමට හැකිය. ඔවුන් ලිපි ලියූ හෝ පිංතූර ඇන්ද එම පුද්ගලයින් සමග ඒවා බෙදා ගැනීමට ළමයින්ව දිරිගන්වන්න.

2. සභාවේ තුන්වෙනි සභාපතිවරයා වූ ජෝන් ටේලර්, ප්‍රේමය දැක්වූ එක් වතාවක් ගැන පහත සඳහන් කථාන්තරය කියන්න:

   ජෝන් ටේලර් තරුණ කාලයේදී, ඔහුගේ මිත්‍ර රොබට් වෙස්ට් තදබල රෝගයක් සෑදී මළේය. ඉන් පසු, පිරිමි ළමයාගේ පියා වන ඇලී වෙස්ට් එඬේරෙකු වීම සඳහා එම ගමෙන් පිටව ගියේය. සමහර විට ඇලී තනිවී සිටින බව දැනගත් ජෝන් ඇලීව බැහැදැකීමට යෑම පිණිස ඔහුගේ දෙමව්පියන්ගෙන් ඇසුවේය. ජෝන්ගේ දෙමව්පියන් ඔහුට අවසර දී, කෑම කූඩයක්ද පිළියෙල කොට ගෙන යෑමට ජෝන්ට දුන්නේය.

   ඇලී ගේ නිවසට ගොස් ආපසු ඒමට මුලු දවසක්ම ගතවන නිසා, ජෝන් උදේ පාන්දරම පිටත් වූවේය. ගමන ඉතා මහන්සි එකක් වූ අතර, කඳු ගණනාවක් නැගීමටද තිබුනි. වරක්, ඔහු විවේක ගන්නා විට, කූඩේ තිබෙන කෑම කෑමට ජෝන්ට පරීක්ෂාවක් ඇති විය. ඒ වෙනුවට ඔහු නැගිට, ගමනේ ඉතිරි ටික හැකි ඉක්මණට ගියේය.

   ජෝන් දැකීමෙන් ඇලී ප්‍රීතියෙන් පිනා ගියේය. දෙදෙනා එක්ව කෑම කා පරණ දේවල් ගැන කථා කළහ. (See Deta Petersen Neeley and Nathan Glen Neely, *A Child's Story of the Prophet John Taylor* [Salt Lake City: Deseret News Press, 1960], පිටු. 12–18.)

   - ඔහුගේ මිතුරාගේ පියාට ප්‍රේමය දැක්වීම පිණිස ජෝන් ටේලර් කුමක් කළේද?
   - ජෝන් ටේලර් කළ දෙය ගැන ඇලී වෙස්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?
   - ජෝන් ටේලර්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?

   අන්‍යයන්ට අප ප්‍රේමය දක්වන විට, අප උපකාර කළ පුද්ගලයින් සතුටට පත්වන අතර අපද සතුටු වන බව ළමයින්ට මතක් කරන්න.

3. පහත සඳහන් ක්‍රියාකාර පදයේ වචන කියමින් රඟපෑමට (අභිනය කිරීමට) ළමයින්ට උපකාර කරන්න.

   ළමයි සියල්ලන්ට යේසු ආදරෙයි.<br>
   ළමයි සියල්න්ට යේසු ආදරෙයි (අත් දිගු කරන්න).<br>
   තවම කුඩා අයට (දණක් උසැති ළමයෙකු පෙන්වීමට අත භාවිතා කරන්න.)<br>
   තොටිල්ලේ ළදරුවාද (අතින් තොටිල්ලක් සාදන්න).<br>
   ලොකු අය සහ උස අයද (ඔලුවට ඉහලින් අත් ඔසවන්න).

   (From *Finger Fun for Little Folk* by Thea Cannon. © 1949 by the Standard Publishing Company, Cincinnati; Ohio. Used by Permission.)

   ළමයින්ට උවමනා අන්දමට බොහෝ වාර ගණනක් නැවත කියන්න.

4. පංතිය ඉදිරියෙහි ළමයින් දෙදෙනෙකුට සිටගැනීමට සලස්වන්න. මෙම ළමයි දෙදෙනා බොහෝ මාර්ග වලින් එක සමාන බව පංතිය සමග සාකච්ඡා කරන්න, එනම් ඇස් දෙකක් හා කන් දෙකක් තිබීම, එකම දේ කිරීමට කැමැත්ත, නැතහොත් සභාවේ සාමාජිකයන් වීම යනාදියයි. ඉන් පසුව ඔවුන්ගේ

වෙනස් ක්‍රම ගැන සාකච්ඡා කරන්න, එනම් හිසකෙස් වල ඇති පාටෙහි වෙනස, වෙනස්ව ඇති විනෝදාංශ නැතහොත් පවුලේ ප්‍රමාණයේ වෙනස යනාදියයි. පුද්ගලයන් දෙදෙනෙකු හරියටම එක සමාන නොවන බව පෙන්වා දෙන්න. අප සියලු දෙනාම යම් විධියකින් එකිනෙකාට වෙනස්ය.

සමහර විට පුද්ගලයින් විවිධාකාර (වෙනස්) බැවින් ඔවුන්ට සලකන අන්දම ගැන අපට සිතාගැ-නීමට නොහැකිය. ඔවුන් වෙනත් භාෂාවක් කථාකරනවා ඇත, ආබාධයක් ඇත, නැතහොත් වෙනත් යම්කිසි අන්දමකින් අපට වඩා වෙනස් විය හැකිය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සියලු දෙනාට ප්‍රේම කළ අතර, අපද සියලු දෙනාට ප්‍රේම කිරීම උන්වහන්සේට අවශ්‍ය බව පහදා දෙන්න. අපට වඩා වෙනස් අන්දමට පෙනෙන අයටත් අපහා සමානව පෙනෙන අයටත් අප උපකාර කරමින් ප්‍රේම කළ යුතුය.

“මම ඇවිදිමි ඔබ සමග” (ළමා ගී පොත, පි. 140) හෝ “අප වෙනස්ය” (ළමා ගී පොත, පි. 263) ළමයින් ලවා ගායනා කිරීමට හෝ වචන කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

මම ඇවිදිමි ඔබ සමග

ඔබ නොඇවිදින්නේ නම් බොහෝ අය මෙන්,
සමහරු ඔබගෙන් ඈත් වී යති,
නමුත් මම නම් නොකරමි! නොකරමි!
ඔබ කථා නොකරන්නේ නම් බොහෝ අය මෙන්
කථා කොට සමහරු ඔබට සිනාසෙති,
නමුත් මම නොකරමි! නොකරමි!
මම ඇවිදිමි ඔබ සමග. කථා කරමි ඔබ සමග.
එලෙස මගේ ප්‍රේමය දක්වමි ඔබට.


යේසු කිසිවෙකු මග හැර නොගියේය.
සියල්ලට එතුමා ප්‍රේම කළේ.
එලෙස මමද කරමි! කරමි!
ඔහු දුටු සියල්ලට යේසු කළේ ආසිරි,
හැරී කීවේ, “මා අනුව එන්න.”
එලෙස මම කරමි! කරමි!
මම කරමි! මම කරමි!
මම ඇවිදිමි ඔබ සමග, මම කථා කරමි ඔබ සමග.
එලෙස මගේ ප්‍රේමය දක්වමි ඔබට.

අපි වෙනස් වන්නෙමු.

මම දනිමි ඔබ, ඔබ දනියි මා.
හිරු සහ මුහුද මෙන් වෙනස්ය අප.
මම දනිමි ඔබ, ඔබ දනියි මා
එලෙස එය විය යුතුයි.

මම කරමි ඔබට උදව්, ඔබ කරයි මට උදව්.
ප්‍රශ්න තුලින් ඉගෙන, ලබයි දැනුම
මම කරමි ඔබට උදව්, ඔබ කරයි මට උදව්
එලෙස එය විය යුතුයි.

මා කරමි ඔබට පෙම්, ඔබ කරයි මට පෙම්.
ඉතා හොඳ වීමට එක්ව යයි ඉදිරියට.
මා කරයි ඔබට පෙම්, ඔබ කරයි මට පෙම්.
එලෙස එය විය යුතුයි.



මා ඔබට පෙම්
කළාක් මෙන්

එකිනෙකාට ප්‍රේම

කරන්න

වයසින් බාල ළමයින්ට මෙම ප්‍රහේලිකාව භාවිතා කරන්න.

එකිනෙකාට ප්‍රේම

කරන්න

වැඩිහිටි ළමයින්ට මෙම ප්‍රහේලිකාව භාවිතා කරන්න.

# 33
වෙනි
පාඩම

# දසයෙන් එක කොටස ගෙවීමට මට හැකිය


---

**අරමුණ** දසයෙන් කොටස අප ගෙවන විට, ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අප ප්‍රේමය පෙන්වන බව අවබෝධ කර ගැනීමට එක් එක් ළමයෙකුට උපකාර කිරීමටය.

---

**සූදානම**


1. මාර්ක් 12:41–44, යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. තවද, ශුභාරංචි මූලධර්ම (31110) 32 වෙනි පරිච්ඡේදය සහ ජේම්ස් ඊ තැල්මේජ්ගේ ක්‍රිස්තුස් නම් වූ යේසුස් පිටු 561–62 ද බලන්න. 3 වෙනි සංස්. [සෝල්ට් ලේක් සිටි: යේසුස් වහන්සේ ගේ පසු දවස්වල ශුද්ධ වන්තයන්ගෙන් යුත් සභාව. 1916]
2. පෙන්වා දී තිබෙන පරිදි, නැමූ කඩදාසි කෑලි භාවිතා කරමින් සලකුණු දෙකක් සූදානම් කරන්න.





3. මාර්ක් ගැන කථාන්තරය පැහැදිලි කිරීමට මුදල් පෙට්ටියක් සාදන්න. කොටස් දෙකකට බෙදා, පියන සමග ඕනෑම කුඩා පෙට්ටියක් ඔබට භාවිතා කිරීමට හැකිය. අවශ්‍ය නම්, එය බෙදීමට පහත සඳහන් උදෙස් හා උදාහරණය බලන්න.

   පෙට්ටියේ ප්‍රමාණයටම උස නමුත් (හෝ සෙන්ටි මීටර් තුනක්) පෙට්ටියට වඩා පළල කාඩ්බෝඩ් කැබැල්ලක් කපා ගන්න. අඟලකින් භාගයක් (හෝ සෙන්ටි මීටර් එකයි භාගයක්) එක් එක් පැත්ත-කින් ලකුණු කර කුඩා පෙට්ටියක් මෙන් තිබෙන අන්දමට පැති තබන්න. පටි වලට ගම් ගා එකක් අනිකට වඩා ලොකුවට සිටින අන්දමට, කොටස් දෙකක් සිටින සේ කාඩ් බෝඩ් කෑල්ල පෙට්ටිය ඇතුලට බස්සන්න.

   පෙට්ටියේ ඉදිරි පස හෝ පියනෙහි, කුඩා කොටසෙහි "දසයෙන් කොටස" යයිද වඩා ලොකු කොටසෙහි "වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන්න ලියන්න.



4. පෙන්වා දී තිබෙන පරිදි, දුඹුරු පාට කඩදාසියකින් ඉතාම කුඩා කාසියයි නම් කරන කුඩා කාසි ප්‍රමාණයේ රවුම් දෙකක් කපන්න:



5. එක් එක් ළමයෙකු වෙනුවෙන්, දසයෙන් කොටස සහ වෙනත් පිදුම් කොලයක් සහ දසයෙන් කොටස ගෙවන ලියුම් කවරයක් ලබා ගන්න.

6. "දසයෙන් කොටස මගේ සමිඳුට දීමට මට ඕනෑ" (ළමා ගී පොත, පි. 150). ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.

7. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. එක සමාන වටිනාකමක් ඇති කාසි දහයක් හෝ (සමාන වටිනාකමක් ඇති මුදල් කොළ)
   ඇ. පිංතූර 2-55, කනවැන්දුම්යගේ දීමනාව.

8. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

---

**යෝජිත පාඩම් වැඩි දියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමයින්ව ඔබ දිරිගැන්වූවා නම් ඒඅනුව යන්න.

**අප උපයන දෙයින් දසයෙන් කොටසක් දසයෙන් එක කොටස නම් වේ.**

ක්‍රියාකාරිත්වයට යොමු කිරීම

කාසි දහය ඔබගේ අතින් අල්ලාගෙන ළමයින්ට පෙන්වන්න.

- මෙම කාසි ඔබ උපයා ගත්තා නම් එය සමග ඔබ කුමක් කරන්නෙහිද?

එක් එක් ළමයෙකුට ප්‍රතිචාර දැක්වීමට සලස්වා, එක් එක් පිළිතුරක් ගැන ශුභවාදී ප්‍රකාශයක් කරන්න. හරි හෝ වැරදි පිළිතුරු එහි නොමැත. එක් එක් ළමයෙකු ප්‍රතිචාර දැක්වූවාට පසු, සාකච්ඡාව පවත්වා-ගෙන යන්න.

දසයෙන් කොටස ගෙවීම ගැන ළමයෙකු සඳහන් කළා නම්, අප මුදල් උපයා ගත් විට කළ යුතු ඉතාම වැදගත් යමක් යමෙකු සඳහන් කළ බව ප්‍රකාශ කරන්න. දසයෙන් කොටස ගෙවීම ගැන කිසිවෙකු සඳහන් නොකළා නම්, යම් කාලයකදී ඔවුන් මුදල් උපයා ගන්නවා නම් ඒ ගැන ඉතාම වැදගත් යමක් ඔවුන්ට ඉගෙන ගැනීම පිණිස ඔබ උපකාර කිරීමට කැමති බව ළමයින්ට කියන්න.

අප උපයන මුදලින් දසයෙන් කොටස ගෙවීමට ස්වර්ගීය පියාණන් වහන්සේ අපට අණ කර තිබෙන බව පහදා දෙන්න. අප දසයෙන් කොටස ගෙවන විට, අප උපයන මුදලෙන් සමහරක් සභාවට අපි දෙන්නෙමු. ස්වර්ගීය පියාණන් වහන්සේගේ සහ ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය ජනතාවට ඉගෙන ගැනීමට උපකාර වෙන දේව මාලිගා, සභා ගොඩනැගිලි, පාඩම් අත් පොත්, සහ වෙනත් උපකරණ වලට ගෙවීමට එම මුදල් උපයෝගී කරගනු ලැබේ.

ක්‍රියාකාරකම්

ඔබ එම කාසි මේසය මත හෝ බිම පේලියට තබන විට කාසි දහය ඔබත් සමග ගණන් කිරීමට ළමයින්ට සලස්වන්න. "දසයෙන් කොටස" යයි නම් කළ ලකුණ මේසය මත හෝ බිම තබන්න. ලකුණේ තිබෙන වචනය කියවන්න නැතහොත් ළමුන් ලවා කියවන්න. අප උපයන මුදලෙන් දෙන දසයෙන් එක අප ගෙවන දසයෙන් එක කොටස යයි ළමයින්ට කියන්න. මේසය මත හෝ බිම තිබෙන

කාසි දහයෙන් එක කාසියක් දසයෙන් කොටස වේ. දසයෙන් කොටස ලකුණ ඉදිරිපිට එක් කාසියක් තැබීමට ළමයෙකුට කියන්න.

"වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යයි නම් කළ ලකුණට අනතුරුව "දසයෙන් එක කොටස" ලකුණ තබන්න. ලකුනේ වචනය කියවන්න නැතහොත් ළමයින් ලවා කියවන්න.

- ඔබ උපයා ගත් මුදල මෙය නම්, දසයෙන් කොටස ගෙව්වාට පසු වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට කොපමණ කාසි ඔබට ඉතිරි වී ඇත්ද?

පංතිය ඒවා ගණන් කරන විට, "වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන ලකුණ ඉදිරි පිට, වරකට එකක් බැගින් කාසි නවය තැබීමට ළමයෙකුට සලස්වන්න.

"වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන ලකුණු ඉදිරි පිට ඇති කාසි පෙන්වා, අප උපයන මුදලෙන් සුළු කොටසක් දසයෙන් එක වශයෙන් ගෙවන බව පහදා දෙන්න.

අප උපයන සෑම මුදලකින්ම දසයෙන් එක කොටස අප ගෙවිය යුතු බව පහදා දෙන්න. ඔවුන් උපයන මුදලෙන් දසයෙන් එක කොටස ගෙවීමේ අදහස වැඩි දුරට ළමයින්ට අවබෝධ කර ගැනීම පිණිස උපකාර කිරීමට වෙනස් ක්‍රමයේ කාසි හෝ නෝට්ටු ඔබට භාවිතා කිරීමට අවශ්‍ය වෙනවා ඇත.

**අපි දසයෙන් කොටස ගෙවීමෙන් හරි දෙය කිරීමට තෝරා ගනිමු.**

කථාන්තර

මුදල් පෙට්ටියේ "වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන පැත්තට කාසි නවය තබා ඔහුගේ දසයෙන් කොටස ගෙවීමට මාර්ක් ගත් තීරණය ගැන කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න. ඔබ කථාන්තරය කියන විට කාසිය යන වචනය වෙනුවට ඔබ ගෙනා කාසියේ නම කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

පසුගිය වතාවේ මාර්ක් වෙළඳ සැලට ගිය විට ඔහුට මිලදී ගැනීමට අවශ්‍ය සෙල්ලම් බඩුව ඔහු දුටුවේය. මාර්ක් තම මවට වැඩකර දීමෙන්, සෙල්ලම් බඩුව ගැනීමට මුදල් ඉතිරි කර ගත්තේය. කාසි නවයක් ඔහු උපයා ගත්තේය. සෙල්ලම් බඩුව ගැනීමට තව එකම කාසියක් පමණක් අවශ්‍යව තිබුනේය. මවට වැඩකර දෙනවා නම් ඔහුට මුදල් ගෙවන බව ඈ ඔහුට කීවාය.

මාර්ක් සෙනසුරාදා උදේ අලුයම නැගිට උදේ කෑමෙන් පසු, ඔහුගේ මවට අවශ්‍ය වැඩ කළේය. ඔහු වැඩය අවසන් කළාට පසු, ඔහු කළ වැඩය ගැන ඔහුගේ මව ඉතාම ප්‍රසන්න වන බව ඔහුට කීවාය. දිළිසෙන අලුත් කාසියක් ඈ මාර්ක්ට දුන්නාය. මාර්ක් සතුටින් කළබල විය. මක් නිසාද සෙල්ලම් බඩුව ගැනීමට දැන් ඔහුට ප්‍රමාණවත් මුදල් තිබෙන නිසාය.

මාර්ක් ඔහුගේ මුදල් පෙට්ටිය ගැනීමට දුවගොස්, එය තුලට කාසිය ඔහු දැමුවේය. පෙට්ටියේ "වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන පැත්තට (තවත් කාසියක් තබන්න) පසුව ඔහු සහ ඔහුගේ මව වෙළඳ සැලට ගියහ.

ඔවුන් වෙළඳ සැලට ගිය විට සෙල්ලම් බඩුව මාර්ක් දුටුවේය. එය තවමත් විකිණී නැති නිසා ඔහු සතුටු විය. ඉතා ප්‍රවේසමෙන් ඔහු එය දෙස බැලුවේය. එය සමග සෙල්ලම් කරන තෙක් ඔහුට ඉවසිල්ලක් නැති විය.

සෙල්ලම් බඩුවට මුදල් ගෙවීමට මාර්ක් ගිය විට, එහි මිල කාසි දහයක් වන බව ලිපිකරුවා සිනාසෙමින් කීවේය. මාර්ක් ඔහුගේ මුදල් පෙට්ටියේ පියන විවෘත කොට ඔහුගේ කාසි ගණන් කිරීමට පටන් ගත්තේය. (මුදල් පෙට්ටියේ පියන ඉවත් කොට "වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන පැත්තේ තිබෙන මුදල් ගණන් කරන්න.) ඔහු දහවෙනි කාසිය ගත් විට: කාසි දහයෙන් එකක් දසයෙන් කොටස විය යුතු යැයි ඔහුට මතක් විය.

මාර්ක් කුමක් කළ යුතුදැයි නොදැන සිටියේය. ඇත්ත වශයෙන්ම ඔහුට සෙල්ලම් බඩුව අවශ්‍ය විය. ඔහුට එය ලබා ගැනීමට හැකිය. නමුත් ඔහුගේ දසයෙන් කොටසේ මුදල් ලිපිකරුවාට දුන්නොත් පමණි. මාර්ක් ලිපිකරුවා දෙසත්, සෙල්ලම් බඩුව දෙසත්, පසුව දසයෙන් කොටසේ කාසිය දෙසත් බැලුවේය.

- ඔබ මාර්ක් නම් ඔබ කුමක් කරන්නෙහිද?

මාර්ක් පෙට්ටියේ දසයෙන් කොටස පැත්තට දසයෙන් කොටසේ කාසිය දැම්මේය. (පෙට්ටියේ "දසයෙන් කොටස" පැත්තට කාසියක් දමන්න.) "වියදම් කිරීමට හෝ ඉතිරි කිරීමට" යන පැත්තට කාසි නවය ඔහු ආපසු දමා, සෙල්ලම් බඩුව නැවත රාක්කයට දැමීමට ඇවිද ගියේය.

මාර්ක් ගේ මව කිසිවක් නොකී, නමුත් මාර්ක් වටා ඇයගේ අත් දමා ඔහුව තදින් මිරිකුවාය. (වැළඳ ගත්තාය). මාර්ක් හරි දෙය කළ බව දැන සිටියාය.

පසු දින සභාවේදී, මාර්ක් ගේ දසයෙන් කොටස ලියුම් කවරය සභා නායකයාට ඔහු දුන්නේය. සභා නායකයා මාර්ක්ට අතට අත දී, ඔහු දසයෙන් කොටස ගෙවූ බැවින් ස්වර්ගීය පියාණන් වහන්සේ සතුටු වන බව මාර්ක්ට කීවේය. මාර්ක්ද සතුටු විය. හරි තීරණය ගත් බව ඔහු දැන සිටියේය. (මාර්ෂල් ටී. බර්ටන්ගෙන් උපුටා ගන්නා ලදී. "කුඩා රතු කාර් එක," උපදේශක වරයා, අප්‍රේ. 1966, පිටුව, 158–59.) (PCPR12D6)

සාකච්ඡා

- මාර්ක්ට තිබුනේ කුමණ තීරණයක් ගැනීමටද?
- ඔහුට මෙය අසීරු තීරණයක් වූයේ කුමක් නිසාද?
- ඔහු ගත් තීරණය ගැන මාර්ක්ට හැඟුනේ කෙසේද? කුමක් නිසාද?
- මාර්ක්ගේ තීරණය ගැන තවත් සතුටු වූයේ කවුද?

**දසයෙන් කොටස ගෙවීමෙන් ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ප්‍රේමය දක්වයි.**

සාකච්ඡා

අප දසයෙන් කොටස ගෙවන විට ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපගේ ප්‍රේමය පෙන්වන බව පහදා දෙන්න.

- ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔබට දෙන ලද ආශිර්වාද මොනවාද?

උන්වහන්සේලා අපට දී තිබෙන බොහෝ ආශිර්වාද වලට ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් වහන්සේට ස්තුති කිරීමට කාසි දහයකින් එක කාසියක් දීම කොහෙත්ම ප්‍රමාණවත් නොවන බව පෙන්වා දෙන්න.

ශුද්ධ ලියවිලි කථාන්තර

දුඹුරු පාට කඩදාසියෙන් කැපූ රවුම් ළමයින්ට පෙන්වා, ඒවා කෙතරම් කුඩා රවුම්ද කියා පෙන්වන්න. යේසුස් වහන්සේ පොළොවේ සිටින විට භාවිතා කළ, ඉතා කුඩා කාසියැයි කියන ඒවා ප්‍රමාණයෙන් මෙම රවුම් හා සමාන බව පහදා දෙන්න. එම කුඩා කාසි වල එතරම් වටිනාකමක් නොවීය.

කනවැන්දුම්යගේ දීමනාව පිංතූර 2-55 පෙන්වා, ඉතා කුඩා කාසිය කෙතරම් කුඩා වුවත් එතරම් වටිනාකමක් නැති වුවත්, ස්වර්ගීය පියාණන් වහන්සේට ප්‍රේමය පෙන්වීමට එම ස්ත්‍රිය ඒවා භවිතා කළාය. මාර්ක් 12:41–44 සඳහන් කථාන්තරය කියන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ, දේවමාළිගාවේ තිබෙන උඩ කොටසේ විවරයක් තිබෙන විශාල භාජනයකට දසයෙන් කොටස සහ පිදුම් එකතු කළ බව පහදා දෙන්න. (පිංතූරයේ තිබෙන භාජනය පෙන්වන්න.) ජනතාව ඔවුන් ගේ මුදල් රැගෙන පැමිණ එම භාජනයට දමනවා දිනක් යේසුස් වහන්සේ බලා සිටිය සේක. කනවැන්දුම්ය ඇයගේ මුදල් දමනවා යේසුස් වහන්සේ දැක, උන් වහන්සේගේ ගෝල-යින්ට කථා කළ සේක. කනවැන්දුම්යට බොහෝ මුදල් නොතිබුනත්, තිබූ පමණින් ස්වර්ගීය පියාණන් වහන්සේට දී ප්‍රේමය දැක්වූ බැවින් ඇය ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් කළ බව උන්වහන්සේ ගෝලයින්ට කීසේක.

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

මාර්ක් 12:43 යේසුස් වහන්සේ ගෝලයින්ට කී දෙය ශබ්ද නගා කියවන්න. ධනවත් ජනතාව ගෙවූ ගණනට සමාන කරන විට කනවැන්දුම්ය දුන්නේ ඉතාම සුළු ගණනක් බව පහදා දෙන්න. ඇය ස්වර්ගීය පියාණන් වහන්සේට ප්‍රේම කළ බැවින් ඇයට තිබුන ප්‍රමාණය ඇය දුන් බව යේසුස් වහන්සේ දැන සිටි

සේක. ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපගේ දසයෙන් කොටස ගෙවීමෙන්, එය සුළු ප්‍රමාණයක් වුවත්, අපගේද ප්‍රේමය පෙන්වීමට අපට හැකිය.

මාර්ක් සෙල්ලම් බඩුව ගැනීම වෙනුවට ඔහුගේ දසයෙන් කොටස ගෙවීමට තීරණය කිරීම මගින් ස්වර්ගීය පියාණන් වහන්සේට ඔහු ප්‍රේමය පෙන්වූ අන්දම ළමයින්ට මතක් කරන්න. මාර්ක්ට එය අපහසු විය, නමුත් ඔහු හරි දෙය තෝරා ගත් නිසා ඔහු සතුටු වූයේය.

ගීතය

"දසයෙන් කොටස මගේ සමිඳුට දීමට මට ඕනෑ" යන්න ගායනා කරන්න නැතහොත් වචන කියන්න. ළමයින්ට වචන ඉගෙන ගැනීමට හැකිවන පිණිස ස්වල්ප වතාවක් ගීතය ගයන්න.

දසයෙන් කොටස මගේ සමිඳුට දීමට මට ඕනෑ,<br>
මා එය කරන විට නිතර<br>
මා සිතමි සියලු දීමනා ගැන.<br>
එතුමා මට හා ඔබට දෙන.

අපට දෙයි ජීවය, ලස්සන ලොවද.<br>
මගේ දසය කුඩා වුවද,<br>
ඇදහීම මගේ හා කළගුණද පෙන්වයි<br>
සියල්ලේ සමිඳු, ඔබටයි.

අපගේ දසයෙන් කොටස අප ගෙවන විට, ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට කෙතරම් ප්‍රේමයක් අප පෙන්වනවාද කියා ළමයින්ට මතක් කරන්න.

## අප දසයෙන් කොටස ගෙවන්නේ කෙසේද?

ක්‍රියාකාරකම්

යේසුස් වහන්සේ පොළොවේ සිටින විට, ජනතාව ඔවුන්ගේ දසයෙන් කොටස සහ වෙනත් පිඳුම් මුදල් දේවමාළිගාවේ තිබෙන භාජනයකට දැමූ බව ළමයින්ට මතක් කරන්න. අද අපේ දසයෙන් කොටස සභා නායකයාට (හෝ ශාඛා සභාපතිට) හෝ ඔහුගේ උපදේශක වරයෙකුට ගෙවන බව පහදා දෙන්න.

දසයෙන් කොටස සහ වෙනත් පිඳුම් කොලයක්ද දසයෙන් කොටස බහාලන ලියුම් කවරයක්ද එක් එක් ළමයෙකුට දෙන්න. අප දසයෙන් කොටස ගෙනව විට මෙම ආකෘති පත්‍ර සහ ලියුම් කවර අප භාවිතා කරන බව පහදා දෙන්න. ළමයි උනන්දු නම්, ආකෘති පත්‍රයේ ලැයිස්තු ගත කර තිබෙන වෙනත් ආධාර ගැන කෙටියෙන් විස්තර කරන්න. ආකෘති පත්‍රය සහ මුදල් ලියුම් කවරයෙහි දමා, අපගේ සභා නායකයාට (හෝ ශාඛා සභාපතිට) හෝ ඔහුගේ එක් උපදේශක වරයෙකුට දෙන බව පහදා දෙන්න.

## සාරාංශය

නැවත බැලීම

කාසි දහය නැවත පෙන්වන්න.

- මෙම කාසි දහය ඔබ උපයා ගත්තා නම්, දසයෙන් කොටස වශයෙන් ලියුම් කවරයට ඔබ කීයක් දමන්නෙහිද?

නියම ගණන ගෙන ආකෘති පත්‍රයත් සමග එය ලියුම් කවරයට දැමීමට ළමයෙකුට සලස්වන්න.

- දසයෙන් කොටස දමන ලද ලියුම් කවරයට අපි කුමක් කරන්නෙමුද?

සාක්ෂිය

අපගේ දසයෙන් කොටස ගෙවීමෙන් ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අපගේ ප්‍රේමය පෙන්වන අන්දම ගැන ඔබගේ සාක්ෂිය දරන්න.

ළමයින් උපයන ඕනෑම මුදලකින්, කෙතරම් සුළු ප්‍රමාණයක් වුවත්, දසයෙන් කොටස ගෙවීමට ළමයින්ව දිරි ගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳින් ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිත කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව," අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. දේවමාළිගා හා රැස්වීම් ගෘහ තැනීමට, ධර්ම දූත වැඩ කිරීමට, පාඩම් අච්චුගැසීම යනාදී දේවල් වලට දසයෙන් කොටසේ මුදල් භාවිතා කරන බව ළමයි සමග සාකච්ඡා කරන්න. මෙම දේවල් අපට සහ අන්‍යයන්ට ප්‍රයෝජනවත් වන අන්දම ගැන සාකච්ඡා කරන්න.

   ළමයින්ට කඩදාසි සහ පාට පැන්සල් හෝ පැන්සල් ලබා දී, ඔබ සාකච්ඡා කළ එක දෙයක් ගැන පිංතූරයක් ඇඳීමට එක් එක් ළමයෙකුට සලස්වන්න.

2. "ගෙවීමට දසයෙන් කොටස මම තුටු වෙමි" (ළමා ගී පොත, පි. 150). ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

   ස්වර්ගයේ දෙව් පියා දෙයි ලස්සන සහ හොඳ දේවල් මට:
   දිළිසෙන හිරු, වැටෙන වැස්ස, තණ පිටියේ ගායනාව:

   උපයන මා සියල්ලේ දසයෙන් කොටස දීමට තුටු වෙමි;
   සුලු දෙයකි මා දෙන දෙවිඳු දෙන සියල්ලට.

   අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දෙන වෙනත් පණතකට මෙන්ම, දසයෙන් කොටස ගෙවීමේ නීතියට නිවැරදි ආකල්පයකින් කීකරු වීමේ වැදගත් කම ගැන කථා කරන්න.

3. දසයෙන් කොටස සඳහා පෙට්ටියක්, ටින් එකක්, හෝ ලියුම් කවරයක් වැනි භාජනයක් සැරසීමට එක් එක් ළමයෙකුට සලස්වන්න. භාජනයක් ඔබම ගෙනෙන්න නැතහොත් මෙම පාඩමට පෙර සතිය තුළදී, ඔවුන්ගේම භාජන ගෙනඒමට ළමයින්ට දන්වන්න.

34
වෙනි
පාඩම

# නිතරම සත්‍යය ප්‍රකාශ කරන්න

**අරමුණ**

අපහසු වුවත්, සත්‍යය ප්‍රකාශ කිරීමට එක් එක් ළමයෙකුට ආසාවක් ඇතිවීම පිණිස ශක්තිමත් කිරීමටය.

**සූදානම**

1. මාර්ක් 14:53–65 සහ ඇදහිල්ලේ කරුණු 1:13 යාච්ඤාවෙන් කියවන්න. ශුභාරංචි මූලධර්ම (31110) 31 වෙනි පරිච්ඡේදය බලන්න.
2. “මා හරි දෙය තෝරන බව පෙන්වීමට” යන ගීතය ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. (“ඔබ ප්‍රීති නම්” 158 යන ගීතයේ තාලයට ගායනා කරන්න. ළමා ගී පොත, පි. 266).
3. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. ළමයින්ට කැරකැවීමට හැකි, බීම බෝතලයක් වැනි බෝතලයක්.
   ඇ. (CTR) හදතෝ සටහනක් (පළවෙනි පාඩම බලන්න.)
   ඈ. පිංතූරය 2-56, යේසුස් වහන්සේගේ පරීක්ෂාව.
4. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒඅනුව යන්න.

**සත්‍යය ප්‍රකාශ කිරීමට අපට හැකිය.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

පහත සඳහන් කථාන්තරය ඔබේ වචනයෙන් කියන්න.

දිනක් ඈන්-මාරි ඇයගේ සීයා සමග මාලු බෑමට ගියාය. ඈන්-මාරි විනෝද වූ අතර ඈ මාලුවෙකු ඇල්ලූ විට විශේෂයෙන් සතුටු වූවාය.

ඈන්-මාරි ගෙදර පැමිණි පසු, ඇයගේ මිතුරා වන ඩැනී බැලීමට ගියාය. ඔහු ඇයට ඇතුලට ආරාධනා කර ඇයව කුස්සියට එක්ක ගොස්, ඔහු ඇල්ලූ මාලුවෙකු ඇයට පෙන්වූවේය. ඈන්-මාරි ඇල්ලූ මාලුවාට වඩා ඩැනීගේ මාලුවා ඉතා විශාල විය.

ඈන්-මාරි ඩැනී ගැන සතුටු වූ අතර, ඇයට කලකිරීමේ හැඟීමක් ඇති විය. ඩැනීගේ මාලුවාට සමාන කරන විට ඇයගේ මාලුවා ඉතාම කුඩාය. ඇයගේ අපහසුතාවය ගැන ඩැනීට දැන ගැනීමට ඉඩ නොතැබූ ඇය, තමාගේ සීයා සමග මාලු බෑමට ගොස් විශාල මාලුවෙකු ඇල්ලූ බවද, මාලුවා කෙතරම් විශාලද කීවොත් දැලක උපකාරයෙන් එය ඇද ගැනීමට සීයාට සහ ඇයට ඇදගැනීමට සිදුවූ බව ඈ කීවාය. ඩැනීගේ මාලුවාට වඩා ඇයගේ මාලුවා බොහෝ විශාල බව ඈන්-මාරි ඔහුට කීවාය.

සාකච්ඡා

- ඈන්-මාරි කළ වැරදි දෙය කුමක්ද?
- ඈන්-මාරිට කුමක් කළ යුතුව තිබුනේද?
- සත්‍යය ප්‍රකාශ කිරීමේ තේරුම කුමක්ද?

සත්‍යය ප්‍රකාශ කිරීම අවංක භාවයේ කොටසක් බව පහදා දෙන්න. අප සත්‍යය ප්‍රකාශ කරන විට, සිදු වූ දේවල් සත්‍යය වශයෙන්ම ඒ ආකාරයෙන්ම අපි කියන්නෙමු.

- සත්‍යය ප්‍රකාශ කිරීමේ වැදගත්කම කුමක්ද?

ළමයි සත්‍යය ප්‍රකාශ කිරීමේ අවස්ථාවන් ගැන කීමට ඔවුන්ට කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

ඇදහිල්ලේ කරුණු

ඇදහිල්ලේ කරුණු සභාවේ සාමාජිකයන් විශ්වාස කරන ප්‍රකාශ බව ළමයින්ට මතක් කරන්න. දහතුන්වන කොටසේ කරුණක් මෙසේ කියන බව ළමයින්ට කියන්න. "අවංකකම හා සත්‍යයතාවය කෙරෙහි අපි විශ්වාස කරමු" ස්වල්ප වතාවක් එම වාක්‍ය කණ්ඩය නැවත කීමට ඔවුන්ට සලස්වන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සත්‍යය ප්‍රකාශ කළ සේක.**

ශුද්ධ ලියවිලි කථාන්තර

පිංතූර 2-56 පෙන්වන්න, යේසුස් වහන්සේගේ පරීක්ෂාව. පිංතූරය පාඩමේ ඉතිරි කොටසට ගැනීමට තබන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිතර සත්‍යය ප්‍රකාශ කළ බව කියා මාර්ක් 14:53–65 සඳහන් කථාන්තරය කියන්න.

හේවායන් යේසුස් වහන්සේව යුදෙව් උත්තම පූජකයාගේ නිවසට ගෙන ගිය අතර, යුදෙව් නායකයා උන්වහන්සේගෙන් බොහෝ ප්‍රශ්න ඇසූ බව විස්තර කරන්න. මාර්ක් 14:61 ශබ්ද නගා කියවන්න. "ඔබ ක්‍රිස්තුස් නොවේද?" යන්න ඔවුන් ඇසූ එක් ප්‍රශ්නයක් විය

ස්වර්ගීය පියාණන් වහන්සේගේ විශේෂ පුත්‍රයා වන ක්‍රිස්තුස් යයි එතුමා කීවොත්, ඔවුන් උන්වහන්සේට යන්ට නොදෙන බව යේසුස් වහන්සේ දැන සිටිය බව පහදා දෙන්න. යේසුස් වහන්සේ උත්තම පූජකයාට පිළිතුරු දුන් අන්දම, මාර්ක් 14:62 ශබ්ද නගා කියවන්න; "එසේය, යේසුස් වහන්සේ කී සේක." උන්වහන්සේගේ ජීවිතය අනතුරු දායක තත්වයක තිබියදීත්, යේසුස් වහන්සේ නිතර සත්‍යය ප්‍රකාශ කළ බව පෙන්වා දෙන්න.

කිරීමට කොපමණ අපහසු වූ වත්, අප නිතරම සත්‍යය ප්‍රකාශ කිරීම යේසුස් වහන්සේට අවශ්‍ය බව පහදා දෙන්න.

(CTR) හදෙතෝ සටහන

(CTR) හදෙතො සටහන පෙන්වා එහි ඇති වචන ළමයින්ට නැවත කීමට සලස්වන්න. පසුව මෙය ඔබ සමග නැවත කීමට සලස්වන්න. "මම යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමණය කරමින් සත්‍යය ප්‍රකාශ කරමි."

ගීතය

"මා හරි දෙය තෝරන බව පෙන්වීමට" ගායනා කිරීමට හෝ වචන කීමට ළමයින්ට උපකාර කරන්න.

මා හරි දෙය තෝරන බව පෙන්වීමට, සත්‍යය කියමි.
මා හරි දෙය තෝරන බව පෙන්වීමට, සත්‍යය කයමි.
ගැලවුම් කරුගේ මග දනිමි මම,
මා කියන දෙය එය පෙන්වයි.
මා හරි දෙය තෝරන බව පෙන්වීමට, සත්‍යය කියමි.
ළමයින්ට එය ඉගෙන ගැනීමට උපකාරවන පිණිස කීප වතාවක් එය ගායනා කරන්න නැත්නම් වචන කියන්න.

**එය අපහසු වූවත් සත්‍යය කීමට අපට හැකිය.**

සාකච්ඡා

සත්‍යය නිතර ප්‍රකාශ කිරීමට පහසු නැති බව පෙන්වා දෙන්න. සමහර විට සත්‍යය නොවන දෙයක් කීමට හෝ කිසිම දෙයක් නොකියාම සිටීම වඩා පහසුය.

- සමහර විට සත්‍යය කීමට අපහසු මන්ද? (යමෙකු තරහ කිරීමට අපට අවශ්‍ය නොමැති නිසා හෝ අපට දඬුවම් ලැබීමට හැකි වන නිසා, යනාදිය පිළිතුරු වලට ඇතුලත් වනවා ඇත.)

කථාන්තර

සත්‍යය ප්‍රකාශ නොකිරීමෙන් කණගාටුවට පත් වූ ළමයෙක් ගැන කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාන්තරය කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

ජෝඇන් විසින් අත්වැරැද්දෙන් ඇයගේ මවගේ මැසීමට භාවිතා කරන කතුර කැඩුනේය. කවුරුන් අතින් එය කැඩුනාද යන්න මවට දැනගැනීමට නොහැකි තව පරිදි, ඈ එය ලාච්චුවක් තුල සැඟෙව්වාය. ජෝඇන් ගේ මව කතුර සොයමින්, කවුරු හරි එය දැක්කාද කියා ඇසුවාය. ජෝඇන් කතුර නොදුටු බව ඇයගේ මවට කීවාය.

ජෝඇන් එය කීවාට පසු ඇයට අපහසු තාවයක් දැනුනි. ඇය නොකළ යුතු දෙයක් වූ කතුර සමග සෙල්ලම් කිරීමෙන් ඇය වැරැද්දක් කළ අතර, දැන් බොරුවක් කීමෙන් දෙවෙනි වැරැද්දක්ද කළ බව ඇයට දැනුනාය. ජෝඇන්ට අපහසු තාවයක්ද දැනුනාය.

ජෝඇන් පවුල් යාච්ඤාවට පැමිණි විට, ඇය විගස ඇස් වසා ගත්තාය. ඇයගේ මව දෙස බැලීමට ඇයට උවමනා නොවූවාය. ජෝඇන්ගේ පියා යාච්ඤාව කියන විට, ඔහු මෙසේ කියනවා ජෝඇන්ට ඇසුනි. "සිතේ සාමය හා සදාකාල ප්‍රීතිය අපට ලැබීම පිණිස, හරි දෙය කිරීමට අපට ධෛර්‍යය දුන මැනව". නැවත ප්‍රීතිය ලබා ගැනීමට, කතුර සම්බන්දව ඇයගේ මවට සත්‍යය ප්‍රකාශ කිරීම අවශ්‍ය බව ජෝඇන් දැන ගත්තාය.

ජෝඇන් කැඩුන කතුර ගෙනැවිත් මවට දී ඇයගේ මවට සත්‍යය ප්‍රකාශ කළාය. ඇය කතුර කැඩූ නිසාද බොරුවක් කී නිසාද කණගාටු වූ, අතර හරි දෙය කීමට ඇයට අවශ්‍ය විය. (මාජරී කැනන් ගෙන් උපුටා ගන්නා ලදී, "පාඩුවක් සහ වැරැද්දක්," ළමයින්ගේ මිතුරා, මාර්, 1962 පි. 14)

සාකච්ඡා

- ජෝඇන් ගේ මව පළමු වරට ඇයගෙන් කතුර ගැන ඇසූ විට ඇය ඇයගේ මවට සත්‍යය ප්‍රකාශ කළාද?
- ඇය සත්‍යය ප්‍රකාශ නොකළ නිසා ජෝඇන්ට හැඟුනේ කුමක්ද?
- ඇය ඇයගේ මවට සත්‍යය ප්‍රකාශ කළ විට ජෝඇන්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?
- ජෝඇන්ට සත්‍යය ප්‍රකාශ කිරීමට පහසු වූවාද?

කතුර කැඩුව නිසා ඇයට දඬුවම් කරනවාට ඇය භය වූ බැවින් සත්‍යය කීමට කොපමණ අපහසු වූවත් සත්‍යය ඈ කී විට ජෝඇන් වඩාත් සතුටට පත්වූ බව පහදා දෙන්න.

ක්‍රීඩා

"සත්‍යය කියන්න" යන ක්‍රීඩාව ළමයි සමග සෙල්ලම් කරන්න. ළමයින්ට රවුමට වාඩි වීමට සලස්වා, රවුම මැද බෝතලය බිම තබන්න. ඔබ බෝතලය කරකවන බවද, බෝතලය යොමුවන ළමයාට සත්‍යය ප්‍රකාශ කිරීම ගැන ප්‍රශ්නයට පිළිතුරු දීමට අවස්ථාවක් සැලසෙන බව පහදා දෙන්න. ළමයා පිළිතුරු දුන්නාට පසු, ඊලඟ පුද්ගලයා තේරීමට ඔහු බෝතලය කරකවන්නේය. (ප්‍රශ්නයට පිළිතුරු දුන් ළමයෙකුටම බෝතලය යොමු වුව හොත් නැවත එය කැරකැවීමට ළමයාට සලස්වන්න.)

පහත සඳහන් සිද්ධීන් හා ප්‍රශ්න හෝ ඔබගේ පංතියේ වඩා සුදුසු තවත් සිද්ධීන් නිර්මාණය කරන්න. (ඔබගේ පංතිය විශාල නම්, තවත් වඩා සිද්ධීන් එකතු කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත):

1. ඔබ නිවසෙහි ක්‍රීඩා කරන විට අත්වැරැද්දෙන් පහණක් කැඩෙයි.
    - ඔබ කුමක් කළ යුතුද?
2. වෙළඳසැලට ගොස් ඔබගේ පියාට මිලදී ගැනීමට අවශ්‍ය යමක් රැගෙන වහාම ඒමට ඔහු කියයි. මග නැවතී ක්‍රීඩා නොකිරීමට ඔහු ඔබට කියයි. අසල් වැසියාගේ නිවස ඔබ පසුකරන විට තැපැල් කිරීමට ලි පි සමහරක් ඇය ඔබට දෙයි. වෙළඳසැලේ සිට ආපසු නිවසට පැමිණෙන විට, මිතුරෙකුගේ අලුත් බයිසිකලය බැලීමට ඔබ නවතියි. ඔබගේ පියා බලා සිටින බව එකිනෙහිම ඔබට මතක් වී ඔබ ඉක්මණට ගෙදර පැමිණෙයි. ඔබගේ පියා කලබල වී සිටින බැවින්, අසල් වැසියාගේ ලිපි සමහරක් තැපැල් කිරීමට ගිය නිසා ඔබ ප්‍රමාද වූ බව ඔහුට කීමට ඔබට අවශ්‍ය වෙයි.

- ඔබ කුමක් කිව යුතුද?

3. අතිරස පිඟානක් මේසය උඩ තිබෙනවා ඔබ දකියි. ඒවා රස නිසා එකක් ඔබට ගෙන, එකක් ඔබගේ කුඩා සහෝදරයාට දෙයි. මව ඇයගේ මිතුරියට අතිරස ගෙන යෑමට පැමිණි විට, අතිරස කමින් සිටි ඔබගේ සහෝදරයා දැක ඔහුට බනින්ට ඇය පටන් ගනී.

- ඔබ කුමක් කළ යුතුද?

4. ඔබගේ කුඩා සහෝදරියගේ සෙල්ලම් බඩුවක් ඇයගෙන් ඔබ ගත් විට, ඇය අඬන්ට පටන් ගනී. ඔබගේ ආච්චි එනවා ඔබට ඇසුන විගස, ඔබ සෙල්ලම් බඩුව ඉක්මණට ආපසු දුන් නමුත් ඔබගේ කුඩා සහෝදරිය ඇඬීම නොනවත්වයි. ඔබගේ කුඩා සහෝදරිය අඬන්නේ කුමක් හෙයින්ද කියා ඔබගේ ආච්චි අසයි.

- ඔබ කුමක් කිව යුතුද?

5. ඔබ සහ ඔබගේ මිතුරන් අසල්වැසියෙකුගේ නිවස ඉදිරි පිට බෝල ගසති. බෝලයට පයින් ගැසූ විට අසල්වැසියාගේ දොර අසල තිබූ මල් පෝච්චියක් කැඩෙයි.

- ඔබ කුමක් කළ යුතුද?

**සාරාංශය**

සාක්ෂිය

කොතරම් අපහසු වූවත්, සත්‍යවාදී වීමේ වැදගත් කම ගැන ඔබගේ සාක්ෂිය දරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිතරම සත්‍යය ප්‍රකාශ කළ අතර අපද නිතර සත්‍යය ප්‍රකාශ කිරීම උන්වහන්සේට අවශ්‍ය බව ළමයින්ට මතක් කරන්න. එක් වතාවක්, ඔබට කිරීමට කොතරම් අපහසු වූවත් සත්‍යය ප්‍රකාශ කළ නිසා ඔබ සතුටට පත්වූ බව කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

ළමයින් හරි දෙයම තෝරා ගැනීමට නිතර උත්සහ දැරිය යුතු බව ඔවුන්ට මතක් කරන්න. ඔවුන් හරි දෙය කරන විට, ඔව්හු හරි දෙය තෝරා ගන්නෝය.

අද ප්‍රාථමිකයේ ඉගෙන ගත් දේවල් ගැන ඔවුන්ගේ පවුල් වලට කීමට ළමයින්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. එය කොතරම් අපහසු වූවත්, එක් එක් පංති සාමාජිකයෙකුටම සත්‍යය ප්‍රකාශ කිරීමට උපකාර කරන පිණිස ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් ඉල්ලීමට ළමයාට යෝජනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව,” අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. “හරි දෙය කරන්න නොබියව” (ළමා ගී පොත, පි. 158), “හරි මග තෝරා ගන්න” (ළමා ගී පොත, පි. 160), නැතහොත් “අවංක වීම මම විශ්වාස කරමි” (ළමා ගී පොත, පි. 149), ගායනා කරන්න නැතහොත් වචන කියන්න. “හරි දෙය කරන්න නොබියව” සහ “හරි මග තෝරා ගන්න” යනාදියේ වචන අත් පොතේ පිටු පස අඩංගු වී ඇත.

   අවංක වීම මම විශ්වාස කරමි

   අවංක වීම මම විශ්වාස කරමි;<br>
   සත්‍යය තාවය මම විශ්වාස කරමි,<br>
   මගෙන්ය අවංක කම පටන් ගත යුතු<br>
   මා කියන සියල්ලෙහි, මා කරන සියල්ලෙහි.

තරුණ කල මම සදම් හොඳ සිරිත්,
තැබීමට මගෙ වචන, සත්‍යය කීමට,
හරි දෙයට කථා කිරීම
ගරු බුහුමන් නමට ගන්න.

අවංක වීම මම විශ්වාස කරමි;
සත්‍ය භාවය මම විශ්වාස කරමි,
මගෙන්ය අවංක කම පටන් ගත යුතු
මා කියන සියල්ලෙහි, මා කරන සියල්ලෙහි.

2. ළමයෙකුට ඉදිරියට පැමිණ අත් දෙකම ඔසවන්ට කියන්න. නූල් පොටක් හෝ කැටි නූල් පොටක් ළමයාගේ මැණික් කටුව වටේ බුරුලෙන් බැඳ ප්‍රවේශමෙන් අල්ලා ගන්න. නූල් පොට හෝ කැටි නූල් පොට කුඩා බොරුවකට සමාන බව පහදා දෙන්න. එය කඩා නිදහස් වීමට ළමයාට කියන්න. (ළමයාට කඩා නිදහස් විය හැකි අන්දමට නූල හෝ කැටි නූල බුරුලෙන් අල්ලා ගන්න).

   ඉන් පසු ළමයාගේ මැණික් කටුව දොළෙස් වතාවක් පමණ බඳිමින්, අපගේ බොරු වැසීමට උත්සහ දරන විට, එක බොරුවක් බොරු ගණනාවකට මග පෙන්වන බව පහදා දෙන්න. අප බොරු කියන විට, මිනිසුන් අප බොරු කියනා බව සොයා ගන්නා බැවින් එය වැලැක් වීමට, බොහෝ විට අපට වැඩියෙන් බොරු ගණනාවක් කීමට සිදුවෙනවා ඇත. අප බොරු ගණනාවක් කී විට, එයින් නිදහස් වීම වඩාත් අපහසු වේ. කඩා නිදහස් වීමට දැන් ළමයාට කියන්න. ළමයා සාර්ථක වූව හොත්, වඩා වැඩියෙන් නූල් හෝ කැටි නූල් කට්ටු යොදා උත්සහ කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. අප වැඩි වැඩියෙන් බොරු කියන විට, හරි දෙය තෝරා ගැනීමට සහ සත්‍යය ප්‍රකාශ කිරීමට වඩාත් අපහසු වන බව පහදා දෙන්න.


   - මෙම බොරු වලින් කැඩී නිදහස් වීමට ඔබට හැකි වන්නේ කෙසේද?


   ළමයාගේ නූල් කපා නිදහස් කිරීමට කතුරක් භාවිතා කරන්න. බොරුවෙන් නිදහස් වීමට, නිතරම අපි සත්‍යය ප්‍රකාශ කළ යුත්තෙමු. අප දැනටමත් බොරුවක් කියා ඇත් නම්, අප බොරු කී පුද්ගලයාට සත්‍යය ප්‍රකාශ කරමින් අපි පසුතැවිලි විය යුත්තෙමු. අප සත්‍යය ප්‍රකාශ කළ විට, අපට සතුටු වීමට හැකිය.

3. පාඩමේ අවසානයෙහි සඳහන් "රහස් පණිවුඩය" යන්නෙහි පිටපත් එක් එක් ළමයෙකු සඳහා සූදානම් කරන්න. එම පණිවුඩයේ පිටපතක් සහ පැන්සලක් එක් එක් ළමයෙකුට දෙන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ එක් ඉගැන්වීමක් රහස් පණිවුඩයෙහි තිබෙන බව පහදා දෙන්න. එක් එක් ලකුණකට ගැලපෙන අකුර ලකුණ යට ඇති කොටුවෙහි ලිවීමෙන්, රහස් පණිවුඩය ඔවුන්ට සොයා ගත හැකිබව ළමයින්ට කියන්න. නිදර්ශනයක් වශයෙන් එක් අකුරක් ලියා, අවශ්‍ය අන්මට ළමයින්ට උපකාර කරන්න.

   රහස් පණිවුඩය ඔවුන් දැනගත් ඔවුන්ගේ අත් බැඳගෙන සිනාසීමට ළමයින්ට කියන්න. ළමයි සියලු දෙනාම පණිවුඩය සොයා ගත් පසු, රහස් පණිවුඩයේ වචන ඔබත් සමග කියවීමට සලස්වන්න: "සත්‍යය ප්‍රකාශ කරන්න."

4. පාඩමෙහි භාවිතා කරන "සත්‍යය ප්‍රකාශ කිරීම" යන්නෙහි ක්‍රීඩා අවස්ථාවන් සමහරක් එක් එක් අවස්ථාවකදීම හරි දේ තේරීම පෙන්වා දෙමින් රඟ දැක්වීමට ළමයින්ට සලස්වන්න.


්‍ය
ශ
කි
ක
ය
රී
ම
ප්‍ර
ත
ා
ස


්‍ය
ශ
කි
ක
ය
රී
ම
ප්‍ර
ත
ා
ස

# 35 වෙනි පාඩම

# මට හැකියාවන් ඇත

**අරමුණ**

අප එක් එක්කෙනාට ස්වර්ගීය පියාණන් වහන්සේ හැකියාවන් දී තිබෙන බව එක් එක් ළමයාට අවබෝධ කර ගැනීම පිණිස උපකාර වීමටය

**සූදානම**

1. මතෙව් 25:14–29, යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ශුභාරංචි මූලධර්ම (31110) 34 වෙනි පරිච්ඡේදයද බලන්න.
2. සතිය තුලදී එක් එක් ළමයෙකුගේ දෙමව්පියන් හමුවී ඔවුන් ගේ ළමයා තුල ඔවුන් දැක ඇති හැකියාවන් මොනවාද කියා අසා දැනගන්න. අවශ්‍ය නම්, අඩුවෙන් පෙනෙන්ට තිබෙන හැකියාවන් එනම්, කරුණාවන්තකම, ප්‍රසන්න භාවය, කීකරුකම, උපකාර කිරීම, මිත්‍රභාවය, හෝ යාච්ඤාවන්ත වීම වැනි දේ යෝජනා කරන්න. එක් එක් ළමයාගේ හැකියාවන් ඇතුලු ලැයිස්තුවක් සාදන්න. එක් එක් ළමයෙකුගේ ඔබ දුටු හැකියාවන් ලැයිස්තුවට එකතු කරන්න.
3. ඔබගේ ලැයිස්තුව භාවිතා කරමින් එක් එක් ළමයෙකු සඳහා පහත සඳහන් ආකාරයට කඩදාසියක් සූදානම් කරන්න. කඩදාසි කැල්ලක ළමයාගේ නම ලියන්න. කඩදාසිය දෙකට නමන්න. පාඩමේදී ඔබ සාකච්ඡා කිරීමට යන ළමයගෙ හැකියාවන් එහි එක කොටසක ලැයිස්තුගත කරන්න. කඩදාසියේ අනිත් කොටස හිස්ව තබන්න.

   ලැයිස්තු ගත කළ හැකියාවන් ගණනම එක් එක් ළමයෙකුගේ කඩදාසියේ තිබේද යන්න සහතික කර ගන්නා අතර, පෙන්වා දීමට හැකි එනම් ගායනය, ලනු පැනීම හෝ කියවීම වැනි එක් හැකියාවක් වත් එක් එක් ළමයෙකුගේ ලැයිස්තුවට අඩංගුද කියා බලන්න.
4. ඔබගේ හැකියාවක් පෙන්වීමට සූදානම් වෙන්න. නැතහොත් ඔබගේ හැකියාවන් පෙන්නුම් කරන ද්‍රව්‍යයක් ගෙන එන්න.

| | |
|---|---|
| (ළමයාගේ නම)<br>මගේ හැකියාවන් ගැන මගෙන් අසන්න.<br><br>1.<br><br>2.<br><br>3.<br><br>4.<br><br>5. | |

5. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. පාට පැන්සල් හෝ පැන්සල්.
   ඇ. 2-57 පිංතූරය, හෙබර්. ජේ. ග්‍රාන්ට්.

6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**හැකියාවන් ස්වර්ගීය පියාණන් වහන්සේ දුන් දීමනාවන්ය.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ඔබගේ එක් හැකියාවක් පෙන්වන්න, නැතහොත් ඔබ ගෙනා ද්‍රව්‍ය පෙන්වා, ඔබගේ එක් හැකියාවක් එය පෙන්නුම් කරන බව පහදා දෙන්න.

- හැකියාවක් යනු කුමක්ද?

ඔබ ද්‍රව්‍යයක් ගෙන ආවානම්, එම ද්‍රව්‍ය ගැන කියා, එය පෙන්නුම් කරන හැකියාව ඔබට වැදගත් වන්නේ කුමක් හෙයින්ද යන්න පහදා දෙන්න. ඔබ හැකියාවක් පෙන්නුම් කරනවා නම් එම හැකියාව භාවිතා කිරීමෙන් ඔබ සතුටු වන්නේ කුමක් හෙයින්ද යන්න පහදා දෙන්න.

ස්වර්ගීය පියාණන් වහන්සේ, උන්වහන්සේගේ එක් එක් දරුවෙකුටම හැකියාවන් දී තිබෙන බව පැහැදිළි කරන්න. ඔබගේ කොට්ඨාසයේ හෝ ශාඛාවේ ළමයි දැක පුරුදු, ගායනා කිරීමට, සංගීත භාන්ඩයක් වාදනය කිරීමට හෝ අන්‍යයන් සතුටු කිරීමට හැකියාවන් ඇති පුද්ගලයින් සමහර දෙනෙකු සඳහන් කරන්න.

ඔවුන් එක් එක්කෙනා ස්වර්ගීය පියාණන් වහන්සේගේ ළමයෙකු වන අතර, ඔවුන් එක් එක්කෙනාට හැකියාවන්ද තිබෙන බව පහදා දෙන්න. එක් එක්කෙනාට වෙනස් වූ හැකියාවන් තිබෙන බව පහදා දෙන්න.

**අප එක් එක් කෙනාට වෙනස් වූ බොහෝ හැකියාවන් තිබේ.**

කථාන්තර සහ සාකච්ඡා

එක් ළමයෙකු ඇයට තිබූ හැකියාවන් සොයා ගත් අන්දම ගැන පහත සඳහන් කථාන්තරය, ඔබගේ වචන වලින් කියන්න.

ඔවුන්ගේ නිවස පිටුපස තිබෙන කඳු වැටියේ ඇයගේ සහෝදරිය වන ෂෙලි අඳිනවා වෙන්ඩි බලා සිටියාය. ෂෙලීට මෙන් වෙන්ඩිට ඇඳීමට නොහැකි නිසා ඇය අධෛර්‍යයට පත් වූවාය. ෂෙලී පියානෝව වාදනය කළ අතර, පාසලේදීද ඇය දක්ෂය. ෂෙලීට හොඳට කිරීමට හැකි සියලුම දේවල් ගැන වෙන්ඩි සිතුවාය. ඇයටද එම දේවල් හොඳට කිරීමට නොහැකි වීම ගැන ඇය පුදුම වූවාය.

- ෂෙලීගේ සියලුම හැකියාවන් ගැන වෙන්ඩි සිතන විට ඇයට කුමක් සිතුනේද කියා ඔබ සිතන්නෙහිද?

ප්‍රාථමිකයේදී කථාවක් පැවැත්වීමට වෙන්ඩිගේ ගුරුවරිය දිනක් ඇයට කීවාය. බොහෝ මහන්සි වී සූදානම්ව හොඳ කථාවක් ඈ පැවැත්වූවාය. වෙන්ඩිගේ කථාව සභා නායකතුමාට ඇසී, ඇයගේ කථාව අසා ඔහු බොහෝ සතුටු වූ බව ඇයට කීවේය. ඇය ඉතාම දක්ෂ බව ඔහු වෙන්ඩිට කීවේය.

වෙන්ඩිට උණුසුම්භාවයේ හැඟීමක් ඇති විය. ඇය තුළ වැදගත් යම් දෙයක් සොයා ගැනීමට සභා නායකයාගේ වචන වෙන්ඩිට උපකාර විය.

- සභා නායක තුමා උපකාර කළේ වෙන්ඩිට කුමක් සොයා ගැනීමටද? (හොඳ කථාවන් පැවැත්වීමට ඇයට හැකියාවක් ඇති බව)

වෙන්ඩිට වෙනත් හැකියාවන් තිබෙන බව ඈ වහාම සොයා ගත්තාය. පහසු වෙන් මිතුරන් සාදා ගැනීමට හැකි වූ අතර අනිත් ළමයින්ට නිතර ඇය සමග සිටීමට අවශ්‍ය විය. කියවීමට සහ ලිවීමට ඇය ප්‍රිය කළාය. සභාවට ගිය විට ඈ ගෞරවනීය සිටිමින් ගුරුවරියට සවන් දුන්නාය. ඒවා ෂෙලීගේ

හැකියාවන් මෙන් නොවන නිසා මේවා හැකියාවන් යයි වෙන්ඩි කිසි දිනක නොසිතුවාය. දැන් හැකියාවන් තිබෙන බවද ඒවා ඇගේ සහෝදරියගේ හැකියාවන්ට වඩා වෙනස් බවද වෙන්ඩි අවබෝධ කර ගත්තාය.

- වෙන්ඩිට තිබුන හැකියාවන් මොනවාද?

සෑම කෙනෙකුටම වෙනස් අන්දමේ හැකියාවන් තිබෙන නමුත්, සියලුම හැකියාවන් වැදගත් බව විශේෂ යෙන් පැහැදිලි කරන්න.

ක්‍රියාකාරකම්

ඔබගේ ප්‍රාථමික පංතියේ පුද්ගලයින් ගේ එක එක වෙනස් වූ බොහෝ හැකියාවන් ගැන අද ඔවුන් ඉගෙන ගැනීමට යන බව ළමයින්ට කියන්න. හැකියාවන් පිළිබඳ එක් එක් ලැයිස්තුවක් ඔබ කියවන විට සැළකිල්ලෙන් සවන්දීමට ළමයින්ට කියන්න. ඔබ විස්තර කරන්නේ කවුද කියා ඔවුන් දැන ගත් විට, ඔවුන් ඔවුන්ගේ අත් එසවිය යුතු බවත්, ශබ්ද නගා කිසිවක් නොකිය යුතු බවත් ළමයින්ට කියන්න.

"මෙම හැකියාවන් ඇති යම් කෙනෙකු ගැන මම සිතමි," යන්නෙන් පටන් ගෙන, එක් එක් ළමයෙකු සඳහා ඔබ සූදානම් කළ හැකියාවන් අඩංගු ලැයිස්තුව කියවන්න.

එක් එක් ලැයිස්තුවක් ඔබ කියවා අවසාන වූවාට පසු, ඔබ මේ දැන් විස්තර කළේ කොයි ළමයාද කියා අනුමාන වශයෙන් සිතීමට ළමයින්ට සලස්වන්න. ළමයින්ට හරි විදියට අනුමානව සිතීමට නොහැකි නම්, පැහැදිලි හෝඩුවාවක් (සංඥාවක්) දෙන්න, එනම් ළමයා ඇඳ සිටින ඇඳුම විස්තර කිරීම, නැතහොත් ළමයා ගැහැණු ළමයෙක්ද පිරිමි ළමයෙක්ද කීම වැනි දේවල්ය.

හැකියාවන් ප්‍රදර්ශනය කිරීම

මෙම හැකියාවන් ස්වර්ගීය පියාණන් වහන්සේ ඔවුන්ට දී තිබෙන බව පහදා දෙන්න. ඔහුගේ හෝ ඇයගේ ලැයිස්තුවෙන් හැකියාවක් ප්‍රදර්ශනය කිරීමට එක් එක් ළමයෙකුට ආරාධනා කරන්න. (පංතියේ දී පහසුවෙන් ප්‍රදර්ශනය කළ හැකි එක් එක් ළමයෙකුගේ හැකියාවක් කලින් තීරණය කරන්න, එනම් ප්‍රිය කරන ගීතයක් ගැයීම, කියවීම, ලනු පැනීම හෝ තනි අණ්ඩෙන් පැනීම වැනි දේවල්ය.)

**අපගේ හැකියාවන් පාවිච්චි කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ඉගැන්වූ සේක.**

ශුද්ධ ලියවිලි කථාන්තර

අපගේ හැකියාවන් පාවිච්චි කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ඉගැන්වූ බව ළමයින්ට කියන්න. මතෙව් 25:14–29 සඳහන් කථාන්තරය කෙටියෙන් කියන්න. පොළොවේ මෙම ජීවිතයෙන් පසු උන්වහන්සේ සහ ස්වර්ගීය පියාණන් වහන්සේ සමග නැවත ජීවත් වීමට ඔවුන් කළ යුතු දේවල් අවබෝධ කර ගැනීමට උපකාර වන පිණිස මෙම කථාන්තරය, යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට කීබව පහදා දෙන්න.

ඔබ කථාන්තරය කියවන විට පහත සඳහන් කරුණු ගැන විශේෂ යෙන් පැහැදිලි කරන්න:

1. යේසුස් වහන්සේ ගේ කාළයේ දී හැකියාවන් (තලෙන්ත) යනු මුදල් කොටස්ය.
2. තලෙන්ත පහක් ලැබූ තැනැත්තේ එවලේම ගොස් එයින් වෙළදාම් කොට තවත් තලෙන්ත පහක් ඉපද වූයේය.
3. තලෙන්ත දෙකක් ලැබූ තැනැත්තේද එවලේම ගොස් තවත් තලෙන්ත දෙකක් උපදවා ගත්තේය.
4. තලෙන්ත එකක් ලැබූ තැනැත්තේ එය සඟවා තැබූ නමුත් පාවිච්චි නොකළේය.
5. දාසයන්ගේ ස්වාමියා ආපසු පැමිණ, ඔවුන්ගේ තලෙන්ත වලින් කුමක් කළා දැයි දාසයන්ගෙන් ඇසුවේය.

මතෙව් 25:21 තලෙන්ත පහ දුන් තවත් තලෙන්ත පහක් උපයා ගත් දාසයාට ස්වාමියා කීදෙය ශබ්ද නගා කියවන්න.

තලෙන්ත දෙකක් දුන් තවත් තලෙන්ත දෙකක් උපයා ගත් දාසයාට ස්වාමියා එසේම කී බව පහදා දෙන්න. තමන්ගේ තලෙන්ත ඥානවන්තව පාවිච්චි කළ මෙම දාසයන් දෙදෙනා කෙරෙහි ස්වාමියා ප්‍රසන්න විය.

තුන්වෙනි දාසයා ඔහුගේ තලෙන්ත පාවිච්චි නොකළ බැවින්, එය ඔහුගෙන් ආපසු ගන්නා අතර කිසි-වක් ඔහුට තබා ගැනීමට නොදෙන බවට ස්වාමියා කී බව පහදා දෙන්න. (මතෙව් 25:26–29 බලන්න)

ගුරුවරයා ගේ ඉදිරිපත් කිරීම

උපමාවේ පළවෙනි දාසයන් දෙදෙනා මෙන් අප විය යුතු බව අවබෝධ කර ගැනීමට ළමයින්ට උපකාර කරන්න. මුදල් වලට වඩා අපට කළ හැකි දේවල් වලට තලෙන්ත යන වචනය අපි භාවිතා කළත්, අප අපගේ තලෙන්ත (හැකියාවන්) ඥානවන්තව භාවිතා කළ යුතුය.

ස්වර්ගීය පියාණන් වහන්සේ ගේ ආත්මික දරුවන් වශයෙන් මෙම පොළොවේ දී භාවිතා කිරීම හා වැඩිදියුණු කිරීමට අප එක් එක්කෙනාට විශේෂිත වූ තලෙන්ත ලැබී ඇති බව පහදා දෙන්න. අප අපගේ හැකියාවන් භාවිතා කරන විට, අපි අපවද අන්‍යායන්ද සතුටු කරන්නෙමු. අප අපගේ හැකියා-වන් සඟවා සමහර විට ඒවා අහිමි වීම, කථාන්තරයේ ස්වාමියා මෙන්ම, ස්වර්ගීය පියාණන් වහන්සේ-ටද අවශ්‍ය නොවන්නේය. අපේ හැකියාවන් වැඩි දියුණු වීමට ඒවා අප භාවිතා කිරීම උන්වහන්සේට අවශ්‍ය වේ. ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමග නැවත ජීවත් වීමට එවිට අපට සූදානම් විය හැකිය.

## පුහුණු වීම මගින් අපගේ හැකියාවන් අපි වැඩි දියුණු කරගන්නෙමු.

කථාන්තර සහ සාකච්ඡා

හීබර් ජේ. ග්‍රාන්ට් ගේ 2-57 පිංතූරය පෙන්වන්න. පසු කළකදී, ආනාශතවක්තෘද සභාවේ සභාපති වූද හීබර් ජේ. ග්‍රාන්ට්, ඔහුගේ හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට ඔහු කළ දෙයක් ගැන කථාන්තරයක් ඔබ කියන බව පහදා දෙන්න:

හීබර් ජේ. ග්‍රාන්ට් කුඩා පිරිමි ළමයෙකුව සිටියදී, ඔහුට බෝල ගැසීමට අවශ්‍ය විය. නමුත් බෝලය ඈතට විසි කිරීමට ඔහුට නොහැකි විය. ඔහු බෝලය විසි කිරීමට උත්සහ ගන්නා විට, අනිත් පිරිමි ළමුන් ඔහුට විහිළු කළහ.

ශූරතා කණ්ඩායමක ක්‍රීඩා කිරීමට ඔහුව තෝරා ගැනීමට හැකිවන අන්දමට, බෝල ගැසීම ඉතාම හොඳට ඉගෙන ගැනීමට හීබර් තීරණය කළේය. ධාන්‍යාගාරයක පැත්තකට බෝලය විසි කරමින් දිනපතාම ඔහු පුහුණු වූයේය. සමහර විට රෑට ඔහුට නිදා ගැනීමට නොහැකි වෙන තරම් ඔහුගේ අත රිදුනේය. නමුත් ඔහු පුහුණු වීම කරගෙන ගියේය. අවුරුදු කිහිපයකට පසු, ශූරතාවය දිනා ගත් කණ්ඩායමක හීබර් ක්‍රීඩා කළේය.

- කුමණ හැකියාවක් හීබර්ට අවශ්‍ය වූයේද?
- ඔහුගේ හැකියාව වැඩි දියුණු කර ගැනීමට හීබර් කුමක් කළේද?
- හීබර් බෝල ගැසීමට පුහුණු වූ විට කුමක් සිදු වූයේද?

ජීවිතයේ පසු කළකදී බැංකුවක ගණන් තබන්නෙකු වශයෙන් වැඩ කිරීමට හීබර්ට අවශ්‍ය විය. නමුත් ගණන් තබන්නෙකුගේ අත් අකුරු පැහැදිලි වූ අතර කියවීමට පහසු විය යුතුය. හීබර් ගේ මිතුරෙකු ඔහුට මෙසේ කීවේය, "[ඔබගේ] අකුරු කිකිළියකගේ අඩි පාරවල් මෙන් පෙනේ." තවත් මිතුරෙකු මෙසේ කීවේය, "තීන්ත බෝතලයකට විදුලි එළිය වැදුනාක් මෙන් එය පෙනෙයි."

අත් අකුරු දියුණු කර ගැනීමට හීබර් පැය ගණන් ගතකරමින් පුහුණු වූයේය. අවුරුදු ස්වල්පයකට පසු ඉතාම හොඳ අත් අකුරු වලට රජයෙන් දෙන සම්මාණයක් ඔහුට ලැබුනේය. ඔහු ගණන් තැබීම සහ අත් අකුරු ලිවීමද විශ්වවිද්‍යාලයේදී ඉගැන්වූවේය.

- හීබර්ට අවශ්‍ය වූයේ කුමණ හැකියාවක් ලබා ගැනීමටද?
- මෙම හැකියාව වැඩිදියුණු කර ගැනීමට හීබර් කුමක් කළේද?

- හීබර්ගේ අත් අකුරු පුහුණු වූ නිසා කුමක් සිදු වූයේද?

හීබර් තරුණ කාලයේදී, ගායනා කිරීම පිණිස ඉගෙන ගැනීම ඔහුගේ මවට අවශ්‍ය විය. ඔහුගේ වයස අවුරුදු දහයක් පමණ කාලයේදී ගායනා පංතියකට ඔහු බැඳුනේය. හීබර්ට ගායනා කිරීම පිණිස ඉගැන්වීමට ගුරුවරයා උත්සහ ගත් නමුත්, අන්තිමේදී එය ඔහු අත්හැර දමා, කිසි දිනක ඔහුට ඉගෙන ගැනීමට නොහැකි වන බව හීබර්ට කීවේය. අවුරුදු ගණනකට පසු, ගායනයට උගන්වන මිතුරෙකු සමග ඔහු කථා කළේය. ගීතිකා ස්වල්පයක් ගායනා කිරීම පිණිස ඉගෙන ගැනීමට ඔහු කැමති බව හීබර් සඳහන් කළේය. ශ්‍රමයත් කාළයත් ඔහුට අවශ්‍ය බව මිතුරා කී නමුත්, ඔහුට එය කිරීමට හැකි බවද කීවේය. බොහෝ සේ පුහුණු වීමට හීබර් කී අතර, සභාවේ ගීතිකා ගායනා කිරීමට ඔහු ඉගෙන ගත්තේය.

- හීබර්ට අවශ්‍ය වූයේ කුමණ හැකියාවක් ලබා ගැනීමටද?
- බෝල ගැසීමට, ඔහුගේ අත් අකුරු වැඩි දියුණු කර ගැනීමට, සහ ගායනා කිරීම පිණිස ඉගෙන ගැනීමට උපකාර වීම පිණිස හීබර් ක්ළේ කුමක්ද?

හීබර් කළා මෙන්ම, පුහුණු වීම මගින් අපගේ හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට හැකි බව ළමයින්ට පහදා දෙන්න. යම් දෙයක් අප වැඩියෙන් කරන විට, එය කෙරෙහි අපි වඩාත් දක්ෂ වන්නෙමු. හීබර් ඔහුගේ හැකියාවන් බොහෝ විට පුහුණු වූ බැවින් ඔහුට එය ඉතා හොඳට කළ හැකි විය. ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දෙන ලද හැකියාවන් පුහුණු වෙමින් භාවිතා කරන විට, උන් වහන්සේ ප්‍රසන්න වන සේක.

### සාරාංශය

ක්‍රියාකාරකම් — පාඩමේදී කලින් සාකච්ඡා කළ පරිදි, එක් එක් ළමයෙකුගේ විශේෂිත හැකියාවන් ගැන නැවත බලන්න. ඔවුන්ගේ හැකියාවන් ලැයිස්තුව සහ පැන්සල් හෝ පාට පැන්සල් ළමයින්ට දෙන්න. ඔවුන්ට තිබෙන හෝ ලබා ගැනීමට කැමති හැකියාවක පිංතූරයක් කඩදාසියේ හිස් පැත්තේ ඇඳීමට ළමයින්ට සලස්වන්න.

පෙන්වා දෙන ලද හැකියාව දියුණු කරගැනීමට ඔවුන්ට උපකාර කළ හැකි අන්දම ගැන සහ ඔවුනගේ පිංතූර ගැනද එකිනෙකා සමග සාකච්ඡා කිරීමට ළමයින්ට සලස්වන්න.

සාක්ෂිය — අප එක් එක්කෙනාට වෙනස් වූ ආකාරයට ස්වර්ගීය පියාණන් වහන්සේ හැකියාවන් දී තිබෙන බවට ඔබගේ සාක්ෂිය දරන්න. අපගේ හැකියාවන් අප භාවිතා කිරීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට සහ ස්වර්ගීය පියාණන් වහන්සේට අවශ්‍ය බව ළමයින්ට මතක් කරන්න. අපගේ හැකියාවන් භාවිතා කරන විට, අපද අන්‍යයන්ද සතුටු වන අතර, අපගේ හැකියාවන් වැඩිදියුණු වීමට අපි උත්සහ කරන්නෙමු.

එක් එක් ළමයෙකුගේ ලැයිස්තුවේ උඩම තිබෙන වචන ශබ්ද නගා කියවන්න නැතහොත් ළමයි ලවා කියවන්න: "මගේ හැකියාවන් ගැන මගෙන් අසන්න." ඔවුන්ගේ ලැයිස්තු ඔවුන්ගේ පවුල් වලට පෙන්වා, හැකියාවන් ගැන ඔවුන් ඉගෙන ගත් දේවල් ගැන පවුලේ අයට කීමට ළමයින් දිරි ගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. පංතියේ එක් එක් සාමාජිකයෙකුගේ හැකියාවන් වෙනුවෙන් ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කරන අතර, ළමයින්ට ඔවුන්ගේ හැකියාවන් මනාව භාවිතා කිරීමට උපකාර වන මෙන් ස්වර්ගීය පියාණන් වහන්සේ ගෙන් ඉල්ලීමට ළමයාට යෝජනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීමක් වශයෙන් හෝ සාරාංශයක් මෙන් ඔබට ඒවා භාවිත කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව," අමතර මගපෙන්වීම් බලන්න.

1. රවුමට වාඩිවීමට ළමයින්ට සලස්වන්න. ඇට මල්ලක් හෝ වෙනත් මෘදු උපකරණයක් රවුම වටේ යවන විට, සිහින් හඬ නැගීමක් හෝ ගීතයක් හෝ පටිගත කරන ලද සංගීතයක් වාදනය කරන්න. සංගීතය නැවතුන විට, ඇට මල්ල අල්ලාගෙන සිටින ළමයා රවුමේ මැදට පැමිණ හැකියාවක් පෙන්වනවා ඇත. හැකියාවන් මෙසේ විය හැකිය. කවියක් කීම, ගීතයක් ගායනා කිරීම, ශුද්ධ ලියවිලි කියවීම, තනි අණ්ඩෙන් පැනීම, හෝ රට හුණු ලෑල්ලේ පිංතූරයක් ඇඳීමය. පංති කාමරයේ පෙන්වීමට නොහැකි හැකියාවන්, එනම් යම් කිසි කරුණාවන්ත ක්‍රියාවක් කිරීම හෝ බෝලයකට පයින් ගැසීම වැනි දේවල් ළමයින්ට අංග චලනයෙන් දැක්විය හැකිය. එක් එක් ළමයෙකු එය නිම කළාට පසු සෙමින් ඔහුට ප්‍රශංසා කිරීමට ළමයින්ට කියන්න.

   එක් එක් ළමයෙකු අඩු වශයෙන් එක් වතාවක් වත් එය ඉටු කිරීමට අවස්ථාව ලැබෙන තෙක් එය කරගෙන යන්න.


2. ඔබ තරුවක් අඳින ලද කඩදාසි කෑල්ලක් සහ පාට පැන්සල් එක් එක් ළමයෙකුට දෙන්න. (තරුවේ නිදර්ශනයක් පාඩමේ අග සඳහන් වී ඇත). අසාමාන්‍ය ක්‍රමයකට ඔවුන්ගේ තරු පාට කිරීමට ළමයින්ට කියන්න. සියලුම ළමයි පාට කර නිම කළාට පසු, ඔවුන්ගේ තරු පෙන්වමින් "සෑම තරුවක්ම වෙනස්ය" (ළමා ගී පොත, පි. 142) යන්නෙහි පළවෙනි පදය ගායනා කිරීමට හෝ වචන කීමට ළමයින්ට සලස්වන්න.

   සෑම තරුවක්ම වෙනස්ය,
   සෑම ළමයෙක්ම එසේය.
   දක්ෂය සතුටුය සමහරු,
   මෘදුය, යටහත්ය සමහරු.
   සෑම කෙනෙක්ම අවශ්‍යයි
   කිරීමට ඔහුට හැකි දෙයක් ගැන.
   එකම කෙනා ඔබ පමණයි
   ඔබ මෙන් විය හැකි කාටද?

   © 1980 by K. Newell Dayley . Used by Permission)

   ඔවුන් ගේ සියලුම තරු වෙනස් වන අන්දමට, ඔවුන්ටද වෙනස් වූ හැකියාවන් හා දක්ෂකම් තිබෙන නිසා ඔවුන් සියලුම දෙනාද වෙනස් බව අවබෝධ කර ගැනීමට ළමයින්ට උපකාර කරන්න. හැකියාවන් ස්වර්ගීය පියාණන් වහන්සේ ගෙන් ලැබී තිබෙන ආශිර්වාද බව ළමයින්ට මතක් කරන්න.

3. ගීතයක් මෙහෙය වීම හෝ, යම් කිසි කලාවක් වැනි දෙයක් හැකියාවකට වැඩි දියුණු කර ගැනීමට හැකි සරල නිපුන තාවයක් ළමයින්ට උගන්වන්න.



# හරි දෙය තෝරා ගත් විට මම ප්‍රඥාසම්පන්න වෙමි


**36**
වෙනි පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ ඉගැන්වීම් වලට අප කීකරු වන විට අප ප්‍රඥාසම්පන්න වන බව එක් එක් ළමයෙකුට අවබෝධ කර ගැනීමට උපකාර වීමටය.

**සූදානම**

1. මතෙව් 7:24–27 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.
2. පෙන්වා දී තිබෙන පරිදි කඩදාසි කැලි නමා, සලකුණු දෙකක් සූදානම් කර ගන්න.



ප්‍රඥාව මෝඩකම. (නුවණ අනුවණ)

3. "නුවණ ඇත්තා නුවණ නැත්තා" (ළමා ගී පොත, පි. 281) සහ "හරි මාර්ගය තෝරා ගන්න" (ළමාගී පොත, පි. 160) ගායනා කිරීමට නැතහොත් වචන කීමට සූදානම් වෙන්න. "හරි මාර්ගය තෝරා ගන්න" යන්නට මෙම අත් පොතේ පිටුපස වචන අඩංගු වී ඇත.
4. කුඩා කඩදාසි කැලි වල, ප්‍රඥාවන්ත ක්‍රියා හා අනුවණ ක්‍රියා සමහරක් ලියන්න. පහත සඳහන් ක්‍රියා භාවිතා කරන අතර ඔබගේ පංතියට සුදුසු වෙනත් දේද එකතුකර ගන්න. කුඩා භාජනයක් වන පෙට්ටියක, කෝප්පයක හෝ මල්ලක කඩදාසි කැලි තබන්න.

   ඔබගේ යාච්ඤාව කියන්න.
   ඔබගේ දෙමව්පියන්ට කීකරු වෙන්න.
   ප්‍රාථමිකයේදී ගෞරවාන්විතව සිටින්න.
   අන්‍යයන්ට කරුණාවන්ත වෙන්න.
   බෙදා ගන්න.
   සත්‍යය ප්‍රකාශ කරන්න.

   රණ්ඩු කරන්න.
   නරක වචනයක් කියන්න.
   ආත්මාර්ථකාමී වෙන්න.
   බොරු කියන්න.
   අකරුණාවන්ත වෙන්න.

5. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. තොප්පියක්, අත් මේස් කුට්ටමක්, සපත්තු කුට්ටමක් (හෝ ඔබගේ පංතියේ ළමයින්ට පැළඳගැනීමට හැකි රෙදි වැනි වෙනත් උපකරණ තුනක්)
   ඇ. හදෙතො [CTR සටහනක් (පළවෙනි පාඩම බලන්න)]
6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම්**
**වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරි ගන්වනවා නම් ඒ අනුව යන්න.

**ප්‍රඥාවන්ත තීරණ ගැනීමට අපට හැකිය.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම.

අත් මේස්, තොප්පිය සහ සපත්තු පෙන්වන්න. (ඔබ වෙනත් රෙදි වැනි උපකරණ භාවිතා කරනවා නම් ඔබට අවශ්‍ය අන්දමට මෙම ක්‍රියාකාරකමට සුදුසු සේ සකස්කර ගන්න. අත් මේස් දෙක ඔබගේ ඔලුව උඩින් තබන්න.

- අප අත් මේස් පැළඳිය යුත්තේ මේ අන්දමටද? ඒ කුමක් හෙයින්ද?
- අත් මේස් අප පාවිච්චි කළ යුත්තේ කුමකටද?

අත් මේස් ඔබගේ ඔලුවට දැමීම අනුවණ ක්‍රියාවකි, මක් නිසාද එවිට ඒවා ඔබගේ අත් ආරක්ෂා නොකරන බව පෙන්වා දෙන්න.

අත් මේස් පළඳන ඥානවන්ත ක්‍රමය පෙන්වා දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

තොප්පිය ඔබගේ එක් කකුලකට දාගන්න

- අප තොප්පිය පැළඳිය යුත්තේ මේ අන්දමටද? ඒ කුමක් හෙයින්ද?
- තොප්පිය අප පාවිච්චි කළ යුත්තේ කුමකටද?

තොප්පිය ඔබගේ කකුලට දැමීම අනුවණ ක්‍රියාවකි, මක් නිසාද එවිට එය ඔබගේ ඔලුව ආරක්ෂා නොකරන බව පෙන්වා දෙන්න.

තොප්පිය පළඳින ඥානවන්ත ක්‍රමය පෙන්වා දීමට තවත් ළමයෙකුට ආරාධනා කරන්න.

ඔබගේ අත්වලට සපත්තු දාගන්න.

- අප සපත්තු පළඳින්නේ මේ අන්දමටද? ඒ කුමක් හෙයින්ද?
- සපත්තු අප පාවිච්චි කරන්නේ කුමකටද?

සපත්තු ඔබගේ අතට දැමීම අනුවණ ක්‍රියාවකි, මක්නිසාද, එවිට ඒවා ඔබගේ කකුල් ආරක්ෂා නොකරන බව පෙන්වා දෙන්න.

සපත්තු පළඳින ඥානවන්ත ක්‍රමය පෙන්වා දීමට තවත් ළමයෙකුට ආරාධනා කරන්න.

තමාගේ ශරීරයේ වැරදි කොටස් වලට අත්මේස්, තොප්පි හෝ සපත්තු පළඳින්නේ පුද්ගලයන් ස්වල්ප දෙනෙකු බව පෙන්වා දෙන්න. නමුත් පළඳින දේවල් තෝරා ගන්නා අන්දමද ප්‍රඥාවන්ත හෝ අනුවණ ක්‍රියාවක් විය හැකිය. නොයෙක් ආකාරයේ රෙදි පිළි පළඳින අවස්ථාවන් ප්‍රඥාවන්ත හෝ අනුවණ ක්‍රියාවක් විය හැකි බව ළමයි සමග කෙටියෙන් සාකච්ඡා කරන්න. (නිදර්ශනයක් වශයෙන්, සීතල දේශගුණයක් පවතින විට එළිමහනේ යෑමට අත් මේස් පැළඳීම ඥානවන්තය, නමුත් ඔබ නාන විට සපත්තු පැළඳීම අනුවණ ක්‍රියාවකි).

දිනපතාම අප බොහෝ දේ තෝරන බව පහදා දෙන්න. අනුවණ තේරීම් අපට හිංසා කරන අතර අප අසතුටට පත්කළ හැකිය. ඥානවන්ත තේරීම් අපව ආරක්ෂා කරමින් සතුටට පත්කරයි.

**අප ප්‍රඥාවන්ත වී උන්වහන්සේගේ ඉගැන්වීම් වලට කීකරු වීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වී ඇත.**

ශුද්ධ ලියවිලි කථාන්තර

ජනතාවට ඉගැන්වීමට උපමා කථා යැයි හඳුන්වනු ලබන කථාන්තර බොහෝ විට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ භාවිතා කළ බව පහදා දෙන්න. අනුවණ තීරණයක් ගත් මිනිසෙකු ගැන හා ප්‍රඥාවන්ත තීරණයක් ගත් මිනිසෙකු ගැන උපමා කථාවක් උන්වහන්සේ කී සේක. බයිබලයෙන් මෙම උපමා කථාන්තරය ඔබ කියවීමට යන බව ළමයින්ට කියන්න. මතෙව් 7:24–27 ශබ්ද නගා කියවන්න.

සාකච්ඡා

- වැලි මත්තෙහි සෑදූ ඔහුගේ ගෙයට හුළඟ හමා ගෙට ගසා එය වැටුණු විට එම මිනිසාට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?
- පර්වතය පිට සෑදූ ඔහුගේ ගෙයට හුළඟෙන් අලාභ හානියක් නොවූ විට එම මිනිසාට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?

උපමා කථාන්තරයේ මිනිසුන්ට යේසුස් වහන්සේ අපව සමාන කළ බව පහදා දෙන්න. යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අප අනුගමණය කරනවා නම් අපි පර්වතය මත ඔහුගේ ගෙය සෑදූ ප්‍රඥාවන්ත මිනිසා මෙන් වන්නෙමු. අපි ප්‍රීතියට පත්වන්නෙමු. යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අප අනුගමණය නොකරන්නේ නම්, අපි වැලි මත්තෙහි ඔහුගේ ගෙය සෑදූ අනුවණ මිනිසා මෙන් වන්නෙමු. අප අසතුටට පත්වන්නෙමු.

ගීතය

“නුවණ ඇත්තා නුවණ නැත්තා” යන්න පහත පෙන්වා දී තිබෙන අංග චලනයන් සමග ගායනා කිරීමට හෝ වචන කීමට පංතියට උපකාර කරන්න.

නුවණ ඇත්තා පර්වතය මත ඔහුගේ නිවස සාදයි. (වම් අතේ අල්ල මත දකුණු අතේ මිට තදින් හිටවන්න.)

නුවණ ඇත්තා පර්වතය මත ඔහුගේ නිවස සාදයි. (වම් අතේ අල්ල මත දකුණු අතේ මිට තදින් හිටවන්න.)

නුවණ ඇත්තා පර්වතය මත ඔහුගේ නිවස සාදයි. (වම් අතේ අල්ල මත දකුණු අතේ මිට තදින් හිටවන්න.)

වැස්ස කඩා වැටුණේ (අත් උඩට ඔසවන්න, පහතට ගේන්න, ඇඟිලි දඟලවන්න.)

වැස්ස කඩා වැටුණේ, ගංවතුර ගැලුවේ (අත් නැවත පහතට ගේන්න, අල්ල උඩට හරවා ඔසවන්න).

වැස්ස කඩා වැටුණේ, ගංවතුර ගැලුවේ (අත් නැවත පහතට ගේන්න, අල්ල උඩට හරවා ඔසවන්න).

වැස්ස කඩා වැටුණේ, ගංවතුර ගැලුවේ (අත් නැවත පහතට ගේන්න, අල්ල උඩට හරවා ඔසවන්න).

පර්වතය මත නිවස තිසලව තිබුනේ (වම් අතේ අල්ල මත දකුණු අතේ මිට තදින් හිටවන්න).

නුවණ නැත්තා වැලි මත ඔහුගේ නිවස සාදයි (ඇඟිලි දඟලවමින් ශරීරය ඉදිරියෙන් අත් ඉදිරියට හා පිටුපසට ගෙන යන්න).

නුවණ නැත්තා වැලි මත ඔහුගේ නිවස සාදයි (ඇඟිලි දඟලවමින් ශරීරය ඉදිරියෙන් අත් ඉදිරියට හා පිටුපසට ගෙන යන්න).

නුවණ නැත්තා වැලි මත ඔහුගේ නිවස සාදයි (ඇඟිලි දඟලවමින් ශරීරය ඉදිරියෙන් අත් ඉදිරියට හා පිටුපසට ගෙන යන්න).

වැස්ස කඩා වැටුනේ (අත් උඩට ඔසවන්න; පහතට ගේන්න, ඇඟිලි දඟලවන්න).

වැස්ස කඩා වැටුණේ; ගංවතුර ගැලුවේ (අත් නැවත පහතට ගේන්න, අල්ල උඩට හරවා ඔසවන්න).

වැස්ස කඩා වැටුණේ; ගංවතුර ගැලුවේ (අත් නැවත පහතට ගේන්න, අල්ල උඩට හරවා ඔසවන්න).

වැස්ස කඩා වැටුණේ; ගංවතුර ගැලුවේ (අත් නැවත පහතට ගේන්න, අල්ල උඩට හරවා ඔසවන්න).

වැලි මත වූ නිවස ගසාගෙන ගියේ (ඇඟිලි දඟලවමින් ශරීරය ඉදිරියෙන් අත් ඉදිරියට හා පිටුපසට ගෙන යන්න).

**හරි දෙය තෝරා ගන්නා විට අපි ප්‍රඥාසම්පන්න වෙමු.**

කථාන්තර සහ සාකච්ඡා

සෑම කෙනෙක්ම දිනපතාම තෝරා ගැනීම් කරයි. ඥානවන්ත තේරීම් අපට කළ හැකි අතර අනුවණ තේරීම්ද අපට කළ හැකිය. පසු කලකදී ප්‍රධාන අධිකාරියේ සාමාජිකයෙකු වූ බී. එච්. (හැරී) රොබට්ස් ගැන පහත සඳහන් කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න. කථාන්තරයේ සඳහන් හැරීගේ තේරීම් ඥානවන්තද අනුවණද කියා තීරණය කිරීමට ළමයින්ට සලස්වන්න.

බොහෝ කලකට පෙර හැරී එන්ගලන්තයේ උපත ලැබුවේය. ඔහුගේ පවුල ඉතාම දිළිඳු බැවින්, හැරීට පාසැල් යෑමට අවස්ථාවක් නොලැබිනි. කියවීම හා ලිවීම ඉගෙන ගැනීමට ඔහුට ඉතාම අවශ්‍ය විය. ඔහුට ඉගෙන ගැනීමට අවස්ථාවක් ලැබුනොත් කියවීමට පමණක් නොව පොත් ලිවීමටද ඔහුට හැකි වේ යැයි ඔහු සිතුවේය.

හැරීට අවුරුදු දහයක් පමණ වන විට, ඔහුගේ සහෝදරිය පොලී සහ අතිකුත් පුරෝගාමීන් සමග තැනිතලා තරණය කොට ඇමෙරිකාවට ඔහු පැමිණියේය.

හැරීට දුෂ්කර වූ සිද්ධි වලට මුහුණ පෑමට සිදු විය. පසු දිනයේදී ඔහුගේ කණ්ඩායම විශාල ගඟක් තරණය කිරීමට යන බව දිනක් ඔහුට ඇසුනි. ඔහුට එය සතුට උපදවන දෙයක් වූ නිසා, පසුදා උදෑසනම කඳවුරෙන් එලියට අවුත් ගඟ බැලීමට ගියේය. කඳවුරු නීති රීති වලට මෙය විරුද්ධය.

- කඳවුරෙන් හොරෙන් යෑමේ හැරීගේ තීරණය ඥානවන්ත එකක් ද අනුවණ එකක් ද කියා ඔබ සිතනවාද?

හැරී සිතුවාට වඩා ගඟ තිබුනේ බොහෝ ඈතින්ය, අන්තිමට එතැනට යන විට ඔහුට බොහෝ මහන්සිය. ගස් අතර හාන්සි වූ ඔහු සුවදායක නින්දකට වැටුනේය.

හැරී අවදි වෙන විට සියලුම රථ ගඟ තරණය කොට ඇත. ඔහු ගං ඉවුරට දුව ගොස් යමෙකුට ඇසෙන සේ කෑගැසුවේය. ඔහුට පිහිනීමට කී, නිසා ඔහුගේ කබාය සහ සපත්තු ඉවතට ගෙන ගඟට පැන්නේය. ඔහු ගඟ හරහා පීනා අවසන් වූ නමුත්, ඔහුට දැඩි මහන්සියක් දැනුනි, එම නිසා සමාගමේ කපිතාන් ඔහුව අසු පිට තබාගෙන ගමනේ ඉතිරි කොටස ගියේය. ආරක්ෂාව ලැබුනු නිසා හැරී සතුටු වූ නමුත් ඔහුගේ කබාය සහ සපත්තු ආපසු ගැනීමට ක්‍රමයක් නොවීය. සෑම රාත්‍රියකම ඔහුට ඔහුගේ කබාය තිබුනා නම් හොඳ යැයි සිතූ අතර සෑම දිනයකදීම ඔහුගේ සපත්තු තිබුනා නම් හොඳ යැයි ඔහු සිතුවේය.

සැතපුම් තවසීයක් පාවහන් නැතිව ඇවිදීමට හැරීට සිදු විය. මේ නිසා ඔහුගේ කකුල් වලට තද වේදනාවක් දැනුණේය. කටු සහිත පතොක් මග අසල වැවී තිබුනි, හැරීට කොපමණ බඩගිනි වුවාද කීවොත් සමහර විට ඔහු ඒවා කෑමට රැස් කර ගත්තේය. තියුණු කටු තුවාල වූ ඔහුගේ කකුල් වල ඇනුණේය. පොලී කටු එලියට අදිමින් දෙදෙනාම ඇඬුහ. හැරී ඔහුගේ තුවාල රිදෙන නිසා ඇඬූ අතර පොලී හැරී ගැන දුක සිතී ඇඬුවේය.

- කඳවුරෙන් හොරෙන් පැන යාමට ගත් තීරණය අනුවණ එකක් වූයේ මන්ද?
- ඔහුගේ තීරණය ගැන පසුව හැරීට හැඟුනේ කුමක්ද?

හැරී සෝල්ට් ලේක් නගරයට ආවාට පසු, අන්තිමට පාසැල් යාමට ඔහුට අවස්තාවක් ලැබුනි. ඔහුට අවුරුදු එකොළහක් වූ විට ගුරුවරියක් ඇයගේ පාසලට ඔහුව ඇතුලත් කරගෙන ඔහුට හෝඩිය ඉගැන්වූවාය. හැරීට කියවීමට හැකිවූ එකම පොත බයිබලය පමණි, එය ඔහු නැවත නැවත් කියෙව්වේය. පාසැලේ දී බොහෝ මහන්සි වී ඉගෙන ගෙන ඉතා හොඳ ශිෂ්‍යයෙකු වූයේය.

- හැරී ගත්තේ කුමණ තීරණයක්ද? (ඔහු කියවීම පිණිස ඉගෙන ගැනීමට තීරණය කළේය. තවද ඔහු ශුද්ධ වූ ලියවිලි අධ්‍යනය කිරීමට තීරණය කළේය

- මෙම තීරණය ප්‍රඥාවන්තද, අනුවණද?

හැරී වැඩ්, සභාවේ ප්‍රඥාවන්ත හා වැදගත් පුද්ගලයෙකු වූයේය. කියවීමට ඔහු ප්‍රිය කළ අතර, ශුද්ධ වූ ලියවිලි කියවමින් ඔහු සතුටු වූයේය. සභාව ගැන බොහෝ පොත්ද ඔහු ලීවේය. බොහෝ ජනයා ඔහුගේ පොත් කියවා සභාව ගැන වැඩියෙන් ඉගෙන ගත්තෝය. (සභා ප්‍රවෘති, 19 ජූලි 1980, පිටු. 8–9; බලන්න; සහ ට්‍රෑමන් ජී. මැඩිසන්, ඇදහීමේ ආරක්ෂකයා: බී. එච්. රොබට්ස් ගේ කථාන්තර [සෝල්ට් ලේක් නගරය: පොත් කලාව, 1980] පිටු. 19–21, 37–40, 56–57) (See Church News, 19 July 1980. pp. 8–9; and Truman G. Madsen, *Defender of Faith: The B. H. Roberts Story* [Salt Lake City Bookcraft, 1980], pp. 19–21, 37–40, 56–57.)

හදෙතො (CTR) සටහන. හදෙතෝ (CTR) සටහන පෙන්වා එහි වචන ඔබත් සමග ළමයින්ට කියවීමට සලස්වන්න: “මම හරි දෙය තෝරා ගනිමි” අප හරි දෙය තෝරා ගන්නා විට අපි ප්‍රඥාවන්ත තීරණ ගන්නා බව ළමයින්ට පහදා දෙන්න.

**සාරාංශය**

ක්‍රියාකාරකම් “ප්‍රඥාවන්ත” සහ “අනුවණ” වශයෙන් නම් කළ ලකුණු බිම හෝ මේසය මත තබා පෙන්වන්න. එක් එක් සළකුණක තිබෙන වචන ඔබත් සමග ළමයින්ට කියවීමට සලස්වන්න. “ප්‍රඥාවන්ත” ලකුණෙහි ප්‍රීතිමත් තිබෙන්නේ ප්‍රඥාවන්ත වීමෙන් අප සතුටු වන නිසා බව පෙන්වා දෙන්න. “අනුවණ” ලකුණෙහි දුක්මුසු මුහුණ තිබෙන්නේ අනුවණ කම්න් අප අසතුටට පත් වන නිසා බව පෙන්වා දෙන්න.

කුඩා කඩදාසි සමග භාජනය ළමයින්ට පෙන්වා, වාර අනුව භාජනයෙන් කඩදාසියක් තෝරා ගැනීමට ළමයින්ට ආරාධනා කරන්න. එක් එක් ළමයා කඩදාසිය තෝරා ගත් විට, එහි ලියා තිබෙන ක්‍රියාව කියවන්න නැතහොත් ළමයා ලවා කියවන්න. ක්‍රියාව ප්‍රඥාවන්තද නැතහොත් අනුවණද කියා තීරණය කිරීමට ළමයාට සලස්වා සුදුසු ලකුණ ලඟින් කඩදාසිය තැබීමට කියන්න.

ප්‍රඥාවන්ත තේරීම් යයි ඔවුන් හඳුනා ගන්නා ඒවා අංග චලනයෙන් දැක්වීමට ළමයින්ව දිරිගන්වන්න.

නැවත බැලීමේ සාකච්ඡා
- අප සතුටට පත් කරන්නේ කුමණ තේරීම්ද?
- ප්‍රඥාවන්තව සතුටට පත් වීම පිණිස, අප අනුගමණය කළ යුත්තේ කාගේ ඉගැන්වීම්ද?
- යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අකීකරු වී වැරදි කිරීම අනුවණ දෙයක් වන්නේ කුමක් හෙයින්ද?

සාක්ෂිය අප ප්‍රඥාවන්තව තෝරා ගන්නා විට සතුටට අප පත්වෙන බව ළමයින්ට සාක්ෂි දරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේට සහ අපට සතුටු වීමට උපකාර වන උන්වහන්සේ අපට උගන්වා දී තිබෙන දේවලට ඔබගේ ප්‍රශංසාව පළකරන්න.

මෙම සතිය තුළදී ඔවුන්ගේ තීරණ ගැන සිතීමට විශේෂ පරිශ්‍රමයක් කරන අතර ප්‍රඥාවන්ත තීරණ ගැනීමට ළමයින්ව දිරිගන්වන්න.

ගීතය “හරි මග තෝරා ගන්න” යන්න ගායනා කරන්න නැතහොත් ළමයි සමග වචන කියන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. පංතියේ එක් එක් සාමාජිකයෙකුටම ප්‍රඥාවන්ත වීමට සහ හරි දෙය තේරීම පිණිස යාච්ඤා කිරීමට ළමයාට කියන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව," අමතර මග පෙන්වීම් වලට බලන්න.

1. 2-7 පිංතූරයෙහි ශාස්ත්‍ර වන්තයන් පෙන්වා, පිංතූරය ගැන ඔබට කීමට ළමයින්ට සලස්වන්න. යේසුස් වහන්සේ උපන්නාට පසු උන්වහන්සේ දැක ගැනීමට ශාස්ත්‍ර වන්තයින් පැමිණි බව ළමයින්ට මතක් කරන්න. (මතෙව් 2:1–12) මෙම මිනිසුන් ප්‍රඥාවන්තය, මක් නිසාද ඔවුන් ඥානවන්ත වීම නිසා පමණක් නොව, ඔවුන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සොයාගෙන උන්වහන්සේට නමස්කාර කිරීම නිසා බව පැහැදිලි කරන්න. යේසුස් වහන්සේව අනුගමණය කිරීමට ඔව්හු ප්‍රඥාවන්තව තෝරා ගත්තෝය.


   ශාස්ත්‍ර වන්තයින් යේසුස් වහන්සේව සෙවීමේ කථාන්තරය ළමයින් ලවා රඟ දැක්වීමට ඔබට අවශ්‍ය විය හැකිය.

2. මෑතකදී ඔහු හෝ ඇය කළ ප්‍රඥාවන්ත තෝරා ගැනීමක් ගැන ඔබට කීමට එක් එක් ළමයෙකුට කියන්න. (අවශ්‍ය නම් යෝජනා දෙන්න). එක් එක් ළමයාගේ පිළිතුරු වෙනම කඩදාසි කැල්ලක ලියා, ඔවුන්ගේ කඩදාසි වල ඔවුන්ගේම පිංතූරය ඇඳීමට ළමයින්ට සලස්වන්න. ප්‍රඥාවන්ත තේරීම් අපව සතුටට පත් කරන නිසා ඔවුන්ගේ චිත්‍ර වල මුහුණු සිනහවෙන් යුක්තව තැබීමට ළමයින්ට මතක්කරන්න.

3. පහත සඳහන් ද්‍රව්‍යමය පාඩම පෙන්වන්න. (පංතියේ දී පෙන්වීමට පෙර නිවසේදී පුහුණු වෙන්න.)

   අවශ්‍ය උපකරණ.

   අ. පෙන්වා දී තිබෙන පරිදි, එක සමාන සරල නිවාස දෙකක් තැනීමට ළමයි අට දෙනෙකුගේ හෝ දස දෙනෙකුගේ ක්‍රීඩා කරන ලීකොට.



   ආ. එක හා සමාන ගැඹුරු ඇතිලි දෙකක්.
   ඇ. එක ඇතිලියක් තුලට දැමීමට ලොකු පැතලි ගලක්.
   ඈ. අනිත් ඇතිලිය තුලට දැමීමට වැලි ගොඩක්.
   ඉ. වතුර දාන බාල්දියක හෝ කළයක වතුර.

   වැලි ගොඩ එක් ඇතිලියකට දමා තුනී කරන්න. සමතලා ගල අනිත් ඇතිලියට දමන්න.

   ලී කොට පෙන්වා, ඒවා භාවිතා කරමින් ඔබ ගෙවල් දෙකක් සාදන බව පහදා දෙන්න. එක ගෙයක් වැලි මතද අනිත් එක ගල මතද සාදන බව කියන්න.

   ගල උඩ ගෙය සෑදීමට උපකාර කිරීමට ළමයින්ට ආරාධනා කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. වැලි මත ඔබ සෑදූ ගෙයට එම ගෙය සමාන විය යුතුය.

   ගෙවල් සෑදුවාට පසු, සුළඟ හමා ගෙවල් වලට වැදෙන බව සිතා ගැනීමට ළමයින්ට සලස්වන්න. වැස්ස තදින් වසින අතර සුළඟද හමයි.

- මෙම ගෙවල් දෙකට සුළඟ කුමක් කරනවා ඇත්දැයි ඔබ සිතන්නෙහිද?

ළමයින් ඔවුන් ගේ අදහස් ප්‍රකාශ කළාට පසු, කිසිවක් නොකියන්න. වැලි ලිස්සා ගොස් ගෙය වැටෙන තෙක් වැලි මත සෑදූ ගෙයට වතුර ඉසින්න නැතහොත් වත්කරන්න. ගල මත සෑදූ ගෙය මතටද එම ප්‍රමාණයම වතුර වත්කර, ගෙය නොවැටෙන බව ළමයින්ට බලා ගැනීමට සලස්වන්න.

වැලි මත ගෙයක් සෑදීම අනුවණ බවද, ගල මත ගෙයක් සෑදීම ප්‍රඥාවන්ත බවද තීරණය කර ගැනීමට ළමයින්ට උපකාර කරන්න.

හීලමන් පොතේ 5:12 (පදනම හරහා) පළවෙනි කොටස ශබ්ද නගා කියවන්න. මෙම ශුද්ධ ලියවිල්ලේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව පර්වතයකට සමාන කරන බව පෙන්වා දෙන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ ඉගැන්වීම් අනුගමණය කිරීම ගල මත ගෙයක් සාදනවාට සමාන බව ළමයින්ට මතක් කරන්න. එය ප්‍රඥාවන්තය.

# 37 වෙනි පාඩම

# සබත් දිනය ශුද්ධව පැවැත් වීමට මට හැකිය

**අරමුණ**

සබත් දිනය ශුද්ධව පැවැත් වීමට එක් එක් ළමයෙකුගේ ආශාව ශක්තිමත් කිරීමටය.

**සූදානම**

1. නික්ම යැම 20:8–11 සහ මතෙව් 12:10–13, යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. (ශුභාරංචි මූලධර්ම (31110), 24 වෙනි පරිච්ඡේදයද බලන්න.)
2. පාඩමේ අග සඳහන් දින දර්ශනය කඩදාසියක් මත තබා ඇඳ හෝ පිටපතක් සාදාගන්න. සබත් දින රතෙන් පාට කරන්න. පවතින මාසය අනුව දින ගණනක් ගණන් තැබීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.
3. පහත සඳහන් වචන තීරු සූදානම් කර ගන්න.

| |
|---|
| “සබත් දවස, ශුද්ධ කොට පවත්වන්නට සිහිකර ගනුව.” |

4. එක් එක් ළමයෙකු වෙනුවෙන්, පාඩමේ අග සඳහන්ව ඇති සබත් දින ක්‍රියාකාරකම් කඩදාසි දෙකම වෙනත් කඩදාසියක් මත තබා ඇඳ හෝ පිටපත් කර හෝ සාදා ගන්න. කුඩා ළමයින්ට තිත් ඉරි මතින් පිටුව කපා ගනන. වැඩි හිටි ළමයින්ට, කතුරු ජෝඩු ස්වල්පයක් ගෙනැවිත්, ඔවුන්ටම පිටු කපා ගැනීමට සලස්වන්න.
5. “සෙනසුරාදා” (ළමා ගී පොත, පි. 197) ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.
6. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්.
   ආ. පාට පැන්සල්.
   ඇ. ස්ටේපලයක් හෝ ක්‍රියාකාරකම් කඩදාසි එකට තබා බැඳීමට හැකි වෙනත් යමක්.
   ඇ. 2-58 පිංතූරය. යේසුස් වහන්සේ වියළුණු අතක් ඇති මනුෂ්‍යයෙකු සුව කිරීම
7. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමයින්ව ඔබ දිරි ගන්වනවා නම් ඒ අනුව යන්න.

**සබත් දිනය විශේෂ දිනයකි.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

දින දර්ශනය පෙන්වා මුලු මාසයේම දින එය පෙන්වන බව ළමයින්ට පහදා දෙන්න. දින දර්ශනය භාවිතා කරන්නේ කුමකටද යන්න කෙටියෙන් විස්තර කරන්න.

- මෙම දින දර්ශනයෙහි අසාමාන්‍යය (විශේෂ) දෙය කුමක්ද?
- රතෙන් පාට කර තිබෙන්නේ කුමණ දිනයක්ද?
- මෙය විශේෂ දිනයක් වන්නේ කුමක් නිසාද? (එය සබත් දිනය නිසාය)

| | |
|---|---|
| ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම | අනාගයන්ට යහපත කිරීමටත් ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන ඉගෙන ගැනීමට සහ සිතීමටත්, ලෝකය පටන් ගත් දා සිට සතියේ එක් දිනක් වෙන් කර තිබෙන බව ළමයින්ට කියන්න. මෙම දිනය සබත් යැයි කියනු ලැබේ.<br><br>• සබත් දිනය සතියේ කුමණ දවසක්ද? |
| ශුද්ධ වූ ලියවිලි සහ වචන තීරු | නික්ම යෑම 20:8 ශබ්ද නගා කියවා වචන තීරු පෙන්වන්න. මෙම ශුද්ධ ලියවිල්ල ළමයින්ට එක්ව කීමට උපකාර කරන්න. මෙය ආඥාවක් බව ළමයින්ට කියන්න.<br><br>ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මතක් වීම පිණිස අප දේවල් කිරීම සබත් දිනය ශුද්ධව පැවැත්වීම යන්නෙහි අදහස වන අතර සභාවට යෑම, ශුද්ධ ලියවිලි කියවීම සහ වෙනත් ගෞරව කිරීමේ දේවල් කිරීමටය. |

**සබත් දිනය ශුද්ධව තබා ගැනීමට අපට හැකිය.**

| | |
|---|---|
| සාකච්ඡා | සබත් දිනයට සුදුසු ක්‍රියාකාරකම් වර්ග ළමයින් සමග සාකච්ඡා කරන්න. සබත් දිනය ශුද්ධව පවත්වා ගැනීම සඳහා අද දින ඔවුන් කළ දේවල් ගැන අහන්න. සභාවට යෑම, යාච්ඤා කිරීම, ගායනා කිරීම, සභා රැස්වීම් වලදී කථා පැවැත් වීම, යේසුස් වහන්සේ ගේ ඉගැන්වීම් ගැන ඉගෙන ගැනීම, සහ සක්‍ර-මේන්තුවට සහභාගී වීම, සබත් දිනය ශුද්ධව පැවැත් වීමට අපට කළ හැකි සමහරක් දේවල් බව අවබෝධ කර ගැනීමට ළමයින්ට උපකාර කරන්න.<br><br>ඉරිදා දිනයේ අප වැඩ නොකළ යුතු බව පහදා දෙන අතර, හැකි නම්, ස්වර්ගීය පියාණන් වහන්සේට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන සිතීමෙන් අපව වළක්වාලන දේවල් අප නොකළ යුතුය. |
| ක්‍රියාකාරකම් | ළමයින්ට සහභාගී වීමට හැකි ක්‍රියාකාරකම් සමහරක් විස්තර කරන්න. සබත් දිනයේදී කිරීමට සුදුසු යම් ක්‍රියාකාරකමක් නම් ළමයින්ට සිනහසීමටත්, සබත් දිනයේදී අප නොකළ යුතු ක්‍රියාකාරකමක් නම් රැවීමටත් කියන්න. පහත සඳහන් ඒවා හෝ ඔබගේ පංතියේ ළමයින්ට සුදුසු වෙනත් ඒවා හෝ භාවිතා කරන්න.<br><br>• සභාවට යෑම.<br>• නිවස පිරිසිදු කිරීම.<br>• නෑදෑයින් බැහැදැකීම.<br>• සාප්පු යෑම.<br>• චිත්‍ර පටයක් බැලීමට යෑම.<br>• ශුද්ධ වූ ලියවිලි හෝ වෙනත් හොඳ පොතක් කියවීම.<br>• යාච්ඤා කිරීම.<br>• ක්‍රීඩාවකට සහභාගී වීම හෝ නැරඹීම.<br>• ලිපි ලිවීම.<br>• ඇවිදින්ට යෑම.<br>• ශුද්ධ ලියවිලි ක්‍රීඩා සෙල්ලම් කිරීම.<br>• රෝගී පුද්ගලයෙකු බැහැදැකීම. |

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සබත් දිනය ශුද්ධව තැබූ සේක.**

ක්‍රියාකාරකමක් සබත් දිනයේදී අප කළ යුතු දෙයක්ද කියා දැනගැනීමට නිතර පහසු දෙයක් නොවන බව ළමයින්ට කියන්න. දැන ගැනීමට ඉතාම හොඳ ක්‍රමය නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආදර්ශය අනුගමණය කිරීමය.

ශුද්ධ වූ ලියවිලි කථාන්තර

2-58 පිංතූරය පෙන්වා, මතෙව් 12:10–13 සඳහන් යේසුස් වහන්සේ වියළුණු අතක් ඇති මනුෂ්‍යයෙකු සුව කිරීම යන කථාන්තරය කියන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේට සහ උන්වහන්සේ කළ දේවල් වලට ඵරිසිවරු අකමැති වූ බව පහදා දෙන්න. නීතියට වැරදි හෝ විරුද්ධ යමක් උන්වහන්සේ ලවා කියවීමට මාර්ගය යොදා උන්වහන්සේව කොටු කර ගැනීමට ඔව්හු උත්සහ දැරූහ. සබත් දිනයේදී යමෙකු සුව කිරීම වැරදි ක්‍රියාවක්ද කියා උන්වහන්සේගෙන් ඔව්හු ඇසූහ. එය එසේ යැයි උන්වහන්සේ ලවා කියවීමට ඔවුන්ට අවශ්‍ය විය.

ඵරිසිවරයෙකුට සිටි බැටළු පැටවෙකු සබත් දිනයේදී වළකට වැටුණොත් ගොඩ ගැනීමට උපකාර වන බවට යේසුස් වහන්සේ පෙන්වා දුන් බව ළමයින්ට කියන්න. බැටළු පැටවෙකුට වඩා මනුෂ්‍යයෙකු උතුම් බැවින් සබත් දිනයේදී මනුෂ්‍යයෙකුට උපකාර කිරීම යහපත් දෙයක් බව කීසේක. මතෙව් 12:12 දෙවෙනි කොටස (එබැවින් යන තැන සිට) ශබ්ද නගා කියවන්න.

යේසුස් වහන්සේ යම් දෙයක් කරන සේක්ද, එනම් යමෙකුට උපකාර කිරීම හෝ කරුණාවන්ත වැනි දෙයක් නම්, සබත් දිනයේ එය කිරීම යහපත් බව ළමයින්ට මතක් කරන්න.

**සබත් දිනය ශුද්ධව තැබීමට සූදානම් වීම අවශ්‍ය වේ.**

සාකච්ඡා

සබත් දිනය ශුද්ධව තැබීමට නම්, සූදානම් වීම සඳහා සබත් දිනට පෙර යම් යම් දේවල් කිරීමට අවශ්‍ය වන බව පෙන්වා දෙන්න.

- ඔබ සහ ඔබගේ පවුලේ අය සබත් දිනයට සූදානම් වීම සඳහා කළ යුතු අවශ්‍ය දේවල් මොනවාද? (සභාවට ඇඳගෙන යෑමට රෙදි සෝදා මැදීම, නිවස පිරිසිදු කිරීම, සබත් දිනයට අනුභව කිරීම සඳහා ආහාර පිළියෙළ කිරීම, සහ සභාවට ගෙන යෑමට ශුද්ධ ලියවිලි හා වෙනත් ද්‍රව්‍ය සොයා ගැනීම යනාදිය පිළිතුරු වලට ඇතුලත් විය හැකිය.)
- මේවා ඔබ කළ යුත්තේ කවදාද?

ගීත

“සෙනසුරාදා” යන්න ගායනා කරන්න නැතහොත් වචන කියන්න. ගීතයේ සඳහන් ක්‍රියා අංග චලනයෙන් රඟ දැක්වීමට ළමයින්ට උපකාර කරන්න. (ඔබගේ පළාතේ සබත් දිනය ඉරිදා හැර වෙනත් දිනක් නම්, සෙනසුරාදා, ඉරිදා සහ සඳුදා යන වචන සුදුසු දින වලට වෙනස් කර ගන්න).

විශේෂ දිනයකි සෙනසුරාදා.
ඒදිනයි ඉරු දිනට අපගේ සූදානම:
පිරිසිදු කරයි අප නිවස, යයි වෙළඳ සැලට,
එයින් සඳුදා තෙක් නොකරමු අපි කිසිවක්.
ඇඳුම් මැද අප, පාවහන් පිරිසිදු කොට,
වැඩ-කරන-දිනයයි කියමු අපි එයට.
නිය පිරිසිඳු කර, ඔලුව සෝදා අපි,
ඉරු දිනට අප සූදානම්ය එවිට!

සබත් දිනය ශුද්ධව තබා ගැනීම පිණිස ලබන සතියේ සූදානම් වීමට ළමයින්ව දිරිගන්වන්න.

**සාරාංශය**

ක්‍රියාකාරකම්

සබත් දින ක්‍රියාකාරකම් වල පිටපතක් එක් එක් ළමයෙකුට දෙන්න. පත්‍රයේ මාතෘකාව ඔබත් සමග කියවීමට ළමයින්ට උපකාර කරන්න: "මගේ සබත් දින පොත." ඔබ කපා නොමැති නම් පිටු කපා වෙන් කිරීමට ළමයින්ට කියන්න.

සුදුසු සබත් ක්‍රියාකාරකම් විස්තර කරමින් පහත සඳහන් වාක්‍ය කියවන අතර, එක් එක් ක්‍රියාකාරකමක් පෙන්වන පිංතූරය තේරීමට ළමයින්ට උපකාර කරන්න.

- ස්වර්ගීය පියාණන් වහන්සේට හා යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ගෞරව කිරීමට හා උන්වහන්සේලා ගැන ඉගෙන ගැනීම පිණිස සබත් දිනයේ අපි සභාවට යන්නෙමු.
- අපගේ පවුලේ අය සමග ශුභාරංචිය අධ්‍යනය කිරීමට සබත් දිනය යහපත් දිනයකි. ශුද්ධ වූ ලියවිලි හා වෙනත් හොඳ පොත් කියවීමට අපට හැකිය.
- සබත් දිනය යාච්ඤාකිරීමේ දිනයකි. සභාවේදී ද, අපගේ පවුල් සමග, සහ අප තනි තනිවද යාච්ඤා කරන්නෙමු.
- ගීතිකා ගායනා කිරීමට සහ හොඳ සංගීතයට සවන් දීමට සබත් දිනයේදී අපට හැකිවේ.
- සබත් දිනයේදී අපගේ දින පොත් ලිවීමටද, අපගේ නෑදෑයින්ට, මිතුරන්ට, සහ ධර්ම දූතයින්ට ලිපි ලිවීමට හෝ පිංතූර ඇඳීමට අපට හැකිය.
- පවුලේ සාමාජිකයන් හෝ අසනීප වී සිටින අය හෝ හුදකලාවේ සිටින පුද්ගලයින්ව බැහැදැකීමට සබත් දිනය හොඳ දවසකි.

පාට පැන්සල් ළමයින්ට දී පිංතූර පාට කිරීමට ඉඩ දෙන්න. සබත් දිනය ශුද්ධව තබා ගැනීමට ඔවුන් කරන්ට යන දෙයක් ගැන පිංතූරයක් හිස් කොටුවෙහි ඇඳීමට ඔවුන්ට කියන්න.

ඔවුන් ගේ පොත් වල පිටු එකට තබා ස්ටේපල් කිරීමට හෝ ඇමිණීමට ළමුන්ට උපකාර කරන්න.

සාක්ෂි

සබත් දිනය ශුද්ධව තැබීමේ වැදගත් කම ගැන ඔබගේ සාක්ෂිය දරන්න. සබත් දිනයේ ඔබ කිරීමට කැමති එකක් හෝ දෙකක් සඳහන් කරමින්, ඒවා ඔබ කරන විට ඔබට හැඟෙන අන්දම කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. ස්වර්ගීය පියාණන් වහන්සේ හා යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන සිතමින් ඉගෙන ගන්නා විට සබත් දිනය ප්‍රීතිමත් දිනයක් විය යුතු වීම ගැන විශේෂ යෙන් පහදා දෙන්න.

ඔවුන්ගේ පොත් ඔවුන්ගේ පවුල් වල අයට පෙන්වා, ඔවුන් අද ඉගෙන ගත් දේ බෙදා ගැනීමට ළමයින්ව දිරිගන්වන්න. සබත් දිනය ශුද්ධව පවත්වා ගැනීමට ළමයින්ට මතක් කරවන ස්ථානයක, ඔවුන් ගේ පොත් තැබීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. සබත් දිනය ශුද්ධව පැවැත් වීමට, පංතියේ සාමාජිකයින්ට උපකාර කිරීම පිණිස ස්වර්ගීය පියාණන් වහන්සේට කීමට ළමයාට යෝජනා කරන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳින් ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව," අමතර මගපෙන්වීම් වලට බලන්න.

1. "මා ගිය විට සභාවට" (ළමා ගී පොත, පි. 157) පළවෙනි පදය ගායනා කරන්න නැතහොත් වචන කියන්න. ළමයින් නැගිට සිට ගායනා කරද්දී පහත සඳහන් අන්දමට අභිනය කිරීමට සලස්වන්න.

නිතර මම වෙමි සතුටු.
සභාවට ගිය විට මා (*පපුව මත අත් තබා සිනාසෙන්න*)
ඕගන් වාදනය මෘදුය මිහිරිය (*කණ් පිටුපසට අත් බොකුටු කර තබන්න*)
ඇඟිලි තුඩු වලින් යමි මම වාඩිවෙන්ට (*එක තැන ඇඟිලි තුඩු තබමින් තොල් මත ඇඟිල්ල තබා ගන්න.*)
ගුරුතුමීට මිතුරන්ට ආචාර කරමි මම (*ළඟ පුද්ගලයාට සෙමින් අතට අත දෙන්න*)
මම සභාවට ගිය විට. (*පුටුවේ වාඩිවෙන්න*)

2. ඇස් දෙකක්, කන් දෙකක්, සහ අත් දෙකක් රට හුණු ලෑල්ලේ අඳින්න. සබත් දිනය ශුද්ධව තබා ගැනීම සඳහා ශරීරයේ මෙම එක් එක් කොටසකින් කුමක් කිරීමට හැකිද යන්න ඔබට කීමට ළමයින්ට කියන්න.

නිදර්ශන:

ඇස් — ශුද්ධ ලියවිලි කියවීම, සභාවේ කථිකයන් හා ගුරුවරුන් දෙස බැලීම.
කණ් — අභිවෘධිමත් කරන සංගීතයට හා කථාන්තර වලට සවන් දීම, ප්‍රාථමික පාඩම් වලට සවන් දීම.
කට — ගීතිකා හෝ ප්‍රාථමිකයේ ගීත ගැයීම, පවුලේ සාමාජිකයන්ට සහ මිතුරන්ට කරුණාවන්ත දේවල් කීම.
අත් — ඈත ජීවත් වෙන පවුලේ සාමාජිකයින්ට පිංතූරයක් ඇඳීම, දින පොත ලිවීම.

3. "සබත් දවස, ශුද්ධ කොට පවත්වන්නට සිහි කර ගනුව" නික්ම යෑම 20:8 කටපාඩම් කර ගැනීමට ළමයින්ට උපකාර කරන්න.

4. "සබත් දවස සිහි කර ගන්න" (ළමා ගී පොත, පි. 155) ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

සබත් දින සිහි කරන්න,
නිතර ශුද්ධව තැබීමට.
සමිඳු ගන්වා ආසිරි පවිත්‍ර කළ එය,
අපට නමස්කාර කිරීමට.

# සබත් දිනය ශුද්ධ වූ දිනයකි.


| ඉරුදින. | සඳුදා. | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |


මගේ සබත් දින පොත.













# 38 වෙනි පාඩම

# සක්‍රමේන්තුව (රාත්‍රී බෝජනය) ගන්නා විට මම යේසුස් වහන්සේව සිහිපත් කරමි

**අරමුණ**

සක්‍රමේන්තු වෙලාවේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සිහිපත් කිරීම පිණිස එක් එක් ළමයෙක්ව පෙළඹවීමට.

**සූදානම**

1. ලූක් 22:7–20 සහ දහම සහ ගිවිසුම 20:75–79 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ශුභාරංචි මූලධර්ම (31110) 23 වෙනි පරිච්ඡේදයද බලන්න.
2. "මිහිරි කථාව කියවන විට මම සිතමි" (ළමා ගී පොත, පි. 56) සහ "සියල්ලන්ට ප්‍රේම කරන්න යේසු කීහ" (ළමා ගී පොත, පි. 61) යන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන ගීත එකක් හෝ දෙකක් ගායනා කිරීම පිණිස ළමයින්ට උපකාර කිරීමට සූදානම් වෙන්න. මම ගීතවලට සහ යේසුස් වහන් ගැන වෙනත් ගීත වලට වචන මෙම අත් පොතෙහි පිටුපස අඩංගු වී ඇත.
3. පිංතූරයකුත් උපයෝගී කර ගැනීමට හැකි නම්, ඔබ ප්‍රිය කරන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන කථාන්තරයක් කීමට සූදානම් වෙන්න.
4. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක් සහ දහම සහ ගිවිසුම.
   ආ. පාන් වලට සහ වතුරට සක්‍රමේන්තු බන්දේසි.
   ඇ. 2-29 පිංතූරය, සක්‍රමේන්තුව බෙදා ගැනීම (62021); 2-54 පිංතූරය, අන්තිම රාත්‍රි බෝජනය (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 225; 62174; 2-59 පිංතූරය, ක්‍රිස්තුස්,
5. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට අවශ්‍ය නම්, එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට සක්‍රමේන්තුව දුන් සේක.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

සක්‍රමේන්තු බන්දේසි ළමයින්ට පෙන්වන්න.

- මේවා භාවිතා කරන්නේ කුමකටද?

සක්‍රමේන්තු බන්දේසි සහ සක්‍රමේන්තුව ගැන ළමයින් දන්නා දේවල් ගැන කීමට ඔවුන්ට සලස්වන්න. අද පාඩම සක්‍රමේන්තුව ගැන බව ඔවුන්ට කියන්න.

ශුද්ධ ලියවිලි කථාන්තර හා සාකච්ඡා

2-54 පිංතූරය පෙන්වන්න, අන්තිම රාත්‍රි භෝජනය. ළමයින්ට එය හඳුනා ගැනීමට හැකිවූවා නම් පිංතූරයෙහි සිදුවන දෙය ගැන කීමට ළමයින්ට කියන්න. ඔවුන්ට පිංතූරය හඳුනා ගැනීමට නොහැකි වූවා නම්, මෙය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේ ගේ ප්‍රේරිත යන්ගේ පිංතූරයක් බව ඔවුන්ට කියන්න. යේසුස් වහන්සේව පෙන්වීමට ළමයින්ට කියන්න.

ලූක් 22:7–20 සඳහන්වන අන්තිම රාත්‍රි භෝජනය ගැන කථාන්තරය කියන්න.

යුදෙව් වරුන්ගේ විශේෂ ශුද්ධ වූ දිනයක් යැයි නම් කරන පාස්කු මංගල්‍යය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේ ගේ ප්‍රේරිතයන් පැවැත් වූබව පහදා දෙන්න. ප්‍රේරිතයන් සමග වළඳන අන්තිම ආහාර වේල මෙම මංගල්‍යය බව යේසුස් වහන්සේ දැන සිටි සේක. මෙම ආහාර වේල අප බොහෝ විට සඳහන් කරන්නේ අන්තිම රාත්‍රී බෝජනය වශයෙන්ය, යයි ළමයින්ට කියන්න.

යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට ප්‍රේම කළ බව පහදා දෙන්න. උන් වහන්සේ ගියාට පසු, උන්වහන්සේගෙ සභාවේ සාමාජිකයන්ට මග පෙන්වීම පිණිස උන්වහන්සේ ඔවුන්ව තෝරා ගත් සේක. උන්වහන්සේ ඔවුන්ට බොහෝ දේ ඉගැන්වූ අතර උන්වහන්සේ සහ උන්වහන්සේගෙ ඉගැන්වීම් ඔවුන් සිහි තබා ගැනීම උන්වහන්සේට අවශ්‍ය වූ සේක.

- යේසුස් වහන්සේව සිහි තබා ගැනීම ප්‍රේරිතයන්ට වැදගත් වූයේ කුමක් නිසාද?
- උන්වහන්සේව සිහි තබා ගැනීම පිණිස උපකාර වීමට යේසුස් වහන්සේ ප්‍රේරිතයන්ට කුමක් දුන් සේක්ද?

ලූක් 22:19 ශබ්ද නගා කියවන්න. ගැලවුම් කරුවාණන් කුඩා කෑලි වලට රොටි කඩා, ආශිර්වාද කොට, ප්‍රේරිතයන්ට කෑමට දුන් බව මෙම ශුද්ධ ලියවිල්ලෙන් කියන බව පෙන්වා දෙන්න. රොටි වනාහී උන්වහන්සේගේ ශරීරය ඔවුන්ට සිහිපත් කිරීමටත් ඔවුන් එය අනුභව කරන විට උන්වහන්සේව සිහිපත් කිරීමට ඔවුන්ට උන්වහන්සේ කීසේක.

එක් එක් ප්‍රේරිතයෙක් රොටි කෑල්ලක් කෑවාට පසු, මිදි වලින් සාදන ලද බීමකට යේසුස් වහන්සේ ආශිර්වාද කොට ප්‍රේරිතයන්ට දුන් සේක. එම බීම උන්වහන්සේගේ ලේ සිහිපත් කිරීමට බව උන්වහන්සේ ඔවුන්ට කී සේක. යේසුස් වහන්සේ මැරුණේ, ඔවුන් මැරුණාට පසු, සවර්ගීය පියාණන් වහන්සේ සමග ඔවුන්ට නැවත ජීවත් වීමට ඔවුන්ට හැකි වීම ගැන ඔවුන් ඒවා බීවාට පසු, සිහිපත් කළ යුතුය.

උන්වහන්සේ සහ උන්වහන්සේ ගේ ඉගැන්වීම් ප්‍රේරිතවරුන් සිහි තබා ගන්නවා නම්, හරි දෙය තේරීමට එය ඔවුනට උපකාර වීම ගැන යේසුස් වහන්සේ දැන සිටි බව පහදා දෙන්න.

- අන්තිම රාත්‍රී බෝජනයේ දී උන්වහන්සේ ගේ ප්‍රේරිතවරුන්ට යේසුස් වහන්සේ දුන් රොටි වලට සහ බීමට අපි කුමක් කියන්නෙමුද? (සක්‍රමේන්තුව)
- යේසුස් වහන්සේ ප්‍රේරිතවරුන්ට සක්‍රමේන්තුව දුන්නේ කුමක් නිසාද?

**යේසුස් වහන්සේව සිහිකිරීමට අපි සක්‍රමේන්තුව ගන්නෙමු.**

සාකච්ඡා

සක්‍රමේන්තුව බෙදා දීමේ 2-29, පිංතූරය පෙන්වා යේසුස් වහන්සේ ගේ ප්‍රේරිතවරුන් සක්‍රමේන්තුව ගත් ආකාරයටම අපද සක්‍රමේන්තුව ගන්නා බව ළමයින්ට මතක් කරන්න. (යේසුස් වහන්සේ ප්‍රේරිතවරුන්ට දුන් බීම වෙනුවට අප වතුර භාවිතා කරන බව ළමයින්ට පහදා දීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.)

- අප සක්‍රමේන්තුව ගන්නේ කවදාද?

අප සක්‍රමේන්තුව ගන්නා රැස්වීමට කියනු ලබන්නේ සක්‍රමේන්තු රැස්වීම කියාය. මකනිසාද එම රැස්වීමේ ඉතාම වැදගත් කොටස සක්‍රමේන්තුව බව පෙන්වා දෙන්න.

- අප සක්‍රමේන්තුව ගන්නේ කුමක් නිසාද?
- හරි දෙය තෝරා ගැනීමට සිහිපත් කිරීම පිණිස සක්‍රමේන්තුව අපට උපකාර කරන්නේ කෙසේද?

ශුද්ධ වූ ලියවිලි

සක්‍රමේන්තුව බෙදා ගැනීමට පෙර විශේෂ යාච්ඤාවක් කියන බව ළමයින්ට මතක් කරන්න. අප කිරීමට පොරොන්දුවන යම් දේවල් එම යාච්ඤාවෙන් ස්වර්ගීය පියාණන් වහන්සේට කියයි. අප සක්‍රමේනතුව ගන්නා විට, ස්වර්ගීය පියාණන් වහන්සේට අප තබන පොරොන්දු දෙකක්, සොයා ගැනීමට ඔවුන්ට හැකි වන බැවින්, පාන් වලට කියන යාච්ඤාව ඔබ කියවන විට සැලකිළිමත්ව සවන් දීමට ළමයින්ට කියන්න.

දහම සහ ගිවිසුම 20:77, ශබ්ද නගා කියවමින් වාක්‍ය ඛණ්ඩ විශේෂ යෙන් පහදා දෙන්න; "ඔබ වහන්සේ ගේ පුත්‍රයාණන් ගේ, ශරීරය සිහිපත් කිරීම පිණිස ඔවුන් එය අනුභව කරමින් ඔබ වහන්සේට සාක්ෂි දරණ" අතර "උන්වහන්සේ දෙන ලද පණත් නිතර තබමින් උන්වහන්සේව නිතර සිහි කිරීම පිණිසය."

"ඔබ වහන්සේට සාක්ෂි දරණ" යනු ස්වර්ගීය පියාණන් වහන්සේට අප පොරොන්දු වන බව ළමයින්ට කියන්න.

- අප කිරීමට පොරොන්දු වන දේවල් දෙක මොනවාද?

අප සක්‍රමේන්තුව ගන්නා එක් එක් අවස්ථාවකම, යේසුස් වහන්සේ සිහිපත් කරමින් උන්වහන්සේගේ පණත් තැබීමට අප පොරොන්දු බව බව පහදා දෙන්න.

**අප උදෙසා ඇති යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ ප්‍රේමය ගැන සක්‍රමේන්තු වේලාවේ දී අපට සිතිය හැකිය.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම්

2-59 පිංතූරය වන ක්‍රිස්තුස් පෙන්වන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගේ පිළිරුවක් එම පිංතූරයෙන් පෙන්වන බව පහදා දෙන්න. ග්‍රහලෝක සහ තාරකා සමහරක චිත්‍රයක් පසුබිමෙහි තිබේ. පිංතූරය ගැන ස්වල්ප වේලාවක් කථා කිරීමට ළමයින්ට ඉඩ දෙන්න.

ගැලවුම්කරුවාණන් සහ අපට තිබෙන උන්වහන්සේ ගේ ප්‍රේමය ගැන සක්‍රමේන්තු වේලාවේදී අප සිතිය යුතු බව පහදා දෙන්න. දැන් පෙන්වූ ආකාරයේ, අප දැක ඇති යේසුස් වහන්සේ ගේ පිංතූර ගැන සිහිපත් කිරීමට අපට හැකි වන අතර, යේසුස් වහන්සේ පිළිබඳ කථාන්තර ගැනද අපට සිතිය හැකිය.

කථාන්තර

පිංතූරයක් තිබේනම් එය උපයෝගී කර ගෙන, යේසුස් වහන්සේ ගැන ඔබ ප්‍රිය කරන කථාන්තරයක් කියන්න. එම පිංතූරයේ කථාන්තරයෙන් යේසුස් වහන්සේ මිනසුන්ට ප්‍රේමය පෙන්වන ආකාරය පැහැදිලි කරන්න.

ළමයින්ගේ සහභාගීත්වය

සෑම ළමයෙකුටම යේසුස් වහන්සේ ගේ කථාන්තරයක් හෝ උන්වහන්සේ පිළිබඳ ඔවුන්ට මතක ඇති යම් දෙයක් කීමට සලස්වන්න. ළමයින් මෙසේ කියන විට යේසුස් වහන්සේ ගේ ප්‍රේමය සහ ළමයින්ට උන්වහන්සේ ගේ මතකය පිළිබඳ මනාව පහදා දෙන්න.

යේසුස් වහන්සේ ගේ කථාන්තර ළමයින්ට මතක බැවින් ඔවුන්ව ප්‍රසංශා කරන්න. සක්‍රමේන්තුව වේලාවේදී මතක්කර ගැනීමට උන්වහන්සේ පිළිබඳ කථාන්තර බොහෝමයක් ඇති බව කියන්න. සක්‍රමේන්තුව වේලාවේදී අප යේසුස් වහන්සේ ගැන සිතමින් සහ උන්වහන්සේ අප කෙරෙහි ඇති ප්‍රේමය ගැන සිතන විට අපට උන්වහන්සේව මතක තබා ගත හැක.

ගීත

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ බොහෝ ගීතද අප දන්නා බව පහදා දෙන්න. සක්‍රමේන්තුව බෙදා දීමේදී ශබ්ද නගා අප ගායනා නොකළත්, යේසුස් වහන්සේ සිහිපත් කිරීමට අපට උපකාර වන ගීත වල වචන ගැන අපට සිතීමට හැකිය.

"එම මිහිරි කථාව මා කියන විට මම සිතමි" සහ "සියල්ලට ප්‍රේම කරන්න යේසු කීහ" යනාදී දන්නා ගීත එකක් හෝ දෙකක් ළමයින් සමග ගායනා කරන්න.

**සක්‍රමේන්තු වේලාවේදී ගෞරවනීය අන්දමට සිටීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිහිපත් කිරීමට අපට උපකාර වන්නේය.**

සාකච්ඡා

සක්‍රමේන්තු වේලාවේදී අප ගෞරවනීය අන්දමට සිටින විට, යේසුස් වහන්සේ ගැන සිතීමට වඩා පහසු බව පහදා දෙන්න.

- සක්‍රමේන්තු වේලාවේදී ගෞරවනීය අන්දමට සිටීමට අපට හැකි වන්නේ කෙසේද?

පහත සඳහන් අදහස් සඳහන් කර ගන්නවාද කියා සහතික කර ගන්න.

- සක්‍රමේන්තු යාච්ඤාවට සවන් දී අවසානයේදී "ආමේන්" කියන්න.
- දෙමව්පියන්ට හෝ වෙනත් පුද්ගලයින්ට කරදර නොකරන්න. ඔවුන්ටද යේසුස් වහන්සේ ගැන සිතීමට අවශ්‍ය වේ.
- සක්‍රමේන්තුවට පෙර පැන්සල්, පොත් හෝ වෙනත් උපකරණ පසෙකා තබන්න.
- නිශ්චලව අපගේ පුටුවේ වාඩි වී ඉන්න.
- උන්වහන්සේ ගැන කථාන්තර, ගීත, අප කෙරෙහි ඇති උන්වහන්සේ ගේ ප්‍රේමයද, උන්වහන්සේ අපට ඉගැන්වූ දේවල් ගැන සිහිපත් කරමින් යේසුස් වහන්සේ ගැන සිතන්න.
- අපට ලඟින්ම තිබෙන පාන් කැල්ල සහ වතුර කෝප්පය ගැනීම.
- සක්‍රමේන්තු කෝප්ප සමග සෙල්ලම් නොකර ආපසු තබන්න.

ක්‍රියාකාරකම්

සක්‍රමේන්තු වේලාව පැමිණ සක්‍රමේන්තු රැස්වීමට වාඩි වී සිටිනවා මෙන් සිතීමට ළමයින්ට කියන්න. කථා නොකර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු පෙන්වීමට ළමයින්ට කියන්න.

- යේසුස්වහන්සේ ගැන ඔබ සිතන බව පෙන්වීමට ඔබගේ කටින් ඔබට කුමක් කළ හැකිද?
- ඔබ ගෞරවාන්විතව සිටින බව පෙන්වීමට ඔබගේ ඔලුවෙන් ඔබට කුමක් කළ හැකිද?
- යේසුස් වහන්සේ ගැන ඔබ සිතන බව පෙන්වීමට ඔබගේ බාහුවෙන් සහ අත් දෙකෙන් ඔබට කුමක් කළ හැකිද?
- ඔබ ගෞරවාන්විතව සිටින බව පෙන්වීමට ඔබගේ පාද වලින් ඔබට කුමක් කළ හැකිද?

සක්‍රමේන්තුව බෙදා හරින වේලාවේ ඔවුන් සිටිය යුතු අන්දමට මිනිත්තු ස්වල්පයක් නිශ්චලව වාඩි වී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන සිතීමට ළමයින්ට සලස්වන්න. ඉන්පසු ඔවුන් යේසුස් වහන්සේ ගැන සිතූ දේවල් බෙදා ගැනීමට සලස්වන්න.

**සාරාංශය**

ක්‍රියාකාරකම්.

සක්‍රමේන්තු වේලාවේ ඔවුන්ට කළ හැකි හෝ සිතිය හැකි දේවල් ගැන ප්‍රකාශ සමහරක් ඔබ කියවන විට සැලකිළිමත්ව සවන් දීමට ළමයින්ට කියන්න. සක්‍රමේන්තු වේලාවේ ඔවුන් කළ යුතු හෝ සිතිය යුතු යමක් එම ප්‍රකාශයෙන් විස්තර කරනවා නම් ඔවුන් නැගිට සිටිය යුතු බව ළමයින්ට කියන්න. සක්‍රමේන්තු වේලාවේ ඔවුන් නොකළ යුතු හෝ නොසිතිය යුතු යමක් එම ප්‍රකාශයෙන් විස්තර කරනවා නම්, ඔවුන් වාඩි වී සිටිය යුතුය.

පහත සඳහන් ප්‍රකාශන හෝ ඔබේම නිරමාණ භාවිතා කරන්න:

- ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපට ප්‍රේම කරන බව සිහි තබා ගන්න.
- ක්‍රීඩා කිරීමට පිටතට යන බව සිතන්න.
- යේසුස් වහන්සේ රෝගීන් සුව කරන බව සිතන්න.
- ඔබගේ අසල්වැසියාට රහසින් කථාකරන්න
- පුටුවේ සිට දඟලන්න.
- සක්‍රමේන්තු ගීතය හා යේසුස් වහන්සේ ගැන වෙනත් ගීත ගැන සිතන්න.

- ස්වර්ගීය පියාණන් වහන්සේට යාච්ඤාවක් කියන්න.
- පිංතූරයක් අඳින්න නැත්නම් සෙල්ලම් බඩුවක් සමග ක්‍රීඩා කරන්න.
- යේසුස් වහන්සේ පිළිබඳ කථාන්තර සිහිපත් කරන්න.

සාක්ෂිය

යේසුස් වහන්සේ ගැන ඔබගේ සාක්ෂිය දරන්න. සක්‍රමේන්තුවට සහභාගී වීමට ලැබීම ගැන ඔබගේ හැඟීම ළමයින්ට කියන්න.

සක්‍රමේන්තු වේලාවේ යේසුස් වහන්සේ සිහිකරමින් ගෞරවනීය අන්දමට සිටීමට ළමයින්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “එනම් ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව,” අමතර මගපෙන්වීම් බලන්න.

1. “මම සිතමි යේසු ගැන” (ළමා ගී පොත, පි. 71), ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

   නිසලව සිටීම නැත අමාරු,<br>
   යේසු ගැන සිතීමට, කුරුසෙහි කන්ද උඩ,<br>
   මා කෙරෙහි දුක් විඳ කළ සියල්ලට;<br>
   නිසලව හිඳ ගැනීම අමාරු නොවිය යුතු.<br>
   මා වුවත් කුඩා අමාරු නොවිය යුතු,<br>
   සිතීමට යේසු ගැන නැත කිසිත් අමාරු.

   ඇවිද ගිය සැතපුම් දූලි මත සිතමි මම,<br>
   ප්‍රේම කිරීමට හා භක්තියට ළමයින්ට වූ පිහිට;<br>
   පුටුවේ සිට උස්ව මට අමාරු නොවිය යුතු,<br>
   යහතින් සවන් දී, පාද මගෙ නිසල කොට,<br>
   මා වුවත් කුඩා අමාරු නොවිය යුතු,<br>
   සිතීමට යේසු ගැන නැත කිසිත් අමාරු.

2. ප්‍රාථමිකයේ සභාපතිගේ අනුමැතිය ඇතිව, පූජකවරයෙකුට හෝ උපස්ථායකවරයෙකුට පංතියට පැමිණ ඔහුගේ වගකීම් ගැන කෙටි විස්තරයක් කිරීමට පිළියෙල කිරීම පිණිස සභා නායකයාට (හෝ ශාඛා සභාපතිවරයාට) කියන්න.

3. (පාඩමෙ අග සඳහන් වී තිබෙන) ගෞරවනීය අන්දමට වාඩිවී සිටින ළමයින්ගේ පිංතූරයේ පිටපත් සාදා, පාට කර, ප්‍රහේළිකා කැලි පහකට කපන්න. පහත සඳහන් එක් එක් ප්‍රශ්නයක් එක් එක් කෑල්ලක පිටුපස ලියන්න.

   - සක්‍රමේන්තු රැස්වීමේදී අප කරන ඉතාම වැදගත් දෙය කුමක්ද?
   - සක්‍රමේන්තු වේලාව පැමිණි විට පූජකවරයා කරන්නේ කුමක්ද?
   - උපස්ථායකවරයා සක්‍රමේන්තුව සමග කරන්නේ කුමක්ද?
   - සක්‍රමේන්තු වේලාවේදී අප වාඩි වී සිටිය යුත්තෙ කෙසේද?
   - සක්‍රමේන්තුව වේලාවේදී අප කුමක් ගැන සිතිය යුතුද?

බිම හෝ මේසය මත ප්‍රහේළිකා කෑලි අතුරන්න. ළමයෙකුට ප්‍රහේළිකා කෑලි තෝරා ගැනීමට සලස්වන්න. කඩදාසියේ පිටුපස තිබෙන ප්‍රශ්නය ළමයින්ගෙන් අසා පිළිතුරු දීමට ඔවුන්ට උපකාර කරන්න. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු දුන්නාට පසු, ප්‍රහේළිකාව එක්කර තැබීමට ළමයින්ට උපකාර කරන්න.

4. පහත සඳහන් පදය කීමට ළමයින්ට උපකාර කරන්න.


සක්‍රමේන්තුව.

මම මගේ අත් බැඳගනිමි, මම මගේ හිස නමමි.
නිසලව, නිසලව සිටිමි.
සක්‍රමේන්තුව ආසිරිගන්වන විට,
මම සිහිකරමි ඔබ.
Devota M. Peterson (ඩිවෝටා එම්. පීටර්සන්)

ළමයින්ට කටපාඩම් කර ගැනීමට උපකාර වන පිණිස එම පදය ස්වල්ප වතාවක් නැවත නැවත කියවන්න.

පදය නැවත කීමට පෙර පහත සඳහන් ප්‍රශ්න ඇසීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත:

- අප බැඳගෙන සිටින්නේ කුමක්ද?
- අප නමාගෙන සිටින්නේ කුමක්ද?
- සක්‍රමේන්තු වේලාවේදී අප නිශ්චලව සිටිය යුතුද, නැතහොත් ශබ්ද නැගිය යුතුද?
- සක්‍රමේන්තු වේලාවේදී අප සිතිය යුත්තේ කාගැනද?



# අන්‍යයන්ට සේවය කිරීම මගින් මට යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමණය කිරීමට හැකිය

39
වෙනි
පාඩම

**අරමුණ**

අන්‍යයන්ට සේවය කිරීම මගින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමණය කිරීමේ එක් එක් ළමයෙකුගේ ආශාව ශක්තිමත් කිරීමටය.

**සූදානම**

1. යොහාන් 13:1–17 සහ ඇදහිල්ලේ කරුණු 1:13 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ශුභාරංචි මූලධර්ම (31110), 28 වෙනි පරිච්ඡේදයද බලන්න.
2. " 'දෙන්න,' කීවේය කුඩා ඇල" (ළමා ගී පොත, පි. 236) සියලුම පද තුනද, "මගේ ගැලවුම්කරුගේ ප්‍රේමය හැඟෙයි මට" (ළමා ගී පොත, පි. 74) හතර වෙනි පදයද ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. මෙම ගීත වලට වචන අත් පොතේ පිටුපස අඩංගු වී ඇත.
3. ඔබ යම් කෙනෙකුට සේවය කළ බැවින් ඔබ ආශිර්වාද ලැබූ අවස්ථාවක් ගැන කීමට සූදානම් වී සිටින්න.
4. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ඇ. එක් එක් ළමයෙක් වෙනුවෙන් කඩදාසියක් සහ පැන්සල් හෝ පාට පැන්සල්
   ඈ. 2-60, පිංතූරය, යේසුස් වහන්සේ ගෝලයින්ගේ පාද සේදීම. (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 226: 62550)
5. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගත්වනවා නම් ඒ අනුව යන්න.

**අප අන්‍යයන්ට සේවය කිරීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වන්නේය.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ඔබ පාඩම පටන්ගන්නා විට, පාට පැන්සල් සමහරක්, කඩදාසි, හෝ වෙනත් උපකරණ "අත් වැරැද්දෙන්" පංතියේ හලන්න. ඔබට උපකාර කිරීමට ළමයින්ට අවස්ථාවක් දීම පිණිස එම උපකරණ ඇහිඳින්ට පෙර ස්වල්ප වේලාවක් සිටින්න. (ළමයි ස්වේච්ඡාවෙන් ඉදිරිපත් නොවූවොත්, උපකාර කිරීමට ළමයින්ට කියන්න.)

සේවය කිරීමට අවස්ථාවක් ලබා ගත් බැවින් ඔවුන්ට ප්‍රශංසා කරමින් ඔබට උපකාර කිරීම ගැන ළමයින්ට ස්තූති කරන්න. ආපසු යමක් ලබා ගැනීමට නොකියා, අන්‍යයන්ට අප උපකාර කිරීම සේවය යැයි කියනු ලබන බව පහදා දෙන්න. සේවය යන වචනය ඔබත් සමග නැවත කීමට ළමයින්ට සලස්වන්න.

ගීතය

" 'දෙන්න,' කීවේය කුඩා ඇල" සියලුම පද තුන ළමයි සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

යේසුස් වහන්සේ දුන් ආකාරයට අපද දිය යුතු බව අන්තිම පදයෙන් කියන බව පෙන්වා දෙන්න. යේසුස් වහන්සේ පොළොවේ සිටිය විට, උන්වහන්සේ නිතර අන්‍යයන්ට සේවය කළ බව ළමයින්ට කියන්න.

ශුද්ධ ලියවිලි කථාන්තර

යේසුස් වහන්සේ ගෝලයින්ගේ පාද සේදීම 2-60 පිංතූරය පෙන්වා, යොහාන් 13:1–17 සඳහන් කථාන්තරය කියන්න. උන්වහන්සේ ගේ සභාව ඉදිරියට ගෙන යෑම පිණිස උපකාර කිරීමට පිංතූරයෙහි පෙන්වන ලද ප්‍රේරිතවරුන්ව යේසුස් වහන්සේ කැඳවූ බව ළමයින්ට මතක්කරන්න.

පසුගිය පාඩමේදී අන්තිම රාත්‍රි බෝජනය ගැන ඔවුන් ඉගෙන ගත් දේවල් ළමයින්ට මතක්කරන්න. ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේ ගේ ප්‍රේරිතයන්ට සක්‍රමේන්තුව ගැන ඉගැන්වූවාට පසු, අන්‍යයන්ට සේවය කිරීමේ වැදගත්කම ගැන උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ සේක.

මිනිසුන් ඔවුන්ගේ පාද සෝදවා ගැනීම අසාමාන්‍ය දෙයක් නොවීය, මක්නිසාද බොහෝ මිනිසුන් පාවහන් පැළඳි නමුත් ඔවුන්ගේ පාද දූවිලලෙන් අපවිත්‍ර වූ බව පහදා දෙන්න. නමුත් සාමාන්‍යයෙන් මෙම වැඩය කළේ සේවකයෙක්ය. යේසුස් වහන්සේ ලවා පාද සේද වීම පේතෘස්ට අවශ්‍ය නොවීය, මක්නිසාද යේසුස් වහන්සේ සේවකයෙකු මෙන් ක්‍රියා කිරීම සුදුසු (හරි දෙයක්) නොවන නිසා යැයි ඔහු සිතූ බව පහදා දෙන්න.

උන්වහන්සේ ගැලවුම්කරුවාණන් වුවත්, උන්වහන්සේ ඔවුන්ට සේවය කළ යුතු බවට යේසුස් වහන්සේ ප්‍රේරිතවරුන්ට පහදා දුන් බව ළමයින්ට කියන්න. ඔවුන් එකිනෙකාට සේවය කළ යුතු බව ඔවුන් අවබෝධ කර ගැනීම උන්වහන්සේට අවශ්‍ය විය. උන්වහන්සේ ගේ ආදර්ශය අනුගමණය කරමින් අන්‍යයන්ට අප සේවය කිරීම යේසුස් වහන්සේට අවශ්‍ය බව, යොහාන් 13:15 ශබ්ද නගා කියවා පහදා දෙන්න.

සාකච්ඡා

- යේසුස් වහන්සේ ප්‍රේරිතයන් ගේ පාද සේදුවේ කුමක් නිසාද?
- ප්‍රේරිතයන් කුමක් කිරීම යේසුස් වහන්සේට අවශ්‍ය වූයේද?
- අප කුමක් කිරීම යේසුස් වහන්සේට අවශ්‍යයද?

උපකාරයක් කිරීමට අපට නොකීවත් නැතහොත් අපගේ උපකාරයට ප්‍රතිඵල නොලැබුනත්, අපට හැකි සෑම අවස්ථාවකම අප සේවය කිරීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වී ඇති බව පහදා දෙන්න. අන්‍යයන්ට අප සේවය කරන විට, අප යේසුස් වහන්සේව අනුගමණය කරන බව පෙන්වා දෙන්න.

**බොහෝ මාර්ග වලින් අන්‍යයන්ට සේවය කිරීමට අපට හැකිය.**

කථාන්තර

ඔහුගේ පවුලේ අයට සේවය කිරීමට මාර්ගයක් සිතූ එක් තරුණ පිරිමි ළමයෙකුගේ, පහත සඳහන් කථාන්තරය, ඔබගේ වචන වලින් කියන විට එයට සවන් දීමට ළමයින්ට කියන්න.

"නිදිබරව සිටි අවුරුදු හතක් වයසැති ඔහුට ධාන්‍යාගාරයට යන පාර සොයා ගැනීමට අපහසු වූයේ දැඩි අන්ධකාරය නිසාය. කුස්සියේ රාක්කයෙන් කිරි දොවන බාල්දිය රැගෙන, කිසිවෙකු අවදි නොවන අන්දමින් ඇඳෙන් නැගිට, ඇඳ පැළඳ ගෙන තරප්පු පේළියෙන් හිමිහිට බැස ගෙදරින් පිට වීමට දවස් ගණනක් ඔහු සැලසුම් කළේය.

"… [ජෝසෆ්] ඔහුගේ සහෝදරිය, මේරි වැස්සිගෙන් කිරි දොවනවා කීප වතාවක් දුටු වේය. ඔහු සිතූ පමණට එය පහසු නැති බව ඔහු සොයා ගත්තේය…. වැඩි වෙලා යෑමට පෙර ඔහුගේ ඇඟිලි හා මැණික්කටුව රිදෙන්ට පටන්ගත්තේය. විවේක ගැනීමට බොහෝ විට එය නැවැත්වීමට ඔහුට සිදු විය…

"කිරි දෙවීමට අදිටන් කරගත් පිරිමි ළමයාට එයට ගතවූ දිගු කාලය ගැන අවබෝධයක් නැති වූ අතර දවල් වී තිබෙනු දුටු විට ඔහු පුදුමයට පත්වූයේය…. අන්තිමට ඔහු ධාන්‍යාගාරයෙන් පිටවී ගෙදර යෑමට

පටන් ගත්තේය. ඔහු කුස්සියට ඇතුල් වන විට, උදේ ආහාරය පිළියෙල කරමින් සිටි මව උඳුන උඩින් බලා මෙසේ ඇසුවාය, 'ජෝසෆ් ඇයි, උදේ පාන්දර මොනවද ඔබ කරන්නේ?"

"පිරුණු කිරි බාල්දිය පිළිතුරු වශයෙන් ඔහු පෙන්වූ අතර, මවගේ අනුමත කිරීමේ සිනහව නිසා උණුසුම් සතුටක් ඔහුට දැනුනි. 'හොඳයි', ඇය කීවාය, ඔබ දැන් සෑහෙන්න ලොකු බැවින්, සෑම දිනකම උදේට කිරි දෙවීම ඔබගේ රැකියාවයි. ඇය ටිකක් සිට මෙසේ ප්‍රශ්න කළාය. 'නමුත් එම වැස්සිගෙන් කිරි දෙවීමට ඔබ ඔතරම් උනන්දු කුමක් නිසාද?"

"ජෝසෆ් ඉතාම උනන්දු මුහුණක් (ස්වභාවයක්) තම මවට පෙන්වමින් මෙසේ පිළිතුරු දුන්නේය, 'තාත්තා ඔහුගේ ධර්මදූත සේවයේ යෙදී සිටින බැවින් උදව් කිරීමට මට අවශ්‍ය විය. [මේරි] ට වෙනත් බොහෝ දේ කිරීමට තිබෙන බව ඔබ දන්නවා නේද, උදේ කිරි දෙවීම මට කිරීමට හැකිනම්, ඒ ගැන ඇය කරදර නොවිය යුතු බව මට හැඟුනේය!"

"... ඔහුගේ මව ඔහු වටා අත යවා තුරුළු කරගෙන මෙසේ කීවාය, 'ඔබගේ පියාට මම ලිපියක් ලියන විට, ඔහු බැහැරව සිටින විට, කිරි දෙවීමේ වගකීම භාර ගත්, ඉතා හොඳ තරුණ මිනිසෙකු ඔහුට සිටින බව කී විට ඔහු කොතරම් සතුටට පත් වෙනවා ඇද්ද!' " (Lucile C. Reading, "The Morning Chore," *Children's Friend*, Apr. 1970, p. 23). (ලුසීලි සී රීඩින්, "උදේ ගෙදර දොර වැඩ කටයුතු," ළමයින්ගේ මිතුරා, අප්‍රි. 1970, පි. 23)

මෙම තරුණ පිරිමි ළමයාගේ නම ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්ය, ඔහු වැඩුණු පසු සභාවේ දෙවෙනි සභාපති වරයා වූ බව ළමයින්ට කියන්න.

- ජෝසෆ් ෆීල්ඩින් සේවය කළේ කෙසේද?
- ඔහු සේවය කළේ කාටද?

ඇදහිල්ලේ කරුණු. සියලුම දෙනාට යහපත කිරීම ගැන අප විශ්වාස කරන බව දහතුන්වෙනි ඇදහිල්ලේ කරුණෙහි සඳහන් බව ළමයින්ට කියන්න. "සියලු මිනිසුන්ටම යහපත කිරීම කෙරෙහි.... අපි විශ්වාස කරමු" යන්න ළමයින්ට නැගිට කීමට ඔවුන්ට උපකාර කරන්න. (සියලු මිනිස්සු යනු සියලුම ජනතාව යන්න බව පහදා දීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.)

ක්‍රියාකාරකම්. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයෙකු (අනුගාමියෙකු) වීමට කැමති සියලුම ළමයින්ට නැගිට සිටීමට කියන්න. උන්වහන්සේගේ සියලුම ගෝලයන් අන්‍යයන්ට සේවය කිරීම යේසුස් වහන්සේට අවශ්‍ය බව ළමයින්ට මතක් කරන්න.

- අන්‍යයන්ට සේවය කිරීමට අපට හැකිවන්නේ කෙසේද?

අන්‍යයන්ට සේවය කිරීමේ මාර්ගයක් නම් කළ ඔහුට හෝ ඇයට වාඩිවීමට සලස්වන්න.

අන්‍යයන්ට සේවය කිරීමේ මාර්ගයක් සිතීමට අපහසු ළමයෙකු සිටීනම්, පහත සඳහන අදහස් හෝ ඔබගේ පංතියේ ළමයින්ට සුදුසු වෙනත් අදහස් හෝ ඔබට යෝජනා කිරීමට අවශ්‍ය වෙනවා ඇත.

- වයසින් අඩු කෙනෙකු ගැන කථාන්තරයක් කියන්න නැතහොත් කියවන්න.
- ඔබගේ දෙමව්පියන්ට හෝ ආච්චිට හෝ සීයාට හෝ පිංතූරයක් අඳින්න.
- ඔබගේ සහෝදරයා එලියට දමා තිබෙන සෙල්ලම් බඩු අස්කර තබන්න.
- කියන්ට පෙර රෑ කෑමට මේසය ලෑස්ති කරන්න.

## අප සේවය කරන විට අපි සතුටු වන්නෙමු.

සාකච්ඡා

- අප සේවය කරන විට සතුටු වන්නේ කවුද? (අප සේවය කරන ජනයා, අප සහ ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ යනාදිය පිළිතුරු වලට අඩංගු විය හැකිය.)

අප අන්‍යයන්ට සේවය කරන විට, අප උපකාර කරන ජනයා සතුටු වෙනවා පමණක් නොව, අපද සතුටු වන බව විශේෂයෙන් පහදා දෙන්න.

- අන්‍යයන්ට සේවය කරන විට එය ඔබව සතුටු කිරීමට සලස්වන්නේ කුමක් නිසාද?

ගීතය

"ගැලවුම්කරුවාණන් ගේ ප්‍රේමය දැනෙයි මට" යන්නෙහි හතරවෙනි පදය ළමයි සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න. (හතරවෙනි පදය ළමයි දන්නේ නැත්නම්, ඔබම ගායනා කිරීමට හෝ වචන කීමට ඔබට හැකි වන අතර ගීත ඛණ්ඩය ගැයීමට ළමයින්ව සම්බන්ධ කරවා ගැනීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

**සාරාංශය**

චිත්‍ර ක්‍රියාකාරකම්

අද දින සභාවේදී හෝ නිවසේදී නිම කළ හැකි සරල සේවාවන් ගැන සිතීමට ළමයින්ට උපකාර කරන්න. අද දින ඔහු හෝ ඇය ඉටු කරන සේවයක පිංතූරයක් ඇඳීම පිණිස එක් එක් ළමයෙකුට කඩදාසි, පාට පැන්සල් නැතහොත් පැන්සල් දෙන්න. ඔවුන්ගේ පිංතූර එකිනෙකාට පෙන්වා ඒවා විස්තර කිරීමට ළමයින්ට සලස්වන්න.

සාක්ෂිය

යමෙකුට සේවය කිරීමෙන් ඔබ ආශිර්වාද ලැබූ අවස්ථාවක් ගැන ළමයින්ට කියන්න. සත්‍යය වූ සතුට ලැබෙන්නේ අන්‍යයන්ට සේවය කිරීම මගින් බව සාක්ෂි දරන්න.

මෙම සතිය තුළදී අන්‍යයන්ට සේවය කිරීමේ මාර්ග කෙරෙහි සෝදිසියෙන් සිටීමට ළමයින්ව දිරි ගන්-වන්න. සේවය පිළිබඳ අත්දැකීම් ඊලඟ වතාවේදී පංතියට වාර්ථා කිරීම පිණිස ළමයින්ට කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

**සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්**

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් වශයෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව" අමතර මගපෙන්වීම් බලන්න.

1. පංතියේදී ළමයින්ට එක්ව ඉටු කළ හැකි සේවයක් කලින් පිළියෙල කර ගන්න. (සේවය සම්බන්ධව මෙම ක්‍රියාකාරකම සබත් දිනයට සුදුසු එකක් බවට සහතික කරගන්න.)

   නිදර්ශන:

   - ඔබගේ පංතියේ ළමයි ප්‍රිය කරන ප්‍රාථමික ගීතයක් ළදරු පංතියේ ළමයින්ට ගැයීමට, ළදරු පංතියේ ගුරුවරිය සමග පිළියෙල කර ගන්න.
   - ප්‍රාථමිකයේ සංගීතය මෙහෙය වන්නාට සහ පියානෝව වාදනය කරන්නාට දීම පිණිස ඔබට ස්තුතියි පත්‍ර සෑදීමට ළමයින්ට උපකරණ ගේන්න.
   - ලබන සතියේ හෝ ඊලඟ පංතියට පංති කාමරය සූදානම් කිරීමට අවශ්‍ය, එනම් රට හුණු ලෑල්ල මැකීම සහ පුටු ඉවත් කිරීම වැනි දේවල් කිරීමට ළමයින්ට උපකාර වෙන්න.

   ළමයි සේවයේ ක්‍රියාව ඉටුකළාට පසු, සේවය කිරීම ගැන ඔවුන්ගේ හැඟීම් ඔවුන් සමග සාකච්ඡා කරන්න.

2. එක් එක් ළමයා වෙනුවෙන් කුඩා කඩදාසි හදවත් තුනක් සාදන්න. "රහස් සේවා සමාජය" ඔබට ආරම්භ කිරීමට අවශ්‍ය බව ළමයින්ට කියන්න. ඔවුන්ගේ පංතියේ සාමාජිකයන්ට රහස් සේවා ඉටුකිරීමට මෙම හදවත් ගෙදර ගෙනයෑමට ළමයින්ව දිරිගන්වන අතර, රහස් සේවාවක් ඔවුන්

ඉටුකළ විට එම එක් එක් ස්ථානයක හදවතක් තැබීමට කියන්න. නිදර්ශනයක් වශයෙන්, සහෝද-රයාගේ හෝ සහෝදරියගේ ඇඳ සකස්කර කොට්ටය උඩ හදවතක් තැබීමට ඔබට හැකි වේ. අන්‍යයන් රහස් සේවා ඉටු කළ විට ඔවුන්ගේ හැඟීම් ඊලඟ සතියේදී වාර්ථා කිරීමට ළමයින්ට කියන්න.

3. "යේසු මෙන් වීමට මා දිරි වඩමි" (ළමා ගී පොත, පි. 78) දෙවෙනි පදය ගායනා කරන්න නැතහොත් වචන කියන්න. ගීතයේ වචන පොතේ පිටුපස අඩංගු වී ඇත.

4. බිම කුඩා රවුමකට ළමයින්ව වාඩිකරවන්න. ඇට මල්ලක් හෝ වෙනත් මෘදු ද්‍රව්‍යයක් ළමයෙකු වෙතට සෙමින් දමා යමෙකුට සේවය කිරීමේ ක්‍රමයක් නම් කිරීමට ඔහුට හෝ ඇයට කියන්න. ළමයා පිළිතුරු දුන්නාට පසු රවුමේ සිටින වෙන ළමයෙකුට ඇට මල්ල දැමීමට ඔහුට හෝ ඇයට සලස්වන්න. සෑම කෙනෙකුටම සේවයක් නම් කිරීමට අඩු වශයෙන් එක් වතාවක වත් ලැබෙන තෙක් එය කරගෙන යන්න.

5. ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් ගැන කථාන්තරය කියනවා වෙනුවට ආත්මයක අගය (53147) යන වීඩියෝ කැසට් එකෙන් "දීමනාව" (මිනි:16) යන්න ඔබගේ ප්‍රදේශයේ තිබේ නම් එය පෙන්වන්න.

6. ඔවුන් අන්‍යයන්ට සේවය කිරීමට උත්සහ දරනවා නම්, පහත සඳහන් එක් එක් සිද්ධියක් සාකච්ඡා කිරීමට හෝ රඟදැක්වීමට ළමයින්ට ඉඩ දෙන්න. (ඔබගේ පංතියේ ළමයින්ට අවශ්‍ය වන සුදුසු ආකාරයට එම සිද්ධීන් වෙනස් කර ගන්න):

   - සොකර් ක්‍රීඩා කිරීමට ඔබ යමින් සිටින්නෙහිය. ඔබට ඉක්මණට යෑමට අවශ්‍ය වූ නමුත්, ක්‍රීඩා පිටියට යන මාර්ගයෙහි ඔබ ඇවිදගෙන යන විට වැඩිහිටි කාන්තාවකගේ බඩු මල්ල බිම වැටෙනවා ඔබ දකින්නෙහිය.

   - මිතුරෙකුගේ නිවසේ ඔබ ක්‍රීඩා කරමින් සිටියෙහිය. ඔබට ඉතාම මහන්සිය. ඔබ වත්තට යන විට ඔබගේ පියා වත්තෙහි වැඩ කරමින් සිටිනවා ඔබ දකින්නෙහිය.

   - යමක් බීමට ඔබ කුස්සියට යන විට, රෑ කෑම භාජන ඔබගේ සහෝදරයා සෝදනවා ඔබ දකින්නෙහිය.

   - මිතුරන් සමහරෙක් සමග ඔබ නිවසට ඇවිදිමින් සිටින්නෙහිය. අසල් වැසියෙකුගේ වත්තෙහි තිබුනු කුණු බාල්දියක් බල්ලෙකු බිම දමා කුණු සෑම තැනම විසිරී තිබුනි. අසල්වැසියා බැහැරව ගොස් දින ගණනකට නොපැමිණෙන්නේය.

   - පාසැලේදී අලුත් ගැහැණු ළමයෙකු දැක ඇයව ඔබට හඳුන්වා දෙන්නෙහිය. ඔබ කෑම ගන්නා ස්ථානයඅලුත් ගැහැණු ළමයා අසයි. ඔබගේ මිතුරන් සමග දවල් ආහාරය ගැනීමට ඔබ සැලසුම් කර ඇත.

   - ඔබගේ පවුලේ අය සභාවට යෑමට සූදානම් වෙති. ඔබගේ පියාට රැස්වීමට සහභාගී වීමට තිබුන හෙයින් ගොස් ඇත. සූදානම් වීමට උපකාර අවශ්‍ය කුඩා සහෝදරයින් සහ සහෝදරියන් බොහෝ දෙනෙක් ඔබට සිටිති.

40

වෙනි

පාඩම

# අන්‍යයන්ට සමාව දීමට මට හැකිය

**අරමුණ**

යේසුස් වහන්සේ කළාක් මෙන්, අප අන්‍යයන්ට සමාව දෙන විට ප්‍රීතිය ලැබෙන බව එක් එක් ළමයෙකුට අවබෝධ කරගැනීම සඳහා උපකාර වීමටය.

**සූදානම**

1. ලූක් 23:13–34 සහ යොහාන් 18:12–14, 19–24; 19:1–5 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. "පිහිටවුව මැන ආදර පියාණෙනි" (ළමා ගී පොත, පි. 99) පළවෙනි පදය ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.
3. පහත සඳහන් වචන තීරු සාදන්න.

| |
|---|
| "පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව;<br>මක්නිසාද ඔවුන් කරන්නේ කුමක්ද කියා ඔව්හු නොදනිති" |

4. ඔබ සමාවදුන් අවස්ථාවක් හා එය ගැන ඔබට හැඟුණු අන්දම ගැන කීමට සූදානම් වෙන්න.
5. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. හදෙතෝ සටහන (CTR) (පළවෙනි පාඩම බලන්න.)
   ඇ. රටහුණු, රටහුණු ලැල්ල, සහ මකනයක්.
   ඈ. 2-56 පිංතූරය, යේසුස් වහන්සේගේ පරීක්ෂාව පිංතූර 2-61 කුරුසයේ ඇණගැසීම. (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 230; 62505)
6. සාරවත්කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමයින්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න. ඔවුන්ගේ සේවයේ අත්දැකීම් ළමයින්ට වාර්තාකිරීම ඇසීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

**අන්‍යයන්ට සමාව දීමට අපට හැකිය.**

ක්‍රියාකාරීත්වයට යොමුකිරීම.

පහත සඳහන් සිද්ධීන් ඔබ විස්තර කරන විට සැලකිලිමත්ව සවන් දීමට ළමයින්ට කියන්න. (ඔබගේ පංතියේ ළමයින්ට සුදුසු වන ආකාරයට අවශ්‍ය අන්දමට එම සිද්ධීන් සකස්කර ගන්න.)

පොත් සහ කඩදාසි රාශියක් (හෝ වෙනත් උපකරණ) අතින් රැගෙන ඔබ ගමන් කරන්නෙහිය. එකවරම යමෙකු ඔබගේ ඇඟේ හැපෙයි. ඔබ රැගෙන ගිය දේවල්ද බිමට වැටෙයි. ඔබගේ පොත් සහ කඩදාසි බිම සෑමතැනම විසිරී යයි.

- මෙවැනි යම් දෙයක් ඔබට කිසිදිනක සිදුවී ඇත්ද?
- ඔබට හැඟුනේ කෙසේද?

මෙම සිද්ධියට අසමාන අවසාන දෙකක් ඔබ විස්තර කිරීමට යන බව ළමයින්ට කියන්න. වඩා හොඳ අවසානය කුමක්ද කියා තේරීමට ඔවුන්ට කියන්න.

*අවසාන 1.*

ඔබගේ සියලුම දේවල් බිමට වැටුණු නිසා, ඔබ කනස්සල්ලට පත්වන්නෙහිය. ඔබගේ ඇගේ හැපුන පුද්ගලයා ඔබගෙන් කමාව අයදිමින් පොත් සහ පත්තර ඇහිඳීම පිණිස ඔහු ඔබට උපකාර වීමට ඉදිරිපත්වූ නමුත් ඔබ ඔහුට, "නැහැ!" යයි තරහෙන් කියමින් ඔහුව පසෙකට තල්ලු කරන්නෙහිය. ඔහු හෙට බොහෝ දේවල් රැගෙන යන විට ඔහුව තල්ලුකර දැමීමට හැකියැයි ඔබ බලාපොරොත්තු වන්නෙහිය.

*අවසාන 2.*

ඔබගේ සියලුම දේවල් බිමට වැටුණු නිසා ඔබ කණස්සල්ලට පත්වන්නෙහිය. ඔබගේ ඇගේ හැපුන පුද්ගලයා ඔබගෙන් කමාව අයදිමින් පොත් සහ පත්තර ඇහිඳීම පිණිස, ඔහු ඔබට උපකාර වීමට ඉදිරිපත්වූ විට, "ඔබට ස්තූතියි" ඔබ කියන්නෙහිය. දෙදෙනා විගස පොත් සහ පත්තර ඇහිඳින්නෝය. ඔහු උවමනාවෙන් ඔබව හප්පා බිම නොදැමූ බව එම පුද්ගලයාට ඔබ කියමින්, දෙදෙනාම සතුටින් ඇවිද ගියහ.

- කථාන්තරයට වඩා හොඳ අවසානය කුමක්ද?
- පළවෙනි එකට වඩා දෙවෙනි අවසානය වඩා හොඳවන්නේ කුමක් නිසාද?
- අප අකමැති දෙයක් හෝ අපව පීඩාවට හෝ තරහට පත්කරන දෙයක් යමෙකු කළ විට අප කුමක් කළ යුතුද? (අප ඔවුන්ට සමාව දියයුතුය.)

ගුරුවරයාගේ ඉදිරපත් කිරීම

යමෙකු අපට පීඩා හෝ තරහ කිරීමට යමක් කළ නමුත්, අප එම පුද්ගලයාට ආදරය හා කරුණාව දැක්වීම සමාව දීම යන්නෙහි අදහස බව පහදා දෙන්න. එම පුද්ගලයාට අපගේ අමනාප හැඟීම් කරුණාවන්ත හැඟීම බවට වෙනස් කිරීම සමහර විට එහි අදහස වෙයි. අප අන්‍යයන්ට සමාව දුන් විට, අප ඔවුන්ට පීඩා කිරීම හෝ නැවත ඔවුන්ට එසේ කිරීමට අපට අවශ්‍ය නොවන්නේය. ඔවුන් අපට කරුණාවන්ත නොවූවත් අප ඔවුන්ට කරුණාවන්ත වන්නෙමු.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන්‍යයන්ට සමාව දුන්සේක.**

ශුද්ධ ලියවිලි කථාන්තර

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, උන්වහන්සේට පීඩා කළ අයට සමාව දීම ගැන, බයිබලයෙන් කථාන්තරයක් ඔබ කියන්නට යන බව, බයිබලය පෙන්වා ළමයින්ට කියන්න. ලූක් 23:13–34 සහ යොහාන් 18:12–14, 19–24; 19:1–5 සඳහන් ක්‍රිස්තුස් වහන්සේගේ පරීක්ෂාව සහ කුරුසයෙහි ඇණගැසීම ගැන, කථාන්තරය කියන්න.

යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ප්‍රේරිතිවරු අන්තිම රාත්‍රී භෝජනය එක්ව අනුභව කළාට පසු, යේසුස් වහන්සේ ස්වර්ගීය පියාණන් වහන්සේට යාච්ඥා කිරීම පිණිස ගෙත්සෙමනෙට ගිය බව පහදා දෙන්න. යේසුස් වහන්සේ යාච්ඥාකර අවසන්වූවාට පසු, හේවායන් සමහරෙකු පැමිණ, ලනුවලින් උන්වහන්සේව බැඳ, උත්තම පූජකයාගේ මාලිගාවට ගෙන ගිය අතර එහිදී උන්වහන්සේව පරීක්ෂාවට භාජනය කරන ලදී.

2–56 පිංතූරය පෙන්වන්න, යේසුස් වහන්සේගේ පරීක්ෂාව.

එම පරීක්ෂාකාලය තුළදී, හේවායෝ බොහෝ අකරුණාවන්ත දේවල් යේසුස් වහන්සේට කළ බව පෙන්වා දෙන්න. උන්වහන්සේට ඔවුහු තැලුවෝය, කසපහර දුන්නෝය, කෙල ගැසූහ, කටු ඔටුන්නක් උන්වහන්සේගේ හිසට දමා, නොයෙක් නම් උන්වහන්සේට කීහ. නමුත් යේසුස් වහන්සේ තරහ නොවූසේක.

පිංතූර 2-61 පෙන්වන්න, කුරුසයේ ඇණ ගැසීම.

පරීක්ෂාවෙන් පසු, හේවායෝ යේසුස් වහන්සේව කල්වරි නම් කන්දට ගෙන ගොස් උන්වහන්සේව කුරුසයට තබා ඇණ ගැසූ බව ළමයිනට කියන්න. උන්වහන්සේට ඔවුන් කළ දේවල් වලට යේසුස් වහන්සේ හේවායන් සමග තරහ නොවූ බව ළමයින්ට පහදා දෙන්න. ඒ වෙනුවට හේවායින්ට සමාව දීමට උන්වහන්සේ ස්වර්ගීය පියාණන් වහන්සේට කී සේක.

ශුද්ධ ලියවිලි සහ වචන තීරු

උන්වහන්සේ මැරෙන්න මොහොතකට කලින් යේසුස් වහන්සේ කී දෙයට සවන් දීමට ළමයින්ට කියන්න. ලූක් 23:34 පළවෙනි වාක්‍ය ශබ්දනගා කියවන්න.

වචන තීරුව පෙන්වා ඉතිරි පංති කාලය සඳහා එය උඩ තබන්න. යේසුස් වහන්සේගේ ප්‍රකාශය ඔබත් සමග නැවත කීමට ළමයින්ට උපකාර කරන්න.

හේවායන් යේසුස් වහන්සේට අකරුණාවන්ත වූවත්, උන්වහන්සේ ඔවුන්ට සමාව දී, තවද ඔවුන්ට සමාව දීමට ස්වර්ගීය පියාණන් වහන්සේට කීබව පෙන්වා දෙන්න.

## ප්‍රීතිය ලඟාවෙන්නේ අප අන්‍යයන්ට සමාව දෙන විටය.

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

අප යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් වන විට උන්වහන්සේ කරන දේවල් කිරීමට අප උත්සහ දැරීම ගැන ළමයින්ට මතක්කරන්න. උන්වහන්සේට අකරුණාවන්ත වූ අයට, යේසුස් වහන්සේ නිතර සමාව දුන්සේක. අපට අකරුණාවන්ත අයට අපද සමාව දිය යුත්තෙමු.

ගීතය

"පිහිටවුන මැන, මට ආදර පියාණෙනි" යන්න ගායනා කරනන නැතහොත් වචන කියන්න. එම වචන වලට හොඳින් සවන් දීමට ළමයින්ට කියන්න. අන්‍යයන්ට සමාව දීමේ වැදගත්කම ගැන හැඟීමට අපට උපකාර වන පිණිස එම වචන යාච්ඤාවක් මෙන් ලියා ඇත.

පිහිටවුව මැනව මට, ආදර පියාණෙනි, සමාව දීමට නිදහසේ<br>
මට අකරුණාවන්ත සෑම දෙනාටම.<br>
දිනපතා මට පිහිටවුන මැනව, පියාණෙනි අයදිමි මම;<br>
ඔබට ලංවී, ලංවී විසීමට පිහිටවුන මැනව මට.

ළමයින්ට නැගිට ඔබත් සමග ගීතය ගායනා කිරීමට හෝ වචන කීමට සලස්වන්න. ඔවුන් එය ගායනා කරන විට වචන වල අදහස ගැන සිතීමට ළමයින්ව දිරිමත්කරන්න.

කථාන්තර සහ සාකච්ඡා

සමාව දීම ගැන දැනසිටි ළමයෙකු ගැන පහත සඳහන් කථාන්තරය කියන්න.

මිදුල පිරිසිදු කිරීමට කෙන්ට්ගේ මව ඔහුට කීවාය. මිදුලේ වැටී තිබුන සියලුම කොල, ගස් වලින් හා පැලෑටි වලින් වැටී තිබුන කුඩා අතු රේක්කයකින් එකතු කළේය. කෙන්ට් බොහෝ මහන්සි වී වැඩකර, සියලුම කොල සහ අතු එකතු කොට අන්තිමට එක ලොකු ගොඩකට ගැසුවේය. එවලේම ජෙඩ් පාර පහල සිට පැමිණ කුණු ගොඩ වෙතට දුව ගොස්, කොල සහ අතු සෑම පැත්තකටම විසිවෙන පරිදි පයින් ගැසුවේය. මිනිත්තු ස්වල්පයක් ඇතුලතදී, කෙන්ට් කළ සියලුම වැඩ නොකළාක් මෙන් විය.

- ජෙඩ් මෙය කළ විට කෙන්ට්ට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?

ජෙඩ් කළ දෙය කෙනට්ගේ සහෝදරයා දුටුවේය. කොල සහ අතු ගොඩ විසිරෙව්ව නිසා, කෙන්ට් ජෙඩ්ව පසුපස එළවා ඔහුට තලනු ඇතැයි ඔහු සිතුවේය.

- කෙන්ට්ට කළ හැක්කේ කුමක්ද?

යෝජනා ස්වල්පයක් ගැන සිතීමට ලමයින්ට උපකාර කරන්න. පසුව කථාන්තරය අවසාන කරන්න.

කෙන්ට් ජෙඩ් පසු පස දිව්වේය. ජෙඩ්ට තලනවා වෙනුවට, එදින ඔහුට තවත් වැඩ තිබෙනවාද කියා කෙන්ට් ඔහුගෙන් ඇසුවේය. ජෙඩ් ඔලුව වැනුවේය.

රේක්කයෙන් කොල එකතුකොට නැවත ගොඩක් ගැසීමට ජෙඩ් ඔහුට උදව් කරනවා නම්, ජෙඩ්ගේ වැඩට උදව් වීමට කෙන්ට් ඉදිරිපත් වූයේය. ජෙඩ් කැමතිවූ අතර, පිරිමි ළමයි දෙදෙනා එක්ව වැඩ කිරීමෙන් විනෝද වූවෝය.

සාකච්ඡා

කෙන්ට් ජෙඩ්ට සැලකුවාක් මෙන්, අප අන්‍යයන්ට සමාව දී කරුණාවන්තව සලකන විට, ප්‍රීතියේ හැඟීම් අප ඇතුලන්තයෙහි අතිවන්නේය. අප සමාව නොදෙන්නේ නම්, හිත් රිදීම සහ තරහ පවත්වා-ගෙන යෑමෙන්, අප සතුටට පත්නොවන්නෙමු. අපට සතුටු වීමට නම් අන්‍යයන්ට සමාව දීම අපට අවශ්‍ය වේ.

යම් සිද්ධීන් ළමයින්ට විස්තර කරමින්, එම සිද්ධියට අදාල ළමයා සමාව දුන්නාද නොදුන්නාද යන්න සාකච්ඡා කරන්න. විස්තර කරන ළමයා සමාව නොදුන්නේ නම්, ඇතුලාන්තයෙහි ප්‍රීතිය හැඟීම පිණිස, සමාව දීම පෙන්වීමට එම ළමයා කුමක් කළ යුතුද කියා ළමයින්ගෙන් අසන්න.

පහත සඳහන් සිද්ධීන් හෝ ඔබේම ඒවා නිර්මාණය කොට භාවිතා කරන්න.

1. ජෑන් ලස්සන පිංතූරයක් ඇඳ අවසන් කළ විගසම ඇයගේ කුඩා සහෝදරයා පැමිණ පාට පැන්සල-තින් එහි සෑම තැනම කුරුටු ගෑවේය. ජෑන් කලබල වී කෑගසමින් ඇයගේ සහෝදරයාගේ අතට ගැසුවාය.
   - ජෑන් සමාව දීම පෙන්වූවාද?
   - ඇතුලාන්තයෙහි ජෑන්ට කෙසේ හැඟුනාද කියා ඔබ සිතන්නෙහිද?
   - ඇයගේ සහෝදරයාට සමාව දීමට ජෑන්ට කුමක් කිරීමට තිබුනේද?
2. සෙල්ලම් පිටියේදී, දෝනා පැමිණ කැලීව බිමට තල්ලුකළාය. දෝනා සිනහසෙමින් ඉවතට දුවගියාය. පසු දින, දෝනා ඔන්චිල්ලාවෙන් වැටී දණහිස තුවාල කරගත්තාය. කැලී විගස දුව ගොස් නැගිටීමට ඇයට උපකාර කළාය.
   - කැලී සමාව දීම පෙන්වූවාද?
   - කැලීට ඇතුලාන්තයේ කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නේද?
3. වැඩ් වතුර ටිකක් බීමට උල්පත ලඟ බලාසිටියදී, ඔහුට ඉදිරියෙන් සිටි පිරිමි ළමයෙකු හැරී ඔහුගේ ඇඟට වතුර විසි කළේය. වැඩ්ගේ මුලු මුහුණම තෙමී තිබුනි, නමුත් ඔහු වචනයක්වත් නොකියා යන්ට ගියේය. පසු දින, වතුර බීමට වැඩ් එහි සිටින විට එම පිරිමි ළමයාම පැමිණියේය. පිරිමි ළමයාට වතුර විසිකිරීමට වැඩ්ට අවස්ථාවක් තිබුන නමුත් ඔහු එසේ නොකළේය.
   - වැඩ් සමාව දීම පෙන්වූවාද?
   - වැඩ්ට ඇතුලාන්තයෙහි කුමක් හැඟුනාද කියා ඔබ සිතන්නෙහිද?

**සාරාංශය**

නැවත බැලීමේ ක්‍රියාකාරකම්

නොම්මර 1 සිට 8 දක්වා රට හුණු ලෑල්ලේ ලැයිස්තුගත කරන්න. නොම්මරයක් මකා එම නොම්ම-රයට සමාන නැවත බැලීම් ප්‍රශ්නයට පිළිතුරු දීමට වාර අනුව ළමයින්ට සලස්වන්න. ඔබට විශාල පංතියක් ඇත්නම්, වැඩියෙන් ප්‍රශ්න සෑදීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

1. අන්‍යයන්ට සමාව දීම යන්නේ අර්ථය කුමක්ද?
2. කුරුසයේ උන්වහන්සේව එල්ලූ භේවායින්ට යේසුස් වහන්සේ ක්‍රියාකළේ කෙසේද?
3. භේවායින්ට කුමක් කිරීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වර්ගීය පියාණන් වහන්සේට කීසේක්ද?

4. කොලගොඩට ජෙඩ් පයින්ගැසූ විට කොන්ට්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?

5. කොන්ට් ජෙඩ්ට සමාව දුන්නේ කෙසේද?

6. ජෙඩ්ට සමාව දුන්විට කොන්ට්ට හැඟුනේ කෙසේද කියා ඔබ සිතන්නෙහිද?

7. පළිගැනීමට සොයනවා වෙනුවට කොන්ට් ඔහුට කරුණාවන්ත වූවිට ජෙඩ්ට කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?

8. අපට අකරුණාවන්ත අයට අප සමාව දෙන විට අපිට කෙසේ හැඟෙන්නෙමුද?

හදෙතො (CTR) සටහන සහ මුද්ද.

හදෙතෝ (CTR) සටහන පෙන්වන්න. සටහනේ වචන නැවත කීමට ළමයින්ට සලස්වන්න. යේසුස් වහන්සේ කළාක් මෙන් අප අන්‍යයන්ට සමාව දීමෙන් අප හරි දෙය තෝරා ගන්න බව අවබෝධ කරගැනීමට ළමයින්ට උපකාර කරන්න.

ළමයින් ඔවුන්ගේ හදෙතෝ (CTR) මුද්ද පැළඳ සිටිනවා නම් එය දෙස බැලීමට සලස්වන්න. අනයයන්ට සමාව දීමෙන් හරි දෙය තෝරන බව ඔවුන්ට මතක්කිරීම පිණිස ඔවුන්ගේ මුදු ඔවුන්ට උපකාර වන බව ළමයින්ට කියනන.

සාක්ෂිය

අප අන්‍යයන්ට සමාව දෙමින් ඔවුන්ට කරුණාවන්තව සලකන විට අපට ප්‍රීතිවීමට හැකි බවට සාක්ෂි-දරන්න. ඔබ හරි දෙය තෝරගෙන යමෙකුට සමාව දුන් අවස්ථාවක් ගැන කියන්න. සමාව දීමට ඔබ කැමතිවූ බැවින් එම පුද්ගලයා කෙරෙහි ඔබට ඇතිවූ හැඟීම් පහදා දෙන්න.

වෙලාව තිබේනම්, යමෙකුට සමාව දුන් අවස්ථාවක් ගැන කීමට ළමයින්ට සලස්වන්න.

මෙම සතිය තුළදී අන්‍යයන්ට සමාව දීමට විශේෂ පරිශ්‍රමයක් දැරීමට ළමයින්ව දිරිගන්වන්න. ඔවුන්ගේ පවුලේ අය සමග සමාව දීම ගැන සාකච්ඡා කිරීමට ළමයින්ට යෝජනා කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. අන්‍යයන්ට සමාව දීමට ළමයින්ට උපකාර-කරන පිණිස ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් ඉල්ලීමට ළමයාට යෝජනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතාකළ හැකිය “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව” අමතර මගපෙන්වීම් වලට බලන්න.

1. විශාල මල්ලක් හා ගල් ටිකක් ගෙනෙන්න. පුද්ගලයන් අපට අකරුණාවන්ත වූවිට, බොහෝ අවස්ථා වල්දී අප තරහෙන් හෝ පළිගැනීමට සොයන බව ළමයින් සමග සාකච්ඡා කරන්න. මෙම සාකච්-ඡාව කරන කාළය තුළදී, ගල් එක එක මල්ලට දමන්න.

   ගල් සෑහෙන ප්‍රමාණයක් මල්ලට දැමූ පසු, එය ඔසවාගෙන රවුමේ යාමට වාරඅනුව ළමයින්ට සලස්වන්න. එය ඔසවාගෙන යන විට අත්පුඩි ගැසීමට හෝ යමෙකු වැළඳගැනීමට උත්සහ කිරීම පිණිස ළමයින්ට කියන්න. ඔවුන් කරන අකරුණාවන්ත දේවල් ගැන අන්‍යයන් සමග තරහ වීම ගල් මල්ලක් ඔසවාගෙන යනවාට සමාන බව ළමයින්ට පහදා දෙන්න. එය අපට විශාල බරකි.

   ඔබ මල්ලෙන් ගල් ඉවතට ගන්නා විට “මම සමාව දෙන්නෙමි” යන්න කිහිප වතාවක්ම කීමට ළමයින්ට සලස්වන්න. ඉන්පසු නැවතත් මල්ල ඔසවාගෙන යෑමට ළමුන්ට සලස්වන්න. අන්‍යයන්ට අප සමාව දෙන විට තවදුරටත් මහත් බර ඔසවාගෙන යෑමට සිදුනොවන බව පහදා දෙන්න. අප සමාව දෙන විට වඩාත් ප්‍රීතියක් අපට දැනෙයි.

2. “මා කරන සේ කරන්න” (ළමා ගී පොත, පි. 276) ගායනා කරන්න නැතහොත් වචන කියන්න. ගීතයට වචන අත්පොතේ පිටුපස අඩංගුවී ඇත.


   ක්‍රියාවක් කිරීම පිණිස වාර අනුව තෝරා ගැනීමට ළමයින්ට සලස්වමින්, ස්වල්ප වතාවක් ගීතය නැවත කියන්න. අප යමෙකු අනුගමණය කරන විට, ඔවුන් කරන දේවල් අපද කරන බව ළමයින්ට මතක්කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමණය කිරීම අපට අවශ්‍ය නම්, අකරුණාවන්ත අයට සමාව දීම වැනි උන්වහන්සේ කළ දේවල්, අපද කළ යුතුය.

3. උත්පත්ති පොතේ 37 සහ 41–45 සඳහන් යෝසෙෆ්ගේ සහ ඔහුගේ සහෝදරයන් ගැන කථාන්තරය කියන්න. ළමයින් ලවා කථාන්තරය රඟදැක්වීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. යෝසෙෆ් ඔහුගේ සහෝදරයින්ට සමාව දුන් අන්දම ගැන ළමයින් සමග සාකච්ඡා කරන්න. (උත්පත්ති 45:1–15 බලන්න).

4. පාඩමේ අග ඇති පිංතූරයේ පිටපත් එක් එක් ළමයා සඳහා සාදන්න. ළමයින්ට පාට පැනසල් හෝ පැන්සල් දී පිංතූරයේ තිබෙන ළමයින්ගේ මුහුණු සතුටින් සිටින ආකාරයට ඇඳීමට සලස්වන්න. පිංතූර නිවසට ගෙන ගොස්, අන්‍යයන්ට සමාව දීමට ඔවුන්ට මතක්කරන ස්ථානයක තැබීමට කියන්න.

5. කෙන්ට් පිළිබඳ කථාන්තරය සහ පාඩමේ පිටු 219–20 සඳහන් සිද්ධීන් තුන රඟපෑමට ළමයින්ට සලස්වන්න. (පළවෙනි සිද්ධියේ, ජෑන් ඇයගේ සහෝදරයාට සමාව දෙන අන්දම රඟපෑමට ළමයින්ට සලස්වන්න). නැතහොත් ඔබගේ පංතියේ ළමයින්ට වඩාත් සුදුසු, ඒවාට සමාන සිද්ධීන් කිහිපයක් ළමයින් ලවා රඟදැක්වීමට නිර්මාණය කරන්න.

සමාවදීම අප සතුටට පත්කරයි.



# යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ ගැලවුම්කාරයාණන්ය

**41**
වෙනි
පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි නිසා, සියලුම දෙනා මළවුන්ගෙන් නැවත නැගිටින බව අවබෝධ කර ගැනීමට එක් එක් ළමයෙකුට උපකාර කිරීමටය.

**සූදානම**

1. මතෙව් 27:45–66, 28:1–8, ලූක් 24:13–46, සහ යොහාන් 19:30, 20:11–18 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ශුභාරංචි මූලධර්ම (31110) පරිච්ඡේද 11 සහ 12ද බලන්න.
2. 2-65 පිංතූරයේ එම ප්‍රමාණයටම කඩදාසියක් ගෙන කෑලි අටකට කපන්න. මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ (ශුභාරචි චිත්‍ර පිංතූර මෙවලම 239:62187) 1 සිට 8 දක්වා කෑලි වල නොම්මර ලියන්න. පන්වාදී තිබෙන පරිදි ප්‍රවේසමෙන් එම පිංතූරයට කෑලි තබා කඩදාසි ගාංචු වලින් හෝ අලවන කුඩා තීරු වලින් පිංතූර 2-65 ආවරණය කරන්න.

| | |
|---|---|
| 1 | 2 |
| 3 | 4 |
| 5 | 6 |
| 7 | 8 |

3. "එතුමා නැගිටිසේක" (ගීතිකා, අංක 199) ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. නැතහොත් එම ගීතයේ තැටියක් ගෙනෙන්න.
4. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. කැපූ සටහන් 2-5, කුරුසයේ ඇණ ගසන දර්ශනයක්, කැපූ සටහන 2-6, යේසුස් වහන්සේගේ ශරීරය එකීම; කැපූ සටහන 2-7, සොහොන් ගෙය; කැපූ සටහන 2-8, විශාල ගල; කැපූ සටහන 2-9, කාවල්ලු; කැපූ සටහන 2-10, දේවදූතයා; කැපූ සටහන 2-11, ආලේප සමග ස්ත්‍රීවරුන්; කැපූ සටහන 2-12, මළවුන්ගෙන් නැගිටි යේසුස් වහන්සේ. පාඩමට භාවිතා කරන පිළිවෙලට මෙම කැපූ සටහන් අඩුක්කර ගන්න.
   ඇ. 2-2 පිංතූරය, ළදරුවා සමග පවුල (62307); 2-35 පිංතූරය, ක්‍රිස්තුස් වහන්සේ සහ ළමයි (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 216; 62467); 2-62 පිංතූරය, මරියා සහ නැවත නැගිටි ස්වාමීන් වහන්සේ (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 233; 62186); 2-63 පිංතූරය, එම්මාවුස්හි මාර්ගය; 2-64 පිංතූරය, යේසුස් වහන්සේ උන්වහන්සේගේ තුවාල පෙන්වීම (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 234; 62503).
5. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතාකිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

## අපට කිරීමට නොහැකි යමක් යේසුස් වහන්ස් අප උදෙසා කළ සේක.

ක්‍රියාකාරීත්වයට යොමුකිරීම

2-2 පිංතූරය පෙන්වන්න, ළදරුවෙකු සමග පවුලක්. ළදරුවෙකු මෙන් පළමුවෙන් ඔවුන් පොළොවට පැමිණි දිනය ගැන සිතීමට ළමයින්ට සලස්වන්න.

- ඔබ ළදරුවෙක්ව සිටි කාලයේදී, ඔබටම කරගැනීමට නොහැකිවූ දේවල් ඔබගේ දෙමව්පියන් (හෝ පවුලේ වෙනත් සාමාජිකයන්) ඔබ වෙනුවෙන් කළේ මොනවාද?

ඔවුන්ගේ දෙමව්පියන් (හෝ පවුලේ වෙනත් සාමාජිකයෙකු) ඔවුන්ට කළ දේවල් ගැන සිතීමට ළමයින්ට උපකාර කරන්න. අඩුම වශයෙන් එක් දෙයක්වත් නම් කිරීමට එක් එක් ළමයෙකුට අවස්ථාවක් ලැබෙනවාද කියා සහතිකකර ගන්න.

- ඔබගේ දෙමව්පියන් (හෝ පවුලේ වෙනත් සාමාජිකයන්) ඔබටම ඔබ වෙනුවෙන් දැන් කිරීමට නොහැකි ඔවුන් කරන දේවල් මොනවාද?
- ඔවුන් මෙම දේවල් ඔබට කරන්නේ කුමක් නිසාද?

අපට අප වෙනුවෙන් කරගැනීමට නොහැකි දේවල් අපගේ දෙමව්පියන් සහ පවුලේ අනිත් සාමාජිකයන් අප වෙනුවෙන් කිරීමට සතුටුවන්නේය, මක් නිසාද ඔවුන් අපට ආදරය කරමින්ද අපට උපකාර කිරීමට ඔවුන්ට අවශ්‍යව ඇතිබව පහදාදෙන්න.

සාකච්ඡා

අපට අප වෙනුවෙන් කිරීමට නොහැකි යමක් කිරීමට අපට ඉතාම ආදරය කරන යමෙකු කැමතිවූ බව පහදාදෙන්න.

2-35 පිංතූරය පෙන්වන්න, ක්‍රිස්තුස් වහන්සේ සහ ළමයි.

- අපට ආදරය කරන මෙම පුද්ගලයා කවුද?

අප මෙම පොළොවට පැමිණීමට ප්‍රථම, අපගේ ගැලවුම් කරුවාණන් වීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉදිරිපත්වූ බව පහදා දෙන්න. උන්වහන්සේ මරණයට පත්වීමට කැමැතිවී මළවුන්ගෙන් නැවත නැගිටීම නිසා, අපට නැවත ස්වර්ගයේ වැඩසිටින පියාණන් වහන්සේ වෙතට ආපසු ගොස් ජීවත්වීමට හැකිවන බව එහි අර්ථයයි. අප වෙනුවෙන් මෙය කිරීමට බලය ඇති එකම පුද්ගලයා යේසුස් වහන්සේ පමණි. අප වෙනුවෙන් අපටම එය කිරීමට නොහැකිය.

- මළවුන්ගෙන් නැවත නැගිටීම යනු කුමක්ද?

අප මැරුනාට පසු අපගේ ආත්මය අපගේ භෞතික ශරීරය හැරයන බව පහදාදෙන්න. යේසුස් වහන්සේ මැරුනාට පසු මළවුන්ගෙන් නැවත නැගිටි ශරීරයක් මෙන් උන්වහන්සේගේ ආත්මය හා උන්වහන්සේගේ භෞතික ශරීරය ආපසු නැවත එක්වීමෙන් සදාකාලයට ජීවත් වීමට හැකිවිය. යේසුස් වහන්සේ මරනයට පත්වී මළවුන්ගෙන් නැවත නැගිටි බැවින්, අපිද මළවුන්ගෙන් නැවත නැගිටින්නෙමු.

## යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටිසේක.

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

අපගේ ගැලවුම් කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ඉතාම වැදගත් සිද්ධියක් වන අතර සෑම අවුරුද්දකම එම සිදුවූ දෙය සිහිපත් කිරීමට අපට උපකාර වන පිණිස එම විශේෂ දිනයේ අපි උත්සවයක් පවත්වන්නෙමු.

- මෙම විශේෂ දිනයට අප කියන්නේ කුමක්ද? (පාස්කු)

පාස්කු කාළයේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන ඔවුන් ඉගෙන ගන්නා බව ළමයින්ට මතක්කරන්න.

ශුද්ධ ලියවිලි කථාන්තර හා කැපූ සටහන්

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසයේ ඇණ ගැසීම, ශරීරයෙ තැන්පත් කිරීම, සහ මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන කථාන්තරය කියන්න. (මතෙව් 27:45, 57:66; 28:1–6 සහ යොහාන් 19:30 බලන්න). සුදුසු වෙලාවට කැපූ සටහන් උඩට එසවීමට ළමයින්ට ඉඩදෙන්න.

කුරුසයේ ඇණ ගැසීමේ දර්ශනය වන කැපූ සටහන 2-5 ඉහලට එසවීමට ළමයෙකුට සලස්වන්න

මධ්‍යම දවාලට පෙර යේසුස් වහන්සේව කුරුසයක් මතතැබූබව පහදා දෙන්න. මධ්‍යම දවාලේ ඉර දර්ශන පථයෙන් සැඟවුන අතර, දේශය මත පැය තුනක කාලයක් අන්ධකාරය පැතිරුනේය. (මතෙව් 27:45 බලන්න.)අපට දරාගැනීමට නොහැකි තරමට යේසුස් වහන්සේගේ වේදනාව දරුණු විය. දුක් විඳ මරණයට පත්නොවීමට යේසුස් වහන්සේට තෝරා ගැනීමට තිබුනි. නමුත් උන්වහන්සේ පොළොවට පැමිණ අප වෙනුවෙන් දුක් විඳ මරනයට පත්වීම පිණිස ස්වර්ගීය පියාණන් වහන්සේට උන්වහන්සේ පොරොන්දු වූසේක.

පොළොව කම්පාවී සෙලවුණු බව ළමයින්ට කියන්න. අන්ධකාරයේ රැකවල්ලා සිටි අයට මෙසේ කියා යේසුස් වහන්සේ කෑගසනවා ඇසුනි “නිමවුනේය” (යොහාන් 19:30) උන්වහන්සේගේ දුක්විඳීම කෙළවර විය. උන්වහන්සේ හිස නමාගෙන මරණයට පත්වූසේක. උන්වහන්සේගේ ආත්මය ශරීරය හැරගියේය.

- යේසුස් වහන්සේව කුරුසයේ ඇණ ගැසුවාට පසු, යේසුස් වහන්සේගේ මිතුරන්ට සහ ගෝලයන්ට කුමක් හැඟෙන්නට ඇත්දැයි ඔබ සිතන්නෙහිද?

කුරුසයේ ඇණ ගැසීමේ දර්ශනයේ කැපූ සටහන් පහත හෙළීමට ළමයාට සලස්වන්න.

2-6 කැපූ සටහන, යේසුස් වහන්සේගේ ශරීරය එතීම ඉහලට එසවීමට ළමයෙකුට සලස්වන්න.

යේසුස් වහන්සේගේ මිතුරෝ සහ ගෝලයෝ උන්වහන්සේගේ ශරීරය ප්‍රවේසමෙන් කුරුසය වෙතින් ඉවතට ගත්තෝය. එකල පැවති චාරිත්‍රය අනුව සුවඳ ද්‍රව්‍ය වලින් යුත් සිහින් කපු රෙදි වලින් උන්වහන්සේගේ ශරීරය එතූහ.

2-7 කැපූ සටහන, සොහොන්ගෙය, එසවීමට ළමයෙකුට සලස්වන්න.

ගැලවුම්කරුවාණන්ගේ මිතුරන්, උන්වහන්සේගේ ශරීරය සොහොන් ගෙය තුල තැබූ බව පහදාදෙන්න. සොහොන්ගෙය කුඩා කාමරයකි. බොහෝවිට එය විශාල ගලක කොටන අතර, එහි පුද්ගලයින් භූමදාන කළ හැකිය.

යේසුස් වහන්සේගේ ශරීරය එතීමේ කැපූ සටහන පහත හෙළීමට ළමයාට සලස්වන්න.

2-8 විශාල ගලක කැපූ සටහන සහ රැකවල්ලු 2-9 කැපූ සටහන, එසවීමට ළමයින්ට සලස්වන්න.

සොහොන්ගෙයි දොර ළඟ විශාල ගලක් තබා, රැකවල්ලු ගල ළඟ සිටිය බව ළමයින්ට කියන්න.

- සොහොන්ගෙයි දොරට ගලක් සහ රැකවලුන් තැබුවේ කුමක් නිසාද? (මතෙව් 27:62–66 බලන්න.)

යේසුස් වහන්සේගේ ශරීරය දින තුනක් සොහොන් ගෙයි තිබූ බව පහදා දෙන්න. ඉරිදා වූ තුන්වෙනි දවසේදී, නැවත පොළොව කම්පා වී සෙලවුනේය. (මතෙව් 28:1–2 බලන්න.)

කැපූ සටහන 2-10, දේවදූතයා, එසවීමට ළමයෙකුට සලස්වන්න.

ස්වර්ගයෙන් බැස දේවදූතයෙකු ඇවිත් සොහොන් ගෙයි දොර වෙතින් ගල අහකට පෙරළා දැමූ බව පහදා දෙන්න.

විශාල ගල ගැන කැපූ සටහන පහතට හෙළීමට ළමයාට සලස්වන්න.

- සොහොන්ගෙය රැකවල්ලා සිටි පුද්ගලයින්ට කුමක් වූයේද? (මතෙව් 28:4 බලන්න.)

රැකවලුන් ගැන කැපූ සටහන පහත හෙළීමට ළමයාට සලස්වන්න.

ආලේප සමග සත්‍රීවරුන්, කැපූ සටහන 2-11, එසවීමට ළමයෙකුට සලස්වන්න.

එම ඉරු දින උදෑසන, යේසුස් වහන්සේගේ අනුගාමිකයින් වූ මග්දලාගේ මරියා සහ තවත් ස්ත්‍රියක් සොහොන්ගෙය බලන්ට ගියෝය. (මතෙව් 28:1 බලන්න.)යේසුස් වහන්සේගේ ශරීරය මත සුගන්ධ සුවඳ ද්‍රව්‍ය ආලේප කිරීමට ඔවුන්ට අවශ්‍ය වූහ. (මෙය ඒ කාලයේ සිරිතක් විය.) සොහොන්ගෙය ලඟට පැමිණි විට, එහි තිබූ ගල අහකට පෙරළා තිබෙනවා ඔව්හු දුටුවෝය. සොහොන්ගෙය හිස්ව තිබුනි. යේසුස් වහන්සේගේ ශරීරය එහි නොවීය.

ස්ත්‍රීන් දේවදූතයා දුටු බවද, ඔවුන්ට භය නොවීමට ඔහු කී බවද පහදා දෙන්න. දේවදූතයා ස්ත්‍රීන්ට කී දෙය මතෙව් 28:5–6 ශබ්දනගා කියවන්න.

ඔවුන්ගේ කැපූ සටහන් පිංතූර පහතට හෙළීමට සියලුම ළමයින්ට සලස්වන්න. මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස් වහන්සේ, කැපූ සටහන 2-12, එසවීමට ළමයෙකුට සලස්වන්න.

"ඔළුතුමා නැගිටිසේක" යයි දේවදූතයා කී විට, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බව ඔහු ස්ත්‍රීන්ට කී බව පහදා දෙන්න. උන්වහන්සේගේ ආත්මය උන්වහන්සේගේ ශරීරයට ආපසු පැමිණි බැවින් උන්වහන්සේ නැවත ජීවත්වන සේක.

උන්වහන්සේ නැවත ජීවත්වන බව යේසුස් වහන්සේගේ ගෝලයින් සහ මිතුරන්ට ඇසුණු විට ඔවුන් ඉතාම සතුටු වූ බව ළමයින්ට කියන්න.

ගීතය

"එතුමා නැගිටි සේක" යන්නෙහි පළවෙනි පදය, ඔබ ගායනා කරන විට හෝ තැටියක් වාදනය කරන අතර මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස් වහන්සේගේ කැපූ සටහන ඉහළට ඔසවා තබා ගැනීමට ළමයෙකුට සලස්වන්න. ඉන් පසු කැපූ සටහන පහතට හෙළීමට ළමයාට සලස්වන්න.

එතුමා නැගිටි සේක! එතුමා නැගිටි සේක!
සතුටු හඬින් එය කියන්න.
තුන්දින සිරගෙය ඔහු බිඳහෙළයි;
මහ මුලු පොළොවම ප්‍රීති වෙයව්.
මරණය ජයගෙන, මිනිසා නිදහස්.
ඉෂ්ඨවූවා ජය ක්‍රිස්තුස්ගේ.

**මග්දලාගේ මරියාට සහ උන්වහන්සේගේ ගෝලයන්ට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවූ සේක.**

සාකච්ඡා

2-62 පිංතූරය පෙන්වන්න. මරියා සහ මළවුන්ගෙන් නැවත නැගිටි ස්වාමීන් වහන්සේ.

උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිට්ටාට පසු උන්වහන්සේගේ ගෝලයින් සමහරෙකුට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශවූ බව පහදා දෙන්න. උන්වහන්සේව ප්‍රකාශවූ ප්‍රථම පුද්ගලයා මග්දලාගේ මරියාය (යොහාන් 20:11–18). සොහොන් ගෙය ලඟ පිටත මරියා හඬමින් සිටින විට යේසුස් වහන්සේ ඇය වෙතට පැමිණි සේක.

- යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දැක උන්වහන්සේ නැවත ජීවත්වන බව දැනගත් මරියාට හැඟුනේ කුමක්ද කියා ඔබ සිතන්නෙහිද?

ශුද්ධ ලියවිලි කථාන්තර

එම්මා වුස්හි මාර්ගයේ 2-63 පිංතූරය පෙන්වා, ලූක් 24:13–46 සඳහන් කථාන්තරය කියන්න.

යේසුස් වහන්සේ ඔවුන් සමග කථාකිරීමට පටන්ගත් විට ගෝලයින් දෙදෙනා උන්වහන්සේව අඳුනා නොගත් බව පහදා දෙන්න. ඒදින සොහොන්ගෙය ලඟ සිදුවූ සියල්ල ගෝලයෝ යේසුස් වහන්සේට කීහ. ඔවුන් සමග ආහාර ගැනීමට යේසුස් වහන්සේ නැවතුන විට, උන්වහන්සේ රොටි කඩා, එයට ආශිර්වා-

දකොට ගෝලයින්ට කන්ට දුන්සේක. එවිට උන්වහන්සේ කවුද කියා ඔව්හු ඇඳින ගත්හ. යේසුස් වහන්සේ ඔවුන්ගේ දර්ශනයෙන් නොපෙනී ගිය සේක.

- යේසුස් වහන්සේ දුටුවාට පසු ගෝලයින්ට හැඟුනේ කුමක්ද කියා ඔබ සිතන්නෙහිද?
- ඔබ එක් ගෝලයක් වී යේසුස් වහන්සේ දුටුවා නම් ඔබ කුමක් කරන්නෙහිද?

යේසුස් වහන්සේ ඔවුන් දුටු බව අනිත් ගෝලයින්ට කීම සඳහා ගෝලයන් දෙදෙනා වහාම යේරුසලමට ගිය බව පහදා දෙන්න. සිදුවූ දෙය ගැන අනායයන්ට ඔවුන් කියමින් සිටියදී, යේසුස් වහන්සේ පැමිණි සේක.

ලූක් 24:36–37 ශබ්දනගා කියවන්න. යේසුස් වහන්සේ දුටු විට ගෝලයෝ භයට පත්වූහ, මක් නිසාද උන්වහන්සේ ආත්මයක් යැයි ඔවුන් සිතූබව පහදා දෙන්න.

යේසුස් වහන්සේ උන්වහන්සේගේ තුවාල පෙන්වීම, 2-64 පිංතූරය පෙන්වන්න.

උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බව ඔවුන්ට දැනගැනීම පිණිස ගෝලයන් උන්වහන්සේගේ ශරීරය අල්ලා බැලීම ක්‍රිස්තුස් වහන්සේට අවශ වූ බව පහදා දෙන්න. ලූක් 24:39–40 ශබ්දනගා කියවන්න.

කෑමට යමක්ද යේසුස් වහන්සේ ඉල්ලූ බව ළමයින්ට කියන්න. ඇටමස් වලින් යුත් උන්වහන්සේගේ භෞතික ශරීරය, උන්වහන්සේගේ ආත්මය සමග නැවත සම්බන්ධ වූ නිසා මළවුන්ගෙන් නැගිටි ශරීරයක් බව ගෝලයින්ට පෙන්වීමට උන්වහන්සේ ආහාර අනුභව කළ සේක. (ලූක් 24:41–43 බලන්න)

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බැවින්, අපි මළවුන්ගෙන් නැවත නැගිටින්නෙමු.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

පුද්ගලයන් මැරුණාට පසු ඔවුන්ට නැවත ජීවත්වීමට හැකිබව, අපගේ ගැලවුම්කරුවාණන් වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොරොන්දු වූ බව ළමයින්ට කියන්න. අප එක් එක්කෙනා යේසුස් වහන්සේ මෙන් නැවත නැගිට, යේසුස් වහන්සේ මෙන් මළවුන්ගෙන් නැවත නැගිටි ආශ්චර්යමත් ශරීරයක් ලබන බව ළමයින්ට කියන්න. යේසුස් වහන්සේ අපට ප්‍රේම කරන නිසා, උන්වහන්සේ මෙය සිදුවීමට සැලැස්වූ සේක.

ක්‍රියාකාරකම්

කඩදාසි කෑලි අටකින් ආවරණය කරන ලද පිංතූරය පෙන්වන්න. කඩදාසි වලින් වැසී සැඟවී තිබෙන්නේ විශේෂ පිංතූරයක් බව පහදා දෙන්න. 1සිට 8 දක්වා ඉලක්කමක් වාර අනුව තෝරා ගැනීමට ළමයින්ට සලස්වන්න. සමාන ප්‍රශ්නය අසා පිළිතුරු දීමට පංතියට ඉඩ දෙන්න. (අවශා අන්දමට ළමයින්ට උපකාර කරන්න.) පංතිය එක් එක් ප්‍රශ්නයකට පිළිතුරු දුන්නාට පසු, පිංතූරයේ එම කොටස පෙනෙන අන්දමට සුදුසු කඩදාසි කෑල්ල ඉවත් කිරීමට ළමයෙකුට සලස්වන්න.

පහත සඳහන් ප්‍රශ්න ක්‍රියාකාරකම් භාවිතා කරන්න. (නැතහොත් ඔබේම යමක් නිර්මාණය කරන්න)

1. මළවුන්ගෙන් නැවත නැගිටින්නේ කවුද (සියලුම දෙනා)
2. මළවුන්ගෙන් නැවත නැගිටීම යනු කුමක්ද? (නැවත ජීවත් වීමට; මරණින් පසු අපගේ ශරීරයත් ආත්මයත් නැවත සම්බන්ධ වීමට)
3. "ඔහු නැගිටි සේක" යන්න දේවදූතයා කී විට ඔහු අදහස් කළේ කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බවය)
4. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිට්ටාට පසු, උන් වහන්සේ කළ යම් දේවල් මොනවාද? (උන්වහන්සේ ඇවිද්ද සේක, කථාකළ සේක, කෑම අනුභව කළසේක, මග්දලාගෙ මරියාට සහ උන්වහන්සේගේ ගෝලයින්ට ප්‍රකාශවූ සේක, ගෝලයින්ට උන්වහන්සේගේ අත් සහ පාද ස්පර්ශ කිරීමට ඉඩදුන් සේක.)

5. අපගේ ගැලවුම්කරුවාණන් කවුද? (යේසුස් ක්‍රිස්තුස් වහන්සේ)

6. උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිට්ටාට පසු යේසුස් වහන්සේ ප්‍රකාශවූයේ කාහටද? (මග්දලාගේ මරියාට සහ උන්වහන්සේගේ ගෝලයින් බොහෝ දෙනෙකුට)

7. යේසුස් වහන්සේ දැන් ජීවත්වන සේක්ද? (ඔව්, ස්වර්ගයේ ස්වර්ගීය පියාණන් වහන්සේ සමග)

8. යේසුස් වහන්සේ අප වෙනුවෙන් මරණයට පත්වී මළවුන්ගෙන් නැවත නැගිට්ටේ කුමක් නිසාද? (උන්වහන්සේ අපට ප්‍රේම කරන බැවින් උන්වහන්සේ සහ සවර්ගීය පියාණන් වහන්සේ සමග නැවත අපට ජීවත් වීමට සැලැස්වීම අවශ්‍යවූ නිසාය.

සම්පූර්ණ පිංතූරයම අනාවරණය කළ විට, මෙය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි චිත්‍රයක් බව පහදා දෙන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බැවින්, සියලු දෙනාම මළවුන්ගෙන් නැවත නැගිටින බව, මෙම පිංතූරය දකින විට අපට මතක් වියහැකිය.

**සාරාංශය**

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ඔබගේ ප්‍රේමය සහ උන්වහන්සේ සහ උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන ඔබගේ හැඟීම් බෙදා ගනිමින් ඔබගේ සාක්ෂිය දරන්න. “එතුමා නැගිටි සේක” යන පුවත සියලු දෙනාටම යහපත් පුවතක් බව ළමයින්ට මතක්කරන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. අප මැරුණාට පසු අපට නැවත ජීවත් වීමට සැලැස්වූ උන්වහන්සේගේ පුත්‍රයාණන්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේව එව් බැවින් ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීමට ළමයාට යෝජනා කරන්න.

---

**සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්**

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව” අමතර මග පෙන්වීම් බලන්න.

1. 3 වෙනි පාඩමෙන් අත් සහ අත්මේස් උපකරණ පාඩම නැවත බලන්න. (13 වෙනි පිටුව බලන්න) මරණය අතෙන් අත්මේස් එක ඉවත් කරනවා වැනි දෙයක් බවට සමානත්වය පැහැදිළි කරගෙන යන්න. ශරීරය (අත් මේස් එක මෙන්) සෙලවීමට නොහැක, නමුත් ආත්මය (අත මෙන්) තවමත් ජීවත් වෙයි. මළවුන්ගෙන් නැවත නැගිටීමේදී, ආත්මය සහ ශරීරය නැවත සම්බන්ධවී, දෙකම නැවත ජීවත් වෙයි.

2. ළමයි නැගිට සිට තුන්වෙනි ඇදහිල්ලේ කරුණ ඔබත් සමග නැවත කීමට සලස්වන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත්වී මළවුන්ගෙන් නැවත නැගිටි බැවින් අප පණත් රකින්නේ නම්, අපද මළවුන්ගෙන් නැවත නැගිට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ ස්වර්ගීය පියාණන් වහන්සේ සමග, යම් දිනක නැවත ජීවත් වීමට අපට ලැබෙන්නේය. මෙම ඇදහිල්ලේ කරුණ කට පාඩම් කිරීමට ළමයින්ට පිහිටවීම සඳහා ඔබට අවශ්‍යවනු ඇත.

3. “සත්‍යයෙන් යේසු ජීවත් වෙයිද නැවත” (ළමා ගී පොත, පි. 64) යන්න ගායනා කරන්න නැතහොත් වචන කියන්න. පෙන්වා දී තිබෙන ක්‍රියා කිරීමට ළමයින්ට උපකාර කරන්න.

   සත්‍යයෙන් යේසු ජීවත් වෙයිද නැවත (*අල්ල උඩට සිටින සේ අත් පිටට අල්ලන්න*)?
   ඔව්, තුන්වෙනි දිනය පැමිණි විට (*ඇඟිලි තුනක් උඩට ඔසවන්න.*)
   නැගිට එතුමා සොහොන්ගෙයින් පිටව (*එක තැන ඇවිදින්න*);
   හඬගැසුවේ ඔහු මරියා නමින් (*කට වටේ අත් බොකුටු කර තබන්න*)

එතුමා පෙම් කරන අය වෙතට යේසු පැමිණියේද (*හදවත මත අත් තබා ගන්න*)?
ඔව්, ජනයා පාද ඇල්ලූ (*පහත් වී පාද අල්ලන්න*),
මාළුද මී වද හා
අනුභව කළේ සත්තකින් ඔහු (*කනවා මෙන් අංගචලනය කරන්න*).

ඇණ සලකුණු අත්වල විය (*අත පෙන්වන්න*)
හෙල්ලෙන් ඇන ඇළය තුලට තුවාල කර (*පැත්ත පෙන්වන්න.*)
සත්‍යයෙන් යේසු ජීවත් වෙයිද නැවත
එතුමා මැරුණ පසු (*අත් පිටට දමා, අල්ල ඔසවන්න*)?
ආ එසේය! මාද එලෙසය (*ඔලුව වනන්න*)!

4. ප්‍රාථමික සභාපතිගේ අනුමැතිය ඇතුව, පංතියට පැමිණ, ගැලවුම්කරුවාණන් කෙරෙහි ඔහුගේ හෝ ඇයගේ ප්‍රේමයද, මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන සාක්ෂිය බෙදා ගැනීමට කොට්ඨාශයේ හෝ ශාඛාවේ සාමාජිකයෙකුට ආරාධනා කරන්න.

5. ළමයින්ගේ ඇස් වසා ගෙන ඔවුන් අන්ධ අය මෙන් සිටීමට කියන්න. අප මළවුන්ගෙන් නැවත නැගිටි විට අන්ධභාවය හෝ වෙනත් ආබාධ තවත් ඇති නොවන බව පහදා දෙන්න. අපගේ ශරීර සම්පූර්ණ වන්නේය. සෑම කෙනෙකුටම දැකීමට, ඇසීමට, දිවීමට හැකිවන්නේය; කිසිම කෙනෙකුට ශාරීරික ප්‍රශ්න ඇති නොවන්නේය. කිසිවෙකු රෝගාතුර නොවන්නේය. ළමයින්ට ඔවුන්ගේ ඇස් ඇරීමට කියා, සම්පූර්ණ නිරෝගී ශරීර ඇති වීම කෙතරම් ආශ්චර්යමත් වන්නේද ගැන කථාකරන්න.

# 42 වෙනි පාඩම


# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව පොළොවේ පිහිටුවා ඇත

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවරයන්ගෙන් යුත් සභාව, ක්‍රිස්තුස් වහන්සේ පොළොවේ සිටින විට සංවිධානය කළ එම සභාවම බව එක් එක් ළමයෙකුට අවබෝධ කරගැනීමට උපකාර වීමටය.

**සූදානම**

1. දහම සහ ගිවිසුම 115:4 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න. ශුභාරංචි මූලධර්ම (31110) පරිච්ඡේද 16 සහ 17 ත් බලන්න.
2. "යේසුස් වහන්සේ ගැන කථා මට කියන්න" (ළමා ගී පොත, පි. 57) සහ "යේසුස් ක්‍රිස්තුස්ගේ සභාව" (ළමා ගී පොත, පි. 77) යන්නෙහි පළවෙනි පදය ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.
3. පාඩමේ අවසානයේ සඳහන්ව තිබෙන ලෝක සිතියම අධ්‍යනය කර ළමයින්ට හුරුපුරුදු, ඔබගේම ප්‍රදේශය හෝ රට වැනි ස්ථාන ස්වල්පයක් අඳුනා ගන්න.
4. පාඩම වේලාවේදී, රට හුණු ලැල්ලේ, බිත්තියේ හෝ බිම පෙන්වා තිබෙන පිංතූර මේ ආකාරයෙන් පෙනෙන්ට තිබිය යුතුය:




5. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක් සහ දහම සහ ගිවිසුම.
   ආ. අලවන පටි හෝ වෙනත් අලවන ද්‍රව්‍යයක් (අවශ්‍ය නම්)
   ඇ. 2-3 පිංතූරය, ක්‍රිස්තුස් නම්වූ යේසුස් (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 240; 62572); පිංතූර 2-19, යොහාන් බව්තීසම (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 208; 62133); 2-20 පිංතූරය, පිරිමි ළමයෙකු

බව්තිස්ම කිරීම (62018); 2-37 පිංතූරය, කන්ද උඩ දේශනාව (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 212; 62166); 2-38 පිංතූරය, පළමු දර්ශනය (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 403; 62470); 2-66 පිංතූරය, ක්‍රිස්තුස් වහන්සේ ප්‍රේරිතවරුන්ව පත්කිරීම (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 211; 62557); 2-67 පිංතූරය, යේසුස් වහන්සේ පළමු සක්‍රමේන්තුව ආසිරි ගැන්වීම; 2-68 පිංතූරය, මෙල්කිසෙදෙක් පූජකවරය නැවත පිහිටුවීම (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 408; 62371); 2-69 පිංතූරය, ළමයෙකු සක්‍රමේන්තුවට සහභාගීවීම; 2-70 පිංතූරය, ලොව පුරා ළමයි.

6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

---

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ සභාව ශුද්ධ දේශයෙහි සංවිධානය කළ සේක.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

පාඩමේ අවසානයෙහි ඇති ලෝක සිතියම ළමයින්ට පෙන්වන්න.

- මෙය කුමක්ද? (සිතියමක්)

සිතියම් සහ ඒවා භාවිතා කරන්නේ කුමකටද යන්න කෙටියෙන් සාකච්ඡා කරන්න. සිතියමේ ඔවුන් ජීවත් වන ස්ථානය ළමයින්ට පෙන්වන්න. ධර්මදූතයෙකු කොහෙන්ද, ඔහු සේවය කරන්නේ කොහේද, නැතහොත් කොට්ඨාශයේ හෝ ශාඛාවේ අලුත් පවුලක් කොහේ සිට පැමිණියේද යනාදී ළමයින්ට හුරු පුරුදු වෙනත් ස්ථාන සමහරක් පෙන්වන්න.

බොහෝ විට ශුද්ධ දේශයයි කියන ප්‍රදේශයක් මෙම සිතියමෙහි තිබෙන බව පහදා දෙන්න. එම ප්‍රදේශය පෙන්වන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වැඩුණේ, ජනතාවට ශුභාරංචිය ඉගැන්වූයේ, තවද උන්වහන්සේගේ සභාව සංවිධානය කළේත් මෙම ස්ථානයෙහි බව පහදා දෙන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන බොහෝ දේවල්ද ශුද්ධ දේශයේ ජනතාවට උන්වහන්සේ ඉගැන්වූ දේවල්ද ප්‍රාථමිකයේදී මෙම වසරේ ඔවුන් ඉගෙන ගත් බව ළමයින්ට මතක් කරන්න.

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

බයිබලය පෙන්වා අලුත් ගිවිසුම පෙරළන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ ශුද්ධ දේශයේ ජනතාව ගැන කථාන්තර මෙම ශුද්ධ ලියවිලි පොතෙහි අඩංගු බව ළමයින්ට මතක් කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධ දේශයේ උන්වහන්සේගේ සභාව සංවිධානය කළ අන්දම ගැන අලුත් ගිවිසුමෙහි අපට කියවීමට හැකිය.

පිංතූර සම්බන්ධ ක්‍රියාකාරකම්

උන්වහන්සේ පොළොවේ සිටින විට, ශුද්ධ දේශය තුළ, උන්වහන් සේයේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව සංවිධානය කිරීමේ සමහර කොටස් ඔබ සාකච්ඡා කිරීමට යන බව ළමයින්ට කියන්න. (කුරුසයේ ඇණ ගැසීමෙන් පසු, උන්වහන්සේ ඇමරිකාව බැහැදැකීමට ගොස් නීෆයිට්ස්වරු අතර එම සභාවම යේසුස් වහන්සේ සංවිධානය කළ බව පෙන්වා දීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.)

කන්ද උඩ දේශනාව, 2-37 පිංතූරය පෙන්වා, රට හුණු ලෑල්ලේ වම් කොණේ උඩ, බිත්තිය උඩ හෝ, පංතිය ඉදිරිපිට බිම තැබීමට ළමයෙකුට සලස්වන්න.

- පිංතූරයෙන් පෙන්වන්නේ කුමක්ද? (යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජනතාවට ඉගැන්වීම.)
- ඔබට මතක ඇති යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සමහර ඉගැන්වීම් මොනවාද?

උන්වහන්සේ ඉගැන්වූ ජනතාවට යේසුස් වහන්සේ ප්‍රේම කළ අතර, ඔවුන් ශුභාරංචිය දැනගැනීම උන්වහන්සේට අවශ්‍යවූ බව පහදා දෙන්න. මෙම දේවල් ඔවුන් කිරීම ස්වර්ගීය පියාණන් වහන්සෙට

අවශ්‍යව ඇත. යේසුස් වහන්සේ සභාව සංවිධානය කිරීමේ එක් කරුණක් නම් එය ජනතාවට ශුභාරංචිය ඉගෙන ගැනීමට උපකාර වන බැවින්ය. ජනතාව ක්‍රමානුකූල පිළිවෙලකට එක්රැස්කිරීම සංවිධානයේ අර්ථය බව පහදා දෙන්න.

- ජනතාව ශුභාරංචිය දැන ගැනීම යේසුස් වහන්සේට අවශ්‍යවූයේ කුමක් නිසාද? (උන්වහන්සේ ඔවුන්ට ප්‍රේම කරන අතර, ස්වර්ගීය පියාණන් වහන්සේ සමග නැවත ජීවත් වීම ගැන ඔවුන් දැන ගැනීම උනවහන්සේට අවශ්‍ය විය.)

යොහාන් බව්තීස්ත යේසුස් වහන්සේව බව්තීස්ම කරන 2-19 පිංතූරය පෙන්වා, කන්ද උඩ දේශනාව යන පිංතූරය යටින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

පිංතූරය ගැන ඔවුන් දන්නා යමක් ඔබට කීමට ළමයින්ට කියන්න. අප බව්තීස්ම විය යුතු ආකාරය ගැන යේසුස් වහන්සේ ආදර්ශයක් තැබූ බව පහදා දෙන්න. පූජකවරය උසුලන යමෙකු මගින් ගිල්වීමේ බව්තීස්මය යේසුස් වහන්සේගේ සභාවේ වැදගත් කොටසක්ය.

ක්‍රිස්තුස් වහන්සේ ප්‍රේරිතවරුන් පත්කරන, 2-66 පිංතූරය පෙන්වා, බව්තීස්ම කිරීමේ පිංතූරය යටින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

උන්වහන්සේගේ සභාවට මගපෙන්වීම සඳහා උපකාර වීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මිනිසුස් දොළොස්දෙනෙකු තෝරාගත් බව පහදා දෙන්න. (සියලුම මිනිසුස් පිංතූරයේ පෙන්වන්නේ නැත). මෙම මිනිසුන්ට ප්‍රේරිතවරුන් යයි කියනු ලැබේ. උන්වහන්සේගේ සභාවට මගපෙන්වීමටත්, ජනතාවට සේවය කිරීම පිණිසත් යේසුස් වහන්සේ ඔවුන්ට පූජකවරය දුන් සේක.

යේසුස් වහන්සේ පළමු සක්‍රමේන්තුවට ආසිරි ගන්වන 2-67 පිංතූරය පෙන්වා, ප්‍රේරිතවරුන්ගේ පිංතූරය යටින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

එම පිංතූරය ගැන ඔවුන් දන්නා යමක් ඔබට කීමට ළමයින්ට කියන්න. උන්වහන්ස් සිහිකිරීමට ඔවුන්ට උපකාර වන පිණිස, යේසුස් වහන්සේ ජනතාවට සක්‍රමේන්තුව දුන් බව ළමයින්ට මතක්කරන්න.

ක්‍රිස්තුස් නම්වූ යේසුස් 2-3 පිංතූරය පෙන්වා, පලමු සක්‍රමේන්තුවේ පිංතූරය යටින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව, සත්‍යයවූ සභාව බව සියලුම දෙනාට දැනගැනීමට යේසුස් වහන්සේට අවශ්‍යවූ බව ළමයින්ට කියන්න.

ගීතය

"යේසු ගැන කථා මට කියන්න" යන්නෙහි පළවෙනි පදයේ වචන නැගිට සිට ඔබ සමග ගායනා කිරීමට හෝ වචන කීමට ළමයින්ට සලස්වන්න.

යේසු ගැන කථා මට කියන්න, අසන්ට කැමතිය මා,
මෙහි සිටියානම් ඔහු අසව් මම ඔහුට කීයන දේ
මග දෙපස දේවල, මුහුද ගැන කථාන්තර,
යේසු ගැන කථාන්තර, කියන්න මට ඒවා.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ සභාව අප වෙනුවෙන් සංවිධානය කළ සේක.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

ක්‍රිස්තුස් වහන්සේගේ මරණින් පසු, ප්‍රේරිතයන් සභාව ගෙන ගිය ගිය බව පහදා දෙන්න. කෙසේ වෙතත්, ප්‍රේරිතයන් මළාට පසු, ජනතාවට යේසුස් වහන්සේ සහ ප්‍රේරිතවරු අමතක වීමට පටන්ගත්තේය. ඔව්හු පණත් වලට කීකරු නොවූහ, නැතහොත් යේසුස් වහන්සේගේ ඉගැන්වීම් තවදුරටත් අනුගමණය නොකලෝය. ඉක්මණින්ම, යේසුස් වහන්සේගේ සභාව වැඩිදුරටත් පොළොවේ නොපැවතුනේය. අවුරුදු සිය ගණනක් ගතවී බොහෝ වෙනත් සභාවල් පැවති නමුත් ඒවා එකකටවත් සත්‍යවූ පූජකවරය නොතිබුනේය.

පොළොවේ සියලුම ජනතාවට ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් තවමත් ප්‍රේම කළ බව ළමයින්ට කියන්න. ජනතාවට ශුභාරංචිය ඉගෙන ගැනීමට හැකිවන පරිදි යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව පොළොව මත තිබීම ඔවුන්ට අවශ්‍යවූ විය.

සිතියම

එක්සත් ජනපදයේ, නිව් යෝර්ක් නගරයෙහි, විසූ ජෝසෆ් ස්මිත්ට 1820 දී ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව දර්ශනය වූ බව ලෝක සිතියම නැවත පෙන්වා ළමයින්ට කියන්න. සිතියමෙහි නිව් යෝර්ක් නගරය පිහිටා තිබෙන ස්ථානය ළමයින්ට පෙන්වන්න.

පිංතූර සම්බන්ධ ක්‍රියාකාරකම්

පළවෙනි දර්ශනය පිංතූරය 2-38 පෙන්වා, කන්ද උඩ දේශනාව පිංතූරය ලඟින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

පිංතූරය ගැන ඔවුන් දන්නා යමක් කීමට ළමයින්ට සලස්වන්න. යේසුස් වහන්සේ පොළොවේ සිටින විට සංවිධානය කළ ආකාරයටම, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව සංවිධානය කිරීම පිණිස යේසුස් වහන්සේ ජෝසෆ් ස්මිත්ට අණකළ බව පහදා දෙන්න.

දහම සහ ගිවිසුමේ පිටපතක් පෙන්වන්න. (නැතහොත් එකට සම්බන්ධ පොත් තුනෙහි දහම සහ ගිවිසුමේ තොරතුරු ඇතුලත් මුල් පිටුව පෙන්වන්න.)යේසුස් වහන්සේ පොළොවේ සිටින විට, උන්වහන්සේගේ ඉගැන්වීම් අඩංගු අලුත් ගිවිසුම මෙන්ම, යේසුස් වහන්සේ ජෝසෆ් ස්මිත්ට සහ අපගේ කාලයේ වෙනත් අනාගතවක්තෘවරුන්ට දෙන ලද ඉගැන්වීම දහම සහ ගිවිසුමේ අඩගුවන බව පෙන්වා දෙන්න.

පිරිමි ළමයෙකු බව්තීස්ම කිරීම 2-20 පිංතූරය පෙන්වා යේසුස් ක්‍රිස්තුස් වහන්සේව බව්තීස්ම කිරීම පිංතූරය ලඟින් එය තැබීමට ළමයෙකුට කියන්න.

මෙම පිංතූරය ගැන කීමට ළමයින්ට සලස්වන්න. යේසුස් වහන්සේ බව්තීස්ම කළා මෙන්ම, එම ළමයාව ගිල්වීම මගින් (සම්පූර්ණයෙන්ම ජලයෙන් වැසෙන ආකාරයට) පූජකවරය උසුලන යම් කෙනෙකු මගින් බව්තීස්ම කරනු ලබන්නේය.

මෙල්කිසෙදෙක් පූජකවරය නැවත පිහිටුවීම, 2-68 පිංතූරය පෙන්වා යේසුස් වහන්සේ උන්වහන්සේගේ ප්‍රේරිතයන් පත්කරන පිංතූරය ලඟින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

මෙල්කිසෙදෙක් පූජකවරය නැවත පිහිටුවීම පිංතූරයේ පේතෘස්, යාකොබ් සහ යොහාන්ව පෙන්වන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් පූජකවරය දෙන ලද මුල්ම ප්‍රේරිතවරුන් තුන්දෙනා නම් පේතෘස්, යාකොබ්, යොහාන් බව පහදා දෙන්න. පේතෘස්, යාකොබ් සහ යොහාන් නැවත පොළොවට පැමිණ ජෝසෆ් ස්මිත්ට සහ ඔලිවඩ් කව්ඩ්‍රිට පූජකවරය දීමට යේසුස් වහන්සේ සැලැස්වූ බව ළමයින්ට කියන්න. සභාවේ මුල් සාමාජිකයන්ට අවශ්‍යවූවාක් මෙන්ම, අපටද පූජකවරය අවශ්‍ය බව යේසුස් වහන්සේ දැන සිටි සේක.

ළමයෙකු සක්‍රමේන්තුවට සහභාගීවීම 2-69 පිංතරය පෙන්වා, යේසුස් වහන්සේ පළමු සක්‍රමේන්තුවට ආසිරි ගන්වන පිංතූරය ලඟින් එය තැබීමට ළමයෙකුට සලස්වන්න.

- මෙම පිංතූරයෙහි සිදුවන්නේ කුමක්ද?
- අප සක්‍රමේන්තුව ගන්නේ කුමක් නිසාද?

ශුද්ධ දේශයේ ප්‍රේරිතයන්ට දුන් එම කාරණය සඳහාම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපටද සක්‍රමේන්තුව දෙන ලද බව පෙන්වාදෙන්න:උන්වහන්සේව සිහිකිරීමට අපට උපකාර වන පිණිසය.

පිංතූර දෙක අතර තිබෙන අන්දමට, යේසුස් නම්වූ ක්‍රිස්තුස් 2-3 පිංතූරය තබන්න.

ශුද්ධ දේශයේ උන්වහන්සේගේ අනුගාමිකයන් මෙන්ම, අප යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ සාමාජිකයන් බව පහදා දෙන්න.

ශුද්ධ වූ ලියවිලි

- අද යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ නම කුමක්ද?

දහම සහ ගිවිසුම 115:4 ශබ්දනගා කියවන්න. පසු දවස්වල යන්නෙහි අර්ථය අප දැන් ජීවත් වන කාළයද, ශුද්ධවන්තයින් යනු යේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලට කීකරු වන ජනතාවට බවද පහදා දෙන්න.

"යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයින්ගෙන් යුත් සභාවට මම අයිතිවෙමි" යන්න ළමයින්ට නැගිට සිට ස්වල්ප වතාවක් එක්ව කීමට සලස්වන්න.

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

පිංතූර පේළි දෙක කෙටියෙන් සසඳා, ශුද්ධ දේශයෙහි මෙන්ම, අදත් යේසුස් වහන්සේගේ සභාව එක සමාන බව විශේෂයෙන් පැහැදිළි කරන්න. ශුද්ධ දේශයේ ජනතාවට දුන් ආකාරයටම, අපටද උන්වහන්සේගේ ඉගැන්වීම් දී තිබේ.

සිතියම

ලෝක සිතියම නැවත පෙන්වන්න. නැවතත් ශුද්ධ දේශය පෙන්වා, යේසුස් වහන්සේ පොළොවේ සිටින කාලයේ, උන්වහන්සේගේ සභාවේ බොහෝමයක් සාමාජිකයන් ශුද්ධ දේශයේ ජීවත් වූ බව පහදා දෙන්න.

- යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ සාමාජිකයන් අද ජීවත්වන්නේ කොහේද?

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

ලොව වටා ළමයි 2-70 පිංතූරය පෙන්වා, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයින්ගෙන් යුත් සභාවේ සාමාජිකයන් ලොව පුරාම ජීවත්වන බව පහදා දෙන්න. පිංතූරයෙහි සිටින ළමයින් නොයෙක් නොයෙක් රටවල් වලින් පැමිණි අය බව පෙන්වා දෙන්න. රටවල් එකක හෝ දෙකක ජනතාව පමණක් නොව, සියලුම ජනතාව උන්වහන්සේගේ ඉගැන්වීම් ඉගෙන උන්වහන්සේගේ සභාවට අයිතිවීම යේසුස් වහන්සේට අයිතිබව පහදා දෙන්න.

ගීතය

"යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව" යන්න ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවට මම වෙමි අයිති.
දනිමි මම කවුද කියා, දනිමි දෙවිඳුගෙ සැලසුම.
මම ඔහුව ඇදහීමෙන් අනුගමණය කරමි.
මම ගැලවුම්කරු යේසු ක්‍රිස්තු විශ්වාස කරමි.
එම නමට කරමි ගරු.
මම හරි දෙය කරමි, මම එතුමාගේ ආලෝකය අනුගමණය කරමි.
මා සත්‍යය ඔහුගේ පවසමි.

**සාරාංශය**

එක සමාන ක්‍රීඩා

ක්‍රිස්තුස් නම්වූ යේසුස් 2-3 පිංතූරය හැරෙන්ට, රට හුණු ලෑල්ලේ මේසයේ හෝ බිම, පේළියේ තිබෙන සියලුම පිංතූර ඉවතට ගෙන, පිංතූර පහතට ගෙන මුහුණ පහතට තිබෙන සේ (නැතහොත් කුඩා ළමයින්ටනම් මුහුණ උඩට) පේළි දෙකකට බිම තබන්න.

මෙම ක්‍රීඩාවේ අරමුණ පිංතූර එකට සමාන කිරීම බව ළමයින්ට කියන්න. වරකට එක්කෙනෙක් බැගින් එක් එක් ළමයෙකුට පිංතූර දෙකක් හැරවීමට සලස්වන්න. පිංතූර එක සමාන නම් (නිදර්ශනයක් වශයෙන්, යේසුස් වහන්සේව බව්තීස්ම කරන පිංතූරය පිරිමි ළමයා බව්තීස්ම කරන පිංතූරයට සමාන නම්), යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ කුමණ කොටසක් එම පිංතූරය මගින් නියෝජනය වන්නේද කියා කීමට ළමයාට සලස්වන්න. පිංතූරය සමාන නොවනවා නම් මුහුණ පහතට තබා තිබුන අන්දමටම ආපසු තැබීමට ළමයාට සලස්වන්න. (පිංතූරයේ පිටුපස ඇති පිංතූරය නිසා ළමයි කලබල වෙනවා කියා ඔබ සිතන්නෙහි නම්, සමාන කිරීමට තිබෙන පිංතූරයේ පිටුපසට හිස් කඩදාසි කෑලි තබන්න)

සමාන කිරීමේ හතරම තිමවෙන තෙක් කරගෙන යන්න. ඔබට විශාල පංතියක් ඇත්නම්, පිංතූර නැවත මිශ්‍රකර නැවත නැවත ක්‍රීඩාව කිරීමෙන් සමාන කිරීමට සියලු දෙනාටම අවස්ථාවක් ලබා දීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තතන්ගෙන් යුත් සභාව, යේසුස් වහන්සේ පොළොවේ සිටන විට සංවිධානය කළ එම සභාවම බවට සාක්ෂි දරන්න. අද පාඩමේ සාකච්ඡා කළ ශුභාරංචියේ එක් දර්ශනයක් ගැන ඔබගේ හැඟීම් ළමයින්ට කියන්න. (බව්තීස්මය, පූජකවරය, හෝ සක්‍රමේන්තුව)

අද ඔවුන් ඉගෙන ගත් දේවල් ඔවුන්ගේ පවුලේ අය සමග කීමට ළමයින්ව දිරිගත්වන්න. පාඩමේද ඉගැන්වූ අදහස් ඉක්මණට නැවත බැලීම පිණිස උපකාර වීම සඳහා ප්‍රශ්න කිහිපයක් ඔබට ඇසීමට අවශ්‍ය වෙනවා ඇත.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස් වල ශුද්ධවන්ත ගෙන් යුත් සභාව වෙනුවෙන් ස්වර්ගීය පියාණන් වහන්සේට ස්තුති කිරීමට ළමයාට යෝජනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව” අමතර මගපෙන්වීම් බලන්න.

1. හයවෙනි ඇදහිල්ලේ කරුණේ පළවෙනි කොටස කට පාඩම් කිරීමට ළමයින්ට උපකාර කරන්න. මූලික සභාවේ සංවිධානය තුල පැවතුන බවට අපි විශ්වාස කරමු. මූලික සභාව යනු යේසුස් වහන්සේ පොළොවේ සිටි කාළය තුල ශුද්ධ දේශයෙහි පැවති සභාව බව පහදා දෙන්න.

2. කඩදාසි සහ පාට පැන්සල් හෝ පැන්සල් ළමයින්ට දී ඔවුන් සභාවේ හෝ සභාව වෙනුවට ඔවුන් රැස්වන ගොඩනැගිල්ලක සිටින පිංතූර ඇඳීමට සලස්වන්න. සභාව ගොඩනැගිල්ලකට වඩා වැදගත් බව අවබෝධ කරගැනීමට ළමයින්ට උපකාර කරන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට යම් දිනක ආපසු යෑමට හැකි වන අන්දමට අපට ජීවත්වීම සඳහා ඉගැන්වීමට උපකාර කරන සංවිධානයකි එය.


නිව් යෝර්ක් නගරය.
ශුද්ධ දේශය.

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණෙන සේක

43
වෙනි
පාඩම

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අනුගමණය කිරීමෙන් දෙවැනි ඊමට සූදානම් වීම පිණිස අවශ්‍යතාවයක් එක් එක් ළමයෙකුට ඇතිකර ගැනීමට උපකාරවීමටය.

**සූදානම**

1. මතෙව් 24:36, ලූක් 24:50–53, සහ ක්‍රියා 1:3, 9–11 යාච්ඤාවෙන් අධ්‍යානය කරන්න. ශුභාරංචි මූලධර්ම (31110) 43 වෙනි පරිච්ඡේදයද බලන්න.

2. අත්පොතේ අන්තිම පිටුවල ඝන කඩදාසියේ සඳහන් වන ක්‍රීඩාව "යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම්වීම" යන්නෙහි පිටපතක් සාදන්න. (පිටපතක් සාදාගැනීමට අපහසු නම්, අත් පොතෙන් එම කොල ප්‍රවේශමෙන් ඉවත්කර ගන්න. ඝන ක්‍රීඩා කඩදාසිය කාඩ් බෝඩ් එකකට හෝ පහසුවෙන් නොනැමෙන කඩදාසියක් මතට අලවන්න. අනාගතයේදී පංතිවලට භාවිතා කිරීම සඳහා මෙම ක්‍රීඩා කඩදාසිය ආරක්ෂාකර තබන්න.

   ඔබගේ පංතිය විශාල නම්, එකවරම කණ්ඩායම් දෙකකට ක්‍රීඩා කිරීමට හැකිවන පරිදි දෙවැනි පිටපතක් සෑදීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත. ප්‍රාථමිකයේ නායකයෙකුට හෝ එක් ළමයෙකුගේ දෙමව්පියන්ට දෙවැනි ක්‍රීඩාව අධීක්ෂණය කිරීමට පංතියට පැමිණෙන්ට කියන්න.

3. ක්‍රීඩාවට, කුඩා කඩදාසි කෑලි දොළහක් කපන්න. ඉලක්කම් 1 සිට 6 දෙවරක් භාවිතා කරමින්, එක් එක් කඩදාසියක ඉලක්කමක් ලියන්න. කඩදාසි නමා භාජනයක දමන්න.

4. ඔබට සමීප කෙනෙක් සුළු කාලයකට යන්ට ගිය අවස්ථාවක් ගැන කීමට සූදානම් වෙන්න. එම පුද්ගලයා දැකීමට නොමැතිවීම ඔබට පාඩුවක් වූ අතර ඔහුගේ ආපසු පැමිණීමට ඔබ සූදානම් වන ආකාරය සැලසුම් කරන අන්දම ගැන කථාකරන්න.

5. "ඔහු නැවත එන විට" (ළමා ගී පොත, පි. 82), දෙවෙනි පදය ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.

6. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්.
   ආ. කුඩා ද්‍රව්‍යයක්, එක් එක ළමයෙක් වෙනුවෙන් බොත්තමක් හෝ ගල් කැටයක් වැනි දෙයක්. ක්‍රීඩාවේ ලකුණු තැබීමේ සලකුණක් වශයෙන් මෙම ද්‍රව්‍ය භාවිතා කරනු ලබන්නේය. (පාටෙන්, හැඩයෙන් සහ ප්‍රමාණයෙන්) එක් එක් ද්‍රව්‍යයක් අනෙකට වඩා වෙනස්විය යුතුය, එවිට ඔවුන්ගේ තමාගෙ ලකුණු තබන සලකුණ හඳුනා ගැනීමට ළමයින්ට හැකි වේ.
   ඇ. 2-62 පිංතූරය, මරියා සහ මළවුන්ගෙන් නැවත නැගිටි ස්වාමීන් වහන්සේ (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 233; 62186); 2-64 පිංතූරය, යේසුස් වහන්සේ උන්වහන්සේගේ තුවාල පෙන්වීම (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 234; 62503); 2-65 පිංතූරය, මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 235; 62187); 2-71 පිංතූරය, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වර්ගයට නැගීම (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 236; 62497).

7. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**අපගේ ප්‍රේමවන්තයන්ගේ ආපසු පැමිණීම උදෙසා අප සූදානම් වන්නෙමු.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ඔබට සමීප කෙනෙක් සුළු කාළයකට යන්ට ගිය අවස්ථාවක් ගැන කියන්න. මෙම පුද්ගලයා ගියවිට ඔබට හැඟුණු අන්දම හා ඔහුගේ හෝ ඇයගේ ආපසු පැමිණීම ගැන ඔබ උනන්දුවෙන් බලා සිටින ආකාරය ගැන පහදා දෙන්න. ඔබගේ ප්‍රේම වන්ත අය ගෙදරට පැමිණීම සඳහා ඔබ යම් අන්දමකින් සූදානම් වූවා නම්, මෙම පුද්ගලයා නැවත දැකීම ගැන ඔබගේ හැඟීම් කියන්න.

ඔවුන් ප්‍රේම කරන අයෙකු සුළු කාලයකට ඉවත්ව ගිය අවස්ථාවක් ගැන සිතීමට ළමයින්ට උපකාර කරන්න. දෙමව්පියන් විනෝද ගමනක් යෑම, බබා ලැබීමට මව රෝහලට යෑම, හෝ සහෝදරයෙකු හෝ සහෝදරියකු නොහොත් පවුලේ වෙනත් සාමාජිකයෙකු ධර්මදූත සේවයට යෑම වැනි දේවල් එයට අඩංගු විය හැකි වේ. මෙම පුද්ගලයන් බැහැර යෑමේදී හා නැවත නිවසට පැමිණි විට ඔවුන්ට ඇතිවූ හැඟීම් ළමයින් සමග සාකච්ඡා කරන්න. අපගේ ප්‍රේමවන්තයින් යන විට ඔවුන් නොදැකීම ගැන ඔවුන් දුක්වීමද, ඔවුන් නිවසට පැමිණි විට අපගේ ප්‍රීතිය ගැනද විශේෂයෙන් පහදා දෙන්න. මෙම පුද්ගලයින් නිවසට පැමිණෙන විට, ගෙදර දොර පිරිසිදු කොට සැරසීම, විශේෂ ආහාර පිසීම හෝ විශේෂිත වූ ඇඳුම් පැළඳීම යනාදී දේවල් කරමින් ඔබ සහ ඔබගේ පවුලේ අය සූදානම් වූ ආකාරය පිළිබඳ කථාකිරීමට ළමයිනට ඉඩදෙන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණෙන සේක.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පොළොවේ ජීවත්වූ කාලයේ, එතුමාට බොහෝ ප්‍රේම කරන මිතුරන් සිටි බව පහදා දෙන්න. මෙම මිතුරෝ උන්වහන්සේව අනුගමණය කරමින් උන්වහන්සේගේ ඉගැන්වීම් වලට සවන් දුන්හ. උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ දේවල් ඔවුන් කළ බැවින්, උන්වහන්සේගේ ගෝලයින් යැයි ඔවුන්ට කියන ලදී.

යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට ප්‍රේම කළ බව පහදා දෙන්න. උන්වහන්සේ සහ පියාණන් වහන්සේ සමග නැවත ජීවත් වීම පිණිස, ඔවුන් කළයුතු දේවල් ඔවුන්ට ඉගෙන ගැනීමට උන්වහන්සේ ඔවුන්ට උපකාර කළසේක. ඔවුන්ට හරි දෙය තෝරාගැනීමට හැකි වන අන්දමට හරි දෙය සහ වැරදි දෙය අතර වෙනස තේරුම් ගැනීමට උන්වහන්සේ ඔවුන්ට උපකාර කළ සේක.

පිංතූර පිළිබඳ සාකච්ඡා

මරියා සහ මළවුන්ගෙන් නැවත නැගිටි ස්වාමීන් වහන්සේ, පිංතූර 2-62, සහ යේසුස් වහන්සේ උන්වහන්සේගේ තුවාල පෙන්වීම, 2-64 පිංතූරය පෙන්වන්න. යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිට්ටාට පසු උන්වහන්සේගේ ගෝලයින් බැහැදැක්ක බව, සති කිහිපයකට පෙර (41 වෙනි පාඩමේ) ඔවුන් ඉගෙන ගත් බව ළමයින්ට මතක් කරන්න. පිංතූර ගැන ස්වල්ප වේලාවක් කථා කිරීමට ළමයින්ට ඉඩදෙන්න.

උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීමෙන් පසු යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ව බැහැදැක දින හතලිහක් උන්වහන්සේගේ ගෝලයින්ට ඉගැන්වූ සේක. (ක්‍රියා 1:3 බලන්න) උන්වහන්සේ නැවත ජීවත් වන බව ඔවුන් දැන ගැනීමද, උන්වහන්සේගේ ඉගැන්වීම් ඔවුන්ට තේරුනාද යන්න ගැන සහතික කරගැනීමට උන්වහන්සෙට අවශ්‍ය විය. ඔවුන් සමග උන්වහන්සේ තවදුරට නොසිටියත්, උන්වහන්සේගේ ඉගැන්වීම් වලට ගෝලයින් කීකරු වීම උන්වහන්සේට අවශ්‍ය විය.

ශුද්ධ ලියවිලි කථාන්තර

යේසුස් වහන්සේ ස්වර්ගයට නැගීම, 2-71 පිංතූරය පෙන්වන්න. ලූක් 24:50—53, සහ ක්‍රියා 1:9—11 විස්තරකර තිබෙන පරිදි, ක්‍රිස්තුස් වහන්සේගේ ස්වර්ගයට නැගීම ගැන කථාන්තරය ඔබගේම වචන වලින් කියන්න. පහත සඳහන් කරුණු විශේෂයෙන් පැහැදිලි කරන්න:

1. යේසුස් වහන්සේ ගෝලයින්ට ආශිර්වාදයක් දුන් සේක.

2. යේසුස් වහන්සේගේ ගෝලයින් කෙරෙහි මෙන්ම ස්වර්ගීය පියාණන් වහන්සේට ස්වර්ගයෙහි එක්වීමට වලාකුළකින් වසාගනු ලැබුවේය.

3. යේසුස් වහන්සේව නොපෙනී යන තෙක්ම ගෝලයෝ සිටගෙන බලා සිටියහ.

ගෝලයින් ස්වර්ගය දෙස බලා සිටියදී, සුදු වස්ත්‍ර ඇන්දාවූ දේවදූතයින් දෙදෙනෙකු පැමිණ ඔවුන් ලඟ සිටගත්හ.

ක්‍රියා 1-11 (කුමක් නිසා නුඹලා බලාසිටින්නේද) යන්නෙන් පටන්ගෙන දේවදූතයන් ගෝලයින්ට කී දේවල් ශබ්දනගා කියවන්න.

යම් දිනක යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, උන්වහන්සේ ගිය ආකාරයෙන්ම නැවත පොළවට පැමිණෙන බව ගෝලයින්ට දේවදූතයින් කී බව පහදා දෙන්න. මෙය අප සඳහන් කරන්නේ දෙවෙනි ඊම වශයෙන් බව ළමයින්ර කයන්න.

යේසුස් වහන්සේ නැවත පැමිණෙන දිනය නියම වශයෙන්ම අප නොදන්නා බව පෙන්වා දෙන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ පමනක් එම වේලාව නියම වශයෙන්ම දන්නා සේක. (මතෙව් 24:36 බලන්න) නමුත් යම් දිනක යේසුස් වහන්සේ පොළොවේ නැවත ජීවත් වීමට එන බව අපි දනිමු.

සාකච්ඡා

මළවුන්ගෙන් නැවත නැගිටි යේසුස් වහන්සේ, 2-65 පිංතූරය පෙන්වන්න

යේසුස් වහන්සේ නැවත පැමිණි විට, පොළොවෙ ජනතාව අතර උන්වහන්සේ ජීවත් වන බව පහදා දෙන්න. උන්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් වන යේසුස් වහන්සේ බව සියලුම දෙනා දැනගෙන, තවද උන්වහන්සෙට නමස්කාර කරන්නෝය.

- යේසුස් වහන්සේ නැවත එන විට ඔබ මෙහි සිටීමට කැමති වන්නෙහිද? කුමක් නිසාද?

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පැමිණි විට පොළොව කෙතරම් ආශ්වර්‍යමත් වන්නේද යන්න ළමයින් සමග සාකච්ඡා කරන්න. යේසුස් වහන්සේව දැකීමට, උන්වහන්සේ සමග කථා කිරීමට, ඇවිදීමට සහ උන්වහන්සේගේ ආදරවන්ත අත් ඔවුන් වටා යැවීමට ජනතාවට හැකිවන්නේය. යේසුස් වහන්සේ පැමිණියාට පසු සියලුම දෙනාම මිතුරන් වන්නෝය. දුෂ්ඨ පුද්ගලයන් නොමැති වන්නේය. දොර අගුලු දැමීමට අපට අවශ්‍ය නොවන්නේය, මක් නිසාද සියල්ලත් සියලුදෙනාත් ආරක්ෂා සහිත වන නිසාය. රෝගකාරක අසනීප හෝ වේදනාව අපට නොතිබෙන අතර, සියලුම සත්තු අප සමගත්, ඔවුන් එක එකා සමගත් මිතුරු වන්නෝය.

නැවත බැලීමේ ක්‍රියාකාරකම්.

දෙවෙනි ඊම ගැන පහත සඳහන් ප්‍රශ්න ළමයින්ගෙන් අසන්න. ප්‍රශ්න වලට උත්තර ඔවුන් දන්නවා නම්, ඔවුන්ට නැගිට සිටීමට කියන්න. ළමයි ස්වල්ප දෙනෙකු නැගිට සිටින විට, ප්‍රශ්න වලට උත්තර දීමට ඔවුන් එක් අයෙකුට කථාකරන්න. කිසිවෙකු නැගිට නොසිටින්නේ නම්, නැතහොත් ළමයින්ට අවුල් සහිත හෝ උත්තරය ගැන සැක සහිත නම්, තොරතුරු නැවත බැලීමට කාලය මිඩංගු කරන්න.

- උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි පසු යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දවස් කීයක් ගෝලයින් බැහැදැක්කේද? (හතලිහක්)
- යේසුස් වහන්සේ නැවත පැමිණෙන දිනය දන්නේ කවුද? (ස්වර්ගීය පියාණන් වහන්සේ පමණි, පොළොවේ කිසිම කෙනෙකු නොදන්නේය.)
- යේසුස් වහන්සේ නැවත පැමිණි පසු යුද්ධ හා සටන් ඇතිවන්නේද? (නැත. පොළොවේ සියලුම දෙනාම මිත්‍ර වන්නෝය.)

- යේසුස් වහන්සේ නැවත පැමිණි පසු රෝගාතුර හා ආබාධිත පුද්ගලයන්ට කුමක් වන්නේද? (ඔව්හු සුවපත් වන්නෝය. යේසුස් වහන්සේ පොළොවට පැමිණියාට පසු රෝග සහ වේදනා තවදුරටත් ඇති නොවන්නේය.)

- යේසුස් වහන්සේ පොළවට පැමිණියාට පසු, සත්තු කුමක් මෙන් වන්නෝද? (අපට සහ අන්‍යයන්ට ඔවුහු මිතුරන් වන්නෝය.)

**යේසුස් වහන්සේ දෙවෙනි ඊමට අපට සූදානම් විය හැකිය.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

ඔවුන්ගේ ආදරවන්තයින් නැවත නිවසට පැමිණෙන විට ඔවුන් සූදානම් වූ අන්දම ගැන ළමයින්ට මතක්කරන්න. යේසුස් වහන්සේගේ නැවත පැමිණීමට අපද සූදානම් විය යුතු බව පහදා දෙන්න. යේසුස් වහන්සේගේ ඉගැන්වීම් ඉගෙන ගැනීමෙන් හා අනුගමනය කිරීමෙන් අපට සූදානම් විය හැකිය.

අප සූදානම්ව සිටින්නේ නම්, ගැලවුම්කරුවාණන් දැකීමට සතුටු වන්නේය. සියලුම දෙනා උන්වහන්සේ සමග නැවත ජීවත්වීම උනවහන්සේට අවශ්‍යවන නමුත්, උන්වහන්සේගේ ඉගැන්වීම් අනුගමණය කරමින් හරිදෙය තෝරා ගන්නා අයට පමණක් එසේ කිරීමට හැකිය. උන්වහන්සේ සමග නැවත ජීවත් වීමට ඔවුන් කළයුතු දේවල් ඉගෙනගැනීමට යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට උපකාර කළ අතර, උන්වහන්සේ නැවත පැමිණෙන විට අපට සූදානම් වීමට උපකාර වන පිණිස ඉගැන්වීම්ද උන්වහන්සේ අපට දී තිබෙන සේක.

ගීතය

"එතුමා නැවත එන විට," යන්නෙහි දෙවෙනි පදය ගායනා කරන්න නැත්නම් වචන කියන්න. යෝජිත ක්‍රියා කිරීමට ළමයින්ට උපකාරවන්න:

පුදුමයි මට, එතුමා නැවත එන විට,
සූදානම්ද මා එවිට (නළලේ කළවර අත තබා ගන්න)
එතුමාගේ ආදර මුහුණ දැකීමට
එතුමා සමග යෑදීමට (යාච්ඤා කරන මෙන් අත් නමා ගන්න)?
එතුමාගේ කැමැත්ත සැමදා කිරීමට දිරිගනිමි මම
ආලෝකය මගේ බැබලවීමට (හිසට උඩින් රවුමට අත් බැඳගන්න)
මා දෙස බලා අන්‍යයන් සොයාවි
වඩාත් වැඩි දිව්‍ය ආලෝකය (ඇස් වසා ගැනීමට අත භාවිතා කරන්න.)
අසිරිමත් දිනය පැමිණි විට,
එතුමා මට පෙම්කර කියන්නේ, (ඔබම වැළඳගන්න)
"සේවය ඔබ මනාව කළේ, මගේ කුඩා දරුවා;
මගේ අතට එන්ට නවතින්න" (අත් ඉදිරියෙන් අල්ලන්න)

(© 1952, 1980 by Mirla Greenwood Thayne. Used by Permission)

ක්‍රීඩාව

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊමට සූදානම් වීම එක දවසින් අපට කළ නොහැකි දෙයක් බව පෙන්වා දෙන්න. යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කරමින් අපගේ මුළු ජීවිත කාලයම ඒ සඳහා සූදානම් විය යුතුයි

"යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම් වීම" යන ක්‍රීඩා කොලය ළමයින්ට පෙන්වන්න. යේසුස් වහන්සේ සමග ජීවත් වීමට ඔවුනට කළ හැකි යම් දේවල් මෙම ක්‍රීඩාව ඔවුන්ට මතක්කර දෙන බව ළමයින්ට කියන්න.

යේසුස් වහන්සේව අනුගමනය කිරීමට අපට කළහැකි යහපත් දේවල් ක්‍රීඩාව විස්තර කරන අන්දම පෙන්වා දෙන්න. "යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම් වීම" යන්න ලකුණු කර තිබෙන ස්ථානයට මෙම දේවල් මග පෙන්වයි. අපට කිරීමට හැකි වැරදි දේවල් සමහරක්ද එම ක්‍රීඩාව පෙන්වන බවට යොමු කරන්න. "යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම් නොවීම" යන්න ලකුණු කර තිබෙන ස්ථානයට මෙම දේවල් මග පෙන්වයි.

ක්‍රීඩාවේදී ලකුණු කිරීම පිණිස භාවිතාකිරීමට කුඩා ද්‍රව්‍යයක් එක් එක් ළමයෙකුට දෙන්න. ඉන් පසු පහත සඳහන් නීතිරීති පහදා දෙන්න.

1. "යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම් වීම" යන්න ලකුණු කර ඇති ස්ථානයට මග පෙන්වන, ඊතලයෙන් ලකුණු කර තිබෙන "පටන් ගන්න" යන ස්ථානයෙන් ගෙන යෑම ක්‍රීඩාවේ අරමුණ වෙයි.
2. වාර අනුව යන්න.
3. ඔබගේ වාරයේදී, භාජනයෙන් කඩදාසි කෑල්ලක් තෝරාගෙන, කඩදාසියෙහි පෙන්වා දී තිබෙන ඉඩ ප්‍රමාණය දිගේ ඔබගේ ලකුණු කරන උපකරණය (ද්‍රව්‍ය) ගෙන යන්න. ඉන් පසු කොලය නැවත නමා භාජනයට ආපසු දමන්න.
4. සම හතරැස් කොටුවකට ඔබ පැමිණි විට, සම හතරැස් කොටුවේ ලියා තිබෙන දෙය ඔබ හෝ ගුරුවරයා ශබ්දනගා කියවන්නේය. මෙම ඉගැන්වීම අනුගමනය කිරීමට ඔබට කළ හැකි යමක් කියන්න. නැතහොත්, සම හතරැස් කොටුවේ විස්තර කර තිබෙන දෙය වැදගත් වන්නේ කුමක් නිසාද බව පහදා දෙන්න. වැරදි දෙයක් විස්තර කරන සම හතරැස් කොටුවකට ඔබ පැමිණියා නම් සම හතරැස් කොටුවේ ලියා ලියා තිබෙන දෙය වෙනුවට ඔබ කළයුතු කුමක්ද කියා පහදා දෙන්න. ඔබට උපකාර අවශ්‍ය නම්, යම් යෝජනා ඔබගේ ගුරුවරයා දෙනු ලබන්නේය.
5. ඊලඟ වාරයේදී ඔබ යායුතු දිසාව එක් එක් සම හතරැස් කොටුවකට ඇති ඊතලයෙන් පෙන්නුම් කරයි.

"යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම් වීම" යන්නෙන් බැහැරව (විරුද්ධව) ඇති සම හතරැස් කොටුවකට ළමයෙකු පැමිණි විට, අප වැරදි දේවල් කරන විට යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුග-මනය නොකරන නමුත්, හරි දෙය කිරීමෙන් දිසාව වෙනස් කිරීමට අපට හැකි බව ළමයින්ට තේරුම් ගැනීමට උපකාරවන්න.

"යේසුස් වහන්සේට පැමිණීම පිණිස සූදානම් වීම" යන ක්‍රීඩාව සියලුම දෙනා කළාට පසු, නැතහොත් පංති වේලාව ආසන්න වීමට පැමිණෙන තෙක් ක්‍රීඩා කරන්න.

**සාරාංශය**

සාක්ෂිය

එන දිනය අප නොදන්නාවූවත්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පොළවට පැමිණෙන බවට සාක්ෂිද-රන්න. උන්වහන්සේ නැවත එන විට උන්වහන්සේ දැක බලා ගැනීමේ වරප්‍රසාදය ඔබට ලබා ගැනීමට හැකිවන අන්දමට යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීමට ඔබට කෙතරම් අවශ්‍යතාවයක් තිබේද කියා ළමයින්ට කියන්න. පංතියේ සිටින එක් එක් ළමයෙක්ම යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීමෙන්, ඔබ සියලු දෙනාටම උන්වහන්සේ සමග එකතු වීමට ඔබගේ ඇති ආශාව ප්‍රකාශ කරන්න.

(CTR) හදෙතො මුද්ද.

ඔවුන් ඔවුන්ගේ හදෙතො (CTR) මුද්ද පැළඳගෙන සිටීනම් එය දෙස බලන්ට ළමයින්ට සලස්වන්න. හරි දෙය තෝරාගෙන යේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කිරීමට මතක්කිරීම පිණිස ඔවුන්ගේ මුද්ද උපකාර විය හැකි බව ළමයින්ට මතක්කරන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊමට සූදානම් වීම පිණිස එන සතිය තුලදී, ඔහු හෝ ඇය කරන්ට යන දෙයක් ගැන කීමට එක් එක් ළමයෙකුට කියන්න.

අවසාන යාච්ඥාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම සඳහා පංතියේ සාමාජිකයන්ට සූදානම් වීමට ස්වර්ගීය පියාණන් වහන්සේගෙන් උපකාර ඉල්ලීමට ළමයාට යෝජනා කරන්න.

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට එවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව" අමතර මගපෙන්වීම් බලන්න.

1. "එතුමා නැවත එන විට" (ළමා ගී පොත, පි. 82) පද දෙකම ගායනා කරන්න, නැතහොත් වචන කියන්න. දෙවෙනි පදයට වචන පිටු 237–38 මුද්‍රණය කර ඇත.

   මට පුදුමයි, එතුමා නැවත එන විට,
   දූතයා ගීයෙන් පවසයිද?
   ගලන හිමෙන් පොළොව සුදුව,
   ලොව වසන්තය දනීද?
   මට පුදුමයි එක් තරුවක් දිළිසෙයිද?
   වඩා දීප්තියෙන් අතිකට;
   මුළු රෑ පුරා දවස පවතියිද?
   ගීත කුරුළුන් කැදළි හැරයයිද?
   කුඩා අයව එතුමා කැඳවනු සහතිකයි මට
   එතුමා දණ වටා එක්ව,
   පුරාණයේ ඔහු කී බැවින්,
   "මා ළඟට ඉඩදෙනු එන්ට"
   (© 1952, 1980 by Mirla Greenwood Thayne. Used by Permission)

2. යේසුස් වහන්සේගේ දෙවෙනි ඊම ගැන දහවෙනි ඇදහිල්ලේ කරුණේ කියන බව පහදා දෙන්න. "යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පෞද්ගලිකව පෘථිවියෙහි රජ කරන බව... අපි විශ්වාස කරමු." මෙම වාක්‍ය ඛණ්ඩය කටපාඩම් කිරීමට ළමයින්ට උපකාර කරන්න. වාක්‍ය ඛණ්ඩයෙහි අදහස ළමයින්ට පහදා දෙන්න.

3. පහනක් හෝ පහනක සරල චිත්‍රයක් ළමයින්ට පෙන්වන්න. කන්‍යාවන් දසදෙනෙකු (හෝ ගැහැණු ළමයි) සහ ඔවුන්ගේ පහන් ගැන කථාන්තරයක් මගින් උන්වහන්සේගේ පැමිණීමට සූදානම් වීමේ වැදගත් කම ගැන යේසුස් වහන්සේ අපට ඉගැන්වූ බව පහදා දෙන්න. මතෙව් 25:1–13 සඳහන් පරිදි, කන්‍යාවන් දසදෙනාගේ උපමාව කියන්න. දැල්වීමට තෙල් නොමැති නම් පහන් වලින් ආලෝකය දීමට නොහැකි බව පහදා දෙන්න. නුවණ නැත්තියන් සූදානම් නොවූ නිසා, මංගල්‍යයට යෑමට ඔවුන්ට අවසර නොලැබුන බව පහදා දෙන්න.

   ගැලවුම්කරුවාණන් උන්වහන්සේගේ දෙවෙනි ඊමට මංගල්‍යය සමාන කළ බව පහදා දෙන්න. යේසුස් වහන්සේ සමග සිටීමට අප සූදානම් වීම, ගැහැණු ළමයි ඔවුන්ගේ පහන් වලට තෙල් ලබා ගැනීමට සමාන කළ හැකිය. උන්වහන්සේ පැමිණෙන විට අප සූදානම්ව නොසිටින්නේ නම්, උන්වහන්සේ සමග ජීවත් වීමට අපට හැකි නොවන්නේය.

   යේසුස් වහන්සේගේ පැමිණීමට සූදානම් විය හැකි මාර්ගය ගැන කීමට ළමයින්ට කියන්න. (ක්‍රීඩාවේදී භාවිත කළ දේවල් වැනි සමහර යෝජනා දීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත) හරි දෙය තෝරාගැනීම මගින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊමට අප සූදානම් වන බව අවබෝධකර ගැනීමට ළමයින්ට උපකාරවන්න.

4. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම සඳහා මම සූදානම් වෙමි, යන්න එක් එක් ළමයෙකුගේ හඳුනා ගැනීමේ ලකුණෙහි උඩ කොටසෙහි ලියන්න. යේසුස් වහන්සේගේ පැමිණීම සඳහා ඔහු හෝ ඇය යමක් කරමින් සූදානම් වන පිංතූරයක් පාටපැන්සල් හෝ පැන්සල් භාවිතා කරමින් හඳුනා ගැනීමේ ලකුණ මත ඇඳීමට එක් එක් ළමයෙකුට සලස්වන්න. හඳුනා ගැනීමේ ලකුණ කටුවකින් ළමයා මත රඳවන්න නැතහොත් එක් එක් හඳුනා ගැනීමේ ලකුණකම උඩ කොටසේ සිදුරක් සාදා නූල් පොටක් හෝ කැටි නූල් පොටක් මගින් මාලයක් සෑදීමට උපකාරවන්න.

# සතුන්ට ආදරය කිරීමට මට හැකිය

**44**
වෙනි
පාඩම

**අරමුණ** ජීවමාන සියලුම ප්‍රාණීන්ට ගෞරවය හා කරුණාව දැක්වීම පිණිස එක් එක් ළමයෙක්ව දිරිගැන්වීමටය.

**සූදානම**

1. උත්පත්ති කථා 6:11–7; 24, යෙසායා 11:6–9, සහ ලූක් 12:6 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. පාඩමේ අවසානයේ සඳහන් වී තිබෙන පරිදි සතුන්ගේ සම හතරැස් කොටු වල පිටපතක් සාදන්න. (එලෙස පිටපතක් සෑදීමට නොහැකි නම්, ප්‍රවේසමෙන් එම පිටුව අත් පොතෙන් ඉවතට ගන්න.) සම හතරැස් කොටු කපා වෙන්කරන්න. ඉදිරියටත් පංතිවලට භාවිතා කිරීම සඳහා මෙම සම හතරැස් කොටු ආරක්ෂා කර තබන්න.
3. "සියල්ල දීප්තිමත්ය, ලස්සනය" (ළමා ගී පොත, පි. 231). නැවත නැවත කියවන කොටස ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.
4. සතෙකුට ඔබ හෝ වෙනත් කෙනෙකු කරුණාව පෙන්වනවා ඔබ දුටු අවස්ථාවක් ගැන කීමට සූදා-නම්වෙන්න.
5. අවශ්‍ය උපකරණ
   අ. බයිබලයක්.
   ආ. එක් එක් ළමයෙකු සඳහා පාටපැන්සල්
   ඇ. 2-72 පිංතූරය, සත්තු සමග නෝවා සහ නැව (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 103; 62305);
   2-73 පිංතූරය, මැවිල්ල.... ජීවමාන ප්‍රාණීන් (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 100; 62483);
   2-74 පිංතූරය, සෝල්ට් ලේක් දේවස්ථානය (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 503; 62490).
6. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතාකිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම** ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**සතුන් වැදගත් වේ.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

සතුන්ගෙන් යුත් සම හතරැස් කොටු කළවම් කර මුහුණු පහතට සිටිනසේ ලෝහ රාමුවක් මත තබා මේසය උඩ හෝ බිම තබන්න. වාර අනුව වරකට එකක් බැගින්, සම හතරැස් කොටු දෙකක් හරවා, පිංතූර පැත්ත උඩට සිටින සේ තැබීමට ළමයින්ට ආරාදනා කරන්න. සත්තු දෙදෙනාම සමාන නම්, ඔවුන් එකට තබා "සත්තු පෙරහැරක්" මෙන් ලෝහ රාමුවේ පැත්තකින් තැබීමට ළමයාට සලස්වන්න. සත්තු දෙදෙනා සමාන නොවන්නේ නම්, එම පත් ආපසු හරවා තිබූ ස්ථානයෙහිම තැබීමට ළමයාට සලස්වන්න. සියලුම සතුන් සමාන කර සත්තු පෙරහැරේ තබන තෙක් කරගෙන යන්න.

පෙරහැරේ සිටින සත්තු ජෝඩු (දකින විට) බයිබලයේ තිබෙන කථාන්තරයක් ඔවුන්ට මතක්වන්නේද කියා ළමයින්ගෙන් අසන්න. නෝවා සහ නැව ගැන කථාන්තරය ළමයින්ට සිතාගැනීමට නොහැකි නම්, පහත සඳහන් මග පෙන්වීමේ සංඥාවන් කිහිපයක් ඔවුන්ට දෙන්න.

- යමෙකුට යමක් සෑදීමට ස්වාමීන් වහන්සේ කීසේක.
- සත්තු ජෝඩු වශයෙන් පැමිණියෝය.
- පොළොවේ ජලගැල්මක් ඇති කරමින් දවස් හතළිහක් සහ රෑ හතළිහක් වැසි වැස්සේය.

ශුද්ධ ලියවිලි කථාන්තර — නොවා සහ නැව සතුන් සමග 2-72 පිංතරය පෙන්වා, උත්පත්ති පොතේ 6:11–7; 24, සඳහන් කථාන්තරය නැවත බලන්න. ජල ගැල්මෙන් සතුන් බේරා ගැනීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වූ බව පහදා දෙන්න. නැවට සතුන් දැමීමට උන්වහන්සේ නොවාට කී අතර එක් එක් වර්ග වලට අයිති බොහෝ සතුන්ව රැක බලා ගන්නා අන්දම දැන ගැනීමට නොවාට උපකාර කළ සේක.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සතුන්ව මැවූ සේක.**

පිංතූර පිළිබඳ සාකච්ඡා — මැවිල්ල— ජීවමාන ප්‍රාණීන්, 2-73 පිංතූරය පෙන්වන්න.

- මෙම පිංතූරයේ ඔබට පෙනෙන්නේ කුමණ සතුන්ද?
- මෙම සතුන්ට ඔබ කැමති කුමක් හෙයින්ද?

මිනිත්තු කිහිපයක් සතුන් ගැන කථාකිරීමට ළමයින්ට ඉඩ දෙන්න.

- මෙම සතුන් මැව්වේ කවුද?

ස්වර්ගීය පියාණන් වහන්සේගේ මග පෙන්වීම යටතේ, සියලුම සතුන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මැවූ බව ළමයින්ට මතක්කරන්න.

ගීතය — "සියල්ල දීප්තිමත්ය, ලස්සනය" නැවත නැවත කියවන කොටස ළමයි සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

සියල්ල දීප්තිමත්ය, ලස්සනය,
ලොකු කුඩා සියලුම ප්‍රාණීන්,
සියල්ල ප්‍රඥාවන්තය පුදුමය,
දෙවි සමිඳු සියල්ල සෑදූ සේක.

ශුද්ධ ලියවිලි — පසු ගිය පාඩමේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊම ගැන ඔවුන් ඉගෙන ගත් බව ළමයින්ට මතක්කරන්න. යේසුස් වහන්සේ නැවත පැමිණි විට සත්තු සියලුම දෙනාම මිත්‍ර වන්නෝය, සමාදාන වන්නෝය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත පොළොවේ ජීවත් වන විට, සතුන් හැසිරෙන ආකාරය ගැන විස්තරය යෙසායා 11:6–7 ශබ්දනගා කියවන්න.

**ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සියලුම ප්‍රාණීන්ට ප්‍රේම කරන සේක.**

ශුද්ධ වූ ලියවිලි. — සියලුම ප්‍රාණීන්ට ඉතාම කුඩා අයට වුවත්, සතුටින් සිටීම, ස්වර්ගීය පියාණන්ට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවශ්‍ය වන සේක. සෑම ජීවමාන ප්‍රාණියෙක්ම වැදගත් බවට උන්වහන්සේලා සලකති.

ලූක් 12:6 ශබ්දනගා කියවන්න. ගේ කුරුල්ලා ඉතාම කුඩාවුවත්, ස්වර්ගීය පියාණන් සහ යේසුස් වහන්සේ ඔවුන්ව රැකබලා ගන්නා බව ශුද්ධ වූ ලියවිලි අපට කියන බවට පහදා දෙන්න.

කථාන්තරය. — සෝල්ට් ලේක් දේවස්ථානය, 2-74 පිංතූරය පෙන්වන්න.

- සභා ගොඩනැගිල්ලකදී රූපවාහිනියක් චන්ද්‍රිකාවක් මගින් ප්‍රචාරය කරන ප්‍රධාන සම්මන්ත්‍රණයක් ඔබ කවදා හෝ දැක තිබේද?

(Tabernacle; ටැබනකල්) දේවස්ථානය නමින් හඳුන්වන ගොඩනැගිල්ලක ප්‍රධාන සම්මන්ත්‍රණය කරන බව පහදා දෙන්න. මෙම (ටැබනකල්) දේවස්ථානය යුටා, සෝල්ට් ලේක් නගරයේ තනන ලද්දේ පසු දවස්වල ශුද්ධවන්ත පූරෝගාමීන් විසින්ය.

දේවස්ථානයේ (ටැබනකල්) උස වහල සහ එහි ඇති බොහෝ දොරවල් පෙන්වා දෙන අතර, ඔබගේ වචන වලින් පහත සඳහන් කථාන්තරය කියන්න.

වසන්තයේ එක් සැන්දෑවකදී ගොඩනැගිල්ල ශීත වීම සඳහා දොරවල් විවෘතකර තබන ලදී. කිසි කෙනෙක් නොදැනුවත්ව කුඩා කුරුල්ලෙකු ඇතුලට පියඹා ආවේය. දොර අගුලුලැවාටත් පසු කුරුල්ලා එහි තුල දිගටම සිටියේය.

පසු දින උදෑසන ශාලාව සංගීත සංදර්ශනයකට සූදානම් කිරීම පිණිස සේවකයන් පැමිණි විට, කුරුල්ලා සිටිනවා දැක ඌ එළවීමට පැය ගණනක්ම උත්සහ ගත්තෝය. මීට ඉතා දිග දැල් මගින් කුරුලලා ඇල්ලීමට විශේෂයෙන් පුහුණු වූ අය ඔවිහු කැඳවූහ.

කළමණාකරු ජෝන් සහෝදරයා පැමිණි විට, මිනිසුන් දැල් දමමින් කුරුල්ලාව එලවනවා ඔහු දුටුවේය. දැලත් සමග මිනිසුන් ගොඩනැගිල්ලේ එක් පැත්තකට දුවන විට, කුරුල්ලා අනිත් කොණට පියඹා යයි. දේවස්ථානයේ (ටැබනකල්) සියලුම දොරවල් විවෘතකොට තිබුන නමුත්, ඌ ඉතාම භයවූ නිසා එය නොදැක්කේය.

විශේෂයෙන් පුහුණු වූ පුද්ගලයින් මුනිස්සම් තුවක්කු ගෙනා අතර, කුරුල්ලාට වෙඩිතැබීමට තුවක්කු භාවිතා කිරීමට ඔව්හු යෝජනා කළහ. ජෝන් සහෝදරය එම අදහසට අකමැතිවූයේය. ගොඩනැ-ගිල්ලට හෝ එහි ඇතුලේ ඇති උපකරණ වලට වෙඩිතැබීමෙන් (තුවක්කුවෙන්) හානි සිදුවීමට හැකිවන නිසාය. වඩාත් වැදගත් වන්නේ, ඔවුන් කුරුල්ලා නොමැරිය යුතුයැයි ඔහු සිතූ බැවින්ය. සභාවේ දොළොස්වෙනි සභාපතිවරයා, කුරුල්ලන්ට වෙඩි නොතැබීම ගැන කළ කථාවක් ඔහුට මතක්විය.

කුරුලලාට කෑමට විස යෙදූ ආහාර තැබීමටද විශේෂයෙන් පුහුණු වූ පුද්ගලයින් යෝජනා කළහ. ජෝන් සහෝදරයා එසේ කිරීම ගැනද අකමැතිවූයේය. නමුත් කුරුල්ලා ඉක්මණටම ඉවත්කළ යුතු බවද ඔහු දැන සිටියේය, මක් නිසාද එම සැන්දෑවේ වැදගත් රඟදැක්වීමක් තිබෙන නිසාය.

ජෝන් සහෝදරයා පසෙකට හැරී කෙටි යාච්ඤාවක් කීවේය. "ස්වර්ගීය පියාණෙනි, මෙම ගේ කුරුල්ලා ඔබ වහන්සේට වැදගත් නම්, ප්‍රවේශමෙන් ඌ ඉවත් කිරීමට කරුණාවෙන් අපට දැන ගන්ට සැලැස්සුව හැකිද?"

ජෝන් සහෝදරයා යාච්ඤාව අවසන් කරන විටම, කළ යුතු දෙය ඔහු දැනගත්තේය. ගොඩනැගිල්ලේ විදුලි ආලෝකය නවත්වා එක දොරක් හැර අනික් සියලුම දොරවල් වසා දැමීමට ඔහු සේවකයන්ට කීවේය.

කුරුල්ලා ඕගනය මත වාඩිවී සිට, විදුලි ආලෝකය නවත්වා දොරවල් වැසූ පසු, කුරුල්ලා ඕගනය වෙතින් පියඹා විවෘතව තිබුන දොරින් කෙලින්ම එළියට ගියේය. (See Ronald D. John, "A Sparrow in the Tabernacle," *Ensign* June, 1989, pp. 24–25). (රොනල්ඩ් ඩී. ජෝන්, "දේවස්ථානයෙහි ගේ කුරුල්ලෙක්," එන්සයින්, ජූනි, 1989, පිටු 24–25 බලන්න).

- කුඩා කුරුල්ලා රැකබලා ගැනීම ජෝන් සහෝදරය පෙන්වූයේ කෙසේද? (ඌට වෙඩි තබනවා හෝ වස දෙනවා වෙනුවට ඔහු ඌ ගැන යාච්ඤා කළේය.)
- ස්වර්ගීය පියාණන් වහන්සේ කුරුල්ලා ගැන සැලකිලිමත් වූ බව ඔබ දන්නේ කෙසේද? (දේවස්ථානයෙන් ඌ එලියට ගන්නා අන්දම දන්වමින් ජෝන් සහෝදරයාට උන්වහන්සේ උපකාර කළ සේක.

**සතුන්ට කරුණාවන්ත වීමට අපට හැකිය.**

සාකච්ඡාව

ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් වහන්සේ කරන ආකාරයට අප එක් එක්කෙනා සතුන් රැකබලා ගැනීම අවශ්‍යව ඇති බව පහදා දෙන්න.

ඔවුන්ගේ හෝ ඔවුන්ගේ පවුල්වල ඇතිකරන සුරතලුන් හෝ වෙනත් සත්තු ගැන කථාකිරීමට ළමයින්ට ආරාධනා කරන්න. (ළමයින්ගේ නිවාස වල සතුන් නොමැති නම්, ඔවුන් ඇතිකිරීමට කැමති සුරතල් සතුන් ගැන කථා කිරීමට හැකිවේ.)මෙම සතුන් ඔවුන් රැකබලා ගන්නා ආකාරය ගැන කීමට ළමයින්ට කියන්න. පිරිසිදු ජලය හා පෝෂ්‍යාදායක ආහාර ලබා දෙමින් සතුන්ව බලා ගනිමින් හෝ ඔවුන්ට කරුණාවන්තව කථාකිරීම යනාදිය අංගචලනයෙන් දක්වමින් ඔවුන් සතුන් රැකබලා ගන්නා අන්දම පෙන්වීමට සලස්වන්න.

කථාන්තර

සභාවේ පළමුවෙනි සභාපතිවරයා වූ අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් පවා සතුන්ට කරුණාව දැක්වීම ගැන ඉගැන්වූයේය. පහත සඳහන් කථාන්තරය ඔබගේම වචන වලින් කියන්න.

අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් සහ තවත් පුද්ගලයින් සමහර දෙනෙකු කුඩා ගඟක ඉවුරු අසල කූඩාරම් ගැසූහ. අනාගතවක්තෘවරයා කූඩාරම ගසන විට, ප්‍රෙයරි දේශයේ සිටින, ඇදෙන විට කට කට ශබ්දයෙන් හඬ නැගෙන විසකුරු සර්පයන් තිදෙනෙකු ඔහුට හමුවිය. සර්පයා මැරීමට අනික් පුද්ගලයින්ට අවශ්‍ය වූ නමුත්, අනාගත වක්තෘවරයා ඔවුන්ව නවත්වා, ඔහුට හිංසා නොකිරීමට කීවේය. එම පුද්ගලයෝ කෝටු වලින් එම සර්පයන් ප්‍රවේසමෙන් අල්ලාගෙන ගඟෙන් අනෙක් පැත්තට ගෙනගියහ. ඔවුන් ගමන් කරන අතර ඔවුන්ගේ ආහාරවලට අවශ්‍ය නම් පමණක් මිස කිසිම සර්පයෙක්, කුරුල්ලෙකු හෝ වෙනත් සතෙක්, නොමැරීමට කීවේය. (සභා ඉතිහාසය 2-71-72 බලන්න; ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්, එන්සයින් නොව. 1978, පි. 45 ද බලන්න.) (See History of the Church, 2:71–72; See also Spencer W. Kimball, *Ensign*, No. 1978, pp. 45.)

**සාරාංශය**

සියලුම සතුන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මැවූ බවද, සියලුම ප්‍රාණීන් ස්වර්ගීය පියාණන් වහන්සේගේ සැලැස්මේ කොටසක් බව ළමයින්ට මතක්කරන්න.

ක්‍රියාකාරීත්වය

ළමයි නැගිට සිට, පහත සඳහන් පදයේ වචන කියමින් අංග චලනය කිරීමට උපකාරවන්න.

සියලුම ප්‍රාණීන්ට සමිඳු ආදරෙයි. (*අත් අල්ලා ඉදිරියට දිගුකරන්න*):
විශාල උස, අලින්ද (*හිසට උඩින් අත තබා ඉහලට දිගුකරන්න*).
සමුදුරේ මාලුන් (*අත් බැඳ මාලු පීණන ආකාරයට සොලවන්න*).
පුංචි මීයා කුඩා වූ (*පහතට නැඹුරුවන්න.*)
බඩගාන සතුන්ට ආදරෙයි එතුමා (*එක අතක ඇඟිලි අනිත් අත උඩ "බඩගානවා" මෙන් සලස්වන්න*).
ඉහල පියාඹන කුරුල්ලන්ද (*පියාපත් මෙන් අත්තටු ගසන්න.*)
කැලයේ මුදු මොළොක් මුවා (*ඔලුවට මාපට ඇඟිලි තබා මුව අං මෙන් ඇඟිලි විහිදුවන්න*).
සමිඳුගේ ප්‍රේමය සියල්ලන්ට හැඟේ (*හදවත මත අත් තබන්න*).

සාක්ෂිය

ඔබ පෙන්වූ හෝ වෙන යමෙකු හෝ සතෙකුට කරුණාව පෙන්වනවා ඔබ දුටු අවස්ථාවක් ගැන කියන්න. මෙම පොළොවේ සිටින සියලුම ප්‍රාණීන්ට ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ආදරය කරන අතර, අපද සතුන්ට කරුණාව දැක්වීම උන්වහන්සේලාට අවශ්‍ය බවට සාක්ෂිදරන්න.

මෙම සතිය තුලදී සතෙකුට කරුණාව දැක්වීමේ යමක් කිරීමට එක් එක් ළමයෙක්ව දිරිගන්වන්න.

චිත්‍ර ක්‍රියාකාරීත්වය

සතුන්ට කරුණාව දැක්වීම පිණිස ඔවුන්ට කළ හැකි යමක් ඇඳීමට ළමයින්ට කොල සහ පාට පැන්සල් දෙන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. "ගුරුවරයාට උපකාර" යන්නෙහි "පංති වේලාව" අමතර මගපෙන්වීම් බලන්න.

1. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල්ගේ කථාවෙන් ජෝන් සහෝදරයාට මතක තිබෙන කථාන්තරය ඔබගේ වචන වලින් කියන්න.

   "මට මතක් වෙයි බොහෝ විට උස් හඬින් ගායනා කරනව"

   "කුඩා කුරුල්ලන් නොමරන්න,
   වදුලේ ගසේ ගායනා කරන,
   සියළු වසන්ත කාලයේ,
   ඔවුන්ගේ මිහිරි ගීත.
   කුඩා කුරුල්ලන්ට වෙඩි නොතබන්න!
   පොළොව සමිඳුගේ වතුයායයි,
   ආහාර එතුමා සපයයි
   ලොකු කුඩා සියල්ලට.
   (Deseret Song, 1909, No. 163.) ඩෙසරේට් ගීත, 1909, නොම්මර. 163.)

   "හෙමින් උඩ විසිකර ගැසීමට හැකි ගල් පටියක් මා ළඟ තිබුනේය. මා විසින්ම සාදා ගත් ඒවා, ඉතා හොඳට ක්‍රියා කළේය. නිවසේ සිට සැතපුමක් පමණ දුර ඇති තණපිට්යට වැස්සියන් ගෙන යෑම මගේ වගකීම විය. මග දෙපස විශාල ඉඹුල් ගස් විය. 'වදුලේ සහ උඩ ගායනා කරන,' කුඩා කුරුල්ලන්ට වෙඩි තැබීමට මට සෑහෙන පරීක්ෂාවක් තිබුන බව මට මතකය, මක් නිසාද මා ඉතා හොඳ වෙඩික්කාරයෙකු වූ අතර, යාර පණහක් දුර ඇති කණුවකට ගැසීමට හෝ ගසක කඳකට ගැසීමට මට හැකියාව තිබුනි. නමුත් සෑම ඉරුදිනකම පාහේ, 'කුඩා කුරුල්ලන් නොමරන්න,' යන්න මා ගායනා කරන බැවින් එයින් මම වැළකී සිටියෙමි.... ලස්සන කුඩා කුරුල්ලෙකු මගේ දෙපා ළඟ වැටෙනවා දැකීම මට මහත් විනෝදයක් නොවීය" (ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්, සම්මන්ත්‍රණ වාර්ථාව, අප්‍රේ. 1978, පි. 71; එන්සයින්, මැයි 1978, පි. 47–48 ද බලන්න. Spencer W. Kimball, in Conference Report, Apr. 1978, p. 71; See also *Ensign*, May 1978 pp. 47–48).

2. ඔවුන්ගේ ප්‍රියතම සතා ඇඹීමට එක් එක් ළමයෙකුට කුඩා ලුනු පිටි ගුලියක් දෙන්න (ලුනු පිටි ගුලියේ වට්ටෝරුව 43 වෙනි පිටුවෙහි සඳහන් වී ඇත.) ඔවුන්ගේ පවුලේ අයට පෙන්වීමට ඔවුන්ගේ සතා ගෙදර ගෙන යෑමට ඉඩදෙන්න.

3. ඔහුගේ ප්‍රියතම සතාගේ ක්‍රියා අංග චලනයෙන් රඟදැක්වීමට වාර අනුව එක් එක් ළමයෙකුට ඉඩදෙන්න. කුමණ සතෙක්ව ඔහු අනුකරණය කරනවාද කියා අනුමාන වශයන් කීමට උත්සහ දැරීම සඳහා අනික් ළමයින්ට සලස්වන්න. අනික් ළමයින්ට ක්‍රියා වලින් අනුමාන වශයෙන් කීමට නොහැකිනම්, කථා කිරීමේ හෝඩුවාවන් එම ළමයාට කීමට සැලැස්විය හැකිය.

4. නොයෙක් සතුන්ගේ හෝඩුවාවන් ළමයින්ට දෙන්න. ඔබ විස්තර කරන සතාව ඔවුන් දැන ගත් විට කිසිවක් නොකියා, ඔවුන්ගේ අත් එසවිය යුතුයැයි ළමයින්ට කියන්න. හෝඩුවාවන් කුමණ සතෙකුගේද කියා කීමට අත් ඔසවාගෙන සිටින ළමයෙකුගෙන් අසන්න. පහත සඳහන් ඒවා හෝ, ඔබගේ ප්‍රදේශයේ හෝඩුවාවන් නිර්මාණය කරන්න.

   - මට කකුල් හතරක් තිබේ, මගේ කබාය කොළ පාටය.
     ඔබ කිසි දිනක නොදුටු ඉතාම හොඳට පනින්ට හැකි තැනැත්තා මමය (තණකොළ පෙත්තා.)

   - මම කුඩා, දඟලන බොහෝ නැමීම් ඇති කෙනෙක්මි.
     මගේ දෙකෙළවරම එක සමාන මෙන් පෙනෙයි (පණුවා.)

- මගේ නිවස ලස්සන සීතල පොකුණක
  නාද කිරීමට හා පැනීමට මම ඉතා ප්‍රිය කරමි (ගෙම්බා.)

- වසන්ත කාලයේදී ඔබ මාව සොයයි
  රතු පිහාටු පපුව සමග ගසට බොහේ උඩ (අච්චිචියා).

- රවුම් මුහුණකුත් විශාල ඇස් දෙකකුත් මට තිබේ
  අඳුරේද පෙනෙයි, ප්‍රඥාවන්ත යයි ඔවිහු කියති (බකමූණා.)

- මට අත් සහ කකුල්, ඇස් කණ් හා නහයක් තිබේ;
  මගේ පයේ ඇඟිලි වලින් හෝ මගේ වලිගයෙන් ගසක එල්ලෙන්නට මට හැකිය (වඳුරා.)

- මගේ පිට උඩට ඔබ නැගුනොත්, රවුමක් ඔබව මම ගෙන යමි.
  මගේ නාස්ලනුවෙන් අල්ලාගන්න; මා හසුරුවීමට පහසුය (අශ්වයා)

- ඔබ සිතන්වත් පෙර ගස උඩට දුව යෑමට මට හැකිය;
  ඇසිපිය ගහන ඉක්මණින්ම, මගේ ඝන වලිගය ආයුබෝවන් කියා වනයි (ලේනා.)

- රැළි ගැසුනු කොට වලිගයක් ඇති මම ගොවිපළක වෙසෙමි.
  පණුවෙකු මෙන් දඟලමින් කෑම බාල්දිය ලඟට යමි (ඌරා.)

- දුවන්න, පණින්න, සෙල්ලම් කරන්න මම ප්‍රියකරමි;
  "බා" යන වචනය පමණක් මට කීමට හැකිය (බැටළුවා).


"මම කවුද"? (ළමයින්ගේ මිතුරා, මැයි 1956, පි. 208) මෙම හෝඩුවාවන් උපුටාගන්නා ලදී.

5. දෙවෙනි පාඩමෙන් (7 වෙනි පිටුව බලන්න) වරන්ගේ කථාව නැවත බලන්න.

   - වරන් සතුන්ට කරුණාව දැක්වූයේ කෙසේද?

6. ඔබට හෝ ළමයින්ට අවශ්‍ය වන අන්දමට බොහෝ වතාවක්ම පාඩමේ මුල සිටම සමාන කරන ක්‍රීඩාව නැවත නැවත කරන්න.

7. එළිමහනේ එල්ලීම සඳහා ගෙදර ගෙනයෑමට කුරුල්ලන්ට කෑම දෙන සරල භාජන සෑදීමට ළමයින්ට උපකාර කරන්න. පයින් ගෙඩියක හෝ ලස්සන හැඩයට කැපූ පාන් කෑලි වල රටකජු වෙඬරු තවරන්න. පයින් ගෙඩිය හෝ පාන් කෑල්ලට කුරුල්ලන්ට කන්ට දෙන ධාන්‍යවල ගිල්වන්න. ගසක පඳුරක හෝ කණුවක කෑම භාජනය එල්ලන්න. (ඔබගේ ප්‍රදේශයේ සුලබව ඇති උපකරණ භාවිතා කරමින් කුරුල්ලන්ට කෑම දෙන භාජන සාදන අන්දම ඔබ දන්නවා ඇත)



# 45 වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම නිමිතිකොට ගෙන අපි උත්සව පවත්වන්නෙමු. (පාස්කු)

**අරමුණ**

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි නිසා පාස්කු උත්සවය අප පවත්වන බව එක් එක් ළමයෙකුට අවබෝධ කරගැනීමට උපකාරවීමටය.

**සූදානම**

1. මතෙව් 27:57–66; 28:1–8; මාර්ක් 15:16–20, 40–47, 16:1–11; ලූක් 23:44–46; සහ යොහාන් 20:1–18 යාච්ඤාවෙන් අධ්‍යනය කරන්න.
2. ඔබගේ ප්‍රදේශයේ පාස්කු උත්සවයට ලෞකික සම්බන්දකම් ඇති ද්‍රව්‍ය වන පැණිරස කෑම, බිත්තර, මල් හෝ අලංකාර ඇඳුම් වැනි දේවල් වල පිංතූර ලබා ගන්න නැතහොත් අඳින්න. පංතියේ මේසය මත, බිම හෝ රට හුණු ලෑල්ලේ මේවා ප්‍රදර්ශනය කර, යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම 2-12 කැපූ පිංතූරය අනිත් පිංතූර සමග පෙන්වන්න.
3. සත්‍යයෙන්ම යේසු නැවත ජීවත්වූයේද? (ළමා ගී පොත, පි. 64) ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න.
4. අවශ්‍ය උපකරණ
   අ. බයිබලයක්
   ආ. කුඩා මල්ලක් හෝ පෙට්ටියක්
   ඇ. කුරුසය මත ඇණ ගැසීමේ දර්ශනය, කැපූ සටහන 2-5, යේසුස් වහන්සේගේ ශරීරය එතීම, කැපූ සටහන 2-6; සොහොන්ගෙය, කැපූ සටහන 2-7; විශාල ගල කැපූ සටහන 2-8; රැකවල්ලු කැපූ සටහන 2-9; දේවදූතයා, කැපූ සටහන 2-10; ආලේප සමග ස්ත්‍රීන්වරුන්, කැපූ සටහන 2-11; යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම, කැපූ සටහන 2-12 පළමු පාස්කු වේ කථාන්තරයට භාවිතා කරන පිළිවෙලට මෙම කැපූ සටහන් අඩුක්කරගන්න.
   ඈ. නැවත නැගිටි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, පිංතූර 2-65 (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 239; 62187).
5. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුළදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**අපි පාස්කු දිනයේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිහිකරන්නෙමු.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

මේසය මත, බිම හෝ රට හුණු ලෑල්ලේ ඔබ ප්‍රදර්ශනය කර ඇති පිංතූර පෙන්වන්න. වරකට එක පිංතූරයක් බැගින් හඳුනාගෙන ප්‍රදේශයේ ලෞකික පාස්කු සිරිත්විරිත් වලට එම පිංතූරයේ ද්‍රව්‍ය සම්බන්ධ වන ආකාරය පෙන්වීමට ළමයින්ට සලස්වන්න.

ළමයි එක් එක් ද්‍රව්‍යයක් සාකච්ඡා කළාට පසු, මෙසේ අසන්න:

- පාස්කු උත්සවය අප පවත්වන්නේ ඇත්ත වශයෙන්ම මෙම ද්‍රව්‍ය නිසාද? (නැත.)

ඉන්පසු එම පිංතූරය ඉවතට ගෙන කුඩා මල්ලේ හෝ පෙට්ටියේ තැබීමට ළමයෙකුට සලස්වන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කැපූ සටහන පමණක් ඉතිරි වන තෙක් අනිත් පිංතූර ගැන සාකච්ඡා කරගෙන යන්න.

- පාස්කු උත්සවය අප පවත්වන්නේ ඇත්තවශයෙන් මෙය නිසාද? (ඔව්)

පාස්කු උත්සවය පැවැත්වීමට සත්‍යවූ කාරණය යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව ළමයින්ට මතක්කරන්න. අප උදෙසා ඉතාම ආශ්චර්යමත් දෙයක් පළමුවෙනි පාස්කුවේදී යේසුස් වහන්සේ කළ සේක.

**පළමුවෙනි පාස්කුවේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි සේක.**

කැපූ සටහන් සමග ශුද්ධ වූ ලියවිලි කථාන්තර

පළමුවෙනි පාස්කුව ගැන කථාන්තරය ඔබගේම වචන වලින් කියන්න. (මතෙව් 27:57–66; 28:1–8; මාර්ක් 15:16–20; 40–47; 16:1–11; ලූක් 23:44–46; සහ යොහාන් 20:1–18 බලන්න). ඔබ කථාන්තරය කියන විට උචිත කැපූ සටහන වාර අනුව උඩට එසවීමට ළමයින්ට ඉඩදෙන්න. ළමයි කථාන්තරය දන්නවා නම් ඔබට එය කීමට උපකාරවීමට ඔවුන්ට සලස්වන්න.

කුරුසයේ ඇණ ගැසීමේ දර්ශනය, කැපූ සටහන් 2-5, උඩට එසවීමට ළමයෙකුට සලස්වන්න.

යේසුස් වහන්සේට අකමැතිවූ දුෂ්ඨ මිනිසුන් අන්තිමට ඔවුන්ගේ නායකයින්ගෙන් අවසර ලබාගෙන උන්වහන්සේව මරණයට පත් කළ බව පහදා දෙන්න. මෙම පුද්ගලයින් යේසුස් වහන්සේට තලා, උන්වහන්සේව සිනහවට ලක්කළහ. නගරයෙන් පිට කන්දක් උඩට ඔවහු උන්වහන්සේව ගෙන ගොස් උන්වහන්සේව කුරුසයක් මත තබා ඇණ ගැසූහ.

කුරුසයේ ඇණ ගැසීමේ කැපූ සටහන පහතට දැමීමට ළමයෙකුට සලස්වා, යේසුස් වහන්සේගේ ශරීරය එතීම, 2-6 කැපූ සටහන එසවීමට වෙනත් ළමයෙකුට සලස්වන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මැරුණාට පසු උන්වහන්සේගේ ශරීරය ගැන සැලකිලිමත් වීමෙන් උන්වහන්සේගේ මිතුරන් උන්වහන්සේට ඔවුන්ගේ ප්‍රේමය දැක්වූ බව පහදා දෙන්න. ඔව්හු ඉතාම ප්‍රවේශමෙන් එය කුරුසයෙන් පහතට ගත්හ. ඔව්හු එය පිරිසිදු අලුත් වස්ත්‍රයක ඔතා, කඳුකරයේ ගලක කොටා තිබූ කුඩා කාමරයක හෝ ගුහාවක තිබූ සොහොන්ගෙය තුල තැබූහ.

යේසුස් වහන්සේගේ ශරීරය එතීමේ කැපූ සටහන පහතට දැමීමට ළමයෙකුට සලස්වා, අනිත් ළමයින්ට සොහොන්ගෙය 2-7 කැපූ සටහන සහ, විශාල ගල 2-8 කැපූ සටහන ඉහලට එසවීමට සලස්වන්න.

යේසුස් වහන්සේගේ මිතුරන් උන්වහන්සේගේ ශරීරය සොහාන්ගෙයි තැබුවාට පසු දොර ලඟට විශාල ගලක් තල්ලු කර තැබූ බව පහදා දෙන්න

- යේසුස් වහන්සේගේ මිතුරන්ට එම සැන්දෑවෙහි කුමක් හැඟුනේද කියා ඔබ සිතන්නෙහිද?

රැකවල්ලු කැපූ සටහන, ඉහලට එසවීමට ළමයෙකුට සලස්වන්න.

පසුව ගැලවුම්කරුවාණන්ගේ සතුරන් සමහරෙක් සොහොන් ගෙය ලඟ රැකවලුන් තැබූව බව ළමයින්ට කියන්න. දින තුනකින් උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටින බව යේසුස් වහන්සේ ජනතාවට කී බැවින් ඔව්හු එසේ කළෝය. උන්වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටින බව උන්වහන්සේගේ සතුරෝ විශ්වාස නොකළහ. යේසුස් වහන්සේගේ මිතුරන් උන්වහන්සේව සඟවා, එතුමා නැවත ජීවත්වන්නේ යැයි කියනු ඇතැයි ඔව්හු සිතූහ.

දේවදූතයා 2-10 කැපූ සටහන ඉහලට එසවීමට ළමයෙකුට සලස්වන්න.

තුන්වෙනි දින උදෑසන දේවදූතයෙකු පැමිණ සොහොන් ගෙයට ඇතුල්වන තැන තිබූ ගල ඉවතට පෙරලූ බව පහදා දෙන්න. රැකවලුන් ඉතාම බියට පත්ව, මැරුණාක් මෙන් ඔව්හු පොළවට පතිතවූහ.

රැකවල්ලු සහ විශාල ගලේ කැපූ සටහනක් පහතට දැමීමට ළමයින්ට සලස්වා ආලේප සමග ස්ත්‍රීවරුන් 2-11 කැපූ සටහන ඉහලට එසවීමට වෙනත් ළමයෙකුට සලස්වන්න.

එදිනම එනම් ඉරුදිනයේදී, යේසුස් වහන්සේගේ මිතුරු ස්ත්‍රීන් සමහර දෙනෙක් සොහොන්ගෙය බැලීමට ගියබව ළමයින්ට කියන්න. යේසුස් වහන්සේගේ ශරීරයට දැමීමට සුවඳ සුගන්ධ ඔව්හු රැගෙන ආහ. මැරුණු පුද්ගලයාට ආදර ගරු බුහුමන් දැක්වීමට එම කාලයේ ජනයා මෙය කළහ.

සොහොන් ගෙයින් එම බර ගල ඉවත්කරන අන්දම ගැන ස්ත්‍රීවරුන් සිතුබව පහදා දෙන්න. නමුත් සොහොන් ගෙය ලඟට ඔවුන් පැමිණි විට, ගල ඉවතට තල්ලු කර තිබෙන බවද යේසුස් වහන්සේගේ ශරීරය එහි නොතිබුනු බවද ඔව්හු දුටුවෝය. සොහොන් ගෙය ලඟ දේවදූතයෙකු ඔව්හු දුටුවෝය.

- ගැලවුම්කාරයාණන්ගේ ශරීරය එහි නොමැති බව ස්ත්‍රීන් දුටු විට ඔවුන්ට කුමක් හැඟුනේ දැයි ඔබ සිතන්නෙහිද?
- ඔවුන් දේවදූතයෙකු දුටු විට ඔවුන්ට කුමක් හැඟුනේදැයි ඔබ සිතන්නෙහිද?

ශුද්ධ වූ ලියවිලි

දේවදූතයා ස්ත්‍රීන්ට කී දෙය මතෙව් 28:5–6 යෙන් ශබ්දනගා කියවන්න.

වහාම ගොස් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව ගෝලයින්ට කීමට දේවදූතයා ස්ත්‍රීන්ට කී බවද පහදා දෙන්න.

සියලුම කැපූ සටහන් පහත දැමීමට ළමයින්ට සලස්වා, යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි සේක 2-12 කැපූ සටහන, වෙනත් ළමයෙකුට ඉහලට එසවීමට සලස්වන්න.

ස්ත්‍රීන් ගොස් අනිත් ගෝලයින්ට කී බවද, තවද පසුව අනිත් ගෝලයින් යේසුස් වහන්සේ දුටු බවද පහදා දෙන්න. එතුමා නැවත ජීවත්වූ සේක.

- යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැවත ජීවත්වූ බව ඔවුන් දැනගත් විට ගෝලයින්ට හැඟුනේ කුමක්ද කියා ඔබ සිතන්නෙහිද?

නැවත බැලීමේ ක්‍රියාකාරකම්

සියලුම කැපූ සටහන් මුහුණ පහතට සිටින සේ මේසය මත හෝ බිම තබන්න. වාර අනුව කැපූ සටහනක් තෝරාගෙන යේසුස් වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ කථාන්තරයට අදාල කොටස් කීමට ළමයින්ට සලස්වන්න.

**අප මළවුන්ගෙන් නැවත නැගිටින බවට පාස්කුවේදී අපි සිහිපත් කරන්නෙමු.**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

නැවත නැගිටි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, 2-65 පිංතූරය පෙන්වන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත්වූවාට පසු එතුමාගේ ශරීරය භෞතික ශරීරයෙන් වෙන්වී ස්වර්ගයට ගිය බව පහදාදෙන්න. දින තුනකට පසු, එතුමාගේ ආත්මය එතුමාගේ භෞතික ශරීරයට ආපසු පැමිණ, එතුමාගේ භෞතික ශරීරය නැවත ජීවත් වෙයි. (ජීවමාන විය) මළවුන්ගෙන් නැවත නැගිටීම යැයි මෙයට අපි කියන්නෙමු. මළවුන්ගෙන් නැවත නැගිටීම යන්න ශබ්දනගා කිහිප වතාවක් කීමට ළමයින්ට සලස්වන්න.

ස්වර්ගීය පියාණන් වහන්සේගේ දරුවන් අතරෙන් පළමුවෙන්ම මළවුන්ගෙන් නැවත නැගිටිනු ලැබුවේ යේසුස් වහන්සේ බව ළමයින්ට පහදා දෙන්න. එතුමා මළවුන්ගෙන් නැවත නැගිටි බැවින්, අප සියලු දෙනාද නැවත නැගිටින්නෙමු. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙන් අප මරණයට පත්වී දින තුනකින් මළවුන්ගෙන් නැවත නොනැගිටින නමුත්, යම් දවසක අපි මළවුන්ගෙන් නැවත නැගිටින්නෙමු.

කථාන්තර

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ එතුමා මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන ඇය සිතූ විට ප්‍රීතියට පත්වූ එක් ගැහැණු ළමයෙකු ගැන කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාන්තරය භාවිතා කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

කාමන්ගේ අසල්වැසියකු වූ ශෙමිඩ් සහෝදරයාගේ වත්ත ලඟ ඇයගේ මිදුලේ ක්‍රීඩා කිරීමට ඇය කැමති-වූවාය. බොහෝ විට ශෙමිඩ් සහෝදරයා ඔහුගේ වත්තෙ වැඩ කරන විට, කාමන් ඔහු සමග කථාකරයි. ඔව්හු හොඳ මිත්‍රයන් වූහ.

ශෙමිඩ් සහෝදරයා වයස්ගතවී මරණයට පත්වූ බව දිනක් කාමන්ගේ මව ඇයට කීවාය. ඔහුගේ ආත්මය භෞතක ශරීරය හැර ගිය බවද, ඔහුගේ භෞතික ශරීරය තවදුරටත් ජීවත් නොවන බවද කීවාය.

ශෙමිඩ් සහෝදරය නැතිවූ පාඩුව කාමන්ට දැණුන නමුත්, පාස්කු කථාන්තරය ඇයගේ මව ඇයට මතක් කළාය. යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ කථාන්තරය කාමන්ට මතක් වූවාය. අපගේ මරණයෙන් පසු, අප සියලු දෙනාම මළවුන්ගෙන් නැගිට නැවත ජීවත් වන බවට යේසුස් වහන්සේ කී දෙය ඇය දැන සිටියාය. ශෙමිඩ් සහෝදරයාද මළවුන්ගෙන් නැවත නැගිටින බව කාමන් දැන සිටියාය. මළවුන්ගෙන් නැවත නැගිටීමට යේසුස් වහන්සේ අපට සැලැස්වූ නිසා ඇය සතුටු වූවාය.

සාකච්ඡාව

යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි දිනය පළවෙනි පාස්කුව යැයි අප හඳුන්වන බව පහදා දෙන්න. ලොව පුරා යේසුස් වහන්සේට ප්‍රේම කරන ජනතාව, යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ පාස්කු උත්සවය පවත්වති.

- පාස්කුවේදී අප ප්‍රීති වන්නේ කුමක් නිසාද? (යේසුස් වහන්සේ මෙන්ම, අප සහ අපගේ ආදරවන්ත සියලු දෙනාම මළවුන්ගෙන් නැවත නැගිටින බව අපි දනිමු.)
- පාස්කු කාලයේදී යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිහි කිරීමට හා අපගේ ප්‍රීතිය පෙන්වීමට අපට කළ හැකි සමහර දේවල් මොනවාද? (නිවසේදී යේසුස් වහන්සේ ගැන කථාකිරීමට, අපගේ පවුල්වල අය සමග යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන ගීත ගායනා කිරීම, පාස්කුව ගැන විශේෂ පාඩම්, වැඩසටහන් පැවැත්වීම, සහ සභාවේදී ගීත ගායනා කිරීම) යනාදිය සමහර පිළිතුරු විය හැකිය.

**සාරාංශය**

ගීතය

"සත්‍යයෙන්ම යේසු නැවත ජීවත්වූයෙද?" යන්න ළමයින් නැගිට සිටිමින් ගායනා කිරීමට හෝ වචන කීමට සලස්වන්න. පෙන්වා දී තිබෙන ක්‍රියා කිරීමට ළමයින්ට උපකාර කරන්න:

සත්‍යයෙන්ම යේසු නැවත ජීවත්වූයේද? (අල්ල උඩට සිටින සේ අත් අල්ලා ගන්න.)
ඔව්, තුන්වෙනි දින පැමිණි විට (ඇඟිලි තුනක් ඉහලට ඔසවන්න)
නැගිට එතුමා සොහොන් ගෙයින් පිටවී (එකතැන ඇවිදින්න);
මරියාගේ නමින් කථා කළේ (කට වටේ අත බොකුටු කර තබාගන්න).

යේසුගේ ආදරවන්තයින් වෙත පැමිණියේද එතුමා (හදවත උඩ අත් තබා ගන්න)?
ඔව්, එතුමාගේ පාද ජනයා ඇල්ලුවේ (පහත්වී පාද අල්ලන්න),
මාලු සහ මී වදද
එතුමා ඇත්තෙන්ම කෑවා (කනවා මෙන් අංගචලනය කරන්න).

ඇණ සලකුණු අත්වල තිබූ (අත් පෙන්වන්න)
හෙල්ලෙන් කළ තුවාල ඇළයේ ඇත (පැත්ත පෙන්වන්න).
සත්‍යයෙන්ම යේසු නැවත ජීවත්වූයේද?
එතුමා මැරුණට පසු (අල්ල උඩට සිටින සේ අත් අල්ලා ගන්න)
ආ ඔව්! මාද එසේය (ඔලුව වනන්න)!

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන ඔබගේ සාක්ෂිය දරන්න. ඔබ සහ ඔබගේ ආදරවන්තයින් යම් දිනක නැවත මළවුන්ගෙන් නැගිටින බව දන්නා බැවින් ඔබට හැගෙන අන්දම ළමයින්ට කියන්න.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන, ඔවුන්ගේ පවුල් වල අය සමග කථාකිරීමට ළමයින්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

## සාරවත්කිරීමේ ක්‍රියාකාරකම්

ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව” අමතර මග පෙන්වීම් බලන්න.

1. පාඩමේ අවසානයෙහි තිබෙන, “පළමුවන පාස්කුව” වන චිත්‍ර කථාන්තරය ළමයින් සමග කියවන්න. පිංතූර වලින් පෙන්වා දී තිබෙන පරිදි, උචිත ස්ථාන වලදී හිස්තැන වචනය පිරවීමට, ළමයින්ට උපකාර කරන්න. හැකිනම්, එක් එක් ළමයා වෙනුවෙන් කථාන්තරයේ පිටපතක් සෑදීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

2. මරණයට පත්වූ ඔබගේ පවුලේ සාමාජිකයෙකුගේ හෝ ඔබගේ මිතුරෙකුගේ පිංතූරයක් ගෙනෙන්න. පිංතූරය පෙන්වා, එම පුද්ගලයා සමග ඔබ කළ යම් යම් දේවලද, ඔබ ඔහු ගෞරවයෙන් සලකන්නේ කුමක් හෙයින්ද, ඔහුට හෝ ඇයට ඔබ ආදරය කරන්නේ මන්ද යනාදිය ගැන ළමයින්ට කථා කරන්න. යම් දිනක මෙම පුද්ගලයා දැක ගැනීමට ඔබට හැකි වන බව ඔබ දන්නා බැවින් ඔබගේ හැඟීම් ප්‍රකාශ කරන්න.

3. අප නැවත ජීවත් වන්නෙමු, යන්න ලියූ කඩදාසි කෑල්ලක් එක් එක් ළමයෙකුට දෙන්න. මරණයට පත්වූ ඔවුන්ගේ ආදරවන්තයින් හෝ ඔවුන්ගේ පවුල්වල අයගේ පිංතූර ඇඳීම පිණිස ළමයින්ට පාට පැන්සල් දෙන්න. ඔවුන්ගේ පිංතූර ගැන පංතියේ අනික් සාමාජිකයින්ට කීමට ළමයින්ට ඉඩදෙන්න.

   යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි බැවින්, අප සියලු දෙනාම මරණින් පසු මළවුන්ගෙන් නැවත නැගිටින බව ළමයින්ට මතක්කරන්න. අපගේ ආදරවන්තයෝ සියලු දෙනාද යම් දිනක මළවුන්ගෙන් නැවත නැගිටින්නෝය.


4. ඔබ දන්නා හෝ දැක ඇති ශාරීරික හෝ මානසික ආබාධ ගැන ළමයින් සමග සාකච්ඡා කරන්න. මළවුන්ගෙන් අප නැවත නැගිටි විට අපගේ ශරීර සර්ව සම්පූර්ණ වන බව වටහා ගැනීමට ළමයින්ට උපකාර කරන්න (ඇල්මා 40-23 බලන්න). කිසිවෙකුට වත් ආබාධ ඇති නොවන්නේය. එය කෙතරම් ආශ්චර්යමත් වන්නේද කියා සාකච්ඡා කරන්න.

5. “යේසු නැගිටි සේක” (ළමා ගී පොත, පි. 70) ළමයින් සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න.


   යේසු නැගිටි සේක,<br>
   යේසු, අපගේ මිතුරා.<br>
   සතුට හද තුල පිරේ;<br>
   නැවත ඔහු ජීවත් වේ.<br>
   පසන් ගී අපි ගයමු ඔහුට,<br>
   මෙම පාස්කුවේ.<br>
   යේසු නැගිටි සේක,<br>
   ගැලවුම්කරු දිව්‍යමය.<br>
   යේසු නැගිටි සේක,<br>
   ගැලවුම්කරු දිව්‍යමය.

# පළමු වෙනි පාස්කුව.




 මිතුරන්.


 සොහොන් ගෙය.



 ගල.

 හේවායෝ.

 දේවදූතයා

යේසුස් වහන්සේ මරණයට පත්වූවාට පසු එතුමාගේ  දුකට පත්වූහ. එතුමා  තුල ඔව්හු තැබූහ.  ඉදිරියෙහි විශාල  තබන ලදී. කිසිවෙකු  ඉවතට පෙරලනවාද බැලීමට  ඒ අසල සිටගෙන සිටියෝය.

දින 3 ක් යේසුස් වහන්සේගේ ශරීරය  තිබුනේය. ඉන් පසු තුන්වෙනි දිනයේ උදෑසන,  පැමිණ  ඉවතට පෙරලුවේය.   දුටු විට බියට පත්වූහ.

ඒදින යේසුස් වහන්සේගේ   වෙතට ආවෝය.  ඉවතට පෙරලා තිබෙනු ඔව්හු දුටුවෝය.  තුල  සිටියේය.  මෙසේ කීවේය, "එතුමා මෙතැන නැත; මක් නිසාද එතුමා නැගිටි සේක."

යේසුස් වහන්සේ මරණයට පත්වූ බැවින් අප සියලු දෙනාටම මරණින් පසු නැවත ජීවත් වීමට හැකිවෙයි. යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැවත නැගිටි දිනය අප සියලු දෙනාටම සිහි කිරීම සඳහා අපට පාස්කුව තිබේ.

# 46 වෙනි පාඩම

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉතාම උතුම් දීමනාවකි (නත්තල).

**අරමුණ**

අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේව පොළොවට එවා අපට දුන් එම ශ්‍රේෂ්ඨ දීමනාව අගය කිරීමට එක් එක් ළමයෙකුට උපකාර කිරීමටය.

**සූදානම**

1. මතෙව් 2:1–12 සහ යොහාන් 3-16 යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්න.
2. යේසුස් වහන්සේගේ උපත 2-41 පිංතූරය, (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 200; 62116) පෙට්ටියක් තුල තබා, හැකිනම් එය තෑග්ගක් මෙන් ඔතන්න. යොහාන් 3:16 (කඩදාසි) කැබැල්ලක ලියා එම තෑග්ගට අමුණන්න.
3. කඩදාසියක් දෙකට නමා, එහි ඉදිරිපස ශුභ නත්තලක් යයි ලියා එක් එක් ළමයෙකු වෙනුවෙන් කාඩ් පත් සාදන්න. හැකිනම්, ළමයින්ට (නත්තල්) පත් දැමීම පිණිස ලියුම්කවර ගේන්න.
4. ශාස්ත්‍රවන්තයන් අනුගමනය කළ තරුව මෙන් තරුවක් අඳින්න නැතහොත් කඩදාසියකින් කපා-ගන්න. (තරුවක නිදර්ශනය පාඩම අවසානයේ සඳහන් කර ඇත.)
5. මරියා, යෝසෙෆ් සහ ශාස්ත්‍රවන්තයින් මෙන් රඟපෑමට ඇඳුම් වලට භාවිතා කිරීම පිණිස (හිස්වැස්ම කබායවල්) වැනි රෙදි ගෙනෙන්න. ඇඳුම් පහසුවෙන් ලබා ගැනීමට නොහැකි නම්, එම කොටස් පෙන්වන නම් ලියූ කඩදාසි කැබෙලි ගේන්න. යේසුස් වහන්සේව නියෝජනය කිරීමට බෝනික්කෙක්ද ශාස්ත්‍රවන්තයන්ගේ තෑගි නියෝජනය කිරීමට (පෙට්ටියක්, ජෝගුවක් සහ මල් පෝච්චියක්) වැනි දේවල් ගෙන එන්න.
6. "එතුමාගේ පුත්‍රයා එතුමා එව්සේක" (ළමා ගී පොත, පි. 34), ගායනා කිරීමට හෝ වචන කීමට සූදානම් වෙන්න. මෙම ගීතයට වචන අත් පොතේ පිටුපස අඩංගුවී ඇත.
7. අවශ්‍ය උපකරණ.
   අ. බයිබලයක්
   ආ. ආත්මික නත්තල් සංගීත තැටි. (අවශ්‍ය නම්)
   ඇ. පැන්සල් සහ පාට පැන්සල්.
   ඈ. 2-7 පිංතූරය ශාස්ත්‍රවන්තයින් (ශුභාරංචි චිත්‍ර පිංතූර මෙවලම 203; 62120)
8. සාරවත් කිරීමේ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ඔබට උවමනා නම් එයට අවශ්‍ය අන්දමට සූදානම් වෙන්න.

**යෝජිත පාඩම් වැඩිදියුණු කිරීම**

ආරම්භක යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

සතිය තුලදී යමක් කිරීමට ළමුන්ව ඔබ දිරිගන්වනවා නම් ඒ අනුව යන්න.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත ශ්‍රේෂ්ඨතම දීමනාව වේ.**

ක්‍රියාකාරීත්වයට යොමු කිරීම

ඔතන ලද තෑග්ග ළමයින්ට පෙන්වන්න. අපට ඉතාමත් ප්‍රේම කරන යම් කෙනෙකුගෙන් ආශ්වර්යමත් තෑග්ගක් නියෝජනය කරන යම් දෙයක් මෙම ඇසුරුම ඇතුලේ තිබෙන බව කියන්න.

ඇසුරුම අල්ලා එහි තුළ තිබෙන දෙය අනුමාණ වශයෙන් කීමට වාර අනුව එක් එක් ළමයෙකුට ඉඩදෙන්න.

කඩදාසි කැබෙල්ල හෝඩුවාවක් බව ළමයින්ට කියන්න. යොහාන් 3:16 ශබ්දනගා කියවන්න. තෑග්ග කුමක්ද එය කාගෙන්ද යන්න දැන් ළමයි දන්නවාද කියා අසන්න. (දෙවියන් වහන්සේ යන්න ස්වර්ගීය පියාණන් වහන්සේට කියන තවත් නමක් බව ළමයින්ට මතක් කිරීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත). තෑග්ග ඔතන ලද දවටනය ඉවත්කොට, සියලු දෙනාටම පෙනෙන සේ, පිංතූරය ඉහලට එසවීමට ළමයෙකුට සලස්වන්න.

සාකච්ඡා

- තෑග්ග කුමක්ද?
- තෑග්ග කාගෙන්ද?
- යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත එතරම්ම ආශ්චර්යමත් තෑග්ගක් වන්නේ කුමක් නිසාද?

ක්‍රිස්තුස් වහන්සේගේ තෑග්ග එතරම්ම ශ්‍රේෂ්ඨ තෑග්ගක් වන එක් කරුණක් නම්, ජීවත්වීමට හරි මාර්ගය අපට ඉගැන්වීමට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැමිණි බව අවබෝධ කර ගැනීමට ළමයින්ට උපකාරවන්න. අන්‍යයන්ට ආදරය කරමින් හා උපකාර කිරීමෙන් අපට ප්‍රීතිය ලැබෙන බව එතුමා ඉගැන්වූ සේක. යේසුස් වහන්සේ පොළොවට එවීමෙන්, ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දුන් තෑග්ග නත්තල් කාලයට පමණක් නොව නිතරම ප්‍රීතිය ලබා ගැනීමට අපට උපකාර වන්නේය.

ගීතය

"එතුමාගේ පුත්‍රයා එතුමා එව්සේක" ළමයින් සමග ගායනා කරන්න නැතහොත් වචන කියනන.

## ළදරු යේසුස්ට ශාස්ත්‍රවන්තයෝ තෑගි දුන්නෝය.

ශුද්ධ වූ ලියවිලි කථානතර සහ සාකච්ඡා

උන්වහන්සේ අපට දුන් තෑග්ග සියලු දෙනාම දැනගැනීම ස්වර්ගීය පියාණන් වහන්සේට අවශ්‍ය වූ බැවින්, උන්වහන්සේ ලස්සන තරුවක් අහසේ තැබූ බව පෙන්වා දෙන්න.

ශාස්ත්‍රවන්තයින්, පිංතූරය 2-7 පෙන්වා, යේසුස් වහන්සේ සොයා ගැනීමට තරුව අනුගමනය කළ ශාස්-ත්‍රවන්තයින්ගේ කථාන්තරය කීමට ළමයින්ට කියන්න (මතෙව් 2:1–12 බලන්න). ඔවුන්ට අමතක වූ යම් විස්තර ඇත්නම් ළමයින්ට උපකාරවන්න.

මතෙව් 2:11 ශබ්දනගා කියවන්න.

- ශාස්ත්‍රවන්තයින් යේසුස් වහන්සේට රැගෙනආවේ කුමණ තෑගිද?

කට්ටකුමංචල් සහ සුවඳ ලාටු, ආගමික උත්සව වලට භාවිතාකරන මිහිරි සුවඳ ගෙන දෙන සුගන්ධ ජාති බව පහදා දෙන්න. සියලුම තෑගි තුන වටිනා සොයාගැනීමට අපහසු ඒවාය. ඔවුන්ට සොයාගැනීමට හැකි ඉතාම හොඳ (ලස්සන) තෑගි යේසුස් වහන්සේට රැගෙන ඒමට ශාස්ත්‍රවන්තයින්ට අවශ්‍ය විය.

- ශාස්ත්‍රවන්තයින් මෙම තෑගි යේසුස් වහන්සේට ගෙන ආවේ කුමක් නිසාද? (ඔවුන්ගේ ආදර ගරුබුහුමන් එතුමාට පෙන්වීමටය).
- ශාස්ත්‍රවන්තයින් යේසුස් වහන්සේව දුටුවිට හිස නමා නමස්කාර කළේ කුමක් හෙයින්ද? (ස්වර්ගීය පියාණන් වහන්සේගේ පුත්‍රයාණන් වූ එතුමා ගැලවුම්කාරයාණන් බව ඔව්හු දැන සිටියෝය.)

රඟදැක්වීමේ ක්‍රියාකාරකම්

ශාස්ත්‍රවන්තයින්ගේ කථාන්තරය රඟදැක්වීමට ළමයින්ට සලස්වන්න. සහභාගී වීමට අවශ්‍ය එක් එක් ළමයෙකුට කොටසක් දෙන්න. ළමයින්ට මරියා, යේසොෆ් සහ ශාස්ත්‍රවන්තයින් විය හැකිය. (සියලු දෙනාටම සහභාගී විය හැකි අන්දමට බොහෝ අය ශාස්ත්‍රවන්තයින් වීම ඔබට අවශ්‍ය වෙනවා ඇත). කඩදාසි තාරකාව අල්ලා සිටීමට, එක ළමයෙකුට කීමට ඔබට හැකිවේ. ඔවුන්ගේ ඇඳුම් ඇඳගැනීමට හෝ නම් ලිවූ කඩදාසි කැබලි දාගැනීමට ළමයින්ට උපකාර කරන්න.

ඉදිරිපත් කිරීමට අමතරව ආත්මික නත්තල් සංගීත තැටියක් පසුබිමේ සිට සෙමින් වාදනය කිරීමට ඔබ කැමතිවෙනවා ඇත.

මතෙව් 2:1–12, තෝරාගත් පද විශේෂයෙන්ම 2 සහ 9–11 යන පද කියවමින් විස්තර කළ හැකිය. ශාස්ත්‍රවන්තයින් සමග මතෙව් 2:2 කියවීමට ඔබට සැලැස්විය හැකිය. (අවශ්‍ය නම්, යුදෙව්වන්ගේ රජ යනු යේසුස් වහන්සේට කියන තවත් නමක් බව පහදාදෙන්න).

**ප්‍රේමයේ තෑගි දීමෙන් අපට ප්‍රීතිය ලැබේ.**

කථාන්තර

උන්වහන්සේට ඔවුන්ගේ ආදරය පෙන්වීම පිණිස ශාස්ත්‍රවන්තයින් යේසුස් වහන්සේට තෑගි රැගෙන ආවාක්මෙන්, අන්‍යයන්ට අපගේ ආදරය පෙන්වීම පිණිස අපට තෑගි දීමට හැකිය.

පසු කාලයකදී ප්‍රධාන අධිකාරියේ (සාමාජිකයෙකු වූ) එස්. ඩිල්වත් යං නම ඇති තරුණ පිරිමි ළමයා ගැන පහත සඳහන් කථාන්තරය කියන්න:

එම නත්තලේදී අවුරුදු පහක් වයසැති එස්. ඩිල්වර්ත් යං, වෙළඳ සැලක ජනේලය මත ප්‍රදර්ශනය කර තිබුන කැබලි රැසක් එක්කොට සාදාගත හැකි පිංතූරයකින් යුත් ප්‍රහේළිකාවක් ඔහු දුටුවේය. වයසක අශ්වයෙකු ඇදගෙන යන ට්‍රක් රථයක පිංතූරයක් එම ප්‍රහේළිකාවේ තිබුනි. එම නත්තලේදී වෙන කිසිම දෙයකට වඩා ඩිල්වර්ත්ට අවශ්‍යව තිබුනේ එම ප්‍රහේළිකාවය.

නත්තල් දිනයේදී ප්‍රහේළිකාවට සිදුවූ දෙය වැඩිහිටි යං පසුව විස්තර කළේය.

"අන්තිමට නත්තල් උදෑසන පැමිණි විට, ලස්සන දේවල් පුරවන ලද මේස් එකක් මගේ පුටුවේ එල්ලා තිබෙනවා මට සම්බ විය. එක සැරේම මගේ ප්‍රහේළිකාව මම හඳුනා ගතිමි. තද පාට කඩදාසි වලින් ඔතා තිබුන නමුත්, හැඩහුරු කමින් එය කුමක්ද කියා කීමට මට හැකි විය. වහාම මම පෙට්ටිය ඇර ප්‍රහේළිකාව එකට දැමීමේ ප්‍රීතිය තුල ඉක්මණටම ගිලුනෙමි.

"වැඩි වේලාවක් ගතවීමට පෙර, ලඟදී ඩෙන්මාර්ක් සිට පැමිණි ජෙන්සන් පවුල වීථිය පහල ජීවත් වන බව, මගේ බාල සහෝදරයාට, වැඩිමහල් සහෝදරියට සහ මට මගේ පියා කීවේය. එම පියාට රැකියා-වක්ද මුදල්ද නැති බව කියමින් අපේ නත්තල් රෑ ආහාර වේල ඔවුන්ට ගෙන යෑමට ඔහු යෝජනා කළේය. අප එක් එක්කෙනා ඉතාම ප්‍රිය කරන සෙල්ලම් බඩු, ජෙන්සන් පවුලේ එක් එක්කෙනාට ගෙන යෑමටද ඔහු කීවේය....

"අප ජෙන්සන්ලාගේ නිවසට යෑමට පෙර, ප්‍රහේළිකාව සමග සෙල්ලම් කරමින්ද විනෝද වෙමින් පැය තුනක් මම සතුටින් ගතකළෙමි. වෙන යමක් දීමට මම සිතුවෙමි. නමුත් දීමට ඇත්තේ එකම තෑග්ගක් පමණක් බව මගේ හදවතේ පතුලින්ම මම දැන සිටියෙමි.

"එකොලහයි හතලිස් පහට අපි සියලු දෙනාම ගමන් ඇරඹුවෙමු. පියා තැටියක් මත වූ කළුකුමා රැගෙන ගියේය. මව සහ මගේ සහෝදරිය එමලි, අල, හොදි, සලාද වලට යොදන තෙල් විනාකිරි ආදී මිශ්‍රණයද, දං වැනි ගෙඩි සහ අතුරුපස රැගෙන ගියහ. ප්‍රවේශමෙන් නැවත ඔතන ලද මගේ ප්‍රහේළිකාව වන ගිනි ඇන්ජිම මගේ කිහිල්ල යට විය.

"ජැන්සන්ගේ නිවසට අපි ඇතුල්වූයෙමු. කොණක තිබූ හිස් මේසය මත අපගේ පියා කළුකුමා තැබූ අතර, අනික් අයද එසේම කළෝය.

"ඊට පසු අපි එක් එක්කෙනා වාර අනුව ඔවුන්ට තෑග්ග දුන්නෙමු. එමලි ඇගේ ලස්සන බෝනික්කා ගැණු ළමයාට දුන්නාය. මම ඉදිරියට පියවර තබා, මගේ වයසේ පිරිමි ළමයා දෙස බැලුවෙමි. 'මෙන්න,' ඔහු වෙතට මගේ ප්‍රහේළිකාව තල්ලු කරමින් මම කීවෙමි. ඔහු එය මගෙන් රැගෙන සිනහසුනේය. ඉන්-පසු මගේ සහෝදරයා ඔහුගේ දීමනාව කුඩාම ළමයාට දුන්නේය. පසුව අපි ආපසු නිවසට පැමිණියෙමු.

“එය පුදුමයකි, අපේ නිවස සහ ජෙන්සන්ලාගේ නිවස අතර කොටස් වල මා ඇවිදින විට මගේ කකුල් පොළොව ස්පර්ශ නොකරන්නාක් මෙන් මට දැනුනි. සුහද හැඟීම් නම් වූ වළාකුල් මත මා ඇවිදින්-නාක් මෙන් මට හැඟුනි. මක් නිසාද තවත් කෙනෙකු සතුටු කළ බව මා දැනගත් නිසාය.

“තම විශේෂිත වූ නත්තල් දිනයේ, අපගේ නත්තල් රෑ ආහාර වූ ටින්කළ බෝංචි, පාන්, බටර්, සහ බෝතල් කළ පළතුරු වල විශේෂ අමතක නොවන අර්ථයක් ඇති විය!” (එස්. ඩිල්වර්ත් යං, “මිතුරාට මිතුරා: විශේෂිතවූ නත්තලක්.” මිතුරා, දෙසැ. 1972, පි. 20–21. (S. Dilworth Young, “*Friend: A Special Christmas*, ” *Friend*, Dec. 1972, pp. 20–21).

සාකච්ඡා

- ඔහු සතුටට පත්වීම සඳහා ඩිල්වර්ත් කළේ කුමක්ද?
- ඔහුගේ ප්‍රියතම සෙල්ලම් භාන්ඩය දුන්නාට පසු ඔහු සතුටු වූයේ කුමක් නිසාද?
- ඔහු හෝ ඇය සතුටු කිරීමට ඔබ කවදා හෝ යමෙකුට යමක් දී තිබේද?

අන්‍යයන්ට තෑගි දීමෙන් ඔවුන්ව සතුටට පත් කළ අවස්ථාවන් ගැන කථා කිරීමට ළමයින්ට සලස්වන්න.

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

අප අන්‍යයන්ට තෑගි දෙන විට, අපගේ ආදරය ඔවුන්ට පෙන්වන බව පහදා දෙන්න. තෑගි ලැබීමෙන් අප සතුටුවන්නාක් මෙන්, තෑගි දීමෙන්ද අපිට සතුටු විය හැකිය. ආදරය බොහෝ සේ පෙන්වීමට තෑගි මිළ අධික නොවිය යුතු බව පෙන්වා දෙන්න. ඉතාම හොඳ තෑගි සමහරක් නම් සේවයේ තෑගිය.

කථාන්තර

සේවයේ තෑගි දුන් ළමයෙකු ගැන කථාන්තරයක් කියන්න. පහත සඳහන් කථාන්තරය කීමට ඔබට අවශ්‍ය වෙනවා ඇත.

නත්තල ඉක්මණට පැමිණෙමින් තිබුනි. ඇයගේ පවුලේ අයට ඇය කෙතරම් ආදරේද කියා පෙන්වීම පිණිස නත්තල් තෑගි දීමට බෙත්ට අවශ්‍ය විය. නමුත් ඇයට මුදල් නොතිබුනි. කිසිම තෑග්ගක් ඇයට දීමට නොහැකි වේ යැයි සිතා, ඇය බොහෝ දුකට පත්ව සිටියාය. ඉතාම හොඳ තෑගි සමහරක් නම් මුදල් වලට මිලදී ගැනීමට නොහැකි තෑගි බව ඇගේ ප්‍රාථමිකයේ ගුරුවරිය පංතියට කියූ බව ඇයට මතක් විය. සේවයේ තෑගි දීමට බෙත් තීරණය කළාය.

පවුලේ සෑම සාමාජිකයෙකුටම බෙත් (නත්තල්) පත් සෑදූ අතර, පවුලේ එම සාමාජිකයාටම ඇය යමක් කරන බව එක් එක් (නත්තල්) පතකම ඈ ලීවාය. ඇයගේ සහෝදරිය කැමති ක්‍රීඩාවක් ඇය කරන බව ඇයගේ බාල සහෝදරියගේ (නත්තල්) පතෙහි ඈ ලීවාය. ඔහුගේ වාරය ඇති රැයක, ඔහු වෙනුවෙන් කෑම භාජන සෝදන බව ඇයගේ වැඩිමහල් සහෝදරයාගේ (නත්තල්) පතෙහි ඈ ලීවාය. මව නිදා ගන්නා විට ළදරුවා රැකබලා ගැනීමට ඇයගේ මවට පොරොන්දු වූ අතර, වත්තෙහි වැඩ කිරීමට උදව් කරන බවට පියාට ඈ පොරොන්දු වූවාය. ඇයගේ පියාට ඇයගේ ප්‍රියතම තෑග්ග: මාසයක්ම සෑම උදෑසනකම සියල්ලට පළමුවෙන් ඔහුව වැළඳගැනීමට ඈ පොරොන්දු වූවාය.

නත්තල් උදෑසන ඇයගේ පවුලේ අයට ඇයගේ තෑගි බෙත් දුන්නාය. බෙත්ගේ සේවයේ තෑගි වලට සියලු දෙනාම කැමති වූහ. බෙත් එවැනි ආශ්චර්යමත් තෑගි දුන් නිසා ඔවුන්ට ඇය ආදරය කරන බව දැනගත්හ.

(නත්තල්) පත් ක්‍රියාකාරකම්

ඝන කඩදාසි කැබෙල්ලක් සහ පැන්සලක් හෝ පාට පැන්සලක් එක් එක් ළමයෙකුට දෙන්න. මෙම (නත්තල්) පත් වලින් ඔවුන් එක් එක්කෙනාට, බෙත් කළා මෙන් සේවයේ තෑග්ගක් දීමට හැකි බව ළමයින්ට කියන්න.

ළමයින්ට දීමට හැකි, එනම් සහෝදරයාගේ හෝ සහෝදරියගේ ඇඳ සකස්කිරීම, රෑ කෑමට මේසය සූදානම් කිරීම, ළදරු සහෝදරයා හෝ සහෝදරිය සමග ක්‍රීඩා කිරීමට හෝ දෙමව්පියන් වෙනුවෙන් පණිවිඩ ගෙන යෑම යනාදි තෑගි ගැන සාකච්ඡා කරන්න. සේවයේ තෑග්ගක් සහ එම තෑග්ග දෙන පුද්ගලයාව තොරා ගැනීමට එක් එක් ළමයෙකුට උපකාර කරන්න.

(නත්තල්) පතෙහි ඇතුලේ උඩ පිටුවේ මම කරමි යන්නද පහත පිටුවේ ඔබට යන්නද ලිවීමට එක් එක ළමයෙකුට උපකාරවන්න.

පුටුවේ මැද යම් කෙනෙකුට සේවයේ තෑග්ගක් මෙන් ඔහු හෝ ඇය කරන දෙයක් ඇඳීමට එක් එක් ළමයෙකුට සලස්වන්න.

ඔබ ලියුම් කවර රැගෙන ආවා නම්, (නත්තල්) පත දැමීමට එක් එක් ළමයෙකුට ලියුම් කවරයක් දෙන්න. ලියුම් කවරයේ හෝ (නත්තල්) පත මුල් පිටුවේ ලබන්නාගේ නම ලිවීමට ළමයාට උපකාර කරන්න.

ඔවුන්ගේ පවුල් වල අය තෑගි හුවමාරු කරන විට ඔවුන්ගේ (නත්තල්) පත් දීමට ළමයින්ට මතක්කරන්න.

පවුලේ අතිත් සාමාජිකයන්ට හෝ මිතුරන්ට තිවසේදී එවැනිම තෑගි ඔවුන්ට සෑදීමට ඔබට යෝජනා කිරීමට අවශ්‍ය වෙනවා ඇත.

**සාරාංශය**

ගුරුවරයාගේ ඉදිරිපත් කිරීම

ස්වර්ගීය පියාණන් වහන්සේ අපට දී තිබෙන ඉතාම වැදගත් තෑග්ග යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව ළමයින්ට මතක්කරන්න. උන්වහන්සේ සහ ස්වර්ගීය පියාණන් වහන්සේ සමග යම් දිනක ජීවත් වීමට අපට ආපසු යෑමට යේසුස් වහන්සේ අපට උපකාර කරන බැවින්ය. යේසුස් වහන්සේව පොළොවට එවීමෙන් ස්වර්ගීය පියාණන් වහන්සේ අපට ප්‍රේමය දැක්වූ ආකාරයට, විශේෂිත තෑගි අන්‍යයන්ට දීමෙන් අපගේ ප්‍රේමය ඔවුන්ට දැක්වීමට අපට හැකි බව පහදාදෙන්න.

සාක්ෂිය

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් බවට ඔබගේ සාක්ෂිය දරන්න. ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප එක් එක්කෙනාට කොතරම් ප්‍රේමකරනවාද යන්න ගැන ඔබ සිතන විට ඔබට හැඟෙන අන්දම ගැන ළමයින්ට කියන්න.

ඔවුන් නත්තල් උත්සවය පවත්වන විට, ස්වර්ගීය පියාණන් වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සිහි කිරීමට ළමයින්ව දිරිගන්වන්න.

අවසාන යාච්ඤාව දීමට ළමයෙකුට ආරාධනා කරන්න.

---

## සාරවත් කිරීමේ ක්‍රියාකාරකම්


ඔබගේ ළමයින්ට ඉතා හොඳට ගැලපෙන ඒවා පහත සඳහන් ක්‍රියාකාරකම් වලින් තෝරා ගන්න. පාඩමට හෝ නැවත බැලීම වශයෙන් හෝ සාරාංශයක් මෙන් හෝ ඔබට ඒවා භාවිතා කළ හැකිය. “ගුරුවරයාට උපකාර” යන්නෙහි “පංති වේලාව,” අමතර මගපෙන්වීම් බලන්න.


1. “නිසල රැය” (ගීතිකා අංක. 204) පළවෙනි පදය ළමයි සමග ගායනා කරන්න නැතහොත් වචන කියන්න.

   නිසල රැයේ! ශුද්ධ රැයේ!
   සියල්ල නිසලයි, සියල්ල දීප්තියි
   කන්‍යා මව සහ දරුවා වටේ.
   ශුද්ධ ළදරුවා, මුදු මොළොක් වූ,
   සගයේ සාමයෙන් නිදයි;
   සගයේ සාමයෙන් නිදයි.

2. “ගව මඩුව අවට” (ළමා ගී පොත, පි. 42), “මරියාගේ දරු නැළවිලි” (ළමා ගී පොත, පි. 44), හෝ “නැලවෙන්න මගේ ළදරුවා” (ළමා ගී පොත, පි. 48) ගායනා කරන්න නැත්නම් වචන කියන්න. මෙම ගීත වලට වචන අත්පොතේ පිටුපස අඩංගු වී ඇත.

3. මතෙව් 2:1–2, 9–11 ශබ්දනගා කියවන්න. ශාස්ත්‍රවන්තයින්ට තරුවේ වැදගත් කම ගැන සාකච්ඡා කරන්න. කඩදාසියකින් ත්‍රිකෝණ දෙකක් කපා එකට අලවා තරු සැරසිල්ලක් (පහත සඳහන් නිදර්ශනය බලන්න) සෑදීමට එක් එක් ළමයෙකුට උපකාර කරන්න. ඔවුන්ගේ තරු ගෙදර ගෙන යෑමට ළමයින්ට ඉඩදෙන්න.





# ගීත වලට වචන

**ප්‍රීතිමත් පවුලක්.**

අම්මාට පෙම් කරමි, ඈ මට පෙම් කරයි.
පියාට අපි පෙම් කරමු, ඔව් මහතා
ඔහු අපට පෙම් කරයි, එය ඔබට පෙනෙයි.

ප්‍රීතිමත් පවුලකි අපි.
සොයුරිට පෙම් කරයි, ඈ මට පෙම් කරයි.
සොයුරට අපි පෙම් කරමු, ඔව් මහතා
ඔහු අපට පෙම් කරයි, එය ඔබට පෙනෙයි,
ප්‍රීතිමත් පවුලකි අපි.

(© 1948, 1975 by Pioneer Music Press, Inc. Used by Permission of Jackman Music Corp.)

**ගව ඔරුවේ එපිට**

ගව ඔරුවේ එපිට, තොටිල්ල නැත ඇඳකුත් නැත,
කුඩා සමිඳු යේසු මුදු මොළොක් හිස තබා ඇත;
සගයේ තරු ඔහු දෙස බලයි පහත
කුඩා සමිඳු යේසු, පිදුරු ගොඩේ නිදයි.

දෙනුන් අඬති, අසරණ ළදරුවා නැගිටියි;
කුඩා සමිඳු යේසු, නොහඬයි ඒ හඬට.
මා පෙම් කරමි සමිඳු යේසුට, බලනු මැන උඩ සිට
සිටිනු මැන මා තොටිල්ල ලඟ උදෑසන තෙක්

සමිඳු යේසු මා ලඟ සිටිනු මැන; මම ඔබට කියමි.
මා ලඟ සදා, පෙම් කරනු මට, යදිමි මා,
ඔබ මුදු මොළොක් රැකවරණයෙන්, සියලු ළමයින්ට ආසරිගන්වනු මැන,
ඔබ සමග විසීමට සගයට අප සකස්කළ මැන.

**බව්තීස්මය.**

යොහාන් බව්තීස්ත වෙතට යේසු ආවේ,
යුදාහි පෙර දවසක,
ගිල්වා බව්තීස්ම කළේ
ගලා යන ජෝර්දාන් නදියේ.

"නීතිය පූර්ණ කිරීමට," යේසු කීහ,
බව්තීස්ත ප්‍රශ්න කළ විට
"මා පියා සමග ඇතුල්වීමට
ඉහල ඇති රාජධානියට."

දැන් අපි දනිමු අපිද
යේසුගේ වචනයට බැතියෙන් සාක්ෂිය,
බව්තීස්මයෙන් කීකරු වීම,
අපගේ සමිඳු යේසු ක්‍රිස්තු මෙන්.

**හරි මග තෝරා ගන්න.**

ජීවත් වීමට ඇත හරි මගක්;
දිනපතා හරි දෙය තේරීමය.
යේසුගේ ඉගැන්වීම මම ගනිමි ඉගෙන;
ඒවා පිහිට වේ මට මග පෙන්වමින්.

*ගීත කණ්ඩය:*

හරි දෙය තෝරා ගෙන සතුටු වෙන්න.
සැම කල්හි තෝරමි මම හරි දෙය.
යාච්ඤාවන්ත වීමට ශුභාරංචියෙන් ඉගෙන ගනිමි මම,
භක්තිවන්ත වීමට, පසු තැවීමට, කීකරු වීමට,
එතුමාගේ ඉගැන්වීම් අනුව ජීවත්වන විට දනිමි මම,
ප්‍රීති වෙමි සත්තකින්ම දිනපතා මම.

ගීත කණ්ඩය.

**නොබියව කරනු හරි දෙය.**

නොබියව කරනු හරි දෙය! නොබියව කියනු ඇත්ත!
ඔබට ඇත කටයුතු වෙන කිසිවෙකුට කළ නොහැකි,
නිර්භයව, කරුණාවෙන් මනාව කරන්න,
කථාව කීමට දේවදූතයන් වේ කඩිසර.
නොබියව, නොබියව, නොබියව කරනු හරි දෙය.
නොබියව, නොබියව, නොබියව කියනු ඇත්ත,
නොබියව කියනු ඇත්ත, නොබියව කියනු ඇත්ත.

## මා කරන ලෙස කරනු

මා කරන ලෙස කරනු
අනුව එන්න, මා අනුව එන්න!
මා කරන ලෙස කරනු;
අනුව එන්න, මා අනුව එන්න!
උඩින් හෝ යටින් මා කළොත්,
වේගෙන් හෝ සෙමින් මා කළොත්,
මා කරන ලෙස කරන්න;
අනුව එන්න, මා අනුව එන්න!
මා කරන ලෙස කරන්න;
අනුව එන්න, මා අනුව එන්න!

© 1963 by D.C Heath and Company. Used by Permission.

## "දෙන්න," කීය කුඩා ඇල

"දෙන්න," කීය කුඩා ඇල,
"දෙන්න," අහෝ ! දෙන්න අහෝ! දෙන්න.
"දෙන්න" කීය කුඩා ඇල.
විගස යමින් කඳු පාමුල;
"මම කුඩාය, දනිමි එය, ගියත් මා කොහේ
කුඹුර වඩාත් කොළ පාට වෙයි."

*ගීත කණ්ඩය.*

ගී ගයමින්, දවස පුරා ගී ගයමින්,
"දෙන්න, අහෝ ! දෙන්න."
ගී ගයමින්, දවස පුරා ගී ගයමින්,
"දෙන්න, අහෝ ! දෙන්න."

"දෙන්න," කියා කුඩා වැස්ස,
"දෙන්න, අහෝ ! දෙන්න, දෙන්න අහෝ ! දෙන්න,"
"දෙන්න," කීය කුඩා වැස්ස.
මල් මත එය වැටුනු විට,
"කඩා වැටුනු හිස ඔවුන්ගෙ ඔසවමි මම,"
මල් මත එය වැටුනු විට.

ගීත කණ්ඩය

දෙන්න, යේසු දුන්නා මෙන්,
දෙන්න, අහෝ ! දෙන්න, දෙන්න, අහෝ ! දෙන්න.
දෙන්න යේසු දුන්නා මෙන්,
සියල්ලන්ට දීමට හැකි යමක් ඇත;
ඇල හා මල් කළා මෙන් කරන්න:
දෙවිඳු සහ අන්‍යයන් ජීවත් වේ.

ගීත කණ්ඩය.

## එතුමා එතුමාගේ පුතා එව්ව සේක.

ප්‍රේමය මුදු මොළොක්, ලොවට කීමට පියාට හැකි
වන්නේ කෙසේද?
පුත්‍රයා එතුමා එව්වේ, අලුත් උපන් ළදරුවා සාමයෙන්,
ශුද්ධ යෙන්.
අප යායුතු මග ලොවට පෙන්වීමට පියාට හැකි වන්නේ
කෙසේද?
එතුමා තම පුත් ලොවට එව්වේ, අපට දැන්වීමට එම
මගෙහි ගමන.
පූජාව, මරණය ලොවට කීමට පියාට හැකි වන්නේ
කෙසේද?
එතුමා තම පුතු ලොවට එව්වේ අප වෙනුවෙන් මැරී
ජීවන හුස්මෙන් අපට නැගිටීමටය.
පියා අසන්නේ අපෙන් කුමක්ද? ශුද්ධ ලියවිලි කුමක්
කියයිද?
බැතියෙන්, පැතුමෙන් පුතුන් මෙන් ජීවත් වී, අනුන්ට
එමගට පිහිට වීමට.
එතුමා කුමක්ද අසන්නේ? පුත් මෙන් ජීවත් වීමටය.

(© 1982 by Mabel Jones Gabbott Used by Permission)

## මම දේව දරුවෙක්මි.

මම දේව දරුවෙක්මි,
එතුමා මා මෙහි එවා,
පොළොවේ නිවසක් දී මට
සමග කරුණාබර දෙමව්පියන්.

*ගීත කණ්ඩය.*

ගෙන යන්න, මගපෙන්වන්න, මා සමග ඇවිදින්න,
මග සෙවීමට මට උදව්වෙන්න.
මා කළ යුතු දෙය මට උගන්වන්න.
යම් දිනක ජීවත් වීමට ඔහු සමග.

මම දේව දරුවෙක්මි,
බොහෝය මට අවැසි දේ;
එතුමාගේ වචන වටහා ගන්න වෙන්න පිහිට මට
කල් යන්ට පෙර.

ගීත කණ්ඩය.

මම දේව දරුවෙක්මි
වටිනා ආශිර්වාද ඇත
මා එතුමාගේ කැමැත්ත ඉගෙන ගතහොත්
මා නැවතත් එතුමා සමගින් වෙසෙයි.

ගීත කණ්ඩය.

### ගැලවුම් කරුගේ ප්‍රේමය හැඟෙයි මට.

ගැලවුම්කරුගේ ප්‍රේමය හැඟෙයි මට
මා වටා මුලු ලෝකයේම.
ජීවය ඔහුගේ උණුසුම් කරයි ආත්මය මගේ
මා දකින සියල්ලෙහිදී.

*ගීත කණ්ඩය.*

ඔහු අනුව මා යෑම එතුමා දනී,
මගෙ මුලු ජීවිතය දෙන බව ඔහුට.
ගැලවුම්කරුගේ ප්‍රේමය හැඟෙයි මට,
අවංකව මට දෙන එතුමාගේ ප්‍රේමය.

*හතරවෙනි පදය:*

මා ගැලවුම්කරුගේ ප්‍රේමය බෙදා ගනිම් මම.
සේවයෙන් අනායයන්ට අවංකව.
සේවයෙන් මම ලබම් ආසිරි.
දීමෙන් ලබම් මම.

ගීත කණ්ඩය.

(© 1978, 1979 by K. Newell Dayley. All rights reserved.
Used by Permission)

### මගේ පියා ජීවත් වේ දනිම් මම.

මගේ පියා ජීවත් වේ පෙම්කරමින්, දනිම් මම.
ආත්මය කොඳුරමින් එය සත්‍යයයි කියයි මට,
එය සත්‍යයයි කියයි මට.

පොළොවට එතුමා එවා මා, බැතියෙන් ජීවත් වීමට
එතුමාගේ සැලසුම.
ආත්මය කොඳුරමින්, එය කළ හැකියි කියයි මට,
එය කළ හැකියි කියයි මට.

### කැමතියි මා මගෙ උපන්දිනයන්ට.

කැමතියි මා මගෙ උපන්දිනයට, සෑම එකකටම;
සෑම එකක්ම වඩා සතුටක් ගෙන දෙයි මට.
අට වෙන තෙක් නැත මට ඉවසිලි,
මම බව්තීස්ම වෙමි, දන්නවද ඔබ.

යේසු මෙන් බව්තීස්ම වීමට
සත්‍යවූ පූජකවරයෙකු මගින්
එසේ ශුද්ධ නීති වලට දෙවිඳුගේ, කීකරුව
කීමට අවශ්‍ය මට එයයි.

මගේ හිස මත අත් තැබූ විට,
ශුද්ධාත්මය මම ලබන්නෙමි.
සවන් දුන්නොත් සැලකිල්ලෙන් මම,
මට අවැසි ආසිරි මට ලැබෙනු ඇත.

### ඔබට මා තුති දෙමි, ආදර පියාණෙනි.

ඉහළ සගයේ ආදර පියාණෙනි, දෙමි තුති ඔබට මම,
ඔබගේ යහපත්කමට, දයාවට, කරුණාවට සහ ප්‍රේමයට.
ඔබට මා තුති දෙමි නිවසට, මිතුරනට, දෙමව්පියන්ට
ආදර,
සියල්ලට ආශිර්වාද මෙහි මා ප්‍රීති වෙන.

යහපත, කරුණාව, මුදු මොළොක් වීමට පිහිටවූන
මැනව අද දින,
මා පියාද, මවද කියන දෙයට සැලකිලිමත් වීමට.
මුදු මොළොක් ප්‍රේමණීය, යේසුගෙ ආදර නාමයෙන්,
ඔබගේ මේ දරුවා රැක ආසිරි ගන්වන්න යදිමි මම

### එම මිහිරි කථාව මා කියවන විට සිතමි මම.

ඉපැරණි මිහිරි කථාව කියවන විට සිතමි මම.
මිනිසුන් අතර මෙහි යේසු සිටින විට,
රැළට එතුමාගේ බැටළුවන් මෙන්, කුඩා දරුවන්ට එතුමා
ඇමතුවේ;
මමද එවිට සිටියා නම් කැමැත්තෙමි.

මගේ හිස මත එතුමාගේ අත් තැබුවා නම්,
මා වටා එතුමාගේ අත් යවා
එතුමාගේ කරුණාව මා දකිනුයේ, කියන විට එතුමා,
"කුඩා අයට මා වෙතට එන්ට ඉඩදෙන්න."

### යේසු මෙන් වීමට දිරි ගනිම් මම

යේසු මෙන් වීමට දිරි ගනිම් මම;
ඔහු අනුව යම් එම මග මම.
මම කරන කියන සියල්ලෙහි, එතුමා මෙන් පෙම් කිරීමට
දිරි ගනිම් මම
වැරදි තීරණ ගැනීමට වැටෙයිදෝ පරීක්ෂාව වරක් මම,
නමුත් සියුම් හඬේ කෙඳිරීමට දිරි ගනිම් සවන් දීමට,

*ගීත කණ්ඩය.*

"එකි නෙකාට ප්‍රේම කරන්න යේසු කළා මෙන් ඔබට ආදර.
ඔබ කරන සියල්ලෙහිදී කරුණාව පෙන්වන්න දිරි ගන්න.
ක්‍රියාවෙන් සිතීමෙන් මුදු මොළොක් ප්‍රේමයෙන්,
මේවාය දේවල් යේසු ඉගැන්වූ."

ආදරය කිරීමට අසල්වැසියාට මගෙ ගතිම් දිරි මම;
මිතුරන්ට කිරීමට සේවය ඉගෙන ගතිම් මම
යේසු එන එම ප්‍රීතියේ දිනයට බලා සිටිම් මම
ඉගැන්වූ පාඩම් ඔහු සිහිපත් කිරීමට ගතිම් දිරි මම.
ශුද්ධ වූ ආත්මය මා සිතට ඇතුල් වී, කියනුය මෙසේ:

ගීත කණ්ඩය.

(© 1980 by Janice Kapp Perry, Used by Permission)

### කුඩා ළමුන්ට කළාය යේසු ආදරේ.

කුඩා ළමුන්ට යෙසු කළාය ආදරේ,
කුඩා අය මා වැනි.
ආසිරි ගන්වා පිහිට වෙයි ඔවුන් හට එතුමා.
දණ මත එතුමාගේ තබා ගතියි ඔවුන්

ඉගැන්වූයේය එතුමා බොහෝ ලස්සන දේ,
අප සියලු දෙනාම කළ යුතු දේ:
එකිනෙකාට ආදරින් පිහිට වීමට,
අවංකව, කරුණාවෙන් හා සත්‍යයෙන්.

### සියල්ලට පෙම් කරන්න යේසු කී සේක.

සියල්ලට පෙම් කරන්න යේසු කී සේක.
කරුණාවෙන්ද සලකන්න ඔවුන්ට.
ඔබගේ හදවත ප්‍රීතියෙන් පිරුණු විට,
අන්‍යයන් කරති ආදරය ඔබ හට.

### මා හිරුරැසක් වීමට යේසුට ඕනෑය.

මා හිරුරැසක් වීමට යේසුට ඕනෑය,
සැමදා එතුමා වෙනුවෙන් දිළෙන්ට;
සියල්ලෙහිදී ඔහු එතුමා කිරීමට,
නිවසේ, පාසැලේ ක්‍රීඩාවෙහිදී.

*ගීත කණ්ඩය:*

හිරු රැසක්, හිරු රැසක්,
මා හිරු රැසක් වීමට යේසුට ඕනෑය.
හිරු රැසක්, හිරු රැසක්,
මම එතුමාගේ හිරු රැසක් වන්නෙමි.

මා ප්‍රේම කිරීම යේසුට ඕනෑය
මා දකින සියල්ලට කරුණාව,
ප්‍රසන්න බව සතුට පෙන්වීමට
ඔහුගේ කුඩා අයට පුලුවනි.

ගීත කණ්ඩය.

### එකිනෙකාට ප්‍රේම කරන්න.

මා ඔබට ප්‍රේම කළාක් මෙන්.
එකිනෙකාට ප්‍රේම කරන්න.
මෙම අලුත් ආඥාව:
එකිනෙකාට ප්‍රේම කරන්න.
එයින් සියල්ලන් දැනගන්නවා ඇත
ඔබලා මගේ ගෝලයන් බව;
ඔබට ප්‍රේමය ඇත්තම්
එකිනෙකාට

(© 1961, renewed 1989 by Luacine C. Fox. Used by Permission.)

### මරියාගේ දරු නැළවිල්ල.

නැලවෙන්න, නැලවෙන්න, මගේ කුඩා පුත.
නැලවෙන්න, මගේ ආදර දරුව.
ශ්‍රේෂ්ඨ දිවිය ඔබගේ ඇරඹුනා පමණි;
මව ඔබව ලංකර සිටී.
රැය පුරා සුරකියි යෝසෙෆ් ඔබව,
ඔබගේ දීප්ති ආලෝකය තරුවෙන් ආපසු යවයි.
නැලවෙන්න, නැලවෙන්න මගේ කුඩා පුත.
නැලවෙන්න, මගේ ආදර දරුව.

මුදු මොළොක් හිස ඔබගේ පළඳියි ඔටුන්නක්,
මන්ද, ඔබගේ පියා රජෙකි.
මුදු මොළොක් අත්, දැන් කුඩා වුවද,
මහා ආසිරි ගෙන එන්නේ.
මගේ ගීතයට සියලු මැවිල්ල එක් වේ,
සාමයත්, ප්‍රේමයත් උපදිය මේ රැයේ.
නැලවෙන්න, නැලවෙන්න, මගේ කුඩා පුත.
නැලවෙන්න මගෙ ආදර දරුව.

**අහෝ නිසලවෙනු ඔබ මගේ ළදරුව.**

අහෝ, නිසල වෙනු ඔබ, මගේ ළදරුවා; කථාවක් මම කියමි,
කුඩා සමිඳු යේසු, විසීමට පොළොවට පැමිණියේ
දුර රටක, සයුරෙන් එහා,
කුඩා ළදරුවෙකු උපන්නේ, ඔබ වගේ මගෙ ආදර පුතේ.

*ගීත කණ්ඩය:*

නැලවෙන්න ළදරුව (බබා), නැලවෙන්න ආදර පුතා
නිදන්න, කුඩා ළදරුව (බබා); කිසිවකට නොවන්න භය.
නැලවෙන්න ළදරුවා (බබා) නැලවෙන්න ආදර පුතා.
ඔහුගේ කුඩා දරුවට මෙහි, යේසු දෙයි රැකවරණ.

දේවදූතයන් දීප්ති කථාව කීවේ,
ඔවුන් වටා දිළිසේ ස්වර්ගීය ආලෝකය.
තරු දීප්තියෙන් බබළයි, එකක් මග පෙන්වයි
නැවතුනේ ආදර ළදරුවා සිටි තැන.

ගීත කණ්ඩය.

එතුමා හමු විය එඬේරුන් හට දෙව්දූතයන් කීලෙස,
අහිංසක කුඩා ආගන්තුකයා තොටිල්ල නැති ඇඳකුත් නැති.
ගව ඔරුවක පහත් වූ, නිසලව එතුමා සැතපේ,
මේ කුඩා දරු යේසු, පිදුරු මත නිදන්නේ.

ගීත කණ්ඩය.

**සැනෙකින් කීකරු වෙමි මම.**

මගෙ මව මට ඇමතූ විට,
සැනෙකින් කීකරු වෙමි මම.
හොඳ දෙයම කිරීමට ඕනෑය මට
සෑම එක් දිනයකම.

පියා මගෙ ඇමතූ විට මට,
සැනෙකින් කීකරු වෙමි මම.
හොඳ දෙයම කිරීමට ඕනෑය මට
සෑම එක් දිනයකම.

සගයේ පියා පෙම් කරයි මට,
සෑම දින ආසිරි ගන්වමින්.
හොඳ දෙයම කිරීමට ඕනෑය මට
සෑම එක් දිනයකම.

**සිනහව.**


ඔරවන කෙනෙකු ඔබට හමු වූ විට,
එය රැඳෙන්ට නොදෙනු
උඩ යට එය වහා පෙරලන්න
සිනහවෙන් එරවීම පහ කරන්න.


ඔරවන මුහුණට නැත කැමති කිසිවෙකු.
සිනහවට එය පෙරලන්න.
ලොව යහපත් තැනක් කරන්න.
නිරන්තර සිනහවෙන්.

**ශුද්ධ ආත්මය.**

යේසු පොළොවේ සිටින විට,
එවීමට එතුමා පොරොන්දු විය
ශුද්ධ ආත්මය සැනසීමට අප,
සත්‍යයවූ අපේ සදාකාල මිතුරා
ශුද්ධ වූ ආත්මය කොඳුරයි.
සියුම් නිසල හඬින්.
සාක්ෂි දරයි දෙවිඳු සහ ක්‍රිස්තුස්ට
අප හදවත් සතුටු කරයි.

අප ස්ථිර කරන විට
ශුද්ධ වූ පූජක බලයෙන්,
ශුද්ධ ආත්මය අපට දෙයි
මග පෙන්වීමට සෑම පැයකදී අපට
අහෝ නිතර මා සවන් දෙනවා
එම නිසල සියුම් හඬට,
එතුමා ආලෝකයෙන් හරි දෙය කරමි මම
තීරණ ගන්නා සෑම විටම මම.


ආරම්භය.
ඔබගේ යාච්ඤා කියන්න
ඔබගේ සෙල්ලම් බඩු පිළිවෙලට තබන්න.
කාරුණාවන්ත වචන කියන්න.
අනාථයන්ට උපකාර කිරීමට කැමති වෙන්න.
ඔබ කුමක් කරනවාද යේසුස් වහන්සේට අවශ්‍ය වන්නේ කියා සිතන්න.
සතාට සලකන්න.
ඔබගේ දෙමව්පි- යන් කියන දේ කරන්න.
ඔබගේ සහෝදරයින් සහ සහෝදරියන් සමග රංඩු නොකරන්න.
ඔබ වැරැද්දක් කළ විට කණගාටු වෙන්න.
ඔබට අයිති නැති දේවල් නොගන්න.
ඉල්ලනට පෙර උපකාර කරන්න.
ඔබගේ දසයෙන් එක කොටස ගෙවන්න.
ඔබ ඉල්ලා ගත් දේවල් ආපසු දෙන්න.
ක්‍රීඩා කළ යුතු ක්‍රීඩාව අන්‍යයන්ට තේරීමට ඉඩදෙන්න.
බොරුවක් නොකියන්න.
යේසුස් වහන්සේගේ පැමිණීමට සූදානම් නොවීම.



යමක් බෙදාගන්න.
සභාවට යන්න.
ඔබගේ දෙමව්පියන්ට කීකරු වෙන්න.
සතුන්ට කරුණාව දක්වන්න.
යමෙකු වැළඳගන්න.
කරුණාවන්ත ක්‍රියාවකින "ඔබට ස්තුතියි" කියන්න.
සාමාජිකයෙකු නොවන කෙනෙක් සභාවට එක්ක යන්න.
අසල්වැසි යමෙකුට උපකාර කරන්න.
යාච්ඤාව කියන විටදී ශබ්ද නොකරන්න.
ඔබගේ සහෝදරයන් සහ සහෝදරියන් සමග රණ්ඩු නොකරන්න.
සභාවේදී ගෞරවාන්විතව ඉන්න.
ඔබට අකරුණාවන්ත වූ යමෙකුට සමාව දෙන්න.
යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමට සූදානම් වෙන්න.

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ
පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

SINHALA
4 02344 84408 9
34484 408